## අපරාධ නඩු විධාන සංග්‍රහය පනත

අපරාධ අධිකරණ වල කාර්යය පටිපාටිය විධිමත් කිරීම පිණිස ද ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ II වන හා IV වන ඡේද ඉවත් කිරීම පිණිස ද ඒ හා සම්බන්ධ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

1979 අංක 15
1979 අංක 36
1979 අංක 68
1980 අංක 52
1982 අංක 39
1985 අංක 49
1988 අංක 11
1988 අංක 12
1988 අංක 13
1988 අංක 21
1989 අංක 15
1990 අංක 12
1993 අංක 4
1995 අංක 4
1995 අංක 20
1997 අංක 19
1998 අංක 28
1999 අංක 47
2002 අංක 12
2005 අංක 14
2005 අංක 21
2006 අංක 07
දරන පනත්

[ 1979 ජූලි මස 2 වන දින]

ලුහුඬු නාමය ක්‍රියාත්මක වන දිනය.

**1**.* මෙහි මින් මතු සංග්‍රහය යනුවෙන් සඳහන් කරනු ලබන මේ පනත 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන ) දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

* මේ වගන්තියේ කාර්ය සඳහා නියම කරන ලද දිනය 1979 ජූලි 02 වේ. 1979 ජූනි මස 15 වන දින අංක 40/16 අති විශෙෂ ගැසට් පත්‍රය බලන්න.

I වන කොටස

## I පරිච්ඡේදය

### ප්‍රාරම්භය

අර්ථ නිරූපණය

**2.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ සංග්‍රහයෙහි -

"අග්‍ර විනිශ්චයකාරවරයා"

"අග්‍ර විනිශ්චයකාරවරයා" යන්නෙන් ශ්‍රී ලංකා ජන රජයේ අග්‍ර විනිශ්චයකාරවරයා අදහස් වන අතර වැඩ බලන අග්‍ර විනිශ්චයකාරවරයෙක් ද ඊට ඇතුළත් වේ;

"ළමා අපචාරය" [1998 අංක 28 §2]

"ළමා අපචාරය" යන්නෙන් ළමයෙක් සම්බන්ධයෙන් කරනු ලැබූ විට දණ්ඩ නීති සංග්‍රහයේ 286අ, 288, 288අ, 288ආ, 308අ, 360ආ, 360ඇ, 363, 364අ, 365, 365අ හෝ 365ආ වගන්ති යටතේ වූ වරදක් අදහස් වේ;

"අත්හිට වූ සිර දඬුවම"

"අත්හිට වූ සිර දඬුවම" යන්නෙන් මේ සංග්‍රහයේ 303 වන වගන්තිය යටතේ ආඥාවක් කරනු ලබන්නේ යම් සිර දඬුවමක් සම්බන්ධයෙන් ද ඒ සිර දඬුවම අදහස් වේ;

"අධිකරණ කටයුත්ත"

"අධිකරණ කටයුත්ත" යන්නෙන් නීත්‍යානුකූල ලෙස සාක්ෂි ගනු ලබන හෝ සාක්ෂි ගත හැකි යම් අධිකරණ කටයුත්තක් අදහස් වේ;

"අධිචෝදනීය වරද"

"අධිචෝදනීය වරද" යන්නෙන් ජූරි සභාවක් ඇතුව හෝ නැතුව මහාධිකරණය විසින් ම නඩු විභාග කළ හැකි හෝ ජූරි සභාවක් නැතිව මහාධිකරණය විසින්ම විශේෂයෙන් නඩු විභාග කළ හැකි හෝ වරදක් අදහස් වේ;

"අභියාචනාධිකරණය"

"අභියාචනාධිකරණය" සහ "අධිකරණය" යන්න අභියාචනාධිකරණය සම්බන්ධයෙන් යෙදෙන විට තත් කාලයෙහි ශ්‍රී ලංකා ජන රජයේ අභියාචනාධිකරණය හෝ අභියාචනාධිකරණයේ සභාපතිවරයා හෝ එහි යම් විනිශ්චකාරවරයෙක් හෝ වැඩ බලන විනිශ්චකාරවරයෙක් හෝ අදහස් වේ;

* 1979 ජූලි මස 2 වන දිනට අතීතයට බලපාන පරිදි. (1979 අංක 68 දරන පනතේ 3 වන වගන්තිය බලන්න)

"ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා" යන්නට ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා හෝ අතිරේක හෝ නියෝජ්‍ය හෝ ජ්‍යෙෂ්ඨ සහකාර හෝ සහකාර ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා වීම සඳහා හෝ එලෙස ක්‍රියා කිරීම සඳහා හෝ පත් කරන ලද යම් තැනැත්තෙක් ඇතුළත් වේ; "ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා" [1980 අංක 52 § 2]

"ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයා" යන්නට ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ යම් වෛද්‍ය පීඨයක අධිකරණ වෛද්‍ය අංශයෙහි යම් නිලධරයෙක් ඇතුළත් වේ; "ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයා"

"ඇප දිය හැකි වරද" යන්නෙන් ඇප දිය හැකි වරදක් ලෙස පළමුවන උපලේඛනයෙහි දැක්වෙන හෝ ඇප දිය හැකි වරදක් බවට තත් කාලයෙහි බල පවත්නා වෙනත් යම් නීතියක් මගින් පත් කරනු ලැබූ හෝ වරදක් අදහස් වන අතර "ඇප දිය නොහැකි වරද" යන්නෙන් වෙනත් යම් වරදක් අදහස් වේ; "ඇප දිය හැකි වරද"

"ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන්, තත් කාලයෙහි ඇඟිලි සටහන් හඳුනා ගැනීමේ කාර්යාලයේ රෙජිස්ට්‍රාර් ධුරය දරන නිලධරයා අදහස් වේ; "ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර්වරයා"

"උත්තරවාදියා" යන්න යම් අධිකරණයක යම් නඩු කටයුත්තක් සම්බන්ධයෙන් යෙදෙන විට, නීතිඥවරයෙක් ඉන් අදහස් වේ; "උත්තරවාදියා"

"උපලේඛනය" යන්නෙන් මීට යා කොට ඇති උපලේඛනයක් අදහස් වේ; "උපලේඛනය"

"තැනැත්තා" යන්නට, සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ; "තැනැත්තා"

"ආරක්ෂා ස්ථානය" යන්නට රක්ෂණ නිවාසයක්, රෝහලක් හෝ භාරය හා රැකවරණය සඳහා වූ යම් ආයතනයක් ඇතුළත් වේ; "ආරක්ෂා ස්ථානය" [1998 අංක 28 § 2]

"තොරතුරු සටහන් පොත" යන්නට, ප්‍රකාශ වාර්තාගත කිරීමේ කාර්යය සඳහා අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව විසින් හෝ යම් විමර්ශන කාර්යාංශයක් විසින් පවත්වාගෙන යනු ලබන අපරාධ සටහන් පෑඩයක් හෝ ලිපි ගොනුවක් හෝ ඇතුළත් වේ; "තොරතුරු සටහන් පොත"

"දඩය" — "දඩය" යන්නට, යම් අපරාධයක් හෝ වරදක් සම්බන්ධයෙන් හෝ යම් ප්‍රඥප්තියක් කඩ කිරීම සම්බන්ධයෙන් හෝ යම් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ විට විනිශ්චිතව නියම කරන ලද යම් දඩයක්, මුදල් අහිමි කිරීමක් හෝ වන්දියක් ඊට ඇතුළත් වේ;

"දණ්ඩ නීති සංග්‍රහය" — "දණ්ඩ නීති සංග්‍රහය " යන්නෙන්, එහි සෑම ව්‍යවස්ථාපිත වෙනස් කිරීමක් හෝ සංශෝධනයක් ද සමග දණ්ඩ නීති සංග්‍රහය අදහස් වේ;

"දිවයින " — " දිවයින" යන්නෙන් , ශ්‍රී ලංකාද්වීපය අදහස් වේ;

"දිසාපතිවරයා" — *"දිසාපතිවරයා" හෝ" දිස්ත්‍රික්කයෙහි දිසාපතිවරයා" යන්නෙන්, පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා අදහස් වන අතර, ඒ දිස්ත්‍රික්කයේ අතිරේක සහ උප දිසාපතිවරයෙක් ද ඊට ඇතුළත් වේ;

"නිදහස් කිරීම" — "නිදහස් කිරීම" යන්න, එහි ව්‍යාකරණානුකූල ප්‍රභේද සහ සජාතීය යෙදුම් සමග ගත් විට ඉන් චූදිතයකුට විරුද්ධ අපරාධ නඩු කටයුතු නතර කිරීම අදහස් වන අතර, වරදින් නිදොස් කිරීමක් ඊට ඇතුළත් නොවේ;

"නියමිත" — "නියමිත" යන්නෙන්, මේ සංග්‍රහය මගින් හෝ ඒ යටතේ සාදන ලද යම් රීති මගින් හෝ නියමිත බව අදහස් වේ;

"නියෝජ්‍ය නීතිපතිවරයා" — "නියෝජ්‍ය නීතිපතිවරයා" යන්නෙන්, ශ්‍රී ලංකා ජන රජයේ නියෝජ්‍ය නීතිපතිවරයා අදහස්වන අතර, අතිරේක නියෝජ්‍ය නීතිපතිවරයකු සහ උප නීතිපතිවරයෙක් ද ඊට ඇතුළත් වේ;

"නීතිපතිවරයා" — "නීතිපතිවරයා " යන්නෙන්, ශ්‍රී ලංකා ජන රජයේ නීතිපතිවරයා අදහස්වන අතර, වැඩ බලන නීතිපතිවරයෙක් ද ඊට ඇතුළත් වේ;

"පරිච්ඡේදය" — "පරිච්ඡේදය" යන්නෙන්, මේ සංග්‍රහයෙහි පරිච්ඡේදයක් අදහස් වේ;

---

* දිසාපතිවරයා යන්නෙන් ප්‍රාදේශීය ලේකම්වරයා අදහස් වේ. 1992 අංක 58 දරන බලතල පැවරීමේ (ප්‍රාදේශීය ලේකම්වරයන්) පනතේ 4 වන වගන්තිය බලන්න.

"පරීක්ෂකවරයා" යන්නෙන්, XI වන පරිච්ඡේදය යටතේ අමාත්‍යවරයා විසින් පත් කරන ලද තැනැත්තෙක් අදහස් වේ; "පරීක්ෂකවරයා"

"පරීක්ෂණය" යන්නට, මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ හෝ පරීක්ෂකවරයකු විසින් හෝ මේ සංග්‍රහය යටතේ පවත්වනු ලබන සෑම පරීක්ෂණයක් ම ඇතුළත් වේ; "පරීක්ෂණය"

"පැමිණිල්ල" යන්නෙන්, දන්නා හෝ නොදන්නා යම් තැනැත්තකු වරදක් සිදුකර ඇති බවට මේ සංග්‍රහය යටතේ ක්‍රියා කිරීම සඳහා මහේස්ත්‍රාත්වරයකු වෙත වාචිකව හෝ ලියවිල්ලකින් කරනු ලබන චෝදනාව අදහස් වේ; "පැමිණිල්ල"

"පිස්කල් යන්නෙන්, අධිකරණයක පිස්කල් අදහස් වන අතර, මේ සංග්‍රහය යටතේ පිස්කල්ගේ යම් බලයක් ක්‍රියාත්මක කිරීමට, කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කිරීමට විනිශ්චයකාරවරයකු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙන ලද යම් තැනැත්තෙක් ද ඊට ඇතුළත් වේ; "පිස්කල්"

"පීඩාකර ආයුධය" යන්නට, 1966 අංක 18 දරන පීඩාකාරී ආයුධ පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේය; "පීඩාකර ආයුධය"

"පුපුරණ ද්‍රව්‍ය" යන්නට, පුපුරණ ද්‍රව්‍ය පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේය; "පුපුරණ ද්‍රව්‍ය"

"පොලිස් නිලධරයා" යන්නෙන්, ප්‍රතිෂ්ඨාපිත පොලිස් බලකායක සාමාජිකයකු අදහස් වන අතර, පොලිස් උප සේවකයෝ ද ඊට ඇතුළත් වෙති; "පොලිස් නිලධරයා"

"පොලිස් ස්ථානය" යන්නෙන්, පොලිස් ස්ථානයක් යයි ආරක්ෂක කටයුතු විෂය භාර අමාත්‍යවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් ප්‍රකාශිත යම් ස්ථානයක් අදහස් වන අතර, ජංගම පොලිස් මුරපොල, අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව සහ යම් විමර්ශන කාර්යාංශයක්ද ඊට ඇතළත් වේ; "පොලිස් ස්ථානයක් භාර නිලධරයා"

"පොලිස් ස්ථානයක් භාර නිලධරයා" යන්නට, පද සම්බන්ධය අනුව අවශ්‍ය වෙයි නම්, පොලිස් ස්ථානයක ශාඛාවක් භාර නිලධරයකු ඇතුළත් වන අතර, පොලිස් ස්ථානය හෝ පොලිස් ස්ථානයක ශාඛාව භාර නිලධරයා ඒ ස්ථානයෙහි "පොලිස් ස්ථානය"

නොමැති විටක හෝ අසනීපයක හේතුවෙන් ඔහුට සිය කාර්ය කරගෙන යාමට නොහැකි විටක, පදවියෙන් එම නිලධරයා ළඟට එම පොලිස් ස්ථානයේ හෝ පොලිස් ස්ථානයේ ශාඛාවෙහි සිටින නිලධරයා ද ඇතුළත් වේ;

"ප්‍රඥප්තිය" — "ප්‍රඥප්තිය" යන්නට, ශ්‍රී ලංකාවේ යම් ආඥාපනතක් හෝ ජාතික රාජ්‍ය සභාවේ පනතක් ඇතුළත් වේ;

"මහාධිකරණය" — "මහාධිකරණය" සහ "අධිකරණය" යන්න මහාධිකරණය සම්බන්ධයෙන් යෙදෙන විට, තත් කාලයෙහි ශ්‍රී ලංකා ජන රජයේ මහාධිකරණය හෝ මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු හෝ මහාධිකරණයේ වැඩ බලන විනිශ්චයකාරවරයකු හෝ ඉන් අදහස් වේ;

"මහෙස්ත්‍රාත්වරයා" — "මහෙස්ත්‍රාත්වරයා" යන්නෙන්, මහෙස්ත්‍රාත් අධිකරණයට පත් කරන ලද මහෙස්ත්‍රාත්වරයකු අදහස් වන අතර, නාගරික මහෙස්ත්‍රාත්වරයෙක්, බාලාපරාධ අධිකරණයක මහෙස්ත්‍රාත්වරයෙක් සහ එවැනි යම් අධිකරණයක වැඩ බලන හෝ අතිරේක මහෙස්ත්‍රාත්වරයෙක් ද ඊට ඇතුළත් වේ;

"රජයේ නීතිඥවරයා" — "රජයේ නීතිඥවරයා" යන්නට, ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥවරයකු සහ වැඩ බලන රජයේ නීතිඥවරයෙක් ද ඇතුළත් වෙති;

"රෙජිස්ට්‍රාර්වරයා" — "රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන්, පද සම්බන්ධය අනුව අවශ්‍ය වන පරිදි, යම් අධිකරණයක රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ;

"ලඝු වරද" — "ලඝු වරද" යන්නෙන්, මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් නඩු විභාග කරනු ලැබිය හැකි වරදක් අදහස් වේ;

"ලියවිල්ල" "ලිඛිත" — "ලියවිල්ල" සහ "ලිඛිත" යන්නට, මුද්‍රණය ලිතෝ මුද්‍රණය ඡායාරූප ශිල්පය, තහඩු කෙටීම සහ වචන හෝ ඉලක්කම් කඩදාසියෙහි හෝ වෙනත් යම් දෙයක ප්‍රකාශ කොට දැක්විය හැකි සෙසු සෑම ක්‍රමයක් ද ඇතුළත් වේ;

"වගන්තිය" — "වගන්තිය" යන්නෙන්, මේ සංග්‍රහයෙහි වගන්තියක් අදහස් වේ;

"වරද" — "වරද" යන්නෙන් තත් කාලයෙහි ශ්‍රී ලංකාවෙහි බලපවත්නා යම් නීතියක් මගින් දඬුවම් පැමිණ විය හැකි යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් අදහස් වේ;

"විනිශ්චයකාරවරයා" යන්නෙන්, අධිකරණයක විනිශ්චයාරූඪ නිලධරයා අදහස් වන අතර, පද සම්බන්ධය අනුව අවශ්‍ය පරිදි, ශ්‍රේෂ්ඨාධිකරණයෙහි, අභියාචනාධිකරණයෙහි, මහාධිකරණයෙහි, දිසා අධිකරණයෙහි සහ මහෙස්ත්‍රාත් අධිකරණයෙහි විනිශ්චයකාරවරයකු ද ඒ අධිකරණයක වැඩ බලන විනිශ්චයකාරවරයකු ද ඊට ඇතුළත් වෙති; "විනිශ්චයකාරවරයා"

"ශ්‍රේෂ්ඨාධිකරණය" සහ "අධිකරණය" යන්න ශ්‍රේෂ්ඨාධිකරණය සම්බන්ධයෙන් යෙදෙන විට, තත් කාලයෙහි ශ්‍රී ලංකා ජන රජයේ ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අග්‍ර විනිශ්චයකාරවරයා හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් විනිශ්චයකාරවරයෙක් අදහස් වේ; "ශ්‍රේෂ්ඨාධිකරණය"

"සාම නිලධරයා" යන්නට පොලිස් නිලධරයකු සහ පොලිස් කාර්යයන් ඉටු කිරීම සඳහා දිසාපතිවරයකු විසින් ලියවිල්ලකින් පත් කරන ලද ප්‍රාදේශීය උප දිසාපතිවරයකු සහ ග්‍රාම නිලධරයකු ඇතුළත් වේ ; "සාම නිලධරයා" [1988 අංක 12 § 2]

" සැක සහිත ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂකවරයා" යන්නට, සැක සහිත ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂකවරයා හෝ සැක සහිත ලේඛන පිළිබඳ ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර හෝ සහකාර පරීක්ෂකවරයා වීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙක් ඇතුළත් වේ; "සැක සහිත ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂකවරයා" [1980 අංක 52 § 2]

"සංස්ථාව" යන්නට, යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ හෝ, සම්පූර්ණයෙන්ම හෝ කොටසක් ආණ්ඩුව විසින් ප්‍රදානයක් ලෙස, ණයක් ලෙස හෝ අන්‍යාකාරයකින් සපයන ලද මූල ධනයෙන් පිහිටුවන ලද යම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ; "සංස්ථාව"

"සංඥෙය නොවන වරද" යන්නෙන්, සාම නිලධරයකු විසින් වරද කරන්නා වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගැනීම කළ නොහැකි වන්නේ යම් වරදක් සම්බන්ධයෙන් ද ඒ වරද සහ "සංඥෙය නොවන නඩුව" යන්නෙන්, සාම නිලධරයකු විසින් වරද කරන්නා වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගැනීම කළ නොහැකි වන්නේ යම් නඩුවක දී ද ඒ නඩුව අදහස් වේ ; "සංඥෙය නොවන වරද"

* 1979 ජූලි මස 2 වන දිනට අතීතයට බලපාන පරිදි. (1979 අංක 68 දරන පනතේ 3 වන වගන්තිය බලන්න.)

"සංක්ෂෙපය වරද"

"සංක්ෂෙපය වරද" යන්නෙන්, පළමුවන උපලේඛනයට අනුකූලව සාම නිලධරයකු විසින් වරද කරන්නා වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගැනීම කළ හැකි වන්නේ යම් වරදකට ද ඒ වරද සහ "සංක්ෂෙපය නඩුව" යන්නෙන් ඒ උපලේඛනයට අනුකූලව සාම නිලධරයකු විසින් වරද කරන්නා වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගැනීම කළ හැකි වන්නේ යම් නඩුවක දී ද ඒ නඩුව අදහස් වේ;

ක්‍රියා ගැන සඳහන් කෙරෙන වචන වලට නීති විරෝධී වූ නොකර හැරීම් ද ඇතුළත් වන බව.

**3.** (1) කරන ලද ක්‍රියා ගැන සඳහන් කරනු ලබන වචන, නීති විරෝධී වූ, නොකර හැරීම් කෙරෙහි ද ව්‍යාප්ත වේ;

දණ්ඩ නීති සංග්‍රහයෙහි අර්ථය ම වචන වලට තිබිය යුතු බව.

(2) මෙහි භාවිත කර ඇත්තා වූ ද දණ්ඩ නීති සංග්‍රහයෙහි අර්ථකථනය කර ඇත්තා වූ ද, මෙහි මීට ඉහත අර්ථකථනය කර නොමැත්තා වූ ද සියලු වචනවල සහ යෙදුම්වල ඒ සංග්‍රහයෙහි ඒ වචනවලට සහ යෙදුම්වලට පිළිවෙලින් දී ඇති අර්ථයම ඇති ලෙස සැලකිය යුතු ය.

අත්සන් අත් අකුරින් විය යුතු බව.

(3) මේ සංග්‍රහය මගින් හෝ මේ සංග්‍රහයෙහි කාර්ය සඳහා ලේඛනයක් අත්සන් කරන ලෙස යම් තැනැත්තකුට විධාන කරනු ලබන හෝ නියම කරනු ලබන කවර අවස්ථාවක වුවද ඒ අත්සන පෑනකින් හෝ එවැනි වෙනත් උපකරණයකින් හෝ ලිවිය යුතු අතර, එය මුද්‍රාවකින් හෝ එවැනි වෙනත් ක්‍රමයකින් හෝ මුද්‍රා තැබීම හෝ සටහන් කිරීම නොකළ යුතු ය.

ඇතැම් නිලධරයන්ගේ බලතල, අධිකරණ බලය, අයිතිවාසිකම් සහ කාර්ය.

**4.** නීතිපතිවරයා, නියෝජ්‍ය නීතිපතිවරයා, පොලිස්පතිවරයා, ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා, සැක සහිත ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂකවරයා, ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර්වරයා හෝ අධිකරණයක රෙජිස්ට්‍රාර්වරයකු වෙත යම් බලයක්, අධිකරණ බලයක් හෝ අයිතිවාසිකම් පිරි නමා තිබෙන හෝ කාර්යයක් නියම කර තිබෙන හෝ අවස්ථාවක තත් කාලයෙහි ඒ ධුරය දරන්නා විසින් හෝ වැඩ බැලීම් වශයෙන් එම ධුරය දරන්නා විසින් හෝ අතිරේක හෝ නියෝජ්‍ය හෝ සහකාර නිලධරයා විසින් හෝ ඒ බලය, අධිකරණ බලය හෝ අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීම ද ඒ කාර්යය ඉටුකිරීම ද කරනු ලැබිය යුතු ය. ඒ අතිරේක, නියෝජ්‍ය හෝ සහකාර නිලධරයා යන්නට, ඒ ධුරයෙහි වැඩ බැලීමට පත් කරන ලද යම් තැනැත්තකු ඇතුළත් විය යුතු ය.

5. (අ) දණ්ඩ නීති සංග්‍රහය යටතේ වූ සියලු වැරදි, සහ

(ආ) වෙනත් යම් නීතියක් යටතේ වූ සියලු වැරදි, අන්‍යාකාරයකින් වූ විධිවිධාන ඒ නීතියෙහි හෝ වෙනත් යම් නීතියක විශේෂයෙන් සලස්වා ඇත්නම් මිස,

විමර්ශනය කිරීම, විභාග කිරීම, නඩු විභාග කිරීම සහ අන්‍යාකාරයෙන් කටයුතු කිරීම මේ සංග්‍රහයෙහි විධිවිධානවලට අනුකූලව කරනු ලැබිය යුතු ය.

දණ්ඩ නීති සංග්‍රහය සහ වෙනත් නීති යටතේ වූ වැරදි සම්බන්ධයෙන් නඩු විභාග කිරීම.

6. ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ හෝ ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ හෝ නීතිපතිවරයාගේ හෝ බලතල හෝ අධිකරණ බලය මේ සංග්‍රහයෙහි සඳහන් කිසිවකින් හීන කෙරෙතැයි හෝ සීමා කෙරෙතැයි තේරුම් නොගත යුතු ය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ සහ නීතිපතිවරයාගේ බලතල ව්‍යාවර්තනය කිරීම.

7. මේ සංග්‍රහය මගින් හෝ තත් කාලයෙහි බල පවත්නා වෙනත් යම් නීතියක් මගින් හෝ විශේෂ විධිවිධාන සලස්වා නොමැති, අපරාධ නඩු කාර්ය පටිපාටියට අදාළ කාරණා සම්බන්ධයෙන් අවස්ථාව අනුව යුක්තිය ඉටුවීම පිණිස අවශ්‍ය විය හැකි සහ මේ සංග්‍රහයට අනුකූලව නොවන කාර්ය පටිපාටියක් අනුගමනය කළ හැකි ය.

විධිවිධාන සලස්වා නොමැති අවස්ථා.

## II වන කොටස

## II වන පරිච්ඡේදය

### අපරාධ අධිකරණවල බලතල

### අ - බලතල සාමාන්‍යයෙන්

8. ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය වෙත පැවරී ඇති වෙනත් බලතලවලට අමතරව, එම අධිකරණය විසින් ස්වකීය අධීක්ෂණ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, සියලුම මුල් අවස්ථා අධිකරණ පරීක්ෂා කිරීම ද ඒ අධිකරණවල වාර්තා තැබීම සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීම ද කරනු ලැබිය හැකි ය.

මුල් අවස්ථා අධිකරණ පරීක්ෂා කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට සහ අභියාචනාධිකරණයට ඇති බලය.

මහෙස්ත්‍රාත් අධිකරණවල අපරාධ ලඝු අධිකරණ බලය.

**9.** මේ සංග්‍රහයේ විධිවිධානවලට යටත්ව සහ අනුකූල ව, සෑම මහෙස්ත්‍රාත් අධිකරණයකට ම -

(අ) ස්වකීය ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන් සිදුකර ඇත්තා වූ ද මේ සංග්‍රහය මගින් හෝ බලපවත්නා වෙනත් යම් නීතියක් මගින් හෝ මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් හෝ දිසා අධිකරණයක් විසින් හෝ සංජානනය කළ යුතු බවට පත් කර ඇත්තා වූ ද වැරදි පිළිබඳව වූ සියලු කාරණා හෝ අපරාධ නඩු ලඝු ආකාරයකින් විභාග කිරීමට, නඩු විභාග කිරීමට, තීරණය කිරීමට සහ ඊට සුදුස්සක් කිරීමට බලය සහ අධිකාරය ඇති අතර එසේ කිරීමට මෙයින් නියම කරනු ලැබේ.

වැරදි කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් කිරීමට ඇති අධිකරණ බලය.

(ආ) (i) ස්වකීය ප්‍රාදේශීය අධිකරණ බලසීමාව තුළ සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන් සිදු කර ඇත්තා වූ හෝ සිදුකර ඇතැයි කියනු ලබන්නා වූ හෝ සියලු වැරදි විභාග කිරීමට හෝ යම් වැරදි සම්බන්ධයෙන් මේ සංග්‍රහය යටතේ ඒ අධිකරණයට අධිකරණ බලය ඇත්තේ ද ඒ වැරදි ආශ්‍රිත සියලු සාක්ෂිකරුවන් විභාග කිරීමට, කැඳවීමට හා පරීක්ෂා කිරීමට ද සියලු අපරාධකරුවන් සහ වරදකරුවන් අල්ලා ගැනීමට, වරෙන්තු සහ වෙනත් අධිකරණයක විධාන නිකුත් කිරීමට ද නීතිය අනුව ඔවුනට විරුද්ධව කටයුතු කිරීමට ; සහ

සෝදිසි වරෙන්තු නිකුත් කිරීමට සහ සාමය සඳහා ඇපකරුවන් නියම කිරීමට.

(ii) සොරකම් කරන ලද බඩු හෝ යම් වරදක් සිදු කිරීමෙහි ලා උපයෝගි කර ගන්නා ලද නැතහොත් යම් වරදකට සම්බන්ධ බඩු ද්‍රව්‍ය හෝ දේවල් තබා ගෙන ඇතැයි කියනු ලබන සියලු ස්ථාන සෝදිසි කිරීම සඳහා නැතහොත් සෝදිසි කිරීමට සැලැස්වීම සඳහා වරෙන්තු නිකුත් කිරීමට සහ සාමය සඳහා හෝ යහපත් පැවැත්ම සඳහා නීති ප්‍රකාර ඇප තබන ලෙස තැනැත්තන්ට නියම කිරීමට ; තවද

හදිසි හෝ අනතුරුවලින් සිදු වූ හෝ මරණ පිළිබඳව පරීක්ෂණයක් කිරීම.

(iii) යම් තැනැත්තකු යම් බන්ධනාගාරයක හෝ මානසික හෝ ලාදුරු රෝහලක හෝ මිය ගිය නැතහොත් දාමරික ක්‍රියාවකින් හෝ හදිසි අනතුරකින් මිය ගිය නැතහොත් මිය යාම හදිසියේම සිදු වූ හෝ යම් තැනැත්තකු ගේ මරණය සිදු වූයේ කෙසේද

යන්න හෙළිදරව් නොවී ඒ තැනැත්තාගේ මළ සිරුර සොයා ගනු ලැබූ හෝ සියලු අවස්ථා පිළිබඳව පරීක්ෂණයක් කිරීමට

අධිකරණ බලය තිබිය යුතු ය.

10. යම් නීතියක විශේෂිතවම අන්‍යාකාර විධිවිධාන සලසා ඇත්නම් මිස, දණ්ඩ නීති සංග්‍රහය යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන්, ඒ වරද නියමිත දිනයට පෙර හෝ පසුව හෝ සිදු කරනු ලැබුවේ වුව ද මේ සංග්‍රහයේ වෙනත් විධිවිධානවලට යටත්ව - දණ්ඩ නීති සංග්‍රහය යටතේ වූ වැරදි.

(අ) මහාධිකරණය විසින් ; හෝ

(ආ) පළමුවන උපලේඛනයේ අටවන තීරයෙහි ඒ වරද සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් නඩු විභාග කරනු ලැබිය හැකි බව දක්වා ඇති අවස්ථාවක මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් ; හෝ

නඩු විභාග කරනු ලැබිය හැකි ය.

11. යම් නීතියක විශේෂිතව ම අන්‍යාකාර විධිවිධාන සලසා ඇත්නම් මිස, දණ්ඩ නීති සංග්‍රහය නොවන වෙනත් යම් නීතියක් යටතේ වූ වරදක්, ඒ වරද නියමිත දිනයට පෙර හෝ පසුව හෝ සිදු කරනු ලැබුවේ වුව ද - වෙනත් නීති යටතේ වූ වැරදි.

(අ) ඒ වරද සම්බන්ධයෙන් ඒ නීතියෙහි යම් අධිකරණයක් සඳහන් කරනු ලැබ ඇති අවස්ථාවක-

(i) සඳහන් කරනු ලැබූ අධිකරණය මහාධිකරණය වන විට මහාධිකරණය විසින්ද නැතහොත් අවුරුදු දෙකක් ඉක්මවන කාලයක් බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් එක් දහස් පන්සියයක් ඉක්මවන දඩයකින් හෝ දඬුවම් කරනු ලැබිය හැකි වරදක් සම්බන්ධයෙන් වන විට සඳහන් කරනු ලැබූ අධිකරණය දිසා අධිකරණය වන අවස්ථාවක ඒ අධිකරණය විසින් ද;

(ii) සඳහන් කරනු ලැබූ අධිකරණය මහෙස්ත්‍රාත් අධිකරණය වන විට මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් ද නැතහොත් අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන දඩයකින් හෝ දඬුවම් කරනු ලැබිය හැකි වරදක් සම්බන්ධයෙන් වන විට සඳහන් කරනු ලැබූ අධිකරණය දිසා අධිකරණය වන අවස්ථාවක ඒ අධිකරණය විසින් ද

නඩු විභාග කරනු ලැබිය යුතු ය.

(ආ) ඒ වරද සම්බන්ධයෙන් ඒ නීතියෙහි යම් අධිකරණයක් සඳහන් කර නොමැති අවස්ථාවක -

(i) මහාධිකරණය විසින් ; හෝ

(ii) අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන දඩයකින් හෝ දඬුවම් කරනු ලැබිය හැකි වරදක් සම්බන්ධයෙන් වන විට මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින්

නඩු විභාග කරනු ලැබිය යුතු ය .

අධිචෝදනාවක් මත පමණක් මහාධිකරණය විසින් නඩු විභාග කළ යුතු බව.

**12.** මහාධිකරණය ඉදිරියේ නඩු විභාග කරනු ලැබීම සඳහා, චූදිත තැනැත්තාට විරුද්ධව නීතිපතිවරයා විසින් හෝ නීතිපතිවරයාගේ මෙහෙයවීමෙන් අධිචෝදනා කර ඇත්නම් මිස, මේ සංග්‍රහයේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, මහාධිකරණය විසින් යම් වරදක් සංජානනය නොකළ යුතු ය.

මහාධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි දණ්ඩන නියමය.

**13.** ලිඛිත නීතියකින් නියමිත යම් දඬුවමක් හෝ වෙනත් දණ්ඩනයක් මහාධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි ය .

මහෙස්ත්‍රාත් අධිකාරණයක් විසින් නියම කරනු ලැබිය හැකි දණ්ඩන නියමය.

**14.** පහත දැක්වෙන දණ්ඩන නියම අතුරින් යම් දණ්ඩන නියමයක් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් නියම කළ හැකි ය:-

(අ) අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් ;

(ආ) රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන දඩයක්;

(ඇ) * ඉවත් කරන ලදි. [2005 අංක 21 § 2]

(ඈ) ඉහත කී දණ්ඩන නියම වලින් යම් දණ්ඩන නියමයක්.

එසේ වුව ද, මේ වගන්තියෙහි සඳහන් කිසිවකින්, දඬුවම් කිරීමේ විශේෂ බලතල දෙනු ලබන, දැනට බල පවත්නා යම් ප්‍රඥප්තියක විධිවිධාන පරිච්ඡින්න කරනු ලබන ලෙස නොසැලකිය යුතු ය.

15. (i) මේ සංග්‍රහයෙහි, දණ්ඩ නීති සංග්‍රහයෙහි වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් හෝ නො එසේව හෝ යම් අධිකරණයක් විසින් කිසිම තැනැත්තකු දින හතකට අඩු කාලයක් බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් නොකළ යුතු ය.

දින හතකට අඩු කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමක් නොකළ යුතු බව.

(2) දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් හෝ නො එසේ ව හෝ වරදකරුවකු බන්ධනාගාරගත කිරීමට යම් ලිඛිත හෝ වෙනත් නීතියකින් යම් අධිකරණයකට බලය ලැබී ඇති අවස්ථාවක, බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කිරීම වෙනුවට, ඒ අධිකරණය විසින් ආඥාවක් කිරීමෙන්, ඒ ආඥාව කරන දිනයේ අපරභාග 8 නොඉක්මවන්නා වූ, ඒ අධිකරණය විසින් ඒ ආඥාවෙහි නියම කරනු ලබන කාලයක් ඒ වරදකරු ඒ අධිකරණයේ සීමාව තුළ රඳවා තැබිය යුතු බවට ආඥාවක් කරනු ලැබිය හැකි ය.

බන්ධනාගාරගත කිරීම වෙනුවට අධිකරණයේ සීමාව තුළ රඳවා තැබීමේ දණ්ඩන නියමය.

(3) දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් නියම කිරීමට නීතියෙන් බලය දී ඇති කාලයක බන්ධනාගාරගත කිරීමක් යම් අධිකරණයක් විසින් ඒ පැහැර හැරීම සම්බන්ධයෙන් නියම කරනු ලැබිය හැකි ය. එසේ වුවද එසේ නියම කරනු ලබන කාලය මේ සංග්‍රහය යටතේ ඒ අධිකරණයේ බලතල නොඉක්මවන කාලයක් විය යුතු ය.

දඩය ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කිරීමට අධිකරණවලට ඇති බලය.

* 2005 අංක 21 දරන පනතේ 2 වන වගන්තිය මගින් ඉවත් කරන ලදි.

(4) (3) වන උපවගන්තිය යටතේ නියම කරනු ලබන බන්ධනාගාරගත කිරීම 13 වන සහ 14 වන වගන්ති යටතේ අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි උපරිම කාලය සඳහා වූ බන්ධනාගාරගත කිරීමේ ප්‍රධාන දණ්ඩන නියමයකට අතිරේකව විය හැකි ය.

එකම නඩු විභාගයේ දී වෙන් වෙන් වැරදි සඳහා වරදකරු කරනු ලැබූ විට දණ්ඩන නියමය.

**16.** (1) යම් තැනැත්තකු එකම නඩු විභාගයක දී යම් ප්‍රභින්න වැරදි දෙකකට හෝ ඊට වැඩි ගණනකට වරදකරු කරනු ලැබූ විට, ඒ වැරදි සඳහා නියමිත වූ ද, නියම කිරීමට ඒ අධිකරණයට බලය ඇත්තා වූ ද වෙන් වෙන් දඬුවම් 301 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව එම තැනැත්තාට අධිකරණය විසින් නියම කළ හැකි ය. එම දඬුවම් බන්ධනාගාරගත කිරීම් වලින් ආරම්භ වන කල්හි, ඒ බන්ධනාගාරගත කිරීම් හෝ ඉන් කිසිවක් එක විට ගෙවී යා යුතු යැයි අධිකරණය විසින් ආඥා කරනු ලැබුවහොත් මිස, වැරදි කිහිපයම සඳහා මුළු දඬුවම් වල එකතුව, එසේ තනි වරදකට වරදකරු කරනු ලැබීමේ දී නියම කිරීමට ඒ අධිකරණයට බලය ඇති දඬුවම ඉක්මවන අවස්ථාවක වුව ද ඒ අධිකරණය විසින් විධාන කරනු ලබන ආකාරයට එක් බන්ධනාගාරගත කිරීමක් අවසන් වන විට අනිත් බන්ධනාගාරගත කිරීම ආරම්භ විය යුතු ය;

උපරිම දඬුවම් ප්‍රමාණය.

එසේ වුවද, නඩුව මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් විභාග කරනු ලැබේ නම්, මුළු දඬුවම ඒ අධිකරණයේ සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කිරීමට ඒ අධිකරණයට බලය ඇති දඬුවමේ ප්‍රමාණයෙහි දෙගුණයකට වැඩි නොවිය යුතු ය.

(2) එක් නඩු විභාගයක දී වෙන් වෙන් වැරදි සඳහා වරදකරු කළ විට (1) වන උපවගන්තිය යටතේ නියම කරනු ලැබූ මුළු දණ්ඩන නියමය අභියාචන කාර්යය සඳහා තනි දණ්ඩන නියමයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

### ආ - නඩු ගාස්තු සහ වන්දි ගෙවීම

නිදොස් කිරීමේ දී ගාස්තු සහ වන්දි ගෙවීම.

**17.** (1) අධිකරණයක් විසින් චූදිතයා නිදොස් කර හෝ නිදහස් කර පැමිණිල්ල නිස්සාර යයි හෝ පීඩා කර යයි ප්‍රකාශ කරනු ලබන කවර අවස්ථාවක වුව ද, අධිකරණය විසින් තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණයක රජයේ ගාස්තු ගෙවන ලෙස එම

අධිකරණය විසින් පැමිණිලිකරුට නියම කිරීම නිත්‍යානුකූල විය යුතු ය. ඊට අමතරව, අධිකරණය සුදුසු යයි කල්පනා කරන වන්දි මුදලක් වූදිතයාට හෝ එක් වූදිතයකුට වැඩියෙන් සිටින විට ඒ එක් එක් වූදිතයාට හෝ ගෙවන ලෙස අධිකරණය විසින් පැමිණිලිකරුට ඒ අවස්ථාවේ දී ම නියම කළ හැකි ය.

(2) යම් තැනැත්තකු විසින් පොලිස් නිලධරයකු ලවා වෙනත් තැනැත්තකු සිර භාරයට ගනු ලැබීමට සලස්වන කවර අවස්ථාවක දී වුවද, එසේ සිර භාරයට ගනු ලැබීමට සැලැස්වීම සඳහා ප්‍රමාණවත් හේතු නොතිබුණේ යයි නඩුව සංජානනය කරන අධිකරණයට පෙනී ගියහොත්, සිර භාරයට ගනු ලැබූ තැනැත්තාට ඔහුගේ කාලය සහ ආදායම නැතිවීම නිසා ද මේ කාරණය සම්බන්ධයෙන් ඔහු දැරූ වියදම් සඳහා ද අධිකරණය සුදුසු යයි කල්පනා කරන වන්දියක් සිර භාරයට ගැනීම සලස්වනු ලැබූ තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු යයි අධිකරණය විසින් නියම කළ හැකි ය. එක් තැනැත්තකුට වඩා වැඩි ගණනක් සිරභාරයට ගනු ලැබුවහොත්, අධිකරණය සුදුසු යයි කල්පනා කරන වන්දියක් ඒ ආකාරයට ම ඒ එක් එක් තැනැත්තා වෙත ප්‍රදානය කළ හැකි ය. ඒ වන්දිය ගෙවීම වැරදි ලෙස බන්ධනාගාරගත කිරීමක් සම්බන්ධයෙන් වූ නඩුවකට බාධාවක් නොවිය යුතු ය.

(3) ඉහතින් වූ උපවගන්ති යටතේ යම් ආඥාවක් කිරීමට පෙර, ඒ ආඥාව කිරීමට විරුද්ධව පැමිණිලිකරු විසින් දැක්විය හැකි යම් විරෝධය පෑමක් අධිකරණය විසින් වාර්තාගත කොට සලකා බැලිය යුතු අතර, අධිකරණය විසින් ඒ ආඥාව කරන්නේ නම්, එය කරනු ලබන්නේ යම් හේතු මත ද ඒ හේතු අධිකරණය විසින් වාර්තාගත කළ යුතු ය.

(4) යම් තැනැත්තකු යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ අවස්ථාවක වුව ද, නැතහොත් චෝදනා ඔප්පු වී ඇතැයි අධිකරණය තීරණය කළ ද වරදකරු නොකොට අධිකරණය වරදකරු සම්බන්ධයෙන් ක්‍රියා කරන අවස්ථාවක, වන්දි වශයෙන් අධිකරණයට සුදුසු යයි පෙනෙන මුදලක් අධිකරණය විධානය කරනු ලබන කාලය ඇතුළත හෝ එසේ විධානය කරනු ලබන වාරික වලින් හෝ ඒ වරදින් පීඩාවට පත් යම් තැනැත්තකුට ගෙවන ලෙස වරදකරු කරනු ලැබූ හෝ චෝදනා ඔප්පු වී ඇතැයි අධිකරණය තීරණය කරනු ලැබූ හෝ තැනැත්තාට අධිකරණය විසින් ආඥා කළ හැකි ය. වරදකරු කරනු ලැබූ විට වන්දි ගෙවීම.

(5) (4) වන උපවගන්තියෙහි සඳහන් වරදකරුගේ වයස අවුරුදු දහසයකට අඩු නම්, ඔහුගේ දෙමාපියන් විසින් හෝ භාරකරු විසින් හෝ ගෙවීම සුදුසු යයි අධිකරණය සැලකුව හොත් එසේ ගෙවිය යුතු යයි අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

(6) ගාස්තු වශයෙන් හෝ වන්දි වශයෙන් හෝ මේ වගන්තිය යටතේ ප්‍රදානය කරනු ලැබූ යම් මුදලක් අධිකරණය විසින් නියම කරන ලද දඩයක් ලෙස අයකර ගනු ලැබිය යුතු ය.

වන්දිය රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවිය යුතු බව.
[2005 අංක 14 § 2]

(7) වන්දි නියම කිරීම මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් සිදු කරනු ලැබූ විට එම වන්දි මුදල මහෙස්ත්‍රාත්වරයකු විසින් සාමාන්‍යයෙන් නියම කළ හැකි දඩ මුදලට වඩා වැඩි වුව ද, එය නොතකා, ඒ වන්දිය පිඩාවට පත් එක් එක් පාර්ශ්වකරුවකු වෙනුවෙන් රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවිය යුතු ය.

නඩුව පවරා ඉදිරියට ගෙන යෑමේ වියදම් පියවීම සඳහා දඩය යොදා ගත හැකි බව.

(8) අධිකරණයක් විසින් දඩයක් හෝ කොටයක් දඩයකින් සමන්විත දණ්ඩන නියමයක් නියම කරනු ලබන කවර අවස්ථාවක වුව ද අය කර ගන්නා ලද දඩය සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් -

(අ) නඩුව පවරා ඉදිරියට ගෙන යෑමේ දී නිසියාකාරව දරන ලද වියදම් පියවීම සඳහා ; හෝ

(ආ) කරන ලද වරද මගින් ඇති වූ හානියට වන්දි සඳහා හෝ යොදා ගත යුතු යයි අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

(9) එම කාරණයට ම අදාළ යම් තදනන්තර සිවිල් නඩුවක දී වන්දි මුදල් ප්‍රදානය කරනු ලබන අවස්ථාවේ දී, මේ වගන්තිය යටතේ වන්දි වශයෙන් ගෙවන ලද හෝ අය කර ගන්නා ලද යම් මුදලක් අධිකරණය විසින් සැලකිල්ලට ගත යුතු ය.

## ඇ - ප්‍රජා සේවා ආඥා

ප්‍රජා සේවා ආඥා.
[1985 අංක 49 § 2]

**18.** (1) අධිකරණය විසින්, යම් වූදිත තැනැත්තකු වරදකරු කොට බන්ධනාගාරගත කිරීමේ දී දණ්ඩන නියමයක් කිරීම වෙනුවට හෝ දඩයක් ගෙවීම පැහැර හැරීමේ දී චූදිත තැනැත්තකුට බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කිරීම

වෙනුවට (මෙහි මින් මතු "ප්‍රජා සේවා ආඥාව " යනුවෙන් සඳහන් කරනු ලබන) නියමිත ආකෘතියක වූ ආඥාවක් සටහන් කිරීමෙන්, එකී වූදිත තැනැත්තා විසින්, නම් කරන ලද ස්ථානයක දී, -

(අ) රජයේ හෝ රජයේ අනුග්‍රහය ලබන ව්‍යාපෘතියක ;

(ආ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ යම් පළාත් පාලන ආයතනයක ; හෝ

(ඇ) අවස්ථාවෝචිත පරිදි යම් පුණ්‍යායතනයක්, සමාජ සේවා සංවිධානයක් හෝ පූජනීය ස්ථානයක් භාරව සිටින තැනැත්තාගේ කැමැත්ත ඇතිව එවැනි පුණ්‍යායතනයක, සමාජ සේවා සංවිධානයක හෝ පූජනීය ස්ථානයක, බලය ලත් නිලධරයෙකුගේ විධානය සහ අධීක්ෂණය යටතේ, එම ආඥාවෙහි සඳහන් කරනු ලබන සේවාවක් ඉටු කරනු ලැබිය යුතු යයි විධාන කරනු ලැබිය හැකි ය.

(2) ප්‍රජා සේවා ආඥාවක කාල සීමාව, එම ආඥාව සටහන් කරනු ලබන දිනයෙන් ආරම්භව ඒ ආඥාවෙහි නියමිතව සඳහන් පරිදි, එක් වර්ෂයක් ඇතුළත දී ඉෂ්ට කළ යුතු, නියමිත පැය ගණන හතළිහකට අඩු නොවන්නා වූ ද, පැය දෙසිය හතළිහකට වැඩි නොවන්නා වූ ද, පැය ගණනකින් සමන්විත විය යුතු ය.

(3) ප්‍රජා සේවා ආඥාවක් සටහන් කරනු ලැබුවේ යම් වරදකරුවකු කරනු ලැබූ තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තා, තමාට ඉටු කරන ලෙස විධාන කරනු ලබන සේවය, ආඥාවෙහි සඳහන් පරිදි නියමිත පැය ගණන ඇතුළත දී ඉටු කිරීමට අපොහොසත් වන්නා වූ හෝ, බලයලත් නිලධරයා සෑහීමට පත් වන පරිදි එම සේවය ඉටු නොකරන්නා වූ හෝ එම ප්‍රජා සේවා ආඥාව අනුව ක්‍රියා කිරීමට යම් ආකාරයකින් පැහැර හරින්නා වූ හෝ අවස්ථාවක එම ප්‍රජා සේවා ආඥාව සටහන් කළ අධිකරණය විසින් -

(අ) එම ප්‍රජා සේවා ආඥාව වෙනස් කරනු ලැබීම ;

(ආ) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් ආකාරයට අලුත් ප්‍රජා සේවා ආඥාවක් සටහන් කරනු ලැබීම ; හෝ

(ඇ) එම ප්‍රජා සේවා ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කොට, එම ප්‍රජා සේවා ආඥාව කරන ලද්දේ යම් වරදක් සම්බන්ධයෙන් ද ඒ වරද සඳහා ඔහු සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබීම ; හෝ

නීත්‍යනුකූල විය යුතු ය.

(4) වරදකරුවකු කරනු ලැබූ තැනැත්තා විසින් ප්‍රජා සේවා ආඥාවේ කාල සීමාව තුළ දී, එම ප්‍රජා සේවා ආඥාව අනුව කටයුතු කරගෙන යන්නේ ද, නැතහොත් කටයුතු කර තිබේ ද යන්න සඳහන් කරමින් සේවාවන් ඉටු කිරීම පිළිබඳ වාර්තාවක් බලයලත් නිලධරයා විසින් ප්‍රජා සේවා ආඥාව සටහන් කළ අධිකරණය වෙත එම අධිකරණය විසින් තීරණය කරනු ලබන දිනයක හෝ දිනවල, ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් ප්‍රජා සේවා ආඥාව සටහන් කරනු ලැබිය යුතු ආකාරය සහ ප්‍රජා සේවා ආඥා ක්‍රියාවේ යෙදවිය යුතු ආකාරය නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා "බලයලත් නිලධරයා" යන්නෙන් -

(අ) රජයේ හෝ රජයේ අනුග්‍රහය ලබන ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් වූ විට එම ව්‍යාපෘතිය භාරව සිටින නිලධරයා;

(ආ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් සම්බන්ධයෙන් වූ විට ඒ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා;

(ඇ) රාජ්‍ය සංස්ථාවක් හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ සම්බන්ධයෙන් වූ විට එම රාජ්‍ය සංස්ථාවේ හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයා හෝ ප්‍රධාන විධායක නිලධරයා;

(අ) පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන් වූ විට එම පළාත් පාලන ආයතනයේ කොමසාරිස්වරයා හෝ ලේකම්වරයා; සහ

(ඉ) පුණ්‍යායතනයක්, සමාජ සේවා සංවිධානයක් හෝ පූජනීය ස්ථානයක් සම්බන්ධයෙන් වූ විට, ඒ ආයතනය, සංවිධානය හෝ ස්ථානය භාරව සිටින තැනැත්තා

අදහස් වේ.

## III වන කොටස

## පොදු විධිවිධාන

### III වන පරිච්ඡේදය

මහෙස්ත්‍රාත්වරයන්ට, පොලීසියට සහ සිර භාරයට ගැනීම කරන තැනැත්තන්ට ආධාර කිරීම හා තොරතුරු සැපයීම.

මහජනයා විසින්, මහෙස්ත්‍රාත්වරයන්ට හා සාම නිලධරයන්ට, ආධාර කළ යුතු අවස්ථා.

**19.** මහෙස්ත්‍රාත්වරයකු විසින් හෝ සාම නිලධරයකු විසින් -

(අ) ඒ මහෙස්ත්‍රාත්වරයාට හෝ සාම නිලධරයාට හෝ යම් තැනැත්තකු සිර භාරයට ගැනීමට බලය ඇත්තේ ද ඒ තැනැත්තා අල්ලා ගැනීමේ දී ;

(ආ) සාමය කඩ කිරීමක් හෝ යම් පොදු දේපළකට කිරීමට තැත් කෙරෙන යම් හානියක් හෝ වැළැක්වීමේ දී ;

(ඇ) කැරලි කෝලාහලයක් හෝ යම් කලහයක් මැඩ පැවැත්වීමේ දී;

යුක්ති සහගත ලෙස සහාය ඉල්ලනු ලබන්නේ යම් තැනැත්තකුගෙන් ද, ඒ සෑම තැනැත්තෙක් ම, ඒ මහෙස්ත්‍රාත්වරයාට හෝ සාම නිලධරයාට සහාය දීමට බැඳී සිටින්නේ ය.

වරෙන්තුව ක්‍රියාවේ යොදවන, සාම නිලධරයකු නොවන තැනැත්තකුට ආධාර කිරීම.

**20.** සාම නිලධරයකු නොවන තැනැත්තකු වෙත වරෙන්තුවක් ක්‍රියාවේ යොදවනු පිණිස යොමු කරනු ලැබ ඇති කල්හි, එම වරෙන්තුව ක්‍රියාවේ යෙදවීමට නියමිත තැනැත්තා තමා සමීපයෙහි සිට වරෙන්තුව ක්‍රියාවේ යෙදවීමෙහි නියුක්තව සිටී නම් එම වරෙන්තුව ක්‍රියාවේ යෙදවීමේ දී ඒ තැනැත්තාට වෙනත් යම් තැනැත්තකු විසින් ආධාර කළ හැකි ය.

ඇතැම් වැරදි. පිළිබඳව මහජනයා විසින් තොරතුරු සැපයිය යුතු බව .

**21.** (අ) දණ්ඩ නීති සංග්‍රහයේ පහත සඳහන් වගන්ති, එනම් 114 වන, 115 වන, 116 වන, 117 වන, 118 වන, 119 වන, 120 වන, 121 වන, 122 වන, 126 වන, 296 වන, 297 වන, 371 වන, 380 වන, 381 වන, 382 වන, 383 වන, 384 වන, 418 වන, 435 වන, 436 වන, 442 වන, 443 වන, 444 වන, 445 වන, සහ 446 වන, වගන්ති යටතේ දඬුවම් කළ හැකි යම් වරදක් සිදු කිරීම හෝ ඒ වරද සිදු කිරීමට වෙනත් යම් තැනැත්තකු තුළ ඇති අදහස;

(ආ) යම් හදිසි හෝ අස්වාභාවික මරණයක් හෝ සාහසික අපරාධයකින් වූ මරණයක් හෝ සැක කටයුතු අවස්ථාගත කරුණු යටතේ වූ මරණයක් ගැන හෝ යම් තැනැත්තකුගේ මරණය සිදු වූයේ කෙසේ දැයි හෙළිදරව් නොවී ඒ තැනැත්තාගේ මළ සිරුර සොයා ගනු ලැබූ බව

දන්නා සැම තැනැත්තකු ම, එම වරද සිදු කිරීම හෝ වරද සිදු කිරීමේ අදහස හෝ ඒ හදිසි, අස්වාභාවික හෝ සාහසික අපරාධයකින් වූ මරණය හෝ සැක කටයුතු අවස්ථාගත කරුණු යටතේ වූ මරණය හෝ ඒ මළ සිරුර හමුවීම හෝ පිළිබඳව තොරතුරු, සමාවට සෑහෙන හේතුවක් නොමැති විට, නොපමාව ළඟම පිහිටි මහෙස්ත්‍රාත් අධිකරණය වෙත හෝ ළඟම පිහිටි පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත හෝ සාම නිලධරයකු වෙත හෝ ළඟම ග්‍රාමයේ ග්‍රාම නිලධාරී වෙත හෝ දැනුම් දිය යුතු ය. සමාවට සෑහෙන හේතුවක් තිබේ නම් එය ඔප්පු කිරීමේ භාරය එසේ දන්නා තැනැත්තා කෙරෙහි විය යුතු ය.

**22.** සෑම ග්‍රාම නිලධාරයකු විසින් ම - | ඇතැම් කරුණු දැනුම් දීමට ග්‍රාම නිලධරයා බැඳී සිටින බව.

(අ) තමාට ක්‍රියා කිරීමට බලය ඇති ප්‍රාදේශීය බල ප්‍රදේශයේ සීමාව තුළ යම් වරදක් සිදු කිරීම හෝ සිදු කිරීමට තැත් කිරීම ;

(ආ) ඒ සීමාව තුළ, යම් හදිසි හෝ අස්වාභාවික මරණයක් හෝ සාහසික අපරාධයකින් හෝ සැක කටයුතු අවස්ථාගත කරුණු යටතේ වූ යම් මරණයක් හෝ සිදු වීම ;

(ඇ) යම් තැනැත්තකුගේ මරණය සිදු වූයේ කෙසේ දැයි හෙළිදරව් නොවී ඒ තැනැත්තාගේ මළ සිරුර සොයා ගනු ලැබීම

සම්බන්ධයෙන් තමා දන්නා හෝ තමා විසින් ලබා ගන්නා ලද තොරතුරක් ළඟම සිටින මහෙස්ත්‍රාත්වරයාට හෝ අධිකරණ බලය ඇති පරීක්ෂකවරයාට හෝ තමාගේ ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිලධරයාට හෝ වහාම දැනුම් දෙනු ලැබිය යුතු ය.

## IV වන පරිච්ඡේදය

## සිර භාරයට ගැනීම, සිර භාරයෙන් පැන යාම සහ නැවත සිර භාරයට ගැනීම

### අ - සිර භාරයට ගැනීම පිළිබඳ සාමාන්‍ය විධිවිධාන

**23.** (1) යම් තැනැත්තකු සිර භාරයට ගැනීමේ දී ඒ සිර භාරයට ගනු ලබන තැනැත්තා තමා අත්අඩංගුවට ගනු ලැබීමට වචනයෙන් හෝ ක්‍රියාවෙන් අවනත වුවහොත් මිස, ඔහු සිර භාරයට ගැනීම කරන තැනැත්තා විසින් සිර භාරයට ගනු ලබන තැනැත්තාගේ ශරීරය සැබවින් ම ස්පර්ශ කොට හෝ රඳවා තබා ඔහුව සිර භාරයට ගත යුතු ය. තවද සිර භාරයට ගනු ලබන තැනැත්තා සිර භාරයට ගනු ලබන්නේ යම් චෝදනාවක් හෝ දෝෂාරෝපණයක් මත ද ඒ චෝදනාවේ හෝ දෝෂාරෝපණයේ ස්වභාවය ඔහුට දැනුම් දිය යුතු ය. | සිර භාරයට ගත යුතු ආකාරය.

පැහැදිලි කිරීම - යම් තැනැත්තකු විධිමත් ලෙස සිර භාරයට නොගෙන ඒ තැනැත්තා රඳවා පෙහෝ ගමන් වළක්වා ගැනීම හෝ සියලු අරමුණු හෝ කාර්යය සඳහා ඒ තැනැත්තා අත් අඩංගුවෙහි සිටින විට සිර භාරයට ගැනීමක් කර නැති බව ව්‍යාජ ලෙස දැක්වීම හෝ ඒ තැනැත්තා සිර භාරයට ගැනීමක් ලෙස සැලකිය යුතුය.

සිර භාරයට ගැනීමේ උත්සාහයට ප්‍රතිරෝධය පෑම.

(2) ඒ තැනැත්තා තම සිර භාරයට ගැනීමේ උත්සාහයට බලහත්කාරයෙන් ප්‍රතිරෝධය පෑවහොත් හෝ සිර භාරයට ගනු ලැබීම මග හැරීමට තැත් කළ හොත්, ඒ සිර භාරයට ගැනීම කරන තැනැත්තා විසින් සිර භාරයට ගැනීම ක්‍රියාත්මක කිරීමට සාධාරණ ලෙස අවශ්‍ය උපක්‍රම යෙදිය හැකි ය.

(3) මරණීය දඬුවම දිය හැකි වරදකින් චෝදනා නොකරනු ලැබූ තැනැත්තකු සිර භාරයට ගැනීමේ දී ඔහුගේ මරණය සිදු කිරීමේ අයිතිවාසිකමක් මේ උපවගන්තියෙහි වූ කිසිවකින් නොලැබේ.

සිර භාරයට ගැනීමට සොයනු ලබන තැනැත්තකු ඇතුළු වූ ස්ථානයක් සෝදිසි කිරීම.

**24.** සිර භාරයට ගත යුතු යම් තැනැත්තකු යම් ස්ථානයකට ඇතුලු වී ඇතැයි හෝ ඒ ස්ථානය තුළ සිටිතැයි විශ්වාස කිරීමට හේතු, සිර භාරයට ගැනීමේ වරෙන්තුවක් යටතේ ක්‍රියා කරන හෝ සිර භාරයට ගැනීමේ බලය ඇති යම් තැනැත්තකුට ඇතහොත්, ඒ ස්ථානයේ පදිංචි හෝ ඒ ස්ථානය භාර තැනැත්තා විසින්, ඉහත කී ලෙස ක්‍රියා කරන හෝ එසේ බලය ඇති තැනැත්තාගේ ඉල්ලීම පිට, ඔහුට එහි නිදහසේ ඇතුළු වීමට ඉඩ දී එහි සෝදිසි කිරීමට සියලු සාධාරණ පහසුකම් සැලැස්විය යුතු ය.

ඇතුළු වීමට අවසර ලබා ගත නොහැකි විට අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය.

**25.** ඒ ස්ථානයට ඇතුළු වීමට 24 වන වගන්තිය යටතේ ඉඩ ලබා ගත නොහැකි වුවහොත්, යම් අවස්ථාවක දී වරෙන්තුවක් යටතේ ක්‍රියා කරන තැනැත්තකු විසින් ද, වරෙන්තුවක් නිකුත් කළ හැකි වුවත් සිර භාරයට ගත යුතු තැනැත්තාට පැන යාමේ අවස්ථාවක් නොදෙමින් ඒ වරෙන්තුව ලබා ගත නොහැකි යම් අවස්ථාවක දී සාම නිලධරයකු විසින් ද, ස්වකීය අධිකාරය සහ අරමුණු දැනුම් දීමෙන් හා ඇතුළු වීමේ අවසරය යථා පරිදි ඉල්ලා සිටිනු ලැබීමෙන් පසු අන් ලෙසකින් ඔහුට එහි ඇතුළු විය නොහැකි නම්, ඔහු ඒ ස්ථානයට ඇතුළු වී එහි සෝදිසි කිරීම ද

ඒ ස්ථානයට ඇතුළු විය හැකි වන සේ, සිර භාරයට ගත යුතු තැනැත්තාගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ යම් ස්ථානයක යම් බාහිර හෝ අභ්‍යන්තර දොරක් හෝ කවුළුවක් කඩා එය විවෘත කිරීම ද නීත්‍යනුකූල විය යුතු ය.

**26.** යම් වරදක් සම්බන්ධයෙන් යම් දෙයක් සොයා ගැනීම පිණිස යම් ගෙයක් හෝ ස්ථානයක් නීත්‍යනුකූලව සෝදිසි කරනු ලබන හෝ සෝදිසි කරනු ලැබීමට ආසන්න කවර අවස්ථාවක වුවද, ඒ සෝදිසිය නිම වන තුරු ඒ ගෙයි හෝ ස්ථානයෙහි සිටින සියලු තැනැත්තන් එහි රඳවා තැබීම නීත්‍යනුකූල විය යුතු අතර, සොයනු ලබන දෙයෙහි ස්වභාවය අනුව එය ඇඟෙහි සඟවා තබා ගත හැකි දෙයක් වී නම් එය සොයා ගැනීම සඳහා ඒ තැනැත්තන් මහෙස්ත්‍රාත්වරයකු විසින් හෝ පරීක්ෂකවරයකු විසින් හෝ පරීක්ෂකවරයකුට වඩා පදවියෙන් පහත් නොවූ පොලිස් නිලධරයකු විසින් හෝ ඔවුනතුරෙන් කෙනකු ඉදිරිපිට හෝ 30 වන වගන්තියට යටත් ව සෝදිසි කළ හැකි ය.

වරෙන්තුව යටතේ සෝදිසි කළ ස්ථානයෙහි සිටින තැනැත්තන් සෝදිසි කිරීම

**27.** සිර භාරයට ගැනීමක් ක්‍රියාත්මක කිරීමට බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් සිර භාරයට ගැනීමක් ක්‍රියාත්මක කිරීම පිණිස යම් ස්ථානයකට නීත්‍යනුකූලව ඇතුළු වීමෙන් පසු එහි රඳවා තබනු ලැබ සිටින තමා ම නිදහස් වීම පිණිස හෝ වෙනත් තැනැත්තකු නිදහස් කර ගැනීම පිණිස හෝ ඒ ස්ථානයේ යම් බාහිර හෝ අභ්‍යන්තර හෝ දොරක් හෝ කවුළුවක් කඩා විවෘත කළ හැකි ය.

නිදහස් කර ගැනීම පිණිස දොර කවුළු කඩා විවෘත කිරීමේ බලය.

**28.** සිර භාරයට ගනු ලැබූ තැනැත්තකු ඔහු පැන යාම වැළැක්වීමෙහි ලා අවශ්‍ය ප්‍රමාණයට වැඩි මැඩපැවැත්වීමක් ඔහු සම්බන්ධයෙන් නොකළ යුතු ය.

අනවශ්‍ය පමණට මැඩ පැවැත්වීම් නොකළ යුතු බව.

**29.** යම් තැනැත්තකු -

සිර භාරයට ගනු ලැබූ තැනැත්තන් සෝදිසි කිරීම.

(අ) ඇප ගැනීමට විධිවිධාන නොසැලැස්වුණු වරෙන්තුවක් යටතේ සාම නිලධරයකු විසින් සිර භාරයට ගනු ලැබූ හෝ ඇප ගැනීමට විධිවිධාන සැලැස්වුණු වරෙන්තුවක් යටතේ හෝ සිර භාරයට ගනු ලැබ ඒ සිර භාරයට ගනු ලැබූ තැනැත්තාට ඇප සැපයිය නොහැකි වූ ; හෝ

(ආ) වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගනු ලැබූ හෝ වරෙන්තුවක් යටතේ පෞද්ගලික තැනැත්තකු විසින් සිර භාරයට ගනු ලැබ, නීත්‍යනුකූලව ඇප දිය නොහැකි වූ නැතහොත් ඇප සැපයිය නොහැකි වූ

කවර අවස්ථාවක දී වුව ද, සිර භාරයට ගැනීම කරන සාම නිලධරයා විසින් හෝ පෞද්ගලික තැනැත්තකු විසින් සිර භාරයට ගැනීම කරන ලද අවස්ථාවක, ඔහු විසින් සිර භාරයට ගනු ලැබූ තැනැත්තා භාර දෙනු ලැබූ සාම නිලධරයා විසින් හෝ 30 වන වගන්තියට යටත්ව ඒ තැනැත්තා සෝදිසි කරනු ලැබ, ඔහු වෙත ඇති අවශ්‍ය ඇඳුම් නොවන සියලු ද්‍රව්‍ය ආරක්ෂා රැකවරණයේ තැබිය හැකි ය. තව ද ඒ ද්‍රව්‍ය අතුරින් අපරාධයේ උපකරණ හෝ ප්‍රතිඵල හෝ වෙනත් සාක්ෂි හෝ වන්නේ යයි විශ්වාස කිරීමට හේතු ඇති කිසිවක් ඔහු නිදහස් හෝ නිදොස් වන තුරු රඳවා තබා ගත හැකි ය.

ස්ත්‍රීන් සෝදිසි කළ යුතු ආකාරය.

**30.** ස්ත්‍රියක සෝදිසි කිරීමට සැලැස්වීම අවශ්‍ය වන කවර අවස්ථාවක දී වුව ද ඒ සෝදිසිය විනීතතාව කෙරෙහි ඉතාමත් සැලකිලිමත්ව වෙනත් ස්ත්‍රියක් විසින් කළ යුතු ය.

පීඩාකර ආයුධ අල්ලා ගැනීමේ බලය .

**31.** මේ සංග්‍රහය යටතේ සිර භාරයට ගැනීමක් කරන තැනැත්තා විසින් සිර භාරයට ගනු ලැබූ තැනැත්තා ළඟ තිබෙන යම් පීඩාකර ආයුධ හෝ වරදක් කිරීමට උපයෝගී කරගත හැකි යම් උපකරණයක් ඔහුගෙන් ගත හැකි අතර, සිර භාරයට ගැනීම කරන තැනැත්තා විසින් සිර භාරයට ගනු ලැබූ තැනැත්තා ඉදිරිපත් කරනු ලැබීමට නීතියෙන් නියමිත අධිකරණයට හෝ නිලධරයාට හෝ එසේ ගත් සියලු ආයුධ සහ උපකරණ භාර දිය යුතු ය .

## ආ - වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගැනීම

වරෙන්තුවක් නොමැතිව සාම නිලධරයන් විසින් සිර භාරයට ගත හැකි අවස්ථා.

**32.** (1) මහෙස්ත්‍රාත්වරයකුගේ ආඥාවක් නොමැතිව සහ වරෙන්තුවක් නොමැතිව යම් සාම නිලධරයකු විසින් -

(අ) තමා ඉදිරිපිට සාමය කඩ කිරීමක යෙදෙන යම් තැනැත්තකු ;

(ආ) යම් සංඥෙය වරදකට සම්බන්ධ වූ තැනැත්තකු හෝ එසේ සම්බන්ධ වූ බවට යම් තැනැත්තකුට විරුද්ධව සාධාරණ පැමිණිල්ලක් ලැබී තිබේ ද නැතහොත් ඒ බවට යම් තැනැත්තකුට විරුද්ධව විශ්වාස කටයුතු තොරතුරු ලැබී තිබේ ද නැතහොත් ඒ බවට යම් තැනැත්තකු සම්බන්ධයෙන් සාධාරණ සැකයක් පවතී ද එවැනි යම් තැනැත්තකු;

(ඇ) නීත්‍යානුකූල හේතුවක් නොමැතිව (හේතුවක් තිබේ නම් ඒ හේතුව ඔප්පු කිරීමේ භාරය ඒ තැනැත්තා වෙත පැවරී ඇත) ගෙවල් බිඳින උපකරණයක් තම සන්තකයෙහි තබා ගෙන සිටින යම් තැනැත්තකු;

(ඈ) වරද කරන්නකු ලෙස ප්‍රකාශයට පත් කර ඇත්තා වූ යම් තැනැත්තකු;

(ඉ) සොරකම් කරන ලදැයි හෝ වංචනික ලෙස ලබා ගන්නා ලදැයි සාධාරණව සැක කළ හැකි යම් දෙයක් තම සන්තකයෙහි තබාගෙන සිට අසු වුවද ඒ දෙය සම්බන්ධයෙන් වරදක් කළේ යයි සාධාරණව සැක කරනු ලබන්නා වූ ද යම් තැනැත්තකු ;

(ඊ) ස්වකීය රාජකාරියෙහි යෙදී සිටින සාම නිලධරයකුට බාධා කරන හෝ නීත්‍යානුකූල අත් අඩංගුවෙන් පැන ගිය හෝ පැන යාමට තැත් කරන යම් තැනැත්තකු ;

(උ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙන්, නාවික හමුදාවෙන් හෝ ගුවන් හමුදාවෙන් පළා යන්නකු යයි සාධාරණව සැක කරනු ලබන යම් තැනැත්තකු ;

(ඌ) සංඥෙය වරදක් කිරීමේ අදහසින් තමා සිටින බව සැඟවීමට පූර්වෝපාය යොදමින් සිටී යයි විශ්වාස කිරීමට හේතු ඇති කරවන අවස්ථා යටතේ සැඟවී සිටීමට පූර්වෝපාය යොදමින් සිට අසු වූ යම් තැනැත්තකු ;

(එ) ශ්‍රී ලංකාවෙහි දී කරනු ලැබී යම් වරදක් වශයෙන් ගෙන දඬුවම් කළ හැකි වූ ද, උදර්පනය හෝ පලායිත තැනැත්තන් හෝ පිළිබඳ තත් කාලයෙහි වලංගුව පවත්නා යම් නීතියක් යටතේ නැතහොත් වෙනත්

ආකාරයකින් ශ්‍රී ලංකාවේ දී අල්ලා ගනු ලැබීමට හෝ අත් අඩංගුවෙහි රඳවා තැබීමට යටත් වූ ද, වරදක් වන ක්‍රියාවක් ශ්‍රී ලංකාවෙන් පිටත යම් ස්ථානයක දී කිරීමට සම්බන්ධ වූ තැනැත්තකු හෝ එසේ සම්බන්ධ වූ බවට යම් තැනැත්තකුට විරුද්ධව සහේතුක පැමිණිල්ලක් කරනු ලැබ ඇත්තේ ද, නැතහොත් යම් තැනැත්තකු එසේ සම්බන්ධ වීමට විශ්වාස කටයුතු තොරතුරක් ලැබී ඇත්තේ ද නැතහොත් යම් තැනැත්තකුට විරුද්ධව සාධාරණ සැකයක් ඇති වී ඇත්තේ ද, එවැනි යම් තැනැත්තකු

සිර භාරයට ගත හැකි ය.

(2) වරෙන්තුවක් නොමැතිව යම් තැනැත්තකු සිර භාරයට ගැනීම සඳහා සාම නිලධරයකුට බලය පවරන්නා වූ වෙනත් යම් ප්‍රඥප්තියක ක්‍රියාකාරීත්වය කෙරෙහි බාධා කිරීමක් හෝ එය ලිහිල් කිරීමක් මේ වගන්තියෙහි කිසිවකින් සිදු වෙතැයි තීරණය නොකළ යුතු ය.

සංඥෙය නොවන වැරදිවල දී සිර භාරයට ගැනීමේ බලය.

**33.** (1) යම් තැනැත්තකු සංඥෙය නොවන වරදක් කළේ යයි සාම නිලධරයකු ඉදිරිපිට දී ඔහුට චෝදනා කරනු ලැබූ අවස්ථාවක තමාගේ නම හා පදිංචි ස්ථානය දන්වන ලෙස ඒ සාම නිලධරයා විසින් ඉල්ලා සිටි කල්හි එය දන්වා සිටීම ඒ තැනැත්තා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ අසත්‍ය යයි විශ්වාස කිරීමට ඒ සාම නිලධරයාට හේතු ඇති නමක් හෝ පදිංචි ස්ථානයක් ඒ තැනැත්තා විසින් දෙනු ලැබුවහොත්, ඔහුගේ නම හෝ පදිංචි ස්ථානය නිසැකව දැන ගැනීම සඳහා ඔහු සිර භාරයට ගැනීම ඒ සාම නිලධරයා විසින් කළ හැකි ය. තව ද සිර භාරයට ගැනීමෙන් පසු පැය විසි හතරක් ඇතුළත දී ඒ තැනැත්තාගේ සැබෑ නම සහ පදිංචි ස්ථානය නිසැකව දැන ගනු ලැබුවේ නම් හා මහෙස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ පෙනී සිටීමට ඔහුට නියම කරනු ලැබුවේ නම් එසේ එකී අධිකරණය ඉදිරියට පැමිණෙන බවට බැඳුම්කරයක් ඒ තැනැත්තා විසින් අත්සන් කරනු ලැබූ විට ඒ තැනැත්තා අප්‍රමාදව මුදා හැරිය යුතු අතර, ඔහුගේ සැබෑ නම හා පදිංචි ස්ථානය එසේ නිසැකව දැන ගත නොහැකි වුවහොත් ආසන්නතම මහෙස්ත්‍රාත් අධිකරණය වෙත යාම සඳහා අවශ්‍ය කාලය අත්හැර ඒ තැනැත්තා සිර භාරයට ගත් වේලාවේ සිට ගණන් බලනු ලබන පැය විසි හතරක් ඇතුළත දී ඒ තැනැත්තා ආසන්නතම මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ගෙන යා යුතු ය.

(2) සංඥෙය නොවන වරදක් කළේ යයි යම් තැනැත්තකු චෝදනා ලැබ සිටිය දී, ඒ තැනැත්තාට ශ්‍රී ලංකාවෙහි ස්ථිර පදිංචියක් නොමැති යයි ද ඔහු ශ්‍රී ලංකාව හැර යාමට ආසන්න යයි ද විශ්වාස කිරීමට සාම නිලධරයකුට හේතු ඇති කල්හි ඒ සාම නිලධරයා විසින් ඔහු සිර භාරයට ගත හැකි අතර, ආසන්නතම මහෙස්ත්‍රාත්වරයා වෙත ඔහු අප්‍රමාදව ගෙන යා යුතු ය. මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ පෙනී සිටින බවට ඇපකරුවන් ඇතිව හෝ නැතිව හෝ බැඳුම්කරයක් අත්සන් කිරීමට ඔහුට නියම කිරීම හෝ ඔහුට විරුද්ධව නඩු විභාග කරන තුරු ඔහු සිර භාරයේ තබා ගැනීමට ආඥා කිරීම හෝ ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් කළ හැකි ය.

වෙනත් ප්‍රාදේශීය බල සීමා තුළට වරදකරුවන් ලුහුබැඳ යෑම.

**34.** වරෙන්තුවක් නොමැතිව යම් තැනැත්තකු සිර භාරයට ගැනීමට බලය ඇති සාම නිලධරයකු විසින් ඒ තැනැත්තා සිර භාරයට ගැනීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ කවර කොටසකට වුව ද ඔහු ලුහුබැඳ යා හැකි ය.

පෞද්ගලික තැනැත්තන් විසින් සිර භාරයට ගැනීම සහ එසේ සිර භාරයට ගත් විට අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.

**35.** යම් පෞද්ගලික තැනැත්තකු විසින්, තමා ඉදිරිපිට දී සංඥෙය වරදක් කරන හෝ වරදකරුවකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ සිටින හෝ පැන දුවන්නා වූ ද සංඥෙය වරදක් කළ තැනැත්තෙකැයි සාධාරණව තමා සැක කරන්නා වූ ද යම් තැනැත්තකු සිර භාරයට ගත හැකි ය.ඔහු විසින් එසේ සිර භාරයට ගනු ලැබූ තැනැත්තා අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව ආසන්නතම සාම නිලධරයා වෙත භාර දිය යුතු ය. සාම නිලධරයකු නොමැති නම් ඒ තැනැත්තා ආසන්නතම පොලිස් ස්ථානයට ගෙන යා යුතු ය. එවැනි තැනැත්තකු 32 වන වගන්තියේ විධිවිධාන යටතට පත් වන්නකු බව විශ්වාස කිරීමට හේතු තිබේ නම් සාම නිලධරයකු විසින් ඔහු නැවත සිර භාරයට ගත යුතු ය. ඒ තැනැත්තා විසින් සංඥෙය නොවන වරදක් කර ඇතැයි විශ්වාස කිරීමට හේතු තිබේ නම් සහ තම නම සහ පදිංචි ස්ථානය දන්වන ලෙස පොලිස් නිලධරයකු විසින් ඉල්ලා සිටි කල්හි එය දන්වා සිටීම ඒ තැනැත්තා ප්‍රතික්ෂේප කරයි නම් හෝ අසත්‍ය යයි විශ්වාස කිරීමට ඒ නිලධරයාට හේතු ඇති නමක් නැතහොත් පදිංචි ස්ථානයක් ඒ තැනැත්තා දන්වා සිටි නම් හෝ ඒ තැනැත්තා ශ්‍රී ලංකාව හැර යාමට ආසන්න බව විශ්වාස කිරීමට හේතු ඒ නිලධරයාට තිබේ නම් හෝ, 33 වන වගන්තියේ විධිවිධාන යටතේ ඒ තැනැත්තා සම්බන්ධයෙන් ක්‍රියා කරනු ලැබිය යුතු ය. ඒ තැනැත්තා යම් වරදක් සිදු කර ඇතැයි විශ්වාස කිරීමට හේතු නොමැති නම් ඔහු වහාම නිදහස් කළ යුතු ය.

**සිර භාරයට ගනු ලැබූ තැනැත්තකු සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය**

**36.** වරෙන්තුවක් නොමැතිව යම් තැනැත්තකු සිර භාරයට ගන්නා වූ සාම නිලධරයකු විසින්, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව හා ඇප දීම සම්බන්ධයෙන් මෙහි ඇතුළත් විධිවිධානවලට යටත්ව, සිර භාරයට ගනු ලැබූ තැනැත්තා, ඒ කාරණය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයකු වෙත ගෙන යාම හෝ ඉදිරිපත් කරවීම කළ යුතු ය.

**සිර භාරයට ගනු ලැබූ තැනැත්තකු පැය විසි හතරකට වැඩි කාලයක් රඳවා තබා නොගත යුතු බව.**

**37.** වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගනු ලැබූ තැනැත්තකු අවස්ථාගත සියලු කරුණු අනුව යුක්ති සහගත වන කාලයකට වඩා දීර්ඝ කාලයක් අත් අඩංගුවෙහි රඳවා තබා ගැනීම හෝ අන් ලෙසකින් රැඳවීම කිසිම සාම නිලධරයකු විසින් නොකළ යුතු අතර, ඒ කාලය සිර භාරයට ගැනීම සිදු කළ ස්ථානයේ සිට මහෙස්ත්‍රාත්වරයා වෙත යාමට අවශ්‍ය කාලය අත්හැර ගණන් බැලිය යුතු පැය විසි හතරක කාලය නොඉක්ම විය යුතු ය.

**පොලිසිය විසින් සිර භාරයට ගැනීම් වාර්තා කළ යුතු බව.**

**38.** පොලිස් ස්ථාන වල නියුක්ත යම් පොලිස් නිලධරයකු විසින් වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගනු ලැබූ හෝ ඒ පොලිස් ස්ථාන භාර නිලධරයන් ඉදිරියට ගෙන එනු ලැබූ හෝ සියලුම තැනැත්තන් විෂයෙහි ලා, එසේ සිර භාරයට ගැනීම හෝ තමන් ඉදිරියට පැමිණ වීම සහ ඒ තැනැත්තන්ට ඇප දෙන ලද්දේ ද නැද්ද යන වග ඒ පොලිස් ස්ථාන භාර නිලධරයන් විසින්, ස්වකීය පොලිස් ස්ථාන පිහිටි ඒ ඒ දිස්ත්‍රික්කවල මහෙස්ත්‍රාත් අධිකරණ වෙත වාර්තා කළ යුතු ය.

**සිර භාරයට ගනු ලැබූ තැනැත්තකු නිදහස් කිරීම.**

**39.** සාම නිලධරයකු විසින් වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගනු ලැබූ යම් තැනැත්තකු, ඔහුගේ ම බැඳුම්කරය පිට හෝ ඇප පිට හෝ මහෙස්ත්‍රාත්වරයකුගේ විශේෂ ලිඛිත ආඥාවක් යටතේ හෝ මිස නිදහස් නොකළ යුතු ය.

**මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට සිදුකරනු ලැබූ වරද.**

**40.** මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට ඔහුගේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ දී යම් තැනැත්තකු විසින් වරදක් කරනු ලැබූ අවස්ථාවක ඒ මහෙස්ත්‍රාත්වරයා ම විසින් ඒ වරදකරු සිර භාරයට ගැනීම හෝ සිර භාරයට ගනු ලැබීමට යම් තැනැත්තකුට ආඥා කිරීම හෝ කළ හැකිය. එසේ සිර භාරයට ගනු ලැබූ විට ඇප සම්බන්ධයෙන් මෙහි ඇතුළත් විධිවිධාන වලට යටත්ව ඒ වරද කරන්නා අත් අඩංගුවේ තැබීමට නියම කළ හැකි ය.

**41.** තම අධිකරණ බල සීමාව තුළ දී යම් තැනැත්තකු යම් වේලාවක දී සහ යම් අවස්ථාගත කරුණු යටතේ සිර භාරයට ගැනීමට වරෙන්තුවක් නිකුත් කිරීමට බලය ඇති මහෙස්ත්‍රාත්වරයකු විසින් එවැනි කවර වූ වෙලාවක දී එවැනි තැනැත්තකු සිර භාරයට ගැනීම හෝ තමා ඉදිරියේ දී සිර භාරයට ගනු ලැබීමට විධාන කිරීම හෝ කළ හැකි ය.

මහෙස්ත්‍රාත්වරයකු විසින් හෝ ඔහු ඉදිරිපිට දී සිර භාරයට ගැනීම.

**42.** නිත්‍යානුකූල අත් අඩංගුවෙහි සිටින තැනැත්තකු පැන ගිය හොත් හෝ බේරාගනු ලැබුව හොත් හෝ ඔහු එසේ පැන ගියේ නැතහොත් බේරා ගනු ලැබුවේ යම් තැනැත්තෙකුගේ අත් අඩංගුවෙන් ද ඒ තැනැත්තා විසින් වහාම ඔහු ලුහුබැඳ ගොස් ඔහු අත් අඩංගුවෙහි සිටි අධිකරණ බල සීමාව තුළ වූ හෝ ඉන් පිටත වූ හෝ යම් ස්ථානයක දී ඔහු සිර භාරයට ගෙන මුල් වතාවෙහි ඒ තැනැත්තා අල්ලා ගනු ලැබූවිට ඔහු සම්බන්ධයෙන් ක්‍රියා කළ ආකාරයෙන් ම ඔහු සම්බන්ධයෙන් ක්‍රියා කළ හැකි ය.

නීත්‍යනුකූල අත් අඩංගුවෙන් පැන යන තැනැත්තකු ලුහුබැඳ ගොස් ඔහු නැවතත් අල්ලා ගැනීමේ බලය .

**43.** සිර භාරයට ගැනීම කරන තැනැත්තා වරෙන්තුවක් පිට ක්‍රියා නොකරන්නා වුත් සිර භාරයට ගැනීමේ බලය ඇති සාම නිලධරයකු නොවන්නා වුත් තැනැත්තකු වුව ද, 42 වන වගන්තිය යටතේ කරන සිර භාරයට ගැනීම සම්බන්ධයෙන් 24 වන, 25 වන සහ 27 වන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

42 වන වගනතිය යටතේ වූ සිර භාරයට ගැනීම් සම්බන්ධයෙන් 24 වන, 25 වන සහ 27 වන වගන්තිවල විධිවිධාන අදාළ වන බව.

**43 අ.** (1) 36 වන සහ 37 වන වගන්තිවල විධිවිධාන ළමා අපචාර සම්බන්ධයෙන් සැක කරනු ලැබූ හෝ චෝදනා කරනු ලැබූ තැනැත්තන් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

ළමා අපචාරය සම්බන්ධයෙන් සිර භාරයට ගනු ලැබූ තැනැත්තන් පිළිබඳ විශේෂ විධිවිධාන. [1998 අංක 28 § 3]

(2) ළමා අපචාරය පිළිබඳ සැක කරනු ලැබූ හෝ චෝදනා ලැබූ යම් තැනැත්තකු වරෙන්තුවක් නොමැතිව අත් අඩංගුවට ගනු ලබන පොලිස් නිලධරයකු විසින් සිර භාරයට ගැනීමෙන් පැය විසි හතරක් ඇතුළත අනවශ්‍ය ප්‍රමාදයක් නොමැතිව, ඒ තැනැත්තා නඩුව පිළිබඳ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අත් අඩංගුවට ගනු ලැබූ යම් තැනැත්තෙක් යම් මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියට පමුණුවනු ලබන්නේ ද ඒ මහෙස්ත්‍රාත්වරයා විසින්, විමර්ශන කටයුතු සඳහා

ඒ තැනැත්තා රඳවා තබා ගැනීම අවශ්‍ය බවට පොලිස් අධිකාරිවරයකුගේ නිලයට පහළ නොවූ නිලධරයකු විසින් හෝ ඔහු නොමැති විටක, ඔහු වෙනුවට ක්‍රියා කරන නිලධරයා විසින් සහතිකයක් ඉදිරිපත් කරනු ලැබූ විට, දින තුනකට නොවැඩි කාලයක් සඳහා එම තැනැත්තා පොලිස් අත් අඩංගුවේ රඳවා තබා ගැනීමට අවසර දෙමින් වූ ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(4) විමර්ශනය නිම කරනු ලැබීම හෝ (3) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවෙහි සඳහන් රඳවා තබා ගැනීමේ කාලය සම්පූර්ණ වීම යන දෙකෙන් කවර වූ හෝ දෙයක් කලින් සිදු වුව ද, එම තැනැත්තා මහෙස්ත්‍රාත්වරයා ඉදිරියට පමුණුවනු ලැබිය යුතු අතර, මේ පනතේ විධිවිධාන සහ ඒ තැනැත්තා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## V වන පරිච්ඡේදය

## පැමිණ සිටින ලෙස බල කිරීමේ අධිකරණ විධාන

### අ - සිතාසි

සිතාසිවල අවශ්‍ය කරුණු.

**44** (1) මේ සංග්‍රහය යටතේ අධිකරණයක් විසින් නිකුත් කරනු ලබන සෑම සිතාසියක් ම පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලකින් විය යුතු අතර සිතාසිය නිකුත් කරන රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඒ අධිකරණය විසින් පත් කරනු ලබන වෙනත් නිලධරයකු විසින් හෝ එය අත්සන් කළ යුතු ය; තවද එය නියමිත ආකෘතියෙහි විය යුතු ය.

(2) කැඳවනු ලබන තැනැත්තා අධිකරණයේ භාෂාව කියවීමට නොහැකි යයි විශ්වාස කරනු ලබන තැනැත්තෙක් වන්නේ නම්, ඒ පිටපත් දෙකින් එක් පිටපතකට ඒ තැනැත්තාට කියවිය හැකි යයි විශ්වාස කරනු ලබන භාෂාවෙන් වූ පරිවර්තනයක් අමුණා තිබිය යුතු ය.

(3) චෝදක පක්ෂයේ සාක්ෂිකරුවන් කිසිවකු වෙතොත් ඔවුන්ගේ නම් හා ලිපින සඳහන් ලැයිස්තුවක් ද සමග, චූදිත තැනැත්තකුට නඩු කටයුතු ඉදිරිපත් කර තිබේන්නේ යම් පැමිණිල්ලක් හෝ වාර්තාවක් නැතහොත් වෙනත් ලේඛනයක්

මත ද ඒ පැමිණිල්ලේ හෝ වාර්තාවේ නැතහොත් වෙනත් ලේඛනයේ පිටපතක් චූදිත තැනැත්තකු වෙත නිකුත් කරනු ලබන සෑම සිතාසියකම අමුණනු ලැබිය යුතුය.

**45.** (1) සාමාන්‍යයෙන්, පිස්කල් හෝ පිස්කල්ගේ නිලධරයකු විසින් හෝ සිතාසි භාර දිය යුතු ය. සිතාසි කෙසේ භාර දිය යුතු ද යන වග.

එසේ වුව ද -

(අ) නඩු කටයුතු පොලිස් නිලධරයකු විසින් පවරා තිබෙන අවස්ථාවක හෝ නඩුව මහාධිකරණය ඉදිරියේ තිබෙන අවස්ථාවක හෝ වෙනත් ආකාරයකින් සිතාසි භාර දිය නොහැකි අවස්ථාවක හෝ පොලිස් නිලධරයකු විසින් සිතාසි භාර දිය යුතු ය;

නැතහොත්

(අ) අවස්ථාගත කරුණු අනුව අවශ්‍ය වන අවස්ථාවක ග්‍රාම නිලධාරියකු විසින් සිතාසි භාර දෙනු ලැබීම සඳහා හෝ ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබීම සඳහා අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකිය.

(2) කැඳවනු ලබන තැනැත්තාට පුද්ගලිකව සිතාසියේ පිටපත් දෙකින් එකක් දීමෙන් හෝ භාර දීමෙන් සිතාසි භාර දීම කළ හැකි නම්, සිතාසි එසේ භාර දිය යුතු ය. අධිකරණයේ භාෂාව කියවීමට නොහැකි යැයි විශ්වාස කරනු ලබන තැනැත්තකු සම්බන්ධයෙන් වූ විට, ඒ පිටපතට ඒ තැනැත්තාට කියවිය හැකි යයි විශ්වාස කරනු ලබන භාෂාවෙන් වූ පරිවර්තනයක් අමුණා තිබිය යුතු ය.

(3) සමාගමක් හෝ සංස්ථාවක් හෝ පුද්ගලයන්ගේ සංස්ථාගත සංගමයක් සම්බන්ධයෙන් වූ විට, ඒ සමාගමෙහි, සංස්ථාවෙහි හෝ සංගමයේ කළමනාකාර අධ්‍යක්ෂවරයා, ලේකම්වරයා හෝ වෙනත් එවැනි නිලධරයකු වෙත හෝ ඒ සමාගමේ, සංස්ථාවේ හෝ සංගමයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය භාරව සිටින තැනැත්තා වෙත හෝ සිතාසි භාර දෙනු ලැබිය හැකි ය.

(4) සංස්ථාගත නොකළ පුද්ගලයන්ගේ සංගමයක් සම්බන්ධයෙන් වූ විට එම සංගමයේ සභාපතිවරයා, ලේකම්වරයා හෝ එහි වෙනත් එබඳු නිලධරයකු වෙත භාර දීමෙන් සිතාසි භාර දෙනු ලැබිය හැකි ය.

(5) සමාගමක්, සංස්ථාවක් හෝ සංස්ථාගත වූ හෝ නොවූ පුද්ගලයන්ගේ සංගමයක් වෙත (3) වන හෝ (4) වන හෝ උපවගන්තිය යටතේ සිතාසි භාර දෙනු ලැබිය නොහැකි අවස්ථාවක, ඒ සමාගමේ සංස්ථාවේ හෝ සංගමයේ ලියාපදිංචි කළ කාර්යාලයට හෝ ලියාපදිංචි කළ කාර්යාලයක් නොමැති නම්, එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයට හෝ එම සිතාසි ලියාපදිංචි තැපෑලෙන් යැවීමෙන් භාර දෙනු ලැබිය හැකි ය.

කැඳවනු ලැබූ තැනැත්තා සොයා ගත නොහැකි විට සිතාසි භාර දීම.

**46.** නිසි උද්යෝගයෙන් යුතුව ක්‍රියා කිරීමෙන් පසුව ද කැඳවිය යුතු තැනැත්තා සොයා ගත නොහැකි වූයේ නම්, ඔහුගේ පවුලේ යම් වැඩිහිටි සාමාජිකයකු වෙත හෝ ඔහු සමග වාසය කරන සේවකයකු වෙත ඔහු සඳහා පිටපත් දෙකින් එකක් සහ අවශ්‍ය අවස්ථාවල එහි පරිවර්තනයක් තබනු ලැබීමෙන් ඔහුට සිතාසි භාර දෙනු ලැබිය හැකි ය.

පෞද්ගලිකව භාර දීම ක්‍රියාත්මක කළ නොහැකි විට අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.

**47.** නිසි උද්යෝගයෙන් යුතුව ක්‍රියා කිරීමෙන් පසුව ද 45 වන වගන්තියෙන් සහ 46 වන වගන්තියෙන් නියමිත භාර දීම ක්‍රියාත්මක කළ නොහැකි වී නම් සිතාසියේ පිටපත් දෙකින් එකක් සහ අවශ්‍ය අවස්ථාවල එහි පරිවර්තනයක් කැඳවනු ලැබූ තැනැත්තා සාමාන්‍යයෙන් වාසය කරන නිවසේ හෝ වාසස්ථානයේ පැහැදිලිව පෙනෙන කොටසක, එය භාර දෙන නිලධරයා විසින් අලවනු ලැබිය යුතු ය. එවැනි අවස්ථාවක දී, ඇලවීමට පෙර හෝ පසුව අධිකරණය විසින් එසේ විධාන කරනු ලැබුවහොත් ඒ සිතාසි යථා පරිදි භාර දෙනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

රජයේ, පළාත් පාලන ආයතන හෝ සංස්ථා සේවකයන්ට භාර දීම.

**48.** (1) කැඳවනු ලබන තැනැත්තා රජයේ හෝ පළාත් පාලන ආයතනයක හෝ සංස්ථාවක සේවා නියුක්තයකු වන අවස්ථාවක සිතාසි නිකුත් කරන අධිකරණය විසින් එය සාමාන්‍යයෙන්, පිටපත් දෙකකින් යුක්තව, අවශ්‍ය අවස්ථාවල පරිවර්තනයක් ද සමග, එම තැනැත්තා සේවයෙහි නියුක්තව සිටින දෙපාර්තමේන්තුවෙහි හෝ කාර්යාලයෙහි ප්‍රධානයා වෙත යවනු ලැබිය යුතු ය. එවිට එම ප්‍රධානයා විසින් එම පිටපත් දෙකින් එකක්, අවශ්‍ය අවස්ථාවල පරිවර්තනයක් ද සමග, සේවා නියුක්තයාට පෞද්ගලිකව භාර දීමට සලස්වා භාර දුන් බවට පිටසන් ඇතිව අනෙක් පිටපත අධිකරණය වෙත ආපසු යැවිය යුතු ය.

(2) මේ වගන්තියෙහි " දෙපාර්තමේන්තුවේ හෝ කාර්යාලයේ ප්‍රධානයා" යන්න, -

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ යම් ඒකකයක සාමාජිකයකු සම්බන්ධයෙන් යෙදෙන විට දී, එම ඒකකයේ අණ දෙන නිලධරයා ද;

(ආ) පළාත් පාලන ආයතනයක සේවයේ නියුක්ත තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට දී, ඒ පළාත් පාලන ආයතනය මහා නගර සභාවක් නම්, එම සභාවේ නාගරික කොමසාරිස්වරයා ද ඒ පළාත් පාලන ආයතනය නගර සභාවක් හෝ සුළු නගර සභාවක් නම් එම නගර සභාවේ හෝ සුළු නගර සභාවේ ලේකම්වරයා ද ඒ පළාත් පාලන ආයතනය ගම් සභාවක් නම් එම ගම් සභාවේ සභාපතිවරයා ද;

(ඇ) රජයේ හෝ සංස්ථාවක වෙනත් යම් සේවා නියුක්තයකු සම්බන්ධයෙන් යෙදෙන විට දී, ඒ තැනැත්තා සේවයේ නියුක්ත, අවස්ථාවෝචිත පරිදි වූ, රජයේ දෙපාර්තමේන්තුවේ හෝ සංස්ථාවේ ප්‍රධානයා ද අදහස් වන්නේ ය.

**49.** (1) අධිකරණයක් විසින් නිකුත් කරන ලද සිතාසියක් භාර දෙනු ලැබූ විට අවස්ථාවෝචිත පරිදි, දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් කරවීමට යථා පරිදි බලය පවරන ලද නිලධරයකු ඉදිරියේ කරන ලදැයි කියනු ලබන එම භාර දීම පිළිබඳව දිවුරුම් පත්‍රයක් හෝ සාම නිලධරයකු විසින් කරන ලදැයි කියනු ලබන ඒ භාර දීම පිළිබඳව වාර්තාවක් හෝ තැපැල් කාර්යාලය විසින් තැපැල් කාර්යාලීය රීති යටතේ නිකුත් කරනු ලබන භාර දීමේ නිවේදනයක් හෝ 48 වන වගන්තියෙහි සඳහන් අවස්ථාවේ දී එම වගන්තියෙහි සඳහන් පිටසන හෝ සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු අතර, එසේ නොවේ යයි ඔප්පු කළහොත් මිස සහ එසේ ඔප්පු කරනු තුරු එහි කරන ලද ප්‍රකාශ නිවැරදි ලෙස සැලකිය යුතු ය. භාර දුන් බව ඔප්පු කිරීම.

(2) මේ වගන්තියෙහි සඳහන් පරිදි වූ වාර්තාවක් හෝ පිටසනක් කරන සෑම තැනැත්තෙක් ම එම ප්‍රකාශයෙහි හෝ පිටසනෙහි, සත්‍යය ප්‍රකාශ කිරීමට නීතියෙන් බැඳී සිටින්නේ ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් දිවුරුම් පත්‍රය සෑදීම සඳහා අවශ්‍ය දිවුරුම හෝ ප්‍රතිඥාව කරවීමට, ඒ සඳහා අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ යම් තැනැත්තකුට මෙයින් බලය පවරනු ලැබේ.

## ආ - සිර භාරයට ගැනීමේ වරෙන්තු

*සිර භාරයට ගැනීමේ වරෙන්තුවේ ආකෘතිය.*

**50.** (1) මේ සංග්‍රහය යටතේ අධිකරණයක් විසින් නිකුත් කරනු ලබන සෑම සිර භාරයට ගැනීමේ වරෙන්තුවක් ම ලියවිල්ලකින් විය යුතු අතර, ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් එය අත්සන් කර තිබිය යුතු ය. තව ද එය නියමිත ආකෘතියෙහි විය යුතු ය.

*සිර භාරයට ගැනීමේ වරෙන්තුවක් බල පවත්වන කාලය.*

(2) එවැනි සෑම වරෙන්තුවක් ම එය නිකුත් කරනු ලැබූ අධිකරණය විසින් අවලංගු කරනු ලබන හෝ එම වරෙන්තුව ක්‍රියාවේ යොදවනු ලබන තුරු හෝ බලාත්මකව පැවතිය යුතු ය.

*ඇප ගැනීමට අධිකරණය විසින් විධාන කළ හැකි බව.*

**51.** (1) යම් තැනැත්තකු සිර භාරයට ගැනීම සඳහා වරෙන්තුවක් නිකුත් කරන මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින්, ඒ තැනැත්තා නිශ්චිත වේලාවක දී සහ ඉන් ඉකිබිතිව අධිකරණය විසින් අන්‍යාකාර විධානයක් කරන තුරු අධිකරණය ඉදිරියට පැමිණ සිටින බවට ප්‍රමාණවත් ඇපකරුවන් සමඟ බැඳුම්කරයක් අත්සන් කරත හොත් ඒ වරෙන්තුව යොමු කරනු ලැබුවේ යම් නිලධරයකු වෙත ද ඒ නිලධරයා විසින් ඒ ඇපය ගෙන ඒ තැනැත්තා අත් අඩංගුවෙන් මුදා හැරිය යුතු ය. ඇප දිය නොහැකි වරදක් සම්බන්ධයෙන් වූ විට, වරෙන්තුව මත පිටසනක් මගින් විධාන කළ හැකි අතර ඇප දිය හැකි වරදක් සම්බන්ධයෙන් වූ විට එසේ විධාන කළ යුතු ය.

(2) පිටසනෙහි -

(අ) ඇපකරුවන්ගේ ගණන;

(ආ) ඇපකරුවන් ද, වරෙන්තුව නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකු සිර භාරයට ගැනීමට ද ඒ තැනැත්තා ද පිළිවෙලින් බැඳී සිටිය යුතු මුදල් ප්‍රමාණය,

(ඇ) ඔහු අධිකරණය ඉදිරියේ පෙනී සිටිය යුතු දිනය සහ වේලාව

සඳහන් විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ ඇපයක් ගනු ලැබූ කවර අවස්ථාවක වුව ද වරෙන්තුවක් යොමු කරනු ලැබූ නිලධරයා විසින් බැඳුම්කරය අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය.

**52.** (1) අධිකරණයක් විසින් නිකුත් කරනු ලබන සිර භාරයට ගැනීමේ වරෙන්තුවක්, සාමාන්‍යයෙන්, ඒ අධිකරණයේ පිස්කල් වෙත යැවිය යුතු අතර, තම වෙන් වූ සහ පිළිවෙලින් වූ අධිකරණ බල සීමා තුළ සියලු පිස්කල්වරයන්, පිස්කල්ගේ නිලධරයන් සහ සාම නිලධරයන් විසින් ද එසේ නැතහොත් ශ්‍රී ලංකාවේ ඕනෑම කොටසක යම් පොලිස් නිලධරයකු විසින් ද එය ක්‍රියාවේ යෙදවිය හැකි ය.

වරෙන්තුවක් කවරකු වෙත යොමු කළ යුතු ද යන වග.

(2) වරෙන්තුව නිකුත් කරන අධිකරණය විසින්, එය නමින් හෝ නිලයෙන් වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් වෙත යොමු කළ හැකි අතර ඒ තැනැත්තා හෝ තැනැත්තන් විසින් හෝ යම් පොලිස් නිලධරයකු විසින් හෝ එය ක්‍රියාවේ යෙදවිය හැකි ය.

(3) වරෙන්තුව සාම නිලධරයකු වෙත නමින් යොමු කොට තිබෙන විට, වෙනත් සාම නිලධරයකු විසින්, එය ඔහුගේ නමට පිටසන් කර ඇත්නම් මිස, ක්‍රියාවේ යෙදවීම නොකළ යුතු ය.

(4) එක් තැනැත්තකුට වැඩි ගණනක් වෙත වරෙන්තුව යොමු කොට තිබෙන විට, එය ඒ සියලු දෙනාම විසින් හෝ යම් එක් තැනැත්තකු විසින් හෝ වැඩි දෙනකු විසින් හෝ ක්‍රියාවේ යෙදවිය හැකි ය.

**53.** සිර භාරයට ගැනීමේ වරෙන්තුවක් ක්‍රියාවේ යොදවන තැනැත්තා විසින් ඒ වරෙන්තුවේ සාරය සිර භාරයට ගනු ලැබූ තැනැත්තාට දැනුම් දිය යුතු අතර, සිර භාරයට ගනු ලැබූ තැනැත්තා විසින් වරෙන්තුව පෙන්වන ලෙස ඉල්ලා සිටිනු ලැබුවහොත් එය නිකුත් කළ තැනැත්තා විසින් අත්සන් කරන ලද ඒ වරෙන්තුව හෝ එහි පිටපතක් ඒ සිර භාරයට ගනු ලැබූ තැනැත්තාට පෙන්විය යුතු ය.

වරෙන්තුවේ සාරය දැනුම් දීම.

**54.** සිර භාරයට ගැනීමේ වරෙන්තුවක් ක්‍රියාවේ යෙදවන තැනැත්තා විසින් (ඇප පිළිබඳ 51 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව) සිර භාරයට ගනු ලැබූ තැනැත්තා ඉදිරිපත් කරනු ලැබීමට තමාට නීතියෙන් නියමිත අධිකරණය වෙත අනවශ්‍ය

සිර භාරයට ගනු ලැබූ තැනැත්තා ප්‍රමාදයකින් තොරව අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු බව.

ප්‍රමාදයෙන් තොරව ඔහු ඉදිරිපත් කළ යුතු අතර, සිර භාරයට ගැනීම කරන ලද වේලාව සහ ස්ථානය ඔහු විසින් වරෙන්තුවෙහි පිටසන් කළ යුතු ය.

වරෙන්තුව ක්‍රියාවේ යෙදවිය හැකි වන්නේ කවර ස්ථානයක ද යන වග.

**55.** සිර භාරයට ගැනීමේ වරෙන්තුවක් ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක දී ක්‍රියාත්මක කළ හැකි ය.

අධිකරණ බල සීමාවෙන් පිටත දී ක්‍රියාවේ යෙදවීම සඳහා වූ වරෙන්තු.

**56.** (1) සිර භාරයට ගැනීමේ වරෙන්තුවක් නිකුත් කරන අධිකරණයෙහි ප්‍රාදේශීය බල සීමාවෙන් පිටත දී වරෙන්තුවක් ක්‍රියාවේ යෙදවීමට ඇති අවස්ථාවක, අධිකරණය විසින් ඒ වරෙන්තුව ක්‍රියාත්මක කළ යුතුව ඇත්තේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව ඇතුළත ද ඒ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත එය තැපෑලෙන් හෝ අන්‍යාකාරයකින් හෝ යවනු ලැබිය යුතු ය.

(2) ඒ වරෙන්තුව එසේ යවනු ලැබුවේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක් වෙත ද ඒ අධිකරණයේ මහෙස්ත්‍රාත්වරයා විසින් එහි තමාගේ නම පිටසන් කළ යුතු අතර, එය ක්‍රියාවේ යෙදවිය හැකි නම්, ස්වකීය ප්‍රාදේශීය අධිකරණ බල සීමාව ඇතුළත එය ක්‍රියාවේ යෙදවීමට සැලැස්විය යුතු ය.

(3) වරෙන්තුවක් ක්‍රියාවේ යෙදවිය යුත්තේ යම් මහෙස්ත්‍රාත්වරයකුගේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව ඇතුළත ද ඒ මහෙස්ත්‍රාත්වරයාගේ පිටසන ලබා ගැනීමේ දී ඇති වන ප්‍රමාදය හෝ ප්‍රසිද්ධිය එය ක්‍රියාවෙහි යෙදවීමෙහි ලා බාධාවක් වෙතැයි විශ්වාස කිරීමට හේතු ඇති කවර අවස්ථාවක වුව ද, වරෙන්තුව නිකුත් කරන අධිකරණය විසින්, එය යම් තැනැත්තකු වෙත විශේෂයෙන් යොමු කරනු ලැබිය හැකි ය; එසේ විශේෂයෙන් යොමු කරනු ලැබූ වරෙන්තුවක් වලංගු විය යුතු අතර, ඒ තැනැත්තා විසින් එය ඉහත කී පරිදි වූ පිටසනක් නොමැතිව ශ්‍රී ලංකාව තුළ ඕනෑම ස්ථානයක නීත්‍යනුකූලව ක්‍රියාවේ යෙදවිය හැකි ය;

එසේ වුව ද ඒ වරෙන්තුව ක්‍රියාවේ යෙද වූ පසු, සෑම විට ම 58 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

**57.** පිස්කල් වෙත යොමු කරනු ලැබූ වරෙන්තුවක් ඔහු පත් කරනු ලැබ ඇත්තේ යම් අධිකරණයකට ද ඒ අධිකරණයේ බල සීමාවෙන් පිටත දී ක්‍රියාවේ යෙදවිය යුතුව ඇති අවස්ථාවක, ඔහු විසින්, ඒ වරෙන්තුව ක්‍රියාවේ යෙදවිය යුතුව ඇත්තේ යම් අධිකරණයක ප්‍රාදේශීය බල සීමාව ඇතුළත ද ඒ අධිකරණයේ පිස්කල්වරයාගේ නමට එය පිටසන් කර ඉනික්බිතිව තැපෑලෙන් හෝ අන්‍යාකාරයකින් ඒ පිස්කල්වරයා වෙත යවනු ලැබිය යුතු ය. ඒ පිස්කල්වරයා විසින් ඒ වරෙන්තුව ලැබුණු විට, එය තමා වෙත මුලින්ම යොමු කරනු ලැබූ ලෙස ඒ ආකාරයෙන්ම ක්‍රියාවේ යෙදවිය යුතු ය.

අධිකරණ බල සීමාවෙන් පිටත දී ක්‍රියාවේ යෙදවීම සඳහා පිස්කල් වෙත යොමු කෙරෙන වරෙන්තු.

**58.** (1) සිර භාරයට ගැනීමේ වරෙන්තුවක් නිකුත් කරනු ලැබුවේ යම් අධිකරණයක් විසින් ද ඒ අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාවෙන් පිටත දී ඒ වරෙන්තුව ක්‍රියාවේ යොදවනු ලැබූ විට, වරෙන්තුව නිකුත් කළ අධිකරණය, සිර භාරයට ගැනීම සිදු කළ ස්ථානයේ සිට සැතපුම් විස්සක් ඇතුළත පිහිටියේ නම් හෝ සිර භාරයට ගැනීම කරනු ලැබුවේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව ඇතුළත ද ඒ මහෙස්ත්‍රාත් අධිකරණයට වඩා ආසන්න නම් හෝ මිස, නැතහොත් 51 වන වගන්තියට යටතේ ඇප ගනු ලැබුවහොත් මිස, සිර භාරයට ගනු ලැබූ තැනැත්තා අවසන් වරට සඳහන් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ගෙන යනු ලැබිය යුතු ය.

වරෙන්තුවක් නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකුට විරුද්ධව ද එම තැනැත්තා සිර භාරයට ගනු ලැබීමෙන් පසු කාර්ය පටිපාටිය.

(2). ඒ සිර භාරයට ගනු ලැබූ තැනැත්තා ඒ වරෙන්තුව නිකුත් කළ අධිකරණය විසින් අදහස් කරන ලද තැනැත්තා බව පෙනී ගිය හොත්, ඔහු ඒ වරෙන්තුව නිකුත් කළ අධිකරණය වෙත අත් අඩංගුවේ ගෙන යන ලෙස සිර භාරයට ගනු ලැබූ තැනැත්තා ඉදිරිපත් කරන ලද මහෙස්ත්‍රාත් අධිකරණය විසින් විධාන කළ යුතු ය.

එසේ වුව ද, වරද ඇප දිය හැකි වරදක් නම් ද, සිර භාරයට ගනු ලැබූ තැනැත්තා ගෙන එනු ලැබ සිටින අධිකරණය සෑහීමට පත් වන සේ ඇප දීමට ඔහු සූදානම් හා කැමති නම් හෝ එසේ වූ විධානයක් හෝ 51 වන වගන්තිය යටතේ වරෙන්තුවෙහි පිටසන් කරනු ලැබ, ඒ විධානයේ නියමිත ඇප පොරොන්දු දීමට ඒ තැනැත්තා සූදානම් හා කැමති නම් ද අධිකරණය විසින්, අවස්ථාවෝචිත පරිදි ඒ ඇපය හෝ ඇප පොරොන්දුව භාර ගෙන ඒ බැඳුම්කරය ඒ වරෙන්තුව නිකුත් කළ අධිකරණය වෙත යැවිය යුතු ය..

(3) 51 වන වගන්තිය යටතේ සාම නිලධරයකු විසින් ඇප ගැනීම මේ වගන්තියෙහි සඳහන් කිසිවකින් වළක්වනු ලබතැයි සලකනු නොලැබිය යුතු ය.

වරෙන්තුව ළඟ නොමැති වුවද සිර භාරයට ගනු ලැබිය හැකි බව.

**59.** යම් තැනැත්තකු සිර භාරයට ගනු ලැබීම සඳහා වරෙන්තුවක් නිකුත් කරනු ලැබ ඇති තැනැත්තකු යයි විශ්වාස කිරීමට පොලිස් නිලධරයකුට සාධාරණ හේතු ඇති අවස්ථාවක මේ පරිච්ඡේදයෙහි පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, ඒ වරෙන්තුව ඒ අවස්ථාවෙහි තම සන්තකයෙහි නොමැති වුව ද ඒ වරෙන්තුව ක්‍රියාවෙහි යෙදවීමෙහි ලා ඔහු විසින් ඒ තැනැත්තා සිර භාරයට ගනු ලැබිය හැකි ය.

## ඇ - ප්‍රකාශන හා තහනමට ගැනීම

පැන ගොස් සැඟ වී සිටින තැනැත්තන් සඳහා ප්‍රකාශනය කිරීම.

**60.** (1) යම් අධිකරණයක් විසින් යම් තැනැත්තකුට විරුද්ධව නිකුත් කරනු ලැබූ වරෙන්තුවක් ක්‍රියාවේ යෙදවිය නොහැකි වන සේ ඒ තැනැත්තා පැන ගොස් සැඟවී සිටින බව හෝ සැඟවෙමින් සිටින බව විශ්වාස කිරීමට (සාක්ෂි සටහන් කර ගැනීමෙන් පසුව හෝ නොඑසේ ව) ඒ අධිකරණයට හේතු ඇතහොත්, ප්‍රකාශනය ප්‍රසිද්ධ කිරීමේ දින සිට දවස් තිහකට නොඅඩු කාලයක දී නියමිත ස්ථානයක දී හා නියමිත වේලාවක දී ඒ තැනැත්තා පෙනී සිටිය යුතු යයි නියම කරමින් ඒ අධිකරණය විසින් ලිඛිත ප්‍රකාශනයක් පළ කළ හැකි ය.

(2) ඒ ප්‍රකාශනය පහත දැක්වෙන පරිදි, එනම් -

(අ) සිංහල සහ දෙමළ භාෂාවලින් පිළියෙල කරන ලද ඒ ප්‍රකාශනය ඒ තැනැත්තා සාමාන්‍යයෙන් පදිංචි නගරයෙහි හෝ ග්‍රාමයෙහි ප්‍රකට ස්ථානයක දී එම භාෂා දෙකින් ම ප්‍රසිද්ධියේ කියවනු ලැබීමෙන්;

(ආ) ඒ තැනැත්තා සාමාන්‍යයෙන් පදිංචි ගෙයි හෝ වාසස්ථානයේ ප්‍රකටව පෙනෙන කොටසක හෝ ඒ නගරයේ හෝ ග්‍රාමයේ ප්‍රකට ස්ථානයක ඒ ප්‍රකාශනයේ සිංහල හා දෙමළ පිටපත් අලවනු ලැබීමෙන්; සහ

(ඇ) අධිකරණ ශාලාවේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ඒ ප්‍රකාශනයේ සිංහල හා දෙමළ පිටපත් අලවනු ලැබීමෙන්

පළ කරනු ලැබිය යුතු ය.

(3) නියමිත දිනයක දී ප්‍රකාශනය යථා පරිදි පළ කරන ලද බවට ඒ ප්‍රකාශනය නිකුත් කරන අධිකරණය විසින් කරනු ලබන ප්‍රකාශයක්, මේ වගන්තියේ නියමයන්ට අනුකූලව ක්‍රියාකර තිබෙන බවට ද එදින ඒ ප්‍රකාශනය කරනු ලබන බවට ද තීරණාත්මක සාක්ෂි විය යුතු ය.

පැන ගොස් සැඟ වී සිටින තැනැත්තන්ගේ දේපළ තහනමට ගැනීම.

**61.** (1) 60 වන වගන්තිය යටතේ ප්‍රකාශනයක් නිකුත් කිරීමෙන් පසුව අධිකරණය විසින්, ඒ ප්‍රකාශිත තැනැත්තාට අයත් චංචල හෝ නිශ්චල හෝ ඒ දෙයාකාරයේ ම හෝ යම් දේපළක් තහනමට ගන්නා ලෙස ආඥා කළ හැකි ය.

(2) ඒ ආඥාව කළ අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ පිහිටි ඒ තැනැත්තාට අයත් යම් දේපළක් තහනමට ගැනීමට ඒ ආඥාවෙන් බලය දිය යුතු අතර, ඒ තැනැත්තාට අයත් වූ ද ඒ අධිකරණ බල සීමාවෙන් පිටත පිහිටියා වූ ද යම් දේපළක් සම්බන්ධයෙන් වන විට, ඒ දේපළ පිහිටා ඇත්තේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක බල සීමාව තුළ ද ඒ මහෙස්ත්‍රාත් අධිකරණයේ මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ ආඥාව පිටසන් කරනු ලැබූ කල්හි ඒ දේපළ තහනමට ගැනීමට ද ඒ ආඥාවෙන් බලය දිය යුතු ය.

(3) තහනමට ගන්නා ලෙස ආඥා කොට ඇති දේපළ ණය වලින් හෝ වෙනත් චංචල දේපළවලින් සමන්විත වේ නම්, මේ වගන්තිය යටතේ වූ තහනමට ගැනීම -

(අ) ඒ දේපළ තහනම් කිරීමෙන්; හෝ

(ආ) දේපළ භාර ගන්නකු පත් කිරීමෙන්;

(ඇ) අධිකරණය සුදුසු යයි කල්පනා කරන ඒ සියලු ක්‍රම මගින් හෝ එයින් යම් ක්‍රම දෙකක් මගින්

කළ යුතු ය.

(4) තහනමට ගන්නා ලෙස ආඥා කොට ඇති දේපළ නිශ්චල දේපළ වේ නම්, මේ වගන්තිය යටතේ වූ තහනමට ගැනීම, ඒ දේපළ පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් මගින් -

(අ) ඒ දේපළ සන්තකය භාර ගැනීමෙන්; හෝ

(ආ) දේපළ භාරගන්නකු පත් කිරීමෙන් ; හෝ

(ඇ) ප්‍රකාශිත තැනැත්තාට හෝ ඔහු වෙනුවෙන් අන් කිසිවකුට කුලිය ගෙවීම හෝ ඒ දේපළ භාර දීම තහනම් කෙරෙන ලිඛිත ආඥාවකින්; හෝ

(ඈ) අධිකරණය සුදුසු යයි කල්පනා කරන ඒ සියලු ක්‍රම මගින් හෝ එයින් යම් ක්‍රම දෙකක් මගින්

කළ යුතු ය.

(5) මේ වගන්තිය යටතේ පත් කරනු ලබන දේපළ භාර ගන්නකුගේ බලතල, කාර්ය හා බැඳීම් සිවිල් නඩු කටයුත්තක දී පත් කරනු ලබන දේපළ බාරගන්නකුගේ බලතල, කාර්ය හා බැඳීම් ම විය යුතු ය.

(6) ප්‍රකාශිත තැනැත්තා ප්‍රකාශනයෙහි සඳහන් කාලය තුළ පෙනී නොසිටිය හොත්, තහනමට ගැනීමට යටත් දේපළ අමාත්‍යවරයා විසින් සුදුස්සක් කළ හැකි දේපළ විය යුතු නමුදු, ඒ දේපළ ඉක්මනින් හා ස්වභාවිකව නරක් වන ස්වභාවයෙන් යුක්ත වුවහොත් හෝ එය විකිණීම එහි අයිතිකරුගේ ප්‍රතිලාභය පිණිස වේ යයි අධිකරණය විසින් සලකනු ලබන්නේ නම් මිස තහනමට ගැනීමේ දින සිට මාස හයක් ඉකුත් වන තුරු එය නොවිකිණිය යුතු ය. එහෙත් යථෝක්ත අවස්ථා දෙකින් කවර අවස්ථාවක දී වුව ද අධිකරණය සුදුසු යයි කල්පනා කරන කවර හෝ වේලාවක දී එය විකිණීමට සැලැස්වීම අධිකරණය විසින් කළ හැකි ය.

(7) නිශ්චල දේපළ තහනමට ගැනීමේ ඒ සෑම ආඥාවක් පිළිබඳව ම ඒ ආඥාව කරන අධිකරණය විසින් ඒ දේපළ පිහිටි ප්‍රදේශයේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයාට නොපමාව දැනුම් දිය යුතු අතර ඒ රෙජිස්ට්‍රාර්වරයා විසින් එය නොපමාව ලියාපදිංචි කළ

යුතු ය. තව ද ඒ කිසිම ආඥාවක්, එය ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ලියාපදිංචි කරන තුරු ක්‍රියාත්මක නොවිය යුතු ය.

(8) නිශ්චල දේපළ විකුණනු ලබන අවස්ථාවක, ගැනුම්කරුට දෙනු ලබන හිමිකරය ඒ දේපළ පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් විසින් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් හෝ ලියා අත්සන් කළ යුතු අතර, එසේ ලියා අත්සන් කරන ලද හිමිකරයක් මගින් ඒ හිමිකරය ප්‍රකාශිත තැනැත්තා විසින් ම ලියා අත්සන් කරන ලද්දක් මෙන් ඒ ආකාරයෙන් ම, ඒ දේපළ ඒ ගැනුම්කරු සතු විය යුතු ය.

තහනමට ගත් දේපළ පුනස්ථාපනය කිරීම.

**62**. 61 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සුදුස්සක් කළ හැකිව තිබෙන්නේ හෝ තිබුණේ යම් තැනැත්තකුගේ දේපළ සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා ඒ තහනමට ගත් දින සිට අවුරුද්දක් ඇතුළත ඒ දේපළ තහනම් කිරීමේ ආඥාව නිකුත් කළ අධිකරණය ඉදිරියෙහි සිය කැමැත්තෙන් පෙනී සිට හෝ ඒ අධිකරණය ඉදිරියට අල්ලා ගෙන එනු ලැබ වරෙන්තුව ක්‍රියාත්මක කරනු ලැබීම මග හැරීමේ කාර්යය සඳහා තමා පැන ගොස් සැඟ වී නොසිටි බවත් ප්‍රකාශනයෙහි සඳහන් කාලය ඇතුළත අධිකරණය ඉදිරියෙහි තමාට පෙනී සිටිය හැකි වන සේ ඒ ප්‍රකාශන පිළිබඳ දැන්වීම තමාට නොලැබුණු බවත් ඒ අධිකරණය සෑහීමට පත් වන පරිදි ඔප්පු කළහොත්, ඒ දේපළ හෝ එය විකුණන ලද නම්, ඒ විකිණීමෙන් ලත් ශුද්ධ අය හෝ ඒ දේපළින් කොටසක් පමණක් විකුණනු ලැබී නම් ඒ විකිණීමෙන් ලත් ශුද්ධ අය හා දේපළෙහි ඉතිරි කොටස ඒ තහනමට ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් දරන ලද සියලු වියදම් පියවීමෙන් පසු, ඔහුට භාර දිය යුතු ය.

## ඈ - අධිකරණ නියෝග පිළිබඳ වෙනත් රීති

සිතාසි වෙනුවට හෝ සිතාසි වලට අමතරව වරෙන්තු නිකුත් කිරීම.

**63.** (1) ජූරි සභිකයකු හැර, වෙනත් යම් තැනැත්තකුට පෙනී සිටීම සඳහා සිතාසියක් නිකුත් කිරීමට මේ සංග්‍රහය මගින් යම් අධිකරණයකට බලය පවරා ඇති කවර හෝ විටක -

(අ) සිතාසි නිකුත් කිරීමට පෙර හෝ සිතාසි නිකුත් කිරීමෙන් පසු, එහෙත් ඔහුට පැමිණ පෙනී සිටීම සඳහා නියම කරනු ලැබූ වේලාවට පෙර, ඔහු පැන ගොස් සැඟවී

සිටින බව හෝ සිතාසියට කීකරු නොවේ යයි විශ්වාස කිරීමට හේතු ඇති බව අධිකරණයට පෙනී යන්නේ නම් ; හෝ

(ආ) ඔහුට අධිකරණයෙහි පෙනී සිටීමට නියම කරන ලද වේලාවෙහි පෙනී සිටීම ඔහු විසින් පැහැර හරිනු ලැබ සහ සිතාසියට අනුකූලව පෙනී සිටීමට ඔහුට හැකි වන සේ කල් ඇතිව සිතාසිය යථා පරිදි ඔහුට භාර දී ඇති බව ඔප්පු වී සහ ඒ පැහැර හැරීම පිළිබඳව සාධාරණ හේතුවක් ඉදිරිපත් නොකරනු ලැබේ නම්,

ඒ අධිකරණය විසින්, ඒ තැනැත්තා සිර භාරයට ගැනීම සඳහා වරෙන්තුවක් නිකුත් කිරීම ස්වකීය හේතු වාර්තාගත කිරීමෙන් පසුව කළ හැකි ය.

වරෙන්තුව ක්‍රියාවේ යෙදවීමේ වියදම් දැරීම පිණිස අධිකරණය විසින් තැන්පත් මුදලක් නියම කළ හැකි බව.

(2) වරෙන්තුව ක්‍රියාවේ යෙදවීමේ දී දරන්නට සිදුවිය හැකි යම් වියදමක් පියවීමේ කාර්යය සඳහා අධිකරණය සාධාරණ යයි සලකන යම් මුදලක් ඒ වරෙන්තුව නිකුත් කරන ලෙස ඉල්ලා සිටින තැනැත්තා විසින් තැන්පත් කළ යුතුය යන්න, අධිකරණය විසින්, (1) වන උපවගන්තිය යටතේ වරෙන්තුවක් නිකුත් කිරීමේ දී කොන්දේසියක් කළ හැකි ය.

පෙනී සිටීම සඳහා බැඳුම්කරයක් ගැනීමේ බලය.

**64**. (1) යම් අධිකරණයක මුලසුන දරන නිලධරයා විසින් සිතාසියක් හෝ වරෙන්තුවක් නිකුත් කරනු ලැබීමේ බලය ඔහුට පවරා ඇත්තේ යම් තැනැත්තකුගේ පෙනී සිටීම සඳහා ද නැතහොත් යම් තැනැත්තකු සිර භාරයට ගැනීම සඳහා ද ඒ තැනැත්තා ඒ අධිකරණයට පැමිණ සිටින විට, ඒ තැනැත්තා ඒ අධිකරණයෙහි පෙනී සිටීම සඳහා ඇපකරුවන් ඇතිව හෝ නැතිව බැඳුම්කරයක් ලියා අත්සන් කළ යුතු යයි ඒ අධිකරණයෙහි මුලසුන දරන නිලධරයා විසින් ඒ තැනැත්තාට නියම කළ හැකි ය.

(2) අධිකරණයක් ඉදිරියෙහි පෙනී සිටීමට මේ සංග්‍රහය යටතේ වූ යම් බැඳුම්කරයකින් බැඳී සිටින යම් තැනැත්තකු එසේ පෙනී නොසිටින කල්හි, ඒ තැනැත්තා සිර භාරයට ගෙන තමා ඉදිරියට පමුණුවන ලෙස විධාන කරමින් වරෙන්තුවක් ඒ අධිකරණයේ මුලසුන දරන නිලධරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි ය.

ශ්‍රී ලංකාවේ ඕනෑම කොටසක දී සිතාසි භාර දිය හැකි බව.

**65.** (1) පෙනී සිටීම සඳහා වූ සිතාසි ශ්‍රී ලංකාවේ ඕනෑම කොටසක දී භාර දෙනු ලැබිය හැකි ය. එසේ වුව ද සිතාසිය නිකුත් කරන අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාවෙන් පිටත දී එවැනි සිතාසි භාර දීමේ දී, "අධිකරණ බල සීමාවෙන් පිටත දී භාර දීම සඳහා " යන වචනය ඒ අධිකරණය විසින් සිතාසියෙහි පිටසන් කරන්නේ නම් මිස, එය භාර දෙනු නොලැබිය යුතු ය.

(2) එවැනි සිතාසියක "අධිකරණ බල සීමාවෙන් පිටත දී භාර දීම සඳහා" යන වචන පිටසන් කිරීම, එවැනි භාර දීමකට ඉඩ දීම සඳහා හේතු ඇති බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම් මිස නොකළ යුතු ය.

(3) වරෙන්තු යොමු කිරීම හා ක්‍රියාවේ යෙදවීම පිළිබඳ මේ පරිච්ඡේදයේ විධිවිධාන සිතාසි සම්බන්ධයෙන් ද හැකි තාක් දුරට අදාළ විය යුතු ය.

## VI වන පරිච්ඡේදය

### ලේඛන සහ වෙනත් චංචල දේපළ ඉදිරිපත් කරන ලෙස බල කිරීම සඳහා වූ සහ අයුතු ලෙස රඳවා ගෙන සිටින තැනැත්තන් සොයා ගැනීම සඳහා වූ අධිකරණ විධාන පිළිබඳව

### අ - ඉදිරිපත් කරන ලෙසට වූ සිතාසි

ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීමට සිතාසි.

**66.** (1) මේ සංග්‍රහය යටතේ යම් අධිකරණයක් විසින් හෝ යම් අධිකරණයක් ඉදිරියේ පවත්වනු ලබන යම් නඩු කටයුත්තක කාර්යය සඳහා යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි ඒ අධිකරණය විසින් සලකනු ලබන කවර විටක දී වුව ද, සිතාසියේ සඳහන් වේලාවේ දී, එහි සඳහන් ස්ථානයට පැමිණ ඒ ලේඛනය හෝ දෙය ඉදිරිපත් කරන ලෙස හෝ සිතාසියේ සඳහන් වේලාවේ දී හා එහි සඳහන් ස්ථානයේ දී එය ඉදිරිපත් කරන ලෙස ඒ ලේඛනය හෝ දෙය තිබෙන්නේ යයි විශ්වාස කරනු ලබන්නේ යම් තැනැත්තකුගේ සන්තකයෙහි ද නැතහොත් යම් තැනැත්තකුගේ බලයට යටත්ව ද ඒ තැනැත්තාට නියම කෙරෙන සිතාසියක් ඒ අධිකරණය විසින් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ හුදෙක් යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීමට නියම කරනු ලැබූ යම් තැනැත්තකු විසින් පෞද්ගලිකව පැමිණ ඒ ලේඛනය හෝ දෙය ඉදිරිපත් කිරීම වෙනුවට, ඒ ලේඛනය හෝ දෙය ඉදිරිපත් කිරීමට සලස්වනු ලැබුවහොත්, ඔහු විසින් ඒ නියමය පිළිපදිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ ඇති කිසිවකින් සාක්ෂි ආඥාපනතේ 123 වන සහ 130 වන වගන්තිවල විධිවිධාන කෙරෙහි බලපෑමක් සිදු වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

ලිපි, විදුලි පණිවිඩ ආදිය සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය.

**67.** (1) තැපැල් සහ විදුලි පණිවිඩ දෙපාර්තමේන්තුව භාරයේ තිබෙන යම් පොතක්, ලිපියක්, තැපැල් පතක්, විදුලි පණිවිඩයක් හෝ වෙනත් ලේඛනයක් මේ සංග්‍රහය යටතේ වූ යම් විමර්ශනයක හෝ නඩු කටයුත්තක කාර්යය සඳහා අවශ්‍ය යයි යම් අධිකරණයක මතය වන්නේ නම්, ඒ අධිකරණය විසින් විධාන කරනු ලබන පරිදි යම් තැනැත්තකු වෙත ඒ ලේඛනය භාර දෙන ලෙස, අවස්ථාවෝචිත පරිදි, ඒ තැපැල් හෝ විදුලි සංදේශ බලධරයන්ට ඒ අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි ය.

(2) එවැනි යම් ලේඛනයක් මේ සංග්‍රහය යටතේ වූ යම් විමර්ශනයක් හෝ නඩු කටයුත්තක් සඳහා අවශ්‍ය යයි නීතිපතිවරයාගේ හෝ පොලිස් අධිකාරී පදවියකට නොඅඩු පදවියක් දරන පොලිස් නිලධරයකුගේ මතය වන්නේ නම්,ඒ ලේඛන සෙවීමට සලස්වා, එය ඔහු වෙත හෝ ඔහු විසින් විධිමත් ලෙස බලය යොදන ලද වෙනත් තැනැත්තකු වෙත භාර දෙන ලෙස, අවස්ථාවෝචිත පරිදි, තැපැල් හෝ විදුලි සංදේශ බලධරයන්ට ඔහු විසින් නියම කරනු ලැබිය හැකි ය.

සොදිසි වරෙන්තු නිකුත් කළ හැකි අවස්ථා.

**68.** (1) (අ) 66 වන වගන්තිය යටතේ සිතාසියක් හෝ 67 වන වගන්තිය යටතේ නියමයක් යවනු ලැබූ හෝ යවනු ලැබිය හැකි තැනැත්තකු විසින් ඒ සිතාසියෙන් හෝ නියමයෙන් නියම කරනු ලැබ ඇති පරිදි ඒ ලේඛනය හෝ වෙනත් දෙය ඉදිරිපත් කරනු නොලැබේ යයි හෝ ඉදිරිපත් කරනු නො ලැබෙනු ඇතැයි විශ්වාස කිරීමට යම් අධිකරණයකට හේතු තිබෙන අවස්ථාවක, හෝ

(ආ) ඒ ලේඛනය හෝ වෙනත් දෙය යම් තැනැත්තකු සන්තකයෙහි ඇති බව අධිකරණය නොදන්නා අවස්ථාවක; හෝ

(ඇ) මේ සංග්‍රහය යටතේ යම් විමර්ශනයක හෝ නඩු කටයුත්තක කාර්ය සාමාන්‍ය සෝදිසියකින් හෝ පරීක්ෂණයකින් ඉටු වනු ඇතැයි අධිකරණය විසින් සලකනු ලබන අවස්ථාවක

(3) වන උපවගන්තියට යටත්ව, නියමිත ආකෘතියෙහි වූ සෝදිසි වරෙන්තුවක් අධිකරණය විසින් නිකුත් කළ හැකි අතර, ඒ වරෙන්තුව යොමු කරනු ලැබූ තැනැත්තා විසින් ඊට අනුකූලව සහ මින් මතු ඇතුළත් කරනු ලබන විධිවිධානවලට අනුකූලව සෝදිසි හෝ පරීක්ෂා කළ හැකි ය.

(2) ඒ සෑම වරෙන්තුවක් ම, ඒ වරෙන්තුවෙහි සඳහන් කරනු ලැබිය යුතු යුක්ති සහගත දින ගණනක් වලංගුව පැවතිය යුතු ය.

(3) තැපැල් හෝ විදුලි සංදේශ බලධරයන් භාරයේ තිබෙන යම් ලේඛනයක් සෙවීම පිණිස වූ වරෙන්තුවක් නිකුත් කිරීම මහාධිකරණය විසින් පමණක් කරනු ලැබිය යුතු ය.

වරෙන්තුවක් සීමා කිරීමේ බලය.

**69.** සෝදිසි කිරීම හෝ පරීක්ෂා කිරීම නිශ්චිත ස්ථානයකට හෝ ඉන් කොටසකට පමණක් සීමා කිරීම සුදුසු යයි අධිකරණය අදහස් කරන්නේ නම්, අධිකරණය විසින් ඒ නිශ්චිත ස්ථානය හෝ එහි කොටස වරෙන්තුවෙහි සඳහන් කරනු ලැබිය හැකි අතර එසේ සඳහන් කරන ලද ස්ථානය හෝ කොටස පමණක් සෝදිසි කිරීම හෝ පරීක්ෂා කිරීම ඒ වරෙන්තුව ක්‍රියාවේ යෙදවීම භාර කරනු ලැබූ තැනැත්තා විසින් කළ යුතු ය.

සොර බඩු, කූට ලෙස වෙනස් කරන ලද ලේඛන ආදිය ඇති බවට සැක කරනු ලබන ගෙවල් සෝදිසි කිරීම.

**70.** යම් මහෙස්ත්‍රාත් අධිකරණයකට ලැබුණු තොරතුරු අනුව සහ අවශ්‍ය යයි ඒ මහෙස්ත්‍රාත් අධිකරණය කල්පනා කරන විභාගයකින් පසුව -

(අ) සොර බඩු හෝ නීති විරෝධී ලෙස ලබා ගත් දේපළ තැන්පත් කිරීම සඳහා හෝ විකිණීම සඳහා යම් ස්ථානයක් පාවිච්චි කරනු ලබන බව; හෝ

(ආ) කූට ලෙස වෙනස් කරන ලද ලේඛන, ව්‍යාජ ලෙස සකස් කරන ලද මුද්‍රා හෝ මුද්දරවල හෝ කාසිවල ව්‍යාජ අනුකරණ සෑදීම සඳහා වූ හෝ කූට ලෙස වෙනස් කිරීම සඳහා වූ උපකරණ හෝ ද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා හෝ විකිණීම සඳහා හෝ නිෂ්පාදනය කිරීම සඳහා යම් ස්ථානයක් පාවිච්චි කරනු ලබන බව; හෝ

(ඇ) යම් සොර බඩු හෝ නීති විරෝධී ලෙස ලබා ගත් දේපළ, කූට ලෙස වෙනස් කරන ලද ලේඛන, ව්‍යාජ ලෙස සකස් කරන ලද මුද්‍රා හෝ මුද්දරවල හෝ කාසි වල ව්‍යාජ අනුකරණ හෝ කාසිවල හෝ මුද්දර වල ව්‍යාජ අනුකරණ සෑදීම සඳහා හෝ කූට ලෙස වෙනස් කිරීම සඳහා පාවිච්චි කරනු ලබන උපකරණ හෝ ද්‍රව්‍ය යම් ස්ථානයක සඟවා ඇති බව, හෝ තැන්පත් කර ඇති බව

විශ්වාස කිරීමට ඒ මහෙස්ත්‍රාත් අධිකරණයට හේතු තිබේ නම් –

(i) අවශ්‍ය විය හැකි සහාය ඇතිව ඒ ස්ථානයට ඇතුළු වීමට ; සහ

(ii) වරෙන්තුවේ සඳහන් ආකාරයෙන් ඒ ස්ථානය සෝදිසි කිරීමට ; සහ

(iii) එහි තිබී සොයා ගනු ලැබූ සහ සොරකම් කර ඇති බවට, නීති විරෝධී ලෙස ලබා ගෙන ඇති බවට, කූට ලෙස වෙනස් කරනු ලැබ ඇති බවට, ව්‍යාජ ලෙස සකස් කරන ලද බවට හෝ ව්‍යාජ අනුකරණයක් බවට තමා විසින් සාධාරණ ලෙස සැක කරනු ලබන යම් දේපළ, ලේඛන, මුද්දර හෝ කාසි සහ ඉහත කී පරිදි වූ එවැනි යම් උපකරණ සහ ද්‍රව්‍ය තම සන්තකයට ගැනීමට; සහ

(iv) ඒ දේපළ, ලේඛන, මුද්‍රා, කාසි, උපකරණ හෝ ද්‍රව්‍ය මහෙස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියට ගෙන ඒමට හෝ වරදකරු මහෙස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියට ගෙන එනු ලබන තුරු එය එතැනම තබා මුර

කිරීමට හෝ එය ආරක්ෂා සහිත ස්ථානයක තැබීමට ; සහ

(v) එවැනි යම් දේපළක්, සොරකම් කරනු ලැබ ඇති බව හෝ එසේ නොවේ නම් නීති විරෝධී ලෙස ලබා ගෙන ඇති බවට හෝ එවැනි යම් ලේඛන, මුද්‍රා, මුද්දර, කාසි, උපකරණ හෝ ද්‍රව්‍ය කූට ලෙස වෙනස් කරන ලද බව, ව්‍යාජ ලෙස සකස් කරන ලද බව, ව්‍යාජ අනුකරණයක් බව හෝ කාසිවල හෝ මුද්දරවල ව්‍යාජ අනුකරණ සෑදීම සඳහා හෝ කූට ලෙසවෙනස් කිරීම සඳහා එවැනි යම් උපකරණ හෝ ද්‍රව්‍ය පාවිච්චි කරනු ලැබ තිබෙන බව හෝ පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන බව දැනුවත්ව හෝ සැක කිරීමට සාධාරණ හේතු තිබිය දී, එකී දේපළ, ලේඛන, මුද්‍රා, මුද්දර, කාසි, උපකරණ හෝ ද්‍රව්‍ය තැන්පත් කරනු ලැබීමට, විකිණීමට හෝ නිෂ්පාදනය කිරීමට හෝ තබා ගැනීමට සම්බන්ධ වූ ලෙස පෙනී යන්නා වූ ද, ඒ ස්ථානයේ සිටින්නා වූ ද සෑම තැනැත්තකු ම අත් අඩංගුවට ගෙන මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියට ගෙන ඒමට

ඒ අධිකරණය විසින් වරෙන්තුවක් මගින් ඒ වරෙන්තුව යොමු කරනු ලැබූ තැනැත්තාට බලය දෙනු ලැබිය හැකි ය.

අධිකරණ බල සීමාවෙන් පිටත සෝදිසි කිරීමේ දී සොයා ගනු ලබන දේ බැහැර කිරීම.

**71.** සෝදිසි වරෙන්තුවක් නිකුත් කළ අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාවෙන් පිටත යම් ස්ථානයක දී ඒ සෝදිසි වරෙන්තුව ක්‍රියාවේ යොදවීමේ දී, ඒ සෝදිසිය කරනු ලබන්නේ යම් දේවල් සෙවීමට ද, ඒ දේවල් අතුරින් කිසිවක් සොයා ගනු ලැබුවහොත්, ඒ ස්ථානය වරෙන්තුව නිකුත් කළ අධිකරණයට වඩා ඒ ස්ථානය විෂයයෙහි ප්‍රාදේශීය අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණයට ආසන්නව පිහිටා තිබේ නම් මිස එසේ සොයා ගනු ලැබූ දේවල් සහ මෙහි මින් මතු සඳහන් විධිවිධාන යටතේ සකස් කරන ලද ඒ දේවල් පිළිබඳ ලැයිස්තුවක් ඒ වරෙන්තුව නිකුත් කළ අධිකරණය ඉදිරියට වහාම ගෙන යා යුතු ය; ඒ ස්ථානය වරෙන්තුව නිකුත් කළ අධිකරණයට වඩා ඒ ස්ථානය විෂයෙහි ප්‍රාදේශීය අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණයට ආසන්නව පිහිටා තිබේ නම්, ඒ ලැයිස්තුව සහ

දේවල් අන්තිමට සඳහන් අධිකරණය ඉදිරියට ගෙන යා යුතු අතර පටහැනිව ක්‍රියා කිරීමට තරම් සෑහෙන හේතු තිබේ නම් මිස ඒ අන්තිමට සඳහන් අධිකරණය විසින් වරෙන්තුව නිකුත් කළ අධිකරණය වෙත ඒවා ගෙන යාමට බලය දෙමින් ආඥාවක් කළ යුතු ය.

## ඈ - අයුතු ලෙස සිර කර ගෙන සිටින තැනැත්තන් සොයා ගැනීම

අයුතු ලෙස සිර කර ගෙන සිටින තැනැත්තන් සෙවීම

**72.** සිර කර තැබීම වරදක් වන අන්දමේ කරුණු යටතේ යම් තැනැත්තකු සිර කර ලැබ සිටින බව විශ්වාස කිරීමට යම් මහෙස්ත්‍රාත් අධිකරණයකට හේතු තිබේ නම්, ඒ අධිකරණය විසින් සෝදිසි වරෙන්තුවක් නිකුත් කරනු ලැබිය හැකි ය; ඒ වරෙන්තුව යොමු කරනු ලැබූ තැනැත්තා විසින් සිර කරනු ලැබ සිටින තැනැත්තා සොයනු ලැබිය හැකි අතර, ඒ සෙවීම වරෙන්තුවලට අනුකූලව කරනු ලැබිය යුතු ය; තව ද ඒ තැනැත්තා සොයා ගනු ලැබුවහොත් ඔහු ඒ අධිකරණය ඉදිරියට වහාම ගෙන යනු ලැබිය යුතු අතර, ඒ අධිකරණය විසින් අවස්ථානුගත කරුණු අනුව සුදුසු යයි පෙනෙන ආඥාවක් කළ යුතු ය.

## ඈ - සෝදිසි කිරීම් වලට අදාළ සාමාන්‍ය විධිවිධාන

සෝදිසි වරෙන්තු යොමු කිරීම ආදිය.

**73.** 20 වන, 50 වන, 52 වන, 56 වන සහ 57 වන වගන්තිවල විධිවිධාන මේ පරිච්ඡේදය යටතේ නිකුත් කරනු ලබන සියලුම සෝදිසි වරෙන්තු සම්බන්ධයෙන් හැකිතාක් දුරට අදාළ විය යුතු ය.

වසා තිබෙන ස්ථාන භාරව සිටින තැනැත්තන් විසින් සෝදිසි කිරීමට ඉඩ දිය යුතු බව.

**74.** (1) මේ පරිච්ඡේදය යටතේ සෝදිසි කරනු ලැබීමට හෝ පරීක්ෂා කරනු ලැබීමට යටත් යම් ස්ථානයක් වසා තිබෙන කවර විටක වුව ද, වරෙන්තුව ක්‍රියාවේ යොදවන තැනැත්තාගේ ඉල්ලීම පිට සහ වරෙන්තුව ඉදිරිපත් කරනු ලැබූ විට, ඔහුට ඒ ස්ථානයට නිදහසේ ඇතුළු වීමට ඉඩ දීම සහ ඒ ස්ථානය තුළ සෝදිසි කිරීම සඳහා සාධාරණ පහසුකම් සැලසීම ඒ ස්ථානයේ පදිංචිව සිටින හෝ ඒ ස්ථානය භාරව සිටින යම් තැනැත්තකු විසින් කළ යුතු ය.

(2) ඒ ස්ථානයට ඇතුළු වීමට එසේ ඉඩ ලබා ගත නොහැකි වුවහොත් වරෙන්තුව ක්‍රියාවේ යොදවන තැනැත්තා විසින්, 25 වන වගන්තියෙහි විධිවිධාන සලස්වා තිබෙන ආකාරයට ක්‍රියා කරනු ලැබිය හැකි ය.

**75.** සෝදිසිය කරනු ලබන අතරතුර තහනමට ගනු ලැබූ සියලුම දේවල් සහ සහ ඒවා සොයා ගනු ලැබූ ස්ථාන පිළිවෙලින් සඳහන් වන ලැයිස්තුවක් සකස් කොට ඒ ලැයිස්තුව අත්සන් කිරීම සෝදිසි වරෙන්තුව ක්‍රියාවේ යොදවන තැනැත්තා විසින් කළ යුතු ය.

තහනමට ගනු ලැබූ දේවල් පිළිබඳ ලැයිස්තුවක් නිලධරයා විසින් සකස් කළ යුතු බව.

**76.** සෝදිසි කරනු ලබන ස්ථානයේ පදිංචිකරුට හෝ ඔහු වෙනුවෙන් යම් තැනැත්තකුට හෝ සෝදිසිය කරනු ලබන අතරතුර සෑම අවස්ථාවක දී ම පැමිණ සිටීමට අවසර දෙනු ලැබිය යුතු අතර, වරෙන්තුව ක්‍රියාවේ යොදවන තැනැත්තා විසින් 75 වන වගන්තිය යටතේ සකස් කොට අත්සන් කරන ලද ලැයිස්තුවේ පිටපතක් ඒ පදිංචිකරුට හෝ ඒ තැනැත්තාට භාර දෙනු ලැබිය යුතු ය.

සෝදිසි කරනු ලබන ස්ථානයක පදිංචිකරුට පැමිණ සිටිය හැකි බව.

## ඉ - විවිධ කරුණු

**77.** මේ සංග්‍රහය යටතේ යම් අධිකරණයක් වෙත ඉදිරිපත් කරන ලද යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් පරිරෝධ කිරීම සුදුසු යයි ඒ අධිකරණය කල්පනා කරන්නේ නම්, ඒ අධිකරණය විසින් එය එසේ පරිරෝධ කරනු ලැබිය හැකි ය.

ඉදිරිපත් කරන ලද දේවල් අධිකරණය විසින් පරිරෝධ කරනු ලැබිය හැකි බව.

**78.** (1) සාම නිලධරයකු වෙත යොමු කරනු ලැබූ හෝ පිටසන් කර දෙනු ලැබූ සෝදිසි වරෙන්තුවක්, ඔහුට පෞද්ගලිකව යා නොහැකි නම්, වෙන යම් සාම නිලධරයකු විසින් ක්‍රියාවේ යොදවනු ලැබිය හැකි ය.

සාම නිලධරයකු විසින් සෝදිසි වරෙන්තු පිටසන් කරනු ලැබිය හැකි බව.

(2) එවැනි අවස්ථාවක දී, ඒ සාම නිලධරයාගේ නම වරෙන්තුව යොමු කරනු ලැබූ හෝ පිටසන් කරනු ලැබූ නිලධරයා විසින් වරෙන්තුවේ පිටසන් කළ යුතු ය.

**79.** (1) සෝදිසි වරෙන්තුවක් නිකුත් කළ මහෙස්ත්‍රාත්වරයකුට ඒ වරෙන්තුව විධිමත් ලෙස ක්‍රියාවේ යොදවනු ලබන බව නිසැක කර ගැනීමේ කාර්යය සඳහා පෞද්ගලිකව පැමිණ සිටිය හැකි ය.

සෝදිසි කිරීමේ දී පැමිණ සිටින මහෙස්ත්‍රාත්වරයාගේ බලතල.

(2) යම් ස්ථානයක් සෝදිසි කිරීම පිණිස සෝදිසි වරෙන්තුවක් නිකුත් කිරීමට බලය ඇති යම් මහෙස්ත්‍රාත්වරයකු විසින් තමා ඉදිරිපිට දී ඒ ස්ථානය සෝදිසි කරනු ලැබීම සඳහා වාචිකව විධානයක් කරනු ලැබිය හැකි ය.

## IV වන පරිච්ඡේදය

## වැරදි වැළැක්වීම

## VII වන පරිච්ඡේදය

## සාමය ආරක්ෂා කිරීම සඳහා සහ යහපත් හැසිරීම සඳහා වූ ඇප පිළිබඳව

### අ - වරදකරු කරනු ලැබූ විට සාමය ආරක්ෂා කිරීම සඳහා වූ ඇපය

වරදකරු කරනු ලැබූ විට, සාමය ආරක්ෂා කිරීම සඳහා වූ ඇපය.

**80.** (1) සාමය කඩ කිරීමක් ඇතුළත් වන යම් වරදක් කිරීම නිසා හෝ යම් තැනැත්තකුට හෝ දේපළකට හානියක් කරන බවට තර්ජනය කිරීමෙන් සාපරාධ බිය ගැන්වීම කිරීම නිසා හෝ නීති විරෝධී රැස්වීමක සාමාජිකයකු වීම නිසා හෝ යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ සහ සාමය ආරක්ෂා කිරීම සඳහා බැඳුම්කරයක් ලියා අත්සන් කරන ලෙස ඒ තැනැත්තාට නියම කිරීම යෝග්‍ය යයි ඒ තැනැත්තා වරදකරු කරනු ලැබුයේ යම් අධිකරණයක් ඉදිරියේ ද, ඒ අධිකරණයේ මතය වන කවර විටක වුව ද, දණ්ඩන නියමය හෝ ආඥාව කරනු ලබන්නේ මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් නම්, අවුරුදු දෙකක් නො ඉක්මවන පරිදි සහ දණ්ඩන නියමය හෝ ආඥාව කරනු ලබන්නේ මහාධිකරණය විසින් නම්, අවුරුදු තුනක් නොඉක්මවන පරිදි, එසේ ඒ තැනැත්තා වරදකරු කරනු ලැබුවේ යම් අධිකරණයක් ඉදිරියේ ද, ඒ අධිකරණය විසින් එක් එක් අවස්ථාවේ දී කිරීම සුදුසු යයි අදහස් කරනු ලබන කාල සීමාවක් තුළ සාමය ආරක්ෂා කරන බවට, ඔහුගේ වත්පොහොසත්කම්වලට ප්‍රමාණානුකූල වූ මුදලක් සඳහා ඇපකරුවන් ඇතිව හෝ නැතිව, බැඳුම්කරයක් ලියා අත්සන් කරන ලෙස, ඒ තැනැත්තා වෙත දණ්ඩන නියමය නියම කරනු ලබන අවස්ථාවේ දී, ඒ අධිකරණය විසින් ඔහුට ආඥා කරනු ලැබිය හැකි ය.

(2) වරදකරු කිරීම අභියාචනයක දී හෝ අන්‍යාකාරයකින් අවලංගු කරනු ලැබුවහොත්, එසේ ලියා අත්සන් කරන ලද බැඳුම්කරය බල රහිත විය යුතු ය.

## ආ - වෙනත් අවස්ථාවල දී සාමය ආරක්ෂා කිරීම සඳහා වූ ඇපය සහ යහපත් හැසිරීම සඳහා වූ ඇපය

81. යම් මහෙස්ත්‍රාත්වරයකුගේ අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව ඇතුළත දී යම් තැනැත්තකු විසින් සාමය කඩ කරනු ලැබීමට හෝ සාමය කඩවීමක් සිදුවිය හැකි යම් වැරදි ක්‍රියාවක් කරනු ලැබීමට ඉඩ ඇති බවට හෝ ඒ බල සීමාවෙන් පිටත යම් ස්ථානයක දී සාමය කඩ කිරීමට හෝ ඉහත කී පරිදි යම් වැරදි ක්‍රියාවක් කිරීමට ඉඩ ඇති තැනැත්තකු ඒ බල සීමාව ඇතුළත සිටින බවට ඒ මහෙස්ත්‍රාත්වරයා වෙත තොරතුරු ලැබුණු කවර විටක වුව ද, නියම කිරීම සුදුසු යයි අධිකරණය කල්පනා කරන සහ අවුරුදු දෙකක් නොඉක්මවන කාල සීමාවක් තුළ සාමය ආරක්ෂා කිරීම සඳහා ඇප ඇතිව හෝ නැතිව බැඳුම්කරයක් ලියා අත්සන් කරන ලෙස ඒ තැනැත්තා වෙත ආඥා කරනු නොලැබීමට හේතු තිබේ නම්, ඒ හේතු දක්වන ලෙස ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තාට මෙහි මින් පසු සලස්වනු ලබන විධිවිධානවල සඳහන් ආකාරයෙන් නියම කරනු ලැබිය හැකි ය.

*වෙනත් අවස්ථාවල දී සාමය ආරක්ෂා කිරීම සඳහා වූ ඇපය.*

82. (අ) යම් මහෙස්ත්‍රාත්වරයකුගේ අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව ඇතුළත තමා සිටින බව වසන් කිරීමට යම් තැනැත්තකු පූර්වෝපායයන් යොදන බවට සහ ඒ තැනැත්තා එවැනි පූර්වෝපායයන් යොදන්නේ වරදක් කිරීමේ අදහසින් යයි විශ්වාස කිරීමට හේතු තිබෙන බවට; හෝ

(ආ) යැපීම් මාර්ගයක් ඇති බවක් පෙනෙන්නට නොමැති හෝ තමා පිළිබඳව පිළිගත හැකි විස්තරයක් කළ නොහැකි තැනැත්තකු ඒ බල සීමාව ඇතුළත සිටින බවට,

*යහපත් හැසිරීම සඳහා සැකකරුවන් සහ අයාලේ යන තැනැත්තන් අඳින් විසින් ඇප තබනු ලැබීම.*

තොරතුරක් ඒ මහෙස්ත්‍රාත්වරයාට ලැබුණු කවර විටක වුව ද, නියම කිරීම සුදුසු යයි ඒ අධිකරණය කල්පනා කරන සහ අවුරුදු

දෙකක් නොඉක්මවන කාල සීමාවක් තුළ යාමය ආරක්ෂා කිරීම සඳහා ඒ තැනැත්තා විසින් ඇප ඇතිව බැඳුම්කරයක් ලියා අත්සන් කරන ලෙස ඔහුට ආඥා කරනු නොලැබීමට හේතු තිබේ නම් ඒ හේතු දක්වන ලෙස ඒ මහේස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තාට මෙහි මින් පසු සලස්වනු ලබන විධිවිධානවල සඳහන් ආකාරයෙන් නියම කරනු ලැබිය හැකි ය.

යහපත් හැසිරීම සඳහා කෂ්ට වරදකරුවන් විසින් ඇප තබනු ලැබීම.

83. යම් මහේස්ත්‍රාත්වරයකුගේ අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව ඇතුළත වූ යම් තැනැත්තකු කෂ්ට කොල්ලකරුවන් බවට, ගෙවල් බිඳින්නකු බවට, සොරකු බවට හෝ සොරකම් කරන ලද බඩු බව දැනුවත්ව සොර බඩු පුරුද්දක් වශයෙන් බාරගන්නකු බවට හෝ ඔහු පුරුද්දක් වශයෙන් ත්‍රාසාද්ග්‍රහණය කරන්නකු බවට හෝ ත්‍රාසාද්ග්‍රහණය කිරීම පිණිස ඔහු තැනැත්තන්ට හානි කිරීමේ බිය ඇති කරන බවට හෝ බිය ඇති කිරීමට තැත් කරන බවට හෝ ඔහු පුරුද්දක් වශයෙන් සොරුන් ආරක්ෂා කරන්නකු බවට හෝ රැකවසන්කරන්නකු බවට හෝ ඔහු සොර බඩු වසන් කිරීමට හෝ බැහැර කිරීමට පුරුද්දක් වශයෙන් ආධාර දෙන්නකු බවට හෝ ඔහු දුෂ්ප්‍රසිද්ධ නොමනා ලෙස ජීවත් වන්නකු බවට හෝ භයානක චරිතයක් ඇත්තකු බවට හෝ ඒ මහේස්ත්‍රාත්වරයා වෙත තොරතුරක් ලැබුණු කවර විටක වුව ද, නියම කිරීම සුදුසු යයි ඒ මහේස්ත්‍රාත්වරයා අදහස් කරන සහ අවුරුදු දෙකක් නොඉක්මවන කාල සීමාවක් තුළ සාමය ආරක්ෂා කිරීම සඳහා ඇප ඇතිව බැඳුම්කරයක් ලියා අත්සන් කරන ලෙස ඒ තැනැත්තාට ආඥා කරනු නොලැබීමට හේතු තිබේ නම් ඒ හේතු දක්වන ලෙස ඒ මහේස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තාට මෙහි මින් පසු සලස්වනු ලබන විධිවිධානවල සඳහන් ආකාරයෙන් නියම කරනු ලැබිය හැකි ය.

එසේ පැමිණ නොසිටි තැනැත්තකු සම්බන්ධයෙන් සිතාසි හෝ වරෙන්තු.

84. 81 වන වගන්තිය හෝ 82 වන වගන්තිය හෝ 83 වන වගන්තිය යටතේ ක්‍රියා කරන මහේස්ත්‍රාත්වරයකු ඒ වගන්තිය යටතේ හේතු දක්වන ලෙස යම් තැනැත්තකුට නියම කිරීමට අවශ්‍ය යයි සලකනු ලබන විටක, ඒ තැනැත්තා අධිකරණයට පැමිණ නොමැති නම්, පෙනී සිටින ලෙස ඔහුට නියම කරමින් සිතාසියක් නිකුත් කිරීම හෝ ඒ තැනැත්තා අත් අඩංගුවේ සිටින නමුත් අධිකරණයට පැමිණ නොමැති විටක, ඒ තැනැත්තා

අධිකරණය ඉදිරියට ගෙන එන ලෙස, ඔහු සිටින්නේ යම් නිලධරයකුගේ අත් අඩංගුවේ ද ඒ නිලධරයාට විධාන කෙරෙන වරෙන්තුවක් නිකුත් කිරීම හෝ ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් කළ යුතු ය.

එසේ වුව ද, සාමය කඩ කිරීමක් සිදු වේ යයි සැක කිරීමට හේතු තිබෙන බව සහ ඒ තැනැත්තා වහාම සිර භාරයට ගැනීමෙන් මිස එසේ සාමය කඩ කිරීම අන්‍යාකාරයකින් වැළැක්විය නොහැකි බව සාම නිලධරයකුගේ වාර්තාවක් අනුව හෝ ලැබුණු වෙනත් තොරතුරු අනුව හෝ ඒ මහෙස්ත්‍රාත්වරයාට පෙනී ගිය කවර විටක වුව ද, (ඒ වාර්තාවේ හෝ තොරතුරුවල භාවාර්ථය ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් සටහන් කළ යුතු ය.) ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ඔහු සිර භාරයට ගැනීම පිණිස ඕනෑම වේලාවක වරෙන්තුවක් නිකුත් කරනු ලැබිය හැකි ය.

සිතාසියේ හෝ වරෙන්තුවේ ආකෘතිය.

**85.** 84 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම සිතාසියක ම හෝ වරෙන්තුවක ම, ඒ සිතාසිය හෝ වරෙන්තුව නිකුත් කරනු ලැබීමට හේතු වූ තොරතුරු වල භාවාර්ථය පිළිබඳ සංක්ෂිප්ත ප්‍රකාශයක් ඇතුළත් කර තිබිය යුතු ය.

තොරතුරුවල සත්‍යතාව පිළිබඳ විභාගය.

**86.** (1) 84 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද සිතාසියක් අනුව ක්‍රියා කිරීමෙහි ලා යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පෙනී සිටි විටක හෝ එසේ නිකුත් කරන ලද වරෙන්තුවක් ක්‍රියාවේ යෙදවීමෙහි ලා යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියට ගෙන එනු ලැබූ විටක, ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ක්‍රියාකරනු ලැබුවේ යම් තොරතුරු අනුව ද ඒ තොරතුරුවල සත්‍යතාව විභාග කිරීම සඳහා සහ අවශ්‍ය යයි පෙනී යන වැඩිදුර සාක්ෂි ගැනීම සඳහා ඔහු විසින් ක්‍රියා කළ යුතු ය.

(2)ඒ විභාගය මහෙස්ත්‍රාත් අධිකරණ ඉදිරියේ ලඝු කාර්ය පටිපාටිය අනුව පැවැත්වෙන නඩුවල දී නඩු විභාග පැවැත්වීම සඳහා මෙහි මින් පසු නියම කෙරෙන ආකාරයට හැකිතාක් අනුකූලව පවත්වනු ලැබිය යුතු ය.

(3) යම් තැනැත්තකු කෂ්ට වරදකරුවකු බව හෝ 83 වන වගන්තියේ සඳහන් අන්දමේ තැනැත්තකු බව මේ වගන්තියේ කාර්යය සඳහා සාමාන්‍ය ප්‍රසිද්ධිය පිළිබඳ සාක්ෂිවලින් හෝ අන්‍යාකාරයකින්-ඔප්පු කරනු ලැබිය හැකි ය.

(4) මහේස්ත්‍රාත්වරයා විසින් සටහන් කළ යුතු හේතු නිසා, විභාගය අවසාන වන තුරු සාමය ආරක්ෂා කරන බවට හෝ යහපත් හැසිරීමෙන් යුක්තව සිටින බවට බැඳුම්කරයක් ලියා අත්සන් කරන ලෙස විභාගය ආරම්භ කිරීමට පෙර, මහේස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තාට ආඥාවක් කරනු ලැබිය හැකි ය. මේ උපවගන්තිය යටතේ කරන ලද යම් ආඥාවකට විරුද්ධ කිසිම අභියාචනයක් කළ නොහැකි විය යුතු ය.

ඇප තැබීම සඳහා ආඥා කිරීම.

**87.** විභාගය පවත්වනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තා විසින්, අවස්ථාවෝචිත පරිදි, සාමය රැකීම සඳහා හෝ යහපත් හැසිරීමෙන් යුක්තව සිටීම සඳහා ඇප ඇතිව හෝ නැතිව බැඳුම්කරයක් ලියා අත්සන් කරනු ලැබීම අවශ්‍ය යයි ඒ විභාගයේ දී ඔප්පු වුවහොත් මහේස්ත්‍රාත්නරයා විසින් ඒ අනුව ආඥාවක් කළ යුතු ය;

එසේ වුව ද -

(අ) සෑම බැඳුම්කරයක ම මුදල් ප්‍රමාණය අවස්ථාවට අදාළ කරුණු ගැන නිසි පරිදි සැලකිලිමත්ව නියම කරනු ලැබිය යුතු අතර එය අධිකතර නොවිය යුතු ය.

(ආ) විභාගය පවත්වනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා බාලවයස්කාරයකු වන විටක, බැඳුම්කරය ඔහුගේ ඇපකරුවන් විසින් පමණක් ලියා අත්සන් කළ යුතු ය.

තොරතුරු ලැබුණේ යම් තැනැත්තකුට විරුද්ධව ද, ඒ තැනැත්තා නිදහස් කිරීම.

**88.** විභාගය පවත්වනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තා විසින්, අවස්ථාවෝචිත පරිදි, සාමය රැකීම සඳහා හෝ යහපත් හැසිරීමෙන් යුක්තව සිටීම සඳහා බැඳුම්කරයක් අත්සන් කරනු ලැබීම අවශ්‍ය බව ඒ විභාගයේ දී ඔප්පු නොවුවහොත්, මහේස්ත්‍රාත්වරයා විසින් නඩු වාර්තාවේ ඒ බවට සටහනක් කළ යුතු ය. තව ද විභාගය පිළිබඳ කාර්යය සඳහා පමණක් ඒ තැනැත්තා අත් අඩංගුවේ සිටින්නේ නම්, මහේස්ත්‍රාත්වරයා විසින් ඔහු මුදා හරිනු ලැබිය යුතු අතර ඔහු අත් අඩංගුවේ නොසිටින්නේ නම්, ඔහු නිදහස් කරනු ලැබිය යුතු ය.

## ඇ - ඇප තබන ලෙස නියම කෙරෙන සියලු ආඥාවලට අදාළ විධිවිධාන

ඇප තැබීම පැහැර හැරීමේ දී බන්ධනාගාරගත කිරීමේ කාලය නියම කිරීම.

**89.** (1) මේ පරිච්ඡේදයේ ඉහතින් වූ වගන්ති යටතේ ඇපයක් තබන ලෙස නියම කෙරෙන ආඥාවක් කරනු ලබන වේලාවේ දී, අධිකරණය විසින්, ඒ ආඥාව කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා ඇපය තැබීම පැහැර හැරියහොත්,ඒ අධිකරණය මහාධිකරණය නම්, අවුරුදු දෙකක් නොඉක්මවන පරිදි ද, ඒ අධිකරණය මහෙස්ත්‍රාත් අධිකරණයක් නම් එක් අවුරුද්දක් නොඉක්මවන පරිදි ද, අධිකරණය සුදුසු යයි කල්පනා කරන කාලයකට ඒ තැනැත්තා බන්ධනාගාරගත කළ යුතු යයි විධාන කළ යුතු ය;

ඇප තැබීම සඳහා කාලය දීම.

එසේ වුව ද ඇප තැබීම සඳහා කාලය දීම සුදුසු යයි අධිකරණය කල්පනා කළ හොත්, එසේ ඇප තැබීම සඳහා එක් මාසයක් නොඉක්මවන කාලයක් අධිකරණය විසින් දෙනු ලැබිය හැකි ය;

එසේම තව දුරටත් කාලය නොදිය යුතු බව අධිකරණයේ මතය වන අවස්ථාවක, කාලය දීම ප්‍රතික්ෂේප කිරීමට හේතු අධිකරණය විසින් සටහන් කළ යුතු ය.

(2) යම් ආඥාවක්, ඒ ආඥාව කරනු ලබන වේලාවේ දී බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් නියම කරනු ලැබ සිටි හෝ බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් විඳිමින් සිටි තැනැත්තකු සම්බන්ධයෙන් කරන ලද අවස්ථාවක, (1) වන උප වගන්තියෙහි අතුරු වගන්තිවල විධිවිධාන ඒ ආඥාව සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

ඇපය තැබීමට නියම කරනු ලැබුවේ යම් කාලයක් සඳහා ද, ඒ කාලය ආරම්භ වීම.

**90.** මේ පරිච්ඡේදයේ ඉහතින් වූ වගන්ති යටතේ කරන ලද ආඥාවක් මගින් ඇප තබන ලෙස නියම කරනු ලැබුවේ යම් කාලයක් සඳහා ද ඒ කාලය, -

(අ) 89 වන වගන්තිය යටතේ කාලය දෙනු නොලැබූ අවස්ථාවක, ඒ ආඥාවේ දින සිට ද;

(ආ) ඒ වගන්තිය යටතේ කාලය දෙනු ලැබූ අවස්ථාවක, එසේ දෙනු ලැබූ කාලය ඉකුත් වූ දින සිට ද;

(ඇ) ඒ ආඥාව, එය කරනු ලැබූ වේලාවේ දී බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කරනු ලැබ සිටි හෝ බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් විඳිමින් සිටි තැනැත්තකු සම්බන්ධයෙන් කරනු ලැබූ අවස්ථාවක, ඒ දණ්ඩන නියමය අවසන් වූ දින සිට ද

ආරම්භ විය යුතු ය.

බැඳුම්කරයේ ඇතුළත් විය යුතු කරුණු.

**91.** (1) එවැනි යම් තැනැත්තකු විසින් ලියා අත්සන් කළ යුතු බැඳුම්කරයකින්, අවස්ථාවෝචිත පරිදි, සාමය රැකීම සඳහා හෝ යහපත් හැසිරීමෙන් යුක්තව සිටීම සඳහා හෝ ඔහු බැඳීමකට යටත් විය යුතු ය; තව ද යහපත් හැසිරීමෙන් යුක්තව සිටීම සඳහා ඔහු බැඳීමකට යටත් වන අවස්ථාවක, බන්ධනාගාරගත කරනු ලැබීමෙන් දඬුවම් කළ හැකි යම් වරදක්, කවර ස්ථානයක දී වුව ද, කිරීම හෝ කිරීමට තැත් කිරීම හෝ ඒ වරද කිරීමට අනුබල දීම බැඳුම්කරයක් කඩ කිරීමක් වන්නේ ය.

ඇපකරුවන් ප්‍රතික්ෂේප කිරීමේ බලය.

(2) මේ පරිච්ඡේදය යටතේ ඉදිරිපත් කරන ලද යම් ඇපකරුවකු යම් අධිකරණයක් විසින් සටහන් කළ යුතු හේතු නිසා නුසුදුසු තැනැත්තා වීම හේතු කොට ගෙන ඒ ඇපකරු පිළිගැනීම ඒ අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

ඇප තැබීම පැහැර හැරීම නිසා බන්ධනාගාරයට භාර කිරීම.

**92.** (1) මේ පරිච්ඡේදයේ ඉහතින් වූ වගන්ති යටතේ ඇපයක් තබන ලෙස ආඥාවක් කරනු ලැබූ යම් තැනැත්තකු විසින් ඒ ඇපය තැබිය යුතුව තිබුණේ යම් කාලයක් සඳහා ද ඒ කාලය ආරම්භ වන දින හෝ ඊට පෙර, ඒ ඇපය තබනු නොලැබුවහොත්, 89 වන වගන්තිය යටතේ නියම කරන ලද කාලය තුළ බන්ධනාගාරගත කර තැබීම පිණිස ඔහු බන්ධනාගාරයට භාර කරනු ලැබිය යුතු ය. එසේ නැතහොත් ඔහු එවකටත් බන්ධනාගාරගත කරනු ලැබ සිටී නම්, බන්ධනාගාරගත වී සිටිය යුතු කාලය ඉකුත් වනතුරු, ඔහු බන්ධනාගාරයේ රඳවා තබා ගැනීම හෝ ඇපය තබන ලෙස නියම කරමින් ආඥාව කළ අධිකරණයට හෝ ඔහු රඳවා තබා ගෙන සිටින බන්ධනාගාරයේ අධිකාරීවරයාට හෝ ජේලර්වරයාට, ඒ කාලය ඉකුත් වීමට පෙර, ඒ ඇපය ඔහු විසින් දෙනු ලබන තුරු ඔහු බන්ධනාගාරයේ රඳවා තබා ගැනීම හෝ කරනු ලැබිය යුතු ය.

සාමය ආරක්ෂා කිරීම සඳහා ඇපයක් තැබීම පැහැර හැරීම සම්බන්ධයෙන් බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම.

(2) සාමය රැකීම සඳහා ඇපයක් තැබීම පැහැර හැරීම සම්බන්ධයෙන් බන්ධනාගාරගත කරනු ලැබීම බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීමක් විය යුතු ය.

යහපත් හැසිරීමෙන් යුක්තව සිටීම සඳහා ඇපයක් තැබීම පැහැර හැරීම සම්බන්ධයෙන් බරපතල වැඩ ඇතිව හෝ නැතිව බන්ධනාගාරගත කිරීම.

(3) යහපත් හැසිරීමෙන් යුක්තව සිටීම සඳහා ඇපයක් තැබීම පැහැර හැරීම සම්බන්ධයෙන් බන්ධනාගාරගත කරනු ලැබීම, එක් එක් අවස්ථාවේ දී අධිකරණය විසින් විධාන කරනු ලබන පරිදි, බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමක් හෝ බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීමක් හෝ විය හැකි ය.

ඇප තැබීම පැහැර හැරීම නිසා බන්ධනාගාරගත කරන ලද තැනැත්තා මුදා හැරීමේ බලය.

**93.** (1) මේ පරිච්ඡේදය යටතේ ඇපයක් තැබීම පැහැර හැරීම නිසා බන්ධනාගාරගත කරනු ලැබූ යම් තැනැත්තකු සමාජයට හෝ වෙනත් යම් තැනැත්තකුට හෝ උපද්‍රවයක් රහිතව මුදා හරිනු ලැබිය හැකි යයි යම් අධිකරණයක මතය වන කවර විටක වුව ද, ඒ තැනැත්තා නිදහස් කරනු ලබන ලෙස ඒ අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(2) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් හෝ අභියාචනාධිකරණය විසින් හෝ හැර වෙනත් අධිකරණයක් විසින් මේ බලය ඒ අධිකරණයේ ම ආඥාවක් යටතේ බන්ධනාගාරගත කිරීම කරනු ලැබූ අවස්ථාවල දී හැර, ක්‍රියාත්මක නොකළ යුතු ය.

## ඈ - ඇපකරුවන් නිදහස් කිරීම

ඇපකරුවන් නිදහස් කිරීම

**94.** (1) මේ සංග්‍රහයේ ඉහතින් වූ විධිවිධාන යටතේ වෙනත් තැනැත්තකුගේ සාමකාමී පැවැත්ම සඳහා හෝ යහපත් හැසිරීම සඳහා හෝ යම් තැනැත්තකු අධිකරණයක් ඉදිරියේ විධිමත් පරිදි පැමිණ සිටින බවට හෝ යම් තැනැත්තකු විසින් යම් නියමයක් විධිමත් පරිදි ඉටු කරනු ලබන බවට ඇප වූ යම් ඇපකරුවකු විසින්, බැඳුම්කරය අවලංගු කරන ලෙස ලියා අත්සන් කිරීමට විධාන කළ අධිකරණය වෙත ඕනෑම වේලාවක දී ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) එවැනි ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසු යයි අධිකරණය කල්පනා කරන පරිදි, ඒ ඇපකරු බැඳී සිටින්නේ යම් තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තාට අධිකරණය ඉදිරියේ පෙනී සිටින ලෙස නියම කරමින් සිතාසියක් නිකුත් කිරීම හෝ ඒ තැනැත්තා අධිකරණය ඉදිරියට ගෙන එන ලෙස නියම කරමින් වරෙන්තුවක් නිකුත් කිරීම හෝ ඒ අධිකරණය විසින් කළ හැකි ය.

(3) ඒ තැනැත්තා අධිකරණය ඉදිරියේ පෙනී සිටින විට හෝ අධිකරණය ඉදිරියට ගෙන එනු ලැබූ විට, ඒ අධිකරණය විසින් බැඳුම්කරය අවලංගු කළ හැකි අතර එසේ අවලංගු කරනු ලැබුවහොත් ඒ බැඳුම්කරයේ නියමිත කාලයෙන් ඉකුත් නොවූ කොටස සඳහා හෝ ඒ බැඳුම්කරයේ ඉටු කරනු ලැබ නොමැති නියමයන් සඳහා මුල් ඇපයට සමාන වර්ගයේම අලුත් ඇපයක් තබන ලෙස ද ඒ තැනැත්තාට ආඥාවක් කළ යුතු ය. එවැනි සෑම ආඥාවක ම මුල් ආඥාවේ තිබුණු බලපෑම ම තිබිය යුතු ය.

(4) 408 වන වගන්තියේ (5) වන උපවගන්තියේ විධිවිධාන, වෙනත් තැනැත්තකුගේ සාමකාමී පැවැත්ම සඳහා හෝ යහපත් හැසිරීම සඳහා හෝ ඇප වූ ඇපකරුවකු විසින් බැඳුම්කරය අවලංගු කර ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන යම් ඉල්ලීමකට ද අදාළ විය යුතු ය.

## VIII වන පරිච්ඡේදය

## නීති විරෝධී රැස්වීම්

තැනැත්තන්ගේ රැස්වීම විසුරුවා හැරීම.

**95.** (1) යම් නීති විරෝධී රැස්වීමකට හෝ මහජන සාමයට බාධාවක් විය හැකි තැනැත්තන් පස් දෙනකුගෙන් හෝ ඊට වැඩි ගණනකින් යුක්ත වූ යම් රැස්වීමකට හෝ විසිර යන ලෙස යම් මහෙස්ත්‍රාත්වරයකුගේ හෝ පොලිස් පරීක්ෂකවරයකුගේ පදවියට නොඅඩු පදවියක් දරන යම් පොලිස් නිලධරයකු විසින් අණ කරනු ලැබිය හැකි අතර, එවිට ඒ අනුව විසිර යාම ඒ රැස්වීමේ සාමාජිකයන්ගේ කාර්යය විය යුතු ය.

රැස්වීම් විසුරුවා හැරීම සඳහා සිවිල් බලය යෙදීම.

(2) එසේ අණ කරනු ලැබූ විට, එවැනි යම් රැස්වීමක් විසිර නොගියහොත් හෝ එසේ අණ නොකර තිබිය දී, විසිර නොයාමේ අධිෂ්ඨානයක් පෙනෙන ආකාරයෙන් ඒ රැස්වීමේ කටයුතු කළහොත් රැස්වීම විසුරුවා හැරීමට සාධාරණ ලෙස අවශ්‍ය වන

යම් බලයක් පාවිච්චි කිරීමෙන් ඒ රැස්වීම විසුරුවා හැරීම පිණිස ඒ මහෙස්ත්‍රාත්වරයා හෝ පොලිස් නිලධරයා විසින් ක්‍රියා කරනු ලැබිය හැකි අතර ඒ රැස්වීම විසුරුවා හැරීමේ කාර්යය සහ ඒ රැස්වීමේ කොටසක්ව සිටිග තැනැත්තන්, ඒ රැස්වීම විසුරුවා හැරීම පිණිස හෝ නීතිය අනුව ඔවුනට දඬුවම් කළ හැකිවීම පිණිස, අවශ්‍ය නම්, සිර භාරයට ගැනීමේ සහ සිර අඩස්සියේ තැබීමේ කාර්යය සඳහා (ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක හෝ යුද්ධ හමුදාවේ , නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ සාමාජිකයකුව, ඒ සාමාජිකයා වශයෙන් ක්‍රියා කරන තැනැත්තකු නොවන) යම් තැනැත්තකුගේ සහාය ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

රැස්වීම විසුරුවා හැරීම සඳහා සන්නද්ධ හමුදා බලය යෙදීම.

(3) එවැනි යම් රැස්වීමක් අන්‍යාකාරයකින් විසුරුවා හැරිය නොහැකි නම් සහ මහජන ආරක්ෂාව සඳහා එය විසුරුවා හැරීම අවශ්‍ය නම්, සන්නද්ධ හමුදා බලය පාවිච්චි කර එය විසුරුවා හරින ලෙසත්, ඒ රැස්වීමේ කොටසක්ව සිටින තැනැත්තන්, ඒ රැස්වීම විසුරුවා හැරීම පිණිස හෝ නීතිය අනුව ඔවුනට දඬුවම් කළ හැකි වීම පිණිස, අවශ්‍ය වන පරිදි, සිර භාරයට ගෙන සිර අඩස්සියේ තබා ගන්නා ලෙසත් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ , නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ යම් පිරිසකට හෝ අණ දෙන අධිකාර ලැබූ හෝ නොලැබූ යම් නිලධරයකුට නියම කිරීමෙන් මහෙස්ත්‍රාත්වරයකු හෝ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් විසින් හෝ පොලිස් අධිකාරීවරයකුගේ පදවියට නොඅඩු පදවියක් දරන යම් පොලිස් නිලධරයකු විසින් හෝ රැස්වීම විසුරුවා හැරීමට සලස්වනු ලැබිය හැකි ය. අධිකාර ලැබූ හෝ නොලැබූ එවැනි සෑම නිලධරයකු ම විසින් සුදුසු යයි තමා කල්පනා කරන යම් ආකාරයකින්, ඒ නියමයට අවනතව ක්‍රියා කළ යුතු ය. එහෙත් එසේ කිරීමේ දී, රැස්වීම විසුරුවා හැරීමට සහ ඒ තැනැත්තන් සිර භාරයට ගෙන රඳවා තැබීමට සරිලන ප්‍රමාණයට පමණක් හැකිතාක් අඩුවෙන් බලය පාවිච්චි කිරීමටත් ඒ ප්‍රමාණයට පමණක් හැකිතාක් අඩුවෙන් පුද්ගලයන්ට හා දේපළවලට හානි සිදු කිරීමටත් ඔහු වගබලා ගත යුතු ය.

අධිකාර ලත් යුද්ධ හමුදා නිලධරයන්ට රැස්වීම විසුරුවා හැරීමට ඇති බලය.

**96.** එවැනි යම් රැස්වීමක් නිසා මහජන ආරක්ෂාව පැහැදිලි වශයෙන් ම අනතුරට පත් වී තිබෙන විට මහෙස්ත්‍රාත්වරයකු වෙත, දිසාපතිවරයකු වෙත හෝ පොලිස් අධිකාරීවරයකුගේ පදවියට නොඅඩු පදවියක් දරන පොලිස් නිලධරයකු වෙත ඒ බව දැනුම් දීමට නොහැකි විට, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, නාවික

හමුදාවේ හෝ ගුවන් හමුදාවේ යම් අධිකාර ලත් යම් නිලධරයකු විසින් සන්නද්ධ හමුදා බලය පාවිච්චි කර ඒ රැස්වීම විසුරුවා හැරීම සහ එහි කොටසක්ව සිටින යම් තැනැත්තන්, ඒ රැස්වීම විසුරුවා හැරීම පිණිස හෝ නීතිය අනුව ඔවුනට දඬුවම් කළ හැකි වීම පිණිස හෝ සිර භාරයට ගෙන, සිර අඩස්සියේ තැබීම කරනු ලැබිය හැකි ය; එහෙත් මේ වගන්තිය යටතේ ඔහු විසින් ක්‍රියා කරනු ලබන අතරතුර, මහෙස්ත්‍රාත්වරයා වෙත, දිසාපතිවරයා වෙත හෝ පොලිස් අධිකාරීවරයකුගේ පදවියට නොඅඩු පදවියක් දරන පොලිස් නිලධරයකු වෙත හෝ ඒ ගැන දැනුම් දීමට ඔහුට හැකිකම ලැබුණහොත්, ඔහු විසින් ඒ ගැන එසේ දැනුම් දිය යුතු අතර ඉන් පසුව ඒ ක්‍රියාව තව දුරටත් කර ගෙන යාම හෝ නොයාම සම්බන්ධයෙන් ඔහු ඒ මහෙස්ත්‍රාත්වරයාගේ හෝ දිස්ත්‍රික් ලේකම්ගේ හෝ පොලිස් නිලධරයාගේ හෝ උපදෙස් වලට අවනත විය යුතු ය.

මේ පරිච්ඡේදය යටතේ කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

**97.** (1) මේ පරිච්ඡේදය යටතේ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, නීතිපතිවරයාගේ අනුමතය ඇතිව හැර යම් මහෙස්ත්‍රාත්වරයකුට, දිසාපතිවරයකුට, පොලිස් නිලධරයකුට හෝ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ , නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ සේවකයකුට හෝ මේ පරිච්ඡේදය යටතේ වූ රැස්වීමක් විසුරුවා හැරීමෙහි ලා පොලිස් නිලධරයකුට සහාය වන යම් තැනැත්තකුට හෝ විරුද්ධව යම් අධිකරණයක දී කිසිම අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) (අ) මහෙස්ත්‍රාත්වරයකු, දිසාපතිවරයකු පොලිස් නිලධරයකු හෝ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ , නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ සාමාජිකයකු හෝ මේ පරිච්ඡේදය යටතේ සද්භාවයෙන් ක්‍රියා කරන වෙනත් යම් තැනැත්තකු; සහ

(ආ) සන්නද්ධ හමුදා නීතිය යටතේ අවනත වීමට තමා බැඳී සිටින යම් නියමයකට අවනත වීමෙහි ලා යම් ක්‍රියාවක් කරන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ , නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ සාමාජිකයකු,

මේ පරිච්ඡේදය යටතේ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සඳහා සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවලට යටත් නොවිය යුතු ය.

## IX වන පරිච්ඡේදය

## මහජන පීඩා

### අ - පීඩා සිදුකරනු ලබන අවස්ථාවල දී ඒවා ඉවත් කිරීම හෝ නතර කිරීම සඳහා වූ ආඥා

පීඩා ඉවත් කිරීම පිණිස කොන්දේසි සහිත ආඥාවක් කිරීම.

98. (1) මහෙස්ත්‍රාත්වරයකු වෙත වාර්තාවක් හෝ වෙනත් තොරතුරක් ලැබුණු විට හා සුදුසු යයි ඔහු කල්පනා කරන සාක්ෂි (කිසිවක් වේනොත්) ඒ සාක්ෂි සටහන් කර ගැනීමෙන් පසුව -

(අ) මහජනයා විසින් නීත්‍යානුකූලව ප්‍රයෝජනයට ගනු ලබන හෝ ගනු ලැබිය හැකි යම් මාර්ගයකින්, වරායකින්, විලකින්, ගංගාවකින් හෝ ඇලකින් හෝ යම් පොදු ස්ථානයකින් නීත්‍යානුකූල නොවන යම් බාධකයක් හෝ පීඩාවක් ඉවත් කළ යුතු යයි; හෝ

(ආ) යම් කර්මාන්තයක් හෝ ව්‍යපෘතියක් හෝ යම් භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ තබා ගැනීමක් එය මහජනයාගේ සෞඛ්‍යයට හෝ කායික සුවයට හානිකර වීමේ හේතුව නිසා මැඩ පැවැත්විය යුතු යයි හෝ ඉවත් කළ යුතු යයි හෝ තහනම් කළ යුතු යයි; හෝ

(ඇ) යම් ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ යම් ද්‍රව්‍යයක් බැහැර කිරීම නිසා ගින්නක් හෝ පිපිරීමක් ඇති වීමට ඉඩ තැබීම හේතු කොට ගෙන, ඒ ඉදි කිරීම හෝ බැහැර කිරීම වැළැක්විය යුතු යයි හෝ නතර කළ යුතු යයි; හෝ

(ඈ) යම් ගොඩනැගිල්ලක් හෝ ගසක් කඩා වැටී ඒ අවට ජීවත් වන හෝ ව්‍යාපාර කටයුතු කරන හෝ ඒ ස්ථානය පසු කර ගෙන යන තැනැත්තන්ට එමගින් හානි සිදුවීමට ඉඩ ඇති තත්වයක ඒ ගොඩනැගිල්ල හෝ ගස පවතින බැවින්, ඒ ගොඩනැගිල්ල ඉවත් කිරීම අලුත්වැඩියා කිරීම හෝ එයට මුක්කු ගැසීම හෝ ඒ ගස ඉවත් කිරීම, හෝ එයට මුක්කු ගැසීම අවශ්‍ය යයි; හෝ .

(ඉ) එවැනි යම් මාර්ගයකට හෝ පොදු ස්ථානයකට යාබද යම් වැවකින්, ළිඳකින් හෝ වළකින් මහජනයාට ඇති විය හැකි අනතුරු වැළැක්වෙන ආකාරයෙන්, ඒ වැව, ළිඳ හෝ වළ වටා වැටක් ඉදි කළ යුතු යයි,

ඒ මහෙස්ත්‍රාත්වරයා සලකන කවර විටක වුව ද, ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් කොන්දේසි සහිත ආඥාවක් කිරීමෙන් ඒ බාධකය හෝ පීඩාව කරන හෝ ඒ කර්මාන්තය හෝ ව්‍යාපෘතිය කරගෙන යන හෝ එවැනි යම් භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ තබා ගෙන සිටින හෝ ඒ ගොඩනැගිල්ල, ද්‍රව්‍යය, ගස, වැව, ළිඳ හෝ වළ අයිතිව සිටින, සිය සන්තකයෙහි තබා ගෙන සිටින හෝ පාලනය කරන තැනැත්තා විසින් කොන්දේසි සහිත ආඥාවෙන් නියම කරනු ලබන කාලයක් ඇතුළත-

(i) ඒ බාධකය හෝ පීඩා ඉවත් කළ යුතු යයි; හෝ

(ii) ඒ කර්මාන්තය හෝ ව්‍යාපෘතිය මැඩ පැවැත්විය යුතු යයි; හෝ

(iii) ඒ භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ ඉවත් කළ යුතු යයි; හෝ

(iv) ඒ ගොඩනැගිල්ල ඉදි කිරීම වැළැක්විය යුතු යයි හෝ නතර කළ යුතු යයි; හෝ

(v) එය ඉවත් කළ යුතු යයි හෝ අලුත්වැඩියා කළ යුතු යයි හෝ එයට මුක්කු ගැසිය යුතු යයි; හෝ

(vi) ඒ ද්‍රව්‍යය බැහැර කිරීම වෙනස් කළ යුතු යයි; හෝ

(vii) ඒ ගස ඉවත් කළ යුතු යයි; හෝ

(viii) අවස්ථාවෝචිත පරිදි, ඒ වැව, ළිඳ හෝ වළ වටා වැටක් ඉදි කළ යුතු යයි; හෝ

අණ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කොන්දේසි සහිත ආඥාවක් යම් තැනැත්තකුට විරුද්ධව කරනු ලැබ ඇත ද ඒ තැනැත්තා විසින්, ඒ ආඥාවෙන් නියම කරන ලද කාලය ඉකුත් වීමට පෙර ඒ ආඥාව කරන මහෙස්ත්‍රාත්වරයා ඉදිරියේ හෝ එම අධිකරණයේ වෙනත් යම් මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ හෝ පෙනී සිට මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලබන ආකාරයෙන් ඒ ආඥාව අවලංගු කරවා ගැනීම පිණිස හෝ එය සුලු වශයෙන් වෙනස් කරවා ගැනීම පිණිස හෝ ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ විධිමත් ලෙස කරන ලද යම් ආඥාවක් පිළිබඳව කිසිම සිවිල් අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා "පොදු ස්ථානය" යන්නට, රජයට හෝ සංස්ථාවකට අයිති හෝ පොදු කාර්යයන් සඳහා යම් රාජ්‍ය නිලධරයකු වෙත හෝ රජයේ දෙපාර්තමේන්තුවක් වෙත සතු කරන ලද දේපළ ද සනීපාරක්ෂක හෝ ක්‍රීඩා කාර්යයන් සඳහා වෙන් කරනු ලැබ ඇති, පදිංචියක් නැති භූමි ද ඇතුළත් වේ.

**99.** (1) මේ පරිච්ඡේදය යටතේ කරනු ලබන ආඥාව සහ වෙනත් යම් ආඥාවක් හෝ දෙනු ලබන දැන්වීමක්, ඒ ආඥාව කරනු ලැබුවේ යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ තැනැත්තාට නැතහොත් ඒ දැන්වීම දිය යුතු වන තැනැත්තාට, හැකි නම් සිතාසි භාර දීම සඳහා මෙහි සඳහන් කර ඇති ආකාරයෙන් භාර දෙනු ලැබිය යුතු ය. ආඥාව භාර දීම හෝ දැනුම් දීම.

(2) ඒ ආඥාව එසේ භාර දෙනු ලැබිය නොහැකි නම්, ඒ තැනැත්තාට ඒ ප්‍රවෘත්තිය දැනුම් දීම සඳහා ඒ ආඥාවේ පිටපතක් ඇලවීමට වඩාත්ම සුදුසු ස්ථානය හෝ ස්ථාන ලෙස අධිකරණය සලකන ස්ථානයේ හෝ ස්ථානවල ඒ ආඥාවේ පිටපතක් අලවනු ලැබිය යුතු ය. ක්‍රියා කිරීම පැහැර හැරීමේ ප්‍රතිඵලය.

**100.** (1) ඒ ආඥාව කරනු ලැබුවේ යම් තැනැත්තකුට විරුද්ධව ද, ඒ තැනැත්තා විසින්, ඒ ආඥාවේ කාලය ඇතුළත - ආඥාව යොමු කරනු ලැබූ තැනැත්තා ඊට අවනත විය යුතු බව හෝ හේතු දැක්විය යුතු බව.

(අ) ඉන් විධාන කර තිබෙන ක්‍රියාව කළ යුතු ය; නැතහොත්

(ආ) 98 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ක්‍රියා කළ යුතු ය.

ක්‍රියා කිරීම පැහැර හැරීමේ ප්‍රතිඵලය.

(2) (1) වන උපවගන්තියෙන් නියම කර ඇති පරිදි, ඒ තැනැත්තා විසින් ඒ ක්‍රියාව කරනු නොලැබුවහොත් හෝ ඒ තැනැත්තා පෙනී නොසිට ආඥාව අවලංගු කරවා ගැනීම හෝ සුලු වශයෙන් වෙනස් කරවා ගැනීමට ඔහුට නොහැකි වුවහොත්, දණ්ඩ නීති සංග්‍රහයේ 185 වන වගන්තියේ ඒ වෙනුවෙන් නියම කර ඇති දණ්ඩනයට ඔහු යටත් විය යුතු අතර ආඥාව නියත බවට පත් කරනු ලැබිය යුතු ය;

එසේ වුව ද, ඒ තැනැත්තා සංස්ථාගත මණ්ඩලයක් නම්, එහි සෑම අධ්‍යක්ෂවරයකු ම, ඒ පැහැර හැරීම තමාගේ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් නිසා සිදු නොවූ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් හැර, මෙහි මින් පෙර නියම කරන ලද දණ්ඩනයට යටත් විය යුතු ය.

පෙනී සිටින විටක කාර්ය පටිපාටිය.

**101.** (1) ඒ තැනැත්තා පෙනී සිට ආඥාව අවලංගු කරවා ගැනීමට හෝ සුලු වශයෙන් වෙනස් කරවා ගැනීමට ඉල්ලා සිටියහොත් මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ කාරණය සම්බන්ධයෙන් සාක්ෂි ගනු ලැබිය යුතු ය.

(2) ආඥාව යුක්තිසහගත සහ යෝග්‍ය නොවේ යයි මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් වුවහොත්, ඔහු විසින් එය පරිච්ඡින්න කිරීම හෝ අවස්ථානුකූලව එය සුලු වශයෙන් වෙනස් කිරීම හෝ කළ යුතු අතර එය සුලු වශයෙන් වෙනස් කරන ලද අවස්ථාවක දී, ඒ ආඥාව එසේ සුලු වශයෙන් වෙනස් කරන ලද පරිදි නියත බවට පත් කරනු ලැබිය යුතු ය.

(3) මහෙස්ත්‍රාත්වරයා එසේ සෑහීමට පත් නොවුවහොත්, ආඥාව නියත බවට පත් කරනු ලැබිය යුතු ය.

ආඥාව නියත බවට පත් කරනු ලැබූ විට කාර්ය පටිපාටිය.

**102.** 100 වන වගන්තිය යටතේ හෝ 101 වන වගන්තිය යටතේ හෝ ආඥාවක් නියත බවට පත් කරනු ලැබූ විට, ඒ ආඥාව කරනු ලැබුවේ යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ තැනැත්තාට මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ බවට දැන්වීමක් කළ යුතු අතර ආඥාවෙන් විධාන කරන ලද ක්‍රියාව ඒ දැන්වීමේ සඳහන් කාලයක් ඇතුළත කරන ලෙස ඔහුට වැඩි දුරටත්

නියම කළ යුතු ය. තව ද, එයට අවනත නොවුවහොත්, 100 වන වගන්තියේ (2) වන උපවගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති දණ්ඩනවලට ඔහු යටත් වන බව ද මහෙස්ත්‍රාත්වරයා විසින් ඔහුට දැනුම් දිය යුතු ය.

ආඥාවට අවනත නොවීමේ ප්‍රතිඵලය.

**103.** (1) 102 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමේ සඳහන් කාලය ඇතුළත ඒ ක්‍රියාව කරනු නොලැබුවහොත්, එය කරනු ලැබීමට මහෙස්ත්‍රාත්වරයා විසින් සලස්වනු ලැබිය හැකි අතර ඒ ක්‍රියාව කිරීමෙහි ලා දරන ලද වියදම් ස්වකීය ආඥාව අනුව ඉවත් කරන ලද යම් ගොඩනැගිල්ලක්, භාණ්ඩ හෝ වෙනත් දේපළ විකිණීමෙන් හෝ ස්වකීය අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව ඇතුළත හෝ ඒ සීමාවෙන් පිටත හෝ පිහිටි, ඒ තැනැත්තාගේ වෙනත් යම් චංචල දේපළක් තහනමට ගෙන විකිණීමෙන් හෝ ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් අය කර ගනු ලැබිය හැකි ය. එකී වෙනත් දේපළ ඒ සීමාවෙන් පිටත පිහිටා ඇත්නම්, තහනමට ගනු ලැබීමට තිබෙන දේපළ තිබෙන්නේ යම් මහෙස්ත්‍රාත්වරයකුගේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව ඇතුළත ද, ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාව පිටසන් කරන ලද විට, ඒ දේපළ තහනමට ගෙන, විකිණීමට ආඥාවෙන් බලය දෙනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ සද්භාවයෙන් කරන ලද යම් දෙයක් සම්බන්ධයෙන් සිවිල් නඩුවක් පැවරිය නොහැකි විය යුතු ය.

විභාගය පවත් වනු ලබන තෙක් ඉන්ජන්ක්ෂන් තහනම් නිකුත් කිරීම.

**104.** (1) මහජනයාට සිදුවිය හැකි අත්‍යාසන්න බරපතල අනතුරක් හෝ හානියක් වැළැක්වීම සඳහා වහාම පියවර ගත යුතු යයි 98 වන වගන්තිය යටතේ ආඥාවක් කළ මහෙස්ත්‍රාත්වරයා විසින් සලකනු ලැබුවහොත් ඒ අනතුර මඟ හැරවීම සඳහා හෝ හානිය වැළැක්වීම සඳහා අවශ්‍ය යම් ඉන්ජන්ක්ෂන් තහනමක් ඒ ආඥාව කරනු ලැබුවේ යම් තැනැත්තකුට විරුද්ධව ද, ඒ තැනැත්තා වෙත මහෙස්ත්‍රාත්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) වහාම ඉන්ජන්ක්ෂන් තහනමට අවනත වීම ඒ තැනැත්තා පැහැර හැරි විටක, ඒ අනතුර මඟ හැරවීම සඳහා හෝ ඒ හානිය වැළැක්වීම සඳහා සුදුසු යයි තමා කල්පනා කරන ක්‍රියා මාර්ගයක් ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ගැනීම හෝ ගැනීමට සැලැස්වීම හෝ කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයකු විසින් සද්භාවයෙන් කරන ලද යම් දෙයක් සම්බන්ධයෙන් සිවිල් නඩුවක් පැවරිය නොහැකි විය යුතු ය.

මහජන පීඩා දිගටම කිරීම මහෙස්ත්‍රාත්වරයකු විසින් තහනම් කළ හැකි බව.

**105.** දණ්ඩ නීති සංග්‍රහයේ හෝ යම් විශේෂ හෝ දේශීය නීතියක අර්ථ කථනය කරනු ලැබ ඇති පරිදි මහජන පීඩාවක් නැවත නොකරන ලෙසට මහෙස්ත්‍රාත්වරයකු විසින් යම් තැනැත්තකුට ආඥා කරනු ලැබිය හැකි ය.

## ආ - පීඩා පිළිබඳ හදිසි අවස්ථාවල දී තාවකාලික ආඥා

පීඩා පිළිබඳ හදිසි අවස්ථාවල දී නියත ආඥාවක් වහාම නිකුත් කිරීමට ඇති බලය.

**106.** (1) මහෙස්ත්‍රාත්වරයකුගේ මතය අනුව, වහාම වැළැක්වීම හෝ ක්ෂණික ප්‍රතිකර්ම යෙදීම හෝ යෝග්‍ය වන අවස්ථාවල දී, එක්තරා ක්‍රියාවකින් වැළකී සිටින ලෙස හෝ තම සන්තකයේ තිබෙන හෝ තම කළමනාකාරීත්වයට යටත් එක්තරා දේපළක් පිළිබඳව යම් කිසි පියවරක් ගන්නා ලෙස යම් තැනැත්තකුට විධානයක් කිරීමෙන්, නීත්‍යානුකූලව සේවයේ නියුක්ත කරනු ලැබ සිටින යම් තැනැත්තන්ට සිදුවන බාධකයක්, කරදරයක් හෝ හානියක් හෝ බාධකයක් සිදුවීමේ, කරදරයක් සිදුවීමේ හෝ හානියක් සිදුවීමේ අවදානම් හෝ මනුෂ්‍ය ජීවිතයට, සෞඛ්‍යයට හෝ ආරක්ෂාවට සිදුවන අනතුරක් නැතහොත් කැරැල්ලක් හෝ කලහයක් වැළකීමට ඉඩ ඇතැයි හෝ එය වැළකීමට ඒ විධානය තුඩු දේ යයි මහෙස්ත්‍රාත්වරයා විසින් සලකනු ලැබුවහොත්, ඒ ක්‍රියාවෙන් වැළකී සිටින ලෙසට හෝ ඒ දේපළ පිළිබඳ වූ ඒ පිළිවෙළ අනුව ක්‍රියා කරන ලෙසට, ඒ අවස්ථා පිළිබඳ වැදගත් සිද්ධි සඳහන් කරන හා 99 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් භාර දෙනු ලැබිය යුතු ලිඛිත ආඥාවක් මගින් මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තාට එසේ විධානයක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක්, හදිසි අවස්ථාවල දී හෝ ඒ ආඥාව යොමු කරනු ලැබුවේ යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ තැනැත්තා වෙත නියමිත කාලය තුළ දැන්වීමක් භාරදීම අවස්ථාගත කරුණු අනුව කළ නොහැකි අවස්ථාවල දී ඒකපාක්ෂිකව කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ආඥාවක්, එක්තරා තැනැත්තකු වෙත හෝ එක්තරා ස්ථානයක ගැවසෙන විට හෝ ඒ ස්ථානයට පැමිණෙන විට පොදුවේ මහජනයා වෙත හෝ යොමු කරනු ලැබිය හැකි අතර පසුව සඳහන් අවස්ථාවේ දී, ආඥාවේ පිටපතක් 99 වන වගන්තියේ (2) වන උප වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි අලවනු ලැබිය යුතු ය.

(4) යම් මහෙස්ත්‍රාත්වරයකු විසින්, (1) වන උපවගන්තිය යටතේ තමා විසින් ම හෝ තම ධුරයේ පූර්වගාමියා විසින් හෝ කරන ලද යම් ආඥාවක් අවලංගු කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තිය යටතේ කරන ලද යම් ආඥාවක්, මනුෂ්‍ය ජීවිතයට, සෞඛ්‍යයට හෝ ආරක්ෂාවට අනතුරක් සිදුවන අවස්ථාවල දී හෝ කැරැල්ලක් හෝ කලහයක් සිදුවිය හැකි අවස්ථාවල දී, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් අන්‍යාකාරයෙන් විධාන කරතහොත් මිස ඒ ආඥාව කරන ලද දින සිට දින දෑහහතරකට වැඩි කාලයක් බලාත්මක නොවිය යුතු ය.

## X වන පරිච්ඡේදය

## සාම නිලධරයන්ගේ නිවාරක ක්‍රියා

**107.** (1) යම් සංඥෙය වරදක් සිදු කිරීම වැළැක්වීමේ කාර්යය සඳහා සෑම සාම නිලධරයකු ම විසින් මැදිහත් වී ක්‍රියා කරනු ලැබිය හැකි අතර ඔහු විසින් එය තමාගේ උපරිම හැකියාව යොදවා වැළැක්විය යුතු ය.

සාම නිලධරයන් විසින් සංඥෙය වැරදි වැළැක්විය යුතු බව.

(2) යම් සංඥෙය වරදක් සිදු කිරීමට තැත් කිරීමක් පිළිබඳව තොරතුරක් ලැබුණු සෑම සාම නිලධරයකු ම විසින්, තමා ආසන්නව ම කණිෂ්ඨ වන්නේ යම් නිලධරයකුට ද ඒ නිලධරයාට හෝ එවැනි යම් වරදක් සිදු කිරීම වැළැක්වීම හෝ එය සංජානනය කිරීම යම් නිලධරයකුගේ කාර්යය වන්නේ ද ඒ නිලධරයාට හෝ එම තොරතුරු දැනුම් දිය යුතු ය.

එවැනි වරදක් කිරීමට තැත් කිරීම පිළිබඳ තොරතුරු.

එවැනි වැරදි වැළැක්වීම පිණිස සාම නිලධරයන් විසින් ආඥාවක් හෝ වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගනු ලැබිය හැකි බව.

(3) යම් සංඥෙය වරදක් සිදු කිරීමට තැත් කර ඇති බව දන්නා සාම නිලධරයකු විසින්, ඒ වරද සිදු කිරීම අන්‍යාකාරයකින් වැළැක්විය නොහැකි බව ඒ නිලධරයාට පෙනී ගියහොත්, ඒ වරද සිදු කිරීමට එසේ තැත් කරන තැනැත්තා මහෙස්ත්‍රාත්වරයකුගේ ආඥාවක් නොමැතිව සහ වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගනු ලැබිය හැකි ය.

පොදු දේපළවලට හානි කිරීම වැළැක්වීම

(4) තමාගේ මතය අනුව යම් චංචල හෝ නිශ්චල පොදු දේපළකට සිදු කිරීමට තැත් කරනු ලබන යම් හානියක් හෝ යම් පොදු ඉම් සලකුණක් හෝ ඉපියාවක් හෝ මුහුදු යාත්‍රා කිරීම සඳහා භාවිත කරනු ලබන වෙනත් සලකුණක් ඉවත් කිරීම හෝ වැළැක්වීම සඳහා යම් සාම නිලධරයකු විසින් තමාගේ ම අධිකාරය පිට මැදිහත් වී ක්‍රියා කරනු ලැබිය යුතු ය.

පඩි හා මිම් පරීක්ෂකවරයන්ට සහාය දීම.

(5) පඩි හා මිම්* පිළිබඳව තත් කාලයේ බලපවත්නා යම් ප්‍රඥප්තියක වූ විධිවිධානයක් කඩ කිරීම පිළිබඳව යම් පඩි හා මිම් පරීක්ෂකවරයකුට වහාම තොරතුරු දැන්වීම සහ එවැනි යම් පරීක්ෂකවරයකුගේ ඉල්ලීම පිට එවැනි යම් ප්‍රඥප්තියක විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ඔහුට සහාය දීම සෑම සාම නිලධරයකුගේ ම කාර්යය විය යුතු ය.

## V වන කොටස

## වැරදි පිළිබඳව විමර්ශනය කිරීම

## XI වන පරිච්ඡේදය

### පොලිස් නිලධරයන් වෙත සහ පරීක්ෂකවරයන් වෙත තොරතුරු දැන්වීම සහ විමර්ශනය කිරීම සඳහා ඔවුන්ට ඇති බලතල

පරීක්ෂකවරයන් පත් කිරීම.

**108.** අමාත්‍යවරයා විසින් යම් ප්‍රදේශයක් සඳහා පරීක්ෂකවරයකු වශයෙන් යම් තැනැත්තකු නමින් හෝ නිලයෙන් පත් කරනු ලැබිය හැකි අතර ඒ ප්‍රදේශයේ සීමා ඔහුගේ පත්වීමෙහි සඳහන් කරනු ලැබිය යුතු ය.

වරදක් පිළිබඳ තොරතුරු.

**109.** (1) වරදක් සිදු කිරීම පිළිබඳ සෑම තොරතුරක් ම පොලිස් නිලධරයකු වෙත හෝ පරීක්ෂකවරයකු වෙත වාචිකව හෝ ලියවිල්ලකින් හෝ දෙනු ලැබිය යුතු ය.

* 1995අංක 35 දරන කිරුම් හා මිනුම් පනත බලන්න.

(2) එවැනි තොරතුරක් පොලිස් නිලධරයකු වෙත හෝ පරීක්ෂකවරයකු වෙත වාචිකව දෙනු ලැබීනි නම්, එය දෙන ලද භාෂාවෙන් ඔහු විසින් එය ලියා ගත යුතු අතර තොරතුරු දැන් වූ තැනැත්තාට ඇසෙන සේ එය කියවිය යුතු ය:

එසේ වුව ද, තොරතුරු දෙන ලද භාෂාවෙන් එය වාර්තාගත කිරීමට පොලිස් නිලධරයාට හෝ පරීක්ෂකවරයාට නොහැකි නම් ඒ පොලිස් නිලධරයා හෝ පරීක්ෂකවරයා විසින් ඒ තොරතුරු ලිඛිතව දෙන ලෙස ඉල්ලා සිටිනු ලැබිය හැකි ය. ඒ තොරතුරු දැන් වූ තැනැත්තාට ඒ තොරතුරු ලිඛිතව දැනුම් දීමට නොහැකි නම් ජාතික භාෂා අතුරින් එක් ජාතික භාෂාවකින් එය වාර්තාගත කිරීමට සිදු වූ හේතු වාර්තාගත කරනු ලැබීමෙන් පසුව, පොලිස් නිලධරයා හෝ පරීක්ෂකවරයා විසින් ඒ තොරතුරු එක් ජාතික භාෂාවකින් වාර්තාගත කොට තොරතුරු දැන්වූ තැනැත්තාට ඇසෙන සේ වාර්තාව කියවීම හෝ ඔහුට වැටහෙන භාෂාවෙන් එය භාෂණ පරිවර්තනය කිරීම හෝ කළ යුතු ය.

(3) එවැනි සෑම තොරතුරක් ම, ලියවිල්ලකින් දෙනු ලැබුව ද නැතහොත් ඉහත කී පරිදි ලියා ගනු ලැබුව ද, දැන් වූ තැනැත්තා විසින් අත්සන් කළ යුතු අතර, අවස්ථාවෝචිත පරිදි ඒ පොලිස් නිලධරයා විසින් හෝ පරීක්ෂකවරයා විසින් පහසු පරිදි, ඒ තොරතුර හෝ එහි පිටපතක් පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් පොලිස් ස්ථානයේ තබා ගනු ලබන හෝ පරීක්ෂකවරයා විසින් තබා ගනු ලබන, මෙහි මින් පසු "තොරතුරු සටහන් පොත" යනුවෙන් හඳුන්වනු ලබන, පොතක අප්‍රමාද ව ඇතුළත් කරනු ලැබිය යුතු ය. ඒ තොරතුරු සටහන් පොත අමාත්‍යවරයා විසින් තත් කාර්යය සඳහා සාදනු ලබන නියෝග මගින් විධිවිධාන සලස්වනු ලබන යම් ආකෘතියක් අනුව විය යුතු ය.

එසේ වුව ද, තොරතුරු සටහන් පොත පිළිබඳ ආකෘතිය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග මගින් විධිවිධාන සලස්වනු ලබන තුරු, නියමිත දිනයට ඉහතින් ම වූ දිනයෙහි භාවිත වූ ආකෘති, භාවිතය සඳහා දිගට ම වලංගුව පැවතිය යුතු ය.

(4) තොරතුරු ලැබුණු පොලිස් නිලධරයකු පොලිස් ස්ථානය භාර නිලධරයා නොවන්නේ නම්, ඒ පොලිස් නිලධරයා විසින් තොරතුරු පිළිබඳ සිද්ධි පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත වහා ම වාර්තා කළ යුතු ය.

[1980 අංක 52 § 3]

*(4අ) පොලිස් නිලධරයකු ඉදිරියෙහි වරදක් සිදු කරනු ලැබූ අවස්ථාවක, වරද සිදු කරන ලද ස්ථානයේ හෝ ඒ අසල සිටි යම් තැනැත්තකුගේ ප්‍රකාශය හා යම් සැකකරුවකුගේ ප්‍රකාශය ඔහු විසින් වාර්තාගත කරනු ලැබිය හැකි අතර, ඒ පොලිස් නිලධරයා වරද සිදු කරන ලද්දේ යම් ප්‍රදේශයක ද ඒ ප්‍රදේශයේ පොලිස් ස්ථානය භාර නිලධරයා නොවන්නේ නම්, ඔහු විසින් ඒ පිළිබඳ සිද්ධි ඒ පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත වහාම වාර්තා කළ යුතු ය.

සංඥෙය වරදක් සිදු කරන බව හෝ සාමය කඩ කිරීමක් සිදුකරන බව සැක කරනු ලබන අවස්ථාවල දී කාර්ය පටිපාටිය
[1980 අංක 52 § 3]

*(5) (අ) යම් වරදක් සිදු කරන ලද බවට ලැබුණු තොරතුරු අනුව හෝ අන්‍යාකාරයකින් සැක කිරීමට පොලිස් ස්ථානය භාර නිලධරයකුට හෝ පරීක්ෂකවරයකුට හේතු තිබේ නම්, මේ ඡේදය යටතේ මෙහි මින් මතු දක්වා ඇති ආකාරයෙන් ඔහු විසින් විමර්ශනයක් කළ යුතු ය; නැතහොත් විමර්ශනයක් කිරීම සඳහා ඔහු විසින් බලය දිය යුතු ය;

එසේ වුව ද වරද සංඥෙය වරදක් වන්නේ නම් හෝ සාමය කඩ කිරීමක් සිදු කරන බව සැක කිරීමට ඔහුට හේතු තිබේ නම්, සෑම පරීක්ෂකවරයකු ම සම්බන්ධයෙන් වන විට ඒ සෑම පරීක්ෂකවරයකු විසින් ම, ඒ වරද සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඒ පිළිබඳ වාර්තාවක් වහාම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; පොලිස් ස්ථානය භාර නිලධරයකු සම්බන්ධයෙන් වන විට ඒ නිලධරයා විසින් ඔහුගේ ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිලධරයා වෙත ඒ පිළිබඳ වාර්තාවක් වහාම ඉදිරිපත් කළ යුතු ය;තව ද ඒ පිළිබඳ සිද්ධි සහ අවස්ථාගත කරුණු විමර්ශනය කිරීමට ද වරදකරු වහාම සොයා සිර භාරයට ගැනීම පිණිස අවශ්‍ය යම් පියවර ගැනීමට ද ඒ ස්ථානයට ඒ සෑම පොලිස් පරීක්ෂකවරයකුම නැතහොත් පොලිස් ස්ථානය භාර නිලධරයකු පෞද්ගලිකව යා යුතු ය:

එසේ ම තව දුරටත්, ඒ විමර්ශනය කිරීම සඳහා වරදකරු සොයා සිර භාරයට ගැනීම පිණිස අවශ්‍ය යම් පියවර ගැනීම සඳහා ඒ ස්ථානයට යාම යම් පොලිස් ස්ථානයක් භාර නිලධරයකු විසින් තමාගේ යටත් නිලධරයන් අතුරින් යම් නිලධරයකුට පවරනු ලැබිය හැකි ය.

---

* 1979 ජුලි මස 2 වන දිනට අතීතයට බලපාන පරිදි - 1979 අංක 68 දරන පනතේ 3 වන වගන්තිය බලන්න.

(ආ) විමර්ශනයක් ආරම්භ කිරීමට තරම් ප්‍රමාණවත් හේතු නොමැති බව පොලිස් ස්ථානයක් භාර නිලධරයකුට හෝ පරීක්ෂකවරයකුට පෙනී ගියහොත් ඒ කාරණය පිළිබඳ ව විමර්ශනය කිරීමට ඒ පොලිස් නිලධරයා හෝ පරීක්ෂකවරයා බැඳී නොසිටිය යුතු ය.

තොරතුරු සැපයිය හැකි තැනැත්තන්ට පැමිණෙන ලෙස නියම කිරීමට පොලිස් නිලධරයකුට හෝ පරීක්ෂකවරයකුට ඇති බලය.

(6) මේ පරිච්ඡේදය යටතේ විමර්ශනයක් කරන යම් පොලිස් නිලධරයකු විසින් ඒ පොලිස් නිලධරයාගේ පොලිස් ස්ථානයේ හෝ යාබද යම් පොලිස් ස්ථානයක හෝ බල සීමාව ඇතුළත නැතහොත් ඒ පරීක්ෂකවරයාගේ ප්‍රාදේශීය බල සීමාව ඇතුළත පදිංචිව සිටින්නා වූ ද එම කාරණය සම්බන්ධයෙන් අවස්ථාගත කරුණු දන්නා බව ලැබුණු තොරතුරු අනුව හෝ අන්‍යාකාරයකින් පෙනී යන්නා වූ ද යම් තැනැත්තකුට තමා ඉදිරියට පැමිණෙන ලෙස ලියවිල්ලකින් වූ නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි අතර එසේ නියම කරන ලද පරිදි ඒ තැනැත්තා පැමිණිය යුතු ය. පැමිණෙන ලෙස පරීක්ෂකවරයා විසින් නියම කරනු ලැබූ විට, යම් තැනැත්තකු එසේ පැමිණීම ප්‍රතික්ෂේප කළ හොත් හෝ පැහැර හැරිය හොත්, ඉහත නියමය මගින් නියම කරන ලද පරිදි ඒ තැනැත්තා පැමිණ සිටින බවට වග බලා ගැනීම පිණිස පරීක්ෂකවරයා විසින් තම අභිමතය පරිදි වරෙන්තුවක් නිකුත් කරනු ලැබිය හැකි ය.

පොලිස් නිලධරයකු හෝ පරීක්ෂකවරයකු විසින් සාක්ෂිකරුවන්ගෙන් ප්‍රශ්න කිරීම.

**110.** (1) මේ පරිච්ඡේදය යටතේ විමර්ශනයක් කරන යම් පොලිස් නිලධරයකු විසින්, ඒ කාරණය පිළිබඳ සිද්ධි සහ අවස්ථාගත කරුණු දනිතැ යි සිතිය හැකි යම් තැනැත්තකුගෙන් වාචිකව විභාග කරනු ලැබිය හැකි අතර එසේ විභාග කරනු ලැබූ තැනැත්තා විසින් කරන ලද ඕනෑම ප්‍රකාශයක් ලියා ගත යුතු ය. එහෙත් එවැනි යම් තැනැත්තකු ලවා යම් දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් කරවීම හෝ නොකළ යුතු ය. 109 (2) වන වගන්තියෙහි දක්වා ඇති ආකාරයට, ඒ මුළු ප්‍රකාශය ම සම්පූර්ණයෙන් වාර්තාගත කළ යුතු ය. පොලිස් නිලධරයා විසින් හෝ පරීක්ෂකවරයා විසින් යම් දෙයක් පැහැදිලිව කර ගැනීම සඳහා යම් ප්‍රශ්නයක් අසනු ලැබුවහොත් ඒ ප්‍රශ්නය ද, ඊට දෙනු ලබන උත්තරය ද, ප්‍රශ්නයක් සහ උත්තරයක් වශයෙන් වාර්තාගත කළ යුතු ය. ඒ වාර්තාව ඔහුට පෙන්වීම හෝ ඔහුට ඇසෙන ලෙස කියවීම හෝ කළ යුතු ය. එය ලියනු ලැබ තිබෙන භාෂාව ඔහුට නොවැටහේ නම්, ඔහුට වැටහෙන භාෂාවකින් එය භාෂණ පරිවර්තනය කරනු ලැබිය යුතු අතර එම ප්‍රකාශය

පැහැදිලි කිරීමට හෝ ඊට යමක් එකතු කිරීමට හෝ ඔහුට නිදහස තිබිය යුතු ය. එවිට ප්‍රකාශය කරන තැනැත්තා විසින් ඒ ප්‍රකාශය අවසන් වන තැනම අත්සන් කළ යුතු ය. ඒ ප්‍රකාශය වාර්තාගත කරන පොලිස් නිලධරයා හෝ පරීක්ෂකවරයා විසින් ඒ වාර්තාගත කරනු ලබන එක් එක් ප්‍රකාශයට පහලින් පහත සඳහන් සහතිකය ලිවිය යුතු ය : -

"ඉහත නම් සඳහන් ....................................... ගේ ප්‍රකාශය ....................................... වන මා විසින් අවංක ලෙසත් නිවැරදි ලෙසත් වාර්තාගත කරන ලද බව මම මෙයින් ප්‍රකාශ කරමි. "

ඒ ප්‍රකාශය තොරතුරු සටහන් පොතෙහි වාර්තාගත කරනු නොලැබුවහොත් එහි සත්‍ය පිටපතක් ඒ පොලිස් නිලධරයා විසින් හෝ පරීක්ෂකවරයා විසින් හැකි පහසු ඉක්මනින් තොරතුරු සටහන් පොතෙහි ඇතුළත් කළ යුතු ය. ඒ ප්‍රකාශයෙහි යම් වෙනසක් කරන විට එය කරන තැනැත්තා විසින් එහි තම කෙටි අත්සන යෙදිය යුතු ය. තව ද කරන ලද වෙනස් කිරීම හේතුවෙන් ඉවත් කිරීමට අවශ්‍ය වන ප්‍රකාශයෙහි යම් කොටසක් ඒ කොටස කියවීමට නොහැකි බවට පත් නොවන යම් ආකාරයකින් කපා හරිනු ලැබිය යුතු ය.

(2) තමා අපරාධ චෝදනාවකට හෝ දණ්ඩනයකට හෝ රාජ්‍ය සන්තක කිරීමකට භාජන කිරීමේ නැඹුරුතාවක් ඇති ප්‍රශ්න හැර, ඒ කාරණයට අදාළව ඒ නිලධරයා හෝ පරීක්ෂකවරයා විසින් තමාගෙන් අසනු ලබන සියලු ප්‍රශ්නවලට සත්‍ය පිළිතුරු දීමට ඒ තැනැත්තා යටත් විය යුතු ය.

පොලිස් නිලධරයකුට හෝ පරීක්ෂකවරයකුට කරනු ලබන ප්‍රකාශ සාක්ෂි ආඥාපනතට අනුකූලව උපයෝගී කර ගත යුතු බව.

(3) යම් විමර්ශනයක් කරනු ලබන අතරතුර යම් තැනැත්තකු විසින් යම් පොලිස් නිලධරයකුට කරන ලද ප්‍රකාශයක්, ඒ තැනැත්තාගේ සාක්ෂි අධිකරණයේ දී අනුසන්ධානය කිරීමේ කාර්යය සඳහා හැර, සාක්ෂි ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව උපයෝගී කර ගනු ලැබිය හැකි ය:

එසේ වුව ද යම් විමර්ශනයක් පවත්වනු ලබන අතරතුර දී චූදිත තැනැත්තකු විසින්, කරන ලද ප්‍රකාශයක්, ඔහු වෙනස් ප්‍රකාශයක් වෙනස් වේලාවක දී කළ බව ඔප්පු කිරීමට පමණක් පාවිච්චි කළ යුතු ය.

මේ උප වගන්තියෙහි වූ කිසිවක්, සාක්ෂි ආඥාපනතේ 27 වන වගන්තියේ විධිවිධාන යටතේ ගැනෙන යම් ප්‍රකාශයකට අදාළ වන්නේ යයි හෝ යම් විමර්ශනයක් පවත්වනු ලබන අතරතුර දී යම් තැනැත්තකු විසින් කරන ලද ප්‍රකාශයක් දණ්ඩ නීති සංග්‍රහයේ 180 වන වගන්තිය යටතේ වූ චෝදනාවක දී සාක්ෂි වශයෙන් උපයෝගී කර ගනු ලැබීම ඒ කිසිවකින් වළක්වන්නේ යයි හෝ සලකනු නොලැබිය යුතු ය.

(4) යම් අපරාධ අධිකරණයක පරීක්ෂණයකට හෝ නඩු විභාගයට භාජනව තිබෙන යම් නඩුවක දී වාර්තාගත කරන ලද ප්‍රකාශය ඒ අධිකරණය විසින් ගෙන්වා ගෙන, ඒ ප්‍රකාශ ඒ නඩුවේ සාක්ෂි වශයෙන් නොව, ඒ පරීක්ෂණයේ දී හෝ නඩු විභාගයේ දී ආධාරකයක් ලෙස උපයෝගී කර ගනු ලැබිය හැකි ය. 444 වන වගන්තියෙහි අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, හුදෙක් ඒ ප්‍රකාශ පිළිබඳව අධිකරණය විසින් සඳහන් කරනු ලැබීම නිසා ම, ඒ ප්‍රකාශය ඉල්ලා සිටීමට හෝ ඒ ප්‍රකාශය බැලීමට හෝ චූදිතයාට හෝ ඔහුගේ අනුයෝජිතයන්ට හිමිකම් නොතිබිය යුතු ය. එහෙත් ඒ ප්‍රකාශ වාර්තාගත කළ පොලිස් නිලධරයා විසින් හෝ පරීක්ෂකවරයා විසින් හෝ සාක්ෂිකරු විසින් තම මතකය අලුත් කර ගැනීම පිණිස ඒ ප්‍රකාශය උපයෝගී කර ගනු ලැබුවහොත් හෝ ඒ පොලිස් නිලධරයාගේ හෝ පරීක්ෂකවරයාගේ හෝ සාක්ෂිකරුගේ සාක්ෂි බිඳ හෙළීමේ කාර්යය සඳහා අධිකරණය විසින් ඒ ප්‍රකාශ උපයෝගී කර ගනු ලැබුව හොත්, අවස්ථාවෝචිත පරිදි, සාක්ෂි ආඥාපනතේ 161 වන වගන්තියේ හෝ 145 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය:

එසේ වුව ද යම් වරදක් සම්බන්ධයෙන් XV වන පරිච්ඡේදය යටතේ මූලික පරීක්ෂණයක් පවත්වනු ලබන අවස්ථාවක, ඒ දක්වා වාර්තාගත කර තිබෙන සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ චූදිතයා විසින් ඉල්ලා සිටින ලද විට, පරීක්ෂණය පැවැත්වෙන අතරතුර විවෘත අධිකරණයේ දී ඔහු විසින් කියවා බලනු ලැබීම සඳහා ඔහුට ලබා ගත හැකි විය යුතු ය.

කිසිම පෙළඹවීමක් නොකළ යුතු බව.

**111.** යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා නගා ඇති යම් තැනැත්තකුට විරුද්ධව ඇති ඒ චෝදනාව පිළිබඳව යම් ප්‍රකාශයක් කරන ලෙසට ඒ තැනැත්තා පෙළඹවීම පිණිස යම් පරීක්ෂකවරයකු විසින් හෝ පොලිස් නිලධරයකු විසින් යම් පෙළඹවීමක් කිරීම,

තර්ජනයක් කිරීම හෝ පොරොන්දුවක් දීම හැනහොත් පෙළඹවීමක් හෝ තර්ජනයක් කිරීමට හෝ පොරොන්දුවක් දීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය. එහෙත් මේ පරිච්ඡේදය යටතේ යම් විමර්ශනයක් කරනු ලබන අතරතුර දී සිය කැමැත්තෙන් ම යම් ප්‍රකාශයක් කිරීමට කැමති වන යම් තැනැත්තකු යම් අවවාදයක් මගින් හෝ අන්‍යාකාරයකින් ඉන් වැළැක්වීම හෝ අධෛර්යයට පත් කිරීම යම් පරීක්ෂකවරයකු විසින් හෝ පොලිස් නිලධරයකු විසින් හෝ නොකළ යුතු ය.

පොලිස් නිලධරයකු හෝ පරීක්ෂකවරයකු විසින් සෝදිසි කරනු ලැබීම

**112** (1) සංඥෙය කාරණයක් පිළිබඳව විමර්ශනයක් පැවැත්වීම සඳහා යම් ලේඛනයක් හෝ දෙයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය යයි විමර්ශනයක් කරන යම් පොලිස් ස්ථානයක් භාර නිලධරයකු හෝ පරීක්ෂකවරයකු සලකන සහ 66 වන වගන්තිය යටතේ සිතාසියක් හෝ ආඥාවක් නිකුත් කරනු ලැබූ හෝ නිකුත් කරනු ලැබිය හැකි තැනැත්තකු ඒ සිතාසියෙන් හෝ ආඥාවෙන් විධාන කර ඇති පරිදි ඒ ලේඛනය හෝ දෙය ඉදිරිපත් නොකරනු ඇතැයි විශ්වාස කිරීමට හේතු තිබෙන කවර හෝ විටක හැනහොත් ඒ ලේඛනය හෝ දෙය යම් තැනැත්තකුගේ සන්තකයේ තිබේ යයි නොදන්නා විටක හෝ ඒ නිලධරයා විසින් හෝ පරීක්ෂකවරයා විසින් යම් ස්ථානයක් ඒ සඳහා සෝදිසි කිරීම හෝ සෝදිසි කිරීමට සැලැස්වීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) ඔහුට ඒ සෝදිසිය ඒ නිලධරයා විසින් ම හෝ පරීක්ෂකවරයා විසින් ම කළයුතු ය.

(3) ඔහුට ඒ සෝදිසිය පෞද්ගලිකව කළ නොහැකි නම් සහ ඒ සෝදිසිය කිරීමට ඇති වෙනත් තැනැත්තකු ඒ වේලාවේ දී නොසිටි නම්, ඒ සෝදිසිය කරන ලෙස ඔහු විසින් යම් ග්‍රාම නිලධරයකුට නියම කරනු ලැබිය හැකි අතර සෝදිසිය කළ යුත්තේ යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් පිළිබඳව ද ඒ ලේඛනය හෝ දෙය සහ සෝදිසි කරනු ලැබිය යුතු ස්ථානය දැක්වෙන ලියවිල්ලකින් වූ නියමයක් ඔහු විසින් ඒ ග්‍රාම නිලධාරියාට භාර දිය යුතු ය. එවිට ඒ ග්‍රාම නිලධාරී විසින් ඒ දෙය සඳහා ඒ ස්ථානය සෝදිසි කරනු ලැබිය හැකි ය.

(4) සෝදිසි වරෙන්තුවලට සහ ඒවා යටතේ වූ සෝදිසි කිරීම්වලට අදාළ මේ සංග්‍රහයේ විධිවිධාන, මේ වගන්තිය යටතේ කරනු ලබන සෝදිසි සම්බන්ධයෙන් හැකි තාක් දුරට, අදාළ විය යුතු ය.

**113.** යම් යටත් පොලිස් නිලධරයකු විසින් මේ පරිච්ඡේදය යටතේ යම් විමර්ශනයක් කරන ලද විට, ඔහු විසින් ඒ විමර්ශනයේ ප්‍රතිඵලය පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත වාර්තා කළ යුතු ය.

පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත වාර්තා කිරීම යටත් නිලධරයකුගේ කාර්යය වන බව.

**114.** චූදිතයා මහෙස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලැබීම යුක්ති සහගත වීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි හෝ සැකයක් පිළිබඳ සාධාරණ හේතු ඇති බව මේ පරිච්ඡේදය යටතේ විමර්ශනයකින් පසු, පොලිස් ස්ථානය භාර නිලධරයාට හෝ පරීක්ෂකවරයාට පෙනී ගියහොත්, ඒ තැනැත්තා අත් අඩංගුවේ සිටි නම්, ඒ වරද පිළිබඳව නඩු විභාග කිරීම සඳහා හෝ පරීක්ෂණයක් කිරීම සඳහා අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ පෙනී සිටින ලෙස නියම කරනු ලැබුවහොත් සහ නියම කරනු ලැබූ විට එසේ පෙනී සිටින බවට, ඒ නිලධරයා හෝ පරීක්ෂකවරයා විසින් විධාන කරනු ලබන පරිදි ඇප ඇතිව හෝ නැතිව ඒ තැනැත්තා විසින් බැඳුම්කරයක් ලියා අත්සන් කිරීම මත ඒ නිලධරයා විසින් හෝ පරීක්ෂකවරයා විසින් ඔහු මුදා හැරිය යුතු ය.

සාක්ෂි ප්‍රමාණවත් නොවේ නම් චූදිතයා මුදා හැරීම

**115.** *(1) මේ පරිච්ඡේදය යටතේ වූ විමර්ශනයක් 37 වන වගන්තියෙන් නියම කරනු ලැබ ඇති පරිදි පැය විසි හතරක කාලය ඇතුළත නිම කරනු ලැබිය නොහැකි සහ වැඩි දුරටත් විමර්ශනය කිරීම අවශ්‍ය බව විශ්වාස කිරීමට හේතු ඇති කවර හෝ විටක පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් හෝ පරීක්ෂකවරයා විසින්, සැකකරු ඒ කාරණය පිළිබඳව අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත වහාම ඉදිරිපත් කළ යුතු අතර, ඒ කාරණයට අදාළව ඒ විමර්ශනය කරනු ලබන අතරතුර විභාග කරනු ලැබූ එක් එක් සාක්ෂිකරු විසින් කරන ලද ප්‍රකාශ කිසිවක් වේ නම්, ඒ ප්‍රකාශ පිළිබඳ සාරාංශයක් ද සමඟ ඒ සිද්ධි පිළිබඳ වාර්තාවක් ඒ මහෙස්ත්‍රාත්වරයා වෙත එවේලේම යැවිය යුතු ය.

පැය විසි හතරක් තුළ විමර්ශනය නිම කළ නොහැකි වූ විට කාර්යය පටිපාටිය [1980 අංක 52 § 4]

(2) වැඩි දුරටත් විමර්ශනය පවත්වනු ලබන තුරු සැකකරු අත්අඩංගුවේ රඳවා තබා ගැනීම අවස්ථානුකූල බවට, මේ වගන්තිය යටතේ සැකකරුවකු ඉදිරිපත් කරනු ලැබුවේ යම්

* 1979 ජූලි මස 2 වන දිනට අතීතයට බලපාන පරිදි, 1979 අංක 68 දරන පනතේ 3 වන වගන්තිය බලන්න.

මහෙස්ත්‍රාත්වරයකු වෙත ද ඒ මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් වුවහොත්, ඔහු විසින් ස්වකීය හේතු සටහන් කිරීමෙන් පසු, දවස් පහළොවක් වූ සම්පූර්ණ කාලය සඳහා එහෙත් දින ගණන ඊට වැඩි නොවන පරිදි, සැකකරු රඳවා තබා ගැනීමට යම් බන්ධනාගාරයක අධිකාරීවරයා වෙත යවනු ලබන බලපත්‍රයක් මගින් බලය දෙනු ලැබිය හැකි ය. 264 වන වගන්තියේ විධිවිධාන එවැනි සෑම බලපත්‍රයකට ම අදාළ විය යුතු ය. එකී දින පහළොවක් වූ කාලය අවසානයේ දී, නඩු පවරනු නොලැබුවහොත් මහෙස්ත්‍රාත්වරයා විසින් (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සැකකරු නිදහස් කරනු ලැබිය හැකි ය. නැතහොත් පෙනී සිටින ලෙස නියම කරනු ලැබුවහොත් සහ නියම කරනු ලැබූ විට එසේ පෙනී සිටින බවට බැඳුම්කරයක් ලියා අත්සන් කරන ලෙස ඔහුට නියම කරනු ලැබිය හැකි ය.

[1979 අංක 68 § 2] *(3) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 15 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධානවලට යටත්ව, දණ්ඩ නීති සංග්‍රහයේ 114 වන, 191 වන සහ 296 වන වගන්ති යටතේ දඬුවම් කරනු ලැබිය හැකි වරදක් සිදු කර ඇති බවට හෝ සිදු කිරීමෙහි ලා සම්බන්ධ වී ඇති බවට හෝ සිදු කර ඇතැයි සැක කරනු ලබන බවට හෝ සිදු කිරීමෙහි ලා සම්බන්ධ වී ඇතැයි සැක කරනු ලබන බවට හෝ වූ චෝදනාවක ප්‍රතිඵලයක් වශයෙන් -

(අ) තමා විසින්ම අධිකරණයට භාර වූ; නැතහොත්

(ආ) සිර භාරයට ගන්නා ලද

යම් තැනැත්තකු, මහෙස්ත්‍රාත්වරයකු විසින් ඇප පිට හෝ අන්‍යාකාරයකින් හෝ මුදා හරිනු නොලැබිය යුතු ය.

එසේ වුව ද නීතිපතිවරයා විසින් කරනු ලබන ඉල්ලීමක් මත මහාධිකරණය විසින් අන්‍යාකාරයකින් විධාන කරතහොත් මිස, ඒ තැනැත්තා අධිකරණයට භාර වූ හෝ ඒ තැනැත්තා සිර භාරයට ගන්නා ලද හෝ දිනයෙහි සිට මාස තුනක කාලයක් ඉකුත් වීමට පෙර මහෙස්ත්‍රාත් අධිකරණයක නැතහොත් මහාධිකරණයෙහි ඔහුට විරුද්ධව නඩු කටයුතු ඉදිරිපත් කර

* 1979 ජූලි මස 2 වන දිනට අතීතයට බලපාන පරිදි, 1979 අංක 68 දරන පනතේ 3 වන වගන්තිය බලන්න.

නොමැති නම් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 15 දරන අපරාධ නඩු විධාන ( විශේෂ විධිවිධාන ) පනතේ විධිවිධානවලට යටත්ව, ඒ තැනැත්තා ඇප පිට මුදා හරිනු ලැබිය යුතු ය:

එසේ ම තව දුරටත් මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධානවල සඳහන් මාස තුනේ කාලය ඉකුත් වීමට පෙර හෝ පසුව හෝ මහාධිකරණය විසින්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 15 දරන අපරාධ නඩු විධාන ( විශේෂ විධිවිධාන) පනතේ විධිවිධානවලට යටත් ව, ඒ තැනැත්තා විශේෂ අවස්ථානුගත කරුණු යටතේ ඇප පිට මුදා හරිනු ලැබිය හැකි ය.

(4) සැකකරුවකු බන්ධනාගාර අධිකාරිවරයකුගේ නීත්‍යනුකූල අත් අඩංගුවේ සිටින කාලය තුළ, පොලිස් ස්ථානයක් භාර පොලිස් නිලධරයා විසින් තත් කාර්යය සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට, විමර්ශනය පැවැත්වීමේ කාර්යය සඳහා යුක්ති සහගත වේලාවක් තුළ සැකකරු මුණ ගැසීමට ඒ පොලිස් නිලධරයාට හෝ වෙනත් යම් පොලිස් නිලධරයකුට හෝ අධිකරණයක් විසින් බලය දෙනු ලැබිය හැකි ය. තව ද පොලිස් ස්ථානයක් භාර නිලධරයකු විසින් තත් කාර්යය සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට, විමර්ශනය පැවැත්වීමේ කාර්යය සඳහා (පොලිස් ස්ථානයක් නොවන) යම් ස්ථානයකින් වෙනත් ස්ථානයකට සැකකරු ගෙන යාම අවශ්‍ය යයි ඒ අධිකරණය විසින් සලකනු ලැබුවහොත්, ඒ අධිකරණය විසින් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු ද සමග සැකකරු එසේ යම් ස්ථානයකින් වෙනත් ස්ථානයකට ගෙන යාමට ඒ පොලිස් නිලධරයාට හෝ නම් කරන ලද වෙනත් පොලිස් නිලධරයකුට හෝ බලය දෙනු ලැබිය හැකි ය:

එසේ වුව ද, මේ උපවගන්තියේ විධිවිධාන යටතේ පොලිස් නිලධරයකුට සැකකරුවකු මුණ ගැසිය හැකි කාලය තුළ හෝ පොලිස් නිලධරයකු විසින් සැකකරුවකු යම් ස්ථානයකින් වෙනත් ස්ථානයකට ගෙන යනු ලබන කාලය තුළ, ඒ සැකකරු සාක්ෂි ආඥාපනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය අදාළ කිරීමේ කාර්යය සඳහා ඒ පොලිස් නිලධරයාගේ අත් අඩංගුවේ සිටින චූදිත තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.

---

* 1979 ජූලි මස 2 වන දින ට අතීතයට බලපාන පරිදි, 1979 අංක 68 දරන පනතේ 3 වන වගන්තිය බලන්න.

එසේ වුව ද 1978 අංක 15 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) පනත් 1984.12.31 වන දින අහෝසි විය. එම නිසා ඒ වගන්තියේ එකී පනත සම්බන්ධයෙන් කර ඇති සඳහන් ඉන් ඉවත් කරනු ලැබූ පරිද්දෙන් කියවා තේරුම් ගත යුතු ය .

ප්‍රමාණවත් තොරතුරු පිළිගත හැකි කරුණු මත පදනම් වී තිබේ නම් හෝ වැඩි දුර විමර්ශනය කිරීම අවශ්‍ය නම්, කාරණය මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීම නිලධරයකුගේ හෝ පරීක්ෂකවරයකුගේ කාර්යය වන බව. [1980 අංක 52 § 5]*

**116.** (1) මේ පරිච්ඡේදය යටතේ විමර්ශනයක් කරන ලද විට, තොරතුරු පිළිගත හැකි කරුණු මත පදනම් වී ඇති බව පොලිස් ස්ථානය භාර නිලධරයාට හෝ පරීක්ෂකවරයාට පෙනී ගියහොත්, ඒ නිලධරයා විසින් ඒ කාරණය පිළිබඳව අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත සැකකරු අත් අඩංගුවේ ඉදිරිපත් කිරීම හෝ වරද ඇප දිය හැකි වරදක් නම් සහ ඇප තැබීමට සැකකරුට හැකිනම්, ඒ අධිකරණය ඉදිරියේ ඔහුගේ පෙනී සිටීම සඳහා ඔහුගෙන් ඇප ලබා ගැනීම හෝ කළ යුතු ය.

(2) පොලිස් ස්ථානයක් භාර නිලධරයා විසින් හෝ පරීක්ෂකවරයා විසින් සැකකරු මහෙස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කිරීම කරන ලද හෝ ඔහුගේ පෙනී සිටීම සඳහා ඇප ලබා ගන්නා ලද විටක, ඒ අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය යම් ආයුධයක් හෝ වෙනත් භාණ්ඩයක් හෝ ලේඛනයක් හෝ ආදර්ශකයක් හෝ සාම්පලයක් ඒ නිලධරයා විසින් හෝ පරීක්ෂකවරයා විසින් ඒ අධිකරණය වෙත යැවිය යුතු ය. තවද බැඳුම්කරයේ සඳහන් කරනු ලබන මහෙස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ පෙනී සිට, සැකකරුවකුට විරුද්ධව ඇති චෝදනාව පිළිබඳ කාරණයෙහි ලා සාක්ෂි දෙන බවට බැඳුම්කරයක් ලියා අත්සන් කරන ලෙස (චෝදනාකරුවකුව සිටී නම් ) චෝදනාකරුට ද ඒ කාරණය පිළිබඳ අවස්ථාගත කරුණු දන්නා බවට ඒ නිලධරයාට හෝ පරීක්ෂකවරයාට පෙනී යන තැනැත්තන් අතුරින් අවශ්‍ය යයි ඔහු සලකන තැනැත්තන් සංඛ්‍යාවකට ද ඒ නිලධරයා හෝ පරීක්ෂකවරයා විසින් නියම කළ යුතු ය.

[1980 අංක 52 § 5]*

(3) පොලිස් නිලධරයකු හෝ පරීක්ෂකවරයකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත මහෙස්ත්‍රාත්වරයා විසින් යම් ආයුධයක් හෝ වෙනත් භාණ්ඩයක් හෝ ලේඛනයක් හෝ ආදර්ශකයක් හෝ සැම්පලයක් අවස්ථාවෝචිත පරිදි, ආණ්ඩුවේ රස පරීක්ෂක, සැක සහිත ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක, ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර් හෝ ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයා වෙත විශ්ලේෂණය කොට අධිකරණයට වාර්තා කරනු ලැබීම සඳහා ඉදිරිපත් කළ හැකි ය.

(4) (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ සඳහන් බැඳුම්කරය ලියා අත්සන් කරනු ලැබුවේ යම් නිලධරයකු හෝ පරීක්ෂකවරයකු ඉදිරිපිට දී ද, ඒ නිලධරයා හෝ පරීක්ෂකවරයා විසින් ඒ බැඳුම්කරය මහෙස්ත්‍රාත් අධිකරණය වෙත යැවිය යුතු ය.

(5) යම් චෝදනාකරුවකු හෝ සාක්ෂිකරුවකු ඒ බැඳුම්කරය ලියා අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළහොත්, ඒ නිලධරයා හෝ පරීක්ෂකවරයා විසින් අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඒ පිළිබඳව වාර්තා කළ යුතු අතර එවිට සැකකරුට විරුද්ධව නඟා ඇති චෝදනාව පිළිබඳ කාරණයෙහි ලා සාක්ෂි දීම පිණිස ඒ අධිකරණය ඉදිරියට ඒ චෝදනාකරු හෝ සාක්ෂිකරු පැමිණෙන බවට වගබලා ගැනීම සඳහා ඒ අධිකරණය විසින් ස්වකීය අභිමතය පරිදි, වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කරනු ලැබිය හැකි ය.

පරීක්ෂකවරයන්ගේ අතිරේක බලතල.

**117.** සෑම පරීක්ෂකවරයකුට ම, ස්වකීය ප්‍රාදේශීය අධිකරණ බල සීමා ඇතුළත, මෙහි සඳහන් වූ බලතලවලට අතිරේකව පහත දැක්වෙන බලතල ද තිබිය යුතු ය.

(අ) යම් වරදකරුවකු සිර භාරයට ගැනීමේ හෝ තමා ඉදිරියේ දී සිර භාරයට ගන්නා ලෙස විධාන කිරීමේ බලය;

(ආ) වරෙන්තුවක් නිකුත් කිරීමේ බලය හෝ වරෙන්තුවක් යටතේ සිර භාරයට ගන්නා ලද යම් චූදිත තැනැත්තකු ඉවත් කිරීම සඳහා නියමයක් කිරීමේ බලය.

සංඥෙය නොවන වැරදි සම්බන්ධයෙන් පොලිස් නිලධරයන්ගේ සහ පරීක්ෂකවරයන්ගේ බලතල.
[1980 අංක 52 § 6]

**118.** * (1) සංඥෙය නොවන යම් වරදක් විමර්ශනය කරන පරීක්ෂකවරයකු හෝ පොලිස් නිලධරයකු වෙත මේ පනතින් පවරා ඇත්තා වූ ද සංඥෙය වරදක් සම්බන්ධයෙන් පමණක් ක්‍රියාත්මක කළ හැකි වූ ද යම් බලයක් ඔහු විසින් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය යයි ඔහුගේ මතය වන්නේ නම්, මහෙස්ත්‍රාත්වරයකුගෙන් ආඥාවක් ලැබුණු විට ඒ සංඥෙය නොවන වරද සම්බන්ධයෙන් ඒ බලය ක්‍රියාත්මක කිරීමට ඔහු හිමිකම් ලැබිය යුතු ය.

(2) 37 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, විමර්ශනයක් පවත්වනු ලබන අතරතුර දී තැනැත්තකු රඳවා තබා ගැනීම සඳහා අවසර දීමට සෑම පරීක්ෂකවරයකුට ම සහ පොලිස් ස්ථානයක් භාර නිලධරයකුට ම බලය තිබිය යුතු ය.

* 1979 ජූලි මස 2 වන දිනට අතීතයට බලපාන පරිදි, 1979 අංක 08 දරන පනතේ 3 වන, වගන්තිය බලන්න.

පරීක්ෂකවරයකු විසින් කාරණය විමර්ශනය කරනු ලැබීම මහෙස්ත්‍රාත්වරයකු විසින් ඉවත් කරනු ලැබිය හැකි බව.

**119.** යම් පරීක්ෂකවරයකු විසින් විමර්ශනය කරනු ලබන යම් වරදක් පිළිබඳ පරීක්ෂණයක් කිරීමට අධිකරණ බලය ඇති යම් මහෙස්ත්‍රාත්වරයකු විසින් ඒ කාරණය ඒ පරීක්ෂකවරයාගෙන් ඕනෑම අවස්ථාවක දී ඉවත් කොට එය තමා විසින්ම නඩු විභාග කිරීම හෝ නඩු විභාගයක් පිණිස ඉදිරිපත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

අප්‍රමාදව විමර්ශනය නිම කරනු ලැබිය යුතු බව.

**120.** (1) මේ පරිච්ඡේදය යටතේ වූ සෑම විමර්ශනයක් අනවශ්‍ය ප්‍රමාදයකින් තොර ව නිම කරනු ලැබිය යුතු ය. ඒ විමර්ශනය දින පහළොවක් ඇතුළත නිම කරනු ලැබිය නොහැකි අවස්ථාවක දී පොලිස් ස්ථානය භාර නිලධරයා හෝ පරීක්ෂකවරයා විසින් දවස් පහළොව අවසානයේ දී සහ ඉන් පසු විමර්ශනය නිමවන තුරු සෑම දවස් පහළොවක කාලය අවසානයේ දී ම, සිද්ධි පිළිබඳ ව සහ විමර්ශනයේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක්, ඒ කාරණය පිළිබඳ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත යැවිය යුතු ය.

(2) 115 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ආඥා කරන ලද රඳවා තබා ගැනීම එක් වතාවකට පහළොස් දිනක කාල සීමාවක් සඳහා විය යුතු ය.

(3) විමර්ශනය නිම කරනු ලැබූ වහාම පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් නියමිත ආකෘතියෙහි වූ වාර්තාවක් ඒ අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. සැකකරු යම් වරදක් සිදු කර ඇති බවට හෝ යම් වරදක් කිරීමෙහි ලා සැකකරු සම්බන්ධ වී ඇති බවට වාර්තාවෙහි චෝදනාවක් වුවහොත් මේ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව ඔහුට විරුද්ධව නඩු පවරනු ලැබිය යුතු ය.

මේ සම් පරිච්ඡේදයේ බලතල සමුච්චිත විය යුතු බව.

**121.** මේ සංග්‍රහය මගින් හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් මගින් පොලිස් නිලධරයන් සතු කරනු ලැබූ බලතල හෝ කාර්ය මේ පරිච්ඡේදයේ ඇතුළත් කිසිවක් සීමා වෙතැයි තේරුම් නොගත යුතු ය.

වෛද්‍යවරයන් විසින් පරීක්ෂා කරනු ලැබීම.

**122.** (1) විමර්ශනයක් පවත්වාගෙන යාම සඳහා වෛද්‍යවරයකු විසින් යම් තැනැත්තකු පරීක්ෂා කරනු ලැබීම අවශ්‍යයයි පොලිස් ස්ථානයක් භාර යම් නිලධරයකු සලකන අවස්ථාවක, ඔහු විසින් ඒ තැන්තාගේ කැමැත්ත ඇතිව ආණ්ඩුවේ

වෛද්‍ය නිලධරයකු ලවා ඒ තැනැත්තා පරීක්ෂා කරවීමට සලස්වනු ලැබිය හැකි ය. ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියා විසින් පරීක්ෂණයේ ප්‍රතිඵල දක්වමින් පොලිස් නිලධරයා වෙත වාර්තා කළ යුතු ය.

(2) එසේ පරීක්ෂා කරනු ලැබීමට (1) වන උප වගන්තියේ සඳහන් තැනැත්තකු කැමති නොවන අවස්ථාවක, ඒ තැනැත්තා පරීක්‍ෂා කර ඒ පිළිබඳව වාර්තා කිරීම සඳහා, ආඥාවේ නම සඳහන් කරනු ලබන ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකු වෙත බලය දෙන ආඥාවක් සඳහා, විමර්ශනය කරනු ලබන්නේ යම් මහේස්ත්‍රාත්වරයකුගේ අධිකරණ බල සීමාව ඇතුළත ද ඒ මහේස්ත්‍රාත්වරයා වෙත ඒ පොලිස් නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබිය හැකිය. එවැනි ආඥාවක් කරන ලද අවස්ථාවක දී ඒ තැනැත්තා ඒ ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයා ඉදිරියේ දී පරීක්‍ෂණයකට භාජනය විය යුතු අතර ඒ ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයා විසින් පරීක්ෂණයේ ප්‍රතිඵල දක්වමින් මහේස්ත්‍රාත්වරයා වෙත වාර්තා කළ යුතු ය.

සැක කරන ලද තැනැත්තකුගේ ඇඟිලි සලකුණු, හිසකෙස්වල ආදර්ශක ආදිය ගැනීම. (2005 අංක 14 & 3)

**123.** (1) විමර්ශනය කාර්යය සඳහා විමර්ශනයට භාජනය කරනු ලැබ ඇති වරද ගැන සැක කරනු ලබන යම් තැනැත්තකුගේ, යම් ඇඟිල්ලක, අත්ලක හෝ පාදයක සලකුණක් හෝ ශරීරයේ යම් කොටසක සලකුණක් හෝ ඒ තැනැත්තාගේ ලේවල, කෙළවල, මුත්‍රාවල, හිසකෙස්වල, හෝ නියපොතුවල ආදර්ශකයක් හෝ නියපොතුවල සූරා ගන්නා ලද කොටසක් ගැනීම අවශ්‍යයයි පොලිස් ස්ථානයක් භාර යම් නිලධරයකුගේ මතය වන අවස්ථාවක, ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව එසේ කිරීමට ඒ පොලිස් නිලධරයා විසින් සලස්වනු ලැබිය හැකි ය.

(2) එවැනි සලකුණක්, ආදර්ශකයක් හෝ සූරාගනු ලැබූ කොටසක් ගැනීම ගැන (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තා කැමති නොවන අවස්ථාවක, ඒ පොලිස් නිධරයා විසින් එවැනි යම් සලකුණක්, ආදර්ශකයක් හෝ සූරාගනු ලබන කොටසක් ගැනීම සඳහා පොලිස් නිලධරයකුට බලය දෙන ආඥාවක් සඳහා, විමර්ශනය කරනු ලබන්නේ යම් මහේස්ත්‍රාත්වරකුගේ අධිකරණ බල සීමාව ඇතුළත ද ඒ මහේස්ත්‍රාත්වරයාගෙන්, ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර ඒ තැනැත්තා ඒ ආඥාවට අනුකූලව ක්‍රියා කළයුතු ය.

(3) විමර්ශනයේ කාර්යය සඳහා අත් අකුරු කිසිවක් සංසන්දනය කර බැලීමට අවශ්‍ය වූ අවස්ථාවක, යම් තැනැත්තකුගේ අත් අකුරුවල ආදර්ශකයක් ඔහුගේ නැමැත්ත ඇතිව ගැනීමට පොලිස් ස්ථානයක් භාර යම් නිලධරයකු විසින් සලස්වනු ලැබිය හැකි ය.

(4) තම අත් අකුරුවල ආදර්ශකයක් දීම ඒ තැනැත්තා ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, ඔහුගේ අත් අකුරුවල ආදර්ශකයක් දිය යුතු බවට ඒ තැනැත්තාට නියම කරන ආඥාවක් සඳහා, විමර්ශනය කරනු ලබන්නේ යම් මහේස්ත්‍රාත්වරයකුගේ අධිකරණ බලසීමාව ඇතුළත ද ඒ මහේස්ත්‍රාත්වරයාගෙන් පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර ඒ තැනැත්තා ඒ ආඥාවට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

මහේස්ත්‍රාත්වරයා විමර්ශනවලට සහාය දිය යුතු බව (1988 අංක 11 & 2)

**124.** විමර්ශනයක් පවත්වාගෙන යාමට සහාය දෙන ලෙස ඉල්ලීමක් යම් මහේස්ත්‍රාත්වරයකු වෙත කරනු ලැබූ විට ඒ මහේස්ත්‍රාත්වරයා විසින් නිසි ආඥා කිරීමෙන් සහ අධිකරණ නියෝග නිකුත් කිරීමෙන් ඒ විමර්ශනය පැවැත්වීම සඳහා සහාය දිය යුතු අතර විශේෂයෙන්ම වරදකරු නිසැකව හඳුනා ගැනීමේ කාර්යය සඳහා හඳුනා ගැනීමේ පෙරෙට්ටුවක් පැවැත්වීම හෝ පැවැත්වීමට බලය දීම සහ ඒ කාර්යය සඳහා ඒ පෙරෙට්ටුවට සහභාගි වන ලෙස සැකකරුවකුට හෝ වෙනත් තැනැත්තකුට නියම කිරීම, සාක්ෂි කරුවකුට සැඟවුණු තැනක සිට හඳුනා ගැනීමට අවසර දීම සහ ඒ පෙරෙට්ටුවේ කටයුතු පිළිබඳ වාර්තාවක් පිළියෙල කිරීම හෝ කළ හැකිය.

ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධරයකු විසින් විමර්ශනය භාර ගත හැකි බව.

**125.** මේ පනතෙහි හෝ වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පරිච්ඡේදය යටතේ වූ යම් විමර්ශනයක් සහකාර පොලිස් අධිකාරීවරයකුගේ පදවියට වඩා පහත් නොවන පදවියක යම් පොලිස් නිලධරයකු විසින් ඕනෑම අවස්ථාවක දී භාර ගනු ලැබීම හා ඒ විමර්ශනය පවත්වාගෙන යාම සහ මෙහෙයවීම ද ඒ කාර්යය සඳහා තමා විසින් තෝරාගනු ලැබූ යම් පොලිස් නිලධරයකු විසින් හෝ දිවයිනේ යම් පළාතකින් ගෙන්වා ගනු ලැබූ විශේෂයෙන් තෝරාගත් පොලිස් නිලධරයන් කණ්ඩායමක් විසින් ඒ විමර්ශනය හෝ එහි යම් කොටසක් හෝ පවත්වාගෙන යනු ලැබීමට සැලැස්වීම නීත්‍යානුකූල විය යුතු ය.

## XII වන පරිච්ඡේදය

## මහෙස්ත්‍රාත්වරයන්ට හෝ සාම නිලධරයන්ට කරනු ලබන ප්‍රකාශ

කිසිම පෙළඹවීමක් නොකළ යුතු බව.

**126.** XXI වන පරිච්ඡේදයෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි හැර වරදක් සම්බන්ධයෙන් චෝදනා නගා ඇති යම් තැනැත්තකුට විරුද්ධව ඇති ඒ චෝදනාව පිළිබඳ ව යම් ප්‍රකාශයක් කරන ලෙසට ඒ තැනැත්තා පෙළඹවීම පිණිස යම් සාම නිලධරයකු හෝ බලයලත් තැනැත්තකු විසින් යම් පෙළඹවීමක් කිරීම, තර්ජනයක් කිරීම හෝ පොරොන්දුවක් දීම නැතහොත් පෙළඹවීමක් හෝ තර්ජනයක් කිරීමට හෝ පොරෙන්දුවක් දීමට සැලැස්වීම හෝ නොකළ යුතුය.

නොතැනියාව පිළිබඳ දැන්වීම. [2005 අංක 14 §4]

126.අ (1) මහාධිකරණයේ දී අධිචෝදනා මත නඩු විභාගයක් පවත්වන අතරතුර දී නොතැනියාව පිළිබඳ විත්ති වාචකයක් සනාථ කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීමට -

(අ) විමර්ශනය අතරතුර දී තම ප්‍රකාශය සිදු කරන අවස්ථාවේ දී නොතැනියාව පිළිබඳ විත්ති වාචකයක් ඇති බවට පොලිසියට ප්‍රකාශ කර ඇත්නම් මිස ; හෝ

(ආ) මූලික පරීක්ෂණය සිදු කරමින් පවතින යම් කවර අවස්ථාවක දී හෝ එවැනි කරුණක් පොලිසියට ප්‍රකාශ කර ඇත්නම් මිස ; හෝ

(ඇ) අධිචෝදනා පත්‍රය භාරදීමෙන් පසු නඩු විභාගය ආරම්භ වීමේ දිනයට දින දහ හතරකට පෙර කවර අවස්ථාවක දී හෝ නීතිපතිවරයාට දැනුම්දීමක් සහිතව එවැනි විත්ති වාචකයක් මතුකර ඇත්නම් මිස,

කිසිම තැනැත්තකුට හිමිකමක් නොතිබිය යුතු ය.

එසේ වුව ද ඉහතින් දක්වා ඇති කාල සීමාව ඇතුළත නොතැනියාව පිළිබඳ විත්ති වාචකය පළ කිරීමට තමා ප්‍රමාද වූයේ ඇයි ද යන්න පෙන්නුම් කිරීම සඳහා ප්‍රමාණවත් හේතු චූදිතයා විසින් ඉදිරිපත් කර ඇති බව අධිකරණයේ මතය වන්නේ නම්, නොතැනියාව පිළිබඳ විත්ති වාචකය ඉදිරිපත් කිරීම සඳහා ඉන් පසුව සහ පැමිණිල්ලේ නඩුව අවසන් වීමට පෙරාතුව කවර හෝ අවස්ථාවක දී අධිකරණය විසින් චූදිතයාට, අවසර දෙනු ලැබිය හැකි ය.

(2) එම තැනැත්තා සිටි බවට හිමිකම් පාන වේලාව සහ ස්ථානය පිළිබඳ සියලු තොරතුරු ද, එම තැනැත්තාගේ නොතැනියාව සහතික කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කරන තැනැත්තන් ඇත්නම්, එම තැනැත්තන් පිළිබඳ මුල් ප්‍රකාශයේ අන්තර්ගත විය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා "නොතැනියාව සනාථ කිරීම සඳහා සාක්ෂි" යන්නෙන් විත්තිකරු යම් විශේෂිත ස්ථානයක හෝ විශේෂිත ප්‍රදේශයක, විශේෂිත වේලාවක් තුළ දී සිටීමේ හේතුව නිසා චෝදනා කරනු ලබන වරද සිදු වූ අවස්ථාවේ දී වරද සිදු කරනු ලැබුවේ යයි කියනු ලබන ස්ථානයේ දී එම තැනැත්තා නොසිටි බවට හෝ සිටීමට ඉඩ නැති බවට පෙන්වීම සඳහා වන සාක්ෂි අදහස් වේ.

ප්‍රකාශ හා අපරාධෝච්චාරණ වාර්තාගත කිරීමට ඇති බලය

**127.** (1) යම් පරීක්ෂණයක් හෝ නඩු විභාගයක් ආරම්භ කිරීමට පෙර යම් අවස්ථාවක දී තමා වෙත නිකුත් කරනු ලබන යම් ප්‍රකාශයක් යම් මහෙස්ත්‍රාත්වරයකු විසින් වාර්තාගත කරනු ලැබිය හැකි ය.

(2) ඒ ප්‍රකාශය 277 වන වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි වාර්තාගත කර, අත්සන් තබා දිනය යොදා, ඉක්බිති ව කාරණය පිළිබඳ පරීක්ෂණය හෝ නඩු විභාගය හෝ කරනු ලබන්නේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් ද ඒ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) අපරාධෝච්චාරණයක් වූ යම් ප්‍රකාශයක් කරන තැනැත්තාගෙන් ප්‍රශ්න කළ විට, එය ස්වේච්ඡාවෙන් කරන ලද බව විශ්වාස කිරීමට තමාට හේතු ඇතොත් මිස කිසිම මහෙස්ත්‍රාත්වරයකු විසින් අපරාධෝච්චාරණයක් වූ යම් ප්‍රකාශයක්

වාර්තාගත නොකළ යුතු ය; තව ද එවැනි යම් ප්‍රකාශයක් ඔහු විසින් වාර්තාගත කරනු ලබන විට, ඒ වාර්තාව යටින් පහත දැක්වෙන අන්දමේ සටහනක් ඔහු විසින් කළ යුතු ය -

මේ ප්‍රකාශය ස්වේච්ඡාවෙන් කරනු ලබන බවට මම විශ්වාස කරමි. එය මා ඉදිරියෙහි මට ඇසෙන සේ සටහන් කර ගනු ලැබ, එය කළ තැනැත්තාට මා විසින් එය කියවා දෙන ලදුව, එය නිවැරදි බව ඔහු විසින් පිළිගන්නා ලදි. තව ද ඔහු විසින් කරන ලද සම්පූර්ණ ප්‍රකාශය එහි නිවැරදි ලෙස ඇතුළත් වී ඇත්තේ ය.

(අත්සන් කළේ ) ඒ.බී.

..........................................................

(මහෙස්ත්‍රාත් අධිකරණයේ මහෙස්ත්‍රාත්වරයා)

## VI වන කොටස

# අපරාධ චෝදනා සම්බන්ධයෙන් වූ නඩු කටයුතු

## XIII වන පරිච්ඡේදය

## පරීක්ෂණවල දී සහ නඩු විභාගවල දී අපරාධ අධිකරණවල අධිකරණ බලය පිළිබඳව

### අ - විභාගය හෝ නඩු විභාගය පවත්වනු ලබන ස්ථානය

සාමාන්‍යයෙන් පරීක්ෂණය හා නඩු විභාගය පවත්වනු ලබන ස්ථානය.

**128.** (1) යම් වරදක් සිදු කරනු ලැබුවේ යම් අධිකරණයක ප්‍රාදේශීය බල සීමාව ඇතුළත ද ඒ අධිකරණය විසින් එවැනි සෑම වරදක් සාමාන්‍යයෙන් පරීක්ෂා කොට නඩු විභාග කරනු ලැබිය යුතුය.

දේශීය ජල තීරයෙහි සිදු කරන ලද වැරදි සම්බන්ධයෙන් කවර හෝ මහෙස්ත්‍රාත් අධිකරණයකට අධිකරණ බලය තිබිය යුතු බව.

(2) ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයෙහි *සිදු කරන ලද්දා වූ සියලු වැරදි සම්බන්ධයෙන් වන විට, චූදිතයකු සිටින්නේ නැතහොත් සොයා ගත හැක්කේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ ද ඒ මහෙස්ත්‍රාත් අධිකරණයට ඒ වැරදි සම්බන්ධයෙන් ප්‍රාදේශීය අධිකරණ බලය නොතිබුණ ද, අධිකරණ බලය තිබේ නම්, ඒ මහෙස්ත්‍රාත් අධිකරණයට ඒ වැරදි සම්බන්ධයෙන් අධිකරණ බලය තිබිය යුතු ය.

(3) ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයෙහි දී කරන ලද, (2) වන උපවගන්තිය අදාළ නොවන වරදක් හෝ මහ මුහුදෙහි හෝ යම් නැවක් තුළ හෝ යම් ගුවන් යානාවක් තුළ කරන ලද වරදක් පිළිබඳ නඩු විභාගයක් හෝ විභාගයක් පැවැත්වීමට කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයට, අන් ලෙසකින් අධිකරණ බලය ඇත්නම් ඒ මහෙස්ත්‍රාත් අධිකරණය විසින් හෝ අධිචෝදනාවක් මත මහාධිකරණය විසින් හෝ ඒ නඩු විභාගය හෝ විභාගය පැවැත්වීම කරනු ලැබිය හැකි ය.

ක්‍රියාව කරන ලද හෝ පසුව ප්‍රතිඵලය ඇති වූ දිස්ත්‍රික්කයෙහි දී චූදිතයාට විරුද්ධව නඩු විභාග කළ හැකි බව.

**129.** කරන ලද යම් කිසිවක් හේතුකොටගෙන හා ඉන් පසුව ඇති වූ එහි යම් ප්‍රතිඵලයක් හේතුකොට ගෙන, යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් තැනැත්තකුට චෝදනා කරනු ලැබ ඇති විට ඒ ක්‍රියාව කරන ලද්දේ හෝ ඒ ප්‍රතිඵලය ඇති වූයේ යම් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ ද ඒ අධිකරණය විසින් ඒ වරද සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීම හෝ නඩු විභාග කිරීම හෝ කළ හැකි ය.

*[1] 1976 අංක 22 දරන පනත බලන්න. * 1983 අංක 40 දරන පනත බලන්න.

නිදර්ශන

(අ) "එක්ස් " මහෙස්ත්‍රාත් අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ දී " ඒ "ට තුවාල සිදු කරන ලදුව, " ඉසෙඩ් " මහෙස්ත්‍රාත් අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ දී ඔහු මිය යයි; " ඒ " සාවද්‍ය ලෙස මනුෂ්‍ය ඝාතනය කිරීමේ වරද පිළිබඳ පරීක්ෂණය " එක්ස් " හෝ " ඉසෙඩ්" මහෙස්ත්‍රාත් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(ආ) "එක්ස් " මහෙස්ත්‍රාත් අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ දී " ඒ " ට තුවාල සිදු කරන ලදුව, "වයි" මහෙස්ත්‍රාත් අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ දී දවස් දහයක් ද " ඉසෙඩ්" මහෙස්ත්‍රාත් අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ දී තවත් දවස් දහයක් ද එම "වයි " හෝ " ඉසෙඩ්" මහෙස්ත්‍රාත් අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ තමාගේ සාමාන්‍ය වැඩ කටයුතු කර ගැනීමට නොහැකිව ගත කරයි; "ඒ " ට නීති විරෝධී ලෙස බරපතල තුවාල සිදු කිරීම පිළිබඳව " එක්ස් " හෝ "වයි" " ඉසෙඩ්"මහෙස්ත්‍රාත් අධිකරණය විසින් නඩු විභාග කරනු ලැබිය හැකි ය.

(ඇ) "එක්ස් " මහෙස්ත්‍රාත් අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ දී "ඒ" ට තුවාල සිදු කරනු ලැබීමේ බිතියට පත් කරන ලදුව, ඒ හේතුවෙන් බිතියට පත් කළ තැනැත්තා වෙත දේපළ භාරදීමට "වයි" මහෙස්ත්‍රාත් අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ දී "ඒ " පොළඹවනු ලබයි. "ඒ " සම්බන්ධයෙන් සිදු කරන ලද ත්‍රාසෝද්ග්‍රහණය කිරීමේ වරද පිළිබඳව " එක්ස් " හෝ "වයි " මහෙස්ත්‍රාත් අධිකරණය විසින් නඩු විභාග කරනු ලැබිය හැකි ය.

**130.** වරදක් වන වෙනත් යම් ක්‍රියාවකට ඇති සම්බන්ධතාව නිසා වෙනත් යම් ක්‍රියාවක් වරදක් වන විට හෝ වරදක් සිදු කරන තැනැත්තාට ඒ වරද සිදු කිරීමට හැකියාව තිබුණි නම් යම් ක්‍රියාවක් වරදක් වන විට, ඒ ක්‍රියා දෙකින් කවර හෝ ක්‍රියාවක් කරනු ලැබුවේ යම් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ ද ඒ අධිකරණය විසින් පළමුව සඳහන් වරද පිළිබඳ චෝදනාවක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීම හෝ නඩු විභාග කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

වරදක් වන වෙනත් යම් ක්‍රියාවකට ඇති සම්බන්ධතාව නිසා යම් ක්‍රියාවක් වරදක් වන අවස්ථාවක නඩු විභාගය පවත්වන ස්ථානය.

නිදර්ශන

(අ) අනුබල දීම පිළිබඳ වූ චෝදනාවක් සම්බන්ධයෙන්, එම අනුබල දීම සිදු කරනු ලැබුවේ යම් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ ද ඒ අධිකරණය විසින් හෝ අනුබල දෙන ලද වරද සිදු කරන ලද්දේ යම් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ ද ඒ අධිකරණය විසින් හෝ පරීක්ෂණයක් පැවැත්වීම හෝ නඩු විභාග කිරීම කරනු ලැබිය හැකි ය.

(ආ) සොරකම් කරන ලද බඩු භාර ගැනීම හෝ තබා ගැනීම පිළිබඳ වූ චෝදනාවක් සම්බන්ධයෙන්, එම සොරකම කරන ලද්දේ යම් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ ද ඒ අධිකරණය විසින් හෝ ඒ බඩු වලින් කිසිවක් වංචා ලෙස භාර ගන්නා ලද්දේ හෝ තබා ගන්නා ලද්දේ යම් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ ද ඒ අධිකරණය විසින් හෝ නඩු විභාග කරනු ලැබිය හැකි ය.

(ඇ) අපහරණය කරන ලදැයි දන්නා තැනැත්තකු අයුතු ලෙස සඟවා තැබීමේ චෝදනාවක් සම්බන්ධයෙන්, එම අයුතු ලෙස සඟවා තැබීම සිදු වූයේ යම් මහෙස්ත්‍රාත් අධිකරණය ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ ද ඒ මහෙස්ත්‍රාත් අධිකරණය විසින් හෝ ඒ අපහරණය සිදුවූයේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ ද ඒ මහෙස්ත්‍රාත් අධිකරණය විසින් හෝ නඩු විභාග කරනු ලැබිය හැකි ය.

අත් අඩංගුවෙන් පැන යාම.

**131.** (1) අත් අඩංගුවෙන් පැන යාමේ වරද සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින තැනැත්තා යම් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ සිටි ද ඒ අධිකරණය විසින් හෝ වරද සිදු කරනු ලැබුවේ යම් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ ද, ඒ අධිකරණය විසින් හෝ ඒ වරද සම්බන්ධයෙන් නඩු විභාග කරනු ලැබිය හැකි ය.

සාපරාධ ව්‍යපහරණය සහ සාපරාධ විශ්වාස භාරය කඩ කිරීම.

(2) සාපරාධ ව්‍යපහරණය පිළිබඳ වූ වරද හෝ සාපරාධ විශ්වාස භාරය කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධයෙන්, එම වරදට විෂය වන්නා වූ දේපළින් යම් කොටසක් චූදිත තැනැත්තා විසින් භාර ගන්නා ලද්දේ යම් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ ද ඒ අධිකරණය විසින් හෝ, ඒ වරද සිදු කරන ලද්දේ යම් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ ද ඒ අධිකරණය විසින් හෝ පරීක්ෂණය ක් පැවැත්වීම හෝ නඩු විභාග කිරීම කරනු ලැබිය හැකි ය.

සොරකම් කිරීම.

(3) යම් දෙයක් සොරා ගැනීම පිළිබඳ වරද සම්බන්ධයෙන්, එම දේ සොරාගනු ලැබුවේ නැතහොත් සොරා විසින් හෝ එය සොරකම් කරනු ලැබූ දෙයක් බව දැන දැනම හෝ එසේ විශ්වාස කිරීමට හේතු ඇතිව එය භාරගත් හෝ තබාගත් යම් තැනැත්තකු විසින් හෝ එය තම සන්තකයෙහි තබා ගනු ලැබුවේ යම් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ ද ඒ අධිකරණය විසින් හෝ පරීක්ෂණයක් පැවැත්වීම හෝ නඩු විභාග කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

විවිධ නඩුවල දී පරීක්ෂණය හෝ නඩු විභාගය පවත්වන ස්ථානය.

**132.** (1) (අ) වරදක් සිදු කරන ලද්දේ ප්‍රාදේශීය සීමා කිහිපයකින් කවර ප්‍රාදේශීය සීමාවක් තුළ ද යන්න අවිනිශ්චිත වන විට ; හෝ

(ආ) වරදක කොටසක් එක් ප්‍රාදේශීය සීමාවක් තුළ සහ කොටසක් වෙනත් ප්‍රාදේශීය සීමාවක් තුළ සිදු කර ඇති අවස්ථාවක ; හෝ

(ඇ) වරදක් දිගටම කර ගෙන යන වරදක් වන්නා වූ සහ ප්‍රාදේශීය සීමා එකකට වැඩි ගණනක දී දිගටම සිදු කර ගෙන යනු ලබන වරදක් වන්නා වූ අවස්ථාවක ; හෝ

(ඈ) වරදක් වෙනස් ප්‍රාදේශීය සීමා තුළ සිදු කරන ලද ක්‍රියා කිහිපයකින් සමන්විත වන අවස්ථාවක ; හෝ

(ඉ) එකම ක්‍රියාවලියේ දී වෙනස් වැරදි වෙනස් ප්‍රාදේශීය සීමා තුළ සිදු කරන ලද අවස්ථාවක

එම වරද හෝ වැරදි පිළිබඳව, එවැනි ප්‍රාදේශීය සීමා අතුරින් යම් එක් ප්‍රාදේශීය සීමාවක් විෂයෙහි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් ඒ වරද හෝ වැරදි සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීම හෝ නඩු විභාග කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

ගමනක යෙදී සිටිය දී සිදු කරන ලද වරද.

(2) වරදකරු ගොඩින් හෝ මුහුදින් යන ගමනක යෙදී සිටිය දී සිදු කරන ලද වරදක් සම්බන්ධයෙන්, වරදකරු හෝ වරද සිදු කරනු ලැබුවේ යම් තැනැත්තකුට විරුද්ධව ද නැතහොත්

යම් දෙයක් සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා හෝ දෙය එසේ ගොඩින් හෝ මුහුදින් යන ගමනේ දී යම් අධිකරණයක ප්‍රාදේශීය සීමා පසු කොට ගියේ ද නැතහොත් එයට ඇතුළු වූයේ ද ඒ ප්‍රාදේශීය සීමාව විෂයෙහි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් පරීක්ෂණයක් පැවැත්වීම හෝ නඩු විභාග කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

දුම්රිය, විදුලි සංදේශ, තැපැල් කාර්යාල හෝ යුද්ධායුධ හා වෙඩි බෙහෙත්වලට අදාළව යම් නීතියක විධිවිධානවලට විරුද්ධව වූ වැරදි.

(3) දුම්රිය, විදුලි සංදේශ, තැපැල් කාර්යාල හෝ යුද්ධායුධ හා වෙඩි බෙහෙත්වලට අදාළව තත් කාලයෙහි බලපවත්නා යම් නීතියක විධිවිධානවලට විරුද්ධව කරන ලද සියලු වැරදි, ඒ වරදකරු යම් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව ඇතුළත සිටින්නේ නම්, ඒ වරද ඒ අධිකරණ බල සීමාව තුළ දී සිදු කරනු ලැබූ බව ප්‍රකාශ කර ඇත ද නැත ද ඒ අධිකරණය විසින් පරීක්ෂණය ක් පැවැත්වීම හෝ නඩු විභාග කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

සැකයක් ඇති අවස්ථාවක, පරීක්ෂණ පැවැත්විය යුතු අධිකරණය නීතිපතිවරයා විසින් තීරණය කළ යුතු බව.

**133**. යම් වරදක් පිළිබඳ පරීක්ෂණය පැවැත්වීම කිනම් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් කළ යුතු ද යන වග සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයකු විසින් යම් සැකයක් ඇති කර ගනු ලැබූ කවර හෝ විටක, නිසැකව දැන ගනු ලැබූ සිද්ධි විශේෂ කාරණයක ස්වරූපයෙන් ඇතුළත් කොට, නීතිපතිවරයාගේ මතය සඳහා ඔහු වෙත ඒ මහේස්ත්‍රාත්වරයා විසින්, යවනු ලැබිය යුතු ය. එවිට ඒ වරද පිළිබඳ පරීක්ෂණය කිනම් අධිකරණය දී පැවැත්විය යුතු ද යන වග නීතිපතිවරයා විසින් තීරණය කළ යුතු අතර, එවිට ඒ වරද පිළිබඳ පරීක්ෂණය පැවැත්වීමට ඒ අධිකරණයට අධිකරණ බලය තිබිය යුතු ය.

වැරදි මහේස්ත්‍රාත් අධිකරණය විසින් පරීක්ෂණය පවත්වනු ලැබීම හේතු කොට ගෙන දණ්ඩන නියමය ඉවත නොදැමිය යුතු බව.

**134.** වරදක් සම්බන්ධයෙන් වූ නඩු විභාගයක දී යම් අපරාධ අධිකරණයක් විසින් පනවන ලද යම් දණ්ඩන නියමයක් හෝ කරන ලද ආඥාවක්, ඒ දණ්ඩන නියමය හෝ අඥාව ආදාළ වන්නේ යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් ද ඒ වරද සිදු කිරීම පිළිබඳ වූ පරීක්ෂණය පැවැත්වීමට මේ පරිච්ඡේදය යටතේ බලය පැවරී නැති මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් ඒ පරීක්ෂණය පැවැත්වීමේ හේතුව නිසාම පමණක් අවලංගු කිරීමට යටත් නොවිය යුතු ය.

## අ - නඩු කටයුතු ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කොන්දේසි

ඇතැම් වැරදි සම්බන්ධයෙන් නඩු පැවරීම ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කොන්දේසි.

**135.** (1) යම් අධිකරණයක් විසින් පහත දැක්වෙන වැරදි සංජානනය කරනු නොලැබිය යුතු ය :-

(අ) නීතිපතිවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව මිස හෝ අදාළ රජයේ සේවකයා විසින් හෝ ඔහු යටත් වන්නේ යම් රජයේ සේවකයකුට ද ඒ රජයේ සේවකයා විසින් හෝ කරනු ලබන පැමිණිල්ල මත මිස, දණ්ඩ නීති සංග්‍රහයේ 170 වන වගන්තියේ සිට 185 වන වගන්තිය තෙක් වූ (ඒ වගන්ති දෙකම ඇතුළුව ) වගන්ති යටතේ දඬුවම් කරනු ලැබිය හැකි යම් වරදක් ;

ආ) නීතිපතිවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව මිස, දණ්ඩ නීති සංග්‍රහයේ 158 වන, 159 වන, 160 වන, 161 වන, 210 වන, 211 වන, හා 212 වන වගන්ති යටතේ දඬුවම් කරනු ලැබිය හැකි යම් වරදක්;

*[1980 අංක 52 § 7]

(ඇ) දණ්ඩ නීති සංග්‍රහයේ 190 වන, 193 වන, 196 වන, 197 වන, 202 වන, 203 වන, 204 වන, 205 වන, 206 වන, 207 වන හා 223 වන වගන්ති යටතේ දඬුවම් කරනු ලැබිය හැකි යම් වරදක් යම් අධිකරණයක යම් නඩු කටයුත්තක දී හෝ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් හෝ සිදු කර ඇති විටක, නීතිපතිවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව මිස හෝ ඒ අධිකරණය විසින් කරනු ලබන පැමිණිල්ල මත මිස ඒ වරද ;

(ඈ) දණ්ඩ නීති සංග්‍රහයේ 452 වන වගන්තියෙහි විස්තර කර ඇති හෝ 459 වන හා 464 වන වගන්ති යටතේ දඬුවම් කරනු ලැබිය හැකි යම් වරදක්, යම් අධිකරණයක වූ යම් නඩු කටයුත්තක පාර්ශ්වකරුවකු විසින් ඒ නඩු කටයුත්තේ සාක්ෂි වශයෙන් ඉදිරිපත් කර ඇති ලේඛනයක් සම්බන්ධයෙන් සිදු කර ඇති විටක, නීතිපතිවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව මිස හෝ ඒ අධිකරණය විසින් කරනු ලබන පැමිණිල්ල මත මිස ඒ වරද;

---

* 1979 ජූලි මස 2 වැනි දිනට අතීතයට බලපාන පරිදි 1980 අංක 52 දරන පනතේ 16 වන වගන්තිය බලන්න.

*[1980 අංක 52 § 7] (ඉ) දණ්ඩ නීති සංග්‍රහයේ 290 අ වගන්තිය යටතේ හෝ 291 ආ වගන්තිය යටතේ හෝ දඬුවම් කරනු ලැබිය හැකි වරදක්, නීතිපතිවරයා විසින් නීතිපතිවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව වෙනත් යම් තැනැත්තකු විසින් හෝ කරනු ලබන පැමිණිල්ලක් මත මිස ;

(ඊ) දණ්ඩ නීති සංග්‍රහයේ XIX වන පරිච්ඡේදය යටතේ වැටෙන යම් වරදක්, ඒ වරදින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් නීතිපතිවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව හෝ වෙනත් තැනැත්තකු විසින් සමාන අනුමතය ඇතිව කරනු ලබන පැමිණිල්ලක් මත මිස ;

(උ) දණ්ඩ නීති සංග්‍රහයේ 291 අ වන වගන්තිය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි වරදක්, ඒ වරදින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් නීතිපතිවරයාගේ පූර්ව අනුමතය ඇතිව හෝ වෙනත් තැනැත්තකු විසින් සමාන අනුමතය ඇතිව කරනු ලබන පැමිණිල්ලක් මත මිස .

(2) අධිකරණයක් විසින් කරනු ලබන පැමිණිල්ල ඒ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අත්සන යටතේ වූ ලියවිල්ලකින් විය යුතු ය.

(3) අධිකරණයක් විසින් පැමිණිල්ලක් කරනු ලබන අවස්ථාවක ඒ අධිකරණය විසින් චූදිතයා සිරභාරයට ගෙන අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියට අත් අඩංගුවේ යවනු ලැබීමට සැලැස්විය හැකි ය.

(4) මේ වගන්තියෙහි සඳහන් යම් වරදක් සම්බන්ධයෙන් අනුමතය දෙනු ලැබූ විටක, නඩුව සංජානනය කරන අධිකරණය විසින්, සිද්ධිවලින් අනාවරණය වන්නා වූ, එසේ සඳහන් වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් චෝදනාවක් පිළියෙල කළ හැකි නමුත් ඒ අනුමතය දෙනු ලැබුවේ යම් දිනයක දී ද ඒ දිනයෙහි සිට මාස හයකට වැඩි කාලයක් වූ අනුමතය වලංගුව නොපැවතිය යුතු ය.

* 2002 අංක 12 4 ඉවත් කර ඇත. 1979 ජූලි මස 2 වන දිනට බලපාන පරිදි, 1980 අංක 52 දරන පනතේ 16 වන වගන්තිය බලන්න.

(5) මේ වගන්තියේ "වෙනත් තැනැත්තකු" යන යෙදුමට සාම නිලධරයකු ද ඇතුළත් වන සේ සලකනු ලැබිය යුතු ය. *[1980 අංක 52 § 7]

(6) 393 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ නීතිපතිවරයා විසින් යම් නඩුවක් සම්බන්ධයෙන් තම බලතල ක්‍රියාත්මක කරන ලද්දේ ද ඒ නඩුවට මේ වගන්තිය අදාළ නොවිය යුතු ය. *[1980 අංක 52 § 7]

## XIV වන පරිච්ඡේදය

## මහෙස්ත්‍රාත් අධිකරණ ඉදිරියෙහි නඩු කටයුතු ආරම්භ කිරීම

මහෙස්ත්‍රාත් අධිකරණයක කෙසේ නඩු පැවරිය යුතු ද යන වග.

**136.** (1) මහෙස්ත්‍රාත් අධිකරණයක නඩු පැවරීම පහත දැක්වෙන ක්‍රම අතුරින් එකක් අනුව කරනු ලැබිය යුතු ය : -

(අ) පරීක්ෂණ පැවැත්වීම හෝ නඩු විභාග කිරීමට හෝ එම අධිකරණයට අධිකරණ බලය ඇති වරදක් සිදු කර ඇති බවට වාචික හෝ ලිඛිත පැමිණිල්ලක් එම අධිකරණයේ මහෙස්ත්‍රාත්වරයා වෙත කරනු ලැබූ විට:

එසේ වුව ද එවැනි පැමිණිල්ලක් ලිඛිතව කරනු ලැබේ නම් එය උත්තරවාදියකු විසින් පිළියෙල කරනු ලැබ අනු අත්සන් කරනු ලැබිය යුතු අතර චෝදනාකරු විසින් එය අත්සන් කරනු ලැබිය යුතු ය;

(ආ) XI වන පරිච්ඡේදය යටතේ පත් කරනු ලැබූ පරීක්ෂකවරයකු විසින් හෝ රජයේ සේවකයකු විසින් හෝ මහා නගර සභාවක හෝ සුළු නගර සභාවක සේවකයකු විසින් හෝ නගර සභාවක හෝ සේවකයකු විසින් ඉහත සඳහන් අන්දමේ ලිඛිත වාර්තාවක් එම අධිකරණයේ මහෙස්ත්‍රාත්වරයකු වෙත කරනු ලැබූ විට;

(ඇ) ඉහත සඳහන් අන්දමේ දැනුමක් හෝ සැකයක් එම අධිකරණයේ මහෙස්ත්‍රාත්වරයකුට ඇති වූ විට;

එසේ වුව ද මේ ඡේදය යටතේ නඩු පවරනු ලැබූ විටක, නඩුව පවරනු ලැබුවේ යම් මහෙස්ත්‍රාත්වරයකුගේ දැනුම හෝ සැකය මත ද ඒ මහෙස්ත්‍රාත්වරයා විසින්

ඒ නඩුව විභාග කරනු නොලැබිය යුතු යයි ද වෙනත් මහෙස්ත්‍රාත්වරයකු විසින් ඒ නඩුව විභාග කරනු ලැබිය යුතු යයි නැතහොත් නඩු විභාගය ඉහල අධිකරණයට තැබිය යුතු යයි ද ඉල්ලා සිටීමට චූදිතයාට හෝ චූදිත තැනැත්තන් කිහිප දෙනකු ඇතොත් ඔවුන් අතුරින් කවර හෝ චූදිතයකුට හිමිකම් තිබිය යුතු ය;

(ඈ) පරීක්ෂණයක් පැවැත්වීමට හෝ නඩු විභාග කිරීමට හෝ එම අධිකරණයට අධිකරණ බලය ඇති වරදක් සිදු කරන ලද බවට චෝදනා කරනු ලැබ අධිකරණ නියෝගයක් නොමැතිව අත් අඩංගුවට ගනු ලැබ එම අධිකරණයේ මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියට යම් තැනැත්තකු පමුණුවනු ලැබූ විට ;

(ඉ) පරීක්ෂණයක් පැවැත්වීමට යම් අධිකරණයකට යම් අධිකරණ බලය ඇති වරදක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලෙස එම අධිකරණයේ මහෙස්ත්‍රාත්වරයකුට නියම කෙරෙන නීතිපත්වරයාගේ අත්සන යටතේ වූ බලපත්‍රයක් මත;

(ඊ) 135 වන වගන්තිය යටතේ අධිකරණයක් විසින් ලිඛිත පැමිණිල්ලක් ඉදිරිපත් කරනු ලැබූ විට.

(2) (1) වන උපවගන්තියේ (ආ) ජේදය යටතේ වූ ලිඛිත වාර්තාව, (ඉ) ජේදය යටතේ වූ නීතිපතිවරයාගේ බලපත්‍රය සහ (ඊ) ජේදය යටතේ වූ ලිඛිත පැමිණිල්ල ද තැපෑලෙන් හෝ පණිවිඩකරුවකු මගින් හෝ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීම හෝ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත අතින් භාර දීම ඉදිරිපත් කිරීම හෝ එවැනි අධිකරණයක මහෙස්ත්‍රාත්වරයකු වෙත අතින් භාර දීම හෝ කරනු ලැබිය යුතු අතර ඒවා නඩු කටයුතු වල කොටසක් බවට පත් විය යුතු ය.

(3) මෙහි ලා විධිවිධාන සලස්වා ඇති පරිදි හැර මහෙස්ත්‍රාත්වරයකු විසින් යම් ලිඛිත පැමිණිල්ලක් භාර ගනු නොලැබිය යුතු ය.

ස්ත්‍රී දූෂණ වැනි අවස්ථාවල දී චෝදනාකාරිය සහ චූදිතයා වෛද්‍ය පරීක්ෂණය ට භාජනය කිරීම.

**137.** පැමිණිලි කරනු ලැබ ඇති වරද, ස්ත්‍රී දූෂණයක්, තරුණ ගැහැණු ළමයකු සමඟ කාම සංසර්ගයක්, අස්වාභාවික වරදක් හෝ බරපතල ස්වභාවකයකින් තුවාල සිදු කිරීමක් හෝ ඇනීම හෝ කැපීම සඳහා වූ උපකරණයකින් සිදු කොට ඇතැයි කියනු ලබන බරපතළ වූ හෝ නොවූ තුවාළ සිදු කිරීමක් වන අවස්ථාවල දී, ඒ ස්ත්‍රී දූෂණයට, කාම සංසර්ගයට, අස්වාභාවික වරදට හෝ තුවාළ සිදු කිරීමට විෂය වූයේ යයි කියනු ලබන තැනැත්තා ද ඒ ස්ත්‍රී දූෂණය හෝ කාම සංසර්ගය හෝ අස්වාභාවික වරද හෝ ඒ සම්බන්ධයෙන් චූදිත තැනැත්තා ද ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකු ද විසින් ඒ වන විටත් පරීක්ෂා කර නොමැති නම් වහාම එවැනි වෛද්‍යවරයකු ලවා එසේ පරීක්ෂා කරවනු ලැබීමට මහෙස්ත්‍රාත්වරයා විසින් සැලැස්විය යුතු ය.

චූදිතයා නොදන්නා විට ඇතැම් නඩුවල දී කාර්ය පටිපාටිය.

**138.** (1) 136 (1) (අ) වන වගන්තිය යටතේ හෝ 136 (1) (ආ) වන වගන්තිය යටතේ හෝ පවරනු ලැබූ යම් නඩු කටයුතුවල කරන ලදැයි කියනු ලබන වරද තමා විසින් ලඝු ආකාරයෙන් විභාග කළ නොහැකි වරදක් වන අවස්ථාවක, එවැනි වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් කිසිම තැනැත්තකු නමින් චෝදනා ලැබ නොමැති වුව ද චෝදනාකරු හෝ දැනුම් දෙන්නා ද නඩුවේ සිද්ධි සම්බන්ධයෙන් තොරතුරු දන්නේ යයි මහෙස්ත්‍රාත්වරයාට පෙනී යන වෙනත් යම් තැනැත්තකු ද මහෙස්ත්‍රාත්වරයා විසින් දිවුරුම් පිට විභාග කරනු ලැබිය හැකි ය. සුදුසු යයි මහෙස්ත්‍රාත්වරයා කල්පනා කරන්නේ නම්, ඒ විභාගය පෞද්ගලිකව පවත්වනු ලැබිය හැකි ය.

(2) මහෙස්ත්‍රාත්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ පවත්වනු ලබන සෑම විභාගයක් ම ලිඛිතව පිළියෙල කොට එය කියවා දෙනු ලැබීමෙන් පසු හා අවශ්‍ය වුවහොත්, විභාග කරනු ලැබූ තැනැත්තාට භාෂණ පරිවර්තනය කර දීමෙන් පසු ඔහු විසින් ද මහෙස්ත්‍රාත්වරයා විසින් ද අත්සන් කරනු ලැබ,දිනය යොදනු ලැබිය යුතු ය.

(3) එවැනි විභාගයකින් පසු, යම් තැනැත්තකුට විරුද්ධව නඩු කටයුතු පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් හේතු ඇති බව මහෙස්ත්‍රාත්වරයාගේ මතය වන්නේ නම්, 139 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තාට විරුද්ධව අධිකරණ නියෝගයක් නිකුත් කරනු ලැබිය යුතුය.

අධිකරණ නියෝග නිකුත් කිරීම

**139.** (1) 136 (1) වන වගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය හෝ යටතේ නඩු පවරා ඇත්තා වූ ද අත් අඩංගුවේ නොමැති යම් තැනැත්තකුට විරුද්ධව කටයුතු කර ගෙන යාම සඳහා ප්‍රමාණවත් හේතු ඇති බව මහෙස්ත්‍රාත්වරයාගේ මතය වන්නා වූ ද අවස්ථාවක -

(අ) නඩුව, පළමුවන උපලේඛනයේ හතරවන තීරය අනුව, පළමුකොට සිතාසිය නිකුත් කළ යුතු නඩුවක් නම්, ඒ තැනැත්තා පැමිණ සිටීම සඳහා වූ සිතාසියක් ඔහු විසින්, 63 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, නිකුත් කරනු ලැබිය යුතු ය;

(ආ) නඩුව, එම තීරය අනුව පළමුකොට වරෙන්තුවක් නිකුත් කළ යුතු නඩුවක් නම් නියමිත වේලාවක දී ඒ තැනැත්තා අධිකරණය ඉදිරියට ගෙනෙනු ලැබීමට හෝ අධිකරණය ඉදිරියෙහි පෙනී සිටීමට හෝ සැලැස්වීම සඳහා වරෙන්තුවක් ඔහු විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

එසේ වුව ද -

(i) කවර හෝ අවස්ථාවක දී සුදුසු යයි තමා කල්පනා කරන්නේ නම් මහෙස්ත්‍රාත්වරයා විසින් වරෙන්තුවක් වෙනුවට පළමු කොට සිතාසියක් නිකුත් කළ හැකිය.

(ii) 136 (1) වන වගන්තියේ (අ) ඡේදය යටතේ හෝ (ආ) ඡේදය යටතේ වූ කවර හෝ අවස්ථාවක දී මහෙස්ත්‍රාත්වරයා විසින්, වරෙන්තුවක් නිකුත් කිරීමට පෙර, චෝදනාකරු හෝ යම් වැදගත් සාක්ෂිකරුවකු හෝ සාක්ෂිකරුවන් දිවුරුම් පිට විභාග කරනු ලැබිය යුතු අතර සිතාසියක් නිකුත් කිරීමට පෙර ද ඔහු විසින් එසේ කරනු ලැබිය හැකි ය ; තව ද

(iii) 136 (1) වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ වූ කවර හෝ අවස්ථාවක දී මහෙස්ත්‍රාත්වරයා විසින් අධිකරණ නියෝගයක් නිකුත් කිරීමට පෙර අවස්ථාවෝචිත පරිදි, තමාගේ දැනුම ලබාගත් මාර්ගය හෝ තම සැකය ඇති වීමට හේතු හෝ

සංයුක්ත කරනු ලැබුවේ යම් සිද්ධි මත ද ඒ සිද්ධි පිළිබඳ සංක්ෂිප්ත ප්‍රකාශයක් වාර්තාගත කරනු ලැබිය යුතු ය.

(2) 136 (1) වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ නඩු පවරා ඇති අවස්ථාවක, චූදිතයා අධිකරණය ඉදිරියට ගෙන ආ තැනැත්තා ද නඩුවේ සිද්ධි සම්බන්ධයෙන් තොරතුරු දන්නා අධිකරණයට පැමිණ සිටින වෙනත් ඕනෑම තැනැත්තකු ද මහෙස්ත්‍රාත්වරයා විසින් දිවුරුම් පිට හෝ ප්‍රතිඥා පිට වහාම විභාග කරනු ලැබිය යුතු ය;

එසේ වුව ද, නඩුවේ සිද්ධි පිළිබඳව වාර්තාවක් මහෙස්ත්‍රාත්වරයා ඉදිරියෙහි ඇත්නම් හෝ ලියවිල්ලකින් වූ පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබේ නම් එවැනි විභාගයක් අවශ්‍ය නොවිය යුතු ය.

(3) 136 (1) වන වගන්තියේ (ඉ)ඡේදය යටතේ හෝ (ඊ) ඡේදය යටතේ හෝ නඩු පවරා ඇති අවස්ථාවක, නඩුව සිතාසියක් හෝ වරෙන්තුවක් හෝ පළමු කොට නිකුත් කරනු ලැබිය යුතු වරදක් වන්නේ යයි පළමු වන උපලේඛනයේ හතරවන තීරය මගින් විධිවිධාන සලස්වා ඇති පරිදි වරෙන්තුවෙහි හෝ පැමිණිල්ලෙහි හෝ නම් සඳහන් තැනැත්තාගේ පැමිණ සිටීම සඳහා සිතාසියක් හෝ ඒ තැනැත්තා නියත වේලාවක දී අධිකරණය ඉදිරියට පමුණුවනු ලැබීමට හෝ අධිකරණය ඉදිරියෙහි පෙනී සිටීමට සැලැස්වීම සඳහා වරෙන්තුවක් හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් පළමු අවස්ථාවේ දී නිකුත් කරනු ලැබිය යුතු ය.

**140.** 139 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම සිතාසියක ම හෝ වරෙන්තුවක ම, චෝදනා කරනු ලැබ ඇත්තේ යම් වරදක් සම්බන්ධයෙන් ද ඒ වරද පිළිබඳ විස්තර ප්‍රකාශයක් ඇතුළත් විය යුතු අතර, සිතාසියක් සම්බන්ධයෙන් වන විට එහි දක්වා ඇති චෝදනාවට උත්තර දීම පිණිස එහි ලා සඳහන් වේලාවේ දී හා ස්ථානයේ දී පෙනී සිටින ලෙස චූදිතයාට ඉන් නියම කරනු ලැබිය යුතු ය. සිතාසියෙහි හෝ වරෙන්තුවෙහි ඇතුළත් විය යුතු කරුණු.

**141.** 139 වන වගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා විසින් පවත්වනු ලබන සෑම විභාගයක්ම 138 (2) වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි වාර්තාගත කරනු ලැබිය යුතු ය. 139 වන වගන්තිය යටතේ පවත්වනු ලබන විභාගය වාර්තාගත කළ යුතු බව.

සුදුසු යයි මහෙස්ත්‍රාත්වරයා කල්පනා කරන්නේ නම් ඒ විභාගය පෞද්ගලිකව පවත්වනු ලැබිය හැකි ය.

නඩුව පවත්වාගෙන යනු ලබන විට අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය. [1980 අංක 52 § 8]

**142.** * (1) වරද හෝ වැරදි එකකට වඩා ඇති අවස්ථාවක වැරදි අතුරින් කවර හෝ වරදක් 1979 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ දෙවන උපලේඛනයෙහි දක්වා ඇති වැරදි ලැයිස්තුවට අයත් වන අවස්ථාවක හෝ නීතිපතිවරයා විසින් 145 (ආ) වගන්තිය යටතේ හෝ 393 (7) (ආ) වගන්තිය යටතේ හෝ මූලික පරීක්ෂණයක් පැවැත්වීමට මහෙස්ත්‍රාත්වරයාට විධාන කරනු ලබන අවස්ථාවක හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් XV වන පරිච්ඡේදයේ දක්වා ඇති කාර්ය පටිපාටිය අනුගමනය කරනු ලැබිය යුතු ය.

(2) වරද, මහෙස්ත්‍රාත් අධිකරණයක දී ලඝු ආකාරයෙන් විභාග කරනු ලැබිය හැකි වරදක් බව පෙනී යන අවස්ථාවක මහෙස්ත්‍රාත්වරයා විසින් XVII වන පරිච්ඡේදයෙහි දක්වා ඇති කාර්ය පටිපාටිය අනුගමනය කරනු ලැබිය යුතු ය.

එසේ වුව ද මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් ඒ වරදට ප්‍රමාණවත් ලෙය දඬුවම් පමුණුවනු ලැබිය නොහැකි බව මහෙස්ත්‍රාත්වරයාගේ මතය වන්නේ නම් ඔහු විසින් වැඩිදුර නඩු කටයුතු වහාම නතර කොට නඩු වාර්තාව නීතිපතිවරයා වෙත යවනු ලැබිය යුතු අතර ඉනික්බිතිව ඔහු නීතිපතිවරයාගේ උපදෙස් අනුව ක්‍රියාකළ යුතු ය.

මනුෂ්‍ය ඝාතනයක් සම්බන්ධයෙන් වන විට මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ ස්ථානයේ දී ම පරීක්ෂණයක් පැවැත්විය යුතු බව.

**143.** 136 වන වගන්තිය යටතේ පවරනු ලැබූ නඩු කටයුත්තක දී එය සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය පිළිබඳ නඩුවක් බව පෙනී ගිය හොත්, තමා විසින් වාර්තාගත කරනු ලැබිය යුතු කරුණු හේතු කොට ගෙන ඒ වරද සිදු කරනු ලැබුවේ යයි පෙනී යන ස්ථානයට යාම අවස්ථානුකූල නොවේ යයි ඔහු කල්පනා කරන්නේ නම් මිස මහෙස්ත්‍රාත්වරයා ඒ ස්ථානයට යා යුතු ය. තව ද, චූදිතයා තමා ඉදිරියෙහි පැමිණ සිටියේ නම් XV වන පරිච්ඡේදය මගින් විධාන කර ඇති පරීක්ෂණයේ අවශ්‍ය යම් කොටසක් පැවැත්වීමට ඔහු විසින් කටයුතු කළ යුතු අතර, චූදිතයා පැමිණ නොසිටි නම් වැදගත් සාක්ෂි දිය හැකි යයි තමාට පෙනී යන යම් තැනැත්තන් ඔහු විසින් විභාග කරනු ලැබිය යුතු ය.

* 1979 ජූලි මස 2 වන දිනට අතීතයට බලපාන පරිදි. 1980 අංක 52 දරන පනතේ 16 වන වගන්තිය බලන්න.

ඒ විභාගය 138 (2) වන වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි වාර්තාගත කරනු ලැබිය යුතු ය.

**144.** මහෙස්ත්‍රාත්වරයකු විසින් සිතාසියක් නිකුත් කරනු ලබන කවර හෝ විටක ස්වකීය අභිමතය පරිදි, ඔහු විසින් පෞද්ගලිකව ම පෙනී සිටින ලෙස චූදිතයාට නියම නොකොට උත්තරවාදියකු මගින් පෙනී සිටීමට ඔහුට අවසර දෙනු ලැබිය හැකි ය. සිතාසියක් නිකුත් කරනු ලබන අවස්ථාවක පෞද්ගලිකවම පෙනී සිටින ලෙස චූදිතයාට නියම නොකළ හැකි බව.

එසේ වුව ද, මහෙස්ත්‍රාත්වරයා විසින්, ස්වකීය අභිමතය පරිදි නඩු කටයුතුවල කවර හෝ අවස්ථාවක චූදිතයා පෞද්ගලිකව පැමිණ පෙනී සිටිය යුතු යයි විධාන කිරීම ද ඔහුගේ පෙනී සිටීම මෙහි මින් පෙර විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම ද කරනු ලැබිය හැකි ය.

## XV වන පරිච්ඡේදය

### මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් ලඝු කාර්ය පටිපාටියක් අනුව විභාග කරනු ලැබිය නොහැකි බව පෙනී යන නමුත් මහාධිකරණය විසින් නඩු විභාග කරනු ලැබිය හැකි නඩුකර පිළිබඳ විභාගය

**145.** චූදිතයා මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියෙහි පෙනී සිටි විට හෝ මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියට පමුණුවනු ලැබූ විට - මූලික පරීක්ෂණය.

(අ) වරද හෝ වැරදි එකකට වැඩි ගණනක් ඇති විට ඒ වැරදි අතුරින් යම් වරදක් හෝ 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ දෙවන උපලේඛනයෙහි දක්වා ඇති වැරදි ලැයිස්තුවට අයත් වරදක් වන අවස්ථාවක ; හෝ

(ආ) අධිචෝදනා පත්‍රයක් සකස් කිරීම සඳහා මූලික පරීක්ෂණයක දී වාර්තාගත කරන ලද සාක්ෂි අවශ්‍ය වෙතැයි නීතිපතිවරයාගේ මතය වන විට වරද සිදු කරනු ලැබූ දින සිට මාස තුනක් ඇතුළත මූලික පරීක්ෂණයක් පැවැත්විය යුතු යයි නීතිපතිවරයා විසින් විධාන කරනු ලබන අවස්ථාවක

මෙහි මින් මතු සඳහන් කර ඇති ආකාරයට මහෙස්ත්‍රාත්වරයා විසින් මූලික පරීක්ෂණයක් පවත්වනු ලැබිය යුතු ය.

චෝදනාව චූදිතයාට දැනුම් දිය යුතු බව.

**146.** මූලික පරීක්ෂණයක් පවත්වන මහේස්ත්‍රාත්වරයකු විසින් ඒ පරීක්ෂණය ආරම්භයේ දී, පරීක්ෂණයක් පවත්වනු ලබන්නේ යම් චෝදනාවක් හෝ චෝදනා සම්බන්ධයෙන් ද, ඒ චෝදනාව හෝ චෝදනා චූදිතයාට කියවා දිය යුතු නමුත්, එසේ කියවා දීමේ දී එයට යම් උත්තරයක් දෙන ලෙස චූදිතයාට නියම කරනු නොලැබිය යුතු ය; එවැනි යම් උත්තරයක් දෙනු ලැබුවහොත්, මහේස්ත්‍රාත්වරයා විසින් එය වාර්තාගත කරනු නොලැබිය යුතු ය. එමෙන් ම එවැනි යම් උත්තරයක් චූදිතයාට විරුද්ධව සාක්ෂ්‍යයේ දී ආවේ ශය නොවිය යුතු ය.

තොරතුරු සටහන් පොත සටහන් ඉදිරිපත් කළ යුතු බව.
[2005 අංක 14 § 5]

**147.** විමර්ශනයේ සටහන්වල ද විමර්ශනය පවත්වාගෙන යන අතරතුර වාර්තාගත කරන සියලු ප්‍රකාශවල ද සහතික පිටපත් තුනක් අදාළ තොරතුරු සටහන් පොත තබා ඇති පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් පරීක්ෂණය ආරම්භයේ දී මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

දිවුරුම් සාක්ෂි.

**148.** (1) ඉක්බිතිව මහේස්ත්‍රාත්වරයා විසින් චූදිතයා ඉදිරියේ දී සහ මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි, නඩුවේ සිද්ධි සහ අවස්ථාගත කරුණු දන්නා තැනැත්තන් විසින් දිවුරුම් පිට හෝ ප්‍රතිඥා පිට කරනු ලබන ප්‍රකාශ ලබා ගෙන ඒවා ලියා ගනු ලැබිය යුතු ය; (මේවාට දිවුරුම් සාක්ෂි යයි කියනු ලැබේ)

එසේ වුව ද නීතිපතිවරයා විසින් අන්‍යාකාරයකින් විධාන කරනහොත් මිස, මහේස්ත්‍රාත්වරයා විසින් යම් විශේෂඥ සාක්ෂිකරුවකු කැඳවීම සහ ඔහුගේ සාක්ෂි වාර්තාගත කිරීම නොකළ යුතු නමුත් එවැනි සාක්ෂිකරුවකුගේ වාර්තාව පමණක් ඉදිරිපත් කරනු ලැබීමට හා එය නඩු වාර්තාවෙහි ගොනු කරනු ලැබීමට ඔහු විසින් සැලැස්විය යුතු ය.

(2) චූදිතයාට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන එක් එක් සාක්ෂිකරුගෙන් (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව චූදිතයාට ප්‍රශ්න ඇසිය හැකි අතර, එහි ලා සාක්ෂිකරු ගෙන් ලැබෙන උත්තරය ඔහුගේ දිවුරුම් සාක්ෂියේ කොටසක් විය යුතු ය.

(3) චූදිතයා නීතිඥවරයකු විසින් නියෝජනය කරනු නොලැබේ නම්, චෝදක පක්ෂයේ එක් එක් සාක්ෂිකරු විභාග කිරීම අවසානයේ දී, ඒ සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කිසිවක් ඇසීමට චූදිතයා බලාපොරොත්තු වන්නේ දැයි මහේස්ත්‍රාත්වරයා විසින් ඔහුගෙන් විමසිය යුතු ය.

චූදිතයා පැන ගොස් සැඟ වී සිටින හෝ එතෙර ගොස් සිටින අවස්ථාවල දිවුරුම් සාක්ෂි.

(4) (අ) (i) චූදිතයා පැනගොස් සැඟවී සිටින හෝ දිවයිනෙන් බැහැරව සිටින; නැතහොත්

(ii) අසනීපයක් නිසා අධිකරණයට පැමිණ සිටීමට හෝ අධිකරණයෙහි රැඳී සිටීමට චූදිතයාට නොහැකි වන්නා වූ ද ඔහු පැමිණ නොසිටිය දී පරීක්ෂණය ආරම්භ කිරීමට හෝ දිගටම පවත්වාගෙන යාමට ඔහු කැමැත්ත දී ඇත්තා වූ හෝ එම පරීක්ෂණය ඔහුට යම් හානියක් නොවන අන්දමින් ආරම්භ කිරීමට හෝ දිගටම පවත්වාගෙන යා හැකි වන්නා වූ ද ; නැතහොත්

(iii) අධිකරණයෙහි ඔහුගේ හැසිරීම හේතු කොට ගෙන පරීක්ෂණය කරගෙන යාමට චූදිතයා බාධා කරන හෝ අවහිර කරන

අවස්ථාවක මහෙස්ත්‍රාත්වරයා මේ සිද්ධිය සම්බන්ධයෙන් සෑහීමට පත් වන්නේ නම්, ඔහු විසින් චූදිතයා පැමිණ නොසිටිය දී පරීක්ෂණය ආරම්භ කොට පවත්වාගෙන යාම හෝ පරීක්ෂණය දිගටම පවත්වාගෙන යාම කළ හැකි ය.

(ආ) එසේ නොපැමිණි චූදිතයකු වෙනුවෙන් නීතිඥවරයකුට පෙනී සිටිය හැකි ය.

(ඇ) ක්‍රියාත්මක කළ හැකි තාක් දුරට, මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව පරීක්ෂණය පවත්වාගෙන යා යුතු අතර, මහාධිකරණයෙහි අධිචෝදනා පත්‍රයක් මත නඩු විභාගයක් ඇති විට, චූදිතයා මහාධිකරණයට පැමිණ සිටිය ද නොසිටිය ද වාර්තාගත කරන ලද දිවුරුම් සාක්ෂි සම්බන්ධයෙන් 416 වන වගන්තිය අදාළ විය යුතු ය.

චෝදනාව හා සාක්ෂි අතර වෙනසක් තිබීම.

**149.** (1) 146 වන වගන්තිය යටතේ චූදිතයාට කියවා දෙනු ලැබූ චෝදනාවෙහි දක්වා ඇති සිද්ධි හා ඒවා සනාථ කරනු පිණිස වරද හෝ ක්‍රියාව සිදු කරනු ලැබ ඇතැයි කියනු ලබන වේලාව හෝ ස්ථානය සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලැබූ සාක්ෂි අතර, ඇති යම් වෙනසක් ඒ වෙනස් වේලාව සම්බන්ධයෙන් වූ විට චෝදනාව ඉදිරිපත් කිරීම සඳහා නීතිය මගින් නියමිත කාලය ඇතුළත ඒ චෝදනාව ඇත්ත වශයෙන්ම ඉදිරිපත් කරනු ලැබූ බව ද ඒ වෙනස් ස්ථානය සම්බන්ධයෙන් වූ විට අධිකරණයේ

අධිකරණ බලය එමගින් පහ නොකරනු ලබන බව ද ඔප්පු කරනු ලැබුවහොත් වැදගත් යයි සලකනු නොලැබිය යුතු ය.

(2) චෝදනාවෙහි දක්වා ඇති සිද්ධි හා ඒවා සනාථ කරනු පිණිස ඉදිරිපත් කරනු ලැබූ සාක්ෂි අතර වෙනත් යම් ආකාරයකින් වූ යම් වෙනසක් වැදගත් නොවිය යුතු ය.

එසේ වුව ද චූදිතයාට චෝදනා නගා ඇත්තේ යම් වරදක් සම්බන්ධයෙන් ද ඒ වරද පිළිබඳ නඩු විභාගයේ දී චූදිතයාට චෝදනා නගා ඇති වරද නොවන වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් ඔහු වරදකරු කිරීම ද එකී වෙනත් යම් වරද මේ සංග්‍රහයේ විධිවිධාන යටතේ වන එකී නඩු විභාගයේ දී චූදිතයා නීත්‍යානුකූලව වරදකරු කරනු ලැබිය හැකි වරදක් නම් මිස, කරනු නොලැබිය යුතු ය.

(3) මේ වගන්තියෙහි සඳහන් කරනු ලබන ආකාරයේ යම් වෙනසක් කෙබඳු ස්වභාවයකින් යුක්ත දැයි කිවහොත් එමගින් චූදිතයා රවටනු ලැබුවේ යයි හෝ නොමග යවනු ලැබුවේ යයි මහෙස්ත්‍රාත්වරයාට පෙනී යන අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින්, සුදුසු යයි තමා කල්පනා කරන නියම මත පරීක්ෂණය යම් මතු දිනයකට අඩාළව කල් තබනු ලැබිය හැකි ය.

(4) එවැනි යම් වෙනසක් පෙනී ගිය විට චෝදනාව සම්බන්ධයෙන් සුදුසු යයි තමා සලකන යම් සංශෝධනයක් මහෙස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය හැකි අතර, යම් සාක්ෂිකරුවකු නැවත කැඳවනු ලැබීමට සහ ඒ වෙනසට හෝ සංශෝධිත චෝදනාවට හෝ අදාළ කාරණා කිසිවක් පිළිබඳව වැඩිදුරටත් ඒ සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කරනු ලැබීමට ඔහු විසින් අවසර දිය හැකි ය.

චෝදක පක්ෂයේ නඩුවේ කරුණු ඉදිරිපත් කිරීම අවසන් වූ පසු චෝදනා චූදිතයාට කියවා දෙනු ලැබිය යුතු බව.

**150.** චෝදක පක්ෂය වෙනුවෙන් කැඳවනු ලැබූ සාක්ෂිකරුවන් විභාග කරනු ලැබීමෙන් පසු 153 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව නඩුව සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු යයි මහෙස්ත්‍රාත්වරයා විසින් සලකනු නොලබන්නේ නම්, මහෙස්ත්‍රාත්වරයා විසින් චෝදනාව කියවා එහි ස්වභාවය සාමාන්‍ය භාෂාවෙන් ඔහුට තේරුම් කර දී, සාක්ෂිකරුවන් කැඳවීමට තමා වෙනුවෙන් ම සාක්ෂි දීමට ඔහු බලාපොරොත්තු වන්නේ නම් එසේ කිරීමට ද ඔහුට අයිතිවාසිකමක් ඇති බව මහෙස්ත්‍රාත්වරයා විසින් ඔහුට දන්වනු ලැබිය යුතු ය.

**151.** (1) ඉක්බිතිව, පහත දැක්වෙන වචනවලින් හෝ ඒ හා සමාන බලපෑමක් ඇති වචනවලින් මහෙස්ත්‍රාත්වරයා චූදිතයා ඇමතිය යුතු ය - චූදිතයාගේ ප්‍රකාශය ලබා ගැනීම සම්බන්ධයෙන් වූ විධිවිධාන.

"චෝදනාවට පිළිතුරු වශයෙන් කිසිවක් කීමට ඔබ කැමැත්තෙහි ද ? එසේ කිරීමට ඔබ බලාපොරොත්තු වන්නෙහි නම් මිස කිසිවක් කීමට ඔබ බැඳී නොසිටින නමුත් ඔබ කියන කුමක් වුව ද සටහන් කරගනු ලැබ ඔබේ නඩු විභාගයේ දී සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලැබේ."

(2) චෝදනාවට පිළිතුරු වශයෙන් චූදිතයා යම් ප්‍රකාශයක් කීමට පෙර ස්වකීය වරදකාරීත්වය පිළිබඳ යම් පිළිගැනීමක් හෝ අපරාධෝච්චාරණයක් හෝ කිරීමට ඔහු පෙළඹවීම පිණිස ඔහු වෙත පිරිනමනු ලැබිය හැකි අනුග්‍රහය පිළිබඳ වූ යම් පොරොන්දුවකින් බලාපොරොත්තු වීමට කිසිවක් නොමැති බවත් ඔහු වෙත කරනු ලැබිය හැකි යම් තර්ජනයක් නිසා බියවීමට කිසිම හේතුවක් නොමැති බවත් එහෙත් එම පොරොන්දුව හෝ තර්ජනය නොතකා, ඔහු විසින් එවිට පවසනු ලබන කුමක් හෝ, ඔහුගේ නඩු විභාගයේ දී සාක්ෂි වශයෙන් දෙනු ලබන බවත් මහෙස්ත්‍රාත්වරයා විසින් ඔහුට ප්‍රකාශ කොට පැහැදිලි ලෙස අවබෝධ කර දිය යුතු ය.

(3) චෝදනාවට පිළිතුරු වශයෙන් චූදිතයා විසින් කරනු ලබන යම් ප්‍රකාශයක් 277 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයට වාර්තාගත කරනු ලැබිය යුතු ය.

**152.** (1) චූදිතයාගේ ප්‍රකාශයට අදාළව 151 වන වගන්තියෙහි වූ නියමය අනුව ක්‍රියා කිරීමෙන් ඉක්බිතිව ම, චූදිතයා විසින් ප්‍රකාශයක් කර ඇති වුව ද නොමැති වුව ද, තමා වෙනුවෙන් ම සාක්ෂි දීමට ඔහු බලාපොරොත්තුවන්නේ ද යන වග සහ සාක්ෂිකරුවන් කැඳවීමට ඔහු බලාපොරොත්තු වන්නේ ද යන වග මහෙස්ත්‍රාත්වරයා විසින් චූදිතයාගෙන් විමසනු ලැබිය යුතු ය. විත්තිය සඳහා වූ සාක්ෂි.

(2) සාක්ෂිකරුවන් කැඳවීමට හෝ සාක්ෂි දීමට තමා බලාපොරොත්තු වන බව ඒ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් චූදිතයා ප්‍රකාශ කරනහොත්, චූදිතයාගේ සාක්ෂි නොපමාව ගැනීමට මහෙස්ත්‍රාත්වරයා ක්‍රියා කළ යුතු අතර චූදිතයාගේ සාක්ෂි අවසානයේ දී (චූදිතයා නියෝජනය කරනු ලැබේ නම්) චූදිතයා කැමති වුවහොත්, ඔහු වෙනුවෙන් ඔහුගේ නීතිඥවරයා විසින් කරුණු ඉදිරිපත් කිරීමට ඉඩ සැලසිය යුතු ය.

(3) තමා වෙනුවෙන්ම සාක්ෂි දීමට සහ සාක්ෂිකරුවන් කැඳවීමට හෝ සාක්ෂිකරුවන් කැඳවීමට පමණක් හෝ තමා බලාපොරොත්තු වන බව ඒ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් චූදිතයා ප්‍රකාශ කරතහොත්, තමා විසින්ම සාක්ෂි දීමට චූදිතයා අදහස් කරනු ලබන්නේ නම් ඔහුගේ සාක්ෂි හා නඩුවේ සිද්ධි හා අවස්ථානුගත කරුණුවලට අදාළව කිසිවක් හෝ චූදිතයාගේ නිර්දෝෂීභාවය ඔප්පු කිරීමට තුඩු දෙන්නා වූ කිසිවක් හෝ දන්නා වූ ද චූදිතයා විසින් කැඳවනු ලබන්නා වූ ද යම් සාක්ෂිකරුවකුගේ සාක්ෂි නොපමාව හෝ චූදිතයා වෙනුවෙන් නීතිඥවරයකු විසින් දේශනයක් පවත්වනු ලැබීමට තිබේ නම් ඒ දේශනය අවසන්වීමෙන් පසු හෝ ගැනීමට මහෙස්ත්‍රාත්වරයා විසින් ක්‍රියා කළ යුතු ය.

(4) කැඳවීමට තමාට සාක්ෂිකරුවන් ඇති නමුත් ඔවුන් අධිකරණයට පැමිණ නොමැති බව චූදිතයා විසින් ප්‍රකාශ කරනු ලැබුවහොත් සහ ඒ සාක්ෂිකරුවන් පැමිණ නොසිටීමට හේතුව චූදිතයාගේ යම් දෝෂයක් හෝ නොසැලකිල්ලක් හෝ නිසා නොවන බවටත් ඔවුන් පැමිණ සිටියේ නම් ඔවුන්ට චූදිතයා වෙනුවෙන් වැදගත් සාක්ෂි දීමට ඉඩ ඇති බවටත් මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් වන්නේ නම්, විභාගය අ. ‍ුව කල් තැබීම ද ඒ සාක්ෂිකරුවන්ගේ පැමිණ සිටීම බල කිරීම පිණිස අධිකරණ නියෝග නිකුත් කිරීම හෝ වෙනත් පියවර ගැනීම ද මහෙස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය හැකි ය.

(5) චූදිතයා විසින් හෝ ඉහත කී පරිදි එවැනි යම් සාක්ෂිකරුවකු විසින් හෝ දෙනු ලැබූ සාක්ෂි ලිඛිතව සටහන් කර ගනු ලැබිය යුතු අතර, 148 වන වගන්තියේ විධිවිධාන, චෝදක පක්ෂයේ සාක්ෂිකරුවන් සම්බන්ධයෙන් අදාළ වන්නාක් මෙන් ම විත්තියේ සාක්ෂිකරුවන් සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය. එහෙත් චූදිතයාගේ චරිතය පිළිබඳව පමණක් සාක්ෂිකරුවකු වූ යම් සාක්ෂිකරුවකුට, නඩු විභාගයට පැමිණ සිටීම පිණිස බැඳුම්කරයක් ලියා අත්සන් කරනු ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරනු නොලැබිය යුතු ය.

නිදහස් කිරීම.

**153.** (1) චූදිතයාට විරුද්ධව ඇති සාක්ෂි චූදිතයා නඩු විභාගයට භාජනය කිරීමට ප්‍රමාණවත් නොවේ යයි මහෙස්ත්‍රාත්වරයා සලකතහොත් විභාගයට යටත්ව පවත්නා චෝදනාව සම්බන්ධයෙන් තමා විසින් වාර්තාගත කරන ලැබිය

යුතු හේතු මත චූදිතයා නිදහස් කරන ලෙස, මහෙස්ත්‍රාත්වරයා විසින් නොපමාව ආඥා කරනු ලැබිය යුතු ය. එහෙත් එවැනි නිදහස් කිරීමක්, එම සිද්ධිය සම්බන්ධයෙන් වූ යම් තදනන්තර චෝදනාවකට බාධාවක් නොවිය යුතු ය.

එසේ වුව ද වහාම හෝ යුක්තිය ඉටු කිරීම පිණිස යෝග්‍ය යයි පෙනී යන පරීක්ෂණයේ යම් අඩාළව කල් තැබීමකින් පසුව හෝ චූදිතයා මහෙස්ත්‍රාත්වරයා ඉදිරියට කැඳවනු හැකිව තිබූ හෝ අන්‍යාකාරයකින් පමුණුවනු ලැබිය හැකිව තිබූ වෙනත් යම් චෝදනාවක් විමර්ශනය කර ගෙන යාමෙන් නැතහොත් ඉහත කී පරිදි එසේ නිදහස් කරන ලද චෝදනාව විභාග කරගෙන යනු ලබන අතරතුර චූදිතයා විසින් සිදු කරන ලදැයි පෙනී යන කාරණයක් පිළිබඳ වෙනත් යම් චෝදනාවක් විමර්ශනය කරගෙන යාමෙන් මේ වගන්තියෙහි ඇතුළත් කිසිවකින් මහෙස්ත්‍රාත්වරයා වළක්වනු නොලැබිය යුතු ය.

(2) (තමා විසින් වාර්තාගත කරනු ලැබිය යුතු හේතු අනුව) අපරාධ චෝදනාව පදනම් රහිත යයි මහෙස්ත්‍රාත්වරයා සලකන්නේ නම් නඩුවේ කවර හෝ අවස්ථාවක දී චූදිතයා නිදහස් කිරීමෙන් මේ වගන්තියෙහි වූ කිසිවකින් මහෙස්ත්‍රාත්වරයා වළක්වනු ලැබේතැයි සලකනු නොලැබිය යුතු ය.

**154.** (1) චූදිතයා පිළිබඳ නඩු විභාගය ඉහළ අධිකරණයට තැබීමට සාක්ෂි ප්‍රමාණවත් වේ යයි මහෙස්ත්‍රාත්වරයා සලකනහොත් මහාධිකරණය ඉදිරියේ නඩු විභාගය සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් චූදිතයා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. නඩු විභාගය ඉහළ අධිකරණයට තැබීම. [ 2005 අංක 14 § 6]

(2) මහාධිකරණය ඉදිරියේ නඩු විභාගය සඳහා චූදිතයා ඉදිරිපත් කිරීමෙන් පසු, මහාධිකරණයේ දී චූදිතයාට අධිචෝදනා කරනු ලැබුවහොත් වඩා අඩු වරදකට වරද පිළිගැනීමට තමා කැමති බව චූදිතයා විසින් ප්‍රකාශ කළ හැකි අතර, මහෙස්ත්‍රාත්වරයා විසින්ම එම ප්‍රකාශය වාර්තාගත කළ යුතු ය:

එසේ වුව ද, එවැනි ප්‍රකාශයක් කර තිබීමේ හේතුවෙන්, මහාධිකරණය ඉදිරියේ චූදිතයාගේ නඩු විභාගය පැවැත්වීම කිසිදු ආකාරයකින් වළක්වනු නොලැබිය යුතු ය.

එසේම තව දුරටත් එවැනි ප්‍රකාශයක් කර තිබීම නඩු විභාගයේ දී චූදිතයාට කිසිදු ආකාරයකින් හානිකර නොවිය යුතු ය.

(3) මහාධිකරණයේ දී චූදිතයා වෙත අධිචෝදනා භාර දීමෙන් පසු, එම අධිචෝදනා මත තමා වරදකරු කරනු ලැබිය හැකිව තිබුණේ යම් අඩු වරදක් සඳහා ද එම අඩු වරදට වරදකරු බව පිළිගැනීමට තමා කැමති බව ප්‍රකාශ කරන අවස්ථාවක සහ එම වරද පිළිගැනීම භාර ගැනීමට අධිකරණය කැමති වන අවස්ථාවක,වඩා අඩු වරදකට වරද පිළිගැනීමට චූදිතයා තුළ තිබුණු කැමැත්ත ඔහු විසින් මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ප්‍රකාශ කර තිබූ බව, චූදිතයාට දඬුවම් පැමිණවීමේ දී විනිශ්චයකාරවරයා විසින් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ චූදිතයා විසින් ප්‍රකාශයක් කර තිබීම මගින් මහාධිකරණයේ දී ගොනු කරනු ලැබූ අධිචෝදනා මත චූදිතයා වරදකරු කරනු ලැබිය හැකිව තිබූ යම් අඩු වරදක් සඳහා මහාධිකරණයේ දී චූදිතයා විසින් කරනු ලබන වරද පිළිගැනීමක් භාරගැනීමට අධිකරණය වෙත හෝ නීතිපතිවරයා වෙත යම් වගකීමක් පැවරෙන බවට කියවා තේරුම් නොගත යුතු ය.

චූදිතයාගේ සාක්ෂිකරුවෝ.

**155.** (1) චූදිතයාගේ නඩු විභාගය ඉහළ අධිකරණයට තබන අවස්ථාවේ දී, ස්වකීය නඩු විභාගයේ දී සාක්ෂි දීමට නියම කරනු ලැබීමට තමා බලාපොරොත්තු වන තැනැත්තන් කිසිවකු වෙතොත් සිද්ධි පිළිබඳ කරුණු දැක්වීම පිණිස කැඳවීමට තමා අදහස් කරන්නා වූ තැනැත්තන් හා හුදෙක් චරිතය පිළිබඳ කරුණු දැක්වීම පිණිස කැඳවීමට තමා අදහස් කරන්නා වූ තැනැත්තන් වෙන් වෙන් වශයෙන් දක්වමින් ඔවුන්ගේ නම් එතැන දීම හා එවෙලෙහි ම වාචිකව ප්‍රකාශ කරන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් චූදිතයාට නියම කරනු ලැබිය යුතු ය.

(2) චූදිතයා විසින් (1) වන උපවගන්තිය යටතේ නම් කරනු ලැබූ සාක්ෂිකරුවන් අතුරින් තමා ඉදිරියෙහි ඒ වන විටත් සාක්ෂි දී නොමැති සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවක් මහෙස්ත්‍රාත්වරයා විසින් පිළියෙල කරනු ලැබිය යුතු අතර, දැන්වීමෙහි සඳහන් දිනයෙහි නඩු විභාගය පවත්වන අධිකරණය ඉදිරියෙහි පෙනී සිටින ලෙස නියම කරමින් ඒ එක් එක් සාක්ෂිකරු වෙත දැන්වීමක් නිකුත් කරන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් පිස්කල්ට විධාන කරනු ලැබිය යුතු ය.

එසේ වුවද යම් සාක්ෂිකරුවකුගේ සාක්ෂි වැදගත් නොවන බව මහේස්ත්‍රාත්වරයාගේ මතය වන්නේ නම් ඔහු විසින් ඒ සාක්ෂිකරුගේ නම ඒ ලැයිස්තුවෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබ සිටින යම් සාක්ෂිකරුවකු ඒ දැන්වීමෙන් විධාන කරන ලද පරිදි නඩු විභාගය පවත්වන අධිකරණයෙහි පෙනී සිටීම පැහැර හරින අවස්ථාවක, 63 වන හා 64 වන වගන්ති අදාළ කිරීමේ කාර්යය සඳහා, ඒ දැන්වීම නඩු විභාගය පවත්වනු ලබන අධිකරණය විසින් නිකුත් කරනු ලැබීමට බලය පවරනු ලැබූ සිතාසියක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ වගන්තිවල විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ යම් දැන්වීමක් භාර දීම, සිතාසි භාරදීම සඳහා 45 වන හා 46 වන වගන්තිවල විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු අතර, ඒ භාරදීම ඔප්පු කිරීමේ කාර්ය සඳහා 49 වන වගන්තියෙහි විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය:

එසේ වුව ද නිසි උද්‍යෝගයෙන් යුතුව ක්‍රියා කිරීමෙන් ද දැන්වීම භාර දීම ඒ ආකාරයෙන් ක්‍රියාත්මක කළ නොහැකි නම් සාක්ෂිකරු සාමාන්‍යයෙන් පදිංචිව සිටින නිවාසයෙහි හෝ ගෙදර දොරේ හෝ යම් ප්‍රකටව පෙනෙන කොටසක දැන්වීම අලවනු ලැබිය යුතු අතර එවැනි අවස්ථාවක දී ඒ දැන්වීම යථා පරිදි භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

**156.** (1) චූදිතයාගේ නඩු විභාගය මහේස්ත්‍රාත්වරයා විසින් ඉහළ අධිකරණයට තබනු ලැබූ විට තමා ඉදිරියෙහි පෙනී සිට සාක්ෂි දී ඇත්තා වූ ද ඒ වන විටත් බැඳුම්කරයක් ලියා අත්සන් කර නොමැත්තා වූ ද චෝදක පක්ෂයේ හෝ විත්ති පක්ෂයේ සෑම වැදගත් සාක්ෂිකරුවකුටම නඩු විභාගයේ දී සහ අවශ්‍ය වුවහොත් නීතිපතිවරයාගේ විධානය මගින් චෝදනාව සම්බන්ධයෙන් චූදිතයාට විරුද්ධව පවත්වනු ලබන යම් වැඩිදුර විභාගයක දී සාක්ෂි දීම පිණිස පෙනී සිටීම සඳහා ඇපකරුවන් ඇතිව හෝ නැතිව බැඳුම්කරයක් ලියා අත්සන් කළ යුතු යයි මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලැබිය යුතු ය. තව ද එයට සමාන කාර්යය සඳහා මෙහි මින් මතු ඇතුළත් විධිවිධාන යටතේ අධිකාරයක් පිට යම් සාක්ෂිකරුවකු විභාග කරන යම් මහේස්ත්‍රාත්වරයකු විසින් ඒ සාක්ෂිකරුට, මහේස්ත්‍රාත්වරයා විසින්

වැදගත් සාක්ෂිකරුවන් පෙනී සිටීම සඳහා බැඳුම්කරයක් ලියා අත්සන් කරන ලෙස නියම කරනු ලැබිය යුතු බව.

නිශ්චය කරනු ලබන පරිදි ඇපකරුවන් ඇතිව හෝ නැතිව බැඳුම්කරයක් ලියා අත්සන් කරන ලෙස නියම කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) නඩු කටයුතුවල යම් වැඩිදුර අවස්ථාවක ඒ අධිකරණයේ දී හෝ චූදිතයා නඩු විභාගය සඳහා මහාධිකරණයට ඉදිරිපත් කරනු ලැබුවහොත් මහාධිකරණයේ දී හෝ පෙනී සිටීම සඳහා මීට ඉහතින් වූ උපවගන්තියෙහි සඳහන් පරිදි බැඳුම්කරයක් ලියා අත්සන් කරන ලෙස නඩු විභාගයේ යම් අවස්ථාවක දී මහෙස්ත්‍රාත්වරයා විසින් යම් සාක්ෂිකරුවකුට නියම කරනු ලැබිය හැකි ය. එසේ පෙනී සිටිය යුත්තේ මහාධිකරණයේ කවර සැසි වාරයක දැයි බැඳුම්කරයෙහි සඳහන් කිරීම අවශ්‍ය නොවිය යුතු නමුත් චූදිතයාගේ නඩු විභාගය පවත්වනු ලබන මහාධිකරණයේ කවර හෝ සැසි වාරයක සාධාරණ කාලයක දැනුම් දීමක් ලැබුණු විට නඩු විභාගයේ දී පැමිණ සිටීමට බන්ධනදායී බැඳී සිටිය යුතු ය.

(3) සාක්ෂිකරුවකු ඒ බැඳුම්කරය ලියා අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළහොත් හෝ අතපසු කළහොත්, ඒ බැඳුම්කරය යථා පරිදි ලියා අත්සන් කරනු ලබන තෙක් හෝ නඩු විභාගය පවත්වනු ලබන තෙක් හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් ඔහු බන්ධනාගාරගත කරනු ලැබිය යුතු අතර, එවිට නඩු විභාගය පවත්වන අධිකරණය වෙත ඔහු අත් අඩංගුවෙහි යවනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ බැඳුම්කරයක් ලියා අත්සන් කරන ලෙස නියම කරනු ලැබූ විට හෝ බැඳුම්කරයක් ලියා අත්සන් කිරීම ප්‍රතික්ෂේප කොට බන්ධනාගාරගත කිරීමට නියම කරනු ලැබූ හෝ සියලු තැනැත්තන්ගේ නම් මහෙස්ත්‍රාත්වරයා විසින් ඉහළ අධිකරණයට තැබීමේ බලපත්‍රයක පිටසන් කරනු ලැබිය යුතු ය.

(5) එවැනි බැඳුම්කරයක් ලියා අත්සන් කරන සෑම තැනැත්තකුම විසින් නඩුවේ වැඩිදුර කටයුතු පිළිබඳ වූ සියලු දැන්වීම් තමා සඳහා තබනු ලැබිය හැකි ලිපිනයක් මහෙස්ත්‍රාත්වරයා වෙත දෙනු ලැබිය යුතු අතර, ඔහු සඳහා ඒ ලිපිනයෙහි තබනු ලැබූ යම් දැන්වීමක් (පටහැනිව කරුණු ඔප්පු කරනු ලබන තෙක්) ඔහුට ලැබී ඇතැයි සලකනු ලැබිය යුතු ය.

*මහෙස්ත්‍රාත්වරයා වාර්තාව සහතික කළ යුතු බව.*

**157.** චූදිතයාගේ නඩු විභාගය ඉහළ අධිකරණයට තබනු ලැබුවහොත් ඔහු ඇප පිට සිටී ද නැතහොත් අත් අඩංගුවෙහි සිටී ද යන වග මහෙස්ත්‍රාත්වරයා විසින් වාර්තාගත කළ යුතු අතර පරීක්ෂණයේ වාර්තාව ස්වකීය අත්සන යටතේ සහතික කරනු ලැබිය යුතු ය.

*පොලිසියට කරන ලද ප්‍රකාශවලට චූදිතයා හිමිකම් ලබන බව. [1980 අංක 52 § 9]*

**158*** (1) චූදිතයකුගේ නඩු විභාගය ඉහළ අධිකරණයට තබනු ලැබූ විට, මහෙස්ත්‍රාත්වරයා ඉදිරියේ සාක්ෂි දෙන ලද සාක්ෂිකරුවන් විසින් පොලිසියට කරනු ලද ප්‍රකාශවල සහ චූදිතයා විසින් පොලිසියට කරන ලද යම් ප්‍රකාශ වේනොත්, ඒ ප්‍රකාශවල සහතික පිටපතක් නඩු විභාගයට පෙර, යුක්තිසහගත කාලයක දී චූදිතයා විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත්, අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කරනු ලබන යම් අනුප්‍රමාණයක් අනුව ඒ සඳහා චූදිතයා විසින් ගෙවනු ලැබූ විට, අදාළ පොත් පත් තබා ඇති පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්, ඒ තැනැත්තා වෙත සහතික පිටපතක් සපයනු ලැබිය යුතු ය :

එසේ වුව ද අනුප්‍රමාණයක් එසේ නියම කරනු ලබන තෙක් ගෙවිය යුතු අනුප්‍රමාණය, වචන එක් සියයක් සඳහා ශත විසිපහක් විය යුතු ය.

(2) මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් නඩු විභාග කරනු ලැබිය හැකි වරදක් ලෙස පළමුවන උපලේඛනයේ අටවන තීරයෙහි දක්වා නොමැති වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව අධිචෝදනා පත්‍රයෙහි ලැයිස්තු ගත නොකරන ලද යම් සාක්ෂිකරුවකු විසින් පොලිසියට කරන ලද ප්‍රකාශය, යුක්තිය ඉටුවීම පිණිස, කියවා බැලීම සඳහා චූදිතයාට හෝ ඔහුගේ නීතිඥවරයා ම හෝ නීතිපතිවරයා විසින් ලබා දිය හැකි ය.

*නඩු වාර්තාව නඩු විභාගය පවත්වන අධිකරණයටත් නඩු වාර්තාවේ සහතික පිටපත නීතිපතිවරයාටත් යැවිය යුතු බව.*

**159.** (1) මහෙස්ත්‍රාත්වරයා විසින් චූදිතයාගේ නඩු විභාගය ඉහළ අධිකරණයට තබනු ලැබූ විට ඔහු විසින්, ඇප තැබීම සම්බන්ධයෙන් වූ මේ සංග්‍රහයේ විධිවිධානවලට යටත්ව, යම් බන්ධනාගාරයක අධිකාරීවරයා නමට වූ බලපත්‍රයක් මගින් නඩු විභාගය පවත්වනු ලබන අතරතුර චූදිතයා එකී අධිකාරීවරයාගේ භාරයට නියම කරනු ලැබිය යුතු ය.

---

* 1979 ජූලි 2 වන දිනට අතීතයට බලපාන පරිදි 1980 අංක 52 දරන පනතේ 16 වන වගන්තිය බලන්න.

(2) මහෙස්ත්‍රාත්වරයා විසින් -

(අ) (i) සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරන ලද සියලු ලේඛන සහ දේවල් සමග පරීක්ෂණයේ වාර්තාව : සහ

(ii) තමාගේ අත්සනින් සහතික කරන ලද ඒ වාර්තාවේ සහ ඒ ලේඛනවල පිටපතක් : සහ

iii) පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් සපයන ලද විමර්ශනයේ සටහන්වල සහ ප්‍රකාශවල සහතික පිටපත් අතුරින් එක් පිටපතක්

මහාධිකරණයට ද

(ආ) (i) චූදිතයන් සංඛ්‍යාවට සමාන සහතික පිටපත් සංඛ්‍යාවක් ද සමග පරීක්ෂණයේ වාර්තාවේ ද සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරන ලද සියලු ලේඛන වල ද තම අත්සනින් සහතික කරන ලද පිටපතක් : සහ

(ii) පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් සපයන ලද විමර්ශනයේ සටහන්වල සහ ප්‍රකාශවල සහතික පිටපත් අතුරින් එක් පිටපතක් නීතිපතිවරයාට ද

වහාම යැවිය යුතු ය.

(3) 264 වන වගන්තියේ විධිවිධාන මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයකට ම අදාළ විය යුතු ය.

අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කිරීම සහ භාර දීම.

**160.** (1) පරීක්ෂණ වාර්තාවේ සහතික පිටපත තමා වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව, නඩුව මහාධිකරණය ඉදිරිපිට අධිචෝදනා පත්‍රයක් මත නඩු විභාග කළ යුතු නඩුවක් බව නීතිපතිවරයාගේ මතය වන්නේ නම්, අධිචෝදනා පත්‍රයක් සකස් කරනු ලැබිය යුතු ය. තව ද 162 (3) වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව එය අත්සන් කරනු ලැබූ විට එය මහාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර මහාධිකරණයෙහි එය ගොනු කර තැබිය යුතුය.

(2) ඒ චෝදනා පත්‍රය එසේ අත්සන් කරනු ලැබීම, ඉදිරිපත් කරනු ලැබීම සහ ගොනු කරනු ලැබීම, චෝදනා නගා ඇත්තේ යම් වරදක් සම්බන්ධයෙන් ද ඒ වරද සංයුක්ත වීමට සහ ඒ අධිකරණයට අධිකරණ බලය ලැබීමට නීතියෙන් නියමිත සියලු කොන්දේසි ඒ නඩුව සම්බන්ධයෙන් සම්පූර්ණ වී ඇති බවට වූ ප්‍රකාශයකට සමාන වන්නේ ය.

(3) මහෙස්ත්‍රාත්වරයා විසින් ගන්නා ලද සාක්ෂිවලින් අනාවරණය වූ යම් වරදක් සම්බන්ධයෙන් වූ යම් චෝදනාවක් මහෙස්ත්‍රාත්වරයා විසින් චූදිතයාට කියවා දෙනු නොලැබුවේ වුව ද, චෝදනා එක් කිරීම සම්බන්ධයෙන් වූ මේ සංග්‍රහයේ විධිවිධානවලට යටත් ව, නීතිපතිවරයා විසින් ඒ චෝදනාව අධිචෝදනා පත්‍රයෙහි ආදේශ කිරීම හෝ ඇතුළත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

*161. මේ සංග්‍රහයෙහි හෝ වෙනත් යම් නීතියක විධිවිධානවලට යටත් ව, අධිචෝදනා පත්‍රයක් මත මහාධිකරණයේ දී පවරනු ලබන සියලුම අපරාධ නඩු ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් විභාග කරනු ලැබිය යුතු ය.

නඩු විභාගයක් ජූරි සභාවක් මගින් සහ ජූරි සභාවක් නොමැතිව පැවැත්විය යුත්තේ කවර අවස්ථාවල දී ද යන වග. [1988 අංක 11 § 3]

එසේ වුව ද, යම් අවස්ථාවක දී යටත් පිරිසෙයින් වරදවල් අතුරින් එක් වරදක් හෝ 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වරදවල් පිළිබඳ ලැයිස්තුවට වැටෙන අවස්ථාවක ජූරි සභාවක් මගින් නඩුව විභාග කළ යුතු යයි චූදිතයා විසින් තීරණය කළ හොත් පමණක් නඩු විභාගය ජූරි සභාවක් මගින් විනිශ්චයකාරවරයකු ඉදිරියේ පැවැත්විය යුතු ය.

**162.** (1) ජූරි සභාවක් මගින් හෝ ජූරි සභාවන් නොමැතිව හෝ මහාධිකරණයේ නඩු විභාගයක් සඳහා වූ සෑම අධිචෝදනා පත්‍රයකම, චෝදක පක්ෂය කැඳවීමට බලාපොරොත්තු වන සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවක් ද, නඩු විභාගයේ දී ඉදිරියට කරනු ලැබීමට බලාපොරොත්තු වන්නා වූ ද, "ඉදිරිපත් කිරීම" යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ ද, ලේඛන සහ දේවල් දැක්වෙන වෙනත් ලැයිස්තුවක් ද ඇතුළත් විය යුතු ය.

අධිචෝදනා පත්‍රයෙහි ඇතුළත් විය යුතු කරුණු

* 1991.11.28 දින සිට ක්‍රියාත්මක වේ. 1991.9.5 දින අංක 678/14 ගැසට් පත්‍රය බලන්න.

එහෙත් චූදිතයා වෙත දැන්වීමක් කරනු ලැබීමෙන් පසුව අධිචෝදනා පත්‍රයෙහි සඳහන් නොවන යම් සාක්ෂිකරුවන් කැඳවීමෙන් හෝ යම් ලේඛනයක් හෝ දෙයක් ඉදිරිපත් කිරීමෙන් හෝ මේ වගන්තියෙහි වූ කිසිවකින් චෝදක පක්ෂය වළක්වනු ලබතැයි සලකනු නොලැබිය යුතු ය: නැතහොත් එසේ තේරුම් නොගත යුතු ය.

(2) සෑම අධිචෝදනා පත්‍රයකට ම පහත දැක්වෙන ලේඛන ඇමිණිය යුතු ය :-

(අ) මේ පරිච්ඡේදය යටතේ මූලික පරීක්ෂණයක් පවත්වනු ලැබූ අවස්ථාවක, පරීක්ෂණ වාර්තාවේ ද, ලේඛනවල ද, මරණ පරීක්ෂණයක් පවත්වන ලද නම් ඒ මරණ පරීක්ෂණ කටයුතු වල ද සහතික පිටපතක්:

[1980 අංක 52 § 10] *(ආ) මේ පරිච්ඡේදය යටතේ මූලික පරීක්ෂණයක් පවත්වනු නොලැබූ අවස්ථාවක, චූදිතයා විසින් පොලිසියට කරන ලද ප්‍රකාශ ඇත්නම් එම ප්‍රකාශවල සහ අධිචෝදනා පත්‍රයෙහි ලැයිස්තුගත කරන ලද සාක්ෂිකරුවන් විසින් පොලිසියට කරන ලද ප්‍රකාශ ඇත්නම් එම ප්‍රකාශවල පිටපත් ;

(ඇ) අධිචෝදනා පත්‍රයෙහි ලැයිස්තුගත කරන ලද සියලු වාර්තාවල හා දළ සටහන්වල පිටපත්;

(ඈ) නඩුව විමර්ශනය කරගෙන යනු ලබන අතරතුර පවත්වන ලද යම් හඳුනා ගැනීමේ පෙරට්ටුවල සටහන්වල පිටපත්;

(ඉ) 127 වන වගන්තිය යටතේ

(i) චූදිතයා විසින් ; සහ

(ii) අධිචෝදනා පත්‍රයෙහි ලැයිස්තුගත කර ඇති යම් සාක්ෂිකරුවකු විසින්

මහෙස්ත්‍රාත්වරයා වෙත කරන ලද යම් ප්‍රකාශවල පිටපත් ;

---

* 1979 ජූලි මස 2 වන දිනට අතීතයට බලපාන පරිදි. 1980 අංක 52 දරන පනතේ 16 වන වගන්තිය බලන්න.

(ඊ) පොලිස් නිලධරයකු විසින් වරද පිළිබඳ ව විමර්ශනය පවත්වනු ලබන අතරතුර ඔහු විසින් කරන ලද, වරද සිදු කරන ලද ස්ථානය පිළිබඳ ව නිරීක්ෂණ අතුළත් සටහන්වල යම් කොටසක පිටපත්.

(3) අධිචෝදනා පත්‍රය නියමිත ආකෘතිය අනුව විය යුතු අතර නීතිපතිවරයාගේ නාමයෙන් එය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

තව ද, එය නීතිපතිවරයා විසින් හෝ නියෝජ්‍ය නීතිපතිවරයා විසින් හෝ රජයේ නීතිඥවරයකු විසින් හෝ අත්සන් කරනු ලැබිය යුතු ය.

(4) නීතිපතිවරයා මිය යාම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම හෝ හේතු කොට ගෙන නඩු කටයුතු අවසන් වීම හෝ සිදු නොවිය යුතු ය.

පරීක්ෂණය එක් මාසයක් ඇතුළත අවසන් කරනු ලැබිය යුතු බව.

163. තමා විසින් වාර්තාගත කරනු ලැබිය යුතු කරුණු හේතු කොට ගෙන එක් මාසයක කාලයකට වැඩි කාලයකට පරීක්ෂණයේ කාලය දීර්ඝ කිරීම අවශ්‍ය යයි මහෙස්ත්‍රාත්වරයාට පෙනී ගියහොත් මිස, මේ පරිච්ඡේදය යටතේ පවත්වනු ලබන සෑම පරීක්ෂණයක් ම නඩු කටයුතු ආරම්භ වීමෙන් පසු එක් මාසයක් ඇතුළත අවසන් කරනු ලැබිය යුතු ය.

## XVI වන පරිච්ඡේදය

### චෝදනාව

චෝදනාවෙහි වරද සඳහන් විය යුතු බව.

164. (1) මේ සංග්‍රහය යටතේ වූ සෑම චෝදනාවකින් ම, චූදිතයාට විරුද්ධව යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා නගනු ලැබේ ද ඒ වරද ප්‍රකාශ විය යුතු ය.

(2) වරද නිර්මාණය කෙරෙන නීතියෙන් ඒ වරදට යම් නිශ්චිත නාමයක් දී ඇතොත් චෝදනාවෙහි ඒ වරද, ඒ නාමයෙන් පමණක් විස්තර කළ හැකි ය.

(3) වරද, නිර්ණය කෙරෙන නීතියෙන් ඒ වරදට යම් නිශ්චිත නාමයක් දී නොමැති නම්, චූදිතයාට විරුද්ධව යම් කාරණයක් සම්බන්ධයෙන් චෝදනා නගනු ලැබේ ද ඒ කාරණය චූදිතයාට දැන්වීමට තරම් වූ වරද පිළිබඳ අර්ථ කථනයක් ප්‍රකාශ විය යුතු ය.

(4) කරන ලදැයි කියන වරදකට දඬුවම් කළ හැකි වන්නේ යම් නීතියක යම් වගන්තියක් යටතේ ද ඒ නීතිය හා ඒ වගන්තිය චෝදනාවෙහි සඳහන් කළ යුතු ය.

(5) චෝදනාව නගනු ලැබීම, චෝදනා නගා ඇති වරද සංයුක්ත වීමට නීතිය අනුව අවශ්‍ය වූ සෑම නෛතික කොන්දේසියක් ම ඒ අවස්ථාව සම්බන්ධයෙන් සම්පූර්ණ වී ඇති බවට කරන ලද ප්‍රකාශයක් හා සමාන වන්නේ ය.

(6) නඩුව විභාගය සඳහා තැබීමට පූර්වයෙන් පැවැත්වෙන පරීක්ෂණයේ දී වුවද නඩු විභාගයේ දී වුවද චෝදනාව ඉදිරිපත් කරනු ලබන විට එය චූදිතයාට අවබෝධ වන භාෂාවකින් කියවා දිය යුතු ය.

### නිදර්ශන

(අ) " බී" මැරීම ගැන " ඒ " චෝදනා ලැබ සිටී. මෙය " ඒ " ගේ ක්‍රියාව දණ්ඩ නීති සංග්‍රහයේ 293 වන සහ 294 වන වගන්තිවල මිනී මැරීම සම්බන්ධයෙන් දී ඇති අර්ථකථනයට ඇතුළත් වන බවට ද එය එම සංග්‍රහයේ සාමාන්‍ය ව්‍යතිරේක අතුරින් කිසිවකට ඇතුළත් නොවන බවට හෝ 1 වන ව්‍යතිරේකයට එය ඇතුළත් වූයේ නම් එම ව්‍යතිරේකයේ අතුරු විධාන තුනෙන් එකක් ඊට අදාළ බවට ද වූ ප්‍රකාශයකට සමාන වේ.

(ආ) වෙඩි තැබීමට පාවිච්චි කරන ලද උපකරණයකින් " බී" ට ස්වේච්ඡාවෙන් බරපතල තුවාල සිදු කරන ලදැයි, දණ්ඩ නීති සංග්‍රහයේ 317 වන වගන්තිය යටතේ " ඒ " චෝදනා ලැබ සිටියි. එය, එම අවස්ථාව සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ 326 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා නොමැති බවට ද ඊට සමාන ව්‍යතිරේක අදාළ නොවන බවට ද වූ ප්‍රකාශයකට සමාන වේ.

(ඈ) "ඒ" මිනී මැරීම, වංචා කිරීම, සොරකම, ත්‍රාසාද්ග්‍රහණය, සාපරාධ බිය ගැන්වීම හෝ ව්‍යාජ දේපළ ලකුණක් පාවිච්චි කිරීම සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටී. දණ්ඩ නීති සංග්‍රහයේ එම අපරාධ පිළිබඳ ව දී ඇත්තා වූ අර්ථකථන ගැන සඳහන් නොකොට, " ඒ " මිනී මැරීම හෝ වංචා කිරීම හෝ සොරකම හෝ ත්‍රාසාද්ග්‍රහණය හෝ සාපරාධ බිය ගැන්වීම හෝ ව්‍යාජ දේපළ ලකුණක් පාවිච්චි කිරීම හෝ සිදු කළ බව, චෝදනාවෙන් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(ඉ) රජයේ සේවකයකුගේ නීත්‍යනුකූල බලය පිට විකිණීමට තබන ලද දේපළක් චේතනාන්විතව බාධා කළේ යයි දණ්ඩ නීති සංග්‍රහයේ 182 වන වගන්තිය යටතේ " ඒ " චෝදනා ලැබ සිටී. චෝදනාව එම වචන වලින්ම විය යුතු ය.

වේලාව, ස්ථානය සහ තැනැත්තා පිළිබඳ විස්තර.

**165.** (1) කරන ලදැයි කියනු ලබන වරද කරන ලද වේලාව සහ ස්ථානය ද ඒ වරද කරනු ලැබුවේ යම් තැනැත්තකුට විරුද්ධව නම් ඒ තැනැත්තා පිළිබඳව ද යම් දෙයක් සම්බන්ධයෙන් නම් ඒ දෙය පිලිබඳව ද, චූදිතයාට විරුද්ධව චෝදනා නගනු ලැබූ කාරණය සම්බන්ධයෙන් ඔහුට දැනුම් දෙනු ලැබීමට සහ ඒ වරද සඳහා නඩු පැවරිය හැකි කාලය ගත වී නොමැති බව පෙන්වීමට සාධාරණ ලෙස ප්‍රමාණවත් වන්නා වූ විස්තර ඒ චෝදනාවෙහි ඇතුළත් විය යුතු ය.

(2) සාපරාධ විශ්වාස භාවය කඩ කිරීම හෝ චංචල දේපළ වංක ලෙස ව්‍යපහරණය කිරීම පිළිබඳ ව හෝ චූදිතයාට විරුද්ධව චෝදනා නගනු ලැබූ කල්හි, ඒ වරද කරන ලදැයි කියනු ලබන්නේ යම් මුදලක් හෝ දෙයක් සම්බන්ධයෙන් ද, අවස්ථාවෝචිත පරිදි, ඒ මුදලෙහි දළ ප්‍රමාණය හෝ ඒ දෙයෙහි දළ ප්‍රමාණය සහ ඒ වරද කරන ලදැයි කියනු ලබන්නේ යම් දින අතර ද, ඒ දින, විශේෂ විෂයයන් හා නියම දින නොදක්වමින්, සඳහන් කිරීම ප්‍රමාණවත් විය යුතු අතර එසේ සකස් කරනු ලැබූ චෝදනාව 174 වන වගන්තියේ අර්ථානුකූලව එක් වරදක් සඳහා වූ චෝදනාවක් ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද, ඒ දින අතුරින් පළමුවන හා අවසන් දින අතර ඇතුළත් වන කාලය එක් අවුරුද්දක් නොඉක්ම විය යුතු ය.

වරද සිදු කළ ආකාරය ප්‍රකාශ කළ යුතු වන්නේ යවර අවස්ථාවක ද යන වග.

(3) චූදිතයාට විරුද්ධව චෝදනා නගා ඇත්තේ යම් කාරණයක් පිළිබඳව ද ඒ කාරණය පිළිබඳ ප්‍රමාණවත් දැනුම් දීමක් 164 වන වගන්තියෙහි සහ මේ වගන්තියේ මීට ඉහතින් වූ උප වගන්තිවල සඳහන් විස්තරවලින් චූදිතයාට නොලැබෙන්නා වූ ස්වභාවය

නඩුවෙහි ඇති කල්හි ඒ කාර්යය සඳහා ප්‍රමාණවත් වන සේ කරන ලදැයි කියන වරද කරන ලද ආකාරය පිළිබඳ විස්තර ද චෝදනාවෙහි ඇතුළත් විය යුතු ය.

### නිදර්ශන

(අ) එක්තරා වේලාවක එක්තර ස්ථානයක දී එක්තරා බඩුවක් සොරකම් කළේ යයි " ඒ " චෝදනා ලැබ සිටී.

(ආ) සඳහන් කර ඇති වේලාවක දී හා ස්ථානයක දී " බී " ට වංචා කරන ලදැයි " ඒ " චෝදනා ලැබ සිටී. " ඒ " විසින් " බී"ට වංචා කරන ලද ආකාරය චෝදනාවෙහි දැක්විය යුතු ය.

(ඇ) සඳහන් කර ඇති වේලාවක දී හා ස්ථානයක දී බොරු සාක්ෂි දෙන ලදැයි " ඒ " චෝදනා ලැබ සිටියි. " ඒ " දුන් සාක්ෂියේ බොරු යයි කියනු ලබන කොටස චෝදනාවෙහි දැක්විය යුතු ය.

(ඈ) සඳහන් කර ඇති වේලාවක දී රාජකාරී කටයුතු කරමින් සිටිය දී, රජයේ සේවකයකු වූ " බී"ට බාධා කළේ යයි " ඒ " චෝදනා ලැබ සිටී. ස්වකීය රාජකාරී කටයුතු කිරීමේ දී " බී " ට " ඒ " බාධා කළ ආකාරය චෝදනාවෙහි දැක්විය යුතු ය.

(ඉ) සඳහන් කර ඇති වේලාවක දී හා ස්ථානයක දී " බී" මැරුවේ යයි " ඒ " චෝදනා ලැබ සිටී. " ඒ " විසින් " බී" මරණ ලද ආකාරය චෝදනාවෙහි සඳහන් කිරීම අවශ්‍ය නැත.

(ඊ) " බී" දඬුවම් ලැබීමෙන් ගැලවීමේ චේතනාව ඇති ව නීතියේ විධානයට අකීකරු වී යයි " ඒ " චෝදනා ලැබ සිටී.චෝදනා කරනු ලබන අකීකරු වීම සහ උල්ලංඝනය කරන ලද නීතිය චෝදනාවෙහි දක්වනු ලැබිය යුතු ය.

වරදක් විස්තර කිරීමේ දී පාවිච්චි කරන ලද වචන වලට දිය යුතු අර්ථය.

(4) සෑම චෝදනාවක ම, වරදක් විස්තර කිරීමේ දී පාවිච්චි කරන ලද වචන, ඒ වරදට දඬුවම් කළ හැකි වන්නේ යම් නීතියක් යටතේ ද ඒ නීතියෙහි ඒ වචනවලට පිළිවෙළින් ඇති යේ සලකනු ලබන අර්ථයෙන් ම පාවිච්චි කරන ලද ලෙස සලකනු ලැබිය යුතු ය.

දෝෂවලින් ඇතිවන ප්‍රතිඵල

**166.** චෝදනාවෙහි සඳහන් කරනු ලැබීමට නියමිත වරද හෝ විස්තර හෝ එහි සඳහන් කිරීමෙහි ලා වූ සම් දෝෂයකින් සහ ඒ වරද හෝ විස්තර සඳහන් කිරීමෙහි ලා වූ නොකර

හැරීමකින් චූදිතයා නො මග ගියේ නම් මිස එවැනි කිසිම දෝෂයක් හෝ නොකර හැරීමක් නඩුවේ යම් අවස්ථාවක දී වැදගත් ලෙස සලකනු නො ලැබිය යුතු ය.

(අ) "කාසිය තම සන්තකයට පත්වන වේලාවෙහි එය හොර කාසියක් බව දැන දැනම එම කාසිය තම සන්තකයෙහි තබාගෙන සිටීම" සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 237 වන වගන්තිය යටතේ "ඒ" චෝදනා ලැබ සිටී "වංචනික ලෙස" යන වචන චෝදනාවෙහි අත්හැර ඇත. මේ අත්හැරීම නිසා "ඒ" සැබැවින් ම නො මග ගිය බව පෙනේ නම් මිස, එම දෝෂය වැදගත් ලෙස සලකනු නො ලැබිය යුතු ය.

(ආ) "බී" ට වංචා කිරීම සම්බන්ධයෙන් "ඒ" චෝදනා ලැබ සිටී. ඔහු "බී" ට වංචා කළ ආකාරය චෝදනාවේ දක්වා නොමැත. නැතහොත් එය වැරදි ලෙස දක්වා ඇත. "ඒ" විත්තිවාචක ඉදිරිපත් කර සිටින අතර ම සාක්ෂිකරුවන් කැඳවා එම ගනුදෙනුව පිළිබඳව තමාගේ ම විස්තරයක් දෙයි. වංචා කළ ආකාරය චෝදනාවෙහි දැක්වීම අත්හැර තැබීම වැදගත් නොවන බව මෙයින් අධිකරණයට නිගමනය කළ හැකි ය.

(ඇ) "බී" ට වංචා කිරීම සම්බන්ධයෙන් "ඒ" චෝදනා ලැබ සිටී. ඔහු "බී" ට වංචා කළ ආකාරය චෝදනාවේ දක්වා නොමැත. "ඒ" හා "බී" අතර ගනුදෙනු කිහිපයක් තිබුණු අතර, එම චෝදනාව අදාළ වන්නේ කවර ගනුදෙනුව සම්බන්ධයෙන් ද යන වග දැන ගැනීමට "ඒ" ට ක්‍රමයක් නොවීය. එහෙයින් ඔහු කිසිම විත්තිවාචකයක් ඉදිරිපත් නො කළේ ය. මේ කාරණයේ දී වංචා කළ ආකාරය, චෝදනාවෙහි දැක්වීම අත්හැර තිබීම වැදගත් බව මේ කරුණුවලින් අධිකරණයට නිගමනය කළ හැකි ය.

**167.** (1) නඩු තීන්දුව ප්‍රකාශ කිරීමට පෙර හෝ ජූරි සභාවක් මගින් මහාධිකරණය ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාග සම්බන්ධයෙන් වූ විට ජූරි සභාවේ තීන්දුව දීමට පෙර හෝ ඕනෑම වේලාවක දී යම් අධිචෝදනාවක් හෝ චෝදනාවක් යම් අධිකරණයක් විසින් වෙනස් කරනු ලැබිය හැකි ය. අධිකරණය විසින් චෝදනාව වෙනස් කළ හැකි බව.

(2) එවැනි සෑම වෙනස් කිරීමක් ම චූදිතයාට කියවා තේරුම් කර දෙනු ලැබිය යුතු ය.

(3) අධිචෝදනාවක එක් චෝදනාවක් වෙනුවට වෙනත් චෝදනාවක් ආදේශ කිරීම හෝ අධිචෝදනාවකට අලුත් චෝදනාවක් එකතු කිරීම ද මහේස්ත්‍රාත් අධිකරණයක දී එක් චෝදනාවක් වෙනුවට වෙනත් චෝදනාවක් ආදේශ කිරීම හෝ අලුත් චෝදනාවක් එකතු කිරීම ද මේ වගන්තියේ අර්ථානුකූලව පළමුව කී ඒ අධිචෝදනාව හෝ චෝදනාව වෙනස් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

වෙනස් කරන ලද චෝදනාව මත නඩු විභාගය වහාම පැවැත්විය හැකි අවස්ථා.

**168.** 167 වන වගන්තිය යටතේ කරන ලද වෙනස් කිරීම කෙබඳු වී ද යත්, ඒ වෙනස් කිරීමෙන් පසු නඩු විභාගය වහාම පවත්වා ගෙන යාම නිසා විත්තිවාචකයේ දී චූදිතයාට හෝ නඩුව පවත්වාගෙන යාමේ දී චෝදකට හෝ හානියක් සිදු නොවිය හැකි බව අධිකරණයේ මතය වේ නම් අධිකරණය විසින්, ස්වකීය අභිමතය පරිදි, ඒ වෙනස් කිරීම සිදු කිරීමෙන් පසු, ඒ වෙනස් කරන ලද අධිචෝදනාව හෝ චෝදනාව මුල් චෝදනාව හෝ චෝදනාව වූවාක් මෙන් නඩු විභාගය පවත්වාගෙන යනු ලැබිය හැකි ය.

අලුත් නඩු විභාගයක් පවත්වන ලෙස විධාන කළ හැකි හෝ නඩු විභාගය අඩාලව කල් තැබිය හැකි අවස්ථා.

**169.** 167 වන වගන්තිය යටතේ කරන ලද වෙනස් කිරීම කෙබඳු වී ද යත්, ඒ වෙනස් කිරීමෙන් පසු වහාම නඩු විභාගය පවත්වාගෙන යාම නිසා, ඉහත කී පරිදි චූදිතයාට හෝ චෝදකට හානියක් සිදු විය හැකි බව අධිකරණයේ මතය වේ නම්, අධිකරණය විසින්, අලුත් නඩු විභාගයක් පවත්වන ලෙස විධාන කළ හැකි ය; නැතහොත් නඩු විභාගය අවශ්‍ය විය හැකි කාලයකට අඩාලව කල් තැබිය හැකි ය.

වෙනස් කරන ලද චෝදනාවෙහි සඳහන් වරද පිළිබඳව අපරාධ චෝදනා ඉදිරිපත් කිරීමට පූර්ව අනුමතය අවශ්‍ය නම් නඩු කටයුතු නතර කළ යුතු බව.

**170.** අපරාධ චෝදනා ඉදිරිපත් කිරීම සඳහා පූර්ව අනුමතය අවශ්‍ය වරදක් කර ඇතැ යි 167 වන වගන්තිය යටතේ වෙනස් කරන ලද පරිදි වූ අධිචෝදනාවෙන් හෝ චෝදනාවෙන් කියැවේ නම් ඒ වෙනස් කරන ලද පරිදි වූ අධිචෝදනාවට හෝ චෝදනාවට පදනම් වූ සිද්ධි ම මත අපරාධ චෝදනාවක් ඉදිරිපත් කිරීම සඳහා අනුමතය එවකටත් ලැබී ඇත්නම් මිස, ඒ අනුමතය ලැබෙන තුරු නඩු විභාගය පවත්වා ගෙන යනු නො ලැබිය යුතු ය.

**171.** නඩු විභාගය ආරම්භ වීමෙන් පසු අධිකරණය විසින් අධිචෝදනාවක් හෝ චෝදනාවක් වෙනස් කරනු ලබන කවර හෝ අවස්ථාවක, සාක්ෂි දුන් යම් සාක්ෂිකරුවකුට නැවත අඩගසා හෝ ඔහු නැවත කැඳවා හෝ ඒ වෙනස් කිරීමට අදාළව ඔහුගෙන් සාක්ෂි ගැනීමට චෝදකට සහ චූදිතයාට ඉඩ දෙනු ලැබිය යුතු ය.

චෝදනාව වෙනස් කළ විට සාක්ෂිකරුවන් නැවත කැඳවීම.

**172.** (1) වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු අධිචෝදනාවේ හෝ චෝදනාවේ යම් දෝෂයක් නිසා ස්වකීය විත්ති වාචකයෙහි ලා නොමග යවනු ලැබූ බවශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණය විසින් ස්වකීය අභියාචන හෝ ප්‍රතිශෝධන බලතල ක්‍රියාත්මක කිරීමේ දී, ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ මතය වුවහොත් ඒ අධිකරණය විසින් සුදුසු යයි කල්පනා කරන කවර හෝ ආකාරයකින් සකස් කරන ලද චෝදනාවක් හෝ අධිචෝදනාවක් මත අලුත් නඩු විභාගයක් පවත්වන ලෙස විධාන කරනු ලැබිය හැකි ය; නැතහොත් නඩුව සම්බන්ධයෙන් යුක්තිය ඉෂ්ට කිරීම පිණිස අවශ්‍ය වෙනත් යම් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

වැදගත් දෝෂයෙහි ප්‍රතිඵලය.

(2) නඩුවේ සිද්ධි කෙබඳු ද යත්, ඔප්පු කරන ලද සිද්ධි සම්බන්ධයෙන් චූදිතයාට විරුද්ධව යම් වලංගු චෝදනාවක් ඉදිරිපත් කළ නොහැකිය යන්න ඒ අධිකරණයේ මතය වුවහොත් හෝ අවස්ථාගත කරුණු අනුව වරදකරු කිරීම නිෂ්ප්‍රභ කළ යුතු අවස්ථාවක හෝ ඒ අධිකරණය විසින් ඒ වරදකරු කිරීම නිෂ්ප්‍රභ කරනු ලැබිය යුතු ය.

### නිදර්ශන

සැබෑ හෝ නිර්ව්‍යාජ සාක්ෂි වශයෙන් තමා දූෂිත ලෙස පාවිච්චි කළ හෝ පාවිච්චි කිරීමට තැත් කළ සාක්ෂි, බොරු බව නැතහොත් ගොතනු ලැබූ බව තමා දැන සිටි බව සඳහන් නොකර තිබූ චෝදනාවක් මත දණ්ඩ නීති සංග්‍රහයේ 193 වන වගන්තිය යටතේ වූ වරදකට "ඒ" වරදකරු කරනු ලැබ සිටී. සමහර විට "ඒ" ට එම දැනීම තිබෙන්නට ඇති බවත් ඔහුට එම දැනීම තිබුණු වග චෝදනාවේ සඳහන් නොකිරීම නිසා ඔහුගේ විත්තිවාචකයේ දී ඔහු නොමග යවනු ලබන්නට ඇති බවත් අධිකරණය කල්පනා කරන්නේ නම් සංශෝධිත චෝදනාවක් මත . අලුත් නඩු විභාගයක් පවත්වන ලෙස අධිකරණය විසින් විධාන කළ හැකි ය; එහෙත් සමහර විට "ඒ" ට එවැනි දැනීමක් නොතිබූ බව නඩු කටයුතු වාර්තා වලින් පෙනී යන්නේ නම් අධිකරණය විසින් එම වරදකරු කිරීම නිෂ්ප්‍රභ කළ යුතු ය.

## චෝදනා එක් කිරීම

වෙන් වෙන් වැරදි සඳහා චෝදනා ඉදිරිපත් කළ යුතු බව.

173. යම් තැනැත්තකුට විරුද්ධව චෝදනා නගනු ලබන සෑම වෙන් වෙන් වරදක් සඳහා ම වෙන වෙනම චෝදනාවක් තිබිය යුතු ය. 174 වන, 175 වන, 176 වන සහ 180 වන වගන්තිවල දී හැර ඒ සෑම චෝදනාවක් පිළිබඳව ම වෙන් වෙන් ව නඩු විභාග කළ යුතු අතර එහි වගන්ති වෙන් වෙන්ව හෝ ඒකාබද්ධව හෝ අදාළ කර ගනු ලැබිය හැකි ය.

### නිදර්ශනය

එක් අවස්ථාවක දී සොරකමක් ගැනත් තවත් අවස්ථාවක දී බරපතල තුවාල සිදු කිරීම ගැනත් "ඒ" චෝදනා ලැබ සිටී. සොරකම ගැනත් බරපතල තුවාල සිදු කිරීම ගැනත් "ඒ" ට විරුද්ධව වෙන් වෙන්ව චෝදනා නගා වෙන් වෙන් ව නඩු විභාග පවත්වනු ලැබිය යුතු ය.

අවුරුද්දක් ඇතුළත වූ එකම වර්ගයේ වැරදි තුනක් වෙනුවෙන් එකට චෝදනා ඉදිරිපත් කළ හැකි බව.

174. (1) පළමුවන වරදෙහි සිට අවසන් වරද තෙක් මාස දොළහක කාලය ඇතුළත කරන ලද එකම වර්ගයේ වැරදි එකකට වඩා වැඩි ගණනක් සම්බන්ධයෙන් තැනැත්තකු චෝදනා ලැබ සිටින විට, එයින් තුනකට නොවැඩි යම් වැරදි සංඛ්‍යාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව චෝදනා නගා එකම නඩු විභාගයේ දී ඔහු නඩු විභාගයට භාජන කළ හැකි අතර මහාධිකරණය ඉදිරිපිට වූ නඩු විභාගවල දී ඒ චෝදනා එකම අධිචෝදනා පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබිය හැකි ය.

(2) දණ්ඩ නීති සංග්‍රහයේ හෝ යම් විශේෂ හෝ ප්‍රාදේශීය නීතියක එකම වගන්තිය යටතේ හෝ එකම ප්‍රමාණයේ දඬුවම්වලින් දඬුවම් කළ හැකි වැරදි එකම වර්ගයේ වැරදි වේ.

වැරදි එකකට වැඩි ගණනක් සම්බන්ධයෙන් නඩු විභාග කිරීම.

175. (1) එකම ක්‍රියා මාලාවක් සංයුක්ත වන සේ එකට සබැඳි ක්‍රියාවලියක දී එකම තැනැත්තා විසින් එකකට වඩා වැඩි වැරදි ගණනක් සිදු කර ඇත්නම් ඒ සෑම වරදකට ම ඔහුට විරුද්ධව චෝදනා නගා එකම නඩු විභාගයේ දී ඔහු නඩු විභාගයට භාජන කළ හැකි අතර මහාධිකරණය ඉදිරිපිට වූ නඩු විභාගවල දී ඒ චෝදනා එකම අධිචෝදනා පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබිය හැකි ය.

(2) කරන ලදැයි කියනු ලබන ක්‍රියා මගින්, වැරදි පිළිබඳව අර්ථ කථනය කරන හෝ වැරදිවලට දඬුවම් කරන, තත්කාලයෙහි බල පවත්නා යම් නීතියක වෙන් වෙන් අර්ථකථන දෙකකට හෝ ඊට වැඩි ගණනකට අයත් වන වරදක් සංයුක්ත වන්නේ නම් එයින් චෝදනා ලැබූ තැනැත්තාට විරුද්ධව ඒ එක් එක් වරදකට චෝදනා නගා එකම නඩු විභාගයේ දී ඔහු නඩු විභාගයට භාජන කළ හැකි අතර මහාධිකරණය ඉදිරිපිට වූ නඩු විභාගවල දී ඒ චෝදනා එකම අධිචෝදනා පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබිය හැකි ය.

අර්ථකථන දෙකක් යටතට වැටෙන වැරදි.

(3) ක්‍රියා කිහිපයක් අතුරින් හුදෙක් එකකින් හෝ එකකට වැඩි ගණනකින් වරදක් සංයුක්ත වන්නේ නම් හා ඒ ක්‍රියා කිහිපය ඒකාබද්ධ කළ විට වෙනත් වරදක් සංයුක්ත වේ නම්, ඒ වැරදිවලට චෝදනා කරනු ලැබූ තැනැත්තාට විරුද්ධව ඒ ක්‍රියා ඒකාබද්ධ කළ විට සංයුක්ත වන වරදට සහ ඒ ක්‍රියා අතුරින් යම් ක්‍රියාවකට හෝ ඊට වැඩි ක්‍රියා ගණනකින් සංයුක්ත වන යම් වරදකට චෝදනා නගා එකම නඩු විභාගයේ දී ඔහු නඩු විභාගයට භාජන කළ හැකි අතර මහාධිකරණය ඉදිරිපිට වූ නඩු විභාගවල දී ඒ චෝදනා එකම අධිචෝදනා පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබිය හැකි ය.

එක් වරදක් සංයුක්ත වන ක්‍රියා ඒකාබද්ධ කළ විට වෙනත් වරදක් සංයුක්ත කිරීම.

(4) මේ වගන්තියේ ඇතුළත් කිසිවක් දණ්ඩ නීති සංග්‍රහයේ 67 වන වගන්තිය කෙරෙහි බල නොපැවැත්විය යුතු ය.

## නිදර්ශන

(1) වන උප වගන්තියට :

(අ) නීත්‍යනුකූල අත්අඩංගුවෙහි සිටින තැනැත්තකු වන "බී" "ඒ" විසින් බේරාගනු ලබයි. "බී" සිටියේ "සී" නමැති කොස්තාපල්වරයාගේ අත් අඩංගුවෙහි ය. "බී" බේරාගැනීමේ දී "ඒ" "සී" ට බරපතල තුවාල සිදු කරයි. දණ්ඩ නීති සංග්‍රහයේ 220 වන සහ 324 වන වගන්ති යටතේ "ඒ" ට විරුද්ධව චෝදනා නගා නඩු විභාග කරනු ලැබිය හැකි ය.

(ආ) හොර අනුකරණ බව තමා දන්නා මුද්‍රා කීපයක් "ඒ" තම සන්තකයෙහි තබා ගෙන සිටී. ඔහු ඒවා තබාගෙන සිටින්නේ දණ්ඩ නීති සංග්‍රහයේ 455 වන වගන්තිය යටතේ දඬුවම්

කරනු ලැබිය හැකි ව්‍යාජ ලේඛන සෑදීමේ වැරදි කීපයක් කිරීමේ කාර්යයට ඒවා ප්‍රයෝජනයට ගැනීමේ චේතනාවෙනි. දණ්ඩ නීති සංග්‍රහයේ 461 වන වගන්තිය යටතේ එක් එක් මුද්‍රාව සන්තකයෙහි තබාගෙන සිටීම සම්බන්ධයෙන් "ඒ" ට විරුද්ධව වෙන් වෙන වශයෙන් චෝදනා නගා ඔහු වරදකරු කරනු ලැබිය හැකි ය.

(ඈ) "බී" ට විරුද්ධව අපරාධ නඩුවක් පැවරීමට සාධාරණ හෝ නීත්‍යනුකූල හේතුවක් නොමැති බව දැන දැන ම ඔහුට හානි කිරීමේ චේතනාවෙන් "ඒ", "බී" ට විරුද්ධව අපරාධ නඩුවක් පවරයි. තව ද චෝදනා කරන්නට සාධාරණ හෝ නීත්‍යනුකූල හේතුවක් නොමැතිව වරදක් කරන ලදැයි "බී" ට අසත්‍ය ලෙස චෝදනා කරයි. දණ්ඩ නීති සංග්‍රහයේ 208 වන වගන්තිය යටතේ "ඒ" ට විරුද්ධව වැරදි දෙකකට වෙන් වෙන් වශයෙන් චෝදනා නගා ඔහු වරදකරු කරනු ලැබිය හැකි ය.

(ඉ) වරදක් සිදු කළේ යයි චෝදනා කරන්නට සාධාරණ හෝ නීත්‍යනුකූල හේතුවක් නොමැති බව දැන දැනම "බී" ට හානි කිරීමේ චේතනාවෙන් "ඒ" "බී" ට විරුද්ධව අසත්‍ය චෝදනාවක් කරයි. "බී" මරණයෙන් දඬුවම් කළ හැකි වරදකට වරදකරු කරවීම සඳහා නඩු විභාගයේ දී "ඒ" "බී" ට විරුද්ධව බොරු සාක්ෂි දෙයි. දණ්ඩ නීති සංග්‍රහයේ 208 වන සහ 191 වන වගන්ති යටතේ "ඒ" ට විරුද්ධව වෙන් වෙන් වශයෙන් චෝදනා නගා ඔහු වරදකරු කරනු ලැබිය හැකි ය.

(ඊ) කැරලි කෝලාහල කිරීම, බරපතල තුවාල සිදු කිරීම හා රජයේ සේවකයකු වශයෙන් කැරලි කෝලාහලය මැඩ පැවැත්වීමෙහි ලා ස්වකීය රාජකාරිය ඉටු කිරීමේ බලවත් උත්සාහයක යෙදී සිටි රජයේ සේවකයකුට පහරදීම යන වැරදි "ඒ" විසින් තවත් හයදෙනකුත් සමග සිදු කරනු ලබයි. දණ්ඩ නීති සංග්‍රහයේ 144 වන, 316 වන සහ 149 වන වගන්ති යටතේ වූ වැරදි සම්බන්ධයෙන් "ඒ" ට විරුද්ධව වෙන් වෙන් වශයෙන් චෝදනා නගා ඔහු වරදකරු කරනු ලැබිය හැකි ය.

(උ) "බී" "සී" හා "ඩී" යන තැනැත්තන් බිය ගැන්වීමේ චේතනාවෙන් ඔවුන්ට ශාරීරික හානි කරන බවට "ඒ" එකම අවස්ථාවේ දී "බී" ට "සී" ට හා "ඩී" ට තර්ජනය කරයි. ඒ වැරදි තුනෙන් එක් එක් වරදට දණ්ඩ නීති සංග්‍රහයේ 486 වන වගන්තිය යටතේ "ඒ" ට විරුද්ධව වෙන් වෙන් වශයෙන් චෝදනා නගා ඔහු වරදකරු කරනු ලැබිය හැකි ය.

(2) වන උපවගන්තියට :

(ළ) "ඒ" අයුතු ලෙස "බී" ට පොල්ලකින් තලයි. දණ්ඩ නීති සංග්‍රහයේ 343 වන හා 314 වන වගන්ති යටතේ වූ වැරදි සම්බන්ධයෙන් "ඒ" ට විරුද්ධව චෝදනා නගා ඔහු වරදකරු කරනු ලැබිය හැකි ය.

(ළු) සොරකම් කරන ලද ධාන්‍ය ගෝනි කිහිපයක් සඟවා තැබීමේ කාර්යය සඳහා ඒවා සොරකම් කරන ලද දේපළ බව දන්නා "ඒ" ට සහ "බී"ට දෙනු ලබයි. ඉක්බිති එම ධාන්‍ය ගෝනි ධාන්‍ය වලක පතුලේ සඟවාලීමට "ඒ" හා "බී" ස්වේච්ඡාවෙන් ම එකිනෙකාට උදව් වෙති. දණ්ඩ නීති සංග්‍රයේ 394 වන හා 396 වන වගන්ති යටතේ වූ වැරදි සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් "ඒ" ට සහ "බී"ට විරුද්ධව චෝදනා නගා ඔවුන් වැරදිකරුවන් කරනු ලැබිය හැකි ය.

(එ) ළමයාගේ මරණය සිදුවීමට ඉඩ ඇති බව දැන දැනම "ඒ" ඇගේ ළමයා බැහැර ලයි. එම බැහැර ලීමේ ප්‍රතිඵලයක් වශයෙන් ළමයා මිය යයි. දණ්ඩ නීති සංග්‍රහයේ 308 වන සහ 297 වන වගන්ති යටතේ වූ වැරදි සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් "ඒ" ට විරුද්ධව චෝදනා නගා ඇය වරදකරු කරනු ලැබිය හැකි ය.

(ඒ) දණ්ඩ නීති සංග්‍රහයේ 163 වන වගන්තිය යටතේ වූ වරදකට රජයේ සේවකයකු වන "බී" වරදකරු කිරීම පිණිස ව්‍යාජ ලේඛනයක් සැබෑ ලේඛනයක් මෙන් "ඒ" වංචනික ලෙස පාවිච්චි කරයි. දණ්ඩ නීති සංග්‍රහයේ (455 වන වගන්තිය සමඟ කියවිය යුතු) එම සංග්‍රහයේ 459 වන වගන්තිය හා 193 වන වගන්තිය යටතේ වූ වැරදි සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් "ඒ" ට විරුද්ධව චෝදනා නගා ඔහු වරදකරු කරනු ලැබිය හැකි ය.

(3) වන උපවගන්තියට :

(ඔ) "ඒ" "බී"ගෙන් කොල්ලකමින් එසේ කිරීමේ දී ඔහුට ස්වේච්ඡාවෙන් ම තුවාල සිදු කරයි. දණ්ඩ නීති සංග්‍රහයේ 314 වන, 380 වන හා 382 වන වගන්ති යටතේ වූ වැරදි සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් "ඒ" ට විරුද්ධව චෝදනා නගා ඔහු වරදකරු කරනු ලැබිය හැකි ය.

පිළිවෙළින් (අ) සිට (ඔ) දක්වා වූ නිදර්ශනවල සඳහන් වෙන් වෙන් චෝදනා එක් නඩු විභාගයක දී විභාග කරනු ලැබිය හැකි අතර ඒවා එකම අධිචෝදනා පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබිය හැකි ය.

කරන ලද වරද කුමක් ද යන වග පිළිබඳව සැකයක් ඇති අවස්ථාවක.

176. යම් තනි ක්‍රියාවක හෝ ක්‍රියාවලියක ස්වභාවය අනුව ඔප්පු කළ හැකි සිදුවීම්වලින් සංයුක්ත වන වරද, වැරදි කිහිපයක් අතුරින් කිනම් වරද දැයි සැක සහිත වේ නම්, චූදිතයාට විරුද්ධව ඒ වැරදි සියල්ල සම්බන්ධයෙන් හෝ ඒ වැරදි අතුරින් එක් වරදක් සම්බන්ධයෙන් හෝ ඊට වැඩි වැරදි ගණනක් සම්බන්ධයෙන් හෝ චෝදනා නැගිය හැකි අතර ඒ වැරදි අතුරින් යම් සංඛ්‍යාවක් පිළබඳව එකම නඩු විභාගයක දී නඩු විභාග කළ හැකි ය. එමෙන් ම මහාධිකරණය ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාගයක දී ඒ චෝදනා එකම අධිචෝදනා පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබිය හැකි ය; නැතහොත් ඔහු විසින් සිදු කරන ලද්දේ කවර වරද දැයි නිශ්චිත වශයෙන් නොදක්වමින් එකී වැරදි අතුරින් එක් වරදක් සිදු කළැයි ඔහුට විරුද්ධව චෝදනා නැගිය හැකි ය.

### නිදර්ශනය

සොරකම, සොර බඩු භාර ගැනීම, සාපරාධ විශ්වාස භාරය කඩ කිරීම හෝ වංචා කිරීම බවට පත්විය හැකි ක්‍රියාවක් කිරීම සම්බන්ධයෙන් "ඒ" චෝදනා ලැබ සිටී. සොරකම, සොර බඩු භාර ගැනීම, සාපරාධ විශ්වාස භාරය කඩ කිරීම හා වංචා කිරීම සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව චෝදනා නැගිය හැකි ය; නැතහොත් පහත දැක්වෙන වැරදි එනම් සොරකම, සොරබඩු භාර ගැනීම, සාපරාධ විශ්වාස භාරය කඩ කිරීම හා වංචා කිරීම යන වැරදි අතුරින් එක් වරදක් සිදු කළැයි ඔහුට විරුද්ධව චෝදනා නැගිය හැකි ය.

එක් වරදක් සම්බන්ධයෙන් චෝදනා නගනු ලැබූ තැනැත්තාට වෙනත් වරදකට වරදකරු කරනු ලැබිය හැකි අවස්ථාවක.

**177.** 176 වන වගන්තියේ සඳහන් අවස්ථාවේ දී චූදිතයාට විරුද්ධව එක් වරදක් සම්බන්ධයෙන් චෝදනා නගනු ලැබ, ඒ වගන්තියේ විධිවිධාන යටතේ ඔහුට විරුද්ධව චෝදනා නැගිය හැකිව තිබුණු වෙනත් වරදක් ඔහු විසින් කර තිබෙන බව සාක්ෂිවලින් පෙනී ගියහොත්, ඒ වරද සම්බන්ධයෙන් ඔහුට චෝදනා නගනු නොලැබුව ද, ඔහු විසින් කරන ලදැයි පෙන්වනු ලැබූ ඒ වරද සම්බන්ධයෙන් ඔහු වරදකරු කරනු ලැබිය හැකි ය.

## නිදර්ශනය

සොරකම් කරන ලදැයි "ඒ" චෝදනා ලැබ සිටී. ඔහු විශ්වාස භාරය කඩකිරීමේ හෝ සොරබඩු භාර ගැනීමේ හෝ වරද සිදු කළ බව පෙනී යයි. එවැනි වරදක් සම්බන්ධයෙන් ඔහු චෝදනා නගා නැතත් (අවස්ථාවෝචිත පරිදි) සාපරාධ විශ්වාස භාරය කඩකිරීම හෝ සොර බඩු භාර ගැනීම හෝ සම්බන්ධයෙන් ඔහු වරදකරු කරනු ලැබිය හැකි ය.

ඔප්පු වූ වරද චෝදිත වරදෙහි ඇතුළත් වූ විට

**178.** (1) යම් තැනැත්තකුට විරුද්ධව කරුණු කිහිපයකින් සමන්විත වරදක් සම්බන්ධයෙන් චෝදනා නගා තිබී ඒ කරුණුවලින් සමහරක් පමණක් ඒකාබද්ධ කළ විට සම්පූර්ණ සුළු වරදක් සංයුක්ත වන අවස්ථාවක ඒ ඒකාබද්ධ කළ කරුණු පමණක් ඔප්පු වූ නමුදු ඉතිරි කරුණු ඔප්පු නොවුයේ නම් ඒ සුළු වරද සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව චෝදනා නගනු නොලැබුව ද ඔහු ඊට වරදකරු කරනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකුට විරුද්ධව වරදක් සම්බන්ධයෙන් චෝදනා නගා ඇති විට ඒ වරද සුළු වරදක් බවට පමුණුවන සිද්ධි ඔප්පු වූ කල්හි, ඒ සුළු වරද සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව චෝදනා නගනු ලැබ නොතිබුණ ද එමෙන් ම එම සුළු වරද සම්බන්ධයෙන් නඩු විභාග කිරීමේ අධිකරණ බලය වෙනත් අධිකරණයකට තනිකරම ම පැවරී තිබුණ ද ඔහු ඊට වරදකරු කරනු ලැබිය හැකි ය.

(3) 135 වන වගන්තියෙන් නියමිත පරිදි පැමිණිල්ලක් ඉදිරිපත් කර නොමැති විටක, ඒ වගන්තියේ සඳහන් යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු කිරීමට මේ වගන්තියෙහි වූ කිසිවකින් බලය ලැබෙතැයි සලකනු නොලැබිය යුතු ය.

## නිදර්ශන

(අ) බඩු ගෙන යන්නකු වශයෙන් තමාට භාර දෙන ලද දේපළ සම්බන්ධයෙන් සාපරාධ විශ්වාස භාරය කඩ කිරීම පිළිබඳව දණ්ඩ නීති සංග්‍රහයේ 390 වන වගන්තිය යටතේ "ඒ" චෝදනා ලැබ සිටී. දේපළ සම්බන්ධයෙන් 389 වන වගන්තිය යටතේ ඔහු සාපරාධ විශ්වාස භාරය කඩ කර ඇති බව පෙනෙන නමුත් එම දේපළ, බඩු ගෙන යන්නකු වශයෙන් ඔහුට භාර දෙනු නොලැබූ බව පෙනී යයි. 389 වගන්තිය යටතේ සාපරාධ විශ්වාස භාරය කඩ කිරීම සම්බන්ධයෙන් ඔහු වරදකරු කරනු ලැබිය හැකි ය.

(ආ) බරපතල තුවාල සිදු කරන ලදැයි දණ්ඩ නීති සංග්‍රහයේ 316 වන වගන්තිය යටතේ "ඒ" චෝදනා ලැබ සිටී. තමා තදබල හදිසි ප්‍රකෝපනයකින් ක්‍රියා කළ බව ඔහු ඔප්පු කරයි. එම සංග්‍රහයේ 326 වන වගන්තිය යටතේ ඔහු වරදකරු කරනු ලැබිය හැකි ය.

වරදක් කිරීමට තැත් කිරීම ගැන වෙනම චෝදනාවක් නොවුව ද එම වරද කිරීමට තැත් කිරීම සම්බන්ධයෙන් වරදකරු කිරීම

**179.** යම් තැනැත්තකුට විරුද්ධව වරදක් සම්බන්ධයෙන් චෝදනා නගා ඇති විට ඔහු ඒ වරද කිරීමට තැත් කළ බවත් එසේ තැත් කිරීමේ දී ඒ වරද කරනු ලැබීමට තුඩු දෙන ක්‍රියාවක් ඔහු විසින් කරන ලද බවත් ඔප්පු වූ කල්හි, ඒ වරද කිරීමට තැත් කිරීමක් සම්බන්ධයෙන් ඔහුට චෝදනා නගනු නොලැබුව ද ඔහු ඊට වරදකරු කරනු ලැබිය හැකි ය.

එසේ වුව ද යම් වරදක් කිරීමට තැත් කිරීම ශ්‍රී ලංකාවේ තත් කාලයෙහි බලපවත්නා යම් ලිඛිත නීතියකින් දඬුවම් කළ හැකි බවට පත් කර ඇත්නම් මිස, ඒ වරද කිරීමට තැත් කිරීම පිළිබඳව යම් තැනැත්තකු වරදකරු කිරීමට මේ වගන්තියෙහි වූ කිසිවකින් බලය ලැබෙතැයි සලකනු නොලැබිය යුතු ය.

වරදක් කිරීමට සම්බන්ධ සියලුම තැනැත්තන්ට විරුද්ධව එකට චෝදනා නැගිය හැකි බව.

**180.** එකම වරද එක්ව කිරීම හෝ එකම ක්‍රියාවලියක දී කරන ලද වෙන් වෙන් වැරදි හෝ පිළිබඳව එක් තැනැත්තකුට වැඩි තැනැත්තන් සංඛ්‍යාවකට විරුද්ධව චෝදනා නගනු ලැබූ කල්හි, නැතහොත් යම් වරදක් කළැයි එක් තැනැත්තකුට විරුද්ධව ද ඒ වරද කිරීමට අනුබල දීම හෝ තැත් කිරීම පිළිබඳව වෙනත් තැනැත්තකුට විරුද්ධව චෝදනා නගනු ලැබූ කල්හි, අධිකරණය විසින් සුදුසු යයි කල්පනා කරනු ලබන පරිදි එක්ව හෝ වෙන් වෙන්ව හෝ ඔවුන්ට විරුද්ධව චෝදනා නගා නඩු විභාග කරනු ලැබිය හැකි ය; තව ද මේ පරිච්ඡේදයේ මුල කොටසෙහි ඇතුළත් විධිවිධාන එවැනි සියලු චෝදනා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

### නිදර්ශන

(අ) "ඒ" හා "බී" එකම මිනීමැරුම සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටිති. මිනීමැරුම සම්බන්ධයෙන් ඒ"ට සහ "බී" ට විරුද්ධව අධිචෝදනා කර එකට නඩු විභාග කරනු ලැබිය හැකි ය.

(ආ) "ඒ" හා "බී" කොල්ලකෑම සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටිති. එම කොල්ලකෑම කරද්දී "බී" ගේ කිසිම සම්බන්ධතාවක් නොමැතිව "ඒ" මිනිසකු මරයි. කොල්ලකෑම සම්බන්ධයෙන් "

"ඒ" හා "බී" යන දෙදෙනාට ම ද මිනීමැරුම සම්බන්ධයෙන් තනිව ම "ඒ" ට ද විරුද්ධව චෝදනා නගනු ලැබූ අධි චෝදනා පත්‍රයක් මත "ඒ" ට හා "බී" ට විරුද්ධව එකට නඩු විභාග කරනු ලැබිය හැකි ය.

(ඇ) "ඒ" හා "බී" යන දෙදෙනාම සොරකමක් සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටිති. එම කටයුත්ත කරන අතරතුර දී තමා විසින් කරන ලද වෙනත් සොරකම් දෙකක් පිළිබඳව "බී" චෝදනා ලැබ සිටී. "ඒ" හා "බී" යන දෙදෙනාට ම එක් සොරකමක් සම්බන්ධයෙන් චෝදනා නගා ඔවුන්ට විරුද්ධව එකට ම නඩු විභාග කරනු ලැබිය හැකි අතර අනෙක් සොරකම් දෙක සම්බන්ධයෙන් "බී" ට විරුද්ධව පමණක් චෝදනා නගා නඩු විභාග කරනු ලැබිය හැකි ය.

(ඈ) "ඒ" හා "බී" කැරලි කෝලාහලයක ප්‍රතිවිරුද්ධ කණ්ඩායම්වල සාමාජිකයන් වශයෙන් චෝදනා ලැබ සිටිති. ඔවුන්ට විරුද්ධව වෙන් වෙන් ව අධිචෝදනා කරනු ලැබ නඩු විභාග කරනු ලැබිය යුතු ය.

(ඉ) "ඒ" හා "බී" එකම නඩු කටයුත්තේ දී බොරු සාක්ෂි දීම සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටිති. ඔවුන්ට විරුද්ධව වෙන් වෙන් ව අධිචෝදනා කරනු ලැබ නඩු විභාග කරනු ලැබිය යුතු ය.

181. (1) එකම තැනැත්තාට විරුද්ධව චෝදනා එකකට වැඩි ගණනක් නගනු ලැබ, ඉන් වැරදි එකකට හෝ ඊට වැඩි ගණනකට වරදකරු කිරීමක් කරනු ලැබූ විට, අපරාධ චෝදනාව මෙහෙයවන නිලධරයා විසින් අධිකරණයේ එකඟත්වය ඇතිව ඉතිරි චෝදනාව හෝ චෝදනා අස්කර ගනු ලැබිය හැකි ය; නැතහොත් අධිකරණය විසින් සිය කැමැත්තෙන් ම ඒ චෝදනාව හෝ චෝදනා පිළිබඳ පරීක්ෂණය හෝ නඩු විභාගය නවත්වනු ලැබිය හැකි ය.

එක් චෝදනාවකට වරදකරු කරනු ලැබූ විට ඉතිරි චෝදනා අස්කර ගත හැකි බව.

(2) වරදකරු කිරීම අවලංගු නොකරනු ලැබුවහොත් ඒ අස්කර ගැනීමෙහි, ඒ චෝදනාවෙන් හෝ චෝදනාවලින් නිදොස් කිරීමේ බලපෑම තිබිය යුතු ය. වරදකරු කිරීම අවලංගු කරනු ලැබුවහොත් එකී අධිකරණය විසින් (වරදකරු කිරීම අවලංගු කරන අධිකරණයේ ආඥාවට යටත් ව) එසේ අස්කර ගනු ලැබූ චෝදනාව හෝ චෝදනා පිළිබඳ පරීක්ෂණය හෝ නඩු විභාගය පවත්වාගෙන යනු ලැබිය හැකි ය.

## XVII වන පරිච්ඡේදය

### ලඝු ආකාරයෙන් නඩු විභාග කිරීමට මහෙස්ත්‍රාත් අධිකරණයකට බලය ඇති අවස්ථාවක නඩු විභාග කිරීම

නඩුවේ විස්තර චූදිතයාට ප්‍රකාශ කිරීම.

**182.** (1) චූදිතයා අධිකරණය ඉදිරියට පමුණුවනු ලබන හෝ ඔහු අධිකරණය ඉදිරියෙහි පෙනී සිටින හෝ අවස්ථාවක චූදිතයාට විරුද්ධව ක්‍රියා කර ගෙන යාමට ප්‍රමාණවත් හේතු තිබේ නම්, මහෙස්ත්‍රාත්වරයා විසින් චූදිතයාට විරුද්ධව චෝදනාවක් සකස් කළ යුතු ය.

(2) මහෙස්ත්‍රාත්වරයා විසින්, ඒ චෝදනාව චූදිතයාට කියවා ඔහු වරදකරු කරනු නොලැබිය යුතු බවට හේතු කිසිවක් දැක්වීමට තිබේදැයි ඔහුගෙන් ඇසිය යුතු ය.

චූදිතයා විසින් වරද පිළිගැනීම.

**183.** (1) තමා වරදකරු කරනු නොලැබිය යුතු බවට හේතු කිසිවක් දැක්වීමට තමාට තිබේදැයි අසනු ලැබූ විට තමා චෝදනා ලැබ සිටින වරද සම්බන්ධයෙන් තමා වරදකරු බවට නිරවශේෂ පිළිගැනීමක් වන ප්‍රකාශයක් චූදිතයා කළහොත්, ඔහුගේ ප්‍රකාශයේ දී ඔහු විසින් උපයෝගී කරගනු ලබන වචනවලින් ම හැකිතාක් ඒ ප්‍රකාශය වාර්තාගත කරනු ලැබිය යුතු ය; තවද වරදකරු කිරීමේ තීන්දු ප්‍රකාශයක් මහෙස්ත්‍රාත්වරයා විසින් වාර්තාගත කොට නීතිය අනුව චූදිතයාට දණ්ඩනය නියම කොට ඒ දණ්ඩන නියමය වාර්තාගත කළ යුතු යඃ

එසේ වුව ද චූදිතයාට විරුද්ධව දණ්ඩන නියමය පැනවීමට පෙර ඕනෑම අවස්ථාවක දී මහෙස්ත්‍රාත්වරයාගේ අවසරය ඇතිව චූදිතයා විසින් තම වරද පිළිගැනීමේ උත්තරවාදය ඉල්ලා අස්කර ගත හැකි ය. එවැනි අවස්ථාවක දී වරදකරු කිරීම සටහන් කරනු නොලැබුවාක් මෙන් නඩු විභාගය පැවැත්වීමට මහෙස්ත්‍රාත්වරයා කටයුතු කළ යුතු ය.

(2) චූදිතයා ප්‍රකාශයක් නොකළ හොත් හෝ නිරවශේෂ වරද පිළිගැනීමක් බවට පත් නොවන ප්‍රකාශයක් කළහොත් නඩු විභාගය

සඳහා සූදානම් දැයි මහෙස්ත්‍රාත්වරයා විසින් ඔහුගෙන් අසනු ලැබිය යුතු අතර-

(අ) තමා නඩු විභාගය සඳහා සූදානම් යයි චූදිතයා පිළිතුරු දුනහොත් මහෙස්ත්‍රාත්වරයා විසින්, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට නඩුව විභාග කර ගෙන යා යුතු ය; එහෙත්

(ආ) සාක්ෂිකරුවන් පැමිණ නොසිටීමේ හේතුව නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ තමා නඩු විභාගය සඳහා සූදානම් නැතැයි චූදිතයා පිළිතුරු දුනහොත් මහෙස්ත්‍රාත්වරයා විසින්, 263 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ඒ අවස්ථාවේ දී නියම කළ යුතු දිනයකට නඩු විභාගය කල් තැබීම හෝ මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට නඩුව නොපමාව ම විභාග කිරීම කරගෙන යාම හෝ කළ යුතු ය.

එහෙත් මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට චෝදක පක්ෂයේ ද විත්ති පක්ෂය වෙනුවෙන් පැමිණ සිටින යම් සාක්ෂිකරුවන්ගේ ද සාක්ෂි ගැනීමෙන් හා ඊට පසු 263 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මහෙස්ත්‍රාත්වරයා විසින් ලිඛිතව වාර්තාගත කළ යුතු හේතු මත ඔහු විසින් නියම කරනු ලබන දිනයකට නඩු විභාගය අඩාළව කල් තැබීමෙන්, මෙහි ඇතුළත් කිසිවකින් මහෙස්ත්‍රාත්වරයා වළක්වනු නොලැබිය යුතු ය.

**184.** (1) චූදිතයාට විරුද්ධව නඩු විභාග කිරීම මහෙස්ත්‍රාත්වරයා විසින් කරගෙන යනු ලබන කල්හි, පිළිවෙලින්, චෝදක පක්ෂය සඳහා හෝ විත්ති පක්ෂය සඳහා හෝ ඉදිරිපත් කරනු ලබන සියලු සාක්ෂි මහෙස්ත්‍රාත්වරයා විසින් ගනු ලැබිය යුතු ය. නඩු විභාගයේ දී කාර්ය පරිපාටිය.

(2) චෝදක පක්ෂය වෙනුවෙන් කැඳවන ලද සියලු සාක්ෂිකරුවන්ගෙන් ද මහෙස්ත්‍රාත්වරයා විසින් කැඳවන ලද හෝ නැවත කැඳවන ලද සියලු සාක්ෂිකරුවන්ගෙන් ද හරස් ප්‍රශ්න ඇසීමට විත්තිකරුට ඉඩ දෙනු ලැබිය යුතු ය.

(3) ස්වකීය නඩු පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීම ආරම්භ කිරීමට පැමිණිලිකරුට ද, චූදිතයාට ද ඔවුන්ගේ උත්තරවාදීන්ට ද හිමිකම් ඇති නමුත් චූදිතයා විසින් හෝ ඔහු වෙනුවෙන් දෙනු ලැබූ සාක්ෂිවලට පිළිතුරු වශයෙන් නිරීක්ෂණ කිසිවක් කිරීමට පැමිණිලිකරුට හෝ ඔහුගේ උත්තරවාදියාට හෝ හිමිකම් නොතිබිය යුතු ය.

තීන්දු ප්‍රකාශය.

**185.** චෝදක පක්ෂයේ සහ විත්ති පක්ෂයේ සාක්ෂි මහෙස්ත්‍රාත්වරයා විසින් සිය මෙහෙයීමෙන් ඉදිරිපත් කිරීමට සලස්වනු ලබන වැඩිදුර සාක්ෂි කිසිවක් වේ නම් ඒ සාක්ෂි ද ගැනීමෙන් පසු චූදිතයා වරදකරු නොවේ යයි මහෙස්ත්‍රාත්වරයා තීරණය කරන හොත් නිදොස් කිරීමේ තීන්දු ප්‍රකාශයක් මහෙස්ත්‍රාත්වරයා විසින් නොපමාව වාර්තාගත කරනු ලැබිය යුතු ය. චූදිතයා වරදකරු යයි මහෙස්ත්‍රාත්වරයා තීරණය කරනහොත් වරදකරු කිරීමේ තීන්දු ප්‍රකාශයක් ඔහු විසින් නොපමාව ම වාර්තාගත කොට නීතිය අනුව චූදිතයාට දණ්ඩනය නියම කොට ඒ දණ්ඩන නියමය වාර්තාගත කරනු ලැබිය යුතු ය.

**186.** මෙහි මින් පෙර ඇතුළත් කිසිවකින් නඩුවේ යම් කලින් අවස්ථාවක දී චූදිතයා නිදහස් කිරීමෙන් මහෙස්ත්‍රාත්වරයා වළක්වනු ලැබෙතැයි සලකනු නො ලැබිය යුතු නමුත් එසේ නිදහස් කිරීමට හේතු මහෙස්ත්‍රාත්වරයා විසින් වාර්තාගත කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද නඩුව සම්බන්ධයෙන් වැඩිදුර නඩු කටයුතු පවත්වාගෙන යාමෙන් චූදිතයා වරදකරු කිරීමේ ප්‍රතිඵලය ඇති නොවන බවට තමා විසින් වාර්තාගත කරනු ලැබිය යුතු හේතු මත මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත්වන්නේ නම්, ඔහු විසින් චූදිතයා නිදොස් කරනු ලැබිය යුතු ය.

නඩු කටයුතු පවත්වාගෙන යන අතරතුර වෙනත් වරදක් එළිදරව් වූ විට ගත යුතු ක්‍රියා මාර්ගය.

**187.** (1) නඩු විභාග කිරීමට මහෙස්ත්‍රාත්වරයා අධිකරණ බලය ඇතුළත වූ චෝදනාවේ සඳහන් වරද නොවන වෙනත් වරදක් චූදිතයා විසින් කර ඇති බව, පිළිගනු ලැබූ හෝ ඔප්පු කරනු ලැබූ සිද්ධි අනුව පෙනී ගියහොත්, මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ චූදිතයා වරදකරු කරනු ලැබිය හැකි නමුත්, එසේ වරදකරු කිරීමට පෙර ඔහු විසින් චෝදනාවක් සකස් කර ඒ චෝදනාව චූදිතයාට කියවා තේරුම් කර දිය යුතු ය; තවද වෙනස් කරනු ලැබූ චෝදනාවලට XVI වන පරිච්ඡේදයේ විධිවිධාන අතුරින් අදාළ වන්නේ යම් විධිවිධාන ද ඒ විධිවිධාන මේ වගන්තිය යටතේ සකස් කරනු ලැබූ චෝදනාවට අදාළ විය යුතු ය.

(2) පිළිගනු ලැබූ හෝ ඔප්පු කරනු ලැබූ සිද්ධි අනුව-

(අ) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ දෙවන උපලේඛනයෙහි දක්වා ඇති වැරදි ලැයිස්තුවට ඇතුළත්වන වරදක් චූදිතයා විසින් කර ඇති බව පෙනී ගියහොත්, මහෙස්ත්‍රාත්වරයා විසින්, චූදිතයා වරදකරු කරනු නො ලැබිය යුතු ය; එහෙත් ඔහු විසින් මේ පරිච්ඡේදය යටතේ වූ නඩු කටයුතු නතර කර XV වන පරිච්ඡේදය යටතේ අලුතින් නඩු කටයුතු ආරම්භ කළ යුතු ය; නැතහොත්

(ආ) එම උපලේඛනයේ සඳහන් වැරදි ලැයිස්තුවට ඇතුළත් නොවන නමුත් මහෙස්ත්‍රාත්වරයා විසින් ලඝු ආකාරයෙන් නඩු විභාග කළ නොහැකි වරදක් චූදිතයා විසින් කර ඇති බව පෙනී ගියහොත්, මහෙස්ත්‍රාත්වරයා විසින් චූදිතයා වරදකරු කරනු නොලැබිය යුතු ය; එහෙත් ඔහු විසින් නඩු කටයුතු නතර කර නඩුව නීතිපතිවරයා වෙත වාර්තා කොට ඊට පසු ඔහුගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

පැමිණිලිකරු පැමිණ නොමැති වූ විට චූදිතයා නිදොස් කළ හැකි බව.

**188.** (1) 136 (1) (අ) වන වගන්තිය යටතේ වූ පැමිණිල්ලක් මත සිතාසි නිකුත් කරනු ලැබ, චූදිතයාට පෙනී සිටින ලෙස නියම කර ඇති දිනයේ දී හෝ වේලාවේ දී, නැතහොත් නඩු විභාගය යම් අවස්ථාවකට අඩාළව කල් තබනු ලැබේ ද ඒ අවස්ථාවේ දී පැමිණිලිකරු පෙනී නො සිටියහොත්, මෙහි මින් පෙර කුමක් සඳහන්ව ඇත ද, යම් කිසි හේතුවක් නිසා වෙනත් යම් දිනයකට හෝ වේලාවකට නඩු විභාගය අඩාළව කල් තැබීම සුදුසු යයි මහෙස්ත්‍රාත්වරයා කල්පනා කරන්නේ නම් මිස, මහෙස්ත්‍රාත්වරයා විසින් චූදිතයා නිදොස් කළ යුතු අතර, ඊට අතිරේකව, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි පැමිණිලිකරු විසින් ආඥාවක් කළ හැකි ය:

එසේ වුව ද පැමිණිලිකරු සාධාරණ කාලයක් ඇතුළත පෙනී සිට තමාගේ නොපැමිණීම අසනීපයක්, හදිසි අනතුරක් හෝ තමාට මැඩ පැවැත්විය නොහැකි වෙනත් යම් හේතුවක් හෝ නිසා වූයේ යයි මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් කරතහොත්, එවිට මහෙස්ත්‍රාත්වරයා විසින් මේ උපවගන්තිය යටතේ කරන ලද යම් ආඥාවක් අවලංගු කළ යුතු ය.

(2) අවස්ථාවෝචිත පරිදි, 136 (1) (ආ) හෝ (ඇ) වන වගන්තිය යටතේ වූ පැමිණිල්ලක් මත සිතාසි නිකුත් කරනු ලැබ, නඩු විභාගය සඳහා නියම කරන ලද දිනයේ දී චෝදක පක්ෂය සුදානම්ව නොසිටිය හොත්, යම් කිසි හේතුවක් නිසා වෙනත් දිනයකට හෝ වේලාවකට නඩු විභාගය අඩාළව කල් තැබීම සුදුසු යයි අධිකරණය කල්පනා කරන්නේ නම් මිස, අධිකරණය විසින් චූදිතයා නිදහස් කළ හැකි ය.

[1989 අංක 15 § 2] (3) (2) වන උපවගන්තියෙහි සඳහන් නිදහස් කිරීමේ ආඥාවක්,-

(අ) එය ඉවතලනු නොලැබ චූදිතයාට විරුද්ධව නඩුව, ඒ ආඥාවේ දිනයෙහි සිට එක් අවුරුද්දක කාල සීමාවක් ඇතුළත නැවත ආරම්භ කරනු නො ලබන්නා; වූ හෝ

(ආ) නඩුව යථා පරිදි නැවත ආරම්භ කර දෙවන වරට නිදහස් කිරීමේ ආඥාවක් කරනු ලැබ ඇත්තා වූ; හෝ

අවස්ථා දෙකින් කවර අවස්ථාවක වුවද ඒ නිදහස් කිරීමේ ආඥාව, නිදොස් කිරීමක් ලෙස ක්‍රියාත්මක විය යුතු ය:

එසේ වුව ද, නිදහස් කිරීමේ ආඥාවක් ඉවත ලන ලෙස කරන ලද ඉල්ලීමක් මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ හෝ වෙනත් යම් අධිකරණයක් ඉදිරියේ ප්‍රතිශෝධනය සඳහා විභාග වෙමින් පවතින අවස්ථාවක, නිදහස් කිරීමේ ආඥාව ඉවත ලන ලෙස වූ ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමේ ආඥාවක් මහෙස්ත්‍රාත්වරයා විසින් හෝ ඒ අධිකරණය විසින් හෝ කරනු ලබන තෙක්, ඒ නිදහස් කිරීමේ ආඥාව එක් අවුරුද්දක කාලසීමාව අවසානයේ දී නිදොස් කිරීමක් ලෙස ක්‍රියාත්මක නොවිය යුතු ය.

පැමිණිලිකරු විසින් චෝදනාව අස්කර ගැනීම.

**189.** මේ පරිච්ඡේදය යටතේ වූ යම් නඩුවක නඩු තීන්දුව දීමට පෙර යම් අවස්ථාවක දී, නඩුව අස්කර ගැනීමට තමාට අවසර දීම සඳහා ප්‍රමාණවත් හේතු ඇති බවට පැමිණිලිකරුවකු විසින් මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් කරතහොත්, නඩුව අස්කර ගැනීමට මහෙස්ත්‍රාත්වරයා විසින් චූදිතයා නිදොස් කළ යුතු ය. එහෙත් එසේ කිරීම සඳහා තමාට ඇති හේතු මහෙස්ත්‍රාත්වරයා විසින් වාර්තාගත කළ යුතු ය:

එසේ වුව ද 266 වන වගන්තියේ විධිවිධාන යටතේ වැරදි සමථයට පත් කිරීමට ඉඩදීමට මහෙස්ත්‍රාත්වරයකුට ඇති බලතල මෙහි ඇතුළත් කිසිවකින් පුළුල් වෙතැයි සලකනු නොලැබිය යුතු ය.

නීතිපතිවරයාගේ අනුමතය ඇතිව මහෙස්ත්‍රාත්වරයා විසින් නිදහස් කළ හැකි බව.

**190.** 136 (1) වන වගන්තියෙහි (අ) වන, (ඇ) වන සහ (ඈ) වන ඡේද යටතේ විභාග කරනු ලබන යම් නඩුවක දී, මහෙස්ත්‍රාත්වරයා විසින් වාර්තාගත කළ යුතු හේතු මත, නීතිපතිවරයාගේ පූර්ව අනුමතය ඇතිව, නිදොස් කිරීමේ හෝ වරදකරු කිරීමේ යම් නඩු තීන්දුවක් ප්‍රකාශ නොකොට ඕනෑම අවස්ථාවක දී නඩු කටයුතු නතර කළ හැකි අතර, ඉනික්බිතිව මහෙස්ත්‍රාත්වරයා විසින් චූදිතයා නිදහස් කළ හැකි ය.

මේ පරිච්ඡේදය යටතේ වූ අපරාධ චෝදනා කවරකු විසින් මෙහෙයවනු ලැබිය හැකි ද යන වග.

**191.** (1) නීතිපතිවරයාට, නියෝජ්‍ය නීතිපතිවරයාට, රජයේ නීතිඥවරයකුට හෝ නීතිපතිවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙනු ලැබූ උත්තරවාදියකුට හෝ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව මේ පරිච්ඡේදය යටතේ විභාග කරනු ලබන යම් නඩුවක දී පෙනී සිට අපරාධ චෝදනාව මෙහෙයවීමට හිමිකම තිබිය යුතු ය. එහෙත් නීතිපතිවරයා, නියෝජ්‍ය නීතිපතිවරයා, රජයේ නීතිඥවරයකු හෝ පෙර කී පරිදි වූ උත්තරවාදියකු නොමැති විට, පැමිණිලිකරු විසින් හෝ ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක යම් නිලධරයකු විසින් හෝ යම් මහා නගර සභාවක, නගර සභාවක හෝ සුළු නගර සභාවක යම් නිලධරයකු විසින්, එම පැමිණිලිකරු හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුව හෝ මහා නගර සභාව හෝ නගර සභාව හෝ සුළු නගර සභාව සම්බන්ධතාවක් දක්වන යම් නඩුවක අපරාධ චෝදනාව මෙහෙයවීම පිණිස පෞද්ගලිකව හෝ උත්තරවාදියකු මගින් හෝ පෙනී සිටිය හැකි ය.

එසේ වුව ද, නීතිපතිවරයා, නියෝජ්‍ය නීතිපතිවරයා, රජයේ නීතිඥවරයකු හෝ නීතිපතිවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙනු ලැබූ උත්තරවාදියකු පැමිණ නොමැති විටක, මහෙස්ත්‍රාත්වරයා විසින්, පැමිණිලිකරු වෙනුවෙන් නීතිඥවරයකු පෙනී නොසිටින අවස්ථාවක, චූදිතයා විසින් වරද සිදු කරන ලදැයි කියනු ලබන්නේ යම් තැනැත්තකුට විරුද්ධව ද

නැතහොත් යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා වෙනුවෙන් පෙනී සිට අපරාධ චෝදනාව මෙහෙයවීම පිණිස යම් නීතිඥවරයකුට අවසර දෙනු ලැබිය හැකි ය.

(2) පැමිණිල්ල 136 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් නම්, රජයේ නිලධරයකුගේ හෝ සේවා නියුක්තයකුගේ නිල කටයුතු ඉටු කිරීම සම්බන්ධයෙන් වූ හෝ ඉටු කිරීමට අදාළ වූ කාරණයක් සම්බන්ධයෙන් ඒ නිලධරයාට හෝ සේවා නියුක්තයාට විරුද්ධව ඒ පැමිණිල්ල ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක දී හැර, නීතිපතිවරයාට, නියෝජ්‍ය නීතිපතිවරයාට, රජයේ නීතිඥවරයකුට හෝ නීතිපතිවරයා විසින් විශේෂයෙන් හෝ සාමාන්‍යයෙන් බලය දෙනු ලැබූ උත්තරවාදියකුට හෝ පැමිණිලිකරුගේ කැමැත්ත නොමැතිව ඔහු වෙනුවෙන් පෙනී සිටීමේ අයිතිවාසිකමක් නොතිබිය යුතු ය.

චූදිතයා පැමිණ නොසිටිය දී නඩු විභාගය පවත්වාගෙන යා හැකි බව.

**192.** (1) (අ) චූදිතයා පැන ගොස් සැඟවී සිටින හෝ දිවයිනෙන් බැහැරව සිටින අවස්ථාවක; හෝ

(ආ) අසනීපයක් නිසා අධිකරණයට පැමිණ සිටීමට හෝ අධිකරණයෙහි රැඳී සිටීමට චූදිතයාට නොහැකි වන්නා වූ සහ ඔහු නොමැතිව නඩු විභාගය ආරම්භ කිරීමට හෝ පවත්වාගෙන යාමට ඔහු කැමැත්ත දී හෝ එම නඩු විභාගය ඔහුට හානියක් නොවන අන්දමින් ආරම්භ කොට පවත්වාගෙන යාම හෝ දිගට ම පවත්වාගෙන යාම කළ හැකි වන්නා වූ ද අවස්ථාවක; හෝ

(ඇ) අධිකරණයෙහි ඔහුගේ හැසිරීම හේතු කොට ගෙන නඩු විභාගය ඉදිරියට පවත්වාගෙන යාමට චූදිතයා බාධා කරන හෝ අවහිර කරන අවස්ථාවක මහේස්ත්‍රාත්වරයා මේ සිද්ධි සම්බන්ධයෙන් සෑහීමට පත් වන්නේ නම් ඔහු විසින් චූදිතයා පැමිණ නොසිටිය දී නඩු විභාගය ආරම්භ කොට පවත්වා ගෙන යනු ලැබිය හැකි ය.

(2) චූදිත තැනැත්තකු පිළිබඳව (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ නඩු විභාගය පවත්වා ගෙන යනු ලබන අතරතුර හෝ නඩු විභාගය අවසන් වී සාධාරණ කාලයක් ඇතුළත චූදිත තැනැත්තා අධිකරණයෙහි පෙනී සිට සම්පූර්ණ නඩු විභාගයට හෝ ඉන් කොටසකට තමා පැමිණ නොසිටීම සද්භාවයෙන් සිදුවූවක් බවට අධිකරණය සෑහීමට පත් කරතහොත්-

(අ) නඩු විභාගය අවසන් කර නොමැති විට, අධිකරණය ඉදිරියෙහි චූදිතයා පෙනී සිටි අවස්ථාව දක්වා ඔහුට විරුද්ධව ඉදිරිපත් කරන ලද සාක්ෂි ඔහුට කියාදෙනු ලැබිය යුතු අතර, ඒ සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ඔහුට ලබා දිය යුතු ය; තව ද

(ආ) නඩු විභාගය අවසන් කර ඇති විට, වරදකරු කිරීමක් හා දණ්ඩන නියමයක් කර ඇත්නම් අධිකරණය විසින් ඒවා අවලංගු කොට චූදිතයා පිළිබඳ නඩු විභාගය අලුතෙන් පැවැත්විය යුතු යයි ආඥා කළ යුතු ය.

(3) නඩු විභාගයේ දී චූදිත තැනැත්තා පැමිණ නොසිටිය දී නීතිඥවරයකු විසින් ඒ චූදිත තැනැත්තාගේ විත්තිවාචකය ඉදිරිපත් කරන ලද නම්, (2) වන උපවගන්තියෙහි විධිවිධාන අදාළ නොවිය යුතු ය.

## XVIII වන පරිච්ඡේදය

## මහාධිකරණ විසින් නඩු විභාග කිරීම

### අ-සාමාන්‍ය

**193.** මහාධිකරණය ඉදිරිපිට වූ සෑම නඩු විභාගයක දී ම නීතිපතිවරයා විසින් හෝ නියෝජ්‍ය නීතිපතිවරයා විසින් හෝ රජයේ නීතිඥවරයකු විසින් හෝ අපරාධ චෝදනාව මෙහෙයවීම පිණිස නීතිපතිවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙනු ලැබූ යම් උත්තරවාදියකු විසින් හෝ අපරාධ චෝදනාව මෙහෙයවනු ලැබිය යුතු ය.

මහාධිකරණය ඉදිරිපිට වූ නඩු විභාගය කවරකු විසින් මෙහෙයවනු ලැබිය යුතු ද යන බව.

**194.** (1) මේ සංග්‍රහය යටතේ මහාධිකරණය ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයක දී ජූරි සභාවේ තීරණය ඉදිරිපත් කිරීමට පෙර කවර හෝ අවස්ථාවක, සුදුසු යයි නීතිපතිවරයා

නීතිපතිවරයා විසින් අපරාධ චෝදනාව අස්කර ගත හැකි බව.

කල්පනා කරනහොත් ඔහු විසින් අධිචෝදනා පත්‍රය මත නැතහොත් එහි ලා සඳහන් යම් චෝදනාවක් මත චූදිතයාට විරුද්ධව තව දුරටත් තමා විසින් අපරාධ චෝදනාව මෙහෙයවනු නොලබන බවට අධිකරණය දැනුම් දිය හැකි අතර එසේ හොලැබූ විට, අවස්ථාවෝචිත පරිදි, ඒ අධිචෝදනා පත්‍රය මත හෝ චෝදනාව මත හෝ චූදිතයාට විරුද්ධව ඇති සියලු නඩු කටයුතු නවත්වා ඒ පිළිබඳව ද එයින් ද චූදිතයා නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ කෙරෙන දැනුම් දීම වාචිකව හෝ නීතිපතිවරයාගේ අත්සන යටතේ වූ ලියවිල්ලක් මගින් හෝ කළ හැකි ය.

(3) ජූරි සභාවේ තීරණය ඉදිරිපත් කිරීමට පෙර නඩු විභාගයේ කවර හෝ අවස්ථාවක දී, චෝදනාව මෙහෙයවන නීතිඥවරයා විසින් මූලාසනාරූඪ විනිශ්චයකාරවරයාගේ කැමැත්ත ඇතිව, අධිචෝදනා පත්‍රය හෝ එහි ලා සඳහන් යම් චෝදනාවක් හෝ අස්කර ගත හැකි අතර, එසේ අස් කර ගනු ලැබූ විට අවස්ථාවෝචිත පරිදි, ඒ අධිචෝදනා පත්‍රය මත හෝ ඒ චෝදනාව මත හෝ චූදිතයාට විරුද්ධව ඇති සියලු නඩු කටයුතු නවත්වා ඒ පිළිබඳව ද එයින් ද චූදිතයා නිදහස කරනු ලැබිය යුතු ය.

අධිචෝදනා පත්‍රය ලැබුණු විට විනිශ්චයකාරවරයාගේ කාර්යය.

**195.** අධිචෝදනා පත්‍රය මහාධිකරණය වෙත ලැබුණු විට යම් මහාධිකරණ සැසිවාරයක දී නඩු විභාගය පැවැත්විය යුතු යයි අභියාචනාධිකරණයේ සභාපතිවරයා විසින් විධාන කර ඇත් ද ඒ සැසිවාරය මූලාසනාරූඪ මහාධිකරණ විනිශ්චයකාරවරයා විසින් -

(අ) චූදිතයා තමා ඉදිරිපිට පෙනී සිටීමට හෝ තමා ඉදිරිපිටට ගෙන එනු ලැබීමට හෝ සැලැස්විය යුතු ය;

(ආ) ඒ අධිචෝදනා පත්‍රය මත නඩු විභාගයට භාජන කරනු ලබන එක් එක් චූදිතයා වෙත අධිචෝදනා පත්‍රයේ පිටපතක් එහි ඇමුණුම් සමග භාර දීමට සැලැස්විය යුතු ය;

(ඇ) නඩු විභාගය පවත්වන දිනය චූදිතයාට දැන්විය යුතු ය;

(ඈ) 403 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව චූදිතයාගේ නඩු විභාගය සඳහා ඔහු අධිකරණයට ඉදිරිපිට පෙනී සිටින බවට බැඳුම්කරයක් අත්සන් කර දෙන ලෙස චූදිතයාට විධාන කළ යුතු ය; නැතහොත් යම් බන්ධනාගාරයක අධිකාරීවරයාගේ නමට වූ බලපත්‍රයකින් නඩු විභාගය පැවැත්වෙන තුරු චූදිතයා රඳවා තැබීමට බලය දිය යුතු ය;

(ඉ) චූදිතයාගේ ඇඟිලි සටහන් ලබා ගැනීමට සලස්වා ඒ ඇඟිලි සටහන් පරීක්ෂා කරනු ලැබීමට හා අපරාධ චෝදනාව මෙහෙයවන රජයේ නීතිඥවරයා වෙත ඒ ගැන වාර්තා කරනු ලැබීම සඳහා ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු ය;

(ඉඉ)* අධිචෝදනා පත්‍රය ජූරි සභාවක් මගින් විභාග කරනු ලැබිය හැකි වරදකට අදාළ වේ නම්, නඩු විභාගය ජූරි සභාවක් මගින් පැවැත්විය යුතු යයි තමා තීරණය කරන්නේ ද නැද්ද යන වග චූදිතයාගෙන් විමසිය යුතු ය; [1988 අංක 11 § 4]

(ඊ) නඩු විභාගය ජූරි සභාවක් මගින් පැවැත්විය යුතු අවස්ථාවක, ජූරි සභිකයන්ගේ ඒ ඒ මූල මණ්ඩලවලින් තමාගේ නඩු විභාගය සඳහා ජූරි සභාව පත් කළ යුත්තේ කිනම් මූල මණ්ඩලයෙන් දැයි තෝරා ගන්නා ලෙස චූදිතයාට විධාන කළ යුතු අතර, එසේ කරනු ලබන තෝරා ගැනීමෙන් ඔහු බැඳෙන බවත් ඒ තෝරා ගැනීම අනුව ඔහු නඩු විභාගයට භාජන කරනු ලැබිය හැකි බවත් දැන්විය යුතු ය.

(උ) තමාගේ විත්තිවාචකය සඳහා නීතිඥවරයකුගේ සේවය අවශ්‍ය දැයි අධිකරණය විසින් අසනු ලැබීමේ දී එසේ සේවය ලබා දෙන මෙන් චූදිතයා විසින් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක නීතිඥවරයකුගේ සේවය එසේ ලබා දිය යුතු ය.

## ආ - මහාධිකරණ විනිශ්චයකාරවරයකු විසින් ජූරි සභාවක් නොමැතිව නඩු විභාග කිරීම

### නඩු විභාගය ආරම්භ කිරීම

චූදිතයා විනිශ්චයට ඉදිරිපත් කිරීම

**196.** නඩු විභාගය ආරම්භ කිරීමට අධිකරණය සූදානම්ව සිටින විට, චූදිතයා අධිකරණය ඉදිරියෙහි පෙනී සිටිය යුතු ය. නැතහොත් අධිකරණය ඉදිරියට ගෙන එනු ලැබිය යුතු ය. තව ද ඔහුට අධිචෝදනා පත්‍රය කියවා තේරුම් කර දිය යුතු අතර, චෝදනා නගා ඇති වරදට තමා වරදකරු ද වරදකරු නොවේ ද යන වග ඔහුගෙන් විමසිය යුතු ය.

වරදකරු බවට උත්තරවාද දීම සහ දණ්ඩන නියම කිරීම [2005 අංක 14 § 7]

**197.** (1) (අ) චූදිතයාට අධිචෝදනා කරනු ලැබ ඇත්තේ යම් වරදක් සඳහා ද එම වරදට තමා වරදකරු යයි උත්තරවාද දෙන්නේ නම් ; හෝ

(ආ) එම අධිචෝදනා පත්‍රය මත ඔහු වරදකරු කරනු ලැබිය හැකි අඩු වරදක් සඳහා චූදිතයා තමා වරදකරු යයි උත්තරවාද දෙන්නේ නම් සහ එම උත්තරවාදය පිළිගැනීමට අධිකරණයට සහ නීතිපතිවරයා කැමති වන්නේ නම්

සහ ඔහුගේ උත්තරවාදයේ ප්‍රතිඵලය ඔහු නිවැරදිව අවබෝධ කරගෙන ඇති බව විනිශ්චයකාරවරයා සෑහීමට පත්වන ආකාරයෙන් පෙනී යන්නේ නම් ඒ උත්තරවාදය අධිචෝදනා පත්‍රයෙහි වාර්තාගත කළ යුතු අතර, ඒ අනුව චූදිතයා වරදකරු කරනු ලැබිය හැකි ය;

එසේ වුව ද වරදකරු බවට උත්තරවාද දෙන ලද අධිචෝදනාව මිනීමැරුමක් සම්බන්ධයෙන් වූ වරදක් වන විට, ඒ උත්තරවාදය පිළිගැනීම විනිශ්චයකාරවරයා විසින් ප්‍රතික්ෂේප කළ හැකි අතර, තමා වරදකරු නොවේ යයි චූදිතයා විසින් උත්තරවාද දෙන ලද්දාක් මෙන් ඒ නඩු විභාගය පවත්වාගෙන යාමට සැලැස්විය යුතු ය.

(2) විනිශ්චයකාරවරයා විසින් චූදිතයාට දණ්ඩන නියමයක් පැනවීමේ දී චූදිතයා එසේ උත්තරවාද දී ඇති බව සැලකිල්ලට ගත යුතු ය.

**198.** චූදිතයා උත්තරවාදය නොදෙන්නේ නම් හෝ වරදකරු නොවේ යයි ඔහු උත්තරවාද දෙන්නේ නම්, ඔහු නඩු විභාගයට භාජන කරනු ලැබිය යුතු ය.

උත්තරවාද දීම ප්‍රතික්ෂේප කිරීම හෝ වරදකරු නොවේ යයි උත්තරවාද දීම.

**199.** (1) චෝදනාව මෙහෙයවන නීතිඥවරයා විසින් ස්වකීය නඩුව අධිකරණය වෙත කියා සිටීමෙන් නඩු විභාගය ආරම්භ කරනු ලැබිය යුතු ය.

චෝදනාව මෙහෙයවන නීතිඥවරයා විසින් ස්වකීය නඩුව ආරම්භ කර සාක්ෂිකරුවන් කැඳවිය යුතු බව.

(2) ඉන් ඉක්බිතිව චෝදක පක්ෂයේ සාක්ෂිකරුවන් විභාග කරනු ලැබිය යුතු ය.

(3) මහෙස්ත්‍රාත් අධිකරණයෙහි පරීක්ෂණයක් පවත්වනු ලැබුවේ නම්, ඒ පරීක්ෂණය පැවැත්වෙන අතර වාර්තාගත කරනු ලැබූ චූදිතයාගේ සියලු ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර චෝදක පක්ෂය වෙනුවෙන් නඩුව අවසන් කිරීමට පෙර ඒ ප්‍රකාශ සාක්ෂි වශයෙන් ඉදිරිපත් කොට කියවිය යුතු ය.

(4) චෝදක පක්ෂය විසින් කැඳවනු නොලැබූ යම් සාක්ෂිකරුවන් කැඳවීම යුක්ති ධර්මය උදෙසා අවශ්‍ය වන්නේ නම් අධිකරණය විසින් කැඳවීම නීත්‍යනුකූල විය යුතු ය. එහෙත් එම සාක්ෂිකරුවන්, චෝදනාව මෙහෙයවන නීතිඥවරයා සහ චූදිතයා විසින් හරස් ප්‍රශ්න ඇසීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) චෝදක පක්ෂය වෙනුවෙන් කැඳවනු ලැබූ සියලු සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට චූදිතයාට අවසර දිය යුතු ය.

**200.** (1) චෝදක පක්ෂය වෙනුවෙන් නඩුව ඉදිරිපත් කිරීම අවසන් කරනු ලැබූ විට, චෝදක පක්ෂය විසින් ඉදිරිපත් කරනු ලැබූ සාක්ෂි විනිශ්චයකාරවරයා මුළුමනින් ම අවිශ්වාස කරන්නේ නම් හෝ අධිචෝදනා පත්‍රයෙහි චූදිතයාට විරුද්ධව යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා නගා ඇත්තේ ද ඒ වරද හෝ ඒ අධිචෝදනා පත්‍රය මත චූදිතයා වරදකරු කරනු ලැබිය හැකි වෙනත් යම් වරදක් හෝ සිදු කර ඇති බව සනාථ කිරීමට ඒ සාක්ෂි අපොහොසත් වන බව විනිශ්චයකාරවරයාගේ මතය වන්නේ නම් විනිශ්චයකාරවරයා විසින් නිදොස් කිරීමේ තීන්දු ප්‍රකාශයක් වාර්තාගත කළ යුතු ය. එසේ වුව ද නඩු විභාගය

විත්තිවාචකය ඉදිරිපත් කරන ලෙස නියම නොකර අධිකරණය විසින් නිදොස් කළ හැකි ය. නැතහොත් විත්තිවාචකය ඉදිරිපත් කරන ලෙස නියම කළ හැකි ය.

පවත්වාගෙන යාමට හේතු ඇතැයි විනිශ්චයකාරවරයා සලකන්නේ නම් ස්වකීය විත්තිවාචකය ඉදිරිපත් කරන ලෙස විනිශ්චයකාරවරයා විසින් චූදිතයාට නියම කළ යුතු ය.

(2) සාක්ෂි ඉදිරිපත් කිරීමට තමා අදහස් නොකරන බව චූදිතයා හෝ ඔහුගේ උත්තරවාදියා ප්‍රකාශ කරන්නේ නම්, චූදිතයාට විරුද්ධව ඇති සාක්ෂි සම්පිණ්ඩනය කිරීමේ කාර්යය සඳහා තමාගේ නඩුව සනාථ කරනු පිණිස චෝදනාව මෙහෙයවන නීතිඥවරයා විසින් දෙවන වරටත් අධිකරණය අමතනු ලැබිය හැකි ය.

චූදිතයා විසින් ඔහුගේ විත්තිවාචකය ඉදිරිපත් කළ හැකි බව.

**201.** (1) සාක්ෂි ඉදිරිපත් කිරීමට තමා අදහස් කරන බව චූදිතයා හෝ ඔහුගේ උත්තරවාදියා ප්‍රකාශ කරන්නේ නම් චූදිතයා හෝ ඔහුගේ උත්තරවාදියා විසින් ස්වකීය විත්තිවාචකය ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර ඔහුගේ සාක්ෂිකරුවන්ටත් (ඇත්නම්) ඔවුන් විභාග කරනු ලැබිය හැකි ය. ඉන් පසුව චූදිත තැනැත්තා හෝ ඔහුගේ උත්තරවාදියා හෝ විසින් ස්වකීය නඩුව සම්පිණ්ඩනය කොට දැක්විය හැකි ය.

(2) දිවුරුම් පිට හෝ සහතික ප්‍රකාශ මත සාක්ෂි දීමට විත්තිය විසින් කැඳවනු ලැබූ සියලුම සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට චෝදනාව මෙහෙයවන නීතිඥවරයාට හිමිකම ඇත්තේ ය.

සාක්ෂි බිඳහෙළීම පිණිස සාක්ෂිකරුවන් කැඳවීමට චෝදනාව මෙහෙයවන නීතිඥවරයාට හිමිකම් ඇත්තේ කිනම් විටක ද යන වග.

**202.** චූදිතයා වෙනුවෙන් යම් සාක්ෂියක් ඉදිරිපත් කරනු ලබන්නේ නම්, චෝදනාව මෙහෙයවන නීතිඥවරයා විසින් විනිශ්චයකාරවරයාගේ අවසරය ඇතිව සාක්ෂි බිඳ හෙළීම පිණිස සාක්ෂිකරුවන් කැඳවනු ලැබිය හැකි ය.

විනිශ්චයකාරවරයා විසින් නඩු තීන්දුව දිය හැකි බව.

**203.** චෝදක පක්ෂය හා විත්ති පක්ෂය වෙනුවෙන් කරුණු දැක්වීම අවසන් කරනු ලැබූ විට, විනිශ්චයකාරවරයා විසින් වහාම හෝ නඩු විභාගය අවසන් කොට දින දහයක් ඇතුළත, නිදොස් කිරීමේ හෝ වරදකරු කිරීමේ තීන්දු ප්‍රකාශයක් ඒ සඳහා තම හේතු සඳහන් කරමින් වාර්තාගත කරනු ලැබිය යුතු ය. තව ද තීන්දු ප්‍රකාශය වරදකරු කිරීමේ තීන්දු ප්‍රකාශයක් නම් නීතිය අනුව චූදිතයා වෙත දණ්ඩන නියමයක් කළ යුතු ය.

## ඇ - ජූරි සභාවක් මගින් නඩු විභාග කිරීම

### නඩු විභාග කිරීම ආරම්භ කිරීම

චූදිතයා විනිශ්චයාට ඉදිරිපත් කිරීම.

**204.** නඩු විභාගය ආරම්භ කිරීමට අධිකරණය සූදානම් විට, චූදිතයා අධිකරණය ඉදිරියෙහි පෙනී සිටිය යුතු ය. නැතහොත් අධිකරණය ඉදිරියට ගෙන එනු ලැබිය යුතු ය. තව ද ඔහුට අධිචෝදනා පත්‍රය කියවා තේරුම් කර දිය යුතු අතර, චෝදනා නගා ඇති වරදට තමා වරදකරු ද වරදකරු නොවේ ද යන වග ඔහුගෙන් විමසිය යුතු ය.

වරදකරු බවට උත්තරවාද දීම සහ දණ්ඩන නියම කිරීම සම්බන්ධයෙන් 197 වන වගන්තිය අදාළ වන බව.
[2005 අංක 14 § 8]

**205.** චූදිතයාට අධිචෝදනා කරනු ලැබූවේ යම් වරදක් සඳහා ද එම වරද සඳහා හෝ අධිචෝදනාව මත ඔහු වරදකරු කරනු ලැබිය හැකි අඩු වරදක් සඳහා චූදිතයා තමා වරදකරු යයි උත්තරවාද දෙන්නේ නම් 197 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

උත්තරවාද දීම ප්‍රතික්ෂෙප කිරීම.

**206.** චූදිතයා උත්තරවාදයක් නොදෙන්නේ නම්, හෝ වරදකරු නොවේ යයි ඔහු උත්තරවාද දෙන්නේ නම් හෝ 205 වන වගන්තියේ අතුරු වගන්තියෙහි දක්වා ඇති අවස්ථානුගත කරුණු අනුව උත්තරවාදය පිළිගැනීම විනිශ්චයකාරවරයා ප්‍රතික්ෂේප කරන්නේ නම් මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි නඩු විභාග කිරීම සඳහා ජූරි සභිකයන් තෝරා ගනු ලැබිය යුතු ය.

චූදිතයා තමා වරදකරු නොවේ යයි උත්තරවාද දෙන හෝ අඩු වරදකට වරදකරු යයි උත්තරවාද දීමට කැමති වන හෝ විට.

**207.** චූදිතයා තමා වරදකරු නොවේ යයි උත්තරවාද දෙන්නේ වුව ද ඒ අධිචෝදනා පත්‍රය මත තමා වැරදිකරු කරනු ලැබිය හැකිව තිබූ අඩු වරදකට වරදකරු යයි උත්තරවාද දීමට තමා කැමති බව ප්‍රකාශ කරතහොත් හා චෝදනාව මෙහෙයවන නීතිඥවරයා ඒ උත්තරවාදය පිළිගැනීමට කැමති වුවහොත් ඒ උත්තරවාදය වාර්තාගත කිරීමෙන් යුක්තිය ඉෂ්ටවනු ඇතැයි විනිශ්චයකාරවරයා කල්පනා කරන්නේ නම් ඔහු විසින් ඒ උත්තරවාදය වාර්තාගත කරන ලෙස ආඥා කොට, ඒ සම්බන්ධයෙන්, ඒ අනුව වූ නඩු තීන්දුවක් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය. එවිට අධිචෝදනා පත්‍රයේ දැක්වෙන වරදින් චූදිතයා නිදහස් කරනු ලැබිය යුතු අතර ඒ නිදහස් කිරීම නිදොස් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

විශේෂ ජූරි සභාවක් කැඳවනු ලැබිය හැකි බව.

**208.** (1) යම් නඩුවක් විභාග කිරීම පිණිස විශේෂ ජූරි සභාවක් කැඳවන ලෙස නියම කරන ආඥාවක් ලබා ගැනීම සඳහා චෝදනාව මෙහෙයවන නීතිඥවරයා හෝ චූදිතයා හෝ විසින්, නඩු විභාගය පැවැත්වෙන සැසි වාරයේ දී මහාධිකරණය වෙත ඉල්ලීමක් කළ හැකි ය. තව ද ඒ ඉල්ලීම විභාග කරනු ලබන්නේ යම් විනිශ්චයකාරවරයකු ඉදිරියෙහි ද ඒ විනිශ්චයකාරවරයා විසින් ඒ ඉල්ලීම සාධාරණ හා යුක්තිසහගත යයි සලකනු ලැබුවහොත් ඔහු විසින් ඒ අනුව ආඥාවක් කළ යුතු ය.

(2) නීතිපතිවරයා, නියෝජ්‍ය නීතිපතිවරයා හෝ රජයේ නීතිඥවරයකු හෝ විසින් කරනු ලැබූ විට, හැර, ඒ ඉල්ලීම දිවුරුම් පත්‍රයකින් සනාථ කරනු ලැබිය යුතු ය.

## ජූරි සභාවක් තෝරා ගැනීම

ජූරි සභාවේ සංඛ්‍යාව හා තීරණය සඳහා ගණපූර්ණය.

**209.** (1) ජූරි සභාව හත් දෙනකුගෙන් සමන්විත විය යුතු ය.

(2) දෙනු ලබන තීරණය ඒකමතික තීරණයක් හෝ පස් දෙනකු හෝ ඊට වැඩි බහුතර සංඛ්‍යාවක් විසින් දෙනු ලබන තීරණයක් හෝ විය යුතු ය.

ජූරි සභාව තෝරා ගැනීම.

**210.** (1) අධිකරණය අන්‍යාකාරයකින් විධාන කරතහොත් මිස චූදිතයා විසින් තෝරා ගනු ලබන මූල මණ්ඩලයෙන් ජූරි සභාව සකස් කර ගත යුතු ය.

(2) කුසපත් ඇදීමෙන් මූල මණ්ඩලයෙන් ජූරි සභාව තෝරා ගනු ලැබිය යුතු ය.

(3) එක් එක් ජූරි සභිකයා තෝරා ගනු ලැබූ විට ඔහුගේ නම කියවනු ලැබිය යුතු අතර ඔහු පෙනී සිටි කල්හි, ඒ ජූරි සභිකයා විසින් තමාගේ නඩු විභාග කරනු ලැබීම ගැන තමා විරෝධය පාන්නේ දැයි රෙජිස්ට්‍රාර්වරයා විසින් චූදිතයාගෙන් ප්‍රශ්න කරනු ලැබිය යුතු ය.

(4) චෝදනා ලැබ සිටින වූදිත තැනැත්තා හෝ තැනැත්තන් සියලු දෙනාම හෝ වෙනුවෙන් හේතු ඉදිරිපත් කරනු නොලබන විරෝධය පෑම් දෙකකට ඉඩ දෙනු ලැබිය යුතු ය.

(5) කැඳවනු ලැබූ සහ ඒ වේලෙහි ජූරි සභාවේ සේවය සඳහා පැමිණ සිටින සියලු ජූරි සභිකයන්ගේ නම් කියවා අවසාන වන තෙක්, චෝදනාව මෙහෙයවන නීතිඥවරයා විසින් විරෝධය පෑමට හේතු ගොදක්වමින් කරනු ලබන යෝජනාව මත, නම් කියවන ලද කවර වූ හෝ ජූරි සභිකයන් සංඛ්‍යාවකට, පසෙකින් සිටින ලෙස විනිශ්චයකාරවරයා විසින් නියෝග කරනු ලැබිය හැකි ය.

(6) ඒ නම් කියවා අවසන් වන තුරුත් ජූරි සභාවක් සකස් නොවුයේ නම්, පසෙකින් සිටින ලෙස එසේ ආඥා කරන ලද එක් එක් තැනැත්තාගේ නම් නැවත කියවිය යුතු අතර මෙහි 211 වන වගන්තිය යටතේ විරෝධය පෑමට හේතු (කිසිවක් ඇතොත් ඒ හේතු) දක්වන ලෙස චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගෙන් ඉල්ලා සිටිනු ලැබිය යුතු ය.

(7) විරෝධය පෑමක් කරනු නොලැබූ ප්‍රමාණවත් ජූරි සභික සංඛ්‍යාවක් පැමිණ නොසිටිය හොත්, අලුත් ජූරි සභික මූල මණ්ඩලයක් කැඳවීමට හැකි වන පරිදි නඩු විභාගය අඩාළව කල් තබනු ලැබිය යුතු ය.

විරෝධය පෑමට හේතු .

**211**. පහත දැක්වෙන හේතු අතුරින් යම් හේතුවක් මත ජූරි සභිකයකු පිළිබඳව දක්වනු ලබන යම් විරෝධය පෑමක් අධිකරණය සෑහීමට පත්වන පරිදි ඉදිරිපත් කරනු ලැබුවහොත් ඒ විරෝධය පෑමට ඉඩදෙනු ලැබිය යුතු ය.

(අ) ජූරි සභිකයා තුළ පවතින බවට පූර්ව නිගමනය කර ඇති හෝ ඔහු තුළ සැබවින්ම පවතින හෝ යම් පක්ෂපාතිත්වයක්;

(ආ) යම් නීතියක් මගින් හෝ තත් කාලයෙහි වලංගුව පවත්නා නීතියක බලය ඇති යම් රීතියක් මගින් හෝ නියමිත සුදුසුකමෙහි ඌනතාවක් වැනි යම් පෞද්ගලික හේතුවක්;

(ඇ) පොලිසිය සතු කාර්යය ඔහු විසින් ක්‍රියාවේ යෙදවීම හෝ පොලිස් කාර්යයන් ඔහුට භාර දෙනු ලැබීම;

(ඈ) විනිශ්චයකාරවරයාගේ මතය අනුව ඒ ජූරි සභිකයා ජූරි සභාවේ සේවය කිරීමට නුසුදුස්සකු බවට පත් කරන යම් වරදකට ඔහු වරදකරු කරනු ලැබ සිටීම;

(ඉ) ජූරි සභාව සකස් කරගනු ලැබුවේ යම් මූල මණ්ඩලයකින් ද ඒ මූල මණ්ඩලයේ භාෂාව තේරුම් ගැනීමට ඔහුට නුපුළුවන්කම;

(ඊ) විනිශ්චයකාරවරයාගේ මතය අනුව ඔහු ජූරි සභිකයකු වශයෙන් හොනිසි බවට පත් කරවන වෙනත් යම් අවස්ථාගත කරුණක්.

විරෝධය පෑම පිළිබඳ තීරණය.

**212.** (1) ජූරි සභිකයකු සම්බන්ධයෙන් දක්වනු ලබන සෑම විරෝධය පෑමක් පිළිබඳව විනිශ්චයකාරවරයා විසින් තීරණයක් කළ යුතු ය. ඒ තීරණය, සටහන් කරනු ලැබිය යුතු අතර එය අවසානාත්මක විය යුතු ය.

(2) විරෝධය පෑමට ඉඩ දෙනු ලැබුවහොත්, ඒ ජූරි සභිකයාගේ තැන මේ පරිච්ඡේදයෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් තෝරා ගනු ලබන වෙනත් යම් ජූරි සභිකයකු විසින් පුරවනු ලැබිය යුතු ය.

ජූරි සභාවේ නායකයා.

**213.** (1) ජූරි සභිකයන් තෝරා ගනු ලැබූ කල්හි පහත දැක්වෙන පරිදි, එනම් - "ජූරි සභාවේ මහත්වරුනි, ඔබේ නායකයා තෝරා ගන්න " යනුවෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඔවුන් ඇමතිය යුතු අතර ඉන් ඉක්බිතිව ඔවුන් එසේ ක්‍රියා කළ යුතු ය.

(2) නායකයකු පත්කර ගැනීමේ දී යුක්ති සහගත යයි විනිශ්චයකාරවරයා කල්පනා කරන කාලයක් තුළ ජූරි සභාවෙන් වැඩි දෙනකු එකඟත්වයට නොපැමිණියහොත්, විනිශ්චයකාරවරයා විසින් නායකයකු පත් කරනු ලැබිය යුතු ය.

(3) නායකයා පත් කර ගනු ලැබූ කල්හි ජූරි සභිකයන් දිවුරවීම හෝ ඔවුන් විසින් ප්‍රතිඥා දීම කරවීම හෝ කළ යුතු ය.

නායකයාගේ කාර්ය.

**214.** ජූරි සභාවේ විවාදවලදී මූලාසනය දැරීම, ජූරි සභාවට හෝ ජූරි සභිකයන් අතුරින් යම් ජූරි සභිකයකුට හෝ අවශ්‍ය වන යම් තොරතුරක් විනිශ්චයකාරවරයාගෙන් විමසීම සහ ජූරි සභාවේ තීරණය ප්‍රකාශ කිරීම ජූරි සභාවේ නායකයා විසින් කළ යුතු ය.

ජූරි සභිකයකු පැමිණ නොසිටීම ආදී අවස්ථාවල දී කාර්ය පටිපාටිය.

**215.** ජූරි සභාවක් මගින් නඩු විභාගයක් පවත්වාගෙන යනු ලබන අතරතුර තීරණය ඉදිරිපත් කිරීමට පෙර යම් අවස්ථාවක යම් ප්‍රමාණවත් හේතුවක් නිසා නඩු විභාගය පැවැත්වෙන කාලය මුළුල්ලේම පැමිණ සිටීමෙන් යම් ජූරි සභිකයකු වළක්වනු ලැබුවහොත් හෝ, යම් ජූරි සභිකයකු නොපැමිණියහොත් සහ ඔහුට පැමිණ සිටීමට බල කිරීම කළ නොහැකි නම් හෝ, සාක්ෂි දෙනු ලබන්නේ යම් භාෂාවකින් ද ඒ භාෂාව නැතහොත් ඒ සාක්ෂි භාෂණ පරිවර්තනය කරනු ලබන කල්හි එය භාෂණ පරිවර්තනය කරනු ලබන්නේ යම් භාෂාවකට ද ඒ භාෂාව හෝ යම් ජූරි සභිකයකුට තේරුම් ගැනීමට නොහැකි යයි පෙනී ගියහොත් හෝ අලුත් ජූරි සභිකයකු එකතු කරන ලෙස නැතහොත් ජූරි සභාව විසුරුවා හැර අලුත් ජූරි සභාවක් තෝරා ගන්නා ලෙස විනිශ්චයකාරවරයා විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

සිරකරුගේ අසනීපය නිසා ජූරි සභාව විසුරුවා හැරීම.

**216.** කූඩුවෙහි රැඳී සිටීමට සිරකරුට නුපුළුවන් වන කවර හෝ විටක ද ජූරි සභාව විසුරුවා හැරීම යුක්තිය ඉෂ්ට කිරීමෙහි ලා අවශ්‍ය යයි විනිශ්චයකාරවරයාගේ මතය වන කවර හෝ විටක ද විනිශ්චයකාරවරයා විසින් ජූරි සභාව විසුරුවා හරිනු ලැබිය හැකි ය.

## චෝදක පක්ෂය හා විත්ති පක්ෂය වෙනුවෙන් නඩුවේ අවසානය තෙක් නඩු විභාගය

රෙජිස්ට්‍රාර්වරයා විසින් අධිචෝදනා පත්‍රය ජූරි සභාවට කියවිය යුතු බව.

**217.** ජූරි සභාව දිවුරවනු ලැබූ විගස ම චූදිතයාට ඇසෙන පරිදි රෙජිස්ට්‍රාර්වරයා විසින් අධිචෝදනා පත්‍රය ජූරි සභාවට කියවිය යුතු අතර, සාක්ෂිවලට ඇහුම්කන් දීමත් අධිචෝදනා පත්‍රයෙහි චූදිතයාට විරුද්ධව කර ඇති චෝදනාවට හෝ චෝදනා එකකට වැඩි ගණනක් කර ඇත්නම් ඒ චෝදනා අතුරින් කිසියම් චෝදනාවකට හෝ ඔහු වරදකරු ද වරදකරු නොවේ ද යන වග ඒ සාක්ෂිය අනුව ස්වකීය තීන්දුවෙන් තීරණය කිරීමත් ඔවුන්ගේ කාර්යය වන බව විනිශ්චයකාරවරයා විසින් ජූරි සභාවට දැනුම් දිය යුතු ය. තව ද නඩුව සම්බන්ධයෙන් අදාළ විය හැකි නිර්දෝෂත්වයේ පූර්වානුමිතිය, ඔප්පු කිරීමේ භාරය සහ එවැනි වෙනත් මූල ධර්ම පිළිබඳව ඔවුන්ට ලුහුඬින් කරුණු පැහැදිලි කර දීම ද ඔහු විසින් කළ හැකි ය.

චෝදක පක්ෂය වෙනුවෙන් නඩුව ආරම්භ කිරීම.

**218.** ඉන් පසුව චෝදනාව මෙහෙයවන නීතිඥයා විසින්, චෝදනා කරනු ලැබ ඇති වරදෙහි ස්වභාවය ද චූදිතයාගේ වරදකාරීත්වය ඔප්පු කිරීම පිණිස ඉදිරිපත් කිරීමට තමා බලාපොරොත්තු වන සාක්ෂි ද ලුහුඬින් ප්‍රකාශ කිරීමෙන් නඩුව ආරම්භ කළ යුතු අතර ඉන් ඉක්බිතිව ඔහු විසින් තම සාක්ෂිකරුවන් විභාග කරනු ලැබිය යුතු ය. ඉනික්බිතිව චූදිතයා විසින් හෝ ඔහුගේ උත්තරවාදියා විසින් ඒ සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න අසනු ලැබිය හැකි ය.

සිරකරුවා විසින් කරන ලද ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු බව.

**219.** මහෙස්ත්‍රාත් අධිකරණයෙහි පරීක්ෂණයක් කරනු ලැබුවේ නම්, ඒ පරීක්ෂණය පැවැත්වෙද්දී චාර්තාගත කරන ලද චූදිතයාගේ සියලු ප්‍රකාශ චෝදක පක්ෂය වෙනුවෙන් නඩුව අවසන් කිරීමට පෙර සාක්ෂි වශයෙන් ඉදිරිපත් කොට කියවනු යුතු ය.

චෝදක පක්ෂයේ සාක්ෂිකරුවන් විභාග කරනු ලැබීමෙන් පසුව අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.

**220.** (1) චෝදක පක්ෂය වෙනුවෙන් නඩුවේ කරුණු ඉදිරිපත් කිරීම අවසන් වූ විට, චූදිතයා වරද සිදු කළ බවට සාක්ෂි නොමැති යයි විනිශ්චයකාරවරයා සලකන්නේ නම් "වරදකරු නොවේය "යන තීරණයක් දෙන ලෙසට ඔහු ජූරි සභාව මෙහෙයවිය යුතු ය.

(2) චූදිතයා වරද සිදු කළ බවට සාක්ෂි ඇතැයි විනිශ්චයකාරවරයා සලකන්නේ නම්, විනිශ්චයකාරවරයා විසින් චූදිතයා සාක්ෂි ඉදිරිපත් කිරීමට අදහස් කරන්නේ දැයි ඔහුගෙන් හෝ ඔහුගේ උත්තරවාදියාගෙන් ඇසිය යුතු ය.

(3) සාක්ෂි ඉදිරිපත් කිරීමට තමා අදහස් නොකරන බව චූදිතයා හෝ ඔහුගේ උත්තරවාදියා හෝ ප්‍රකාශ කරතහොත්, චූදිතයාට විරුද්ධව ඇති සාක්ෂි සම්පිණ්ඩනය කොට දැක්වීමේ කාර්යය සඳහා ස්වකීය නඩුව සනාථ කරනු පිණිස චෝදනාව මෙහෙයවන නීතිඥවරයා විසින් දෙවන වරටත් ජූරි සභාව අමතනු ලැබිය හැකි ය.

විත්ති පක්ෂය.

**221.** (1) තමා පිරිවහල් කර ගැනීමට බලාපොරොත්තු වන සිද්ධි හෝ නීතිය හෝ සඳහන් කිරීමෙන් සහ චෝදක පක්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂි අනුව අවශ්‍ය යයි තමා කල්පනා කරන අදහස් පළ කිරීමෙන් චූදිතයා හෝ ඔහුගේ උත්තරවාදියා හෝ විසින් එවිට ස්වකීය නඩුව ආරම්භ කරනු ලැබිය හැකි ය ඉන් ඉක්බිතිව ඔහු විසින් ස්වකීය සාක්ෂිකරුවන් කැඳවනු ලැබිය හැකි අතර ඒ සාක්ෂිකරුවන් සාක්ෂි දෙනු ලැබීමෙන් පසු ස්වකීය නඩුවේ කරුණු ඔහු විසින් සම්පිණ්ඩනය කොට දැක්විය හැකි ය.

(2) දිවුරුම් පිට හෝ ප්‍රතිඥා පිට සාක්ෂි දීමට විත්ති පක්ෂය විසින් කැඳවනු ලැබූ සියලු සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට චෝදනාව මෙහෙයවන නීතිඥවරයාට හිමිකම තිබිය යුතු ය.

*සාක්ෂිකරුවන් විභාග කිරීමට හා කැඳවීමට චූදිතයාට ඇති අයිතිවාසිකම.*

**222.** තමා විසින් කලින් නම් නොකරන ලද යම් සාක්ෂිකරුවකු අධිකරණයට පැමිණ සිටින්නේ නම් ඒ සාක්ෂිකරු විභාග කිරීමට චූදිතයාට ඉඩ දෙනු ලැබිය යුතු ය.

*සාක්ෂි බිඳ හෙළීම පිණිස වූ සාක්ෂිකරුවෝ.*

**223.** චෝදනාව මෙහෙයවන නීතිඥවරයා විසින්, විනිශ්චයකාරවරයාගේ අවසරය ඇතිව, කරුණු බිඳ හෙළීම පිණිස සාක්ෂිකරුවන් කැඳවනු ලැබිය හැකි ය.

*වරදකරන ලද ස්ථානය ජූරි සභාව විසින් බැලීම.*

**224.** (1) චෝදනා නගා ඇත්තේ යම් වරදක් සම්බන්ධයෙන් ද ඒ වරද සිදු කරන ලදැයි කියනු ලබන ස්ථානය හෝ නඩු විභාගය සම්බන්ධයෙන් වැදගත් වන අන් කිසි කටයුත්තක් සිදු වී යයි කියනු ලබන වෙනත් යම් ස්ථානයක් හෝ ජූරි සභාව විසින් බැලිය යුතු යයි විනිශ්චයකාරවරයා කල්පනා කරන කවර හෝ අවස්ථාවක, විනිශ්චයකාරවරයා විසින් ඒ බවට ආඥාවක් කරනු ලැබිය යුතු ය.

තව ද අධිකරණයේ නිලධරයකුගේ ආරක්ෂාව යටතේ ජූරි සභාව එක් කණ්ඩායමක් වශයෙන් ඒ ස්ථානය වෙත ගෙන යනු ලැබිය යුතු අතර විනිශ්චයකාරවරයා විසින් පත් කරන ලද තැනැත්තකු විසින් ඒ ස්ථානය ජූරි සභාවට පෙන්වනු ලැබිය යුතු ය.

(2) ඒ නිලධරයා විසින්, විනිශ්චයකාරවරයාගේ අවසරය ඇතිව හැර, ජූරි සභාවේ යම් සාමාජිකයකු සමග කථා කිරීමට හෝ ජූරි සභාවේ යම් සාමාජිකයකු සමග අදහස් හුවමාරු කර ගැනීමට හෝ වෙනත් යම් තැනැත්තකුට ඉඩ නොදිය යුතු ය. තව ද අධිකරණය විසින් අන්‍යාකාරයෙන් විධාන කරනු ලැබුවහොත් මිස ස්ථානය බලා ගැනීම අවසන් කළ පසු ජූරි සභාව වහාම අධිකරණය වෙත ආපසු ගෙන යා යුතු ය.

*ජූරි සභිකයකු විභාග කරනු ලැබිය හැකි අවස්ථා.*

**225.** ජූරි සභිකයකු යම් අදාළ සිද්ධියක් පෞද්ගලිකව දන්නේ නම් ඒ බව අධිකරණය වෙත දැනුම් දීම ඔහුගේ කාර්යය වන අතර, එසේ කරනු ලැබූ විට, වෙනත් යම් සාක්ෂිකරුවකු දිවුරවනු ලබන හා විභාග කරනු ලබන ආකාරයෙන්ම ඒ ජූරි සභිකයා දිවුරවනු ලැබීම හා විභාග කරනු ලැබීම කළ හැකි ය.

අධාළව කල් තබනු ලැබූ රැස්වීම් වාරයකට ජූරි සභාව පැමිණ සිටිය යුතු බව.

**226**. නඩු විභාගයක් අධාළව කල් තබනු ලැබූවහොත්, එසේ අධාළව කල් තබා පවත්වනු ලබන සෑම රැස්වීම් වාරවල දී සහ නඩු විභාගය අවසන් වන තෙක් ඉන් අනතුරුව පැවැත්වෙන සෑම රැස්වීම් වාරයක දී ම ජූරි සභාව පැමිණ සිටිය යුතු ය.

ජූරි සභාව එක් රැස් කොට තබනු ලැබිය හැකි අවස්ථාව.

**227.** (1) යම් අවස්ථාවක දී විනිශ්චයකාරවරයාගේ සම්පිණ්ඩන දේශනය අවසන් වීමට කලින් නඩු විභාගයක් අධාලව කල් තබා ඇති යම් කාලයක් තුළ ජූරි සභාව එක් රැස් කරවා තැබීම අවශ්‍ය නොවිය යුතු ය. එහෙත් යම් නඩු විභාගයක දී යුක්තිය ඉෂ්ට කිරීමෙහි ලා ප්‍රඥාගෝචර යයි තමාට පෙනී ගියහොත් නඩු විභාගයක් අධාළව කල් තබා ඇති යම් කාලයක් තුළ ජූරි සභාව එක් රැස් කරවා තබන ලෙස විනිශ්චයකාරවරයා විසින් නියම කිරීම නීත්‍යනුකූල විය යුතු ය.

(2) යම් නඩු විභාගයක් පවත්වන අතරතුර වෙන්ව යාමට ජූරි සභාවට ඉඩ දෙනු ලැබූ අවස්ථාවක, එසේ වෙන්ව ගොස් සිටින කාලය තුළ සහෝදර ජූරි සභිකයකු සමග හැර වෙනත් යම් තැනැත්තකු සමග නඩු විභාගයේ විෂයය පිළිබඳව අදහස් හුවමාරු කර ගැනීමක් නොකරන බවට ජූරි සභිකයන් පළමු කොට දිවුරවීම හෝ ඔවුන්ගෙන් ප්‍රතිඥා ගැනීම කරනු ලැබිය හැකි ය.

(3) එයින් යම් ජූරි සභිකයකු, සහෝදර ජූරි සභිකයකු නොවන වෙනත් යම් තැනැත්තකු සමග එවැනි යම් අදහස් හුවමාරු කර ගැනීමක් කළහොත්, නැතහොත් සහෝදර ජූරි සභිකයකු නොවන යම් තැනැත්තකු එයින් යම් ජූරි සභිකයකු සමග එවැනි යම් අදහස් හුවමාරු කර ගැනීමක් කළහොත්, අවස්ථාවෝචිත පරිදි ඒ ජූරි සභිකයා නැතහොත්, ඒ තැනැත්තා අධිකරණයට අපහාස කිරීමක් සම්බන්ධයෙන් වරදකරු ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඔහුට දඬුවම් කරනු ලැබිය යුතු ය.

විනිශ්චයකාරවරයා විසින් ජූරි සභාවට ආහාර පාන දීමට ඉඩ දිය හැකි බව.

**228.** විනිශ්චයකාරවරයාගේ සම්පිණ්ඩන දේශනය පැවැත්වීමට පෙර හෝ පසුව ජූරි සභාව එක් රැස් කොට තැබිය හැකි යම් කාලයක් තුළ යම් අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් රජයේ වියදමින් ජූරි සභාව සඳහා සෑහෙන ආහාර පාන සැපයිය යුතු යයි ආඥා කිරීම සුදුසු බව විනිශ්චයකාරවරයා කල්පනා කරතහොත් ඔහු විසින් එසේ ආඥා කරනු ලැබිය හැකි ය.

## නඩු විභාගය අවසන් කිරීම

**229.** විත්ති පක්ෂය වෙනුවෙන් නඩුවේ කරුණු ඉදිරිපත් කිරීම ද චෝදනාව මෙහෙය වන නීතිඥවරයාගේ යම් පිළිතුරක් වෙතොත් එය ද අවසන් කරනු ලැබූ විට, සාක්ෂි සම්පිණ්ඩනය කොට දක්වමින් හා ජූරි සභාව ගුරුකොට ගත යුතු නීතිය විදහා දක්වමින් විනිශ්චයකාරවරයා විසින් ජූරි සභාව වෙත සිය දේශනය පැවැත්විය යුතු ය. ජූරි සභාවට දේශනය පැවැත්වීම.

**230.** (අ) නඩු විභාගය පැවැත්වෙන අතරතුර උද්ගත වන සියලු නීති ප්‍රශ්න ද විශේෂයෙන් ම, ඔප්පු කිරීමට අදහස් කොට ඇති සිද්ධිවල උචිතභාවය සහ සාක්ෂිවල ආවේශ්‍යතාව හෝ පාර්ශ්වකරුවන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් අසනු ලබන ප්‍රශ්නවල යෝග්‍යතාව පිළිබඳ සියලු ප්‍රශ්න ද තීරණය කිරීම, සහ පාර්ශ්වකරුවන් විසින් විරෝධය පළ කරනු ලැබුව ද නොලැබුව ද ආවේශ්‍ය නොවන්නා වූ සාක්ෂි ඉදිරිපත් කිරීම ස්වකීය අභිමතය පරිදි වැළැක්වීම ; විනිශ්චයකාරවරයාගේ කාර්යය.

(ආ) නඩු විභාගයේ දී සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලබන සියලු ලේඛනවල අර්ථය හා අර්ථ නිරූපණය තීරණය කිරීම;

(ඇ) විශේෂ කාරණා පිළිබඳව සාක්ෂි දිය හැකි වනු පිණිස ඔප්පු කිරීම අවශ්‍යය විය හැකි සිද්ධියක් පිළිබඳ සියලු කාරණා තීරණය කිරීම.

(ඈ) උද්ගත වන යම් ප්‍රශ්නයක් තමා සඳහා වූවක් ද නැතහොත් ජූරි සභාව සඳහා වූවක් දැයි තීරණය කිරීම

විනිශ්චයකාරවරයාගේ කාර්යය වේ.

**231.** ස්වකීය සම්පිණ්ඩන දේශනය කිරීමේ දී, සුදුසු යයි විනිශ්චයකාරවරයා කල්පනා කරන්නේ නම්, නඩු කටයුත්තට අදාළ යම් සිද්ධිය පිළිබඳ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් හෝ නීතිය හා සිද්ධි මිශ්‍ර යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් හෝ තම මතය ඔහු විසින් ජූරි සභාවට ප්‍රකාශ කරනු ලැබිය හැකි ය. සිද්ධිය පිළිබඳ ප්‍රශ්නයක් හෝ නීතිය හා සිද්ධිය මිශ්‍ර ප්‍රශ්නයක් හෝ පිළිබඳව විනිශ්චයකාරවරයා විසින් අදහස් ප්‍රකාශ කළ හැකි බව.

## නිදර්ශන

(අ) නඩුවේ සාක්ෂිකරුවකු නොවන තැනැත්තකු විසින් කරන ලද ප්‍රකාශයක්. ඒ ප්‍රකාශය පිළිබඳ සාක්ෂි පිළිගනු ලබන බවට පත් කරන අවස්ථානුගත කරුණු ඔප්පු වී ඇතැයි යන හේතුව මත ඔප්පු කිරීමට යෝජනා කර ඇත. මේ අවස්ථානුගත කරුණුවල පැවැත් ම ඔප්පු කරනු ලැබුවේ ද නැද්ද යන වග තීරණය කිරීම ජූරි සභාව විසින් නොව, විනිශ්චයකාරවරයා විසින් කළ යුතු ය.

(ආ) මුල් පිටපත නැති වී යයි හෝ විනාශ කරන ලදැයි හෝ කියනු ලබන ලේඛනයක් පිළිබඳව ද්විතීයික සාක්ෂි දීමට යෝජනා කර ඇත.

ජූරි සභාවේ කාර්යය.

**232.** (අ) සිද්ධි පිළිබඳව කවර මතය සත්‍ය දැයි තීරණය කිරීම සහ ඉන් අනතුරුව ඒ මතය යටතේ විනිශ්චයකාරවරයාගේ මෙහෙයවීම අනුව ප්‍රකාශ කළ යුතු තීරණය ප්‍රකාශ කිරීම ;

(ආ) (නීතියේ යෙදුම් නොවන) සියලු පාරිභාෂික යෙදුම්වල ද, ලේඛනවල දක්නට ලැබුණ ද, නොලැබුණ ද නිශ්චය කිරීම අවශ්‍ය විය හැකි අසාමාන්‍ය අර්ථයකින් යෙදෙන වචනවල ද අර්ථය නිශ්චය කිරීම ;

(ඇ) නීතිය අනුව සිද්ධිය පිළිබඳ ප්‍රශ්න වශයෙන් සලකනු ලබන සියලු ප්‍රශ්න තීරණය කිරීම ;

(ඈ) සාමාන්‍ය අනියත යෙදුම් නෛතික කාර්ය පටිපාටිය පිළිබඳව සඳහනක් කරතහොත් මිස, නැතහොත් එම යෙදුම්වල අර්ථ නීතිය අනුව නිසැකව දක්වා ඇත්නම් මිස, (ඒ අවස්ථා දෙකින් කවර හෝ අවස්ථාවක දී වුව ද ඒ යෙදුම්වල අර්ථය තීරණය කිරීම විනිශ්චයකාරවරයාගේ කාර්යය වේ. සාමාන්‍ය අනියත යෙදුම් විශේෂ අවස්ථාවලට අදාළ වන්නේ ද නොවන්නේ ද යන වග තීරණය කිරීම.

ජූරි සභාවේ කාර්යය වේ.

නිදර්ශන

(අ) "බී" ගේ මරණය සිදු කිරීම සම්බන්ධයෙන් "ඒ " ට විරුද්ධව නඩු විභාග කරනු ලැබේ. මිනීමැරුම සහ මිනීමැරුමක් නොවන්නා වූ සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය අතර ඇති වෙනස ජූරි සභාවට පැහැදිලි කර දීම සහ මිනීමැරුම සම්බන්ධයෙන් හෝ මිනීමැරුමක් නොවන්නා වූ සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය සම්බන්ධයෙන් "ඒ " වරදකරු කරනු ලැබිය යුත්තේ නැතහොත් නිදොස් කරනු ලැබිය යුත්තේ සිද්ධි පිළිබඳ කවර අදහස් යටතේ ද යන වග කියා දීම විනිශ්චයකාරවරයාගේ කාර්යය වේ.

සිද්ධි පිළිබඳව කවර අදහස සත්‍යදැයි තීරණය කර, විනිශ්චයකාරවරයාගේ මෙහෙයවීම හරි වුවද, වැරදි වුවද ජූරි සභාව ඒ මෙහෙයවීම හා එකඟ වුවද නොවුවද ඒ මෙහෙයවීම අනුව තීරණයක් ප්‍රකාශ කිරීම ජූරි සභාවේ කාර්යය වේ.

(ආ) ප්‍රශ්නය නම්, එක්තරා කාරණයක් පිළිබඳව යම් තැනැත්තකු සාධාරණ විශ්වාසයක් දැරුවේ ද වැඩය සෑහෙන දක්ෂතාවකින් හෝ නිසි උද්යෝගයෙන් කරන ලද්දේ ද යන්නය.

මේ එක් එක් කාරණය ජූරි සභාව විසින් තීරණය කළ යුතු ප්‍රශ්නයකි.

**233.** (1) සම්පිණ්ඩන දේශනයෙන් පසු ස්වකීය තීරණය සලකා බැලීම සඳහා ජූරි සභාව ඉවත් ව යා හැකි ය.

ජූරි සභාව තීරණය සලකා බැලීම සඳහා ඉවත්ව යා හැකි බව.

(2) ජූරි සභාව ඉවත්ව යතහොත් නියමිත ආකෘතියෙහි පළමු කොට දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් දිය යුතු අධිකරණයේ නිලධරයකුගේ භාරයට ජූරි සභාව පත් කළ යුතු ය.

(3) විනිශ්චයකාරවරයාගේ අවසරය ඇතිව හැර, ඒ ජූරි සභාවේ සාමාජිකයකු නොවන කිසිම තැනැත්තකු ඒ ජූරි සභාවේ යම් සාමාජිකයකු සමඟ කථා කිරීම හෝ ඔහු සමග යම් අදහස් හුවමාරුවක් කර ගැනීම හෝ නොකළ යුතු ය.

**234.** (1) ස්වකීය තීරණය දීමට ජූරි සභාව සූදානම් වීමට සහ සියලුම ජූරි සභිකයන් ඒකමතික දැයි රෙජිස්ට්‍රාර්වරයා විසින් ජූරි සභාවේ නායකයාගෙන් ඇසිය යුතු ය.

තීරණය දීමට ජූරි සභාව සූදානම්ව සිටින අවස්ථාව.

(2) ජූරි සභාව ඒකමතික නොවන්නේ නම්, තවදුරටත් සලකා බැලීම සඳහා ඉවත්ව යන ලෙස විනිශ්චයකාරවරයා විසින් ජූරි සභාවට නියම කරනු ලැබිය හැකි ය.

(3) සාධාරණ යයි විනිශ්චයකාරවරයා සලකන කාලයක් එසේ තව දුරටත් සලකා බැලීමෙන් පසුව හෝ, තමන් ඒකමතික බව ජූරි සභාවේ නායකයා පළමු අවස්ථාවේ දීම කියන්නේ නම් හෝ, ඔවුන්ට ඉවත්ව යාමට විනිශ්චයකාරවරයා විසින් නියම කරනු නොලබන්නේ නම් හෝ, (සියලුම ජූරි සභිකයන් රැස්ව සිටිය දී) රෙජිස්ට්‍රාර්වරයා විසින් මෙසේ පැවසිය යුතු ය."ඔබ තීරණය කරන්නේ චූදිත තැනැත්තා වන (ඔහුගේ නම සඳහන් කරමින් ) ඔහුට චෝදනා නගා ඇති (වරද සඳහන් කරමින් ) වරද සම්බන්ධයෙන් ඔහු වරදකරු වන බව ද ? නැතහොත් වරදකරු නොවන බව ද? "

(4) එවිට ජූරි සභාවේ තීරණය කුමක් දැයි ජූරි සභාවේ නායකයා විසින් ප්‍රශ්න කරනු ලැබිය යුතු ය.

එක් එක් චෝදනාව සම්බන්ධයෙන් තීරණයක් දිය යුතු බව.

**235.** (1) විනිශ්චයකාරවරයා විසින් අන්‍යාකාරයකින් ආඥා කරනු ලැබුවහොත් මිස, යම් චෝදනා සම්බන්ධයෙන් චූදිතයාට විරුද්ධව නඩු විභාග කරනු ලැබී ද ඒ සියලුම චෝදනා සම්බන්ධයෙන් ජූරි සභාව විසින් තීරණයක් ප්‍රකාශ කරනු ලැබිය යුතු අතර ඔවුන්ගේ තීරණය කුමක් දැයි හිසැකව දැන ගැනීම සඳහා අවශ්‍ය වන ප්‍රශ්න විනිශ්චයකාරවරයා විසින් ඔවුන්ගෙන් ඇසිය හැකි ය.

(2) ජූරි සභාව විසින් ප්‍රකාශ කරන ලද තීරණය විනිශ්චයකාරවරයා විසින් අනුමත කරනු නොලබන්නේ නම් ඔවුන්ගේ තීරණය නැවත සලකා බලන ලෙස විනිශ්චයකාරවරයා විසින් ඔවුන්ට විධාන කරනු ලැබිය හැකි අතර, එසේ නැවත සලකා බැලීමෙන් පසුව දෙනු ලබන තීරණය නියම තීරණය ලෙස සලකනු ලැබිය යුතු ය.

තීරණය සටහන් කිරීම හා අත්සන් කිරීම.

**236.** (1) රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණය අධිචෝදනා පත්‍රයෙහි සටහන් කරනු ලැබිය යුතු අතර, ඉන් ඉක්බිතිව පහත දැක්වෙන වචන මාලාව හෝ ඒ හා සමාන අර්ථයකින් යුතු වචන මාලාවක් ජූරි සභාවට පැවසිය යුතු ය.

"ජූරි සභාවේ මහත්වරුනි, ඔබේ නායකයා ඔබේ තීරණය අත්සන් කරන විට රැස්ව සිටින්න. ඔබේ (හෝ අවස්ථාවෝචිතව සිටින පරිදි ඔබ ................ දෙනාගේ නිගමනය අ,ආ, නැමති සිරකරු වරදකරු වන බව (හෝ වරදකරු නොවන බව ය "

(2) එසේ සටහන් කරන ලද තීරණය ජූරි සභාවේ නායකයා විසින් අත්සන් කළ යුතු අතර, තීරණය එලෙස සටහන් කරනු ලැබ අත්සන් කරනු ලැබූ විට අවසානාත්මක විය යුතු ය ; එහෙත් ඊට කලින් එසේ නොවිය යුතු ය.

(3) අත්වැරැද්දකින් හෝ වැරදීමකින් හෝ වැරදි තීරණයක් දෙනු ලැබූ විටක ඒ තීරණය අවසන් වීමට පෙර හෝ අත්සන් කිරීමෙන් ඉක්බිතිව ම හෝ ජූරි සභාව විසින් එය සංශෝධනය කරනු ලැබිය හැකි ය.

**237.** ජූරි සභාවට හෝ ඔවුන් අතුරින් නියමිත බහුතර සංඛ්‍යාවකට එකඟත්වයට පැමිණිය නොහැකි වුවහොත් සාධාරණ යයි තමා කල්පනා කරන කාලයක් ඉකුත් වූ පසු විනිශ්චයකාරවරයා විසින් ඔවුන් විසුරුවා හරිනු ලැබිය යුතු ය.

ජූරි සභාවට එකඟත්වයට පැමිණිය නොහැකි විට ජූරි සභාව විසුරුවා හැරීම.

**238.** චූදිතයා වරදකරු කරනු ලැබුවහොත් විනිශ්චයකාරවරයා විසින් නොපමාව ම සාධාරණ කාලයක් ඇතුළත හෝ නීතිය අනුව ඔහු සම්බන්ධයෙන් නඩු තීන්දුව දිය යුතු ය ;

වරදකරු කරනු ලැබූ විට නඩු තීන්දුව නියම කිරීම.

එසේ වුව ද අවස්ථානුකූල යයි විනිශ්චයකාරවරයාට පෙනී යන්නේ නම්, නඩු තීන්දුව ප්‍රකාශ කරනු වෙනුවට, කැඳවනු ලැබුවහොත් හා කැඳවනු ලැබූ විට අධිකරණය ඉදිරියෙහි පෙනී සිට නඩු තීන්දුව භාර ගැනීම පිණිස හා ඒ අතරතුර සාමය ආරක්ෂා කරන ලෙස හා යහපත් හැසිරීමෙන් යුතු වීම පිණිස විනිශ්චයකාරවරයා විසින් විධාන කරනු ලබන යම් කාලයක් සඳහා ඇපකරුවන් ඇතිව හෝ නැතිව බැඳුම්කරයට ඇතුළත් කර චූදිතයා මුදා හරින ලෙස විනිශ්චයකාරවරයා විසින් විධාන කරනු ලැබිය හැකි ය.

## ඈ - ජූරි සභාව විසුරුවා හරිනු ලැබීමෙන් පසු චූදිතයා නැවත නඩු විභාගයට භාජනය කිරීම

**239.** (1) ජූරි සභාව විසුරුවා හරිනු ලැබූ කවර හෝ විටක 403 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, සුදුසු යයි විනිශ්චයකාරවරයා කල්පනා කරන පරිදි චූදිතයා අත් අඩංගුවෙහි තබා ගෙන හෝ ඇප පිට මුදා හැර වෙනත් ජූරි සභාවක් මගින් ඔහු නඩු විභාගයට භාජන කරනු ලැබිය යුතු ය.

චූදිතයා නැවත නඩු විභාගයට භාජන කිරීම.

(2) මේ වගන්තිය යටතේ අත් අඩංගුවෙහි තබා ගනු ලැබූ සෑම තැනැත්තකුම යම් බන්ධනාගාරයක අධිකාරීවරයා අමතනු ලැබූ බලපත්‍රයක් මගින් එසේ තබා ගනු ලැබිය යුතු අතර ඒ සෑම බලපත්‍රයක් ම සම්බන්ධයෙන් 264 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

## ඉ - කලින් වරදකරු කරනු ලැබීම සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය

කලින් වරදකරු කරනු ලැබීම සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය.

**240.** (1) යම් වරදක් සඳහා කලින් වරදකරු කිරීමකින් පසුව වරදක් සිදු කිරීම පිළිබඳව චූදිතයාට චෝදනා නගා ඇති අවස්ථාවක් සම්බන්ධයෙන් වූ නඩු විභාගයක දී මෙහි මින් පෙර දක්වා ඇති කාර්ය පටිපාටිය පහත දැක්වෙන පරිදි සුළු වශයෙන් වෙනස් කරනු ලැබිය යුතු ය -

(අ) චූදිතයාට විරුද්ධව චෝදනා නගා ඇති වරදට තමා වරදකරු යයි ඔහු උත්තරවාද දෙන්නේ නම් හෝ ඊට වරදකරු කරනු ලැබී නම්, කලින් වරදකරු කරනු ලැබීම පිළිගන්නේ දැයි එවිට ඔහුගෙන් ඇසිය යුතු ය;

(ආ) කලින් වරදකරු කරනු ලැබීම ඔහු පිළිගන්නේ නම්, විනිශ්චයකාරවරයා විසින් ඒ අනුව ඔහු සම්බන්ධයෙන් නඩු තීන්දුව නියම කළ හැකි ය. එහෙත් තමා කලින් වරදකරු කරනු ලැබූ බව ඔහු නොපිළිගන්නේ නම් නැතහොත් ඒ ප්‍රශ්නයට උත්තර දීම ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ උත්තර නොදෙන්නේ නම් අවස්ථාවෝචිත පරිදි, ජූරි සභාව හෝ විනිශ්චයකාරවරයා හෝ විසින් ඒ කලින් වරදකරු කිරීම පිළිබඳව එවිට විභාග කළ යුතු අතර, එවැනි අවස්ථාවක දී ජූරි සභිකයන් නැවත දිවුරවීම අවශ්‍ය නොවිය යුතු ය.

(2) මේ වගන්තියෙහි ඇතුළත් කිසිවක් නොතකා, කලින් වරදකරු කිරීම පිළිබඳ සිද්ධිය, ශ්‍රී ලංකාවේ තත් කාලයෙහි බල පවත්නා යම් නීතියක් යටතේ අදාළ වන්නේ නම්, ඒ කලින් වරදකරු කිරීම පිළිබඳ සාක්ෂි තදනන්තර වරදක් සඳහා වූ නඩු විභාගයේ දී දෙනු ලැබිය හැකි ය.

## ඊ - චූදිතයා පැමිණ නොසිටිය දී මහාධිකරණයෙහි පවත්වනු ලබන නඩු විභාග

චූදිතයා පැමිණ නොසිටිය දී නඩු විභාගය පැවැත්විය හැකි බව.

**241.** (1) මේ සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, අධිචෝදනාවක් මත යම් තැනැත්තකු පිළිබඳ වූ ජූරි සභාවක් රහිත නඩු විභාගය -

(අ) අධිචෝදනා පත්‍රය ඒ තැනැත්තා වෙත භාර දෙන ලද බවට හා -

(i) ඔහු පැන ගොස් සිටින බවට හෝ දිවයිනෙන් බැහැර ගොස් ඇති බවට ; හෝ

(ii) රෝගාතුරවීම හේතු කොටගෙන ඔහුට අධිකරණය පැමිණ සිටීමට හෝ අධිකරණයෙහි රැඳී සිටීමට හෝ නොහැකි බවට හා ඔහු පැමිණ නොසිටිය දී නඩු විභාගය ආරම්භ කිරීමට නැතහොත් පවත්වාගෙන යාමට ඔහු විසින් කැමැත්ත දී ඇති බවට ; හෝ

(iii) රෝගාතුරවීම හේතු කොටගෙන ඔහුට අධිකරණයට පැමිණ සිටීමට හෝ අධිකරණයෙහි රැඳී සිටීමට හෝ නොහැකි බවට හා ඔහු පැමිණ නොසිටිය දී නඩු විභාගය ආරම්භ කිරීමෙන් නැතහොත් පවත්වාගෙන යාමෙන්, විනිශ්චයකාරවරයාගේ මතය අනුව, ඔහුට කිසිම හානියක් සිදු නොවන බවට ; හෝ

(iv) අධිකරණයේ දී ඔහුගේ හැසිරීම හේතු කොටගෙන නඩු විභාගය පවත්වාගෙන යාමට ඔහු බාධා කරන බවට හෝ අවහිර කරන බවට ; හෝ

(ආ) ඒ තැනැත්තා පැන ගොස් සිටින බවට හෝ ඔහු දිවයිනෙන් බැහැර ගොස් ඇති බවට සහ අධිචෝදනා පත්‍රය ඔහුට භාර දීමට නොහැකි වී ඇති බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, ඒ තැනැත්තා පැමිණ නොසිටිය දී ආරම්භ කිරීම හෝ පවත්වාගෙනයාම හෝ කරනු ලැබිය හැකිය.

(2) මේ වගන්තිය යටතේ නඩු විභාගයක් ආරම්භ කිරීම හෝ පවත්වාගෙන යාම ඒ නඩු විභාගයේ දී නීතිඥවරයකු මගින් විත්තිවාචක ඉදිරිපත් කිරීමට ඒ තැනැත්තා සතු අයිතිවාසිකම් කෙරෙහි බලපාන්නක් ලෙස හෝ ඒ අයිතිවාසිකමට හානියක් සිදුවන්නක් ලෙස හෝ සලකනු නොලැබිය යුතු ය ; නැතහොත් එය එසේ වන්නක් ලෙස තේරුම් නොගත යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) අනුඡේදය යටතේ හෝ (ආ) ඡේදය යටතේ චූදිත තැනැත්තකු පිළිබඳ නඩු විභාගය පවත්වාගෙන යන අතරතුර දී නැතහොත් එය අවසන් වීමෙන් පසු, ඔහු අධිකරණය ඉදිරියෙහි පෙනී සිට, ඒ සම්පූර්ණ නඩු විභාගයට හෝ ඉන් කොටසකට හෝ තමාට පැමිණ සිටීමට නොහැකි වූයේ නිර්ව්‍යාජ හේතු නිසා බවට ඔහු විසින් අධිකරණය සෑහීමට පත් කරන ලද අවස්ථාවක -

(අ) නඩු විභාගය අවසන් වී නොමැති විටක, චූදිතයා අධිකරණය ඉදිරියෙහි පෙනී සිටි වේලාව තෙක් ඔහුට විරුද්ධව මෙහෙය වනු ලැබූ සාක්ෂි ඔහුට ඇසෙන සේ කියවිය යුතු අතර, ඒ සාක්ෂි දුන් සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ද ඔහුට ලබා දිය යුතු ය; තව ද

(ආ) නඩු විභාගය අවසන් වී ඇති විටක, වරදකරු කිරීමක් හා දණ්ඩන නියමයක් කර ඇත්නම්, ඒ වරදකරු කිරීම හා දණ්ඩන නියමය අධිකරණය විසින් අවලංගු කොට, චූදිතයාට අලුතින් නඩු විභාග කරන මෙන් ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(4) නඩු විභාගයේ දී චූදිත තැනැත්තා පැමිණ නොසිටිය දී නීතිඥවරයකු විසින් ඔහුගේ විත්ති වාචකය ඉදිරිපත් කරන ලද නම් (3) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

විත්තිකරු පැමිණ නොසිටිය දී නඩු විභාගය පවත්වනු ලබන අවස්ථාවේ දී කාර්ය පටිපාටිය.

**242**. විත්තිකරු පැමිණ නොසිටිය දී මහාධිකරණයෙහි පවත්වනු ලබන නඩු විභාග, අවස්ථාවෝචිත පරිදි, ජූරි සභාවක් ඇතිව හෝ ජූරි සභාවක් නැතිව නඩු විභාග සම්බන්ධයෙන් මේ පරිච්ඡේදයෙහි ඇති විධිවිධානවලට හැකි තාක් දුරට අනුකූලව පවත්වනු ලැබිය යුතු ය.

## XIX වන පරිච්ඡේදය

## සාක්ෂිකරුවන්ගේ සහ ජූරි සභිකයන්ගේ වියදම්

**243**. (1) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් - නියෝග සෑදීමට ඇති බලය.

(අ) මහාධිකරණය ඉදිරියෙහි පැවැත්වෙන යම් නඩු විභාගයක දී හෝ එවැනි යම් නඩු විභාගයකට පෙර පවත්වනු ලබන පරීක්ෂණයේ දී හෝ අල්ලස් පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියෙහි පැවැත්වෙන යම් නඩු විභාගයක දී හෝ සාක්ෂි දීම පිණිස කැඳවනු ලැබූ තැනැත්තන් විසින් පැමිණ සිටීමෙහි ලා හා සාක්ෂි දීමෙහි ලා නැතහොත් ඊට ආනුෂංගිකව දරන ලද වියදම්, ඒ තැනැත්තන් වෙත ඒකාබද්ධ අරමුදලින් ගෙවීම සඳහා හා ඒ ගෙවීම්වලට ඉඩ දිය හැක්කේ යම් කොන්දේසි මත ද ඒ කොන්දේසි පිළිබඳව; [1982 අංක 39 § 2]

(ආ) මහාධිකරණය ඉදිරියෙහි පැවැත්වෙන යම් නඩු විභාගයක දී ජූරි සභිකයන් වශයෙන් සේවය කිරීමට කැඳවන ලද තැනැත්තන්ගේ වියදම් ඒකාබද්ධ අරමුදලින් ගෙවීම සඳහා ;

(ඇ) ඒ වියදම්වල ප්‍රමාණ නිශ්චය කළ යුත්තේ හා ගෙවීම් කළ යුත්තේ යම් තැනැත්තන් විසින් ද ඒ තැනැත්තන් පිළිබඳව සහ ඒ වියදම්වල ප්‍රමාණ නිශ්චය කළ යුත්තේ හා ගෙවීම් කළ යුත්තේ යම් ආකාරයකට ද ඒ ආකාර පිළිබඳව;

විධිවිධාන සලස්වමින් නියෝග සාදනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියෝග සාදනු ලබන තුරු ඒ උපවගන්තියේ දැක්වෙන කාරණා සම්බන්ධයෙන් නියමිත දිනයේ දී බල පවත්නා නියෝග දිගට ම අදාළව බල පැවැත්විය යුතු ය.

## XX වන පරිච්ඡේදය

## ජූරි සභිකයෝ

ජූරි සභිකයකු වශයෙන් සේවය කිරීමට යටත්වීම

**244**. වයස අවුරුදු විසි එක සම්පූර්ණ වී සිටින්නා වූ ද අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සිංහල හෝ දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් හයකින් සමත් වී සිටින්නා වූ ද මාසයකට රුපියල් තුන් සියයකට නොඅඩු ආදායමක් ලබන්නා වූ ද ශ්‍රී ලංකාවෙහි පදිංචිව සිටින්නා වූ ද සෑම තැනැත්තකුම, 245 වන හා 246 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව, ජූරි සභිකයකු වශයෙන් සේවය කිරීමට සුදුස්සකු වන අතර එසේ සේවය කිරීමට යටත් විය යුතු ය. තව ද එයින් යම් තැනැත්තකු පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයකු ද වන්නේ නම් හෝ ඊට සමාන වෘත්තිය සුදුසුකමක් දරන්නේ නම්, එවැනි සෑම තැනැත්තකු ම, ඊට අතිරේකව, විශේෂ ජූරි සභිකයකු වශයෙන් සේවය කිරීමට සුදුස්සකු වන අතර එසේ සේවය කිරීමට යටත් විය යුතු ය.

ජූරි සභිකයන් ලෙස සේවය නොකළ යුතු තැනැත්තෝ.

**245**. පහත සඳහන් තැනැත්තන් ජූරි සභිකයන් ලෙස සේවය නොකළ යුතු යः -

(අ) ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා ;

(ආ) බලපවත්නා නීතිය යටතේ පිහිටුවා ඇති අධිකරණ වල විනිශ්චයකාරවරයෝ ;

(ඇ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෝ ;

(ඈ) විදේශීය ආණ්ඩුවල නියෝජිතවරයෝ ;

(ඉ) පාර්ලිමේන්තුවේ ද අධිකරණවල සහ අධිකරණ අමාත්‍යාංශයේ ද නිලධරයෝ හා අනෙකුත් සේවා නියුක්තයෝ ;

(ඊ) මේ සංග්‍රහය යටතේ පත් කරන ලද පරීක්ෂකවරයෝ ;

(උ) නීතිඥවරයෝ ;

(ඌ) පොලිස් හා රේගු නිලධරයෝ ;

(එ) ප්‍රව්‍රජිතයෝ ; (Priests)

ඒ) නීතිපතිවරයාගේ,බන්ධනාගාර කොමසාරිස්වරයාගේ හා පරිවාස සහ ළමා රක්ෂක සේවා කොමසාරිස්වරයාගේ දෙපාර්තමේන්තුවල සේවයෙහි නියුක්ත තැනැත්තෝ ;

(ඔ) එක් මාසයක් හෝ ඊට වැඩි කාලයක් බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳ ඇති තැනැත්තෝ ;

(ඕ) ජූරි සභිකයකුගේ කාර්යය ඉටු කිරීමට තමන් නුසුදුසු බවට පත් කරවන අන්දමේ ශාරීරික හෝ මානසික අශක්‍යතාවකින් යුත් හෝ ජූරි සභිකයකුගේ කාර්යය ඉටු කිරීමට තමන් නුසුදුසු බවට පත් කරවන අන්දමේ ආගමික ප්‍රතිපත්ති පිළිගෙන සිටින හෝ තැනැත්තෝ.

**246.** පහත සඳහන් තැනැත්තන් ඔවුන්ගේම කැමැත්ත ඇති ව මිස ජූරි සභිකයන් වශයෙන් සේවය නොකළ යුතු ය - තමන්ගේ ම කැමැත්ත ඇති ව මිස, ජූරි සභිකයන් ලෙස සේවය නොකළ යුතු තැනැත්තෝ.

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ පූර්ණ වැටුප් සහිත සේවයේ හෝ සක්‍රිය සේවයේ හෝ යෙදී සිටින තැනැත්තෝ ;

(ආ) තත් කාලයෙහි බල පවත්නා නීතිය යටතේ වෛද්‍යවරයන් ලෙස ලියාපදිංචි වී සිටින තැනැත්තෝ ;

(ඇ) ඖෂධ සංයෝජකයන් වශයෙන් නිසි පරිදි සුදුසුකම් ලබා සිටින හා ඇත්ත වශයෙන්ම එසේ සේවයේ යෙදී සිටින තැනැත්තෝ ;

(ඈ) උපත් හා මරණ රෙජිස්ට්‍රාර්වරයෝ හා නියෝජ්‍ය උපත් හා මරණ රෙජිස්ට්‍රාර්වරයෝ ;

(ඉ) වයස අවුරුදු හැට ඉක්මවා සිටින තැනැත්තෝ ;

ජූරි සේවයෙන් නිදහස් කිරීම හා ඒ සේවයට නොපැමිණීම සඳහා අවසර දීම.

**247.** (1) ජූරි සභාවක සේවය කිරීමට කැඳවනු ලැබ සිටින යම් තැනැත්තකු, එසේ තමා කැඳවනු ලැබූ දිනයට කලින් වූ මාස දොළහ ඇතුළත ජූරි සභිකයකු වශයෙන් සේවය කර ඇත්නම්, ජූරි සේවයෙන් නිදහස් කරනු ලැබීමට ඔහුට හිමිකම් තිබිය යුතු ය;

එසේ වුව ද -

(අ) නිදහස් කරනු ලැබීම සඳහා වූ ඉල්ලීම, ජූරි සේවයට පැමිණෙන ලෙස ඒ තැනැත්තා කැඳවනු ලැබූ ඉක්මනින් ම, රෙජිස්ට්‍රාර්වරයා නමට යවනු ලබන ලිපියකින් ඉදිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) ජූරි සභික මූල මණ්ඩලයේ සංඛ්‍යාව හොඳිසි ලෙස අඩු නොවන පරිදි ඒ නිදහස් කිරීමට ඉඩ දිය හැකි බව අධිකරණයේ මතය විය යුතු ය.

(2) යම් ජූරි සභික නාම ලේඛනයක නම ඇතුළත් කරනු ලැබූ යම් තැනැත්තකු විසින් එක්තරා කාලයක් ජූරි සභිකයකු ලෙස සේවයට නොපැමිණ සිටීමට තමාට අවසර දෙන ලෙසට ලියවිල්ලකින් වූ ඉල්ලීමට හේතුවන කරුණු ද සඳහන් කරමින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ හැකි අතර, ඒ සම්බන්ධයෙන් සුදුසු යයි තමා අදහස් කරන ආඥාවක් විනිශ්චයකාරවරයා විසින් කරනු ලැබිය හැකි ය.

(3) යම් දිනයක හෝ දිනවල හෝ යම් දිනයක යම් වේලාවක හෝ යම් ජූරි සභිකයකුට නොපැමිණ සිටීමට, කොන්දේසි රහිතව හෝ විනිශ්චයකාරවරයා විසින් නියම කරනු ලබන වෙනත් දිනයක හෝ වේලාවක හෝ ඔහු ජූරි සේවයෙහි නියුක්ත විය යුතු ය යන කොන්දේසිය පිට, විනිශ්චයකාරවරයා විසින් සාධාරණ හේතු මත අවසර දෙනු ලැබිය හැකි ය.

ජූරි සභිකයන් වශයෙන් සේවය කිරීමට යටත් තැනැත්තන්ගේ ලැයිස්තු පිළියෙල කිරීම.

**248.** (1) අවස්ථාවෝචිත පරිදි, ජූරි සභිකයන් වශයෙන් හෝ විශේෂ ජූරි සභිකයන් වශයෙන් හෝ සේවය කිරීමට සුදුසුකම් ඇති හා එසේ සේවය කිරීමට යටත්ව සිටින තැනැත්තන්ගේ සම්පූර්ණ නම්, රක්ෂා හා පදිංචි ස්ථාන දැක්වෙන, ඒ ජූරි සභිකයන්ගේ හෝ විශේෂ ජූරි සභිකයන්ගේ ලැයිස්තු සෑම දිසාපතිවරයකු විසින් ම ස්වකීය බල සීමාව තුළ පිහිටි එක් එක්

අධිකරණ කලාපය සම්බන්ධයෙන් පිළියෙල කර පවත්වාගෙන යා යුතු ය. ඒ ලැයිස්තු පිළියෙල කිරීමේ දී හෝ පවත්වාගෙන යාමේ හෝ කාර්යය සඳහා දිසාපතිවරයකු විසින් යම් තොරතුරක් ඉල්ලා සිටින ලද විට, එය සැපයීම ප්‍රතික්ෂේප කරන නැතහොත් නොසලකා හරින එසේත් නැත්නම් ඕනෑකමින් ම අසත්‍ය තොරතුරක් සපයන යම් තැනැත්තකු වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත්විය යුතු ය.

(2) අධිකරණ කලාප දෙකක් හෝ ඊට වැඩි ගණනක ලැයිස්තු ඒකාබද්ධ කරන ලෙස විධාන කිරීමට අමාත්‍යවරයාට බලය තිබිය යුතු ය.

(3) දිසාපතිවරයා විසින් සෑම වර්ෂයක ම ජූලි මාසයේ දී ඒ ලැයිස්තු මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

එක් එක් ලැයිස්තුවෙන් ජූරි සභික මූල මණ්ඩල පිළියෙල කළ යුතු බව.

**249.** (1) ජූරි සභිකයන්ගේ පැමිණ සිටීම අපේක්ෂා කරන්නේ යම් සැසිවාරයක් සඳහා ද, ඒ සැසි වාරවල දී මුලසුන දැරීම පිණිස පත් කරන ලද එක් එක් මහාධිකරණ විනිශ්චයකාරවරයා විසින්, ඒ සැසිවාර ආරම්භ කිරීමට යටත් පිරිසෙයින් සති දෙකකටවත් පෙර සහ ඉන් පසු කලින් කල ජූරි සභික මූල මණ්ඩලය අධිකරණ රීති මගින් නියම කර ඇති කාර්ය පටිපාටිය අනුව පිළියෙල කරනු ලැබිය යුතු ය. නියමිත දිනයට පෙරාතුවම වූ දිනයෙහි බලපැවැත් වූ කාර්ය පටිපාටියට අදාළ රීති, මේ උපවගන්තිය යටතේ රීති නියම කරනු ලබන තෙක් දිගටම බල පැවැත්විය යුතු ය.

(2) නොවැළැක්විය හැකි නම් මිස, ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවකට, යම් සංස්ථාවකට, යම් වෙළෙඳ හෝ ව්‍යාපාරික ආයතනයකට හෝ යම් වැවිල්ලකට හෝ යම් වත්තකට හෝ අයත් නැතහොත් එහි සේවයෙහි නියුක්ත කර ඇති තැනැත්තන් එක්කෙනකුට වැඩි සංඛ්‍යාවක් එකම මූල මණ්ඩලයකට ඇතුළත් කරනු නොලැබිය යුතු ය.

ජූරි සභිකයන්ට සිතාසි.

**250.** (1) ජූරි සභිකයකු වෙත යවන ලද සෑම සිතාසියක් ම, ඒ තැනැත්තා පැමිණ සිටීම සඳහා නියමිත දිනයට යටත් පිරිසෙයින් දින දහයකටවත් පෙර ඔහු වෙත භාර දිය යුතු

අතර ඒ සිතාසිය පිස්කල් විසින් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ විනිශ්චයකාරවරයා විසින් විධාන කරනු ලබන වෙනත් ආකාරයකින් හෝ භාර දෙනු ලැබිය හැකි ය.

(2) ඒ ජූරි සභිකයා යම් නිශ්චිත දිනයක පැමිණ සිටීම අවශ්‍ය නොවන බවත්, එහෙත් යම් දිනයක පැමිණ සිටින ලෙස විශේෂ දැන්වීමක් ලැබුණහොත් ඒදින පැමිණ සිටීමට ඔහු සූදානම්ව සිටිය යුතු බවත් සිතාසියෙහි සඳහන් කළ යුතු ය.

දෙසතියකට වඩා සේවය කිරීමට ජූරි සභිකයා බැඳී නොසිටින බව.

**251.** යම් ජූරි සභිකයකු එසේ ජූරි සභිකයකු වශයෙන් සේවයේ යෙදී සිටින නඩු විභාගයක් දෙසතියක් ඉකුත් වූ විටත් විභාග වෙමින් තිබේ නම් මිස, දෙසතියකට වැඩියෙන් සේවය කිරීමට කිසිම ජූරි සභිකයකුට බල කළ නොහැකි විය යුතු අතර, එසේ නඩු විභාගයක් විභාග වෙමින් තිබෙන විටක එය අවසන් වන තෙක් පමණක් ඔහුට එසේ බල කළ හැකි විය යුතු ය.

අවසර නොගෙන නොපැමිණෙන ජූරි සභිකයකු දඩයකට යටත් වන බව.

**252.** (1) ජූරි සභිකයකු වශයෙන් පැමිණ සිටින ලෙස කැඳවනු ලැබ, නිත්‍යානුකූල හේතුවක් නොමැතිව පැමිණ සිටීම පැහැර හරින්නා වූ හෝ පැමිණ සිටීමෙන් පසු අධිකරණයේ අවසර නොලබා නික්ම යන්නා වූ හෝ අධිකරණය අඩාළව කල් තැබීමෙන් පසුව රැස් වූ විට නැවත පැමිණ සිටින ලෙස ආඥාවක් කරනු ලැබ සිටිය දී එසේ පැමිණ සිටීම පැහැර හරින්නා වූ හෝ යම් තැනැත්තකු විනිශ්චයකාරවරයාගේ ආඥාවකින්, සුදුසු යයි විනිශ්චයකාරවරයා අදහස් කරන දඩයකට යටත් විය යුතු අතර ඒ දඩය ගෙවීම පැහැර හැරියහොත් දඩය ගෙවනු ලබන තෙක් බන්ධනාගාරගත කරනු ලැබීමට යටත් විය යුතු ය.

එසේ වුව ද, එසේ නියම කරනු ලැබූ යම් දඩයක් ලිහිල් කිරීම සුදුසු යයි විනිශ්චයකාරවරයා අදහස් කළහොත්, ඔහු විසින් එසේ කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) යම් තැනැත්තකු පැමිණ නොසිටිය දී ඔහුට එසේ දඩයක් නියම කරනු ලැබූ විටක, දඩය ගෙවන ලෙස හෝ දඩය නොගෙවීමට හේතු දින හතක් ඇතුළත අධිකරණය ඉදිරියෙහි දක්වන ලෙස හෝ ඔහුට නියම කරමින් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලිඛිත දැන්වීමක් ඒ තැනැත්තා වෙත නොපමාව ම යැවිය යුතු ය.

**253.** මහාධිකරණය විසින් දෙනු ලබන කිසිම නඩු තීන්දුවක් හෝ මහාධිකරණයේ කිසිම දණ්ඩන නියමයක්, ආඥාවක්, තීන්දුවක් හෝ මහාධිකරණය විසින් නැතහොත් මහාධිකරණයේ නැතහොත් මහාධිකරණයේ දී නැතහොත් මහාධිකරණය ඉදිරියේ පැවැත්වෙන වෙනත් කිසිම නඩු කටයුත්තක් හෝ එය අනුව කරන ලද යම් දෙයක්, යම් ජූරි සභිකයකුගේ සුදුසුකම්වල හෝ සුදුසුකම් සම්බන්ධයෙන් හෝ වූ යම් අඩුපාඩුවක් නැතහොත් දෝෂයක් හේතුකොටගෙන අවලංගු වේ යයි හෝ නීති විරෝධී වේ යයි හෝ තීරණය නොකළ යුතු අතර ඒ හේතුවෙන් ඒ නඩු තීන්දුව, දණ්ඩන නියමය, ආඥාව, තීන්දුව හෝ නඩු කටයුත්ත ගැන කිසිම ආකාරයකින් ප්‍රශ්න නොකළ යුතු ය.

ජූරි සභිකයන්ගේ ලැයිස්තුවෙහි හෝ මූල මණ්ඩලයෙහි හෝ යම් අඩුපාඩුවක් නැතහොත් හෝ දෝෂයක් තිබීම හේතු කොට ගෙන නඩු කටයුත්තක් අවලංගු නොවිය යුතු බව.

**254.** විශේෂ ජූරි සභාවක් කැඳවන ලෙස නියම කරමින් ආඥාවක් කරන ලද කවර හෝ විටක, ඒ ආඥාවෙහි සඳහන් සංඛ්‍යාවෙන් සමන්විත මූල මණ්ඩලයක් විශේෂ ජූරි සභිකයන්ගේ ලැයිස්තුවෙන් පිළියෙල කරනු ලැබිය යුතු අතර, ඉනික්බිති ඒ මූල මණ්ඩලයට ඇතුළත් නැනැත්තන් රෙජිස්ට්‍රාර්වරයා විසින් කැඳවනු ලැබිය යුතු ය. තව ද ඒ මූල මණ්ඩලය පිළියෙල කිරීම සම්බන්ධයෙන් සහ විශේෂ ජූරි සභාව කැඳවීම හා ඒ ජූරි සභාවේ සේවය සම්බන්ධයෙන් මේ පරිච්ඡේදයේ විධිවිධාන, අදාළ කළ හැකි තාක් දුරට, ඒ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එයේ ඒ මූල මණ්ඩලය පිළියෙල කිරීම සම්බන්ධයෙන් සහ විශේෂ ජූරි සභාව කැඳවීම හා ඒ ජූරි සභාවේ සේවය සම්බන්ධයෙන් අදාළ කළ යුතු ය.

විශේෂ ජූරි සභික මූල මණ්ඩලය.

## XXI වන පරිච්ඡේදය

## පරීක්ෂණ සහ නඩු විභාග පිළිබඳ සාමාන්‍ය විධිවිධාන

**255.** (1) මහේස්ත්‍රාත් අධිකරණයක පැවැත්වෙන යම් පරීක්ෂණයක හෝ නඩු විභාගයක කාර්යය සඳහා පැමිණ සිටින ලෙස යම් සාක්ෂිකරුවකුට බල කිරීමට හෝ යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කරන ලෙස බල කිරීමට හෝ අධිකරණ නියෝගයක් නිකුත් කරන මෙන් චෝදක විසින් හෝ චූදිතයා විසින් හෝ මහේස්ත්‍රාත්වරයාගෙන් ඉල්ලීමක් කරනු ලැබුවහොත්, මහේස්ත්‍රාත්වරයා විසින් වාර්තාගත කරනු ලැබිය

පැමිණ සිටින ලෙස සාක්ෂිකරුවන්ට බල කිරීමේ බලය.

යුතු හේතු අනුව එවැනි අධිකරණ නියෝගයක් නිකුත් කිරීම අනවශ්‍ය යයි ඔහු සැලකුවහොත් මිස, ඔහු විසින් අධිකරණ නියෝගයක් නිකුත් කළ යුතු ය.

(2) පැමිණ සිටින ලෙස යම් සාක්ෂිකරුවකුට බල කිරීමට අධිකරණ නියෝගයක් නිකුත් කරන මෙන් ඉල්ලුම් කර ඇත්තේ හිරිහැර කිරීමේ අදහසින් හෝ යුක්තියේ පරමාර්ථ ඉටු කිරීම ප්‍රමාද කිරීමේ නැතහොත් ඒ පරමාර්ථ ව්‍යර්ථ කිරීමේ අදහසින් හෝ බවට මහෙස්ත්‍රාත්වරයා සැක කළහොත්, ඒ සාක්ෂිකරුගේ සාක්ෂි වැදගත් සාක්ෂි යයි විශ්වාස කිරීම සඳහා සාධාරණ හේතු ඇති බවට තමා සෑහීමට පත් කරන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් ඉල්ලුම්කරුට නියම කරනු ලැබිය හැකි අතර,එසේ තමා සෑහීමට පත් කරනු නොලැබුවහොත්, (ප්‍රතික්ෂේප කිරීමට හේතු වාර්තාගත කරමින්) සාක්ෂිකරු කැඳවීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඒ සාක්ෂිකරු පැමිණ සිටීම සම්බන්ධයෙන් වැය වන වියදම් ගෙවීම සඳහා අවශ්‍ය යයි තමා අදහස් කරන යම් මුදලක් ඒ සාක්ෂිකරු කැඳවීමට පෙර තැන්පත් කරන ලෙස නියම කිරීම හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය හැකි ය.

අපසහායකුට සමාව දීම.

**256.** (1) මහාධිකරණය විසින් ම පමණක් නඩු විභාග කළ යුතු යම් වරදක් සම්බන්ධයෙන් වන විට, ඒ වරද පිළිබඳ පරීක්ෂණය පවත්වන මහෙස්ත්‍රාත්වරයා විසින්, ඒ පරීක්ෂණයට භාජන වී ඇති වරදට කෙළින්ම හෝ අන් අයුරකින් හෝ සම්බන්ධ වූයේ යයි නැතහොත් හවුල් වූයේ යයි විශ්වාස කරනු ලබන යම් තැනැත්තකුගේ සාක්ෂි ලබා ගැනීමේ අරමුණ ඇතිව, ඒ තැනැත්තාට සමාව දීම සඳහා නීතිපතිවරයා බලය ලබා ගැනීමෙන් පසුව ද, නැතහොත් නීතිපතිවරයා විසින් ම ද ඒ වරද සම්බන්ධයෙන් ඒ තැනැත්තා දන්නා සියලු අවස්ථානුගත කරුණු ඒ තැනැත්තා විසින් සම්පූර්ණයෙන් හා සත්‍ය ලෙස හෙළිදරව් කළ යුතු ය යන කොන්දේසිය මත, ඒ තැනැත්තාට සහ ඒ වරද කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන වරදකරු වශයෙන් හෝ අනුබල දුන් තැනැත්තකු වශයෙන් හෝ ඊට සම්බන්ධ වූ වෙනත් සෑම තැනැත්තකුටම සමාවක් දෙනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ සමාවක් පිළිගන්නා සෑම තැනැත්තකුගෙන්ම නඩුවේ සාක්ෂිකරුවකු වශයෙන් ප්‍රශ්න කරනු ලැබිය යුතු ය.

(3) ඒ තැනැත්තා ඇප පිට නිදහස්ව නොසිටී නම්, නඩු විභාගය අවසන් වන තුරු ඔහු අත් අඩංගුවේ රඳවා තබා ගත යුතු ය.

**257.** නඩු විභාගය ඉහළ අධිකරණය තැබීමෙන් පසුව සහ නඩු තීන්දුව ප්‍රකාශ කිරීමට පෙර කවර හෝ අවස්ථාවක, එවැනි යම් වරදකට කෙලින්ම හෝ අන් අයුරකින් හෝ සම්බන්ධ වී යයි නැතහොත් හවුල් වී යයි හෝ විශ්වාස කරනු ලබන යම් තැනැත්තකුගේ සාක්ෂි නඩු විභාගයේ දී ලබා ගැනීමේ අරමුණ ඇතිව, නීතිපතිවරයා විසින් ම ඒ තැනැත්තාට පෙර කී කොන්දේසිය ම මත සමාව දීම නැතහොත් සමාවක් දෙන ලෙස නීතිපතිවරයා විසින් මහෙස්ත්‍රාත්වරයාට බලය දීම හෝ කරනු ලැබිය හැකි ය.

මහෙස්ත්‍රාත්වරයා විසින් සමාව දෙන ලෙස විධාන කිරීමට නීතිපතිවරයා සතු බලය.

**258.** ඉහත සඳහන් වගන්ති දෙකින් කවර හෝ වගන්තියක් යටතේ සමාව දෙනු ලැබූ හා ඒ සමාව දෙන ලද්දේ යම් කොන්දේසියක් මත ද ඒ කොන්දේසිය ඒ සමාව පිළිගත් යම් තැනැත්තකු විසින් අත්‍යවශ්‍ය යම් දෙයක් ඕනෑකමින්ම වසන් කිරීමෙන් හෝ අසත්‍ය සාක්ෂි දීමෙන් හෝ කඩ කරනු ලැබූ අවස්ථාවක, ඒ සමාව එසේ දෙන ලද්දේ යම් වරදක් සම්බන්ධයෙන් ද ඒ වරද සඳහා හෝ ඒ කාරණයට ම සම්බන්ධ වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් ඔහු වරදකරු යයි පෙනී යන විටක ඒ වරද සඳහා හෝ ඔහුට විරුද්ධව නඩු විභාග කරනු ලැබිය හැකි ය.

සමාව දෙන ලද්දේ යම් කොන්දේසියක් මත ද ඒ කොන්දේසිය කඩ කිරීම.

**259.** (1) සමාවක් පිළිගත් යම් තැනැත්තකු විසින් කරන ලද ප්‍රකාශය, 258 වන වගන්තියෙහි සඳහන් පරිදි ඒ තැනැත්තා පිළිබඳ නඩු විභාගය පවත්වනු ලබන විට, ඔහුට විරුද්ධව සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් අසත්‍ය සාක්ෂි දීමේ වරද සඳහා වූ කිසිම නඩු පැවරීමක් සඳහා නීතිපතිවරයාගේ අනුමැතිය නොමැතිව අවසර දෙනු නොලැබිය යුතු ය.

සමාව දෙනු ලැබූ තැනැත්තාගේ ප්‍රකාශය ඔහු පිළිබඳ නඩු විභාගයේ දී ඔහුට විරුද්ධව සාක්ෂි වශයෙන් ඉදිරිපත් කළ හැකි බව.

**260.** යම් අපරාධ අධිකරණයක් ඉදිරියෙහි චෝදනා ලැබ සිටින සෑම තැනැත්තකු ම විසින් අයිතිවාසිකමක් වශයෙන්, මේ සංග්‍රහයෙහි සහ යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, නීතිඥවරයකු මාර්ගයෙන් විත්තිවාචක ඉදිරිපත් කරනු ලැබිය

විත්ති වාචක ඉදිරිපත් කිරීමට චූදිතයකුට ඇති අයිතිවාසිකම.

හැකි අතර අතෘප්තියට පත් සෑම පාර්ශ්වකරුවකුට ම නීතිඥවරයකු මගින් අධිකරණයේ දී තමා නියෝජනය කරනු ලැබීමේ අයිතිවාසිකම තිබිය යුතු ය.

සංස්ථාවක් වෙනුවෙන් අධිකරණයෙහි පෙනී සිටීම.

**261.** (1) යම් අධිකරණයක පැවැත්වෙන යම් නඩු විභාගයක චූදිතයා සංස්ථාවක් වන අවස්ථාවක, සංස්ථාවෙහි කළමනාකාර අධ්‍යක්ෂකවරයා විසින් හෝ ලේකම්වරයා හෝ ඒ හා සමාන නිලධරයකු විසින් හෝ කළමනාකාර අධ්‍යක්ෂකවරයා විසින් සංස්ථාවේ නියෝජිතයා ලෙස පත්කරනු ලැබූ තැනැත්තකු විසින් හෝ සංස්ථාව නියෝජනය කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව පත් කරනු ලැබූ යම් තැනැත්තකු විසින් සංස්ථාවක් නියෝජනය කරනු ලබන අවස්ථාවක-

(අ) චූදිතයාට විරුද්ධව ඇති චෝදනාවට පිළිතුරු දීම සහ යම් කාර්යයක් සඳහා චූදිතයාගේ කැමැත්ත අවශ්‍ය වන අවස්ථාවක ඒ කැමැත්ත දීම හෝ කැමැත්ත දීම ප්‍රතික්ෂේප කිරීම සහ චූදිතයාගේ සියලු අයිතිවාසිකම් හෝ ඉන් යම් අයිතිවාසිකමක් හෝ චූදිතයා වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම ඒ තැනැත්තා විසින් කළ හැකි ය.

(ආ) යම් දෙයක් චූදිතයා ඉදිරිපිට කළ යුතු බවට හෝ යම් දෙයක් චූදිතයාට ඇසෙන සේ කියවිය යුතු බවට හෝ පැවසිය යුතු බවට මේ සංග්‍රහයෙහි ඇති යම් නියමයක්, ඒ දෙය ඒ තැනැත්තා ඉදිරිපිට කළ යුතු බවට හෝ පැවසිය යුතු බවට වූ නියමයක් ලෙස තේරුම් ගත යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව පත් කරනු ලැබූ යම් තැනැත්තකු විසින් සංස්ථාවක් නියෝජනය නොකරනු ලබන අවස්ථාවක, සංස්ථාව වෙත සිතාසි භාර දී ඇති බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, නඩු විභාගයේ දී සංස්ථාව නියෝජනය කරනු නොලැබුව ද, නඩු විභාගය පවත්වාගෙන ගොස් එය නිම කිරීමට අධිකරණය බලය තිබිය යුතු ය.

**262.** චූදිතයා සිහි විකල තැනැත්තකු නොවන නමුත් ඔහුට නඩු කටයුතු වටහා දීමට නොහැකි නම්, අවස්ථාවෝචිත පරිදි මහෙස්ත්‍රාත් අධිකරණය හෝ මහාධිකරණය හෝ විසින් පරීක්ෂණය හෝ නඩු විභාගය හෝ පවත්වා ගෙන යනු ලැබිය හැකි අතර, ඒ පරීක්ෂණයේ ප්‍රතිඵලය වන්නේ ඒ චූදිතයා ඉහළ අධිකරණය විසින් විභාග කරනු ලැබීම පිණිස ඉදිරිපත් කිරීම නම්, නැතහොත් ඒ නඩු විභාගයේ ප්‍රතිඵලය වන්නේ චූදිතයා වරදකරු කිරීම නම්, ඒ අධිකරණය විසින් නඩුවේ අදාළ කරුණු පිළිබඳ වාර්තාවක් ද සමග නඩු කටයුතු වාර්තාව අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. තවද ඒ පිළිබඳව සුදුසු යයි අභියාචනාධිකරණය අදහස් කරන යම් ආඥාවක් අභියාචනාධිකරණය විසින් කළ යුතු ය. සිහි විකල තැනැත්තකු නොවන චූදිතයකුට නඩු කටයුතු නොවැටහෙන අවස්ථාවක අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.

**263.** (1) සාක්ෂිකරුවකු පැමිණ නොසිටීම නිසා හෝ වෙනත් යම් සාධාරණ හේතුවක් නිසා හෝ යම් පරීක්ෂණයක් හෝ නඩු විභාගයක් ආරම්භ කිරීම කල් තැබීම හෝ යම් පරීක්ෂණයක් හෝ නඩු විභාගයක් අඩාළව කල් තැබීම හෝ අවශ්‍ය වුවහොත් හෝ ප්‍රඥාගෝචර වුවහොත්, සුදුසු යයි අධිකරණය අදහස් කරන නියම මත සහ සාධාරණ යයි අධිකරණය අදහස් කරන යම් කාලයක් සඳහා ඒ පරීක්ෂණය හෝ නඩු විභාගය කල් තැබීමේ හෝ අඩාළව කල් තැබීමේ ආඥාවක් අධිකරණය විසින් කලින් කල කරනු ලැබිය හැකි අතර, චූදිතයා අත් අඩංගුවේ සිටී නම් ඔහු රිමාන්ඩ් භාරයේ තැබීමට නියම කිරීම හෝ ඔහු අත් අඩංගුවට ගැනීමට නියම කිරීම හෝ හෝ චූදිතයා අධිකරණයේ පෙනී සිටින බවට ඔහුගේම බැඳුම් ඔප්පුවක් මත නැතහොත් ඇපකරුවන්ගේ ඇප පිට ඔහු මුදා හැරීම හෝ අධිකරණය විසින් කළ හැකි ය. නඩු කටයුතු කල් තැබීමට හෝ අඩාළව කල් තැබීමට හෝ ඇති බලය. [2005 අංක 14 § 9]

එසේම තම දුරටත් ජූරි සභාවක් සහිතව හෝ ජූරි සභාවක් නොමැතිව මහාධිකරණයේ දී පවත්වනු ලබන සෑම නඩු විභාගයක් ම, ප්‍රායෝගිකව සිදු කළ හැකිතාක් දුරට දිනපතා පැවැත්විය යුතු ය.

(2) සිතාසි මගින් කළ කැඳවීමක් මත චූදිතයා අධිකරණය ඉදිරියට පැමිණ සිටින අවස්ථාවක, අධිකරණය විසින් වාර්තාගත කළ යුතු යම් හේතු මත අධිකරණය විසින් අන්‍යාකාර ආඥාවක් කරනු ලැබුවහොත් මිස චූදිතයා අධිකරණයේ පෙනී සිටින බවට ඔහුගේම බැඳුම් ඔප්පුවක් මත හෝ තමා අධිකරණයේ පෙනී සිටින බවට ඔහු දෙන හුදු පොරොන්දුවක් මත හෝ ඔහු මුදා හැරිය යුතු ය.

පැහැදිලි කිරීම - චූදිතයා විසින් වරදක් කර ඇති බවට සාධාරණ සැකයක් ඇති කර ගැනීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි ලබා ගෙන ඇත්නම් ඔහු රිමාන්ඩ් භාරයේ තැබීමෙන් වැඩි දුර සාක්ෂි ලබා ගැනීමට ඉඩ තිබේ නම්, ඒ වූ කලී ඔහු රිමාන්ඩ් භාරයේ තැබීමට සාධාරණ හේතුවකි.

(3) මහෙස්ත්‍රාත් අධිකරණයක පැවැත්වෙන පරීක්ෂණයක් හෝ නඩු විභාගයක්, යම් සාක්ෂිකරුවකු පැමිණ නොසිටීමේ හේතුව මත කල් තැබීම හැකහොත් අඩාළව කල් තැබීම, ඒ සාක්ෂිකරුගේ සාක්ෂි ඒ පරීක්ෂණයට හෝ නඩු විභාගයට වැදගත් වන බවට ද ඔහු අධිකරණය ඉදිරියට ගෙන්වීමට සෑහෙන උත්සාහයක් දරා ඇති බවට ද මහෙස්ත්‍රාත්වරයා පළමුකොට සෑහීමට පත් වුවහොත් මිස සහ ඒ සාක්ෂිකරුගේ නම ද ඔහු විසින් දෙනු ලැබේ යයි අපේක්ෂා කරන සාක්ෂිවල ස්වභාවය ද මහෙස්ත්‍රාත්වරයා විසින් වාර්තාගත කරනු ලැබීමෙන් පසුව මිස, නොකළ යුතු ය.

(4) මේ වගන්තිය යටතේ රිමාන්ඩ් භාරයට පත් කරනු ලබන හෝ අත් අඩංගුවේ රැඳවා තබනු ලබන සෑම තැනැත්තකුම, බන්ධනාගාර අධිකාරිවරයා නමට නිකුත් කරනු ලබන බලපත්‍රයක් මගින් එසේ රිමාන්ඩ් භාරයට පත් කිරීම හෝ අත් අඩංගුවේ තැබීම හෝ කරනු ලැබිය යුතු අතර, 264 වන වගන්තියේ විධිවිධාන ඒ සෑම බලපත්‍රයකට ම අදාළ විය යුතු ය.

සිර භාරයේ තැබීමේ බලපත්‍ර ආදිය නිකුත් කිරීමේ කාර්ය පටිපාටිය.

**264.** (1) 115 වන වගන්තිය, 159 වන වගන්තිය, 239 වන වගන්තිය හෝ 263 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන රැඳවා තැබීමේ හෝ රිමාන්ඩ් භාරයට පත් කිරීමේ සෑම බලපත්‍රයක් ම නියමිත ආකෘතියෙහි විය යුතු අතර, එය විනිශ්චයකාරවරයා විසින් අත්සන් කරනු ලැබිය යුතු ය. තව ද එය බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයකු වෙත භාර දෙනු ලැබිය යුතු ය. ඒ බලපත්‍රය තමාට ලැබුණු විට, ඒ නිලධරයා විසින් ඒ බලපත්‍රයේ නම් කර ඇති තැනැත්තා තම භාරයට ගෙන ඒ බලපත්‍රයෙහි නම් කරනු ලැබ ඇති බන්ධනාගාරයේ අධිකාරිවරයාගේ භාරයට ඒ තැනැත්තා පත් කරනු ලැබිය යුතු ය. තව ද එසේ ක්‍රියා කිරීමට හා එකී කාර්යය සඳහා එකී තැනැත්තා රැඳවා තබා ගැනීමට ඒ බලපත්‍රය බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ එකී නිලධරයාට පූර්ණ අධිකාරයක් වන්නේ ය.

(2) බලපත්‍රයෙහි නම් කරනු ලැබ ඇති තැනැත්තා ඉහත සඳහන් පරිදි ඒ අධිකාරීවරයා වෙත භාර දෙනු ලැබූ විට, රැඳවා තබා ගැනීමේ, අත් අඩංගුවේ තැබීමේ හෝ රිමාන්ඩ් භාරයට පත් කිරීමේ ආඥාව කළ අධිකරණය වෙනුවෙන් එකී අධිකාරීවරයා විසින් ඒ බලපත්‍රයෙහි සඳහන් යම් කාලයක් ඒ තැනැත්තා රඳවාගෙන, ඔහු ආරක්ෂා සහිතව අත් අඩංගුවෙහි තබා ගත යුතු අතර, ඒ බලපත්‍රයෙහි සඳහන් වෙනත් නියම අනුව ද ඒ තැනැත්තා සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් තමා වෙත නීත්‍යනුකූලව නිකුත් කරනු ලබන යම් ආඥාවක් අනුව ද ඒ අධිකාරීවරයා විසින් ක්‍රියා කළ යුතු ය.

**265.** (1) ඒ තැනැත්තා රඳවා තබා ගැනීම සඳහා හා අත් අඩංගුවේ තබා ගැනීම සඳහා 264 වන වගන්තියේ සඳහන් බලපත්‍රය බන්ධනාගාරයේ අධිකාරීවරයාට පූර්ණ අධිකාරියක් වන්නේ ය.

(2) විනිශ්චයකාරවරයා විසින් අත්සන් කරන ලද, බලපත්‍රයේ පිටපතක් නඩු වාර්තාවෙහි ගොනු කර තැබිය යුතු ය.

බලපත්‍රය බන්ධනාගාරයේ අධිකාරීවරයාට පූර්ණ අධිකාරයක් වන බව.

**266.** (1) මෙහි පහත දැක්වෙන වක්‍රයෙහි පළමුවන තීරයේ සහ දෙවන තීරයේ විස්තර කරනු ලැබ ඇති වරදක්, ඒ වරද සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක අපරාධ නඩුවක් නොපවත්නා විට, ඒ චක්‍රයේ තුන්වන තීරයේ අනුරූප සටහන්වල සඳහන් තැනැත්තා විසින් සමථයට පත් කළ හැකි අතර, ඒ පිළිබඳ අපරාධ නඩුවක් මහෙස්ත්‍රාත් අධිකරණයක පවත්නා විට ඒ අධිකරණයේ මහෙස්ත්‍රාත්වරයාගේ කැමැත්ත ඇතිව ඒ තැනැත්තා විසින් සමථයට පත් කළ හැකි ය.

## වකුය

| වරද | දණ්ඩ නීති සංග්‍රහයෙ අදාළ වගන්ති | වැරදි සමථයට පත් කළ හැක්කේ කවර තැනැත්තන් විසින් ද යන වග |
|---|---|---|
| කලහ කිරීම | 157 | කලහයට සම්බන්ධ තැනැත්තන් |
| ස්වෙච්ඡාවෙන්ම තුවාල සිදු කිරීම ස්වෙච්ඡාවෙන්ම බරපතල තුවාල සිදු කිරීම හෝ ප්‍රකෝපනයක් මත බරපතල තුවාල සිදු කිරීම ජීවිතයට අන්තරායදායක ක්‍රියාවලියකින් තුවාල සිදු කිරීම ජීවිතයට හෝ වෙනත් තැනැත්තන්ගේ පෞද්ගලික ආරක්ෂාවට අන්තරායදායක ක්‍රියාවලියකින් බරපතල තුවාල සිදු කිරීම. | 314, 315, 325, 316, 326, 329 | තුවාල කරන ලද්දේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා |
| යම් තැනැත්තකුට අයුතු ලෙස අවහිර කිරීම හෝ යම් තැනැත්තකු අයුතු ලෙස සිරකර තැබීම. | 332, 333 | අවහිර කරනු ලැබූ හෝ සිර කර තබනු ලැබූ තැනැත්තා |
| අඩන්තේට්ටම් කිරීම හෝ සාපරාධ බලහත්කාරය පෑම | 343, 346, 348, 349 | අඩන්තේට්ටම් කරනු ලැබූ හෝ සාපරාධ බලහත්කාරය පාන ලද තැනැත්තා |
| දේපළ වංචා ලෙස ව්‍යපහරණය කිරීම - ඉන් සිදු වූ පාඩුව පුද්ගලිකව තැනැත්තකුට සිදුවූ අවස්ථාවක | 386 | පාඩුව සිදුවූයේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා |
| අනර්ථය නිසාම වූ එකම පාඩුව හෝ අලාභය පුද්ගලිකව තැනැත්තකුට සිදුවූ අවස්ථාවක ඒ අනර්ථය | 409, 410 | පාඩුව සිදුවූයේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා |
| රුපියල් දහයකට නොවැඩි වටිනාකමක් ඇති යම් සතකු මැරීමෙන් හෝ එවැනි යම් සතකු අංග විකල කිරීමෙන් හෝ කරන ලද අනර්ථය - ඉන් පුද්ගලිකව තැනැත්තකුට පාඩු වූ අවස්ථාවක | 411 | පාඩුව සිදුවූයේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා |
| ගව ආදි සතුන් මැරීමෙන් හෝ අංග විකල කිරීමෙන් හෝ කරන ලද අනර්ථය - ඉන් පුද්ගලිකව තැනැත්තකුට පාඩු වූ අවස්ථාවක | 412 | පාඩුව සිදුවූයේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා |

| වරද | දණ්ඩ නීති සංග්‍රහයෙ අදාළ වගන්ති | වැරදි සමථයට පත් කළ හැක්කේ කවර තැනැත්තන් විසින් ද යන වග |
|---|---|---|
| සාපරාධ අයුතු ඇතුළු වීම, | 433 | දේපළෙහි සන්තකය දරන තැනැත්තා |
| ගෙයකට අයුතු ලෙස ඇතුළු වීම | 434 | |
| අපකීර්තිකරණය | 480 | අපකීර්තිකර ණයට පාත්‍ර වූ තැනැත්තා |
| යම් දෙයක් අපකීර්තිකර බව දැනුවත්ව එය මුද්‍රණය කිරීම හෝ කැටයම් කිරීම | 481 | |
| අපකීර්තිකර කරුණු ඇතුළත් මුද්‍රිත හෝ කැටයම් කරන ලද ද්‍රව්‍යයක් එහි අපකීර්තිකර කරුණු ඇතුළත් බව දැනුවත්ව විකිණීම | 482 | |
| සාමය කඩ කිරීමට තුඩු දෙන ලෙස ප්‍රකෝප කිරීමේ චේතනාවෙන් නින්දා කිරීම | 484 | නින්දාවට පාත්‍ර වූ තැනැත්තා |
| සාපරාධ භය ගැන්වීම | 486 | භය ගන්වනු ලැබූ තැනැත්තා |

(2) මේ වගන්තිය යටතේ යම් වරදක් සමථයට පත් කළ හැකි විටක, ඒ වරදට අනුබල දීම හෝ (වරද කිරීමට තැත් කිරීම වරදක් වන අවස්ථාවකාඒ) වරද කිරීමට තැත් කිරීම ඒ ආකාරයෙන් ම සමථයට පත් කරනු ලැබිය හැකි ය.

(3) බාල වයස්කාරයකු, මුග්ධයකු හෝ සිහි විකල තැනැත්තකු නො වූයේ නම්, මේ වගන්තිය යටතේ වරදක් සමථයට පත් කිරීමට බලය ඇති යම් තැනැත්තකු එසේ බාලවයස්කාරයකු, මුග්ධයකු හෝ සිහි විකල තැනැත්තකු වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් ගිවිසුම්වලට බැඳීමට බලය ඇති යම් තැනැත්තකු විසින් ඒ වරද සමථයට පත් කරනු ලැබිය හැකි ය.

[1988 අංක 11 S 5]

(4) * වෙනත් යම් නීතියක විධිවිධානවලට යටත් ව, මේ වගන්තිය යටතේ යම් වරදක් සමථයට පත් කිරීමේ දී -

(අ) ඒ වරද සම්බන්ධයෙන් වූ අපරාධ නඩුවක් මහෙස්ත්‍රාත් අධිකරණයේ නොපවත්නා විට, චූදිතයා නිදොස් කිරීමක බලය ඇත්තේ ය ;

(ආ) ඒ වරද සම්බන්ධයෙන් වූ අපරාධ නඩුවක් මහෙස්ත්‍රාත් අධිකරණයක පවත්නා විට, චූදිතයා නිදොස් කිරීමක බලය ඇත්තේ ය ;

(5) මේ වගන්තියෙහි විස්තර කර නොමැති කිසිම වරදක් සමථයට පත් කරනු නොලැබිය යුතු ය.

නඩු විභාගය හෝ පරීක්ෂණය පැවැත්වෙන අතරතුර මහෙස්ත්‍රාත්වරයා වෙනස් කිරීම.

**267.** යම් මහෙස්ත්‍රාත්වරයකු විසින් යම් පරීක්ෂණයක් හෝ නඩු විභාගයක සාක්ෂි සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් හෝ විභාග කර වාර්තාගත කිරීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් ඔහුගේ අධිකරණ බලය ක්‍රියාත්මක වීම නතර වන්නා වූ ද ඒ අධිකරණ බලය ඇති හා එය ක්‍රියාත්මක කරන වෙනත් මහෙස්ත්‍රාත්වරයකු ඔහු වෙනුවෙන් අනුප්‍රාප්ත වන්නා වූ ද කවර හෝ විටක, එසේ අනුප්‍රාප්ත වන මහෙස්ත්‍රාත්වරයා විසින්, තම පූර්වගාමියා එසේ වාර්තාගත කර තිබුණ හෝ තම පූර්වගාමියා විසින් කොටසක් වශයෙන් ද තමා විසින් කොටසක් වශයෙන් ද වාර්තාගත කරන ලද සාක්ෂි මත ක්‍රියා කළ හැකි ය ; නැතහොත් ඔහු විසින් සාක්ෂිකරුවන් නැවත කැඳවා, පරීක්ෂණය හෝ නඩු විභාගය නැවත ආරම්භ කළ හැකි ය ;

එසේ වුව ද යම් නඩු විභාගයක දී, දෙවන මහෙස්ත්‍රාත්වරයා තමාගේ නඩු කටයුතු ආරම්භ කරන විට, සාක්ෂිකරුවන් හෝ ඔවුන්ගෙන් යම් සාක්ෂිකරුවකු හෝ නැවත කැඳවා නැවත සාක්ෂි විභාග කරන ලෙස චූදිතයා විසින් ඉල්ලා සිටිය හැකි ය.

සැලකිය යුතු ප්‍රමාණයක හානියක් සිදු වී ඇති විටක ශ්‍රේෂ්ඨාධිකරණය විසින් හෝ අභියාචනාධිකරණය විසින් හෝ වරදකරු කිරීම නිෂ්ප්‍රභ කළ හැකි බව.

**268.** චූදිතයා වරදකරු කරනු ලැබුවේ යම් මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ද ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් සම්පූර්ණයෙන්ම වාර්තාගත කරනු නොලැබූ සාක්ෂි මත එසේ වරදකරු කිරීමේ හේතුවෙන් චූදිතයාට සැලකිය යුතු ප්‍රමාණයක හානියක් සිදු වී ඇතැයි ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ මතය වේ නම්, අභියාචනයක් ඉදිරිපත් කොට තිබුණත් නොතිබුණත්, ඒ වරදකරු

* 1991.11.28 දින සිට ක්‍රියාත්මක වේ. 1991.9.5 දින අංක 678/14 දරන අති විශේෂ ගැසට් පත්‍රය බලන්න.

කිරීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් හෝ අභියාචනාධිකරණය විසින් හෝ නිෂ්ප්‍රභ කළ හැකි අතර අලුතින් නඩු විභාගයක් පවත්වන ලෙස ද ආඥා කළ හැකිය.

අධිකරණයට පැමිණ සිටින වරදකරුවන් රඳවා තැබීම.

**269.** (1) අපරාධ අධිකරණයට පැමිණ සිටින යම් තැනැත්තකු එසේ පැමිණ සිටින්නේ සිර භාරයේ පසු වෙමින් සිටිය දී හෝ සිතාසියක් මත හෝ නොවුව ද, ඒ අධිකරණය විසින් සංජානනය කළ හැකි සහ ඒ තැනැත්තා විසින් කරන ලද බව සාක්ෂිවලින් පෙනී යන යම් වරදක් පිළිබඳ පරීක්ෂණයක් හෝ නඩු විභාගයක් හෝ පැවැත්වීමේ කාර්යය සඳහා ඒ අධිකරණය විසින් ඒ තැනැත්තා රඳවා තබා ගත හැකි අතර, ඔහු සිර භාරයට ගෙන හෝ කැඳවනු ලැබ හෝ ඇත්තාක් මෙන්, ඔහුට විරුද්ධව නඩු කටයුතු පවත්වා ගෙන යා හැකි ය.

(2) XV වන පරිච්ඡේදය යටතේ වූ පරීක්ෂණයක් පවත්වාගෙන යන අතරතුර දී හෝ නඩු විභාගයක් ආරම්භ කිරීමෙන් පසු හෝ රඳවා තබා ගැනීම කරනු ලැබූ විටක, ඒ තැනැත්තා සම්බන්ධයෙන් වූ නඩු කටයුතු අලුතින් ආරම්භ කළ යුතු අතර සාක්ෂිකරුවන්ගෙන් නැවත සාක්ෂි විභාග කළ යුතු ය.

ඉරු දිනවල හා නිවාඩු දිනවල නඩු කටයුතු පැවැත්විය හැකි බව.

**270.** යම් අපරාධ අධිකරණයක පැවැත් වූ යම් නඩු කටයුත්තක් හෝ යම් පරීක්ෂණයක්, ඉරු දිනයක හෝ රජයේ නිවාඩු දිනයක හෝ පැවැත්වීමේ හේතුව නිසා පමණක් ම බල රහිත නොවිය යුතු ය.

චූදිතයා වෙනුවෙන් උත්තරවාදියකු පෙනී නොසිටින්නේ නම්, චෝදක පක්ෂයේ නඩුව අධිකරණය විසින් චූදිතයාට පැහැදිලි කර දිය යුතු බව.

**271.** (1) සෑම නඩු විභාගයක දී ම, චූදිතයාගේ විත්ති වාචකය ඉදිරිපත් කරන ලෙස අධිකරණය විසින් චූදිතයාට නියම කරනු ලැබුවහොත් සහ නියම කරන ලද විට,ඔහු වෙනුවෙන් උත්තරවාදියකු පෙනී නොසිටින්නේ නම්, තමා වෙනුවෙන් තමා ම සාක්ෂි දීමට ඔහුට ඇති අයිතිවාසිකම පිළිබඳව ඒ අධිකරණය විසින් ඔහුට දැනුම් දිය යුතු ය. එසේ තමා වෙනුවෙන් ම ඔහු ඉදිරිපත් වුවහොත්, චෝදක පක්ෂයේ සාක්ෂිවලින් ඔහුට විරුද්ධව බලපාන ප්‍රධාන කරුණු තමාගේ නිදහස සඳහා පැහැදිලි කිරීම පිණිස ඔහුට අවස්ථාවක් ලැබෙන පරිදි, අධිකරණය විසින් ඒ ප්‍රධාන කරුණු කෙරෙහි ඔහුගේ අවධානය යොමු කළ යුතු ය.

(2) සෑම නඩු විභාගයක දී ම, චූදිත තැනැත්තා විසින් සාක්ෂි ඉදිරිපත් කරනු ලැබුවත්, නොලැබුවත් උත්තරදීමේ අයිතිවාසිකම චූදිතයාට තිබිය යුතු ය.

(3) යම් නඩු විභාගයක දී, යම් චූදිතයකු විසින් හෝ අවස්ථාවෝචිත පරිදි, යම් චූදිතයකුගේ භාර්යාව විසින් හෝ ස්වාමිපුරුෂයා විසින් හෝ සාක්ෂි දීම පැහැර හැරීම, චෝදක පක්ෂය විසින් අගති විවේචනයට හේතුවක් කර නොගත යුතු ය.

## XXII වන පරිච්ඡේදය

## පරීක්ෂණයවල දී සහ නඩු විභාගවල දී සාක්ෂි ගත යුතු හා සාක්ෂි වාර්තාගත කළ යුතු ආකාරය

චූදිතයා වෙනුවට සාක්ෂි ගත යුතු බව.

**272.** අන්‍යාකාර විධිවිධාන ප්‍රකාශිතව සලස්වා තිබෙන විට හැර, මේ සංග්‍රහය යටතේ වූ පරීක්ෂණවලදී නැතහොත් නඩු විභාගවල දී ගනු ලබන සියලු සාක්ෂි චූදිතයා ඉදිරිපිට දී හෝ ඔහු පෞද්ගලිකව පෙනී සිටීම අවශ්‍ය නොවන විට, ඔහුගේ උත්තරවාදියා ඉදිරිපිට දී හෝ ගනු ලැබිය යුතු ය.

සාක්ෂි සටහන් කර ගත යුතු ආකාරය.

**273.** (1) මහාධිකරණයේ දී සහ මහෙස්ත්‍රාත් අධිකරණවල දී, විනිශ්චයකාරවරයා විසින් ම හෝ ඔහු ඉදිරියේ දී සහ ඔහුට ඇසෙන පරිදි ඔහුගේ පෞද්ගලික මෙහෙයවීම හා අධීක්ෂණය යටතේ එක් එක් සාක්ෂිකරුගේ සාක්ෂි සටහන් කළ යුතු අතර, ඒ සාක්ෂි ඒ විනිශ්චයකාරවරයා විසින් අත්සන් කොට දිනය යෙදිය යුතු ය . තව ද පරීක්ෂණයක දී ඒ සාක්ෂි සටහන් කර ගනු ලබන අවස්ථාවක, යම් භාෂණ පරිවර්තකයකු සේවයේ නියුක්ත කර තිබේ නම්, ඒ භාෂණ පරිවර්තක විසින් ද ඒ සාක්ෂි අත්සන් කළ යුතු ය.

(2) සාමාන්‍යයෙන් ප්‍රශ්නයක හා පිළිතුරක ස්වරූපයෙන් නොව වෘත්තාන්තයක ස්වරූපයෙන් සාක්ෂි සටහන් කළ යුතු නමුත් විනිශ්චයකාරවරයා විසින් ස්වකීය අභිමතය පරිදි යම් විශේෂ ප්‍රශ්නයක් හා පිළිතුරක් සටහන් කර ගත හැකි ය ;

එසේ වුව ද, මහාධිකරණයේ දී, ප්‍රශ්නයක හා පිළිතුරක ස්වරූපයෙන් සාක්ෂි සටහන් කර ගනු ලැබිය යුතු ය.

(3) සාක්ෂිකරුවන් හඳුනා ගැනීමේ කාර්යය සඳහා එක් එක් සාක්ෂිකරු සම්බන්ධයෙන් පහත දැක්වෙන විස්තර වාර්තාගත කළ යුතු ය ;

(අ) සම්පූර්ණ නම,

(ආ) විවාහක ස්ත්‍රියක නම්, ස්වාමිපුරුෂයාගේ නම,

(ඇ) වයස,

(ඈ) රක්ෂාව,

(ඉ) පදිංචි ස්ථානය,

(ඊ) විදේශිකයකු නම්, ඔහුගේ ජාතිය.

(4) සාක්ෂිකරුවකුගේ සාක්ෂි සටහන් කර ගන්නා සෑම විනිශ්චයකාරවරයකු ම විසින් ඒ සාක්ෂිකරු සාක්ෂි දෙන අවස්ථාවේ දී ඔහුගේ හැසිරීමේ විලාසය සම්බන්ධයෙන් සැලකිය යුතු යයි තමා අදහස් කරන කරුණු වාර්තාගත කළ හැකි ය.

එක් එක් සාක්ෂිය අවසානයේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.

**274.** (1) පරීක්ෂණයක දී එක් එක් සාක්ෂිකරුගෙන් සාක්ෂි ගැනීම අවසන් කරනු ලැබීමෙන් පසු හෝ නඩුව ඉහළ අධිකරණයට යැවීමට පෙර යම් අවස්ථාවක දී හෝ චූදිත තැනැත්තා පැමිණ සිටී නම් චූදිත තැනැත්තා ඉදිරියේ දී හෝ ඔහු වෙනුවෙන් උත්තරවාදියකු පෙනී සිටී නම් ඔහුගේ උත්තරවාදියා ඉදිරියේ දී මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ සාක්ෂිය ඒ සාක්ෂිකරුට ඇසෙන සේ කියවිය යුතු ය. තව ද, අවශ්‍ය වන්නේ නම්, ඒ සාක්ෂිය නිවැරදි කළ යුතු ය.

(2) සාක්ෂිකරු විසින් දෙන ලද සාක්ෂිය ඔහුට ඇසෙන සේ කියවනු ලැබූ විට ඒ සාක්ෂියේ යම් කොටසක නිරවද්‍යතාව ඔහු නොපිළිගනී නම්, මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ සාක්ෂිය නිවැරදි කිරීම වෙනුවට සාක්ෂිකරු විසින් ඒ සම්බන්ධයෙන් කරන ලද විරෝධය පිළිබඳ සටහනක් ඒ සාක්ෂියෙහි ඇතුළත් කළ හැකි අතර, අවශ්‍ය යයි තමා අදහස් කරන කරුණු ද ඊට එකතු කළ යුතු ය.

(3) සාක්ෂි වාර්තාගත කරනු ලැබූ භාෂාව සාක්ෂිකරුට නොවැටහෙන්නේ නම්, ඒ සාක්ෂිය දෙනු ලැබුවේ යම් භාෂාවකින් ද ඒ භාෂාවෙන් ඒ සාක්ෂිය ඔහුට ඇසෙන සේ භාෂණ පරිවර්තනය කළ යුතු ය.

(4) සාක්ෂිය සාක්ෂිකරුට කියවා දෙනු ලැබීමෙන් පසු සහ නිවැරදි කිරීම් කිසිවක් කරන ලෙස සාක්ෂිකරු ඉල්ලා සිටියේ නම් ඒ සෑම නිවැරදි කිරීමක් ම කරනු ලැබීමෙන් හෝ සටහන් කරනු ලැබීමෙන් හෝ පසු, සාක්ෂිකරු විසින් ඒ දිවුරුම් සාක්ෂිය අත්සන් කළ යුතු ය. තව ද එසේ අත්සන් කිරීම සාක්ෂිකරු ප්‍රතික්ෂේප කළහොත් ඒ ප්‍රතික්ෂේප කිරීම මහේස්ත්‍රාත්වරයා විසින් වාර්තාගත කළ යුතු ය.

මහේස්ත්‍රාත්වරයා විසින් දිවුරුම් සාක්ෂි සහතික කිරීම.

(5) දිවුරුම් සාක්ෂියක් සාක්ෂිකරුවකුට ඇසෙන සේ කියවනු ලැබ, එය නිවැරදි බව ඒ සාක්ෂිකරු විසින් පිළිගනු ලැබූ විට, මහේස්ත්‍රාත්වරයා විසින් තම අත්සන හෝ කෙටි අත්සන යෙදූ පහත දැක්වෙන ආකාරයේ සහතිකයක් ඒ සාක්ෂිකරුගේ සාක්ෂියට ඈමිණිය යුතු ය. එනම්,

(අ) නඩු වාර්තාව තබා ගනු ලබන්නේ යම් භාෂාවකින් ද ඒ භාෂාවෙන් සාක්ෂි දුන් සාක්ෂිකරුවකු සම්බන්ධයෙන් වන විට, "විවෘත අධිකරණයේ දී චූදිතයා ඉදිරිපිට දී සාක්ෂිකරුට ඇසෙන සේ කියවන ලදුව, නිවැරදි බවට සාක්ෂිකරු විසින් පිළිගන්නා ලදී " යනුවෙන් ; සහ

(ආ) අනෙක් සාක්ෂිකරුවන් සම්බන්ධයෙන් වන විට, "විවෘත අධිකරණයේ දී චූදිතයා ඉදිරිපිට දී සාක්ෂිකරුට ඇසෙන සේ කියවා, භාෂණ පරිවර්තනය කරන ලදුව, නිවැරදි බවට සාක්ෂිකරු විසින් පිළිගන්නා ලදී " යනුවෙන්.

(6) චූදිතයා ඉදිරිපිට නොමැතිව සටහන් කර ගන්නා ලද දිවුරුම් සාක්ෂි සම්බන්ධයෙන් වූ විට "චූදිතයා ඉදිරිපිට දී " යන වචන (5) වන උපවගන්තියේ සඳහන් සහතිකයෙන් අස් කරනු ලැබිය යුතු ය.

(7) මේ වගන්තිය පෙසු නියම අනුව ඇත්වශයෙන්ම ක්‍රියා කර ඇති බව වෙනත් සාක්ෂි වලින් ඔප්පු වේ නම් එවැනි සහතිකයක් දිවුරුම් සාක්ෂියට අමුණා නොතිබීම, ඒ දිවුරුම් සාක්ෂිය සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරනු ලබන කවර හෝ නඩුවක දී එය සාක්ෂි වශයෙන් පිළිගැනීමෙහි ලා බාධාවක් නොවිය යුතු ය.

චූදිතයාට සාක්ෂි භාෂණ පරිවර්තනය කිරීම.

**275.** (1) චූදිතයාට නොවැටහෙන භාෂාවකින් යම් සාක්ෂියක් දෙනු ලැබූ හා ඔහු පුද්ගලිකවම පැමිණ සිටින නමුත් නීතිඥවරයකු විසින් නියෝජනය නොකරනු ලබන කවර විටක දී වුවද, ඒ සාක්ෂිය විවෘත අධිකරණයේ දී ඔහුට වැටහෙන භාෂාවකින් ඔහුට භාෂණ පරිවර්තනය කර දිය යුතු ය.

(2) විධිමත් ලෙස ඔප්පු කිරීමේ කාර්යය සඳහා ලේඛන ඉදිරිපත් කරනු ලබන විට, එයින් අවශ්‍ය විය හැකි යයි අධිකරණයට පෙනී යන කොටසක් පමණක් අධිකරණය විසින් සිය අභිමතය පරිදි භාෂණ පරිවර්තනය කිරීමට සැලැස්විය යුතු ය.

ලේඛනමය සාක්ෂි

**276.** (1) මහෙස්ත්‍රාත් අධිකරණයක පවත්වනු ලබන සෑම පරීක්ෂණයක දී ම සහ නඩු විභාගයක දී ම, සියලු ලේඛනමය සාක්ෂි නඩු වාර්තාවට අමුණා තැබිය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයා විසින් එහි තම කෙටි අත්සන යොදා ඒවා තමා වෙත ලැබුණු දිනය ද එහි යෙදිය යුතු ය.

(2) යම් ලේඛනයක් අධිකරණයේ භාෂාව නොවන වෙනත් භාෂාවකින් වේ නම්, අධිකරණයේ භාෂාවෙන් වූ එහි පරිවර්තනයක් හෝ එහි වැදගත් යයි සලකනු ලබන කොටස් අධිකරණයේ භාෂාවට පරිවර්තනය කර හෝ ඒ සමඟ අමුණා තිබිය යුතු ය.

(3) විනිශ්චයකාරවරයකු විසින් යම් ලේඛනයක් තමා හොඳින් දන්නා භාෂාවකට පරිවර්තනය කරන ලෙස නියම කරනු ලැබීම නීත්‍යනුකූල වේ.

(4) යම් ලේඛනමය සාක්ෂියක් නඩු වාර්තාවට ගොනු කිරීමට නොහැකි හෝ ගොනු කිරීමට අපහසු හෝ ස්වභාවයකින් යුක්ත වන විට, එය හඳුනා ගැනීමේ කාර්යය සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් ඊට තම කෙටි අත්සන යෙදීමෙන් පසු එය ඉදිරිපත් කළ තැනැත්තා වෙත එය ආපසු දිය හැකි ය. නඩු විභාගය පවත්වන අධිකරණය වෙත එය නැවත ඉදිරිපත් කිරීමට ඒ තැනැත්තා නීතියෙන් බැඳී සිටිය යුතු ය. එහෙත් මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ ලේඛනයේ අදාළ විය හැකි යම් කොටසක පිටපතක් සකස් කරනු ලැබීමට සහ ඒ පිටපත නඩු වාර්තාවට ගොනු කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

චූදිතයාගේ ප්‍රකාශය හෝ සාක්ෂි විභාගය වාර්තාගත කළ යුතු ආකාරය

**277.** (1) XV වන පරිච්ඡේදය යටතේ පරීක්ෂණයක් පවත්වාගෙන යන අතරතුර කවර හෝ විටක, චූදිතයකු විසින් මහෙස්ත්‍රාත්වරයකු වෙත ප්‍රකාශයක් කරනු ලැබුවහොත්, ඒ ප්‍රකාශය සම්පූර්ණයෙන්ම වාර්තාගත කොට ඒ වාර්තාව ඔහුට

පෙන්වීම හෝ ඇසෙන සේ කියවීම හෝ කළ යුතු ය. එය ලියා ඇති භාෂාව චූදිතයාට නොවැටහේ නම්, ඔහුට වැටහෙන භාෂාවකින් එය ඔහුට භාෂණ පරිවර්තනය කරනු ලැබිය යුතු අතර ප්‍රකාශය පැහැදිලි කිරීමට හෝ ඊට යමක් එකතු කිරීමට හෝ ඔහුට නිදහස තිබිය යුතු ය.

(2) සත්‍ය යයි චූදිතයා ප්‍රකාශ කර සිටින දෙයට ඒ සම්පූර්ණ ප්‍රකාශයම අනුකූල කරනු ලැබූ විට, මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ වාර්තාව අත්සන් කළ යුතු අතර, තමා ඉදිරියේ දී සහ තමාට ඇසෙන සේ ඒ ප්‍රකාශය වාර්තාගත කරන ලද බවත් චූදිතයාගේ සම්පූර්ණ ප්‍රකාශයම නිවැරදිව ඒ වාර්තාවේ ඇතුළත් ව ඇති බවත් මහෙස්ත්‍රාත්වරයා විසින් ස්වකීය අත්සන යොදා සහතික කළ යුතු ය.

(3) ඒ ප්‍රකාශය චූදිතයා විසින් අත්සන් කළ යුතු ය ; නැතහොත් තම ලකුණ යෙදීමෙන් එම ප්‍රකාශය සහතික කළ යුතු ය; තව ද එසේ කිරීම ඔහු ප්‍රතික්ෂේප කළහොත්, එම ප්‍රතික්ෂේප කිරීම මහෙස්ත්‍රාත්වරයා විසින් වාර්තාගත කළ යුතු ය.

මූලාසනාරූඪ විනිශ්චයකාරවරයා විසින් සාක්ෂි පිළිබඳ සටහන් ගත යුතු බව හෝ සටහන් ගැනීමට සැලැස්විය යුතු බව.

**278.** මහාධිකරණය ඉදිරියේ විභාග කරනු ලබන නඩුවල දී, මූලාසනාරූඪ විනිශ්චයකාරවරයා විසින් සාක්ෂි පිළිබඳ ලිඛිත සටහන් ගැනීම හෝ ගැනීමට සලස්වනු ලැබීම හෝ කළ යුතු ය

## XXIII වන පරිච්ඡේදය

## නඩු තීන්දුව

නඩු තීන්දුව දිය යුතු ආකාරය.

**279.** මේ සංග්‍රහය යටතේ වූ සෑම නඩු විභාගයක දී ම, තීන්දුව වාර්තාගත කළ වහාම හෝ 203 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි හැර, පාර්ශ්වකරුවන්ට හෝ ඔහුගේ උත්තරවාදීන්ට යථා පරිදි දැනුම් දෙනු ලැබිය යුතු, යම් පසු අවස්ථාවක හෝ, නඩු තීන්දුව විවෘත අධිකරණයේ දී ප්‍රකාශ කරනු ලැබිය යුතු ය. නඩු විභාගයේ දී චූදිතයා පුද්ගලිකව පැමිණ සිටීම අවශ්‍ය කරනු නොලැබ ඇති සහ දණ්ඩන නියමයක් දඩයක් පමණක් වූ අවස්ථාවල දී නැතහොත් නඩු විභාගයට චූදිතයා පැමිණ නොසිටි අවස්ථාවල දී හැර, චූදිතයා අත් අඩංගුවේ සිටී නම් නඩු තීන්දුවට සවන් දීමට ඔහු ගෙන යා යුතු

අතර, ඔහු අත් අඩංගුවේ නොසිටී නම් නඩු තීන්දුවට සවන් දීමට පැමිණ සිටින ලෙස ඔහුට නියම කළ යුතු ය.

**280**. මහාධිකරණයේ දී මරණීය නඩු තීන්දුව ප්‍රකාශ කිරීමට පෙර තමාට විරුද්ධව මරණීය නඩු තීන්දු ව ප්‍රකාශ නොකළ යුතු බවට හේතුවක් වශයෙන් කිසිවක් කීමට තිබේ දැයි චූදිතයාගෙන් ඇසිය යුතු ය. ව්‍යාහරණය.

**281**.* මරණීය දණ්ඩනයෙන් දඬුවම් කළ හැකි යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු වයස අවුරුදු දහ අටට අඩු තැනැත්තකු බව අධිකරණයට පෙනී ගිය අවස්ථාවක, අධිකරණය විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 53 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති දණ්ඩන නියමය, මරණීය දණ්ඩනය වෙනුවට ඒ තැනැත්තා විෂයෙහි ප්‍රකාශ කළ යුතු ය.

වයස අවුරුදු දහ අටට අඩු තැනැත්තන් සඳහා මරණීය දණ්ඩනය වෙනුවට රඳවා තැබීමේ දඬුවම . [1980 අංක 52 § 11]

**282**. (1) මරණීය දණ්ඩනයෙන් දඬුවම් කළ හැකි වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ ස්ත්‍රියක තමා ගර්භණියකැයි කියා සිටින අවස්ථාවක හෝ ස්ත්‍රියක එසේ වරදකරු කරනු ලැබුවේ යම් අධිකරණයක් ඉදිරියේ ද ඒ අධිකරණය විසින් ඒ ස්ත්‍රිය ගර්භණියක ද නැද්ද යන ප්‍රශ්නය නිශ්චය කිරීම යෝග්‍ය යයි කල්පනා කරන අවස්ථාවක, ඒ ස්ත්‍රිය විෂයෙහි දණ්ඩන නියමය නියම කිරීමට පෙර -

මරණීය දණ්ඩනයෙන් දඬුවම් කළ හැකි වරදක් සම්බන්ධයෙන් වරදක් කරනු ලැබූ ස්ත්‍රියක ගර්භණියක් බව කියා සිටින අවස්ථාවක කාර්ය පටිපාටිය.

(අ) ඒ ස්ත්‍රිය වරදකරු කරන ලද්දේ මහාධිකරණයේ විනිශ්චයකාරවරයන් තිදෙනකු විසින් ජූරි සභාවක් නැතිව විශේෂ නඩු විභාගයකින් පසුව නම් ඒ විනිශ්චයකාරවරයන් විසින් ; හෝ

(ආ) ඒ ස්ත්‍රිය වරදකරු කරන ලද්දේ ජූරි සභාවක් මගින් පවත්වනු ලැබූ නඩු විභාගයකින් පසුව නම්, ඇය වරදකරු කිරීමේ තීරණය දුන් ජූරි සභාව විසින් (මෙහි දී ඒ ජූරි සභාවේ සභිකයන් නැවත දිවුරවීම අවශ්‍ය නොවේ.)

ඒ ප්‍රශ්නය තීරණය කළ යුතු ය.

---

* 1979 ජූලි මස 2 වන දිනට අතීතයට බලපාන පරිදි. [ 1980 අංක 52 දරන පනතේ 16 වන වගන්තිය බලන්න.]

(2) (1) වන උපවගන්තියේ (ඇ) ජේදය යටතට පත් වන අවස්ථාවල දී -

(අ) ස්ත්‍රිය වරදකරු කරනු ලැබීමෙන් පසු සහ ජූරි සභාව විසින් ඇය ගර්භණියක ද නැද්ද යන ප්‍රශ්නය පිළිබඳව තීන්දුවක් දීමට පෙර, ඒ පරීක්ෂණය පැවැත්වුණු කාලය මුළුල්ලේම යම් ප්‍රමාණවත් හේතුවක් නිසා පැමිණ සිටීමට යම් ජූරි සභිකයකුට නොහැකි වුවහොත් හෝ යම් ජූරි සභිකයකු නොපැමිණියහොත් සහ ඔහුට පැමිණ සිටීමට බල කළ නොහැකි නම් හෝ සාක්ෂි දෙනු ලබන්නේ යම් භාෂාවකින් ද ඒ භාෂාව හෝ සාක්ෂි භාෂණ පරිවර්තනය කරනු ලබන විටක, එය එසේ භාෂණ පරිවර්තනය කරනු ලබන්නේ යම් භාෂාවකට ද ඒ භාෂාව හෝ තේරුම් ගැනීමට යම් ජූරි සභිකයකුට නොහැකි යයි පෙනී ගියහොත්, අලුත් ජූරි සභිකයකු එකතු කරන ලෙස නැතහොත් ජූරි සභාව විසුරුවා හැර අලුත් ජූරි සභාවක් තෝරා ගන්නා ලෙස අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය ;

(ආ) නිශ්චය කිරීමට ඇති ප්‍රශ්නය පිළිබඳ ව ඒකමතිකව හෝ දෙකට පහ යන ප්‍රමාණයට නොඅඩු වැඩි ඡන්දයෙන් හෝ එකගත්වයට පැමිණීමට ජූරි සභාවට නොහැකි වේ නම් නැතහොත් ජූරි සභාව විසුරුවා හැර අලුත් ජූරි සභාවක් පත් කිරීම යුක්තිය ඉටු කිරීම පිණිස අවශ්‍ය වන බව අධිකරණයේ මතය වේ නම් අධිකරණය විසින් ජූරි සභාව විසුරුවා හැර අලුත් ජූරි සභාවක් තෝරා පත් කර ගන්නා ලෙස ආඥා කළ හැකි ය.

(ඇ) මේ උපවගන්තියේ (අ) ජේදය යටතේ හෝ (ආ) ජේදය යටතේ අලුත් ජූරි සභාවක් තෝරා ගන්නා ලෙස අධිකරණය විසින් ආඥා කරනු ලබන අවස්ථාවක දී, නඩු විභාගයක් සඳහා තෝරා පත් කර ගනු ලබන ජූරි සභාවක් සංයුක්ත වන ආකාරයෙන් ම ඒ ජූරි සභාව ද සංයුක්ත විය යුතු ය. ඒ සෑම ජූරි සභාවක්ම සහ මේ උපවගන්තියේ (අ) ජේදය යටතේ අලුතින් එකතු කරන ලද සෑම අලුත් ජූරි සභිකයකුම, අධිකරණය විසින් විධාන කරනු ලබන ආකාරයකින් දිවුරවනු ලැබිය යුතු ය.

(3) ස්ත්‍රිය විසින් හෝ චෝදක පක්ෂය විසින් හෝ අවශ්‍යතාවෝචිත පරිදි, විනිශ්චයකාරවරයන්ට නැතහොත් ජූරි සභාවට ඉදිරිපත් කරනු ලබන සාක්ෂි මත, ඒ ස්ත්‍රිය ගර්භණී ද නැද්ද යන ප්‍රශ්නය ඒ විනිශ්චයකාරවරයන් හෝ ජූරි සභාව හෝ විසින් නිශ්චය කළ යුතු ය. තව ද ඒ ස්ත්‍රිය ගර්භණී බව, අවශ්‍යතාවෝචිත පරිදි, ඒ විනිශ්චයකාරවරයන් හෝ ජූරි සභාව හෝ සෑහීමට පත් වන අන්දමට නියත වශයෙන් ම ඔප්පු කරනු ලැබුවහොත් මිස ඒ විනිශ්චයකාරවරයන් හෝ ජූරි සභාව හෝ විසින් ඒ ස්ත්‍රිය ගර්භණී නොවන බව තීරණය කළ යුතු ය.

(4) ස්ත්‍රිය ගර්භණී බව තීරණය කරන ලද්දේ නම්, අධිකරණය විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 54 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමය, මරණීය දණ්ඩනය වෙනුවට ඒ ස්ත්‍රිය විෂයයෙහි ප්‍රකාශ කළ යුතු ය.

ගර්භණී ස්ත්‍රියක විෂයයෙහි මරණීය දණ්ඩනය වෙනුවට බන්ධනාගාරගත කිරීමේ දඬුවම .

**283.** ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අභියාචනාධිකරණය හෝ නොවන අධිකරණවල නඩු තීන්දු සම්බන්ධයෙන් පහත දැක්වෙන විධිවිධාන අදාළ විය යුතු ය ; -

ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අභියාචනාධිකරණය හෝ නොවන අධිකරණවල නඩු තීන්දු.

(1) නඩුව විභාග කළ විනිශ්චයකාරවරයා විසින් නඩු තීන්දුව ලිවිය යුතු අතර, එය ප්‍රකාශ කරනු ලබන අවස්ථාවේ දී විවෘත අධිකරණයේ දී, ඔහු විසින් ඊට දිනය යොදා එය අත්සන් කළ යුතු ය. තව ද අභියාචනයක් කළ හැකි අවස්ථාවල දී, නිශ්චය කළ යුතු වූ කරුණ හෝ කරුණු ද ඒ පිළිබඳ තීරණයට හේතු ද එහි ඇතුළත් විය යුතු ය.

(2) චූදිතයා වරදකරු කරන ලද්දේ යම් වරදක් සම්බන්ධයෙන් ද ඒ වරද සහ චූදිතයා එසේ වරදකරු කරන ලද්දේ නීතියේ යම් වගන්තියක් යටතේ ද ඒ වගන්තිය හා ඔහුට නියම කරන ලද දඬුවම ද නඩු තීන්දුවෙහි සඳහන් කළ යුතු ය.

(3) එය වූ කලී නිදොස් කිරීමේ නඩු තීන්දුවක් නම්, චූදිතයා නිදොස් කරන ලද්දේ කවර වරදකින් ද යන වග ඒ නඩු තීන්දුවෙහි සඳහන් කළ යුතු ය.

(4) නඩු තීන්දුවක් එසේ අත්සන් කරනු ලැබූ විට, ඒ නඩු තීන්දුව දුන් අධිකරණය විසින් එය එසේ වෙනස් කිරීම හෝ සමාලෝචනය කිරීම හෝ කළ නොහැකි ය ;

එසේ වුව ද, ඕනෑම වේලාවක දී ලිපි දෝෂයක් නිවැරදි කළ හැකි අතර, වෙන යම් දෝෂයක් ඒදින අධිකරණය විසිර යාමට පෙර ඕනෑම වේලාවක දී නිවැරදි කළ හැකි ය.

(5) නඩු තීන්දුව බලපාන චූදිතයාට එය පැහැදිලි කර දිය යුතු අතර, ඔහු එහි පිටපතක් ඉල්ලුම් කළහොත් අප්‍රමාදව එහි පිටපතක් ඔහුට දිය යුතු ය.

(6) මුල් පිටපත නඩු වාර්තාව සමග ගොනු කර තැබිය යුතු ය.

විකල්ප නඩු තීන්දුව.

**284.** වරදකරු කිරීම දණ්ඩ නීති සංග්‍රහය යටතේ කරන ලද විටක හා වරද පත් වන්නේ ඒ සංග්‍රහයේ වගන්ති දෙකකින් කවර වගන්තියක් යටතට ද නැතහොත් එකම වගන්තියේ කොටස් දෙකකින් කවර කොටසක් යටතට ද යන්න සැක සහිත වන විටක, ඒ බව අධිකරණය විසින් පැහැදිලිවම ප්‍රකාශ කර විකල්ප වශයෙන් නඩු තීන්දුව නියම කළ යුතු ය.

මරණීය දණ්ඩනය සහ කස පහර දීම. [2005 අංක 21 § 3]

**285.** (1) යම් තැනැත්තකුට මරණීය දණ්ඩනය නියම කළ විට, ජනාධිපතිවරයා විසින් තීරණය කරනු ලබන දිනයක දී හා ස්ථානයක දී, ඒ තැනැත්තා මිය යන තුරු ඔහු බෙල්ලෙන් එල්ලා තැබිය යුතු යයි ඒ දණ්ඩන නියමයෙන් විධාන කළ යුතු ය.

*285 (2) ඉවත් කර ඇත.

## XXIV වන පරිච්ඡේදය

## දණ්ඩන නියම හා ඒවා ක්‍රියාවේ යෙදවීම

මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කිරීම පිළිබඳ විධිවිධාන.

**286.** පහත දැක්වෙන විධිවිධාන මරණීය දණ්ඩන සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතු ය -

(අ) දණ්ඩන නියමය ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු, එකී දණ්ඩනයට නියම කරනු ලැබූ තැනැත්තා බන්ධනාගාරයක අධිකාරිවරයාගේ භාරයට පත් කිරීම සඳහා වූ බලපත්‍රයක් ඒ දණ්ඩන නියමය කළ විනිශ්චයකාරවරයා විසින් හෝ ඔහුගේ සම විනිශ්චයකාරවරයා විසින් හෝ ඔහු වෙනුවට අනුප්‍රාප්ත විනිශ්චයකාරවරයා විසින් හෝ පිළියෙළ කොට අත්සන්

* 2005 අංක 21, පනතේ 3 වන වගන්තිය මගින් 285 (2) වගන්තිය ඉවත් කර ඇත.

කළ යුතු ය. ඒ සෑම බලපත්‍රයක් ම, දණ්ඩන නියමය ක්‍රියාත්මක කරනු ලබන තෙක්, ඒ වරදකරු රඳවා තැබිය යුතු බන්ධනාගාරයේ අධිකාරීවරයා වෙත යොමු කළ යුතු අතර, ඒ සෑම බලපත්‍රයකට ම 290 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය;

(ආ) මරණීය දණ්ඩනය ක්‍රියාවේ යොදවනු ලැබීම සඳහා හෝ ක්‍රියාවේ යොදවනු නොලැබීම සඳහා හේතු කිසිවක් තිබේ ද, එසේ නම් ඒ කවරේද යන්න පිළිබඳ ව තම මතය දක්වමින් තමා විසින් අත්සන් කරනු ලැබූ ලිඛිත වාර්තාවක් ද සමග, නඩු විභාගයේ දී මුලසුන දැරූ මහාධිකරණ විනිශ්චයකාරවරයා විසින් සටහන් කර ගන්නා ලද සාක්ෂි පිළිබඳ සටහන්, මරණීය දණ්ඩනය ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින්, ඒ විනිශ්චයකාරවරයා විසින් හෝ ඔහු නොමැති විටක නැතහොත් ඔහුට අශක්‍යතාවක් ඇති විට, ඔහුගේ සම විනිශ්චයකාරවරයා විසින් හෝ ඔහු වෙනුවට අනුප්‍රාප්ත විනිශ්චයකාරවරයා විසින් හෝ ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) එකී වාර්තාව සලකා බැලීමෙන් පසු ඒ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් කරනු ලබන යම් නියමයක් ජනාධිපතිවරයා විසින් මහාධිකරණය වෙත දැන්විය යුතු ය ;

(ඈ) බලපත්‍රය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කරන ලෙස නියම කිරීම හෝ එය ක්‍රියාත්මක කිරීම සඳහා දිනයක් හා වේලාවක් සහ ස්ථානයක් නියම කිරීම හෝ ජනාධිපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය ;

(ඉ) (i) බන්ධනාගාරයේ අධිකාරීවරයා හෝ ජේලර්වරයකු ද, බන්ධනාගාර වෛද්‍ය නිලධරයා ද, අවස්ථාවෝචිත පරිදි, අධිකාරීවරයා හෝ ජේලර්වරයා විසින් නියම කරනු ලබන බන්ධනාගාරයේ වෙනත් යම් නිලධරයන් ද දණ්ඩන නියමය ක්‍රියාත්මක කරනු ලබන තව ද දණ්ඩන නියමය ක්‍රියාත්මක කරනු ලබන්නේ බන්ධනාගාරය ඇතුළත නම්, යම් පූජකවරයකු ද ඒ ස්ථානයට ඇතුළුවීමට ඉඩ දීම

සුදුසු යයි බන්ධනාගාර අධිකාරිවරයා විසින් අදහස් කරනු ලබන යම් ඥාතීන් හෝ වෙනත් තැනැත්තන් ද එහි පැමිණ සිටිය හැකි ය;

(ii) මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කරනු ලැබීමෙන් පසු වහාම, එල්ලා මරනු ලැබූ තැනැත්තාගේ සිරුර බන්ධනාගාර වෛද්‍ය නිලධරයා විසින් පරීක්ෂා කර බැලිය යුතු අතර, මරණය සිදු වූ බව නියැකව දැන ගෙන, ඒ පිළිබඳ සහතිකයක් ඔහු විසින් අත්සන් කොට එය බන්ධනාගාර අධිකාරිවරයාට භාර දිය යුතු ය.

(iii) එල්ලා මැරීම සිදු කලේ යම් ස්ථානයක ද ඒ ස්ථානය පිහිටි කොට්ඨාසයේ මහෙස්ත්‍රාත්වරයකු විසින් සිරුර හඳුනා ගැනීම සඳහා සහ මරණීය දණ්ඩනය යථා පරිදි ක්‍රියාත්මක කරනු ලැබුවේ ද යන වග පිළිබඳව පරීක්ෂණයක් එකී එල්ලා මරණු ලැබීමෙන් පසු පැය විසි හතරක් ඇතුළත දී පවත්වා එකී කරුණු පිළිබඳව තමා සෑහීමට පත් විය යුතු අතර ඒ පිළිබඳව මුල් පිටපත් දෙකකින් යුක්ත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. ඒ මුල් පිටපත් දෙකින් එකක් මහාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර එය එහි ගොනු කර තැබිය යුතු ය. අනෙක් මුල් පිටපත අධිකරණ අමාත්‍යවරයාගේ කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර එය එහි ගොනු කර තැබිය යුතු ය.

(ඊ) මරණීය දණ්ඩනය නියම කරනු ලැබූ තැනැත්තා නඩු විභාගය පවත්වන ලද කාලය තුළ නොපැමිණීම නිසා හෝ ඔහු පැන යාම නිසා හෝ මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කළ නොහැකි විටක, ඒ දණ්ඩන නියමය අවස්ථාවෝචිත පරිදි, ඔහු අල්ලා ගැනීමෙන් හෝ නැවත අල්ලා ගැනීමෙන් හෝ පසු, ජනාධිපතිවරයා විසින් නියම කරනු ලබන වෙනත් යම් වේලාවක දී ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය ;

(උ) මේ වගන්තිය යටතේ දෙනලද යම් නියමයක හෝ බල පත්‍රයක වේලාව සහ ස්ථානය සඳහන් නොකිරීම නිසා හෝ සඳහන් කරන ලද වේලාව සහ ස්ථානය

සම්බන්ධයෙන් වූ යම් දෝෂයක් නිසා සහ එවැනි නියමයක හෝ බලපත්‍රයක ආකෘතියෙහි වූ යම් වැරැද්දක් නිසා ඒ නියමය හෝ බලපත්‍රය යටතේ කරන ලද හැතහොත් එසේ කිරීමට අදහස් කරන ලද යම් එල්ලා මැරීමක් නීති විරෝධී බවට පත් වන්නේ යයි හෝ අන්‍යාකාරයකින් නීත්‍යනුකූල විය හැකිව තිබූ යම් එල්ලා මැරීමකින් නීති විරෝධී බවට පත් වන්නේ යයි හෝ සලකනු නොලැබිය යුතු ය.

මේ වගන්තියේ සහ 288 වන වගන්තියෙහි ජනාධිපතිවරයා" යන යෙදුමෙන් ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා අදහස් විය යුතු ය.

මරණීය දණ්ඩනය නියමයන් නොවන මහාධිකරණයේ දණ්ඩන නියමය ක්‍රියාත්මක කිරීම.

**287.** පහත දැක්වෙන විධිවිධාන මහාධිකරණය විසින් නියම කරනු ලබන්නා වූ ද මරණීය දණ්ඩන නියමයන් නොවන්නා වූ ද දණ්ඩන නියමයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතු ය :

(අ) දණ්ඩන නියමය ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් රෙජිස්ට්‍රාර්වරයා විසින් බන්ධනාගාරගත කිරීමේ බලපත්‍රයක් පිළියෙළ කරනු ලැබිය යුතු ය. දණ්ඩන නියමය කළ විනිශ්චයකාරවරයා විසින් හෝ ඔහුගේ සම විනිශ්චයකාරවරයකු විසින් හෝ ඔහු වෙනුවට අනුප්‍රාප්ත විනිශ්චයකාරවරයකු විසින් හෝ ඒ බල පත්‍රය අත්සන් කළ යුතු අතර දණ්ඩන නියමය කරන ලද දිනය එහි යෙදිය යුතු ය.

(ආ) ඒ සෑම බල පත්‍රයක් ම නියමිත ආකෘතියෙහි විය යුතු අතර එය යම් බන්ධනාගාරයක අධිකාරීවරයා වෙත යොමු කරනු ලැබිය යුතු අතර ඒ සෑම බලපත්‍රයකට ම 290 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

දණ්ඩ නීති සංග්‍රහයේ 53 වන වගන්තිය යටතේ වූ දණ්ඩන නියමයන් ක්‍රියාත්මක කිරීම.

**288.** ජනාධිපතිවරයා කැමති කාලයක් යම් තැනැත්තකු රඳවා තැබීමට දණ්ඩ නීති සංග්‍රහයේ 53 වන වගන්තිය යටතේ යම් තැනැත්තකුට විරුද්ධව දණ්ඩන නියමයක් කරනු ලැබ ඇති විට, යම් ප්‍රඥප්තියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ජනාධිපතිවරයා විසින් කලින් කල විධාන කරනු ලබන කොන්දේසි

යටතේ සහ එසේ විධාන කරනු ලබන ස්ථානයක රඳවා තබනු ලැබීමට ඒ තැනැත්තා යටත් වන අතර, එසේ රඳවා තබා ගනු ලැබ සිටින අතරතුර ඔහු නීත්‍යනුකූල අත් අඩංගුවේ සිටින ලෙස සලකනු ලැබිය යුතු ය.

ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අභියාචනාධිකරණය හෝ මහාධිකරණය නොවන අධිකරණවල දණ්ඩන නියමය ක්‍රියාත්මක කිරීම.

**289.** පහත දැක්වෙන විධිවිධාන ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය සහ මහාධිකරණය නොවන අධිකරණ විසින් නියම කරනු ලබන දණ්ඩන නියමයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතු ය: -

(අ) වුදිතයා බන්ධනාගාරගත කිරීම සඳහා දණ්ඩන නියමයක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ දණ්ඩන නියමය කළ අධිකරණය විසින් නොපමාව බලපත්‍රයක් පිළියෙළ කළ යුතු අතර දණ්ඩන නියමය කළ විනිශ්චයකාරවරයා විසින් හෝ ඔහුගේ සම විනිශ්චයකාරවරයා විසින් හෝ ඔහු වෙනුවට අනුප්‍රාප්ත විනිශ්චයකාරවරයා විසින් හෝ ඒ බල පත්‍රය අත්සන් කළ යුතු අතර, දණ්ඩන නියමය කරන ලද දිනය එහි යෙදිය යුතු ය;

(ආ) එවැනි සෑම බල පත්‍රයක් ම නියමිත ආකෘතියෙහි විය යුතු අතර, එය යම් බන්ධනාගාරයක අධිකාරිවරයා වෙත යොමු කරනු ලැබිය යුතු ය. තව ද 290 වන වගන්තියේ විධිවිධාන ඒ සෑම බලපත්‍රයකට ම අදාළ විය යුතු ය.

286 වන, 287 වන සහ 289 වන වගන්තිය යටතේ බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය.

**290.** (1) 286 වන වගන්තියෙහි, 287 වන වගන්තියෙහි හෝ 289 වන වගන්තියෙහි සඳහන් සෑම බලපත්‍රයක් ම නියමිත ආකෘතියෙහි විය යුතු අතර, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයකුට එය භාර දෙනු ලැබිය යුතු ය. එය ලැබීමෙන් පසු ඒ නිලධරයා විසින් එහි නම සඳහන් තැනැත්තා තම භාරයට ගෙන, විනිශ්චයකාරවරයාගේ අත්සන යටතේ වූ බලපත්‍රය ද සමග, ඒ තැනැත්තා ඒ බලපත්‍රයෙහි නම සඳහන් බන්ධනාගාරයේ අධිකාරිවරයාගේ භාරයට පත් කළ යුතු ය. තව ද තත් කාර්යය සඳහා එකී තැනැත්තා රඳවා තබා ගැනීම පිණිස හා ඒ බල පත්‍රයේ සඳහන් බන්ධනාගාරය වෙත ඔහු ගෙන යාම පිණිස එකී බලපත්‍රය පූර්ණ අධිකාරයක් වන්නේ ය.

(2) බලපත්‍රයෙහි නම සඳහන් තැනැත්තා ඉහත සඳහන් පරිදි ඉහත කී අධිකාරීවරයා වෙත භාර දෙනු ලැබූ විට, ඔහු විසින් ඒ තැනැත්තා රඳවා ගෙන, දණ්ඩන නියමය ක්‍රියාවේ යොදවනු ලබන තෙක්, ආරක්ෂා සහිතව ඔහු අත් අඩංගුවේ තබා ගත යුතු ය. තව ද බලපත්‍රයේ සෙසු නියමයන්ට සහ ඒ තැනැත්තා සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් ඔහු වෙත නීත්‍යනුකූලව නිකුත් කරනු ලබන යම් ආඥාවලට අනුකූලව ද ඒ අධිකාරීවරයා ක්‍රියා කළ යුතු ය.

(3) එසේ රඳවා තබා ගැනීම සඳහා ද අත් අඩංගුවේ තබා ගැනිම සඳහා ද දණ්ඩන නියමය ක්‍රියාත්මක කිරීම සඳහා ද ඉහත සඳහන් බලපත්‍රය අධිකාරීවරයාට පූර්ණ අධිකාරයක් වන්නේ ය.

(4) විනිශ්චයකාරවරයා විසින් අත්සන් කරන ලද බලපත්‍රයේ පිටපතක් නඩු වාර්තාවෙහි ගොනු කර තැබිය යුතු ය.

(5) කස පහර දීමේ දණ්ඩන නියමයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මේ සංග්‍රහයේ වූ විධිවිධාන කෙරෙහි මේ වගන්තියෙහි වූ කිසිවක් බල නොපෑ යුතු ය.

**291.** (1) තත් කාලයෙහි බල පවත්නා යම් නීතියක අධිකාරය යටතේ යම් දඩයක් නියම කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ දඩය සම්බන්ධයෙන් යම් ප්‍රකාශිත විධිවිධානයක් ඒ නීතියෙහි ඇතුළත්ව නොමැති විට, පහත දැක්වෙන විධිවිධාන ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. එනම් ; - දඩ ගැසීමේ දණ්ඩන නියමයන්ට අදාළ විධිවිධාන.

(අ) දඩය යම් මුදලක් දක්වා වැඩි කල හැකි යයි ප්‍රකාශිතව ම සඳහන් කර නොමැති අවස්ථාවක, වරදකරු විසින් ගෙවීමට යටත් වන්නා වූ මුදල සීමා රහිත වන නමුත් එය ඉතා අධික නොවිය යුතු ය ;

(ආ) බන්ධනාගාරගත කිරීමක් සහිතව හෝ රහිතව හෝ වරදකරුට දඩ ගැසීමේ දණ්ඩන නියමයක් කරනු ලැබුවා වූ ද බන්ධනාගාරගත කිරීමකින් මෙන් ම දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි වූ ද වරදක් සම්බන්ධයෙන් වූ සෑම අවස්ථාවක දී ම සහ වරදකරුට දඩ ගැසීමේ දණ්ඩන නියමයක් කරනු ලැබුවා වූ ද

දඩයකින් පමණක් දඬුවම් කරනු ලැබිය හැකි වූ ද වරදක් සම්බන්ධයෙන් වූ සෑම අවස්ථාවක දී ම, වරදකරු විසින් ඒ දඩය ගෙවීම පැහැර හරිනු ලැබූ විට, ඔහු එක්තරා කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමෙන් ඔහුට දඬුවම් කරනු ලැබිය යුතු යයි, දණ්ඩන නියමය කළ අධිකරණය විසින් ස්වකීය අභිමතය පරිදි, ඒ දණ්ඩන නියමයෙන් විධාන කළ හැකි ය. ඒ බන්ධනාගාරගත කිරීමේ කාලය ඔහුට නියම කරනු ලැබිය හැකිව තිබුණු වෙනත් යම් බන්ධනාගාරගත කිරීමේ කාලයට නැතහොත් දණ්ඩන නියමයක් න්‍යාදේශ කිරීම යටතේ ඔහු යටත් විය හැකි බන්ධනාගාරගත කිරීමේ කාලයට අමතරව විය යුතු ය ;

(ඇ) වරදකරුට නියම කරන ලද දඩය රුපියල් දහසක් නොඉක්මවන අවස්ථාවක, ඒ දඩය ගෙවීම පැහැර හරිනු ලැබූ විට, (ආ) ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් ව තිබුණ ද, බන්ධනාගාරගත කිරීමක් අධිකරණය විසින් නියම කරනු නොලැබිය යුතු නමුත් 15 (2) වන වගන්තියෙන් විධිවිධාන සලසා ඇති පරිදි ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය;

(ඈ) දඩයක් ගෙවීම පැහැර හරිනු ලැබූ විට වරදකරු බන්ධනාගාරගත කරන ලෙස අධිකරණය විසින් විධාන කරනු ලබන්නේ යම් කාලයකට ද ඒ කාලය, වරද බන්ධනාගාරගත කිරීමකින් මෙන් ම දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි වරදක් වේ නම්, ඒ වරද සඳහා නියමිත උපරිම බන්ධනාගාරගත කිරීමේ කාලයෙන් හතරෙන් එකක් නොඉක්මවන කාලයක් විය යුතු ය;

(ඉ) දඩයක් ගෙවීම පැහැර හරිනු ලැබූ විට අධිකරණය විසින් නියම කරනු ලබන බන්ධනාගාරගත කිරීම, ඒ වරද සම්බන්ධයෙන් ඒ වරදකරුට නියම කරනු ලැබිය හැකිව තිබුණු කවර හෝ විස්තරයකට අයත් බන්ධනාගාරගත කිරීමක් විය හැකි ය ; වරදක් දඩයකින් පමණක් දඬුවම් කරනු ලැබිය හැකි වරදක් නම්, ඒ බන්ධනාගාරගත කිරීම බරපතල වැඩ රහිත බන්ධනාගාරගත කිරීමක් විය යුතු ය ;

(ඊ) වරද බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය නොහැකි වරදක් නම්, දඩය ගෙවීම පැහැර හරිනු ලැබූ විට වරදකරු බන්ධනාගාරගත කරන ලෙස අධිකරණය විසින් විධාන කරනු ලබන්නේ යම් කාලයකට ද, ඒ කාලය පහත දැක්වෙන සීමාවන් නොඉක්මවිය යුතු ය ;

එනම් -

(i) දඩ මුදල රුපියල් දහයක් ඉක්මවන නමුත් රුපියල් විසිපහක් නොඉක්මවන අවස්ථාවක, දින හතක කාලයක් ;

(ii) දඩ මුදල රුපියල් විසිපහක් ඉක්මවන නමුත් රුපියල් පනහක් නොඉක්මවන අවස්ථාවක, දින දහහතරක් නොඉක්මවන යම් කාලයක්;

(iii) දඩ මුදල රුපියල් පනහක් ඉක්මවන නමුත් රුපියල් එක් සියයක් නොඉක්මවන අවස්ථාවක, මාස තුනක් නොඉක්මවන යම් කාලයක් ;

(iv) දඩ මුදල රුපියල් සියයක් ඉක්මවන අවස්ථාවක, මාස හයක් නොඉක්මවන යම් කාලයක් ;

(උ) දඩයක් ගෙවීම පැහැර හරිනු ලැබූ විට නියම කරනු ලබන බන්ධනාගාරගත කිරීම, ඒ දඩය ගෙවනු ලැබූ හෝ නීති මාර්ගයෙන් එය අය කර ගනු ලැබූ කවර හෝ විටක අවසන් විය යුතු ය ;

(ඌ) දඩයක් ගෙවීම පැහැර හරිනු ලැබූ විට නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ කාලය ඉකුත් වීමට පෙර, ඒ දඩයෙන් යම් කොටසක් ගෙවනු ලැබුවහොත් හෝ අය කර ගනු ලැබුවහොත් සහ ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් ඒ දක්වා බන්ධනාගාරගතව සිටි කාලය එවකටත් ගෙවිය යුතු ව ඇති දඩ මුදලේ කොටසකට වඩා සමානුපාතිකව අඩු නොවේ නම්, බන්ධනාගාරගත කිරීම අවසන් විය යුතු ය ;

(ඒ) නොගෙවා ඇති දඩය හෝ එහි කොටස දණ්ඩන නියමය කරනු ලැබීමෙන් පසු අවුරුදු හයක් ඇතුළත කවර හෝ වේලාවක දී වුව ද, දණ්ඩන නියමය යටතේ අවුරුදු හයකට වඩා දීර්ඝ කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට වරදකරු යටත් වන්නේ නම්, ඒ කාලය ඉකුත් වීමට පෙර කවර හෝ වේලාවක දී වුව ද අය කර ගනු ලැබිය හැකි අතර වරදකරුගේ ණය සඳහා ඔහුගේ මරණයෙන් නීත්‍යනුකූලව යටත් වන යම් දේපළක් ඔහුගේ මරණය නිසා එම යටත් වීමෙන් නිදහස් නොවේ.

(2) තත් කාලයෙහි බල පවත්නා යම් නීතියක අධිකාරය යටතේ දඩයක් ගෙවන ලෙස වරදකරුවකුට දණ්ඩන නියමයක් කර ඇති කවර හෝ විටක, දණ්ඩන නියමය කළ අධිකරණය විසින්, ස්වකීය අභිමතය පරිදි, වරදකරුට අයත් යම් චංචල දේපළක් විනිග්‍රහණය කොට, එය විකිණීමෙන් ඒ මුදල අය කර ගැනීම සඳහා බලපත්‍රයක්, ඒ දඩය ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් වරදකරු බන්ධනාගාරගත කරනු ලැබිය යුතු බවට දණ්ඩන නියමයෙන් විධාන කරනු ලැබ තිබුණත්, නිකුත් කරනු ලැබිය හැකි ය. ඒ බලපත්‍රය අධිකරණයේ පිස්කල්වරයා වෙත යොමු කරනු ලැබිය යුතු අතර, එය ශ්‍රී ලංකාවේ කවර හෝ ස්ථානයක දී ක්‍රියාවේ යොදවනු ලැබිය හැකි ය. එහෙත් ඒ බලපත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් අධිකරණයක් විසින් ද ඒ අධිකරණයේ අධිකරණ බල සීමාවෙන් පිටත දී එය ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය වුවහොත්, එසේ ක්‍රියාවේ යෙදවිය යුතු ප්‍රදේශය විෂයයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයකු විසින් එය පිටසන් කරනු ලැබිය යුතු ය.

(3) වරදකරුවකුගේ සහ ඔහුගේ පවුලේ අයගේ ඇඳුම් පැළඳුම් ද රුපියල් දෙසිය පනහක් දක්වා වටිනාකමින් යුත් බීජ ධාන්‍ය ද ඇතුළුව ඔහුගේ වෘත්තිය මෙවලම් හා උපකරණ ද විනිග්‍රහණ බලපත්‍රයක් යටතේ ගැනීම නොකළ යුතු ය.

[1995 අංක 4 § 2] (4) (අ) දඩයක් ගෙවීම සඳහා පමණක් ද, ගෙවීම පැහැර හරිනු ලැබූ විට බන්ධනාගාරගත කිරීම සඳහා ද, වරදකරුවකුට දණ්ඩන නියමයක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ දඩය වශයෙන් අය විය යුතු මුළු මුදල වරදකරු විසින් සම්පූර්ණයෙන් එක්

වරම ගෙවනු ලබන අවස්ථාවක දී හැර, පහත දැක්වෙන සියලු දේ හෝ ඉන් කිසිවක් හෝ අධිකරණය විසින් කරනු ලැබිය යුතු ය -

(i) එකී දඩය ගෙවීම සඳහා කල් දීම ;

(ii) එකී දඩය වාරික මගින් ගෙවීමට විධාන කිරීම ;

(iii) එකී දඩය හෝ යම් වාරිකයක් ගෙවීම සඳහා ඇපකරුවකු හෝ ඇපකරුවන් හෝ ඇතිව හෝ නැතිව, අදාළ නියමිත ආකෘති පත්‍රය මගින් අධිකරණය සෑහීමට පත්වන අන්දමේ බැඳුම්කරයකට ඇතුළුවීමට එකී දඩය ගෙවන තැනැත්තාට නිදහස ඇති බව විධාන කිරීම, තව ද මේ සංග්‍රහයෙන් විධිවිධාන සලසා ඇති ආකාරයෙන් ඒ බැඳුම්කරයට ඇතුළුවීම හා ඒ බැඳුම්කරය ක්‍රියාවෙහි යෙදවීම හෝ කරනු ලැබිය හැකි ය ;

එසේ වුවද දඩයක් ගෙවීම සඳහා පමණක් ද, දඩය ගෙවීම පැහැර හරිනු ලැබූ විට බන්ධනාගාරගත කිරීම සඳහා ද, දණ්ඩන නියමයක් කර ඇති වරදකරුවකු සම්බන්ධයෙන් අධිකරණය විසින් (i), (ii) සහ (iii) වන අනුජේදවල නිශ්චිත ව සඳහන් කර ඇති සියලු දේ හෝ ඉන් කිසිවක් හෝ කරනු ලැබ ඇති අවස්ථාවක, අසාමාන්‍ය අවස්ථාගත කරුණුවල දී සහ වාර්තාගත කරනු ලැබිය හැකි හේතු සඳහා හැර, ඒ වරදකරු විසින් ඒ වරද සම්බන්ධයෙන් ම පසුව කරනු ලබන පැහැර හැරීමක් ඇති වූ විටක දී ඒ වරදකරු සම්බන්ධයෙන් ම ඒ අනුජේදවල නිශ්චිතව සඳහන් සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ අධිකරණය විසින් නොකළ යුතු ය.

(ආ) මේ උපවගන්තිය බලාත්මක වන දිනයේ දී යම් තැනැත්තකු දඩයක් ගෙවීම පැහැර හැරීම වෙනුවෙන් බන්ධනාගාරගත වීමේ කාල සීමාවක් ගෙවමින් සිටින අවස්ථාවක, (අ) ජේදයට අනුකූලව පියවර ගැනීම සඳහා , ඒ තැනැත්තාට දණ්ඩන නියමය කරන ලද්දේ යම් අධිකරණයක් විසින් ද අධිකරණය හමුවට ඒ තැනැත්තා ඉදිරිපත් කිරීම ඒ තැනැත්තා තම දණ්ඩනය ගෙවමින් සිටින බන්ධනාගාරයේ අධිකාරිවරයාගේ කාර්යය විය යුතු ය.

(ඈ) (අ) ඡේදයේ (i) වන හෝ (ii) වන අනුඡේදය යටතේ යම් ගෙවීමක් කිරීමට ඇති අවස්ථාවක, යම් අනුමත කළ බැංකුවකට හෝ යම් ප්‍රාදේශීය ලේකම්වරයකුගේ කාර්යාලයකට හෝ තැපැල් කාර්යාලයකට ඒ ගෙවීම කිරීමට විධාන කරන අධිකරණය විසින් නිශ්චිත වශයෙන් ම නියම කළ කාලය ඇතුළත, ගෙවීම කරනු ලැබිය යුතු ය. තව ද මේ කාර්යය සඳහා , ඒ ගෙවීම් කරන විට, ඒ බැංකුවට, යම් ප්‍රාදේශීය ලේකම්වරයකුගේ කාර්යාලයකට හෝ තැපැල් කාර්යාලයකට වරදකරු විසින් ඉදිරිපත් කිරීම පිණිස, දඩයේ ප්‍රමාණය, එක් එක් වාරිකයේ ප්‍රමාණය, දඩය ගෙවිය යුතු වාරික ගණන සහ වෙනත් අදාළ විස්තර සඳහන් කරමින් නියමිත ආකෘතියේ වූ ප්‍රකාශයක් අධිකරණය විසින් වරදකරුට නිකුත් කරනු ලැබිය යුතු ය. අවස්ථාවෝචිත පරිදි, ඒ දඩය හෝ වාරික ගෙවීම භාර ගැනීමෙන් පසු ඒ බැංකුව, ප්‍රාදේශීය ලේකම් හෝ තැපැල් කාර්යාලයේ ස්ථානාධිපතිවරයා විසින්, ඒ ප්‍රකාශයේ ඒ බවට පිටසනක් කොට ඒ ප්‍රකාශය වරදකරුට ආපසු භාරදිය යුතු අතර, ඒ දඩය හෝ වාරිකය ගෙවූ බව ඔප්පු කිරීම, නියමිත ආකෘතිය මගින්, ඒ ගෙවීම් කිරීම විධාන කරනු ලැබූ අධිකරණය වෙත ඒ ගෙවීම කර සති දෙකක් ඉකුත් වීමට ප්‍රථමයෙන් ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) මේ උපවගන්තියේ " අනුමත කළ බැංකුව " යන්නෙන් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූල වූ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් අදහස් වේ.

(5) යම් දඩයක් වාරික ගෙවීම මගින් විධාන කර ඇති හා යම් එක් වාරිකයක් ගෙවීම පැහැර හැර ඇති විටක, එතෙක් නොගෙවා ඇති සියලු වාරික ගෙවීම පැහැර හරිනු ලැබූ විටක වූ කාර්ය පටිපාටියම අනුගමනය කරනු ලැබිය හැකි ය.

වරදකරු බැඳුම්කරයකට ඇතුළත් වූ විට දණ්ඩන නියමය ක්‍රියාත්මක කිරීම අත්හිටුවනු ලැබිය හැකි බව.

**292.** දඩයක් ගෙවීම සඳහා පමණක් ද දඩය ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් බන්ධනාගාරගත කිරීම සඳහා ද වරදකරුවකුට දණ්ඩන නියමයක් කරනු ලැබ ඇති සහ අධිකරණය විසින් 291 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ විටක, ඒ බලපත්‍රය පිළිබඳව වාර්තා කිරීම සඳහා නියම කරනු ලබන දිනයෙහි වරදකරු ඒ අධිකරණය ඉදිරියෙහි පෙනී සිටින බවට, සුදුසු යයි අධිකරණය අදහස් කරන පරිදි

ඇපකරුවන් ඇතිව හෝ නැතිව වරදකරු විසින් බැඳුම්කරයක් ලියා අත්සන් කරන ලද විට, අධිකරණය විසින් බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමය ක්‍රියාත්මක කිරීම අත්හිටුවා වරදකරු මුදා හරිනු ලැබිය හැකි ය. වරදකරු අධිකරණය ඉදිරියෙහි පෙනී සිටිය යුතු බවට නියම කරනු ලබන ඒ දිනය, ඔහු ඒ බැඳුම්කරය ලියා අත්සන් කරන වේලාවේ සිට දින පහළොවක් ඉක්මවන දිනයක් නොවිය යුතු ය. තව ද ඒ දිනයෙහි, දඩය ගෙවා නොතිබුණහොත් හෝ අයකර ගෙන නොතිබුණහොත්, බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමය නොපමාව ක්‍රියාත්මක කළ යුතු යයි අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි ය.

එසේ වුව ද, ඒ දඩය මහාධිකරණය විසින් නියම කරනු ලැබූ දඩයක් වන අවස්ථාවක, බැඳුම්කරයේ සඳහන් වන මහෙස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියෙහි වරදකරු පෙනී සිටිය යුතු බවට වූ කොන්දේසියක් බැඳුම්කරයේ ඇතුළත් විය යුතු අතර, එසේ පෙනී සිටින දිනයේ දී, දඩය ගෙවා නොතිබුණහොත් හෝ අයකර ගෙන නොතිබුණහොත්, බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමය නොපමාව ක්‍රියාවේ යෙදවිය යුතු යයි ඒ මහෙස්ත්‍රාත් අධිකරණය විසින් විධාන කළ යුතු ය.

**293.** යම් දණ්ඩන නියමයක් ක්‍රියාත්මක කිරීම සඳහා වූ සෑම බලපත්‍රයක්ම ඒ දණ්ඩන නියමය කළ විනිශ්චයකාරවරයා විසින් ඔහුගේ සම විනිශ්චයකාරවයකු විසින් හෝ ඔහු වෙනුවට අනුප්‍රාප්ත විනිශ්චයකාරවරයා විසින් හෝ නිකුත් කරනු ලැබිය හැකි ය. බලපත්‍රය කවරකු විසින් නිකුත් කළ හැකි ද යන වග.

**299.*** (1) වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු බන්ධනාගාරයෙන් පැන යාමට පෙර ඔහුට නියම කරනු ලැබ තිබූ යම් දණ්ඩන නියමයක් හෝ දණ්ඩන නියමයන් හෝ යටතේ ගත කිරීමට ඔහු යටතේ වූ බරපතල වැඩ සහිත හෝ බරපතල වැඩ රහිත බන්ධනාගාරගත කිරීමේ කාලයක ඉකුත් නොවූ කොටසෙන් හෝ විඳීමට ඔහු යටත් වූ වෙනත් දඬුවමක ඉතිරි කොටසෙන්, ඔහු බන්ධනාගාරයෙන් පැන යාමේ හේතුවෙන්, ඔහු නිදහස් නොවිය යුතු ය. පැනගිය වරදකරු කරනු ලැබුවන් සම්බන්ධයෙන් වූ දණ්ඩන නියම. [2005 අංක 21 § 4]

* 2005 අංක 21 දරන පනතේ 3 වන වගන්තිය මගින් 294, 295,296,297 සහ 298 වූ වගන්ති ඉවත් කරන ලදී.

(2) තම නඩු විභාගයට පැමිණ නොසිටි චූදිතයකුට දණ්ඩන නියමයක් කරනු ලැබූ විටක, ඔහු සිරභාරයට ගනු ලැබූ වහාම ඒ දණ්ඩන නියමය ක්‍රියාත්මක කළ යුතු ය.

[2005 අංක 21 § 4]

(3) පැන ගිය, වරදකරු කරනු ලැබූ තැනැත්තකුට මරණීය දණ්ඩන නියමයක් හෝ දඩ ගැසීමේ හෝ බන්ධනාගාරගත කිරීම සහිතව හෝ රහිතව, දණ්ඩන නියමයන් කරනු ලැබූ විට, ඒ දණ්ඩන නියමය මරණීය දණ්ඩන නියමයක් හෝ දඩ ගැසීමේ දණ්ඩන නියමයක් නම්, මෙහි ඉහත සඳහන් විධිවිධානවලට යටත්ව, එය නොපමාව ක්‍රියාත්මක විය යුතු ය. තව ද අලුත් දණ්ඩන නියමය යටතේ වූ බන්ධනාගාරගත කිරීම බරපතල වැඩ සහිත බන්ධනාගාරගත කිරීමක් නම් සහ ඒ වරදකරු කරනු ලැබූ තැනැත්තා පැන ගිය වේලාවේ දී ඔහු විඳිමින් සිටියේ බරපතල වැඩ රහිත බන්ධනාගාරගත කිරීමක් පමණක් නම්, බරපතල වැඩ සහිත බන්ධනාගාරගත කිරීම වහාම ක්‍රියාත්මක විය යුතු අතර, එය කලින් දණ්ඩන නියමය සහ සමගාමීව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය ; එහෙත් වරදකරු කරනු ලැබූ තැනැත්තා පැන ගිය අවස්ථාවේ දී ඔහු විඳිමින් සිටියේ බරපතල වැඩ සහිත බන්ධනාගාරගත කිරීමක් නම්, ඒ වරදකරු පැන ගිය වේලාවේ දී ඔහුගේ කලින් දණ්ඩන නියමයෙන් ඉකුත් නොවී තිබුණු කාලයට සමාන වූ ද ඔහු නැවත අල්ලා ගනු ලැබූ දිනයෙන් ආරම්භ වන්නා වූ ද කාලයක් ඔහු බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කරනු ලැබීමෙන් පසු අලුත් දණ්ඩන නියමය යටතේ වූ බරපතල වැඩ සහිත බන්ධනාගාරගත කිරීම ක්‍රියාත්මක විය යුතු ය.

වෙනත් වරදක් සඳහා එවකටත් දණ්ඩන නියමයක් කරනු ලැබ සිටින වරදකරුවකුට දණ්ඩන නියමයක් කිරීම.

**300.** ඇත්ත වශයෙන් ම බන්ධනාගාරගත කර සිටින තැනැත්තකුට බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කරනු ලැබූ විට, ඒ බන්ධනාගාරගත කිරීම, කලින් ඔහුට නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ කාලය අවසන් වීමෙන් ඉක්බිතිව ආරම්භ විය යුතු ය.

දණ්ඩන නීති සංග්‍රහයේ ඇතැම් වගන්ති සියලුම වැරදි සම්බන්ධයෙන් අදාළ විය යුතු බව.

**301.** දණ්ඩ නීති සංග්‍රහයේ 55 වන වගන්තියේ සහ 67 වන වගන්තියේ විධිවිධාන සියලුම වැරදි සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

**302.** දණ්ඩන නියමයක් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරනු ලැබූ විට, එය ක්‍රියාත්මක කල නිලධරයා විසින් ඒ දණ්ඩන නියමය ක්‍රියාත්මක කරනු ලැබූ ආකාරය සහතික කරමින් තම අත්සන යටතේ වූ පිටසනක් බලපත්‍රයෙහි යොදා, ඒ බලපත්‍රය එය නිකුත් කළ අධිකරණය වෙත ආපසු එවිය යුතු ය.

දණ්ඩන නියමය ක්‍රියාත්මක කරනු ලැබූ විට බලපත්‍රය ආපසු එවීම.

**303.** (1) මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව, වරදකරුවකු කිසියම් කාල සීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කිරීමේ දී, අධිකරණයක් විසින් -

බන්ධනාගාරගත කිරීමේ අත්හිටුවූ දණ්ඩන නියමය. [1995 අංක 20 § 2 ] [1997 අංක 19 § 2 ] [1999 අංක47 § 2]

(අ) දණ්ඩන නියමය කරනු ලැබුවේ යම් වරදක් සම්බන්ධයෙන් ද ඒ වරද සඳහා නියමිත උපරිම දණ්ඩනය ;

(ආ) වරදේ ස්වභාවය සහ වරදේ බරපතලකම ;

(ඇ) වරද සඳහා වරදකරුගේ සදෝෂත්වය සහ වගකීමේ ප්‍රමාණය ;

(ඈ) වරදකරුගේ පූර්ව කල්ක්‍රියාව ;

(ඉ) වරද සිදු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස කෙලින්ම සිදු වූ යම් හානියක්, පාඩුවක් හෝ අලාභයක් ;

(ඊ) වරදකරු හා සම්බන්ධ වූ දඬුවම උග්‍ර කිරීමට හෝ ලිහිල් කිරීමට තුඩු දෙන සාධක කිසිවක් තිබීම ;

(උ) සියලු අවස්ථානුගත කරුණු අනුව සාධාරණ වන ප්‍රමාණයකට සහ ආකාරයකට වරදකරු දඬුවම් පැමිණ වීමට ඇති අවශ්‍යතාවය ;

(ඌ) එම ස්වභාවයේ හෝ සමාන ස්වභාවයක වැරදි සිදු කිරීමෙන් වරදකරු හෝ වෙනත් තැනැත්තන් වළක්වාලීමට ඇති අවශ්‍යතාවය ;

(එ) වරදකරු නිරතව සිටියේ කවර ස්වරූපයක ක්‍රියාකලාපයක ද, ඒ ක්‍රියාකලාපය, අධිකරණය විසින් ප්‍රතික්ෂේප කිරීම ප්‍රත්‍යක්ෂ කිරීමේ අවශ්‍යතාව;

(ඊ) වරදට භාජනය වූ තැනැත්තා හෝ ප්‍රජාව වරදකරුගෙන් ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාව ;

(ම) වරදට චෝදනා ලැබූ තැනැත්තා වරදට වරදකරු බව පිළිගැනීම සහ ඒ තැනැත්තා අවංකව සහ සත්‍ය ලෙස පසුතැවිලි වන බව ; හෝ

(ඕ) ඉහත සඳහන් කරුණු වලින් කරුණු දෙකක් හෝ ඊට වැඩි එකතුවක්,

යන කරුණු සැලකිල්ලට ගෙන, අවස්ථානුගත කරුණු අනුව, දණ්ඩන නියමය සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් හෝ අත්හිටුවීම යෝග්‍ය යයි අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, ලිඛිතව සඳහන් කළ යුතු හේතු අනුව, අධිකරණය විසින් දණ්ඩන නියමය සම්පූර්ණයෙන් ම හෝ එම දණ්ඩන නියමයේ යම් කොටසක් හෝ අත්හිටුවමින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(2) (අ) දණ්ඩන නියමය කරනු ලැබූවේ යම් වරදක් සම්බන්ධයෙන් ද, ඒ වරද සඳහා නීතිය මගින් විධානාත්මක අවම බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක්, නියම කරනු ලැබ ඇත්නම් ; හෝ

(ආ) වරදකරු අත්හිටුවනු ලැබ නොමැති බන්ධනාගාරගත කිරීමේ කාලයක් දඬුවම් විඳිමින් සිටී නම් හෝ ඔහුට එවැනි බන්ධනාගාරගත කිරීමේ කාලයක් දඬුවම් විඳිමට නියමව ඇත්නම් ; හෝ

(ඇ) වරද සිදුකරනු ලැබූවේ වරදකරු පරිවාස ආඥාවකට හෝ කොන්දේසි පිට මුදා හැරීමේ හෝ නිදහස් කිරීමේ ආඥාවකට යටත්ව සිටින විට දී නම් ; හෝ

(ඈ) නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ කාල සීමාව හෝ එකම නඩු කටයුතු වලදී එක් වරදට වැඩි වැරදි සංඛ්‍යාවක් සඳහා වරදකරු, වරදරකරු කරනු ලබන අවස්ථාවල දී, බන්ධනාගාරගත කිරීමේ කාල සීමාවල එකතුව අවුරුදු දෙකක් ඉක්මවන්නේ නම්,

අධිකරණයක් විසින්, බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් අත්හිටුවමින්, ආඥාවක් කරනු නොලැබිය යුතු ය.

(3) (මෙහි මින් මතු "ක්‍රියාත්මක වන කාලය" යනුවෙන් කරනු ලබන) දණ්ඩන නියමයක් සම්පූර්ණයෙන් ම හෝ එහි කොටසක් හෝ අත්හිටුවනු ලැබිය හැකි කාල සීමාව, ඒ දණ්ඩන නියමය සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් හෝ අත්හිටුවමින් ආඥාව කරනු ලබන විට ඒ අධිකරණය විසින් -

(අ) තීරණය කරනු ලැබිය යුතු ය ; සහ

(ආ) නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය ;

එසේ වුවද ඒ කාල සීමාව, දණ්ඩන නියමය සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් හෝ අත්හිටුවමින් කරනු ලබන ආඥාවේ දින සිට, අවුරුදු පහකට වඩා අඩු නොවිය යුතු ය.

(4) අත්හිටුවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකින් දඬුවම් ලැබ සිටින වරදකරුවකු -

(අ) ඒ දණ්ඩන නියමය ක්‍රියාත්මක වන කාලය තුළ,ව්‍යවස්ථාපිත දණ්ඩනය බන්ධනාගාරගත කිරීම හෝ ව්‍යවස්ථාපිත දණ්ඩනයට බන්ධනාගාරගත කිරීම ද අතුළත් වන, වෙනත් වරදක් සිදු කළහොත් මිස ; සහ

(ආ) (13) වන උපවගන්තිය යටතේ අධිකරණයක් විසින් ආඥාවක් කළහොත් මිස,

ඒ වරදකරු, අත්හිටුවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයේ කිසිම කොටසක් සඳහා දඬුවම් විඳිනු නොලැබිය යුතු ය.

(5) දණ්ඩන නියමය සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් හෝ අත්හිටුවමින් කරන ලද ආඥාවේ දින සිට, ක්‍රියාත්මක වන කාලය ගණන් බලනු ලැබිය යුතු ය.

(6) ක්‍රියාත්මක වන කාලය ආරම්භ වීමට පෙරාතුව ම සිදු කරන ලද වෙනත් වරදක් සඳහා, ක්‍රියාත්මක වන කාලය තුළ දී, වරදකරුවකුට බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කරනු ලැබුවහොත්, වරදකරු ඒ දඬුවම විඳිමින් සිටින අතර, ක්‍රියාත්මක වන කාලය අඛණ්ඩව ගෙවී යා යුතු ය.

(7) අත්හිටුවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකින් දඬුවම් ලැබ සිටින වරදකරුවකු, ක්‍රියාත්මක වන කාලය අවසන් වීමේ දී නිදහස් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(8) ධුරයන් සඳහා නුසුදුසුකමක් වීම සඳහා හෝ ධුරය අහිමි වීම සඳහා නැතහොත් විශ්‍රාම වැටුප් හෝ වෙනත් ප්‍රතිලාභ අහිමි කිරීම හෝ අත්හිටුවීම සඳහා විධිවිධාන සලස්වන යම් නීතියක හැර, වෙනත් නීතියක කාර්ය සඳහා, බන්ධනාගාරගත කිරීමේ අත්හිටුවන ලද දණ්ඩන නියමයක් බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(9) සම්පූර්ණයෙන් ම අත්හිටුවනු ලැබූ බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක සම්පූර්ණ කාලය හෝ එම කාලයෙන් යම් කොටසක් දඬුවම් විඳින ලෙස (13) වන උපවගන්තිය යටතේ යම් වරදකරුවකුට ආඥා කරනු ලැබුවහොත්, එවිට ධුරය සඳහා නුසුදුසුකමක් වීම සඳහා හෝ ධුරය අහිමි වීම සඳහා හෝ විශ්‍රාම වැටුප් හෝ වෙනත් ප්‍රතිලාභ අහිමි කිරීම හෝ අත්හිටුවීම සඳහා හෝ විධිවිධාන සලස්වන යම් නීතියක කාර්යය සඳහා, ඒ උපවගන්තිය යටතේ ආඥාව කරන ලද දිනයේ දී වරදකරු බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකට යටත් වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(10) (8) වන සහ (9) වන උපවගන්තිවල කාර්යය සඳහා "නීතිය" යන්නට, පාර්ලිමේන්තු පනතක්, යම් පාර්ලිමේන්තු පනතක් යටතේ සාදන ලද නියෝග, රීති සහ අතුරු ව්‍යවස්ථා, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය සහ අමාත්‍ය මණ්ඩලය විසින් සාදන ලද හෝ අනුමත කරන ලද රීති සංග්‍රහ හෝ රීති ඇතුළත් වන්නේ ය.

(11) යම් වරදක් සඳහා වූ ව්‍යවස්ථාපිත දණ්ඩනය, බන්ධනාගාරගත කිරීම වන්නා වූ හෝ ඒ දණ්ඩනයට බන්ධනාගාරගත කිරීම ඇතුළත් වන්නා වූ වරදක් සඳහා , අධිකරණයක් විසින් තැනැත්තකු වරදකරු කරනු ලබන්නේ නම් සහ ඒ වරද, වෙනත් වරදකට අදාළව ක්‍රියාත්මක වන කාලය තුළ සිදු කරනු ලැබුවේ නම්, යම් අධිකරණයක් විසින් (13) වන උපවගන්තිය යටතේ ඒ තැනැත්තා සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

(12) (අ) යම් වරදක් සඳහා වූ ව්‍යවස්ථාපිත දණ්ඩනය, බන්ධනාගාරගත කිරීම වන්නා වූ හෝ ඒ දණ්ඩනයට බන්ධනාගාරගත කිරීම ඇතුළත් වන්නා වූ හෝ වරදක් සඳහා තැනැත්තකු වරදකරු කරනු ලැබ ඔහු සම්බන්ධයෙන් ක්‍රියා කර ඇත්නම් සහ, ඒ වරද වෙනත් වරදකට අදාළව ක්‍රියාත්මක වන කාලය තුළ සිදු කරනු ලැබුවේ නම්, එවිට, ඒ වෙනත් වරදට අදාළ ඒ කාරණා කියා පාමින් (1) වන උපවගන්තිය යටතේ අත්හිටුවන ලද දණ්ඩන නියමය කළ අධිකරණය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(ආ) ඡේදය යටතේ වූ පැමිණිල්ල -

(i) යම් තැනැත්තකු විසින් ;

(ii) ක්‍රියාත්මක වන කාලය අවසානයේ සිට අවුරුදු දෙකක කාලයක් පසු නොවී,

කරනු ලැබිය හැකි ය.

(ඇ) (අ) ඡේදය යටතේ වූ පැමිණිල්ලක් ලියවිල්ලකින් විය යුතු අතර, පැමිණිලිකරුගේ දිවුරුම් ප්‍රකාශයක් මගින් එය තහවුරු කරනු ලැබිය යුතු ය.

(ඈ) (අ) ඡේදය යටතේ ලියවිල්ලකින් වූ දිවුරුම් ප්‍රකාශයකින් තහවුරු කරන ලද පැමිණිල්ලක් අධිකරණය විසින් ලදහොත්, ඒ අධිකරණය විසින් අත්හිටුවන ලද දණ්ඩන නියමයක් නියම කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා සහ (අ) ඡේදය යටතේ පැමිණිල්ල කරන තැනැත්තා, නිශ්චිතව සඳහන් කරනු ලබන ස්ථානයක දී, දිනයක දී හා වේලාවක දී අධිකරණය ඉදිරියෙහි පෙනී සිටින ලෙසට අධිකරණය විසින් සිතාසියක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(ඉ) (ඈ) ඡේදය යටතේ තැනැත්තකු වෙත නිකුත් කරන ලද සිතාසියක් ඒ තැනැත්තා වෙත පෞද්ගලිකව භාර දෙනු ලැබිය යුතු ය ; නැතහොත් ඒ තැනැත්තා අවසන් වරට වාසය කර ඇතැයි දැන ගන්නට ඇති ස්ථානයෙහි තැබිය යුතු ය.

(ඊ) (ඈ) ඡේදය යටතේ අධිකරණය ඉදිරියේ පෙනී සිටීමට සිතාසි ලැබූ යම් තැනැත්තකු සිතාසියට ප්‍රතිචාර වශයෙන් අධිකරණය ඉදිරියෙහි පෙනී සිටීම පැහැර හැරියහොත්, ඒ තැනැත්තා සිර භාරයට ගෙන අධිකරණය ඉදිරියට පැමිණවීම පිණිස අධිකරණය විසින් වරෙන්තුවක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(13) (අ) 12 වන උපවගන්තිය යටතේ කරන ලද පැමිණිල්ලක් විභාග කිරීමේ දී, වරද සඳහා වූ ව්‍යවස්ථාපිත දණ්ඩනය බන්ධනාගාරගත කිරීම වන්නා වූ හෝ ඒ දණ්ඩනයට බන්ධනාගාරගත කිරීම ඇතුළත් වන්නා වූ වරදකට තැනැත්තකු වරදකරු කර තිබෙන බවට සහ අධිකරණය විසින් අත්හිටුවන ලද දණ්ඩන නියමයක් නියම කරනු ලැබූවේ යම් වරදක් සම්බන්ධයෙන් ද ඒ වරදට අදාළ ක්‍රියාත්මක වන කාලය තුළ දී ඉහත කී වරද සිදු කර ඇති බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, (7) වන උපවගන්තියේ කුමක් සඳහන් ව ඇත ද, අධිකරණය විසින්-

(i) අත්හිටුවීමට යෙදුණු දණ්ඩන නියමය හෝ දණ්ඩන නියමයේ කොටස පුනස්ථාපනය කොට ඒ දඬුවම විඳින ලෙස වරදකරුට ආඥා කරනු ලැබිය හැකි ය ; නැතහොත්

(ii) දණ්ඩන නියමයේ කොටසක් හෝ දණ්ඩන නියමයේ අත්හිටුවීමට යෙදුණු කොටස හෝ පුනස්ථාපනය කොට ඒ දඬුවම විඳින ලෙස වරදකරුට ආඥා කරනු ලැබිය හැකිය; නැතහොත්

(iii) සම්පූර්ණයෙන් අත් හිටුවන ලද දණ්ඩන නියමයක් සම්බන්ධයෙන් වන විට, ආඥාවේ දිනයේ සිට මාස දොළහක් පසු නොවන දිනයකට, ක්‍රියාත්මක වන කාලය දීර්ඝ කරනු ලැබිය හැකි ය; නැතහොත්

(iv) අත්හිටුවන ලද දණ්ඩන නියමය සම්බන්ධයෙන් කිසිම ආඥාවක් කරනු නොලැබිය හැකි ය.

තව ද, ඊට අතිරේකව, අධිකරණය විසින් ඒ තැනැත්තාට රුපියල් විසිපන්දහසක් නොඉක්මවන දඩයක් නියම කරනු ලැබිය හැකි ය.

(ආ) අත්හිටුවන ලද බන්ධනාගාරගත කිරීමේ කාලයක් විඳින ලෙස (අ) ඡේදය යටතේ අධිකරණයක් විසින් වරදකරුවකුට ආඥා කරනු ලැබුවහොත්, අධිකරණය විසින් අන්‍යාකාරයකින් ආඥා කරනු ලැබුවහොත් මිස, ඒ කාලය ඒ තැනැත්තා විසින් -

(i) වහාම; සහ

(ii) වරදකරු විඳිමින් සිටින හෝ ඉදිරියට විඳීමට තිබෙන වෙනත් යම් බන්ධනාගාරගත කිරීමේ කාලයක් සමග සමගාමීව,

විඳිනු ලැබිය යුතු ය.

(ඇ) අත්හිටුවන ලද දණ්ඩන නියමය නියම කිරීමෙන් පසු, යම් තදනන්තර වරදක් පිළිබඳ කරුණු ද ඇතුළුව, උද්ගත වී ඇති හෝ දැනගන්නට ලැබී ඇති සියලු අවස්ථානුගත කරුණු හේතු කොට ගෙන, (13) වන වගන්තියේ (අ) ඡේදයේ (i) වන හෝ (ii) වන හෝ (iii) වන අනුඡේද යටතේ ආඥාවක් කිරීම යුක්ති සහගත නොවන බව අධිකරණයේ මතය වන්නේ නම් මිස, අධිකරණයක් විසින්, ඒ ඡේදය යටතේ ආඥාවක් කරනු ලැබිය යුතු අතර, අධිකරණය විසින් ඒ මතය දරන්නේ නම් ඊට හේතු අධිකරණය විසින් ලිඛිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(ඈ) (12) වන උපවගන්තිය යටතේ කරන ලද පැමිණිල්ලක් සම්බන්ධයෙන් වරදකරු පිළිබඳව වහාම කටයුතු කිරීමට අධිකරණයට නොහැකි වන්නේ නම්, අධිකරණය විසින් නියම කරනු ලබන යම් කොන්දේසි මත, අධිකරණය විසින් ඔහු ඇප පිට මුදා හරිනු ලැබිය යුතු ය.

**304.** බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් අත්හිටුවමින් ආඥාවක් කිරීමට යෝජනා කරන අධිකරණයක් විසින්, ඒ ආඥාව කිරීමට පෙර -

(අ) වරදකරු විසින් ක්ෂණිකව අවබෝධ කර ගන්නා භාෂාවකින් ඒ වරදකරුට -

(i) යෝජිත ආඥාවේ අරමුණ සහ බලපෑම : සහ

(ii) ක්‍රියාත්මක වන කාලය තුළ දී බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කරනු ලැබිය හැකි වෙනත් වරදක් වරදකරු විසින් කරනු ලැබුවහොත් ; ඉන් සිදු විය හැකි ප්‍රතිඵල.

පැහැදිලි කර දීම හෝ පැහැදිලි කර දීමට සැලැස්වීම හෝ කළ යුතු ය.

(ආ) වරදකරු හඳුනාගැනීම සඳහා සහ ඇඟිලි සටහන් ගැනීම සඳහා ආඥාවක් කරනු ලැබිය යුතු ය.

305 වගන්තිය § 3, 47/1999 මගින් ඉවත් කරන ලදී.

## XXV වන පරිච්ඡේදය

## වරදකරුවන් කොන්දේසි පිට නිදහස් කිරීම ආදිය

වරදකරුවන් කොන්දේසි පිට මුදා හැරීමට අවසර දීමට අධිකරණයට ඇති බලය

**306.** (1) යම් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් දඬුවම් පමුණුවනු ලැබිය හැකි වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව ඒ අධිකරණය ඉදිරියෙහි චෝදනා නගනු ලැබ, චෝදනාව ඔප්පු වී ඇතැයි අධිකරණය කල්පනා කරන නමුත් චෝදනා නගනු ලැබ ඇති තැනැත්තාගේ චරිතය, පූර්ව ක්‍රියා කලාපය, වයස, සෞඛ්‍යය හෝ මානසික තත්වය හෝ වරදේ අල්ප ස්වභාවය නැතහොත් වරද කරනු ලැබූ අවස්ථාවෙහි පැවති මන්දි කාරක කරුණු සැලකිල්ලට ගත් විට, ඒ තැනැත්තාට නාම මාත්‍ර දඬුවමක් නොවන වෙනත් යම් දඬුවමක් නියම කිරීම යෝග්‍ය නොවන බව හෝ මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි වරදකරු කොන්දේසි පිට නිදහස් කිරීම යෝග්‍ය වන බව හෝ අධිකරණයේ මතය වන අවස්ථාවක, ඔහු වරදකරු කිරීමට ක්‍රියා නොකොට, අධිකරණය විසින් -

(අ) සුදුසු යයි අධිකරණයට පෙනෙන යම් අවවාදයක් කිරීමෙන් පසු ඒ වරදකරු නිදහස් කරන ලෙස ආඥාවක් කරනු ලැබිය හැකි ය ; නැතහොත්

(ආ) යහපත් හැසිරීමෙන් යුක්තවන බවට සහ අධිකරණයේ ආඥාවෙහි සඳහන් කරනු ලබන්නා වූ ද අවුරුදු තුනක් නොඉක්මවන්නා වූ ද යම් කාලයක් ඇතුළත යම් අවස්ථාවක දී වරදකරු කිරීම සඳහා හා දණ්ඩන

* 1999 අංක 47 දරන පනතේ 3 වන වගන්තිය මගින් ඉවත් කරන ලදී.

නියමයක් කිරීම සඳහා පෙනී සිටින ලෙස නියම කරනු ලැබූ විට එසේ පෙනී සිටින බවට වරදකරු ඇපකරුවන් ඇතිව හෝ නැතිව බැඳුම් ඔප්පුවකට ඇතුළත් වූ විට, වරදකරු කොන්දේසි පිට නිදහස් කරනු ලැබිය හැකි ය.

(2) බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි යම් වරදක් සම්බන්ධයෙන් අධිචෝදනා පත්‍රයක් මත යම් තැනැත්තකු වරදකරු කරනු ලැබ, චෝදනා නගනු ලැබ ඇති තැනැත්තාගේ චරිතය පූර්ව ක්‍රියා කලාපය, වයස, සෞඛ්‍යය හෝ මානසික තත්ත්වය හෝ වරදේ අල්ප ස්වභාවය නැතහොත් වරද කරනු ලැබූ අවස්ථාවෙහි පැවති මන්දි කාරක කරුණු සැලකිල්ලට ගත් විට, ඒ තැනැත්තාට නාම මාත්‍ර දඬුවමක් නොවන වෙනත් යම් දඬුවමක් නියම කිරීම යෝග්‍ය නොවන බව හෝ මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි වරදකරු කොන්දේසි පිට නිදහස් කිරීම යෝග්‍ය වන බව හෝ අධිකරණයේ මතය වන අවස්ථාවක ඔහුට බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කිරීම වෙනුවට, යහපත් හැසිරීමෙන් යුක්ත වන බවට සහ ආඥාවෙහි සඳහන් කරනු ලබන්නා වූ ද අවුරුදු තුනක් නොඉක්මවන්නා වූ ද යම් කාලයක් ඇතුළත යම් අවස්ථාවක දී දණ්ඩන නියමයක් කිරීම සඳහා පෙනී සිටින ලෙස නියම කරනු ලැබූ විට එසේ පෙනී සිටින බවට වරදකරු ඇප කරුවන් ඇතිව හෝ නැතිව බැඳුම් ඔප්පුවකට ඇතුළත් වූ විට, වරදකරු කොන්දේසි පිට නිදහස් කරමින් අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් ආඥාවක් කරනු ලබන යම් ආඥාවකට අතිරේකව, අධිකරණය විසින් -

(i) මේ සංග්‍රහයේ 17 (4) වන වගන්තිය යටතේ වන්දි ගෙවන ලෙස; සහ

(ii) රජයේ ගාස්තු වශයෙන් සුදුසු යයි අධිකරණය කල්පනා කරන පරිදි රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන මුදලක් ගෙවන ලෙස

වරදකරුට ආඥාවක් කළ හැකි ය.

(4) මේ වගන්ති යටතේ වූ ආඥාවක් මහෙස්ත්‍රාත් අධිකරණය විසින් කරනු ලැබූ අවස්ථාවක, සොරකම් කරන ලද දේපළක් ආපසු පවරා දීමේ හෝ පුනස්ථාපන කිරීමේ කාර්යය සඳහා සහ අයිතිකරු වෙත දේපළ නැවත ලබා දීම හෝ දීම සම්බන්ධයෙන් හා එසේ නැවත ලබා දුන් විට නැතහොත් ඒ සම්බන්ධයෙන් මුදල් ගෙවීම සම්බන්ධයෙන් ආඥා කිරීමට අධිකරණයට හැකි කිරීමේ කාර්යය සඳහා, ඒ වරදකරු කිරීමක දී ඇති වන බලපෑම ම ඒ ආඥාවෙහි තිබිය යුතු ය.

බැඳුම් ඔප්පුවල ඇතුළත් විය යුතු කොන්දේසි.

**307.** මේ පරිච්ඡේදය යටතේ වූ බැඳුම් ඔප්පුවක, අවස්ථාවේ විශේෂ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් යම් කාරණයක් හෝ සම්බන්ධයෙන් එහි ඇතුළත් කළ යුතු යයි අධිකරණය විසින් ආඥා කරනු ලබන කොන්දේසි ඇතුළත් කළ හැකි ය. -

(අ) සොරුන් සහ වෙනත් නොමනා තැනැත්තන් ආශ්‍රය කිරීම හෝ නොමනා ස්ථානවල ගැවසීම හෝ වරදකරුට තහනම් කිරීම;

(ආ) කරන ලද වරද බීමත්කම වූ විට හෝ බීමත්ව සිටි අවස්ථාක දී කළ වරදක් වූ විට, මත්පැන් පානයෙන් වැළකීම;

(ඇ) වරදකරු අවංක හා කාර්යශීලි ජීවිතයක් ගත කරන බවට සාමාන්‍යයෙන් වග බලා ගැනීම;

(ඈ) ආඥාවෙහි සඳහන් කරනු ලබන යම් අන්තර්කාලවල දී ඇපකරුවකු හෝ ඇපකරුවන් හෝ වෙතොත් ඔවුන් ද සමග, මහෙස්ත්‍රාත් අධිකරණයක මහෙස්ත්‍රාත්වරයාගේ නිල කාමරයේ දී ඔහු ඉදිරියෙහි වරදකරු පෙනී සිටීම සඳහා කටයුතු සැලැස්වීම.

බැඳුම් ඔප්පුවක කොන්දේසි වෙනස් කිරීමට ඇති බලය.

**308.** වරදකරු කිරීම සඳහා හෝ දණ්ඩන නියමයක් කිරීම සඳහා හෝ පෙනී සිටින බවට මේ සංග්‍රහය යටතේ යම් තැනැත්තකු ඔහුගේ බැඳුම් ඔප්පුව මගින් බැඳීමකට යටත් වූයේ යම් අධිකරණයක් ඉදිරියේ ද ඒ අධිකරණය විසින්, වරදකරුට දැනුම් දීමෙන් පසු, බැඳුම් ඔප්පුවේ කොන්දේසි වෙනස් කරනු ලැබිය හැකි ය; තව ද එකී තැනැත්තාගේ හැසිරීම ඒ බැඳුම්

ඔප්පුව අවලංගු කිරීමට තරම් වන තත්ත්වයකින් යුක්ත වූ බවට අධිකරණය සෑහීමට පත් වුවහොත් අධිකරණය විසින් ඒ බැඳුම් ඔප්පුව අවලංගු කරනු ලැබිය හැකි ය.

බැඳුම් ඔප්පුවක කොන්දේසි පිළිපැදීම වරදකරු විසින් පැහැර හැර ඇති විටක අදාළ විධිවිධාන.

**309.** (1) වරදකරු කිරීම සඳහා හෝ දණ්ඩන නියමයක් කිරීම සඳහා හෝ පෙනී සිටින බවට මේ සංග්‍රහය යටතේ යම් තැනැත්තකු ඔහුගේ බැඳුම් ඔප්පුව මගින් බැඳීමකට යටත් වූයේ යම් අධිකරණයක් ඉදිරියේ ද ඒ අධිකරණය දිවුරුමක් මත හෝ ප්‍රතිඥාවක් මත ඉදිරිපත් කරනු ලබන තොරතුරු අනුව, වරදකරු ඔහුගේ බැඳුම් ඔප්පුවේ කොන්දේසි කිසිවක් පිළිපැදීම පැහැර හැර ඇති බවට සෑහීමට පත් වුවහොත්, ඔහු අල්ලීම පිණිස වරෙන්තුවක් ඒ අධිකරණය විසින් නිකුත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් පළමුව වරෙන්තුවක් නිකුත් කිරීම වෙනුවට සිතාසියේ සඳහන් යම් අධිකරණයකට සිතාසියේ සඳහන් යම් වේලාවක දී පැමිණ සිටින ලෙස වරදකරුට හා ඔහුගේ ඇපකරුවන් කිසිවකු වෙතොත් ඔවුන්ට ද නියම කරමින් සිතාසියක් නිකුත් කිරීම සුදුසු යයි අධිකරණය අදහස් කළහොත්, ඒ අධිකරණය විසින් එසේ කරනු ලැබිය හැකි ය.

(2) වරදකරු කිරීම සඳහා හෝ දණ්ඩන නියමයක් කිරීම සඳහා හෝ යම් අධිකරණයක් ඉදිරියේ වරදකරු පෙනී සිටින බවට ඔහුගේ බැඳුම් ඔප්පුවෙන් ඔහු බැඳීමට යටත් වූයේ ද ඒ අධිකරණය ඉදිරියට වරදකරු, අල්ලා ගනු ලැබූ විට, නොපමාව ගෙනෙනු නොලැබුවහොත්, මහෙස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියට ගෙනෙනු ලැබිය යුතු ය.

(3) අල්ලා ගනු ලැබූ විට වරදකරුවකු ගෙන එනු ලැබුවේ යම් අධිකරණයක් ඉදිරියට ද නැතහොත් ඉහත කී පරිදි යම් සිතාසියක් අනුව ඔහු පෙනී සිටියේ යම් අධිකරණයක් ඉදිරියේ ද ඒ අධිකරණය, වරදකරු කිරීම සඳහා හෝ දණ්ඩන නියමයක් කිරීම සඳහා හෝ පෙනී සිටීමට වරදකරු ඔහුගේ බැඳුම් ඔප්පුවෙන් බැඳී සිටින අධිකරණය නොවේ නම්, පසුව සඳහන් අධිකරණය ඉදිරියට ඔහු ගෙන යනු ලබන තෙක්, මුලින් සඳහන් අධිකරණය විසින් ඔහු රිමාන්ඩ් භාරයේ තැබීම නැතහොත් ඇප පිට නිදහස් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(4) වරදකරු කිරීම සඳහා හා දණ්ඩන නියමයක් කිරීම සඳහා හෝ යම් තැනැත්තකු ඔහුගේ බැඳුම් ඔප්පුවෙන් බැඳී සිටින්නේ යම් අධිකරණයක් ඉදිරියේ පෙනී සිටීමට ද ඒ

අධිකරණය, ඒ තැනැත්තා ඔහුගේ බැඳුම් ඔප්පුවේ යම් කොන්දේසියක් පිළිපැදීම පැහැර හැර ඇති බවට සෑහීමට පත් වූ විට, ඔහුගේ වරදකාරත්වය වැඩිදුර ඔප්පු කිරීමක් නොමැතිව ම ඒ අධිකරණය විසින් මුල් වරද සඳහා ඔහු වරදකරු කොට, ඔහුට දණ්ඩන නියමයක් කළ හැකි ය. නැතහොත් ඒ අධිකරණය විසින් ඒ නඩුව, අනුමත කළ හෝ සහතික කළ පාසලකට ඒ වරදකරු යවන ලෙස ළමයින් හා තරුණයන් පිළිබඳ ආඥාපනත යටතේ මුල් අධිකරණය විසින් ආඥාවක් කල හැකිව තිබුණු නඩුවක් වී නම් හා වරදකරු තවමත් අවුරුදු දහසයට අඩු බව පෙනේ නම්, එවැනි ආඥාවක් කරනු ලැබිය හැකි ය.

රීති සෑදීමට ඇති බලය.

**310.** මේ පරිච්ඡේදයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා 453 වන වගන්තිය යටතේ රීති සාදනු ලැබිය හැකි ය.

## XXVI වන පරිච්ඡේදය

## දණ්ඩන නියම අත්හිටුවීම, ලිහිල් කිරීම හා න්‍යාදේශ කිරීම

ජනාධිපතිවරයා විසින් දණ්ඩන නියම කොන්දේසි සහිතව අත්හිටුවීම හෝ ලිහිල් කිරීම හෝ කළ හැකි බව.

**311.** (1) යම් තැනැත්තකුට වරදක් සම්බන්ධයෙන් දඬුවම් නියම කර ඇති විට, කොන්දේසි රහිතව හෝ දණ්ඩනයට නියම වූ තැනැත්තා විසින් පිළිගනු ලබන යම් කොන්දේසි යටතේ හෝ ඔහුගේ දඬුවම ක්‍රියාවේ යෙදවීම, අත්හිටුවීම හෝ ඔහුට නියම කරන ලද දඬුවම සම්පූර්ණයෙන් ම නැතහොත් එයින් යම් කොටසක් ලිහිල් කිරීම හෝ ජනාධිපතිවරයා විසින් කවර හෝ අවස්ථාවක දී වුව ද කළ හැකි ය.

(2) දණ්ඩන නියමයක් අත්හිටුවා ගැනීම පිණිස හෝ ලිහිල් කරවා ගැනීම පිණිස ජනාධිපතිවරයා වෙත ඉල්ලීමක් කර ඇති කවර හෝ විටක, ඒ ඉල්ලීමට ඉඩ දිය යුතු ද නැතහොත් එය ප්‍රතික්ෂේප කළ යුතු ද යන්න සම්බන්ධයෙන් තමාගේ මතය, එම මතයට එළඹීමට හේතු ද සමග දක්වන ලෙස, එම දණ්ඩනයට නියම වූ තැනැත්තා වරදකරු කරන ලද්දේ නැතහොත් ඔහු වරදකරු කිරීම ස්ථිර කරන ලද්දේ යම් අධිකරණයක් ඉදිරියේ ද නැතහොත් යම් අධිකරණයක් විසින් ද ඒ අධිකරණයේ මුලාසනය දැරූ විනිශ්චයකාරවරයාට ජනාධිපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

(3) දණ්ඩන නියමයක් අත්හිටුවන ලද්දේ හෝ ලිහිල් කරන ලද්දේ හෝ යම් තැනැත්තකුගේ වාසියට ද ඒ තැනැත්තාට ජනාධිපතිවරයා විසින් නියම කරන ලද කොන්දේසි සපුරාලීම ඒ තැනැත්තා විසින් පැහැර හරින ලද නම්, එකී අත්හිටුවීම හෝ ලිහිල් කිරීම හෝ ජනාධිපතිවරයා විසින් අවලංගු කළ හැකි ය. එවිට ඒ තැනැත්තා නිදහසේ සිටි නම් පොලිස් නිලධරයකු විසින් වරෙන්තුවක් නොමැතිව ඔහු සිර භාරයට ගනු ලැබිය හැකි අතර දණ්ඩන නියමයේ ඉකුත් නොවී ඇති කොටස ඉකුත් වන තෙක් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් ඔහු රිමාන්ඩ් භාරයට පත් කරනු ලැබිය හැකි ය.

(4) දඬුවමකට සමාව දීමට, දඬුවමක් කල් තැබීමට, දඬුවමක් ප්‍රමාද කිරීමට හෝ දඬුවමක් ලිහිල් කිරීමට ජනාධිපතිවරයාට ඇති ඇයිතිවාසිකමට මේ වගන්තියේ ඇතුළත් කිසිවකින් බාධාවක් වෙතැයි සලකනු නොලැබිය යුතු ය.

**312**. දණ්ඩනයට නියම වූ තැනැත්තාගේ කැමැත්ත නොමැතිව, මෙහි පහත දැක්වෙන කවර වූ හෝ දණ්ඩන නියමයක් මෙහි ඊට අනුරූපව දක්වා ඇති න්‍යාදේශිත දණ්ඩන නියමයක් බවට ජනාධිපතිවරයා විසින් න්‍යාදේශ කරනු ලැබිය හැකි ය. ජනාධිපතිවරයා විසින් දණ්ඩන නියමයක් න්‍යාදේශ කළ හැකි බව.

| දණ්ඩන නියමය | න්‍යාදේශිත දණ්ඩන නියමය |
|---|---|
| මරණය | ජීවිතාන්තය දක්වා හෝ වෙනත් යම් කාලයක් හෝ බරපතල වැඩ ඇතිව හෝ නැතිව බන්ධනාගාරගත කිරීම |
| බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීම | අඩු කාලයක් බන්ධනාගාරගත කිරීම බරපතල වැඩ ඇතිව හෝ ඒ තැනැත්තාට නියම කළ හැකිව තිබුණු දීර්ඝතම කාලය නොඉක්මවන කාලයක් බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ දඩයක් |
| බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම | අඩු කාලයක් බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ දඩයක්. |

මේ පරිච්ඡේදයෙහි "ජනාධිපතිවරයා" යන පාඨයෙහි අර්ථය.

**313.** මේ පරිච්ඡේදයෙහි "ජනාධිපතිවරයා" යන යෙදුමෙන් ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා අදහස් වේ.

## XXVII වන පරිච්ඡේදය

## කලින් කර ඇති නිදොස් කිරීම් හෝ වරදකරු කිරීම

එකම වරදට කිසිම තැනැත්තකු දෙවරක් නඩු විභාගයට භාජන නොකළ යුතු බව.

Double Jeopardy

**314.** (1) නිසි අධිකරණ බලයක් ඇති අධිකරණයක් විසින් වරදක් පිළිබඳව නඩු විභාගයට වරක් භාජන කරනු ලැබ ඒ වරද සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ හෝ ඉන් නිදොස් කරනු ලැබූ තැනැත්තකු එසේ වරදකරු කිරීම හෝ නිදොස් කිරීම හෝ බලපවත්නා විට ඒ වරදම සම්බන්ධයෙන් හෝ ඔහුට විරුද්ධව කරන ලද චෝදනාවට වඩා වෙනස් වූ චෝදනාවක්, ඒ කරුණු ම පදනම් කොට ගෙන 166 වන වගන්තිය යටතේ කළ හැකිව තිබුණේ ද ඒ චෝදනාව සම්බන්ධයෙන් හෝ 167 වන වගන්තිය යටතේ වරදකරු කළ හැකිව තිබූ වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් හෝ නැවතත් නඩු විභාගයට භාජන වීමට යටත් නො විය යුතු ය.

(2) යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ හෝ ඉන් නිදොස් කරනු ලැබූ හෝ තැනැත්තකු පළමු නඩු විභාගයේ දී 165 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඔහුට විරුද්ධව වෙනම චෝදනාවක් කළ හැකි ව තිබූ යම් ප්‍රභින්න වරදක් සම්බන්ධයෙන් පසුව නඩු විභාගයට භාජන කළ හැකි ය.

(3) යම් තැනැත්තකු වරදකරු කරන ලද්දේ යම් වරදක් සංයුක්ත වන ක්‍රියාවක් සම්බන්ධයෙන් ද ඒ ක්‍රියාවෙන් සිදුවන ප්‍රතිවිපාක සමග ගත් කළ ඒ වරදට වඩා වෙනස් වරදක් ඒ ක්‍රියාවෙන් සංයුක්ත වන්නේ නම් සහ ඔහු වරදකරු කරනු ලැබූ වේලාවේ දී ඒ ප්‍රතිවිපාකය ඇති නොවී නම් හෝ ඇති වූ බව අධිකරණය දැන නොසිටියේ නම්, ඒ තැනැත්තා ඉන් පසුව ඒ වෙනස් වරද සම්බන්ධයෙන් නඩු විභාගයට භාජන කළ හැකි ය.

(4) යම් ක්‍රියාවලින් සංයුක්ත වන යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ හෝ ඉන් නිදොස් කරනු ලැබූ හෝ තැනැත්තකු එසේ වරදකරු කළ හෝ නිදොස් කළ අධිකරණයට, ඒ තැනැත්තා විසින් කරන ලද එම ක්‍රියාවලින් ම සංයුක්ත වන වෙනත් යම් වරදක් විභාග කිරීමට නිසි අධිකරණ බලය නොතිබී

නම්, ඒ වරදකරු කිරීම හෝ නිදොස් කිරීම නොතකා, ඒ වෙනත් වරදට ඔහුට විරුද්ධව චෝදනා කොට ඔහු නැවතත් නඩු විභාගයට භාජන කළ හැකි ය.

නිදර්ශන

(අ) සේවකයකු වශයෙන් සොරකමක් කරන ලදැයි යන චෝදනාව මත නඩු විභාග කරනු ලැබ "ඒ" නිදොස් කරනු ලබයි. එම නිදොස් කිරීම බලපවත්නා තාක් කල්, සේවකයකු වශයෙන් සොරකම් කිරීම සම්බන්ධයෙන් හෝ එම සිද්ධි මත ම හුදෙක් සොරකම් කිරීම සම්බන්ධයෙන් හෝ සාපරාධ ලෙස විශ්වාසය කඩ කිරීම සම්බන්ධයෙන් හෝ ඔහුට විරුද්ධව ඊට පසුව චෝදනා නැගිය නොහැකි ය.

(ආ) මිනී මැරීමේ චෝදනාවක් මත නඩු විභාගයට භාජනය කරනු ලැබ "ඒ" නිදොස් කරනු ලබයි. කොල්ලකෑමේ චෝදනාවක් වූයේ නැත. එහෙත් මරණය සිදු කළ වේලාවෙහි "ඒ" කොල්ලකෑම කළ බව සිද්ධිවලින් පෙනී යයි. කොල්ලකෑම සම්බන්ධයෙන් "ඒ" ට විරුද්ධව පසුව චෝදනා නගා නඩු විභාගයට ඔහු භාජන කළ හැකි ය.

(ඇ) බරපතල තුවාල සිදු කිරීම සම්බන්ධයෙන් "ඒ" නඩු විභාගයට භාජන කරනු ලැබ වරදකරු කරනු ලබයි. තුවාල ලැබූ තැනැත්තා පසුව මිය යයි. උපවාදය මනුෂ්‍ය ඝාතනය සම්බන්ධයෙන් "ඒ" නැවත වරක් නඩු විභාගයට භාජන කරනු ලැබිය හැකි ය.

(ඈ) "ඒ" විසින් "බී" මරණ ලදුව, උපවාද්‍යව මනුෂ්‍ය ඝාතනය කිරීම සම්බන්ධයෙන් "ඒ" ට විරුද්ධව චෝදනා නගා ඔහු වරදකරු කරනු ලබයි. "බී" මැරීම සම්බන්ධයෙන්, එම සිද්ධිය මතම මිනී මැරීමේ චෝදනාවට "ඒ" පසුව නඩු විභාගයට භාජන කළ නොහැකි ය.

(ඉ) "බී" ට ස්වේච්ඡාවෙන් ම තුවාල සිදු කිරීම සම්බන්ධයෙන් "ඒ" ට විරුද්ධව චෝදනා නගා ඔහු වරදකරු කරනු ලබයි. එම නඩුව මේ වගන්තියේ (3) වන උපවගන්තියේ විෂය පථයට ඇතුළත් වෙතොත් මිස, එම සිද්ධිය මත ම "බී" ට ස්වේච්ඡාවෙන් ම බරපතල තුවාල සිදු කිරීම සම්බන්ධයෙන් "ඒ" පසුව නඩු විභාගයට භාජන කළ නොහැකි ය.

කලින් නිදොස් කරනු ලැබීම හෝ වරදකරු කරනු ලැබීම පිළිබඳ උත්තරවාදය.

**315.** (1) කලින් නිදොස් කර තිබීම හෝ වරදකරු කර තිබීම හෝ පිළිබඳව උත්තරවාදය වාචිකව හෝ ලිඛිතව හෝ ඉදිරිපත් කළ හැකි අතර එය පහත දැක්වෙන ආකෘතිය අනුව හෝ පහත දැක්වෙන භාවයෙන් හෝ විය හැකි ය.

"අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 314 වන වගන්තිය ප්‍රකාර තමා නඩු විභාගයට භාජන කරනු ලැබීමට යටත් නොවන බව විත්තිකරු කියා සිටී. "

(2) ඒ උත්තරවාදය වෙනත් යම් උත්තරවාදයක් සමග ඉදිරිපත් කළ හැකි නමුදු, ඒ උත්තරවාදයෙන් උද්ගත වූ විසඳිය යුතු ප්‍රශ්නය, වෙනත් උත්තරවාද වලින් උද්ගත වූ විසඳිය යුතු ප්‍රශ්නවලට පෙර නඩු විභාගයට භාජන කොට විසඳා අවසන් කළ යුතු ය.

(3) කලින් නිදොස් කර තිබීමක් හෝ වරදකරු කර තිබීමක් හෝ පිළිබඳ උත්තරවාදයක් මත වූ විසඳිය යුතු ප්‍රශ්නයක් නඩු විභාගයට භාජනය වූ විට, අධිකරණය වෙත එවන ලද කලින් නඩු විභාගයේ දිවුරුම් සාක්ෂි සහ ලබා ගත හැකි නම් විනිශ්චයකාරවරයාගේ සටහන් ද තදනන්තර චෝදනාව පිළිබඳව අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද දිවුරුම් සාක්ෂි ද චෝදනාවල අනන්‍යතාව ඔප්පු කිරීමේ හෝ අසත්‍ය බැව් ඔප්පු කිරීමේ හෝ සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු ය.

## VII වන කොටස

## අභියාචනය, යොමු කිරීම සහ ප්‍රතිශෝධනය

### XXVII වන පරිච්ඡේදය
### අභියාචන

විධිවිධාන සලසා ඇති පරිදි හැර කිසිම අභියාචනයක් කළ නොහැකි බව.

**316.** මේ සංග්‍රහය මගින් හෝ තත් කාලයේ බලපවත්නා වෙනත් යම් නීතියක් මගින් හෝ විධිවිධාන සලසා ඇති පරිදි හැර, අපරාධ අධිකරණයක් විසින් දෙන ලද යම් නඩු තීන්දුවකට හෝ ආඥාවකට හෝ විරුද්ධව කිසිම අභියාචනයක් කළ නොහැකි විය යුතු ය.

## අ - මහෙස්ත්‍රාත් අධිකරණවලින් අභියාචනාධිකරණය වෙත කරනු ලබන අභියාචන

ඇතැම් අවස්ථාවල දී අභියාචන කළ නොහැකි බව.

**317.** (1) (අ) චූදිතයා 183 වන වගන්තිය යටතේ තමා වරදකරු බවට නිරවශේෂ පිළිගැනීමක් කර ඇති බවට හා මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් ඔහු වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක යම් නඩු තීන්දුවකට හෝ ආඥාවකට විරුද්ධව කිසිම අභියාචනයක් කළ නොහැකි විය යුතු ය.

[2005 අංක 21 S 5]

(2) ඒ හැර වෙනත් සියලු අවස්ථාවල දී, නීතිය පිළිබඳ කරුණක් මත, අභියාචනයක් කළ හැකි විය යුතු ය.

නිදොස් කිරීමකට විරුද්ධව අභියාචන

**318.** මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් කරනු ලැබූ නිදොස් කිරීමකට විරුද්ධව නීතිපතිවරයාගේ ඉල්ලීම පිට හෝ නීතිපතිවරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව හෝ හැර කිසිම අභියාචනයක් කළ නොහැකි විය යුතු ය.

අධිකරණ නියෝගයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව අභියාචන

**319.** අධිකරණ නියෝගයක් නිකුත් කිරීම මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක, ඒ අධිකරණ නියෝගය නිකුත් කරන ලෙස ඒ අධිකරණයට බල කරවීම සඳහා මැන්ඩාමුස් ආඥාවක් ලබා ගත හැකි විය යුතු ය. එහෙත් නීතිපතිවරයාගේ ඉල්ලීම පිට හෝ නීතිපතිවරයගේ ලිඛිත අනුමතය ඇතිව හෝ හැර එවැනි ප්‍රතික්ෂේප කිරීමකට විරුද්ධව කිසිම අභියාචනයක් කළ නොහැකි විය යුතු ය.

අභියාචන කිරීමේ අයිතිවාසිකම්

**320.** (1) තමා පාර්ශ්වකරුවකු වන අපරාධ නඩුවක දී හෝ කාරණයක දී හෝ, යම් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් ප්‍රකාශයට පත් කරන ලද යම් නඩු තීන්දුවකින් හෝ අවසාන ආඥාවකින් අතෘප්තියට පත් කවර හෝ තැනැත්තකු විසින් 317 වන, 318 වන, සහ 319 වන වගන්තිවල විධිවිධානවලට යටත් ව, නීතිය හෝ සිද්ධිය පිළිබඳ යම් දෝෂයක් සම්බන්ධයෙන් ඒ තීන්දුවට විරුද්ධව අභියාචනයක් පහත දැක්වෙන ආකාරයට අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(අ) ඒ නඩු තීන්දුව දෙනු ලැබූ හෝ ආඥාව කරනු ලැබූ දිනයේ සිට දවස් දහහතරක් ඇතුළත,

* 2005 අංක 21 දරන පනතේ 5 වන වගන්තිය (1) උපවගන්තියේ (අ) ඡේදය මගින් ඉවත් කරන ලදි.

අභියාචනාධිකරණය ඇමතූ අභියාචන පෙත්සමක් එකී මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන්; නැතහොත්

(ආ) අභියාචනය කිරීමට තමා බලාපොරොත්තු වන බව හා අභියාචනයට හේතු, ඉහත කී කාලය ඇතුළත, ඒ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාට හෝ අත්‍යප්තියට පත් තැනැත්තා තත් කාලයේ රඳවා තබනු ලැබ ඇති බන්ධනාගාරයේ ජේලර්වරයාට හෝ ප්‍රකාශ කර රුපියල් පහක වටිනාකම ඇති මුද්දරයක් ඒ සමග සැපයීමෙන්. එවිට අභියාචන පෙත්සමක් පිළියෙල කොට, එකී නඩු තීන්දුව හෝ ආඥාව ප්‍රකාශයට පත් කළ අධිකරණය වෙත එය ඉදිරිපත් කිරීම, අවස්ථාවෝචිත පරිදි, එකී රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ බන්ධනාගාරයේ ජේලර්වරයාගේ හෝ කාර්යය විය යුතු ය.

(2) යම් අපරාධ නඩුවක් හෝ කාරණයක් සම්බන්ධයෙන්, මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් ප්‍රකාශයට පත් කරන ලද නඩු තීන්දුවකට හෝ ආඥාවකට හෝ විරුද්ධව වූ අභියාචනයක්, 317 වන වගන්තියේ අදාළ විධිවිධානවලට යටත් ව, නීතිපතිවරයා විසින් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කළ හැකි අතර, ඔහු එසේ අභියාචනය ඉදිරිපත් කරන අවස්ථාවක හෝ අභියාචනයක් අනුමත කරන අවස්ථාවක, අභියාචන පෙත්සම ඉදිරිපත් කළ යුතු කාල සීමාව දවස් විසි අටක් විය යුතු ය.

**පැහැදිලි කිරීම** - චූදිතයකුගේ නඩු විභාගය ඉහළ අධිකරණයකට තබමින් 154 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවක් හෝ චූදිතයකු නිදහස් කරමින් 153 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවක්, නඩු තීන්දුවක් හෝ අවසාන ආඥාවක් හෝ නොවේ.

කාලය ගණන් බැලීම.

**321.** (1) අභියාචනයක් ඉදිරිපත් කළ යුත්තේ යම් කාලයක් ඇතුළත ද ඒ කාලය ගණන් බැලීමේ දී, අභියාචනය කරනු ලබන්නේ යම් නඩු තීන්දුවකට හෝ ආඥාවකට විරුද්ධව ද ඒ නඩු තීන්දුව හෝ ආඥාව ප්‍රකාශයට පත් කළ දිනය ගණන් ගත යුතු නමුත් සියලුම ඉරු දින සහ රජයේ නිවාඩු දින ගණන් ගනු නොලැබිය යුතු ය.

(2) අභියාචන පෙත්සමක් ඉදිරිපත් කිරීම සඳහා වූ කාලය ඉකුත් වන දිනයේ අධිකරණයේ කාර්යාලය වසා ඇති දිනයක් වුවහොත් ඉන්පසු ඒ කාර්යාලය විවෘත කෙරෙන ඊළඟ ප්‍රථම දිනයෙහි ඉදිරිපත් කරනු ලැබේ නම් එය නිසි කල්හි ඉදිරිපත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

**322.** (1) සෑම අභියාචන පෙත්සමක ම අභියාචනයට පදනම් වූ කරුණු හුහුඩින් ප්‍රකාශ විය යුතු අතර අභියාචක විසින් හෝ ඔහුගේ නීතිඥවරයා විසින් හෝ එය අත්සන් කර තිබිය යුතු ය.

අභියාචන පෙත්සමෙහි ප්‍රකාශ විය යුතු කරුණු.

(2) අභියාචනය කරනුයේ නීතිය පිළිබඳ කාරණයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක, විවාදයට භාජන කළ යුතු එම නීතිය පිළිබඳ කාරණය සම්බන්ධයෙන් වූ ප්‍රකාශයක් පෙත්සමෙහි ඇතුළත් විය යුතු අතර එම නීතිය පිළිබඳ කාරණය අභියාචනාධිකරණය විසින් විනිශ්චය කරනු ලැබීමට සුදුසු ප්‍රශ්නයක් බවට නීතිඥවරයකුගේ සහතිකයක් ද එහි ඇතුළත් විය යුතු ය.

(3) ඒ සෑම පෙත්සමක ම රුපියල් පහක මුද්දරයක් අලවා තිබිය යුතු ය:

එසේ වුවද, -

(අ) අභියාචනය 320 (2) වන වගන්තිය යටතේ නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලැබේ නම්, හෝ

(ආ) 136 (1) (ආ) වන වගන්තිය යටතේ කරන ලද ලිඛිත වාර්තාවක් මත පවරන ලද යම් නඩු කටයුත්තක දී මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් ප්‍රකාශයට පත් කරන ලද නඩු තීන්දුවකට හෝ අවසාන ආඥාවකට හෝ විරුද්ධව කරනු ලබන අභියාචනයක් සම්බන්ධයෙන් වන විට ඒ වාර්තාව කළ තැනැත්තා විසින් අභියාචනය ඉදිරිපත් කරනු ලැබේ නම්

ඒ මුද්දරය අවශ්‍ය නොවිය යුතු ය:

එසේම තවදුරටත්, අභියාචනය ඉදිරිපත් කරනු ලබන්නේ යම් අධිකරණයකින් ද ඒ අධිකරණයට සුදුසු යයි

පෙනී යයි නම් අභියාචනයේ නඩු තීන්දුව දෙනු ලබන තුරු මුද්දර ගාස්තුව ගෙවීම නතර කර තැබිය හැකි ය.

(4) අභියාචනයේ තීරණය පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ අභියාචකගේ වාසියට දෙනු ලැබුවහොත්, මුද්දර ගාස්තුවක් ගෙවා ඇති විට එය ඔහුට ආපසු දිය යුතු ය.

(5) අභියාචනයේ තීරණය අභියාචකට විරුද්ධව දෙනු ලැබුවහොත්, මුද්දර ගාස්තුව ඔහු විසින් ගෙවා නැති විට, ඒ මුද්දර ගාස්තුව සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් හෝ අඩු කිරීම යෝග්‍ය යයි අභියාචනාධිකරණය විසින් සලකනු ලබන්නේ නම් මිස, එය ඔහු විසින් ගෙවිය යුතු ය; නැතහොත් දඩයක් අය කර ගන්නා ආකාරයට ඔහුගෙන් අය කර ගත යුතු ය. අඩු කිරීමක් සිදු වුවහොත් එවිට එසේ අඩු කරනු නොලැබූ කොටස පමණක් අය කර ගනු ලැබිය යුතු ය.

ඇප දුන් විට අභියාචකයා මුදා හරිනු ලැබිය යුතු බව.

**323** (1)අභියාචනයක් ඉදිරිපත් කර ඇති විට, අභියාචක අත් අඩංගුවේ සිටින්නේ නම්, අභියාචනය ඉදිරිපත් කරනු ලැබුවේ යම් අධිකරණයකින් ද ඒ අධිකරණය විසින් විධාන කරනු ලබන මුදලකට එසේ විධාන කරනු ලබන පරිදි ඇපකරුවකු හෝ ඇපකරුවන් හෝ ඇතිව හෝ නැතිව අභියාචනාධිකරණයේ නඩු තීන්දුව පිළිපදින බවට හා තීන්දු කරනු ලබන නඩු ගාස්තු ගෙවන බවට වූ කොන්දේසිවලට යටත් බැඳුම් ඔප්පුවකට ඒ අභියාචක ඇතුළත් වූ විට, මුලින් සඳහන් අධිකරණය විසින් අභියාචක මුදා හරින ලෙස ආඥා කළ යුතු ය:

එසේ වුව ද අභියාචනය ඉදිරිපත් කරනු ලබන්නේ යම් අධිකරණයකින් ද ඒ අධිකරණය සුදුසු යයි කල්පනා කරන්නේ නම්, බැඳුම් ඔප්පුවකට ඇතුළත් වනු වෙනුවට ප්‍රමාණවත් යයි ඒ අධිකරණය සලකන, මුදලක් ඒ අධිකරණයෙහි තැන්පත් කිරීමෙන් හෝ අන්‍යාකාරයකින් හෝ අභියාචක විසින් වෙනත් යම් ඇපයක් තබනු ලැබිය හැකි ය.

(2) අභියාචක එවැනි යම් බැඳුම් ඔප්පුවකට ඇතුළත් වූ විට හෝ ඉහත කී පරිදි වෙනත් යම් ඇපයක් තැබූ විට හෝ ඔහු අත් අඩංගුවෙන් මුදා හරිනු ලැබිය යුතු ය.

(3) අභියාචක සිටින්නේ බන්ධනාගාරයේ නම් ඒ බන්ධනාගාරයේ අධිකාරිවරයා හෝ ජේලර්වරයා හෝ ඉදිරියෙහි ඒ බැඳුම් ඔප්පුවට ඇතුළත් විය හැකි අතර, එසේ ඇතුළත් වූ විට, එය එම අභියාචනය ඉදිරිපත් කරනු ලබන්නේ යම්

පෙනී යයි නම් අභියාචනයේ නඩු තීන්දුව දෙනු ලබන තුරු මුද්දර ගාස්තුව ගෙවීම නතර කර තැබිය හැකි ය.

(4) අභියාචනයේ තීරණය පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ අභියාචකගේ වාසියට දෙනු ලැබුවහොත්, මුද්දර ගාස්තුවක් ගෙවා ඇති විට එය ඔහුට ආපසු දිය යුතු ය.

(5) අභියාචනයේ තීරණය අභියාචකට විරුද්ධව දෙනු ලැබුවහොත්, මුද්දර ගාස්තුව ඔහු විසින් ගෙවා නැති විට, ඒ මුද්දර ගාස්තුව සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් හෝ අඩු කිරීම යෝග්‍ය යයි අභියාචනාධිකරණය විසින් සලකනු ලබන්නේ නම් මිස, එය ඔහු විසින් ගෙවිය යුතු ය; නැතහොත් දඩයක් අය කර ගන්නා ආකාරයට ඔහුගෙන් අය කර ගත යුතු ය. අඩු කිරීමක් සිදු වුවහොත් එවිට එසේ අඩු කරනු නොලැබූ කොටස පමණක් අය කර ගනු ලැබිය යුතු ය.

ඇප දුන් විට අභියාචකයා මුදා හරිනු ලැබිය යුතු බව.

**323** (1)අභියාචනයක් ඉදිරිපත් කර ඇති විට, අභියාචක අත් අඩංගුවේ සිටින්නේ නම්, අභියාචනය ඉදිරිපත් කරනු ලැබුවේ යම් අධිකරණයකින් ද ඒ අධිකරණය විසින් විධාන කරනු ලබන මුදලකට එසේ විධාන කරනු ලබන පරිදි ඇපකරුවකු හෝ ඇපකරුවන් හෝ ඇතිව හෝ නැතිව අභියාචනාධිකරණයේ නඩු තීන්දුව පිළිපදින බවට හා තීන්දු කරනු ලබන නඩු ගාස්තු ගෙවන බවට වූ කොන්දේසිවලට යටත් බැඳුම් ඔප්පුවකට ඒ අභියාචක ඇතුළත් වූ විට, මුලින් සඳහන් අධිකරණය විසින් අභියාචක මුදා හරින ලෙස ආඥා කළ යුතු ය:

එසේ වුව ද අභියාචනය ඉදිරිපත් කරනු ලබන්නේ යම් අධිකරණයකින් ද ඒ අධිකරණය සුදුසු යයි කල්පනා කරන්නේ නම්, බැඳුම් ඔප්පුවකට ඇතුළත් වනු වෙනුවට ප්‍රමාණවත් යයි ඒ අධිකරණය සලකන, මුදලක් ඒ අධිකරණයෙහි තැන්පත් කිරීමෙන් හෝ අන්‍යාකාරයකින් හෝ අභියාචක විසින් වෙනත් යම් ඇපයක් තබනු ලැබිය හැකි ය.

(2) අභියාචක එවැනි යම් බැඳුම් ඔප්පුවකට ඇතුළත් වූ විට හෝ ඉහත කී පරිදි වෙනත් යම් ඇපයක් තැබූ විට හෝ ඔහු අත් අඩංගුවෙන් මුදා හරිනු ලැබිය යුතු ය.

(3) අභියාචක සිටින්නේ බන්ධනාගාරයේ නම් ඒ බන්ධනාගාරයේ අධිකාරිවරයා හෝ ජේලර්වරයා හෝ ඉදිරියෙහි ඒ බැඳුම් ඔප්පුවට ඇතුළත් විය හැකි අතර, එසේ ඇතුළත් වූ විට, එය එම අභියාචනය ඉදිරිපත් කරනු ලබන්නේ යම්

අධිකරණයකින් ද ඒ අධිකරණය ඉදිරියේ දී ඇතුළත් වන ලද්දාක් සේ සියලු ආකාරයෙන් ම වලංගු විය යුතු ය. තවද අභියාචනයක් ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ සම්බන්ධයෙන් තැබිය යුතු ඇපයේ ප්‍රමාණය හා ස්වභාවය, බන්ධනාගාරගත කිරීමේ බලපත්‍රයෙහි, අධිකරණය විසින්, මේ කාර්යය සඳහා පිටසන් කළ යුතු ය.

(4) බරපතල වැඩ ඇතිව යම් කාලයකට බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයක් නියම කරනු ලැබූ තැනැත්තකු අභියාචනයක් ඉදිරිපත් කොට ඇත්තා වූ ද එහෙත් නියමිත බැඳුම් ඔප්පුව තැබීමට හෝ වෙනත් ඇපයක් දීමට හෝ ඔහුට නොහැකි වන්නා වූ ද අවස්ථාවක, අභියාචනාධිකරණයේ නඩු තීන්දුව බන්ධනාගාරයේ අධිකාරිවරයාට දැනුම් දෙන තුරු ඒ තැනැත්තා බරපතල වැඩ නැතිව අත් අඩංගුවෙහි රඳවා තබා ගනු ලැබිය යුතු ය.

(5) ඒ අභියාචක එසේ අත් අඩංගුවෙහි සිටි කාලය හෝ එයින් යම් කොටසක් හෝ ඔහුගේ දණ්ඩන නියමයේ දැක්වෙන කාලයෙන් කොටසක් ලෙස ගණන් ගනු ලැබිය යුතු යයි අභියාචනාධිකරණය විසින් ආඥා කළ හැකි ය.

(6) අභියාචන පෙත්සමක් ඉදිරිපත් කර ඇති විට එම අභියාචන පෙත්සම සමග නඩු කටයුතු වාර්තාව මහෙස්ත්‍රාත්වරයා විසින් අභියාචනාධිකරණයට යැවිය යුතු අතර, ඒ බව අභියාචනයට විෂය වූ නඩු තීන්දුව හෝ ආඥාව හෝ ප්‍රකාශයට පත් කරන ලද්දේ පැමිණිලිකරු වූ නැතහොත් චූදිතයා වූ යම් පාර්ශ්වකරුවකුගේ වාසියට ද නැතහොත් අභියාචනය ඉදිරිපත් කොට ඇත්තේ යම් පාර්ශ්වකරුවකුගේ අවාසියට ද, ඒ පාර්ශ්වකරු වෙත අප්‍රමාදව දැනුම් දිය යුතුය.

නඩු කටයුතු වාර්තා අභියාචනාධිකරණයට ඉදිරිපත් කළ යුතු බව හා අභියාචනයට විෂය වූ නඩු තීන්දුව හෝ ආඥාව ප්‍රකාශ කර ඇත්තේ යම් තැනැත්තකුගේ වාසියට ද ඒ තැනැත්තාට ඒ පිළිබඳව දැනුම් දිය යුතු බව.

**324.** (1) නඩු කටයුතු වාර්තාව සහ අභියාචන පෙත්සම අභියාචනාධිකරණය වෙත යවනු ලැබූ විට, රෙජිස්ට්‍රාර්වරයා විසින් අභියාචනයට අංක යොදා එය අභියාචන ලැයිස්තුවෙහි ඇතුළත් කරනු ලැබිය යුතු අතර ඒ ලැයිස්තුව අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ එල්ලා තැබිය යුතු ය.

අභියාචනයක් කරනු ලැබූ විට අභියාචනාධිකරණයෙහි කාර්ය පටිපාටිය.

(2) අභියාචනයේ පාර්ශ්වකරුවන්ට වැඩිදුර දැනුම් දීමක් නොමැතිව අභියාචනය අංක පිළිවෙල අනුව විභාගයට ගනු ලැබිය යුතු ය:

එසේ වුව ද, අභියාචනය පවත්වාගෙන යාම හෝ අභියාචනයේ ගාස්තු හෝ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සුදුසු යයි අධිකරණය කල්පනා කරන නියම මත අධිකරණය විසින් සිය මෙහෙයවීමෙන් ම හෝ පාර්ශ්වකරුවකුගේ ඉල්ලීමක් පිට හෝ අභියාචන විභාගය ඉක්මන් කිරීම නැතහොත් කල් තැබීම කළ හැකි ය.

පළමුව අභියාචකට සවන් දිය යුතු බව.

**325.** (1) අභියාචනය විභාගය සඳහා ගනු ලැබූ විට, අභියාචක පැමිණ සිටී නම් අභියාචනය සනාථ කිරීම සඳහා ඔහු ඉදිරිපත් කරන කරුණුවලට පළමුව සවන් දිය යුතු අතර, වගඋත්තරකරු පැමිණ සිටී නම්, අභියාචනයට විරුද්ධව ඔහු ඉදිරිපත් කරන කරුණු වලට ඉන් අනතුරුව සවන් දිය යුතු ය.

(2) අභියාචනය සනාථ කිරීම සඳහා අභියාචක පැමිණ නොසිටී නම්, අධිකරණය විසින් අභියාචනය සලකා බලා සුදුසු යයි අධිකරණය සලකන යම් ආඥාවක් ඒ සම්බන්ධයෙන් කළ හැකි ය.

වග උත්තරකරු පැමිණ නොසිටින විට, කාර්ය පටිපාටිය.

**326.** අභියාචනයක් විභාග කරන විට වගඋත්තරකරු අධිකරණයට පැමිණ නොසිටී නම් සහ අභියාචන දැන්වීම ඔහුට යථා පරිදි භාර දී ඇති බවට අධිකරණය සෑහීමට පත් නොවී නම්, පෙනී සිටීමට ඔහුට ඉඩ සැලැස්වීම සඳහා අධිකරණය විසින් අභියාචන විභාගය මතු දිනයකට අඩාළව කල් තබනු ලැබිය හැකි ය. එවැනි අවස්ථාවක දී ඔහුට භාර දීමට නියමිත දැන්වීම පිස්කල් මගින් භාර දීම සඳහා අධිකරණය විසින් නිකුත් කරනු ලැබිය යුතු ය. එහෙත් ඉහත කී පරිදි අධිකරණය සෑහීමකට පත් වුවහොත් මිස වගඋත්තරකරු පැමිණ නොමැති විට ඔහුට හානි කර ආඥාවක් අධිකරණය විසින් නොකළ යුතු ය.

නිදොස් කිරීමකට විරුද්ධව අභියාචනය කිරීමක දී චූදිතයා සිර භාරයට ගැනීම.

**327.** නිදොස් කිරීමකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ විට, චූදිතයා සිර භාරයට ගෙන ඔහු අභියාචනාධිකරණය ඉදිරියට ගෙන එන ලෙස විධාන කරමින් අභියාචනාධිකරණය විසින් වරෙන්තුවක් නිකුත් කරනු ලැබිය

හැකි අතර අභියාචනය විභාග කර අවසන් කරන තුරු ඔහු සිර භාරයේ තැබීම හෝ ඔහු ඇප පිට නිදහස් කිරීම හෝ ඒ අධිකරණය විසින් කළ හැකි ය.

අභියාචන සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ බලය.

**328.** අභියාචනය විභාග කිරීමේ දී, මැදිහත් වීමට තරම් ප්‍රමාණවත් හේතු නොමැති බව අධිකරණය සලකන්නේ නම් අභියාචනය නිෂ්ප්‍රභ කළ හැකි ය; නැතහොත්,-

(අ) නිදොස් කිරීමේ ආඥාවකට විරුද්ධව වූ අභියාචනයක දී, ඒ ආඥාව ප්‍රතිවර්තනය කොට අවස්ථාවෝචිත පරිදි, වැඩිදුර විභාග පවත්වන ලෙස හෝ චූදිතයා නැවත නඩු විභාගයට භාජන කරන ලෙස හෝ ඔහුගේ නඩු විභාගය ඉහළ අධිකරණයට තබන ලෙස හෝ විධාන කිරීම හෝ නැතහොත් ඔහු වරදකරු බව තීරණය කොට ඔහු විෂයෙහි නීතිය අනුව දණ්ඩන නියමයක් කිරීම;

(ආ) වරදකරු කිරීමට විරුද්ධව වූ අභියාචනයක දී-

(i) තීන්දු ප්‍රකාශය හා දණ්ඩන නියමය ප්‍රතිවර්තනය කොට චූදිතයා නිදොස් කිරීම හෝ නිදහස් කිරීම හෝ හිසි අධිකරණ බලය ඇතිඅධිකරණයක් විසින් ඔහුට විරුද්ධව නැවත නඩු විභාග කරනු ලැබිය යුතු යයි නැතහොත් ඔහුගේ නඩු විභාගය ඉහළ අධිකරණයට තැබිය යුතු යයි ආඥා කිරීම; හෝ

(ii) දණ්ඩන නියමය එසේම තිබිය දී තීන්දුව වෙනස් කිරීම හෝ තීන්දුව වෙනස් කර හෝ නොකර දණ්ඩන නියමයේ ප්‍රමාණය වැඩි හෝ අඩු හෝ කිරීම හෝ එහි ස්වභාවය වෙනස් කිරීම;

(ඇ) වෙනත් යම් ආඥාවකට විරුද්ධව වූ අභියාචනයක දී, ඒ ආඥාව වෙනස් කිරීම හෝ ප්‍රතිවර්තනය කිරීම කළ හැකි යː

එසේ වුව ද, අභියාචනයක් මත කරනු ලබන දණ්ඩන නියමය මුල් අධිකරණය විසින් නියම කළ හැකිව තිබූ දණ්ඩන නියමය නොඉක්මවිය යුතු ය.

අභියාචනාධිකරණය විසින් වැඩිදුර සාක්ෂි සටහන් කළ හැකි බව හෝ සාක්ෂි සටහන් කරන ලෙස විධාන කළ හැකි බව.

**329.** (1) මේ පරිච්ඡේදය යටතේ අභියාචනයක් පිළිබඳව කටයුතු කිරීමේ දී වැඩිදුර සාක්ෂි අවශ්‍ය යයි අභියාචනාධිකරණය කල්පනා කරන්නේ නම් ඒ වැඩිදුර සාක්ෂි අභියාචනාධිකරණය විසින් ම සටහන් කළ හැකි ය. නැතහොත් ඒ සාක්ෂි සටහන් කරන ලෙස යම් මහෙස්ත්‍රාත්වරයකුට විධාන කළ හැකි ය.

(2) වැඩිදුර සාක්ෂි සටහන් කරනු ලැබූ විට, ඒ සාක්ෂි සටහන් කළ මහෙස්ත්‍රාත්වරයා විසින් එසේ සටහන් කරන ලද සාක්ෂි යථා පරිදි සහතික කොට, ඒ සාක්ෂි පිළිබඳව තම මතය ද දක්වා, ඒ සාක්ෂි අභියාචනාධිකරණය වෙත යැවිය යුතු ය.

(3) අභියාචනාධිකරණය විසින් අන්‍යාකාර විධානයක් කරතහොත් මිස, මෙම වගන්තිය හා 328 වන වගන්තිය යටතේ වැඩිදුර සාක්ෂි කිසිවක් සටහන් කරන විට චූදිතයා හෝ ඔහුගේ උත්තරවාදියා හෝ පැමිණ සිටිය යුතු ය.

(4)ඒ සාක්ෂි සටහන් කර ගැනීම XV වන පරිච්ඡේදය යටතේ වූ පරීක්ෂණයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

අභියාචනයේ නඩු තීන්දුව විවෘත අධිකරණයෙහි දී ප්‍රකාශ කළ යුතු බව.

**330.** (1) අභියාචන විභාගය අවසන් වූ විට, අභියාචනාධිකරණය විසින් ඒ අවස්ථාවේ දී ම හෝ තත් කාර්යය සඳහා ඒ අවස්ථාවේ දී නියම කළ යුතු යම් පසු දිනයක හෝ, තම තීරණයට හේතු දක්වමින්, නඩු තීන්දුව විවෘත අධිකරණයෙහි දී ප්‍රකාශ කළ යුතු ය.

(2) එසේ නියම කරන ලද දිනයේ දී, නඩු තීන්දුව දීමට අධිකරණය සූදානම් නැත්නම්, ඒ කාර්යය සඳහා තවත් පසු දිනයක් නියම කොට ප්‍රකාශයට පත් කළ හැකි ය.

## ආ - මහාධිකරණයෙන් අභියාචනාධිකරණය වෙත කරනු ලබන අභියාචන සහ අභියාචනය කිරීමට අවසර ලබා ගැනීමේ ඉල්ලීම්

අභියාචන පෙත්සම ඉදිරිපත් කිරීම හෝ අභියාචනය කිරීමට අවසර ඉල්ලීම.

**331.** (1) මේ පරිච්ඡේදය යටතේ වූ අභියාචනයක්, ඒ අභියාචනය කරනු ලබන්නේ යම් වරදකරු කිරීමකට, දණ්ඩන නියමයකට හෝ ආඥාවකට විරුද්ධව ද ඒ වරදකරු කිරීම, දණ්ඩන නියමය හෝ ආඥාව මහාධිකරණය විසින් ප්‍රකාශයට පත් කරනු ලැබූ දින සිට දවස් දාහතරක් ඇතුළත,

මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත අභියාචන පෙත්සමක් හෝ අභියාචනය කිරීමට අවසර ලබා ගැනීමේ ඉල්ලීමක් හෝ භාර දීමෙන්, කළ හැකි ය:

එසේ වුවද, බන්ධනාගාරයේ සිටි තැනැත්තකු විසින්, අභියාචනය කිරීමට තමා බලාපොරොත්තු වන බව ද ඒ අභියාචනයට හේතු ද ඔහු තත් කාලයේ රඳවා තබා ඇති බන්ධනාගාරයේ ජේලර්වරයාට ඉහත සඳහන් කාලය තුළ දී ප්‍රකාශ කිරීමෙන් අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය. එවිට අභියාචන පෙත්සමක් පිළියෙල කොට, ඒ අභියාචනයට විෂය වී ඇති වරදකරු කිරීම, දණ්ඩන නියමය හෝ ආඥාව ප්‍රකාශයට පත් කළ මහාධිකරණය වෙත ඒ අභියාචන පෙත්සම ඉදිරිපත් කිරීම ඒ ජේලර්වරයාගේ කාර්යය විය යුතු ය.

(2) අභියාචනයක් ඉදිරිපත් කළ යුත්තේ කවර කාලයක් ඇතුළත ද ඒ කාලය ගණන් බැලීමේ දී, ඒ අභියාචනය කරනු ලබන්නේ යම් නඩු තීන්දුවකට හෝ අවසාන ආඥාවකට විරුද්ධව ද එම නඩු තීන්දුව හෝ ආඥාව ප්‍රකාශයට පත් කළ දිනය ගණන් ගත යුතු නමුත් සියලුම ඉරු දින සහ රජයේ නිවාඩු දින ගණන් නොගත යුතු ය.

(3) අභියාචන පෙත්සමක් ඉදිරිපත් කිරීම සඳහා වූ කාලය අධිකරණයේ කාර්යාලය වසා ඇති දිනයක ඉකුත් වුවහොත් ඉන්පසු ඒ කාර්යාලය විවෘත කෙරෙන ඊළඟ ප්‍රථම දිනයෙහි එය ඉදිරිපත් කරනු ලැබී නම් එය නිසි කල්හි ඉදිරිපත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අභියාචන පෙත්සම මනා හා යෝග්‍ය කඩදාසියක පැහැදිලිව ලියා අභියාචක විසින් හෝ අභියාචකගේ නීතිඥවරයා විසින් හෝ අත්සන් කර දිනය යොදා තිබිය යුතු ය. තවද අභියාචන පෙත්සමෙහි පහත දැක්වෙන තොරතුරු ඇතුළත් විය යුතු ය :-

(අ) අභියාචනය කරනු ලබන්නේ යම් වරදකරු කිරීමකට, දණ්ඩන නියමයකට හෝ ආඥාවකට විරුද්ධව ද ඒ වරදකරු කිරීම, දණ්ඩන නියමය හෝ ආඥාව ප්‍රකාශයට පත් කළ මහාධිකරණයේ සැසි වාරය;

(ආ) නඩුවේ අංකය;

(ඇ) අභියාචකගේ සහ වග උත්තරකරුගේ නම සහ ලිපිනය;

(ඈ) අභියාචනාධිකරණය වෙත කැරෙන ඇමතුම;

(ඇ) අභියාචනය කරනු ලබන්නේ යම් නඩු තීන්දුවකට හෝ ආඥාවකට විරුද්ධව ද, අවස්ථාවෝචිත පරිදි, ඒ නඩු තීන්දුව හෝ ආඥාව හෝ ප්‍රකාශයට පත් කළ දිනය සහ එම ප්‍රකාශයේ ස්වභාවය;

(ඊ) අභියාචනයට පදනම් වූ හේතු දැක්වෙන සරල හා සංක්ෂිප්ත ප්‍රකාශයක්;

(උ) ඉල්ලා සිටින සහනය.

(5) අභියාචක විසින් අභියාචනයට රුපියල් පහක් වටිනා මුද්දර ඇලවිය යුතු ය. එහෙත් අභියාචනය නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන විට හෝ මරණීය දණ්ඩනය නියම කැරෙන දණ්ඩන නියමකට විරුද්ධව වන විට හෝ මුද්දර ගාස්තුවක් අවශ්‍ය නොවේ.

අභියාචනය සංශෝධන කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම කළ හැකි බව.

**332.** මෙහි නියම කර ඇති ආකාරයෙන් අභියාචනය ඉදිරිපත් කරනු නොලැබුවහොත්, අධිකරණය විසින් නියම කරනු ලබන කාලයක් ඇතුළත එය සංශෝධනය කිරීමේ කාර්යය සඳහා අභියාචක වෙත ආපසු යැවීම හෝ එය එහි දී ම හා ඒ අවස්ථාවේ දී ම සංශෝධනය කිරීම හෝ කළ හැකි ය. විධාන කරන ලද පරිදි අභියාචනය සංශෝධනය කරනු නොලැබුවහොත්, අධිකරණය විසින් වාර්තාගත කළ යුතු හේතු මත ඒ අභියාචනය ප්‍රතික්ෂේප කළ හැකි ය. යම් අභියාචනයක් සංශෝධනය කරන ලද අවස්ථාවක විනිශ්චයකාරවරයා විසින් හෝ ඒ සඳහා ඔහු විසින් පත් කරනු ලබන ඒ අධිකරණයේ නිලධරයකු විසින් තම අත්සන යෙදීමෙන් ඒ සංශෝධනය සහතික කළ යුතු ය.

අභියාචනය භාර ගනු ලැබූ කල්හි නඩු කටයුතු තව දුරටත් පැවැත්වීම නතර කිරීම

**333.** (1) අධිකරණය විසින් අභියාචනය භාර ගනු ලැබූ කල්හි ඒ නඩුව සම්බන්ධයෙන් තව දුරටත් පැවැත්වෙන සියලුම නඩු කටයුතු නතර කළ යුතු අතර නඩු වාර්තාව සහ එහි පිටපත් අටක් ද විනිශ්චයකාරවරයා විසින් ගන්නා ලද සාක්ෂි සටහන් ද සමඟ එකී අභියාචනය හැකි තරම් ඉක්මනින් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) නිදොස් කිරීමකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ විට චූදිතයා සිර භාරයට ගෙන අධිකරණය ඉදිරියට පමුණුවන ලෙස විධාන කෙරෙන වරෙන්තුවක් අධිකරණය විසින් නිකුත් කළ හැකි අතර අභියාචනය තීරණය කරන තුරු ඔහු බන්ධනාගාරයේ තැබීමට නියම කිරීම හෝ ඔහු ඇප පිට නිදහස් කිරීම හෝ අධිකරණය විසින් කළ හැකි ය.

(3) වරදකරු කිරීමකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ විට අභියාචනය තීරණය කරන තුරු මහාධිකරණය විසින් (4) වන උප වගන්තියට යටත් ව අභියාචක ඇප පිට නිදහස් කළ හැකි ය. ඇප පිට නිදහස් කරනු නොලැබූ අභියාචකයකුගේ අභියාචනය තීරණය කරනු ලබන තෙක් බන්ධනාගාර ආඥාපනත යටතේ සාදනු ලැබූ රීති මගින් නියමිත ආකාරයකින් ඒ අභියාචක සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ය.

(4) චූදිතයාට මරණීය දණ්ඩනය නියම කරනු ලබන අවස්ථාවක ඔහු සම්බන්ධයෙන් මරණ දඬුවම ක්‍රියාත්මක කිරීම අත්හිටුවනු ලැබිය යුතු අතර අභියාචනය තීරණය කරනු ලබන තුරු බන්ධනාගාර ආඥාපනත යටතේ සාදනු ලබන රීති මගින් නියම කරනු ලබන ආකාරයට ඔහුට සලකනු ලැබිය යුතු ය. [1988 අංක 13 § 2]

(5) ස්වකීය අභියාචනය තීරණය කරන තෙක් අභියාචකයකු ඇප පිට නිදහස් කරනු ලබන කාල සීමාව ද, අභියාචක අත් අඩංගුවේ සිටි නම් (යම් අභියාචනයක් සම්බන්ධයෙන් අභියාචනාධිකරණය විසින් මීට පටහැනිව කරනු ලබන යම් විධානවලට යටත්ව) ඔහු අභියාචකයකු ලෙස මේ වගන්තිය යටතේ විශේෂයෙන් කරනු ලබන කාල සීමාව ද ඔහුට නියම කර ඇති දණ්ඩන නියමය යටතේ බන්ධනාගාරගත කිරීමේ යම් කාල සීමාවක කොටසක් ලෙස සලකනු නොලැබිය යුතු ය. තවද මහාධිකරණය විසින් පනවන ලද දණ්ඩන නියමය යටතේ වුවද අභියාචනාධිකරණය විසින් පනවන ලද දණ්ඩන නියමය යටතේ වුවද අභියාචක බන්ධනාගාරගත කිරීමක් අභියාචනාධිකරණයේ විධානවලට හෝ ආඥාවට යටත්ව අවස්ථාවට අවශ්‍ය පරිදි නැවත ආරම්භ වීම නැතහොත් පටන් ගැනීම, අභියාචක අත් අඩංගුවෙහි සිටින්නේ නම් අභියාචනය තීරණය කරනු ලැබූ දින සිට ද අභියාචක අත් අඩංගුවෙහි නොසිටින්නේ නම් දණ්ඩන නියමය යටතේ ඔහු බන්ධනාගාරයට භාර ගනු ලැබූ දින සිට ද සිදුවන ලෙස සලකනු ලැබිය යුතු ය.

නඩු විභාගය ජූරි සභාවක් ඉදිරියේ පැවැත්වුණු නඩුවලට විරුද්ධ වූ අභියාචන තීරණය කිරීම.

**334.** (1) ජූරි සභාවක තීන්දුවක් මත වූ වරදකරු කිරීමකට විරුද්ධව ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක දී ජූරි සභාවේ තීන්දුව අසාධාරණ වීමේ හේතුව මත හෝ සාක්ෂි ගැන සලකා බලන කල තහවුරු කළ නොහැකි වීමේ හේතුව මත හෝ ඒ තීන්දුව අවලංගු කළ යුතු බව හෝ අභියාචක වරදකරු කරනු ලැබුවේ යම් අධිකරණයක් ඉදිරියෙහි ද ඒ අධිකරණයේ නඩු තීන්දුව නීතිය පිළිබඳ යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් වූ වැරදි තීරණයක හේතුව මත ඉවතලිය යුතු යයි නැතහොත් කවර හෝ හේතුවක් නිසා යුක්තිය ඉටු නොවීමක් සිදු වී ඇති බව අභියාචනාධිකරණය විසින් සලකනු ලබන්නේ යම් අභියාචනාධිකරණය විසින් අභියාචනයට ඉඩ දිය යුතු අතර වෙනත් කවර වුවද අවස්ථාවක දී අභියාචනය නිෂ්ප්‍රභ කළ යුතු ය:

එසේ වුවද අභියාචනයේ දී ඔහු මතු කර ඇති ප්‍රශ්නය අභියාචකගේ වාසියට තීරණය විය හැකි බව අධිකරණයේ මතය වුවද සැලකිය යුතු තරමින් යුක්තිය ඉටු නොවීමක් ඇත්ත වශයෙන් සිදු වී නැතැයි අධිකරණය සලකන්නේ නම් අධිකරණය විසින් අභියාචනය නිෂ්ප්‍රභ කළ හැකි ය.

(2) වරදකරු කිරීමකට විරුද්ධව වූ අභියාචනයකට අභියාචනාධිකරණය විසින් ඉඩ දෙනු ලබන්නේ නම්, එකී වරදකරු කිරීම, මේ සංග්‍රහයේ ඇති විශේෂ විධිවිධාන වලට යටත්ව, අභියාචනාධිකරණය විසින් නිෂ්ප්‍රභ කොට ඔහු නිදොස් කිරීමේ නඩු තීන්දුවක් දෙන ලෙස විධාන කළ යුතු ය:

එසේ වුවද අභියාචනයට ඉඩ දීමට හේතු වූ අනුමිතතාව නිසා නොවේ නම් චූදිතයා යුක්ති සහගත ලෙස වරදකරු කළ හැකි වීමට ප්‍රමාණවත් වූ සාක්ෂි ජූරි සභාව ඉදිරියෙහි තිබුණු බව අභියාචනාධිකරණයේ මතය වේ නම් අලුත් නඩු විභාගයක් පවත්වන ලෙස අභියාචනාධිකරණය විසින් ආඥා කළ හැකි ය.

(3) වරදකරු කිරීම කරන ලද්දේ යම් නඩු විභාගයක දී ද ඒ නඩු විභාගය, අධිකරණය සංයුක්ත වී ඇති ආකාරයෙහි යම් දෝෂයක් හේතුවෙන් හෝ අන්‍යාකාරයකින් හෝ නිෂ්ප්‍රභ වන්නක් වූ විට අලුතෙන් නඩු විභාගයක් පවත්වන ලෙස ආඥා කිරීමට අභියාචනාධිකරණයට ඇති බලය කෙරෙහි මේ වගන්තියෙහි වූ කිසිවක් බල නොපෑ යුතු ය.

(4) අභියාචකයකු අධිචෝදනා පත්‍රයේ යම් චෝදනාවකට හෝ කොටසකට හෝ නිසි ලෙස වරදකරු කරනු ලැබ නොමැති නමුත් අධිචෝදනා පත්‍රයේ වෙනත් යම් චෝදනාවකට හෝ කොටසකට හෝ නිසි ලෙස වරදකරු කරනු ලැබ ඇති බව අභියාචනාධිකරණයට පෙනී යතහොත්, නඩු විභාගයේ දී අභියාචක විෂයෙහි නියම කරන ලද දණ්ඩන නියමය ස්ථිර කිරීම හෝ අභියාචක නිසි ලෙස වරදකරු කරනු ලැබුවේ යයි අධිකරණය සලකනු ලබන්නේ අධිචෝදනා පත්‍රයේ කවර චෝදනාවක් හෝ කොටසක් හෝ සම්බන්ධයෙන් ද ඒ චෝදනාව හෝ කොටස හෝ සම්බන්ධයෙන් නියම කිරීමට නීතිය අනුව තීන්දුවෙන් ඉඩ ලැබෙන්නා වූ ද, සුදුසු යයි අධිකරණය කල්පනා කරන්නා වූ ද දණ්ඩන නියමයක් ඉහත සඳහන් නියමය වෙනුවට ආදේශ කිරීම හෝ, අධිකරණය විසින් කළ හැකි ය.

(5) අභියාචක එක් වරදකට වරදකරු කරනු ලැබ ඇත්තා වූ ද අධිචෝදනා පත්‍රය මත ජූරි සභාව විසින් වෙනත් යම් වරදකට ඔහු වරදකරු බව තීරණය කළ හැකිව තිබුණා වූ ද ඒ වෙනත් වරද සම්බන්ධයෙන් වරදකරු බව ඔප්පු කළ සිද්ධි පිළිබඳව ජූරි සභාව සෑහීමට පත් වී සිටින්නට ඇතැයි ජූරි සභාවේ තීන්දුව මත අභියාචනාධිකරණයට පෙනී යන්නා වූ ද අවස්ථාවක, අභියාචනාධිකරණය විසින් අභියාචනයට ඉඩ දීම හෝ අභියාචනය නිෂ්ප්‍රභ කිරීම හෝ නොකොට ජූරි සභාවේ තීන්දුව වෙනුවෙන් ඒ වෙනත් වරද සම්බන්ධයෙන් වරදකරු කිරීමේ තීන්දුවක් ආදේශ කොට, නඩු විභාගයේ දී නියම කරන ලද දණ්ඩන නියමය වෙනුවෙන් ආදේශකයන් වශයෙන්, ඒ වෙනත් වරද සඳහා නියම කිරීමට නීතිය ඉඩ සලසා ඇති හා තදබල මින් කලින් දණ්ඩන නියමයට වැඩි නොවන්නා වූ ද දණ්ඩන නියමයක් කළ හැකි ය.

(6) අභියාචක වරදකරු කරනු ලැබීමේ දී ජූරි සභාව විසින් විශේෂ තීන්දුවක් දී ඇත්තා වූ ද ඒ තීන්දුවේ ප්‍රතිඵලයක් වශයෙන් අභියාචක වරදකරු කළ අධිකරණය විසින් වැරදි නිගමනයකට බැස ඇති බව අභියාචනාධිකරණය විසින් සලකනු ලබන්නා වූ ද අවස්ථාවක, අභියාචනාධිකරණය විසින් අභියාචනයට ඉඩ දීම වෙනුවට, ඒ තීන්දුවට අනුව නීතියෙන් නියමිත යයි අභියාචනාධිකරණයට පෙනී යන නිගමනයක් වාර්තාගත කිරීමට නියම කොට, නඩු විභාගයේ දී කරන ලද දණ්ඩන නියමය වෙනුවට ආදේශකයක් වශයෙන්, නීතියෙන් ඉඩ සලසා ඇති දණ්ඩන නියමයක් කළ හැකි ය.

නඩු විභාගය ජූරි සභාවක් නැතිව පවත්වන ලද අවස්ථාවලදී එම තීන්දුවලට විරුද්ධව කරන ලද අභියාචන තීරණය කිරීම.

**335.** (1) ජූරි සභාවක් නැතිව පවත්වනු ලැබූ නඩු විභාගයක දී මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් දෙන ලද නඩු තීන්දුවකට විරුද්ධව ඉදිරිපත් කරන ලද අභියාචනයක දී මැදිහත් වීමට තරම් ප්‍රමාණවත් හේතු නොමැති බව අභියාචනාධිකරණය සලකන්නේ නම් අභියාචනාධිකරණය විසින් අභියාචනය නිෂ්ප්‍රභ කළ හැකි ය.

(2) ජූරි සභාවක් නැතිව පවත්වනු ලැබූ නඩු විභාගයක දී මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් දෙන ලද, වරදකරු කිරීමේ තීන්දුවකට විරුද්ධව වූ අභියචනයක දී, අභියාචනාධිකරණය විසින්, -

(අ) තීන්දු ප්‍රකාශය හා දණ්ඩන නියමය ප්‍රතිවර්තනය කොට චූදිතයා නිදොස් කිරීම හෝ නිදහස් කිරීම හෝ ඔහුට විරුද්ධව නැවත නඩු විභාගය කිරීමට ආඥා කිරීම හෝ කළ හැකි ය:

(ආ) දණ්ඩන නියමය එසේම තිබිය දී තීන්දු ප්‍රකාශය වෙනස් කිරීම හෝ, තීන්දු ප්‍රකාශය වෙනස් කර හෝ නොකර දණ්ඩන නියමයේ ප්‍රමාණය වැඩි හෝ අඩු කිරීම හෝ එහි ස්වභාවය වෙනස් කිරීම හෝ, චූදිත තැනැත්තා අධිචෝදනා පත්‍රය මත වරදකරු කරනු ලැබිය හැකිව තිබුණු වෙන වරදක් සම්බන්ධයෙන් වරදකරු කිරීමක් ආදේශ කොට නියම කරන ලද දණ්ඩන නියමය වෙනුවට නීතියෙන් ඉඩ සලසා ඇති දණ්ඩන නියමයක් ආදේශ කිරීම හෝ කළ හැකි ය.

දණ්ඩන නියමයට විරුද්ධව කැරෙන අභියාචන.

**336.** ජූරි සභාවක් ඉදිරියේ හෝ ජූරි සභාවක් නැතිව හෝ නඩු විභාග කිරීමෙන් පසු නියම කරන ලද දණ්ඩන නියමයකට විරුද්ධව ඉදිරිපත් කරන ලද අභියචනයක දී ඊට වඩා වෙනස් දණ්ඩන නියමයක් නියම කළ යුතුව තිබුණේ යයි අභියාචනාධිකරණය කල්පනා කරන්නේ නම්, යට කී දණ්ඩන නියමය නිෂ්ප්‍රභ කොට, ඒ වෙනුවට තීන්දු ප්‍රකාශයෙන් නීතිය අනුව ඉඩ සලසා ඇත්තා වූ ද නියම කළ යුතුව තිබුණේ යයි අභියාචනාධිකරණය කල්පනා කරන්නා වූ ද (තදබලකමින් අඩු හෝ වැඩි) වෙනත් දණ්ඩන නියමයක් නියම කළ යුතු අතර වෙනත් යම් අවස්ථාවක දී අභියාචනය නිෂ්ප්‍රභ කළ යුතු ය.

නිදොස් කිරීම්වලට විරුද්ධව යැවෙන අභියාචන

**337.** (1) නිදොස් කිරීමේ ආඥාවකට විරුද්ධව ඉදිරිපත් කරන ලද අභියාචනයක දී අභියාචනාධිකරණය විසින් ඒ ආඥාව ප්‍රතිවර්තනය කොට, චූදිතයාට විරුද්ධව නැවත නඩු විභාග කරන ලෙස විධාන කළ හැකි ය. නැතහොත් එම වරද සම්බන්ධයෙන් ම හෝ අධිචෝදනා පත්‍රය මත චූදිත තැනැත්තා වරදකරු කළ හැකිව තිබූ වෙනත් වරදක් සම්බන්ධයෙන් හෝ ඔහු වරදකරු කොට නීතිය අනුව ඔහු විෂයෙහි දණ්ඩන නියමය නියම කළ හැකි ය.

(2) වෙනත් කවර වුව ද ආඥාවකට විරුද්ධව ඉදිරිපත් කරන ලද අභියචනයක දී ඒ ආඥාව වෙනස් කිරීම හෝ ප්‍රතිවර්තනය කිරීම හෝ ඉවත් කිරීම හෝ මහාධිකරණයේ ආඥාව වෙනුවට ආදේශකයක් වශයෙන් නීතියෙන් ඉඩ ලැබෙන වෙනත් ආඥාවක් කිරීම හෝ අභියාචනාධිකරණය විසින් කළ හැකි ය.

අභියාචක වරදකරු වන නමුත් උමතු තැනැත්තකු වන විට.

**338.** අභියාචකට විරුද්ධව චෝදනා නගා ඇත්තේ යම් ක්‍රියාවක් කිරීම හෝ යම් දෙයක් නොකර හැරීම හෝ සම්බන්ධයෙන් ද ඒ ක්‍රියාවට නැතහොත් නොකර හැරීමට අභියාචක වරදකරු වන නමුත් ඒ ක්‍රියාව හෝ ඒ නොකර හැරීම හෝ කළ අවස්ථාවේ දී සිහි විකලත්වය හේතු කොට ගෙන ඒ ක්‍රියාවේ ස්වභාවය හෝ එය වැරදි බව හෝ නීතියට පටහැනි බව හෝ දැන සිටීමට ඔහුට නොහැකිව තිබුණු බව, අභියාචනයක දී, අභියාචනාධිකරණයට පෙනී ගිය හොත් නඩු විභාගයේ දී නියම කරන ලද දණ්ඩන නියමය අභියාචනාධිකරණය විසින් නිෂ්ප්‍රභ කොට, සුදුසු යයි අධිකරණය අදහස් කරන ස්ථානයක සුදුසු යයි අධිකරණය අදහස් කරන ආකාරයකට ආරක්ෂිත රැකවරණයේ අභියාචක තැබිය යුතු යයි ආඥා කළ හැකි අතර අමාත්‍යවරයාගේ නියමයන් සඳහා ඒ නඩුව ඔහු වෙත වාර්තා කළ යුතු ය. එසේ වාර්තා කළ විට, ඒ අභියාචක මේ සංග්‍රහයේ 301 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ අමාත්‍යවරයාගේ නියමයන් සඳහා තම නඩුව වාර්තා කරන ලද චූදිතයකු ලෙස, මේ සංග්‍රහයේ XXXI වන පරිච්ඡේදයේ කාර්යය සඳහා සලකනු ලැබිය යුතු ය.

වරදකරු කරනු ලැබූ විට දේපළ බැහැර කිරීම.

**339.** (1) යම් තැනැත්තකු අධිචෝදනාවක් මත වරදකරු කිරීමේ දී දේපළ බැහැර කිරීම සම්බන්ධයෙන් මේ සංග්‍රහයේ XXXVIII වන පරිච්ඡේදය යටතේ මහාධිකරණය විසින් කරන ලද යම් ආඥාවක් ක්‍රියාත්මක වීම ද වරදකරු කිරීමක දී සොර

බඩු වල අයිතිය නැවත පැවරීම සම්බන්ධයෙන්, බඩු විකිණීමේ ආඥාපනතේ 24 වෙනි වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන (දේපළෙහි අයිතිය අධිකරණයේ මතය අනුව විවාදයකට විෂය වී නොමැති අවස්ථාවක ඒ වරදකරු කිරීම කරනු ලබන්නේ යම් අධිකරණයක් ඉදිරියෙහි ද ඒ අධිකරණය අන්‍යාකාරයෙන් විධාන කරතහොත් මිස) එවැනි වරදකරු කිරීමක දී ක්‍රියාත්මක වීම ද -

(අ) කවර විටෙක වුව ද වරදකරු කිරීමේ දිනයේ සිට දවස් දහහතරක් ඉකුත් වන තෙක් ; සහ

(ආ) අභියාචනයක් ඉදිරිපත් කර ඇති කවර හෝ විටක අභියාචනය තීරණය කරන තෙක්

අත්හිටුවිය යුතු අතර, එවැනි යම් ආඥාවක් හෝ එකී විධිවිධාන හෝ ක්‍රියාත්මක වීම අභියාචනය තීරණය කරන තෙක් අත්හිටුවා ඇති අවස්ථාවල දී, ඒ වරදකරු කිරීම අභියාචනයේ දී නිෂ්ප්‍රභ කරනු ලැබුවහොත් ප්‍රශ්නයට අදාළ දේපළ සම්බන්ධයෙන් ආඥාව බලාත්මක නොවිය යුතු ය. එවැනි යම් ආඥාවක් ක්‍රියාත්මක වීම හෝ එකී විධිවිධාන ක්‍රියාත්මක වීම අත්හිටුවීම බල පවත්වන තෙක් යම් දේපළක ආරක්ෂක භාරකාරත්වය නිසැකව ම ඇති කිරීම සඳහා 453 වන වගන්තිය යටතේ සාදන ලද රීතියක් මගින් හෝ අධිකරණයේ ආඥාවක් මගින් හෝ විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

(2) වරදකරු කිරීම නිෂ්ප්‍රභ කරනු නොලැබුව ද, යම් දේපළක් බැහැර කිරීම සම්බන්ධයෙන් නඩු විභාගයක දී කරන ලද යම් ආඥාවක් අභියාචනාධිකරණය විසින් ආඥාවක් මගින් නිෂ්ප්‍රභ කිරීම හෝ වෙනස් කිරීම හෝ කළ හැකි ය. පළමු කී ආඥාව නිෂ්ප්‍රභ කරනු ලැබුවහොත් එය බලාත්මක නොවිය යුතු අතර වෙනස් කරනු ලැබුවහොත් එසේ වෙනස් කරනු ලැබූ ආකාරයට බලාත්මක විය යුතු ය.

අභියාචනය කිරීමට අවසර ඉල්ලීමක් ඉදිරිපත් කිරීම.

**340.** අභියාචනය කරනු ලබන්නේ යම් වරදකරු කිරීමකට, දණ්ඩන නියමකට හෝ ආඥාවකට විරුද්ධව ද ඒ වරදකරු කිරීම දණ්ඩන නියමය හෝ ආඥාව ප්‍රකාශයට පත් කළ දින සිට දින දහහතරක් ඇතුළත දී, අභියාචනය කිරීමට අවසර ඉල්ලීමේ ඉල්ලුම් පත්‍රයක් අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත

භාර දීමෙන් ඒ ඉල්ලීම ඉදිරිපත් කළ හැකි ය. එවිට 331 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු උපවගන්තියේ විධිවිධාන සහ ඒ වගන්තියේ (2) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ ඉල්ලීමට අදාළ විය යුතු ය.

අභියාචනය කිරීමට අවසර ඉල්ලීමක් සම්බන්ධයෙන් කටයුතු කිරීම.

**341.** අභියාචනය කිරීම සඳහා අවසර ඉල්ලීමක දී, අභියාචනාධිකරණය විසින්, -

(අ) ඒ අවසරය දිය හැකි ය; නැතහොත්

(ආ) ඉල්ලීම ප්‍රතික්ෂේප කළ හැකි ය.

අවසර දුන් විට, මහාධිකරණය විසින් නඩු වාර්තාව අභියාචනාධිකරණය වෙත යැවිය යුතු බව.

**342.** අභියාචනය කිරීම සඳහා අවසර ඉල්ලීමක් මත අභියාචනය කිරීමට අවසර දෙන ලද විට, ඒ බව අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් මහාධිකරණය වෙත දැනුම් දිය යුතු ය. එවිට 333 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ ඉල්ලීමට අදාළ විය යුතු ය.

## අභියාචන සහ අභියාචන සඳහා අවසර ඉල්ලීම් ලැයිස්තුගත කිරීම සහ විභාග කිරීම

අභියාචන සහ අභියාචන සඳහා වූ අවසර ඉල්ලීම් අංක යොදා අභියාචන ලේඛනයේ ඇතුළත් කළ යුතු බව.

**343.** (1) අභියාචනය හෝ අභියාචනය සඳහා අවසර ඉල්ලීමක් හෝ තොලැබුණු විට, අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් අවස්ථාවෝචිත පරිදි, එම අභියාචනයට හෝ අවසර ඉල්ලීමට අප්‍රමාදව අංක යොදා ඒ අංකය සහ පාර්ශ්වකරුවන්ගේ නම් අභියාචන ලේඛනයෙහි ඇතුළත් කර ඒ බවට දැන්වීමක් ඔවුන් වෙත නිකුත් කළ යුතු ය. ඉන් අනතුරුව අවස්ථාවෝචිත පරිදි ඒ අභියාචනය හෝ අවසර ඉල්ලීම හෝ විභාගය සඳහා ඉදිරිපත් කරනු ලබන, විභාග කිරීමට ඇති අභියාචන පිළිබඳ උචිත ලේඛනයෙහි ඇතුළත් කළ යුතු ය.

(2) විභාග කිරීමට ඇති අභියාචන පිළිබඳ ලේඛනයෙහි ඇති අභියාචන සහ අවසර ඉල්ලීම් ඇතුළත් ලැයිස්තුවක් අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ පිටත ප්‍රදර්ශනය කර තැබිය යුතු ය.

අභියාචන සහ අවසර ඉල්ලීම විභාග කිරීම සඳහා ලැයිස්තුගත කළ යුතු බව

**344.** විභාග කිරීමට ඇති අභියාචනය පිළිබඳව උචිත ලේඛනයෙහි ඇතුළත් කර ඇති අභියාචනයක් හෝ අභියාචනය සඳහා අවසර ඉල්ලීමක්, අදාළ පාර්ශ්වකරුවන්ට වැඩිදුර දැනුම් දීමක් නොමැතිව, ලේඛනයෙහි දැක්වෙන අනුපිළිවෙල අනුව විභාග කිරීම සඳහා ගනු ලැබිය යුතු ය.

අභියාචනය සඳහා වූ අවසර ඉල්ලීමකට ඉඩ දුන් විට ඒ ඉල්ලීම අභියාචනයක් ලෙස සැලකිය යුතු බව.

**345.** අභියාචනය සඳහා අවසර ඉල්ලීමක් විභාග කොට එසේ අභියාචනය කිරීමට අවසර දුන් විට, එම ඉල්ලීම, ඉන් අනතුරුව, අභියාචනාධිකරණය විසින් විධාන කරන ලද පරිදි විභාග කිරීමට ඇති අභියාචනයක් ලෙස සැලකිය යුතු ය.

අභියාචනයක් හෝ අභියාචනය සඳහා අවසර ඉල්ලීමක් හෝ යටත් පිරිසෙයින් දින හතක් ප්‍රදර්ශනය කර තැබිය යුතු බව.

**346.** අභියාචනයක් හෝ අභියාචනය සඳහා අවසර ඉල්ලීමක් හෝ 343 වන වගන්තියෙන් නියමිත ආකාරයට ලේඛනයෙහි ඇතුළත් කොට ප්‍රදර්ශනය කරනු ලැබීමෙන් පසු යටත් පිරිසෙයින් දින හතක් ගත වන තෙක්, අවස්ථාවෝචිත පරිදි, අභියාචනය හෝ අවසර ඉල්ලීම හෝ විභාග කිරීම සඳහා ලැයිස්තුගත නොකළ යුතු ය.

අභියාචන සහ අභියාචනය සඳහා අවසර ඉල්ලීම් ඉක්මන් කිරීම හෝ කල් තැබීම.

**347.** අභියාචනාධිකරණය විසින්, ඒ අධිකරණයේ වුවමනාව පරිදි හෝ පාර්ශ්වකරුවකුගේ ඉල්ලීම පිට හෝ, අභියාචනයක් නැතහොත් අභියාචනය සඳහා අවසර ඉල්ලීමක් විභාග කිරීම සුදුසු යයි ඒ අධිකරණය අදහස් කරන කොන්දේසි මත, ඉක්මන් කළ හැකි ය; නැතහොත් කල් තැබිය හැකි ය.

අභියාචන සහ අභියාචනා සඳහා අවසර ඉල්ලීම් ඒකාබද්ධ කිරීම.

**348.** එකම කාරණයකින් මතු වන අභියාචන හෝ අභියාචනය සඳහා අවසර ඉල්ලීම් හෝ දෙකක් නැතහොත් වැඩි ගණනක් ඇත්තා වූ ද ඒවා ඒකාබද්ධ කළ හොත් අධිකරණයට සහ අභියාචනයට සම්බන්ධ සියලු පාර්ශ්වකරුවන්ට පහසු විය හැකි බව අභියාචනාධිකරණයේ මතය වන්නා වූ ද අවස්ථාවක, ඒවා ඒකාබද්ධ කරන ලෙස අධිකරණය විසින් විධාන කළ හැකි අතර එසේ ඒකාබද්ධ කරන ලද අභියාචන සහ අවසර ඉල්ලීම් එතැන් පටන් සියලු කාර්ය සඳහා අවස්ථාවෝචිත පරිදි තනි අභියාචනයක් හෝ තනි අවසර ඉල්ලීමක් හෝ ලෙස සලකනු ලැබිය යුතු ය.

විභාග කිරීමේ කාර්ය පටිපාටිය.

**349** (1) අභියාචන විභාගයේ දී හෝ අවසර ඉල්ලීම විභාග කිරීමේ දී තම තමන්ට ඉදිරිපත් කිරීමට ඇති කරුණු ඉදිරිපත් කරන ලෙස අවස්ථාවෝචිත පරිදි අභියාචකට නැතහොත්

ඉල්ලුම්කරුට සහ වගඋත්තරකරුට හෝ ඔවුන්ගේ නීතිඥවරයන්ට හෝ අධිකරණය විසින් නියම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, පළමුවෙන් අභියාචනය හෝ අවසර ඉල්ලීම හෝ තහවුරු කිරීම සඳහා කරුණු ඉදිරිපත් කිරීමට අභියාචකට හෝ ඉල්ලුම්කරුට හෝ ඉඩ දිය යුතු ය. එවිට, අධිකරණය විසින් අභියාචනය නැතහොත් අවසර ඉල්ලීම වහාම නිෂ්ප්‍රභ කරනු නොලබන්නේ නම් හෝ අභියාචනයට පාත්‍රව ඇති නඩු තීන්දුව හෝ ආඥාව ස්ථිර නොකරන්නේ නම්, කරුණු ඉදිරිපත් කිරීමට වග උත්තරකරුට ඉඩ දිය යුතු ය. එවැනි අවස්ථාවක දී පිළිතුරු දීමට අභියාචකට හෝ ඉල්ලුම්කරුට හිමිකම ඇත්තේ ය.

(3) තම අභියාචනය හෝ අවසර ඉල්ලීම හෝ තහවුරු කිරීම සඳහා අභියාචක හෝ ඉල්ලුම්කරු පෙනී නොසිටිය හොත් අධිකරණය විසින් අභියාචනය හෝ අවසර ඉල්ලීම හෝ සලකා බලා සුදුසු යයි අධිකරණය සලකන ආඥාවක් ඒ සම්බන්ධයෙන් කළ හැකි ය.

අත් අඩංගුවේ පසුවන අභියාචකට හෝ ඉල්ලුම්කරුට විභාගයට පැමිණීමට හිමිකම ඇති බව.

**350.** අත්අඩංගුවේ පසු වන අභියාචකයකු හෝ ඉල්ලුම්කරුවකු තම අභියාචනය හෝ අවසර ඉල්ලීම හෝ විභාග කරන අවස්ථාවේ දී පැමිණ සිටීමට අපේක්ෂා කරන්නේ නම්, එසේ පැමිණ සිටීමට ඔහුට හිමිකම ඇත්තේ ය.

අධිකරණයේ අතිරේක බලතල

**351.** අභියාචනයක් පිළිබඳව කටයුතු කිරීමේ දී පහත සඳහන් පරිදි ක්‍රියා කිරීම යුක්ති ධර්මය අනුව අවශ්‍ය යයි හෝ අවස්ථාවෝචිත යයි අභියාචනාධිකරණය සලකන්නේ නම්,-

(අ) නඩුව තීන්දු කිරීම සඳහා ඉදිරිපත් කිරීම අවශ්‍ය යයි අභියාචනාධිකරණයට පෙනී යන්නා වූ ද නඩු කටයුත්තට සම්බන්ධ වූ ද යම් ලියවිල්ලක්, ඉදිරිපත් කළ ද්‍රව්‍යයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කරන ලෙස ආඥා කළ හැකි ය;

(ආ) වැඩිදුර සාක්ෂි අභියාචනාධිකරණය විසින් ම සටහන් කළ හැකි ය. නැතහොත් එවැනි සාක්ෂි මුල් අධිකරණයක යම් විනිශ්චයකාරවරයකු විසින් හෝ තත් කාර්යය සඳහා අභියාචනාධිකරණය විසින් පත් කරනු ලබන වෙනත් තැනැත්තකු විසින් හෝ සටහන් කරනු ලැබිය යුතු යයි විධාන කළ හැකි ය:

එසේ වුව ද වැඩිදුර සාක්ෂි අභියාචනාධිකරණය ඉදිරියෙහි හැර වෙනත් ස්ථානයක දී සටහන් කරනු ලැබූ විට ඒ සාක්ෂි සටහන් කළ නිලධරයා විසින් එසේ සටහන් කරන ලද සාක්ෂි යථා පරිදි සහතික කොට ඒ සාක්ෂි පිළිබඳව තම මතය ද දක්වා ඒ සාක්ෂි අභියාචනාධිකරණය වෙත යැවිය යුතු ය.

නඩු තීන්දුව ප්‍රකාශ කිරීම.

**352.** (1) අභියාචන විභාගය හෝ අවසර ඉල්ලීම පිළිබඳ විභාගය අවසන් වූ විට අභියාචනාධිකරණය විසින් ඒ අවස්ථාවේ දී ම හෝ, තත් කාර්යය සඳහා ඒ අවස්ථාවේ දී නියම කළ යුතු යම් පසු දිනයක හෝ, විවෘත අධිකරණයෙහි දී නඩු තීන්දුව ප්‍රකාශ කළ යුතු ය.

(2) එසේ නියම කරනු ලැබූ දිනයේ දී නඩු තීන්දුව දීමට අධිකරණය සූදානම් නැත්නම් තත් කාර්යය සඳහා තවත් මතු දිනයක් නියම කොට ප්‍රකාශයට පත් කළ හැකි ය.

(3) අභියාචනාධිකරණයේ නඩු තීන්දුව ලියා තැබිය යුතු අතර විනිශ්චයකාරවරයන් විසින් එය අත්සන් කොට දාතම යෙදිය යුතු ය. තව ද නඩු තීන්දුවෙහි මෙහි පහත දැක්වෙන කරුණු ඇතුළත් විය යුතු යː-

(අ) තීරණය කළ යුතුව තුබූ කරුණු.

(ආ) ඒ පිළිබඳව විනිශ්චයකාරවරයන්ගේ තීරණය.

(ඇ) තීරණයට තුඩු දුන් හේතු; සහ

(ඈ) ප්‍රදානය කරන ලද සහන.

## පොදු විධිවිධාන

**353.** යුක්ති ධර්මය අනුව අභියාචකට නීති ආධාර සැපයීම යෝග්‍ය බව ද නීති ආධාර ලබා ගැනීමට හැකි වන තරම් ප්‍රමාණවත් මිල මුදල් අභියාචකට නොමැති බව ද අධිකරණයේ මතය වේ නම්, කවර හෝ අපරාධ නඩුවක දී හෝ නඩු කටයුත්තක දී, අභියාචකගේ ඉල්ලීම පිට, අභියාචක වෙනුවෙන් පෙනී සිටීමට නීතිඥවරයකු අභියාචනාධිකරණය විසින් කවර හෝ අවස්ථාවක දී පත් කළ හැකි ය. අභියාචකට නීති ආධාර.

**354.** අභියාචකයකු වෙනුවෙන් පෙනී සිටීමට මේ පරිච්ඡේදය යටතේ පත් කරනු ලැබූ යම් නීතිඥවරයකුගේ වියදම් ද, අධිකරණයේ ආඥාව අනුව අධිකරණයට පැමිණෙන හෝ අභියාචනයට ආනුෂංගික යම් නඩු කටයුතුවල දී සාක්ෂි විභාග කරනු ලැබූ හෝ යම් සාක්ෂිකරුවන්ගේ වියදම් ද, අධිකරණය විසින් සාක්ෂි විභාග කිරීමේ කාර්යය සඳහා පත් කරනු ලැබූ යම් තැනැත්තකු විසින් සාක්ෂිකරුවන්ගෙන් සාක්ෂි විභාග කිරීමේ හෝ ඊට ආනුෂංගික හෝ සියලු වියදම් ද අධිකරණය විසින් අවසර දෙනු ලබන මුදලක් දක්වා, එහෙත් 453 වන වගන්තිය යටතේ සාදන ලද රීති මගින් නියමිත ගෙවීම් අනුපාතිකවලට සහ පරිමාණවලට යටත්ව, ගෙවනු ලැබිය යුතු ය. එවැනි රීති සාදනු ලබන තෙක්, නියමිත දිනයට ඉහතින් වූ දිනයේ දී ගෙවීම් අනුපාතික හා පරිමාණවලට අදාළව බලපැවැත් වූ රීති දිගට ම බලපැවැත්විය යුතු ය. වියදම්.

**355.** (1) අභියාචනයක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මේ සංග්‍රහයේ විධිවිධාන පිළිපැදීමෙහි ලා යම් දෝෂයක්, අත් හැරීමක් හෝ පැහැර හැරීමක් සිදු වී ඇති අවස්ථාවක, මහාධිකරණය විසින් ඒ දෝෂය, අත් හැරීම හෝ පැහැර හැරීම නොතකා, අභියාචන පෙත්සම, නඩුවට අදාළ සියලු ම ලියකියවිලි හා නඩු වාර්තාව සමග, අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය. මේ සංග්‍රහයේ විධිවිධාන පිළිපැදීමෙහිලා සිදු වූ දෝෂයක, නොකර හැරීමක හෝ පැහැර හැරීමක ප්‍රතිඵලය.

(2) මේ සංග්‍රහයෙහි විධිවිධාන අනුව ක්‍රියාකිරීමෙහි ලා අභියාචක අතින් සිදු වූ යම් දෝෂයක, අත් හැරීමක හෝ පැහැර හැරීමක හේතුවෙන් පමණක් අභියාචනයක් ප්‍රතික්ෂේප කිරීමට හෝ නිෂ්ප්‍රභ කිරීමට හෝ මේ සංග්‍රයෙන් අභියාචනාධිකරණය වෙත පැවරී ඇති බලතල, ඒ දෝෂය, අත්හැරීම හෝ පැහැර හැරීම හේතුකොට ගෙන එම අභියාචනයේ වගඋත්තරකරුට සැලකිය යුතු හානියක් සිදු වී ඇත්නම් මිස, අභියාචනාධිකරණය විසින් ක්‍රියාත්මක නොකළ යුතු ය.

(3) (2) වන උපවගන්තියෙහි සඳහන් වූ ද අභියාචනාධිකරණය විසින් ප්‍රතික්ෂේප හෝ නිෂ්ප්‍රභ හෝ නොකරන ලද්දා වූ ද යම් අභියාචනයක දී, එවැනි යම් දෝෂයක් නිවැරදි කිරීමේ, අත් හැරීමක් ඇතුළු කිරීමේ හෝ නොකර තිබීමක් යථාවත් කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි අධිකරණය සලකන විධාන කිසිවක්, ඒ විධානවල නිශ්චිතව සඳහන් යම් කාලයක් ඇතුළත හා ඒ විධානවල සඳහන් කොන්දේසිවලට අනුකූලව පිළිපදින ලෙස අභියාචකට අභියාචනාධිකරණය විසින් නියම කළ යුතු අතර, ඒ විධාන අනුව ක්‍රියා කිරීම අභියාචක විසින් පැහැර හරිනු ලැබුවහොත් අභියාචනාධිකරණය විසින් ඒ අභියාචනය ප්‍රතික්ෂේප හෝ නිෂ්ප්‍රභ හෝ කළ යුතු ය.

අභියාචනාධිකරණයේ ආඥාව සහතික කොට මහාධිකරණය වෙත යැවිය යුතු බව.

**356** (1) යම් නඩුවක් අභියාචනාධිකරණය විසින් මේ පරිච්ඡේදය යටතේ අභියාචනයක දී තීරණය කරනු ලැබූ කවර හෝ අවස්ථාවක, ඒ අධිකරණය විසින් ස්වකීය ආඥාව ස්වකීය මුද්‍රාව යටතේ මහාධිකරණය වෙත සහතික කොට අභියාචනාධිකරණය විසින් කරන ලද ආඥාව සඳහා දක්වන ලද හේතුවල පිටපතක් සමග නඩු වාර්තාව සහ අභියාචන පෙත්සම මහාධිකරණයට ආපසු යැවිය යුතු ය.

(2) අභියාචනාධිකරණයේ ආඥාව සහතික කොට යවනු ලබන්නේ යම් මහාධිකරණයට ද ඒ මහාධිකරණය විසින්, එවිට, එසේ සහතික කොට එවන ලද ආඥාවට අනුකූල වන්නා වූ ආඥා කළ යුතු ය. තව ද අවශ්‍ය නම් නඩු වාර්තාව ඒ ආඥාවලට අනුකූලව සංශෝධනය කළ යුතු ය.

(3) ඉක්බිතිව මහාධිකරණය විසින් අභියාචනාධිකරණයේ ආඥාවට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

ගාස්තු.

**357.** මේ පරිච්ඡේදය යටතේ වූ සියලු නඩු කටයුතුවල දී, පාර්ශ්වකරුවන් විසින් ගෙවිය යුතු හෝ පාර්ශ්වකරුවන්ට ගෙවිය යුතු හෝ ගාස්තු, සුදුසු යයි අභියාචනාධිකරණය අදහස් කරන පරිදි නියම කිරීමේ බලය අභියාචනාධිකරණයට තිබිය යුතු යː

එසේ වුව ද කිසිදු අවස්ථාවක දී නීතිපතිවරයාට විරුද්ධව එවැනි ආඥාවක් නොකළ යුතු ය.

## ඈ - අභියාචන සහ අභියාචන සඳහා අවසර ඉල්ලීම් නතර වීම සහ ඉල්ලා අස්කර ගැනීම

**358.** (1) මේ සංග්‍රහය යටතේ අභියාචනාධිකරණය වෙත කරන සෑම අභියාචනයක් ම සහ අභියාචනය සඳහා වූ සෑම අවසර ඉල්ලීමක් ම චූදිතයාගේ මරණය සිදු වූ විට නතර විය යුතු ය: නතර වීම.

එසේ වුව ද, අභියාචනය හෝ අවසර ඉල්ලීම වරදකරු කිරීමකට විරුද්ධව වන අවස්ථාවක, අනෟප්තියට පත් තැනැත්තකු විසින්, අභියාචනය විභාග කරන අධිකරණයේ අවසරය ඇතිව, වරදකරු කිරීමේ තීරණයට අදාළ වනතාක් දුරට පමණ, මැදිහත් වී අභියාචනය හෝ අවසර ඉල්ලීම හෝ පිළිබඳ නඩු කටයුතු පවත්වා ගෙන යා හැකි ය.

(2) "අනෟප්තියට පත් තැනැත්තා" යන්නට, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 16 වන වගන්තියෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

**359.** මේ සංග්‍රහය යටතේ අභියාචනාධිකරණය වෙත අභියාචනයක් හෝ අභියාචනය සඳහා අවසර ඉල්ලීමක් හෝ ඉදිරිපත් කළ අභියාචකයකු හෝ ඉල්ලුම්කරුවකු හෝ විසින්, කවර අවස්ථාවක වුව ද, අවස්ථාවෝචිත පරිදි, තම අභියාචනය හෝ අවසර ඉල්ලීම හෝ ඉල්ලා අස්කර ගැනීම සඳහා අභියාචනාධිකරණය වෙත ඉල්ලීමක් කළ හැකි අතර, අවශ්‍ය යයි ඒ අධිකරණය සලකන පරීක්ෂණයකින් පසු, නියම කිරීම සුදුසු යයි ඒ අධිකරණය කල්පනා කරන නියම මත ඒ අභියාචනය ඉල්ලා අස්කර ගැනීමට අවසර දිය හැකි ය. එවිට ඒ අභියාචනය හෝ අභියාචනය සඳහා අවසර ඉල්ලීම හෝ නිෂ්ප්‍රභ විය යුතු ය. අභියාචන හෝ අභියාචනය සඳහා අවසර ඉල්ලීම හෝ ඉල්ලා අස්කර ගැනීම.

## ඈ - අභියාචනවල දී රජය නියෝජනය කිරීම

**360.** (1) මේ සංග්‍රහය යටතේ අභියාචනාධිකරණය වෙත ඉදිරි පත් කරනු ලැබූ යම් අභියාචනයකට රජය හෝ රජයේ නිලධරයකු හෝ පාර්ශ්වකරුවකු වේ නම් ඒ සෑම අභියාචනයක දී ම රජය වෙනුවෙන් නීතිපතිවරයා පෙනී සිටිය යුතු ය. තව ද මේ වගන්තිය යටතේ නීතිපතිවරයාගේ කාර්ය ඉටු කිරීම සඳහා ඔහුට අවශ්‍ය වන්නා වූ ද ඒ නඩු කටයුතු හා සම්බන්ධ වූ ද රජය නියෝජනය කිරීම.

සියලු ලිපි ලේඛන, ඉදිරිපත් කළ ද්‍රව්‍යවල සහ වෙනත් දේවල්වල භාරය දරන අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් නීතිපතිවරයා වෙත යැවිය යුතු ය.

(2) එවැනි යම් අභියාචනයක දී නීතිපතිවරයා වෙනුවට රජය වෙනුවෙන් පෙනී සිටීමේ හිමිකම නියෝජ්‍ය නීතිපතිවරයාට, රජයේ නීතිඥවරයකුට හෝ නීතිපතිවරයා විසින් එසේ පෙනී සිටීම සඳහා විශේෂයෙන් හෝ සාමාන්‍යයෙන් බලය දෙන ලද නීතිඥවරයකුට තිබිය යුතු ය.

## XXIX වන පරිච්ඡේදය

## යොමු කිරීම හා ප්‍රතිශෝධනය

නීතිය පිළිබඳ ප්‍රශ්න වෙන් කර තැබීම.

**361.** (1) යම් තැනැත්තකු වරදකරු කොට ඔහුට යම් දණ්ඩනයක් හෝ දඩුවමක් නියම කර ඇති කවර හෝ අවස්ථාවක ඒ නඩු කටයුතුවලින් පැන නැගෙන නීතිය පිළිබඳ යම් ප්‍රශ්නයක් අභියාචනාධිකරණය විසින් සලකා බැලීම සඳහා වෙන්කර තැබීම සුදුසු යයි ලඝු අධිකරණ බලය ප්‍රකාර ක්‍රියා කරන යම් මහෙස්ත්‍රාත් අධිකරණයක් කල්පනා කරන්නේ නම් ඒ මහෙස්ත්‍රාත් අධිකරණය විසින් එසේ කළ හැකි ය.

(2) එසේ වෙන් කර තබනු ලැබූ නීතිය පිළිබඳ සෑම ප්‍රශ්නයක් ම ඉහත කී අධිකරණයට විශේෂ කාරණයක ස්වරූපයෙන් ඉදිරිපත් කළ යුතු ය.

(3) එවැනි සෑම විශේෂ කාරණයක් ම එම නඩු කටයුතු පැවැත් වූ අධිකරණයේ මහෙස්ත්‍රාත්වරයා විසින් පිළියෙළ කළ යුතු ය. ඔප්පු කර ඇතැයි මහෙස්ත්‍රාත්වරයා සලකන සිද්ධි එහි සංක්ෂේපයෙන් දැක්විය යුතු අතර අභියාචනාධිකරණයේ මතය සඳහා වෙන් කර තබා ඇති නීතිය පිළිබඳ ප්‍රශ්නය මහෙස්ත්‍රාත්වරයා විසින් එහි සඳහන් කළ යුතු ය.

(4) එවැනි සෑම විශේෂ කාරණයක් ම මහෙස්ත්‍රාත්වරයා විසින් අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු ය. එය අභියාචනාධිකරණය විධාන කරන ආකාරයට විවාදය සඳහා තබනු ලැබිය යුතු ය.

(5) වරදකරු කරනු ලැබූ තැනැත්තා, විශේෂ කාරණයේ තීරණය ලැබෙන තෙක් බන්ධනාගාරයෙහි රිමාන්ඩ් භාරයේ තැබිය යුතු ය. නැතහොත් සුදුසු යයි අධිකරණය කල්පනා කරන්නේ නම් ඇප පිට නිදහස් කළ යුතු ය.

**362.** එවැනි විශේෂ කාරණයක දී පැන නැගෙන නීතිය පිළිබඳ ප්‍රශ්නය අභියාචනාධිකරණය විසින් විභාග කොට තීරණය කර ඉක්බිතිව ඒ විශේෂ කාරණය ප්‍රකාශ කර ඇත්තේ යම් තීරණයක් සම්බන්ධයෙන් ද ඒ තීරණය ස්ථිර කිරීම, සංශෝධනය කිරීම හෝ ප්‍රතිවර්තනය කිරීම කළ යුතු ය. නැතහොත් ඒ කාරණය සම්බන්ධයෙන් සුදුසු යයි අභියාචනාධිකරණයට පෙනී යන යම් ආඥාවක් ඒ අධිකරණය විසින් කළ හැකි ය:

තීරණය සහ ඒ මත කරනු ලබන ආඥා.

එසේ වුව ද මේ සංග්‍රහය ප්‍රකාර යම් විශේෂ කාරණයක් සඳහන් කොට ඉදිරිපත් කරන කිසිම මහෙස්ත්‍රාත්වරයකු, ඒ සම්බන්ධයෙන් කිසිම නඩු ගාස්තුවකට කිසිම අවස්ථාවක දී යටත් නොවිය යුතු ය.

**363.** (1) මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු ඉදිරියෙහි පැවැත්වුණු නඩු විභාගයක දී යම් තැනැත්තකු යම් වරදකට වරදකරු කරනු ලැබ දණ්ඩන නියමයකට යටත් කරනු ලැබූ විට, සුදුසු යයි විනිශ්චයකාරවරයා කල්පනා කරන්නේ නම්, ඒ නඩු විභාගයේ දී පැන නැගී ඇති නීතිය පිළිබඳ යම් ප්‍රශ්නයක් වෙන් කර තබා, නීතිය පිළිබඳ ප්‍රශ්නය පැන නැගීමට හේතු වූ විශේෂ අවස්ථානුගත කරුණු ද සමග ඒ ප්‍රශ්නය කාරණයක් වශයෙන් ප්‍රකාශ කොට ඊට ඔහු විසින් අත්සන් තබා අභියාචනාධිකරණයේ තීරණය සඳහා එය යොමු කළ හැකි ය.

මහාධිකරණයේ දී පැන නැගෙන ප්‍රශ්න වෙන් කර තැබීමට ඇති බලය.

(2) විනිශ්චයකාරවරයා එවැනි යම් ප්‍රශ්නයක් වෙන් කර තැබුවහොත්, ඒ ප්‍රශ්නය පිළිබඳව තීරණය ලැබෙන තෙක් වරදකරු කරනු ලැබූ තැනැත්තා බන්ධනාගාරයෙහි රිමාන්ඩ් භාරයේ තැබිය යුතු ය. නැතහොත් සුදුසු යයි විනිශ්චයකාරවරයා කල්පනා කරන්නේ නම් ඇප පිට නිදහස් කළ යුතු ය. තව ද ඒ ප්‍රශ්නය විභාග කොට අවසාන වශයෙන් තීරණය කිරීමට සහ ඉන් ඉක්බිතිව නඩු තීන්දුව ප්‍රතිවර්තනය කිරීමට, ස්ථිර කිරීමට හෝ සංශෝධනය කිරීමට නැතහොත් යුක්තිය ඉෂ්ට කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් ආඥාවක් කිරීමට අභියාචනාධිකරණයට බලය තිබිය යුතු ය.

(3) මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු ඉදිරියෙහි වූ නඩු විභාගයක දී, යම් තැනැත්තකු වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට, ඒ නඩු විභාගයේ දී පැන නැගුනා වූ ද මේ

වගන්තිය යටතේ වෙන් කර තබා නොමැති වූ ද යම් නීතිය පිළිබඳ ප්‍රශ්නයක් වැඩිදුරටත් සලකා බැලිය යුතු බව නීතිපතිවරයාගේ මතය වන්නේ නම් ඔහු විසින් ඒ බව ස්වකීය අත්සනින් සහතික කළ හැකි අතර ඉන් ඉක්බිතිව ඒ නඩුව හෝ ඉන් අවශ්‍ය විය හැකි යම් කොටසක් හෝ සමාලෝචනය කර ඒ ප්‍රශ්නය පිළිබඳව අවසාන වශයෙන් තීරණය කිරීමට ද, ඉන් ඉක්බිතිව, (1) වන උපවගන්තිය යටතේ වෙන් කර තබන ලද ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරයට නඩු තීන්දුව ප්‍රතිවර්තනය කිරීමට, ස්ථිර කිරීමට හෝ සංශෝධනය කිරීමට නැතහොත් යුක්තිය ඉෂ්ට කිරීම පිණිස අවශ්‍ය විය හැකි වෙනත් ආඥාවක් කිරීමට ද අභියාචනාධිකරණයට සම්පූර්ණ බලය හා අධිකාරය තිබිය යුතු ය.

මහාධිකරණයේ හෝ මහෙස්ත්‍රාත් අධිකරණයක හෝ නඩු වාර්තා අභියාචනාධිකරණය විසින් ගෙන්වා ගනු ලැබිය හැකි බව.

**364.** මහාධිකරණයක හෝ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක හෝ විභාග කොට නිමව ඇති නැතහොත් විභාග කිරීමට ඇති යම් නඩුවක දී කරන ලද යම් දණ්ඩන නියමයක නැතහොත් ආඥාවක නීත්‍යනුකූල භාවය හෝ යෝග්‍යතාව හෝ පිළිබඳව නැතහොත් ඒ අධිකරණයේ නඩු කටයුතුවල විධිමත් භාවය පිළිබඳව සෑහීමට පත්වනු පිණිස අභියාචනාධිකරණය විසින් ඒ නඩුවේ වාර්තාව ගෙන්වා ගෙන පරීක්ෂා කළ හැකි ය.

ප්‍රතිශෝධනයේ දී අධිකරණයට ඇති බලය.

**365.** (1) අභියාචනාධිකරණය වෙත XXVIII වන පරිච්ඡේදයෙන් පවරා ඇති බලතල අතුරින් කවරක් වුව ද අභියාචනාධිකරණය විසින් නඩු වාර්තාව ගෙන්වා ගන්නා ලද යම් නඩුවක් සම්බන්ධයෙන් හෝ අන්‍යාකාරයකින් ඒ අධිකරණයට දැනගන්නට ලැබෙන නඩුවක් සම්බන්ධයෙන් හෝ ස්වකීය අභිමතය පරිදි ඒ අධිකරණය විසින් ක්‍රියාත්මක කළ හැකි ය.

(2) චූදිතයාට තමා විසින් ම හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ තමාගේ නිදහසට කරුණු කියා සිටීමට අවස්ථාවක් ලබා දී ඇත්නම් මිස, චූදිතයාට හානිකර කිසිම ආඥාවක් මේ වගන්තිය යටතේ කරනු නොලැබිය යුතු ය.

(3) නිදොස් කිරීමේ තීරණයක් වරදකරු කිරීමේ තීරණයක් බවට පත් කිරීමට, මේ වගන්තියේ ඇතුළත් කිසිවකින් අභියාචනාධිකරණයට බලය ලැබෙතැයි නොසැලකිය යුතු ය.

**366.** අභියාචනාධිකරණය විසින් ස්වකීය ප්‍රතිශෝධන බලතල ක්‍රියාත්මක කිරීමේ දී කිසිම පාර්ශ්වකරුවකුට අභියාචනාධිකරණය ඉදිරියෙහි තමා විසින් ම හෝ නීතිඥවරයකු මගින් හෝ කරුණු ඉදිරිපත් කිරීමට අයිතිවාසිකමක් නොතිබිය යුතු ය: සමාලෝචනයේ දී පාර්ශ්වකරුවන්ට සවන් දීම අධිකරණයේ මනාපය පරිදි බව.

එසේ වුව ද, එම බලතල ක්‍රියාත්මක කිරීමේ දී සුදුසු යයි අධිකරණය සලකන්නේ නම් යම් පාර්ශ්වකරුවකුට පෞද්ගලිකව හෝ ඔහුගේ නීතිඥවරයා මගින් හෝ කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් දිය හැකි ය.

**367.** අභියාචනාධිකරණය විසින් 364 වන වගන්තිය යටතේ යම් නඩුවක වාර්තාව ඉල්ලා යැවූ විට මහාධිකරණ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ නඩු වාර්තාව සමඟ ස්වකීය තීරණයට හෝ ආඥාවට හෝ පදනම් වූ හේතු ද වැදගත් යයි ඔහු කල්පනා කරන සිද්ධි ද ඇතුළත් ප්‍රකාශයක් ඉදිරිපත් කළ හැකි අතර, එකී තීරණය හෝ ආඥාව හෝ උත්සාරණය කිරීමට හෝ ඉවතලීමට පෙර, එම ප්‍රකාශය අධිකරණය විසින් සලකා බැලිය යුතු ය. අභියාචනාධිකරණය විසින් නඩු වාර්තාව ඉල්ලා යැවූ විට මහාධිකරණ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් ස්වකීය තීරණයට පදනම් වූ හේතු පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කළ හැකි බව.

**368.** (1) අභියාචනාධිකරණය විසින් මේ පරිච්ඡේදය යටතේ යම් නඩුවක් ප්‍රතිශෝධනය කරනු ලැබූ විට, ඒ අධිකරණය විසින් ස්වකීය ආඥාව ස්වකීය මුද්‍රාව යටතේ සහතික කොට, පරිශෝධිත තීන්දු ප්‍රකාශය, නඩු තීන්දුව හෝ ආඥාව වාර්තාගත කළ හෝ නියම කළ අධිකරණය වෙත යැවිය යුතු අතර, අභියාචනාධිකරණය විසින් ස්වකීය ආඥාවට දෙනු ලබන හේතුවල පිටපතක් ද සමඟ නඩු වාර්තාව ඒ අධිකරණය වෙත ආපසු යැවිය යුතු ය. අභියාචනාධිකරණයේ ආඥා මහාධිකරණ විනිශ්චයකාරවරයා විසින් හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් හෝ ක්‍රියාත්මක කළ යුතු බව.

(2) ආඥාව එසේ සහතික කොට යවනු ලබන්නේ යම් අධිකරණයකට ද ඒ අධිකරණය විසින්, එවිට, එසේ සහතික කොට එවන ලද ආඥාවට අනුකූල වන ආඥා කළ යුතු ය. තව ද අවශ්‍ය නම් නඩු වාර්තාව ඒ ආඥාවලට අනුකූලව සංශෝධනය කළ යුතු ය.

## VIII වන කොටස

## විශේෂ පරීක්ෂණ කටයුතු

## XXX වන පරිච්ඡේදය

## මරණ පරීක්ෂණය

මරණ පරීක්ෂණ

**369.** මරණ පරීක්ෂණයක් මේ සංග්‍රහයේ විධිවිධාන යටතේ හැර පවත්වනු නොලැබිය යුතු ය.

මරණ පරීක්ෂකවරයාගේ කාර්යය.

**370.** (1) යම් තැනැත්තකු -

(අ) සියදිවි නසා ගෙන ඇති බවට, හෝ

(ආ) යම් සතකු විසින් මරණයට පත් කරනු ලැබ ඇති බවට හෝ යම් යන්ත්‍රෝපකරණයක් නිසා නැතහොත් යම් අනතුරක් නිසා මරණයට පත් වී ඇති බවට , හෝ

(ඇ) හදිසියේ හෝ නොදන්නා හේතුවකින් හෝ මිය ගොස් ඇති බවට

තොරතුරක් ලැබුණු විට, සෑම මරණ පරීක්ෂකවරයකු ම, එසේ මිය ගිය තැනැත්තාගේ සිරුර තිබෙන ස්ථානයට වහාම ගොස්, එහි දී පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර සිරුරේ දක්නට ඇති තුවාල, කැඩුම් බිඳුම්, සීරීම් සහ වෙනත් තුවාල ලකුණු ද තමාගේ මතය අනුව, මරණයට හේතුව හා සම්බන්ධ විය හැකි ලකුණු, ද්‍රව්‍ය සහ පරිවේෂණ ද විස්තර කරමින් සහ පෙනී යන අන්දමට ඒ ලකුණු ඇති වී තිබෙන්නේ කවර ආකාරයකින් ද යන වග සඳහන් කරමින්, මරණය පිළිබඳ දෘෂ්‍යමාන හේතුව දැක්වෙන වාර්තාවක් සකස් කළ යුතු ය.

(2) ඒ වාර්තාව ඒ මරණ පරීක්ෂකවරයා විසින් අත්සන් කර, ආසන්නතම මහෙස්ත්‍රාත්වරයා වෙත නොපමාව ම ඉදිරිපත් කළ යුතු ය.

(3) අපරාධයක් සිදු කර ඇති බවට සාධාරණ සැකයක් ඒ වාර්තාවෙන් හෝ තමා ඉදිරියේ ඇති වෙනත් කරුණුවලින් හෝ මහෙස්ත්‍රාත්වරයා තුළ ඇති වුවහොත් මහෙස්ත්‍රාත්වරයා විසින් XIV වන සහ XV වන පරිච්ඡේද යටතේ පරීක්ෂණ කටයුතු කළ යුතු අතර, එවැනි අවස්ථාවක දී, පරීක්ෂණ වාර්තා සටහන සහ මරණ පරීක්ෂකවරයාගේ වාර්තාව මහෙස්ත්‍රාත්වරයා ඉදිරියේ පැවැත් වූ පරීක්ෂණ කටයුතු පිළිබඳ වාර්තාවට අමුණානු ලැබිය හැකි ය.

(4) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් සිද්ධි අතුරින් යම් සිද්ධියක් මහෙස්ත්‍රාත්වරයාට දැනුම් දෙනු ලැබූ කවර විටක වුව ද, මේ සංග්‍රහයේ 9 වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල යටතේ නොපමාව ම පරීක්ෂණයක් මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලැබීම මෙහි සඳහන් කිසිවකින් වළක්වනු නොලැබේ.

(5) මේ පරිච්ඡේදය යටතේ යම් පරීක්ෂණයක කාර්යය සඳහා තමා ඉදිරියේ සාක්ෂි දීම පිණිස හෝ යම් ලේඛනයක් නැතහොත් වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම පිණිස හෝ පැමිණ සිටීමට යම් සාක්ෂිකරුවකුට බල කිරීම සඳහා අධිකරණ නියෝගයක් නිකුත් කිරීම යෝග්‍ය යයි යම් මරණ පරීක්ෂකවරයකු විසින් සලකනු ලැබුවහොත්, ඒ මරණ පරීක්ෂකවරයා විසින් එසේ අධිකරණ නියෝගයක් නිකුත් කළ හැකි ය. මරණ පරීක්ෂකවරයාගේ බලතල.

(6) එසේ කැඳවනු ලැබූ යම් තැනැත්තකු ඒ සිතාසියේ සඳහන් වේලාවේ දී එහි සඳහන් ස්ථානයට පැමිණ සිටීම පැහැර හැරියහොත් හෝ නොසලකා හැරියහොත්, ඔහු අල්ලා ගෙන තමා වෙත ඉදිරිපත් කරන ලෙසට වරෙන්තුවක් ඒ මරණ පරීක්ෂකවරයා විසින් නිකුත් කළ හැකි ය.

(7) පැමිණ සිටීම එසේ පැහැර හරින හෝ, සාක්ෂිකරුවකු වශයෙන් දිවුරුම් දීම ප්‍රතික්ෂේප කරන හෝ, තමාගෙන් නීත්‍යනුකූලව අසනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරන හෝ, යම් ලේඛනයක් නැතහොත් වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම පැහැර හරින නැතහොත් ප්‍රතික්ෂේප කරන හෝ සෑම තැනැත්තකු ම වරදක් කරන අතර ඊට වරදකරු කරනු ලැබූ විට රුපියල් සියයක් නොඉක්මවන දඩයකට හෝ තුන් මාසයක් නොඉක්මවන යම් කාල සීමාවක් දෙයාකාරයෙන් එක් ආකාරයකින්

බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

පොලීසිය භාරයේ හෝ මානසික රෝහලක හෝ ලාදුරු රෝහලක සිටින අතරතුර යම් තැනැත්තකුගේ මරණය සිදු වීම.

**371.** (1) යම් තැනැත්තකු පොලීසිය භාරයේ හෝ මානසික රෝහලක හෝ ලාදුරු රෝහලක හෝ බන්ධනාගාරයක හෝ සිටින අතරතුර මියගිය විටක, අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා භාරව සිටි නිලධරයා විසින් හෝ ඒ රෝහල නැතහොත් බන්ධනාගාරය භාරව සිටි නිලධරයා විසින්, ඒ තැනැත්තාගේ මෘත ශරීරය හමු වූයේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බල සීමාව ඇතුළත තිබී ද ඒ මහෙස්ත්‍රාත් අධිකරණයේ මහෙස්ත්‍රාත්වරයකු වෙත ඒ මරණය පිළිබඳ තොරතුරු නොපමාව ම සැපයිය යුතු අතර, ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ මෘත ශරීරය බලා, මරණයට හේතුව පිළිබඳව පරීක්ෂණයක් පැවැත්විය යුතු ය.

(2) වරදක් සම්බන්ධයෙන් වූ පරීක්ෂණයක් පැවැත්වීමේ දී මහෙස්ත්‍රාත්වරයකු සතු සියලු බලතල, මේ වගන්තිය යටතේ වූ පරීක්ෂණයක් පැවැත්වීමේ දී මහෙස්ත්‍රාත්වරයකුට ඇත්තේ ය.

සාක්ෂි සහ තීරණය වාර්තාගත කළ යුතු බව.

**372.** (1)මේ පරිච්ඡේදය යටතේ නියම කර තිබෙන පරීක්ෂණයක් පවත්වන මහෙස්ත්‍රාත්වරයා විසින් හෝ මරණ පරීක්ෂකවරයා විසින් සාක්ෂි සහ ඒ පරීක්ෂණය පිළිබඳ තම තීරණය වාර්තාගත කළ යුතු ය.

(2)මේ පරිච්ඡේදය යටතේ මරණ පරීක්ෂණයක් පවත්වනු ලබන ස්ථානය මහජනයාට විවෘත වූ ස්ථානයක් විය යුතු ය. එහෙත් මරණ පරීක්ෂණයක් පවත්වන මහෙස්ත්‍රාත්වරයකු විසින් හෝ මරණ පරීක්ෂකවරයකු විසින් හෝ, තම අභිමතය පරිදි මහජන ප්‍රතිපත්තිය නැතහොත් යෝග්‍යතාව පිළිබඳ විශේෂ හේතු පිට, පරීක්ෂණයේ ඕනෑම අවස්ථාවක දී මරණ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානයෙන් මහජනයා බැහැර කළ හැකි ය.

පශ්චාත් මරණ පරීක්ෂණ.

**373.** (1) මෘත ශරීරය පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණයක් පවත්වන ලෙස සහ මරණයට හේතුව සම්බන්ධයෙන් වාර්තාවක් තමා වෙත ඉදිරිපත් කරන ලෙස දිස්ත්‍රික්කයේ රජයේ වෛද්‍ය නිලධරයාට හෝ වෙනත් යම් වෛද්‍ය වෘත්තිකයකුට හෝ නියම කිරීම අවස්ථානුකූල යයි මහෙස්ත්‍රාත්වරයා විසින් නැතහොත්

නත් කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් බලය පවරන ලද යම් මරණ පරීක්ෂකවරයකු විසින් සලකනු ලැබුවහොත්, ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් හෝ එසේ නියම කළ යුතු ය.

(2) මෘත ශරීරය ඒ වන විට වළලනු ලැබ තිබේ නම්, (1) වන උපවගන්තිය යටතේ වූ පශ්චාත් මරණ පරීක්ෂණය පිළිබඳ කාර්ය සඳහා, ඒ මෘත ශරීරය නැවත ගොඩ ගැනීමට මහෙස්ත්‍රාත්වරයා විසින් සලස්වනු ලැබිය හැකි ය.

## XXXI වන පරිච්ඡේදය

## සිහිවිකල තැනැත්තෝ

**374.** (1) චූදිතයා සිහිවිකල තැනැත්තකු බැව් ද ඒ හේතුවෙන් ස්වකීය විත්තිවාචකය ඉදිරිපත් කිරීමට ඔහුට නොහැකි බැව් ද විශ්වාස කිරීමට හේතු, පරීක්ෂණයක් හෝ නඩු විභාගයක් හෝ පවත්වන මහෙස්ත්‍රාත් අධිකරණයකට තිබෙන විටක, එම සිහිවිකල් භාවය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා එම තැනැත්තා ඒ දිස්ත්‍රික්කයේ රජයේ වෛද්‍ය නිලධරයා විසින් හෝ වෙනත් යම් වෛද්‍ය නිලධරයකු විසින් හෝ පරීක්ෂා කරනු ලැබීමට සැලැස්විය යුතු අතර, ඉනික්බිතිව සාක්ෂිකරුවකු වශයෙන් එම නිලධරයාගෙන් ප්‍රශ්න අසා ඒ සාක්ෂි විභාගය ලියා සටහන් කළ යුතු ය.

චූදිතයා සිහිවිකල තැනැත්තකු නම් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.

(2) චූදිතයා සිහිවිකල තැනැත්තකු බැව් ද ඒ හේතුවෙන් ස්වකීය විත්තිවාචකය ඉදිරිපත් කිරීමට ඔහුට නොහැකි බැව් ද මහෙස්ත්‍රාත් අධිකරණයේ මතය වේ නම් ඒ අධිකරණය විසින් නඩුවේ වැඩිදුර නඩු කටයුතු කල් තැබිය යුතු ය.

**375.** (1) නඩු විභාගය සඳහා මහාධිකරණය ඉදිරියට පමුණුවන ලද යම් තැනැත්තකු සිහිවිකල තැනැත්තකු බැව් ද ඒ හේතුවෙන් ස්වකීය විත්තිවාචකය ඉදිරිපත් කිරීමට ඔහුට නොහැකි බැව් ද ඒ විභාගයේ දී අධිකරණයට පෙනී ගිය හොත්, මහාධිකරණයේ ජූරි සභාව විසින් හෝ (නඩු විභාගය ජූරි සභාවක් නැතිව නම්) මහාධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් පළමුකොට එම සිහිවිකල්භාවය හා අශක්‍යතාව පිළිබඳව විභාග කොට ඒ සිහිවිකල්භාවය හා අශක්‍යතාව පිළිබඳව විභාග කොට

නඩු විභාගය සඳහා මහාධිකරණයට පමුණුවන ලද තැනැත්තා සිහිවිකල තැනැත්තකු නම් ක්‍රියා කළ යුතු ආකාරය.

ඒ අනුව තීරණය කළ යුතු අතර ඉනික්බිතිව නඩු විභාගය කල් තැබිය යුතු ය.

(2) චූදිතයාගේ සිහිවිකල් භාවය සහ අශක්‍යතාව පිළිබඳව නඩු විභාගය අධිකරණය ඉදිරියෙහි වූ ඔහුගේ නඩු විභාගයේ කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය.

විමර්ශනයක් හෝ නඩු විභාගයක් පවතිමින් තිබෙන අතර සිහිවිකල තැනැත්තා මුදා හැරීම.

**376.** (1) චූදිතයකු සිහිවිකල තැනැත්තකු බැව් ද ස්වකීය විත්තිවාචකය ඉදිරිපත් කිරීමට ඔහුට නොහැකි බැව් ද තීරණය කරනු ලබන කවර විටක වුව ද, නඩුව ඇප දිය හැකි අන්දමේ නඩුවක් නම් ඔහු නිසි පරිදි ගනු ලබන බවටත් තමාට ම හානියක් සිදු කර ගැනීමෙන් හෝ වෙනත් යම් තැනැත්තකුට හානියක් සිදු කර ගැනීමෙන් හෝ වෙනත් යම් තැනැත්තකුට හානියක් සිදු කිරීමෙන් හෝ ඔහු වළක්වාලන බවටත් අවශ්‍ය වූ විට අධිකරණය ඉදිරියේ හෝ අධිකරණය විසින් නම් කරනු ලබන නිලධරයකු ඉදිරියේ හෝ ඔහු පෙනී සිටීමට සලස්වන බවටත් දෙනු ලබන ප්‍රමාණවත් ඇපයක් මත අධිකරණය විසින් ඔහු මුදා හැරිය හැකි ය.

(2) නඩුව ඇප දිය නොහැකි නඩුවක් නම් හෝ ප්‍රමාණවත් ඇපයක් නො දෙනු ලැබුවේ නම්, අධිකරණය විසින් අමාත්‍යවරයා වෙත ඒ නඩුව වාර්තා කළ යුතු අතර, චූදිතයා මානසික ආරෝග්‍යශාලාවක හෝ ආරක්ෂිත රැකවරණය ඇති වෙනත් සුදුසු ස්ථානයක හෝ රැඳවිය යුතු යයි අමාත්‍යංශයේ ලේකම්වරයාගේ අත්සන යටතේ වූ ලියවිල්ලක් මගින් අමාත්‍යවරයා විසින් නියම කළ හැකි අතර අධිකරණය විසින් එම නියමය ක්‍රියාත්මක කළ යුතු ය.

පරීක්ෂණය හෝ නඩු විභාගය නැවත ආරම්භ කිරීම.

**377.** (1) 374 වන සහ 375 වන වගන්ති යටතේ පරීක්ෂණයක් හෝ නඩු විභාගයක් කල් තබනු ලැබූ කවර අවස්ථාවක වුව ද එම පරීක්ෂණය නැවත ආරම්භ කිරීම හෝ නඩු විභාගය අලුතින් පටන් ගැනීම හෝ අධිකරණය විසින් ඕනෑම අවස්ථාවක දී කළ හැකි අතර චූදිතයාට අධිකරණය ඉදිරියේ පෙනී සිටින ලෙස හෝ චූදිතයා අධිකරණය ඉදිරියට පමුණුවන ලෙස හෝ අධිකරණය විසින් නියම කළ හැකි ය.

(2) 376 වන වගන්තිය යටතේ චූදිතයා මුදා හරිනු ලැබ ඇති විට සහ ඔහු ඉදිරිපත් කිරීම සඳහා ඇප වූ අපකරුවන් විසින් ඔහු ඉදිරිපත් කළ යුත්තේ අධිකරණය විසින් තත් කාර්යය සඳහා පත් කරන ලද යම් නිලධරයකු වෙත ද ඒ නිලධරයා වෙත ඔහු ඉදිරිපත් කරනු ලැබූ කල්හි, ස්වකීය විත්තිවාචකය ඉදිරිපත් කිරීමට චූදිතයාට හැකි බවට වූ එම නිලධරයාගේ සහතිකය සාක්ෂි වශයෙන් භාර ගත හැකි විය යුතු ය.

චූදිතයා අධිකරණය ඉදිරියෙහි පෙනී සිටින විට අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.

**378.** (1) චූදිතයා පෙනී සිටි කල්හි හෝ චූදිතයා, නැවතත් අධිකරණය වෙත පමුණුවනු ලැබූ කල්හි ස්වකීය විත්තිවාචකය ඉදිරිපත් කිරීමට චූදිතයාට හැකි යයි අධිකරණය අදහස් කරන්නේ නම්, පරීක්ෂණය හෝ නඩු විභාගය පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

(2) ස්වකීය විත්තිවාචකය ඉදිරිපත් කිරීමට චූදිත තැනැත්තාට එවකටත් නොහැකි යයි අධිකරණය අදහස් කරන්නේ නම්, අධිකරණය විසින් නැවතත්, අවස්ථාවෝචිත පරිදි, 374 වන වගන්තියෙහි හෝ 376 වන වගන්තියෙහි හෝ විධිවිධාන අනුව ක්‍රියා කළ යුතු ය.

චූදිතයා සිහිවිකලව සිටි බව පෙනී යන විට.

**379.** පරීක්ෂණය පැවැත්වෙන අවස්ථාවෙහි චූදිතයා හොඳ සිහියෙන් යුක්ත යයි පෙනී යන්නා වූ ද, ඔහු හොඳ සිහියෙන් යුක්තව සිටියේ නම් වරදක් විය හැකිව තිබුණු ක්‍රියාවක් චූදිතයා විසින් කර ඇති බව ද ඒ ක්‍රියාව කළ අවස්ථාවෙහි සිහිවිකලත්වය හේතුකොට ගෙන ඒ ක්‍රියාවේ ස්වභාවය දැන සිටීමට හෝ ඒ ක්‍රියාව වැරදි ක්‍රියාවක් බව නැතහොත් නීතියට පටහැනි ක්‍රියාවක් බව දැන සිටීමට හෝ ඔහුට නොහැකිව සිටි බව ද විශ්වාස කිරීමට හේතු ඇත්තේ යයි මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියෙහි දෙන ලද සාක්ෂි අනුව මහෙස්ත්‍රාත් අධිකරණය සෑහීමට පත් වන්නා වූ ද විට, XV වන පරිච්ඡේදයෙන් විධාන කළ පරිදි අධිකරණය විසින් ඒ නඩුවේ කටයුතු පවත්වා ගෙන යා යුතු ය.

සිහිවිකලත්වයේ හේතුව උඩ නිදොස් කිරීමේ නඩු තීන්දුව

**380.** යම් තැනැත්තකු විසින් වරදක් කරන ලදැයි කියන අවස්ථාවේ දී ඒ වරද සංයුක්ත වන්නා වූ කළේ යයි කියන ක්‍රියාවෙහි ස්වභාවය දැන සිටීමට හෝ ඒ ක්‍රියාව වැරදි ක්‍රියාවක් බව නැතහොත් නීතියට පටහැනි ක්‍රියාවක් බව දැන සිටීමට හෝ සිහිවිකලත්වය හේතු කොට ගෙන ඔහුට නොහැකිව සිටීමේ හේතුව මත ඔහු නිදොස් කරනු ලබන කවර අවස්ථාවක වුව ද, ඔහු එම ක්‍රියාව කළේ ද නැද්ද යන වග තීන්දුවෙහි නිශ්චය වශයෙන් සඳහන් විය යුතු ය.

සිහිවිකලත්වයේ හේතුව මත නිදොස් කරනු ලැබූ තැනැත්තා ආරක්ෂිත රැකවරණයෙහි තැබිය යුතු බව.

**381.** (1) කරන ලදැයි කියන ක්‍රියාව චූදිතයා විසින් කරන ලද බව තීන්දුවෙහි සඳහන් වන්නා වූ කවර අවස්ථාවක වුව ද තීරණය කරන ලද අශක්‍යතාව නිසා හොවේ නම් ඒ ක්‍රියාවෙන් වරදක් සංයුක්ත විය හැකිව තිබුණේ නම් සුදුසු යයි අධිකරණයට හැඟෙන ස්ථානයක සුදුසු යයි අධිකරණය කල්පනා කරන ආකාරයකට එම තැනැත්තා ආරක්ෂිත රැකවරණයෙහි තැබිය යුතු යයි නඩු විභාගය පවත්වනු ලැබූ අධිකරණය විසින් ආඥා කළ යුතු අතර අධිකරණය විසින් ඒ අනුව අමාත්‍යවරයාගේ නියමයන් සඳහා ඔහු වෙත වාර්තා කළ යුතු ය.

(2) වැඩිදුර නියම කරනු ලබන තුරු එම තැනැත්තා මානසික ආරෝග්‍යශාලාවක, බන්ධනාගාරයක හෝ ආරක්ෂා රැකවරණයෙන් යුත් වෙනත් සුදුසු ස්ථානයක රඳවා තැබිය යුතු යයි අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අත්සන යටතේ වූ ලියවිල්ලක් මගින් අමාත්‍යවරයා විසින් නියම කළ හැකි ය.

මේ පරිච්ඡේදය යටතේ රඳවා තබා ඇති තැනැත්තන් බැලීමට බන්ධනාගාර කොමසාරිස්වරයා හෝ මානසික ආරෝග්‍යශාලාවේ වික්ෂකයන් යා යුතු බව.

**382.** මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ යම් තැනැත්තකු රඳවා තබා ඇති අවස්ථාවක, ඔහු බන්ධනාගාරයක රඳවා තබා ඇත්නම් බන්ධනාගාර කොමසාරිස්වරයා විසින් හෝ, ඔහු මානසික ආරෝග්‍යශාලාවක රඳවා තබා ඇත්නම් ඒ මානසික ආරෝග්‍ය ශාලාවේ වික්ෂකයන් විසින් නැතහොත් ඔවුන් අතුරින් දෙදෙනකු විසින් හෝ ඔහුගේ මානසික තත්ත්වය නිශ්චය කොට දැන ගැනීම පිණිස ඔහු බැලීමට යා හැකි ය; තව ද යටත් පිරිසෙයින් මාස හයකට වරක්වත් ඉහත කී පරිදි ඒ කොමසාරිස්වරයා හෝ ඒ වික්ෂකයන් අතුරින් දෙදෙනකු හෝ ඔහු බැලීමට යා යුතු අතර, ඒ තැනැත්තාගේ මානසික තත්ත්වය පිළිබඳ විශේෂ වාර්තාවක් ඒ කොමසාරිස්වරයා විසින් හෝ ඒ වික්ෂකයන් විසින් හෝ අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතු ය.

376 වන වගන්තිය යටතේ රඳවා තබා ඇති තැනැත්තාට ස්වකීය විත්ති වාචකය ඉදිරිපත් කිරීමේ හැකියාව ඇතැයි වාර්තා කරනු ලැබූ අවස්ථාවක, කාර්ය පටිපාටිය.

**383.** ඒ තැනැත්තා 376 වන වගන්තියේ විධිවිධාන යටතේ රඳවා තබා ඇත්නම් සහ එම තැනැත්තාට ස්වකීය විත්තිවාචකය ඉදිරිපත් කළ හැකි යයි තම මතය අනුව ඒ කොමසාරිස්වරයා හෝ වික්ෂකයන් හෝ සහතික කරන්නේ නම්, ඒ තැනැත්තා රඳවා තබා ඇත්තේ යම් අධිකරණයක ආඥාව පිට ද ඒ අධිකරණය විසින් නියම කරනු ලබන යම් වේලාවක දී ඒ තැනැත්තා ඒ අධිකරණය විසින් නියම කරනු ලබන යම් වේලාවක දී ඒ තැනැත්තා ඒ අධිකරණය ඉදිරියට ගෙන යනු ලැබිය යුතු ය. එවිට ඒ අධිකරණය විසින් ඒ තැනැත්තා සම්බන්ධයෙන් 378 වන වගන්තියේ විධිවිධාන යටතේ ක්‍රියා කළ යුතු අතර යට කී පරිදි කොමසාරිස්වරයාගේ හෝ වික්ෂකයන්ගේ සහතිකය සාක්ෂි වශයෙන් භාර ගත හැකි විය යුතු ය.

**384.** 376 වන වගන්තියේ හෝ 381 වන වගන්තියේ හෝ විධිවිධාන යටතේ ඒ තැනැත්තා රඳවා තබා ඇත්නම් සහ තමාට හානියක් කර ගැනීමේ හෝ වෙනත් යම් තැනැත්තකුට හානියක් කිරීමේ හෝ අවදානමකින් තොරව එම තැනැත්තා නිදහස් කළ හැකි යයි තම විනිශ්චය අනුව කොමසාරිස්වරයා විසින් හෝ වික්ෂකයන් විසින් හෝ සහතික කරනු ලැබේ නම්, එවිට ඔහු නිදහස් කළ යුතු යයි හෝ අත් අඩංගුවෙහි රඳවා තැබිය යුතු යයි හෝ ඔහු දැනටමත් මානසික ආරෝග්‍යශාලාවකට යවනු ලැබ නැත්නම් මානසික ආරෝග්‍යශාලාවකට මාරු කළ යුතු යයි හෝ අමාත්‍යවරයා විසින් නියම කළ හැකි ය. මානසික ආරෝගශාලාවකට ඔහු මාරු කිරීමට අමාත්‍යවරයා නියම කළහොත්, අවශ්‍ය වන අන්දමේ සාක්ෂි ගැනීමෙන් පසු ඒ තැනැත්තාගේ මානසික තත්ත්වය පිළිබඳ විධිමත් පරීක්ෂණයක් කර අමාත්‍යවරයා වෙත වාර්තා කරනු පිණිස මහෙස්ත්‍රාත්වරයකුගෙන් සහ වෛද්‍ය නිලධරයන් දෙදෙනකුගෙන් සමන්විත පරීක්ෂණ කමිටුවක් අමාත්‍යවරයා විසින් පත් කළ හැකි ය. ඉක්බිතිව, සුදුසු යයි අමාත්‍යවරයා කල්පනා කරන පරිදි ඔහු නිදහස් කිරීම සඳහා හෝ රඳවා තබා ගැනීම සඳහා හෝ නියමයක් අමාත්‍යවරයා විසින් කළ හැකි ය.

376 වන වගන්තිය හෝ 381 වගන්තිය හෝ යටතේ රඳවා තබා ඇති තැනැත්තා නිදහස් කරනු ලැබීමට සුදුසු යයි ප්‍රකාශ කරනු ලැබූ අවස්ථාවක, කාර්ය පටිපාටිය.

**385.** (1) 376 වන වගන්තියේ හෝ 381 වන වගන්තියේ හෝ විධිවිධාන යටතේ රඳවා තබා ඇති තැනැත්තකු තම ආරක්ෂාවට සහ භාරයට පත් කළ යුතු බවට ඒ තැනැත්තාගේ යම් ඥාතියකු හෝ මිත්‍රයකු හෝ විසින් කැමැත්ත දක්වා සිටින කවර අවස්ථාවක වුව ද, ඒ ඥාතියා විසින් හෝ මිත්‍රයා විසින් හෝ ඉල්ලීමක් කරනු ලැබූ විට සහ එසේ භාර දෙනු ලබන තැනැත්තා නිසි පරිදි බලා ගනු ලබන බවටත් තමාට හානියක් කර ගැනීමෙන් හෝ වෙනත් යම් තැනැත්තකුට හානියක් කිරීමෙන් හෝ ඒ තැනැත්තා වළක්වා ගනු ලබන බවටත් අමාත්‍යවරයා සෑහීමට පත්වන පරිදි ඒ ඥාතියා විසින් හෝ මිත්‍රයා විසින් ඇපයක් තබනු ලැබූ විට, ඒ ඥාතියා හෝ මිත්‍රයා වෙත ඒ තැනැත්තා භාර දෙන ලෙස අමාත්‍යවරයා විසින් නියම කළ හැකි ය.

රඳවා තබා ඇති තැනැත්තා ඥාතියකුගේ හෝ මිත්‍රයකුගේ හෝ ආරක්ෂාවට භාර දීම.

(2) එවැනි තැනැත්තකු එසේ භාර දෙනු ලබන කවර අවස්ථාවක වුව ද, අමාත්‍යවරයා විසින් විධාන කරනු ලබන පරිදි යම් නිලධරයකු වෙත අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් වේලාවන් හි දී ඔහු පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය යන කොන්දේසිය මත ඒ භාර දීම කළ යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන යටතේ භාර දෙනු ලබන තැනැත්තන්ට 382 වන හා 384 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව, අදාළ විය යුතු අතර මේ වගන්තිය යටතේ පත් කරනු ලබන පරීක්ෂක නිලධරයාගේ සහතිකය සාක්ෂි වශයෙන් භාර ගත හැකි විය යුතු ය.

සිහිවිකල යයි සැක කරනු ලබන තැනැත්තා කවර ස්ථානයක කවර ආකාරයකට රිමාන්ඩ් භාරයේ තැබිය යුතු ද යන වග.

**386.** 384 වන වගන්තිය යටතේ ක්‍රියා කරන මහෙස්ත්‍රාත්වරයකු විසින්, සිහිවිකල තැනැත්තකු යයි සැක කරනු ලබන යම් චූදිත තැනැත්තකු වෛද්‍ය පරීක්ෂණයකට භාජන කර විය හැකි අතර, ඒ තැනැත්තා රිමාන්ඩ් භාරයට පත් කිරීමේ ආඥාවෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු සාධාරණ කාලයකට එක් වරක දී හෝ ඊට වැඩි වාර ගණනක දී හෝ බන්ධනාගාරයක අධිකාරිවරයකු විසින් ඒ බන්ධනාගාරයේ රඳවා තබා ගනු පිණිස එවැනි අධිකාරිවරයෙකුගේ භාරයට හෝ මානසික රෝග ආඥා පනතේ 3 වන වගන්තියේ විධිවිධාන යටතේ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන නිරීක්ෂණ නිවාසයක් නැතහොත් නිරීක්ෂණ නිවාසයේ හෝ නිරීක්ෂණ ස්ථානයේ හෝ රඳවා තබා ගනු පිණිස එවැනි නිලධරයකුගේ භාරයට හෝ ඒ තැනැත්තා පත් කරමින් ඔහු රිමාන්ඩ් භාරයට පත් කළ යුතු ය. එසේ රිමාන්ඩ් භාරයට පත් කරනු ලබන සෑම තැනැත්තකු ම ඒ බන්ධනාගාරයේ හෝ නිරීක්ෂණ නිවාසයේ නැතහොත් ස්ථානයේ හෝ වෛද්‍ය නිලධරයාගේ පරීක්ෂණයට භාජනය කළ යුතු ය.

## XXXII වන පරිච්ඡේදය

## යුක්තිය පසිඳලීම කෙරෙහි බලපාන ඇතැම් වැරදි සම්බන්ධයෙන් නඩු කටයුතු

135 (1) වන වගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් නඩු සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය.

**387.** (1) මහෙස්ත්‍රාත් අධිකරණයක් නොවන යම් සිවිල් අධිකරණයක් නැතහොත් අපරාධ අධිකරණයක් ඉදිරිපිට දී සිදු කරන ලද හෝ අධිකරණ කටයුත්තක දී ඒ අධිකරණයක අවධානයට ලක් කරනු ලැබූ හෝ, 135 (1) වන වගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් යම් වරදක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට හේතු ඇති බව ඒ අධිකරණයේ මතය වන විට, ඒ අධිකරණය විසින්, එම නඩුව පරීක්ෂණය සඳහා හෝ නඩු විභාගය සඳහා ළඟම පිහිටි මහෙස්ත්‍රාත් අධිකරණය වෙත යැවීම ද, චූදිතයා අත් අඩංගුවේ යැවීම හෝ මහෙස්ත්‍රාත්

අධිකරණය ඉදිරියෙහි ඔහුගේ පෙනී සිටීම සඳහා ප්‍රමාණවත් ඇපයක් ගැනීම ද ඒ පරීක්ෂණයේ දී හෝ නඩු විභාගයේ දී පෙනී සිටීමට සහ සාක්ෂි දීමට යම් තැනැත්තකුගේ ඇග බැඳීම ද කළ හැකි ය; ඉන් පසු ඒ මහෙස්ත්‍රාත් අධිකරණය විසින් නීතිය අනුව කටයුතු කිරීම ආරම්භ කළ යුතු ය.

(2) එවැනි අධිකරණයක් ඉදිරිපිට දී වරද සිදු කරන ලද හෝ අධිකරණයෙහි අවධානයට වරද ලක් කරන ලද හෝ වේලෙහි ඒ අධිකරණයෙහි මුලසුන දරන නිලධරයා ළඟම පිහිටි මහෙස්ත්‍රාත් අධිකරණයෙහි මහෙස්ත්‍රාත්වරයකු ද වන අවස්ථාවක, ඔහු විසින් චූදිතයා සම්බන්ධයෙන් නඩු විභාග කිරීම නොකළ යුතු නමුත්, නඩු විභාගය මහාධිකරණයට තැබීමේ අදහසින් XV වන පරිච්ඡේදය යටතේ තමා විසින් ම පරීක්ෂණයක් පැවැත්වීම හෝ ඒ මහෙස්ත්‍රාත් අධිකරණයේ වෙනත් මහෙස්ත්‍රාත්වරයකු විසින් නඩු විභාග කරනු ලැබීම පිණිස චූදිතයා රිමාන්ඩ් භාරයේ තැබීම නැතහොත් ඇප පිට මුදා හැරීම හෝ කරනු ලැබිය යුතු ය.

(3) මහෙස්ත්‍රාත් අධිකරණයක් සම්බන්ධයෙන් වූ විට, ඒ අධිකරණය ඉදිරිපිට දී වරද සිදු කරන ලද හෝ අධිකරණයෙහි අවධානයට වරද ලක් කරන ලද හෝ වේලෙහි ඒ අධිකරණයෙහි මුලසුන දරන මහෙස්ත්‍රාත්වරයා විසින් නඩු විභාගය මහාධිකරණයට තැබීමේ අදහසින් XV වන පරිච්ඡේදය යටතේ තමා විසින් ම පරීක්ෂණයක් පැවැත්වීම හෝ ඒ මහෙස්ත්‍රාත් අධිකරණයෙහි වෙනත් මහෙස්ත්‍රාත්වරයකු විසින් නඩු විභාග කරනු ලැබීම පිණිස චූදිතයා රිමාන්ඩ් භාරයෙහි තැබීම නැතහොත් ඇප පිට මුදා හැරීම හෝ කරනු ලැබිය යුතු ය.

අපහාස කිරීමේ ඇතැම් අවස්ථා සම්බන්ධයෙන් කාර්ය පරිපාටිය.

**388.** (1) දණ්ඩ නීති සංග්‍රහයේ 173 වන, 176 වන, 177 වන, 178 වන හෝ 223 වන වගන්තිවල විස්තර කර ඇති යම් වරදක් ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අභියාචනාධිකරණය හෝ මහාධිකරණය හැර වෙනත් යම් අපරාධ අධිකරණයකට හෝ සිවිල් අධිකරණයකට පෙනෙන පරිදි නැතහොත් එවැනි යම් අධිකරණයක් ඉදිරිපිට දී කරනු ලබන කවර අවස්ථාවක දී වුව ද ඒ අධිකරණය විසින් එම වරදකරු අත් අඩංගුවේ රඳවා තබා ගැනීමට සලස්වා, එදින ම අධිකරණය විසිර යාමට පෙර යම් අවස්ථාවක දී, සුදුසු යයි අධිකරණය කල්පනා කරන්නේ නම්, වරද සංජානනය කොට, ඒ අධිකරණය දිසා අධිකරණයක් නම් රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන දඩයක් සහ ඒ

දඩය ගෙවීම පැහැර හැරීමේ දී එය කලින් ගෙවනු ලැබුවහොත් මිස, මාස තුන දක්වා දීර්ඝ විය හැකි බරපතල වැඩ නොමැති බන්ධනාගාරගත කිරීමක් ද ඒ වරදකරු විෂයෙහි නියම කළ හැකි ය.

(2) වරද, දණ්ඩ නීති සංග්‍රහයේ 223 වන වගන්තිය යටතේ වන වරදක් නම්, බාධා කරනු ලැබූ හෝ අපහාස කරනු ලැබූ අධිකරණය රැස්ව සිටියේ නම් අධිකරණ කටයුත්තක් සම්බන්ධයෙන් ද ඒ අධිකරණ කටයුත්තේ ස්වභාවය සහ අවස්ථාව ද, කරන ලද බාධාවේ හෝ අපහාසයේ ස්වභාවය ද නඩු වාර්තාවෙහි දක්වා තිබිය යුතු ය.

(3) වරදකරු ඒ අධිකරණයේ ආඥාවට හෝ නියමයට අවනත වුවහොත් හෝ එය සෑහීමට පත්වන ආකාරයෙන් සමාව අයැද සිටියහොත් අධිකරණය විසින් ස්වකීය අභිමතය පරිදි වරදකරු නිදහස් කිරීම හෝ දඬුවම ලිහිල් කිරීම හෝ කරනු ලැබිය යුතු ය.

388 වන වගන්තිය යටතේ නඩුව සම්බන්ධයෙන් කටයුතු නොකළ යුතු යයි අධිකරණය සලකන අවස්ථාවක කාර්ය පටිපාටිය.

**389.** (1) 388 වන වගන්තියෙහි සඳහන් වූ ද යම් මහෙස්ත්‍රාත් අධිකරණයකට හෝ දිසා අධිකරණයකට පෙශනන පරිදි හෝ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක් හෝ දිසා අධිකරණයක් ඉදිරිපිට දී හෝ සිදු කරනු ලැබුවා වූ ද වැරදි කිසිවක් සම්බන්ධයෙන් චූදිත යම් තැනැත්තකුට ඒ වගන්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් නොවන අන්‍යාකාරයකින් දඬුවම් කළ යුතු යයි යම් නඩුවක දී ඒ අධිකරණය සලකනහොත්, නැතහොත් වෙනත් යම් හේතුවක් නිසා ඒ වගන්තිය යටතේ ඒ නඩුව අසා නිම නොකළ යුතු බව ඒ අධිකරණයේ මතය වුවහොත් ඒ අධිකරණය විසින්, වරද සංයුක්ත කරන සිද්ධි සහ මෙහි කලින් දක්වා ඇති පරිදි චූදිතයාගේ ප්‍රකාශය වාර්තාගත කිරීමෙන් පසුව නඩුව නීතිපතිවරයා වෙත ඉදිරිපත් කළ හැකි අතර ඉනික්බිතිව නීතිපතිවරයාගේ උපදෙස් අනුව කටයුතු කළ යුතු ය:

(2) එවැනි නඩුවක් ලැබුණු විට නීතිපතිවරයා සිද්ධි සම්බන්ධයෙන් සෑහීමට පත් වුවහොත් වරදකරුට විරුද්ධව නිසි මහෙස්ත්‍රාත් අධිකරණයෙහි නඩු පැවරීම හෝ වරදකරුගේ නඩු විභාගය මහාධිකරණයට තැබීමේ අදහසින් XV වන පරිච්ඡේදය යටතේ පරීක්ෂණයක් පවත්වන ලෙස

නිසි මහෙස්ත්‍රාත් අධිකරණයෙහි නඩු පැවරීම හෝ වරදකරුගේ නඩු විභාගය මහාධිකරණයට පැවරීමේ අදහසින් XV වන පරිච්ඡේදය යටතේ පරීක්ෂණයක් පවත්වන ලෙස මහෙස්ත්‍රාත්වරයාට විධාන කිරීම හෝ මහාධිකරණය විසින් නඩු විභාග කිරීම සඳහා වරදකරුට විරුද්ධව කෙලින්ම අධි චෝදනා පත්‍රයක් ඉදිරිපත් කිරීම හෝ ඔහු විසින් කළ යුතු ය:

එසේ වුව ද මහාධිකරණයෙහි නඩු විභාගය ජූරි සභාවක් නැතිව විය යුතු ය:

එසේ ද වුවත් වරද සිදු කරනු ලැබුවේ යම් මහෙස්ත්‍රාත්වරයකුට පෙනෙන පරිදි ද නැතහොත් යම් මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී ද ඒ මහෙස්ත්‍රාත්වරයා ඒ නඩුව ලඝු කාර්ය පටිපාටිය අනුව විභාග නොකළ යුතු ය.

උත්තර දීම හෝ ලේඛන ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන තැනැත්තකු බන්ධනාගාරගත කිරීම හෝ ඔහුගේ නඩු විභාගය ඉහළ අධිකරණයට පැවරීම.

**390.** (1) ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අභියාචනාධිකරණය නොවන යම් අධිකරණයක් ඉදිරිපිට සිටින යම් තැනැත්තකු, ඔහුගෙන් අසන ප්‍රශ්නවලට උත්තර දීම හෝ ඉදිරිපත් කරන ලෙස අධිකරණය විසින් නියම කරනු ලබන ඔහු සන්තකයෙහි හෝ ඔහුගේ බලය යටතේ ඇති යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම හෝ ප්‍රතික්ෂේප කරයි නම් හා ඒ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් යම් යුක්ති සහගත හේතුවක් ඉදිරිපත් නොකරයි නම් ඒ අධිකරණය විසින් ලිඛිතව වාර්තාගත කොට තැබිය යුතු හේතු මත දින හතක් නොඉක්මවන යම් කාලයක් ඔහු සිරකරුවකු ලෙස රඳවා තැබිය යුතු යයි ආඥා කළ හැකි ය. එහෙත් ඒ අතරතුර ඔහු එසේ ප්‍රශ්න අසනු ලැබීමට හා උත්තර දීමට හෝ ලේඛනය ඉදිරිපත් කිරීමට කැමැත්ත දැක්වුවහොත් එසේ ආඥා නොකළ යුතු ය. එකී කාලය ඉකුත්වීමෙන් පසුවත් ඔහු තම ප්‍රතික්ෂේප කිරීම දිගටම කරගෙන යයි නම් 388 වන වගන්තියේ හෝ 389 වන වගන්තියේ විධිවිධාන අනුව ඔහු සම්බන්ධයෙන් ක්‍රියා කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබූ පසු සෑම විට ම එසේ ප්‍රතික්ෂේප කළ තැනැත්තා ප්‍රකාශයක් කළේ නම් ඒ ප්‍රකාශය ද සමග ඒ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ සිද්ධි අධිකරණය විසින් වාර්තාගත කොට, අභියාචනාධිකරණයේ ප්‍රතිශෝධන බලය ක්‍රියාත්මක කිරීම සුදුසු යයි අභියාචනාධිකරණය කල්පනා

කරතහොත් ඒ ප්‍රතිශෝධන බලය ඒ අධිකරණය විසින් ක්‍රියාත්මක කළ හැකි වීම සඳහා ඒ වාර්තාවේ පිටපතක්, ආඥාවෙහි පිටපතක් ද සමඟ, අභියාචනාධිකරණය වෙත යැවිය යුතු ය.

135 (1) වන වගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් වැරදි තමන් ඉදිරිපිට දී සිදු කරනු ලැබූ විට දිසා විනිශ්චයකාරවරයන් හා මහෙස්ත්‍රාත්වරයන් විසින් ඒ සම්බන්ධයෙන් නඩු විභාග නොකළ යුතු බව.

**391.** 135 (1) වන වගන්තියේ (අ) සහ (ඇ) ඡේදවල සඳහන් යම් වරදක් තමා ඉදිරිපිට දී හෝ තමාගේ බලයට අපහාස වන පරිදි හෝ සිදු කරනු ලැබූ විට හෝ අධිකරණ කටයුත්තක දී, දිසා විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා වශයෙන් තමාගේ අවධානයට ලක් කරනු ලැබූ විට, කිසිම දිසා විනිශ්චයකාරවරයකු හෝ මහෙස්ත්‍රාත්වරයකු හෝ විසින්, ඒ වරද සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව, මේ පරිච්ඡේදයෙහි විධිවිධාන සලසා ඇති පරිදි හැර, නඩු විභාග කරනු නොලැබිය යුතු ය.

ඇතැම් වැරදි මහාධිකරණය විසින් සංජානනය කළ හැකි බව.

**392.** මේ සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මහාධිකරණය විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 173 වන, 176 වන, 177 වන හෝ 178 වන වගන්තිවල විස්තර කර ඇති යම් වරදක් හෝ 135 (1) වන වගන්තියේ (ඇ) සහ (ඈ) ඡේදවල සඳහන් යම් වරදක්-

(i) ඒ වරද ඒ අධිකරණයට පෙනෙන පරිදි හෝ ඒ අධිකරණය ඉදිරිපිට දී හෝ සිදු කරනු ලැබූ හැතහොත් අධිකරණය ඉදිරියෙහි වූ අධිකරණ කටයුත්තක දී ඒ අධිකරණයේ අවධානයට ලක් කරනු ලැබූ හෝ අවස්ථාවක, නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන අධිචෝදනා පත්‍රයක් නොමැතිව ද;

(ii) අනෙකුත් අවස්ථාවල දී නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන අධිචෝදනා පත්‍රයක් මත ද

සංජානනය කොට නඩු විභාග කළ හැකි ය.

## IX වන කොටස

## පරිපූරක විධිවිධාන

## XXXIII වන පරිච්ඡේදය

## නීතිපතිවරයා විසින් කරනු ලබන නඩු කටයුතු

**393.** (1) පහත දැක්වෙන අවස්ථාවල දී නීතිපතිවරයා විසින් තොරතුරු හා අධිචෝදනා පත්‍ර ඉදිරිපත් කිරීම සහ අපරාධ නඩු කටයුතු පැවරීම, භාර ගැනීම හෝ පවත්වා ගෙන යාම නීත්‍යනුකූල විය යුතු ය; එනම් - නීතිපතිවරයා සතු බලතල.

(අ) යම් වරදක් සම්බන්ධයෙන් XV වන පරිච්ඡේදය යටතේ මහෙස්ත්‍රාත්වරයකු විසින් මූලික පරීක්ෂණයක් පැවැත්විය යුතු යයි නියමව ඇති හෝ එවැනි පරීක්ෂණයක් පවත්වන ලෙස නීතිපතිවරයා විසින් විධාන කරනු ලබන අවස්ථාවක;

(ආ) වරද ඇප දිය නොහැකි වරදක් වන යම් අවස්ථාවක;

(ඇ) රජයේ දෙපාර්තමේන්තුවක් විසින් නීතිපතිවරයා වෙත යොමු කර ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් අපරාධ නඩු කටයුතු පැවරිය යුතු යයි නීතිපතිවරයා අදහස් කරන අවස්ථාවක;

(ඈ) මේ සංග්‍රහයේ 136 (1) (අ) වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද නඩුවක් හැර, වැදගත් යයි හෝ දුෂ්කරතාවක් ඇතැයි නීතිපතිවරයාට පෙනී යන නැතහොත් වෙනත් යම් හේතුවක් නිසා ඔහුගේ මැදිහත්වීම අවශ්‍ය වන යම් නඩුවක්;

(ඉ) නීතිපතිවරයා විසින් මහාධිකරණය වෙත අධිචෝදනා පත්‍රයක් හෝ තොරතුරු ඉදිරිපත් කරනු ලැබූ කවර හෝ අවස්ථාවක.

(2) වැදගත් වන්නා වූ නැතහොත් දුෂ්කරතාවකින් යුක්ත වූ යම් සාපරාධ කාරණයක දී රජයේ දෙපාර්තමේන්තුවලට, රාජ්‍ය නිලධරයන්ට, පොලිස් නිලධරයන්ට සහ සංස්ථා නිලධරයන්ට, ඔවුන්ගේ ඉල්ලීම පිට හෝ නීතිපතිවරයාගේ වුවමනාවෙන් ම හෝ නීතිපතිවරයා විසින් උපදෙස් දිය යුතු ය.

(3) යම් රාජ්‍ය නිලධරයකුට හෝ සංස්ථාවක හෝ පොලිසියේ යම් නිලධරයකුට යම් පොත් හෝ ලේඛන රැගෙන තම කාර්යාලයට පැමිණෙන ලෙස නියම කිරීමට ද-

(අ) යම් සාපරාධ නඩු කටයුත්තක් ආරම්භ කිරීමේ හෝ මෙහෙය වීමේ; නැතහොත්

(ආ) පැදගත් වන්නා වූ නැතහොත් දුෂ්කරතාවකින් යුක්ත වූ යම් සාපරාධ කාරණයක් සම්බන්ධයෙන් උපදෙස් දීමේ

කාර්යය සඳහා ඒ නිලධරයා සමග සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමට ද නීතිපතිවරයාට හිමිකම් තිබිය යුතු ය. අදාළ නිලධරයා ඒ නියමය අනුව ක්‍රියා කළ යුතු අතර, ගෙන එන ලෙස තමාට නියම කර තිබිය හැකි යම් පොත් සහ ලේඛන ද රැගෙන ඔහු නීතිපතිවරයාගේ කාර්යාලයට පැමිණිය යුතු ය.

(4) යම් අධිකරණයක දී යම් අපරාධ චෝදනාවක් පවත්වා ගෙන යාම පිණිස රජයේ නීතිඥවරයකු නම් කිරීම හෝ යම් නීතිඥවරයකු යෙදවීම ද ඒ නීතිඥවරයාට ගෙවිය යුතු ගාස්තුව නිශ්චය කිරීම ද නීතිපතිවරයා විසින් කළ හැකි ය.

(5) යම් කොට්ඨාසයක් භාරව සිටින පොලිස් අධිකාරිවරයා හෝ සහකාර පොලිස් අධිකාරිවරයා, ස්වකීය ප්‍රදේශය ඇතුළත සිදු කරනු ලැබ ඇත්තා වූ ද-

(අ) XV වන පරිච්ඡේදය යටතේ මූලික විමර්ශනයක් පැවැත්විය යුතු යයි නියමව ඇත්තා වූ; හෝ

(ආ) නඩු කටයුතු පැවරීම සඳහා නීතිපතිවරයාගේ කැමැත්ත හෝ අනුමතය අවශ්‍ය වන්නා වූ; හෝ

(ඇ) නීතිපතිවරයා විසින් වාර්තාවක් ඉල්ලා ඇත්තා වූ; හෝ

(ඈ) නීතිපතිවරයාගේ උපදෙස් හෝ සහාය ලබාගැනීම අවශ්‍ය යයි හෝ සුදුසු යයි ඒ පොලිස් අධිකාරිවරයා විසින් හෝ සහකාර පොලිස් අධිකාරිවරයා විසින් සලකනු ලබන්නා වූ ; හෝ

(ඉ) වාර්තාවක් එවන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් විධාන කරනු ලබන්නා වූ; නැතහොත්

(ඊ) වරද සංඥෙය වරදක් වුවද අපරාධ චෝදනාව ඉල්ලා අස්කර ගෙන ඇත්තා වූ හෝ පවත්වා ගෙන යා නොහැකි වූ ද,

සෑම වරදක් පිළිබඳව නීතිපතිවරයා වෙත වාර්තා කළ යුතු ය.

(6) (5) වන උපවගන්තිය ප්‍රකාර වාර්තා කරන විට අවස්ථාවෝචිත පරිදි, පොලිස් අධිකාරීවරයා විසින් හෝ සහකාර පොලිස් අධිකාරීවරයා විසින්-

(අ) අවස්ථාගත කරුණු පිළිබඳ සම්පූර්ණ ප්‍රකාශයක් ;

(ආ) සියලුම සාක්ෂිකරුවන් විසින් කරන ලද ප්‍රකාශවල පිටපත් ;

(ඇ) අදාළ විය හැකි හෝ නීතිපතිවරයා විසින් ඉල්ලා සිටිනු ලබන වෙනත් තොරතුරු, ලේඛන හෝ ඉදිරිපත් කරන ලද දේ; සහ

(ඈ) මරණ පරීක්ෂණයක් පවත්වා ඇති අවස්ථාවක පරීක්ෂණ වාර්තාවේ පිටපතක්

නීතිපතිවරයා වෙත සපයනු ලැබිය යුතු ය.

(7) මේ පනතේ ඇතුළත් වෙනත් යම් විධිවිධාන නොතකා නීතිපතිවරයා විසින්, යම් ලඝු වරදක් සම්බන්ධයෙන් වරදෙහි ස්වභාවය හෝ වෙනත් යම් කරුණු සලකා බලා - *[1980 අංක 52 § 12]

(අ) මහාධිකරණය වෙත කෙලින් ම අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කිරීම, හෝ

(ආ) මූලික පරීක්ෂණයක දී වාර්තාගත කරන ලද සාක්ෂි අධිචෝදනා පත්‍රයක් සකස් කිරීම සඳහා අවශ්‍ය වන්නේ යයි නීතිපතිවරයාගේ මතය වන අවස්ථාවක ඔහු විසින් නියම කොට දක්වනු ලබන යම් වරදක් සම්බන්ධයෙන් XV වන පරිච්ඡේදයේ සඳහන් කාර්ය පටිපාටිය අනුව

මූලික පරීක්ෂණයක් පැවැත්වීමට මහෙස්ත්‍රාත්වරයාට විධාන කිරීම

නීත්‍යනුකූල වන්නේ ය; ඉන් අනතුරුව ඒ වරද මහෙස්ත්‍රාත් අධිකරණයක දී විභාග කරනු නොලැබිය යුතු ය.

*[1980 අංක 52 § 12]

(8) මේ වගන්තිය යටතේ නීතිපතිවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීම හා කාර්ය ඉටු කිරීම කළ හැකි වනු පිණිස අවශ්‍ය සියලු ආනුෂංගික හා පරිපූරක විධිවිධාන ඇතුළත් නියෝග අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය හැකි ය.

අධිකරණයට ගෙන එනු ලැබූ තැනැත්තන් ලෙස සලකනු ලබන්නේ කවර තැනැත්තන් ද යන වග.

**394.** තමාට විරුද්ධව අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබ, මහාධිකරණය ඉදිරියෙහි පෙනී සිටින සියලු තැනැත්තන්ම, නීතියේ යථා මාර්ගය අනුව, එම අධිකරණය ඉදිරියට ගෙන එනු ලැබූ ලෙස, එය එසේ නොවේතැයි දක්වනු ලැබුවහොත් මිස, සලකනු ලැබිය යුතු අතර ඒ සියලු තැනැත්තන් ම (මෙහි ඇතුළත් විධිවිධානවලට යටත් ව) එසේ ඉදිරිපත් කරනු ලැබූ අධිචෝදනා පත්‍රය මත නඩු විභාගයට පාත්‍ර කරනු ලැබිය යුතු ය.

මුල් නඩු වාර්තාව සහ ඉදිරිපත් කරන දේ කැඳවීමට නීතිපතිවරයාට ඇති බලය.

**395.** (1) 159 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන, පරීක්ෂණයක වාර්තාවේ සහතික පිටපත තමා වෙත ලැබීමෙන් පසු, පරීක්ෂණයේ මුල් නඩු වාර්තාව (සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරන ලද යම් ලේඛන වේතොත් ඒ ලේඛන ද සමග) එය ඉදිරිපත් කරනු ලැබූ අධිකරණයෙන් ද, ලේඛනමය සාක්ෂි නොවන ඉදිරිපත් කරන ලද යම් දෙයක් රෙජිස්ට්‍රාර්වරයාගෙන් ද කැඳවීම, නඩුව තමා විසින් නිසි පරිදි සලකා බැලීම සඳහා අවශ්‍ය යයි නීතිපතිවරයාගේ මතය වන්නේ නම්, ඔහු විසින් එසේ කැඳවීම නීත්‍යනුකූල විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කැඳවනු ලැබූ යම් නඩු වාර්තාවක් හෝ ඉදිරිපත් කරන ලද දෙයක් නීතිපතිවරයා වෙත යැවීම මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යය විය යුතු ය.

ඉහළ අධිකරණයකට තැබීම නිෂ්ප්‍රභ කොට මහෙස්ත්‍රාත්වරයාට උපදෙස් නිකුත් කිරීමට නීතිපතිවරයාට ඇති බලය.

**396.** 159 වන වගන්තිය යටතේ යවන ලද, පරීක්ෂණයක නඩු වාර්තාවෙහි සහතික පිටපත තමාට ලැබීමෙන් පසුව, නඩු විභාගය ඉහළ අධිකරණයට තැබීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි නොමැති බව නීතිපතිවරයාගේ මතය වුවහොත් හෝ, පැමිණිල්ලේ, තොරතුරු හෝ චෝදනාවේ කාරණාවලින් ද චූදිතයා අත් අඩංගුවෙහි සිටී නම් තව දුරටත් රඳවා තබා ගැනීමෙන් ද යම් හේතුවක් නිසා චූදිතයා නිදහස් කළ යුතු බව නීතිපතිවරයාගේ

මතය වුවහොත්, ඔහු විසින් ලියවිල්ලකින් වූ නියමයක් කිරීමෙන් මහෙස්ත්‍රාත්වරයා විසින් කරන ලද ඉහළ අධිකරණයට භාරදීම නිෂ්ප්‍රභ කරනු ලැබිය හැකි අතර, පරීක්ෂණයේ නඩු වාර්තාව ආපසු මහෙස්ත්‍රාත් අධිකරණය වෙත යවන ලෙස මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත විධාන කළ හැකි ය. එවැනි සෑම අවස්ථාවක දී ම, චූදිතයාට විරුද්ධව වූ පැමිණිල්ල, තොරතුරු හෝ චෝදනාව අසා නිම කිරීම සම්බන්ධයෙන් යෝග්‍ය යයි තමාට පෙනී යන විධාන නීතිපතිවරයා විසින් මහෙස්ත්‍රාත්වරයා වෙත නිකුත් කළ යුතු අතර, එසේ නිකුත් කරන ලද විධානවලට අනුකූලව ක්‍රියා කිරීම මහෙස්ත්‍රාත්වරයාගේ කාර්යය විය යුතු ය.

වැඩිදුරටත් සාක්ෂි විභාග කරන ලෙස නීතිපතිවරයා විසින් නියම කළ හැකි බව.

**397.** (1) චූදිතයාට විරුද්ධව වූ නඩු කටයුතුවලින් සාපරාධ වරදක් අනාවරණය වී ඇති නමුත් එවකටත් ලබා ගෙන ඇති සාක්ෂි යම් විස්තරයක් හෝ කරුණක් සම්බන්ධයෙන් දෝෂ සහිත වීමේ හේතුව නිසා, සම්පූර්ණ හා නිසි නඩු විභාගයක් සඳහා පදනමක් ඇති කර ගැනීම පිණිස ඒ සාක්ෂි ප්‍රමාණවත් නොවන බව නීතිපතිවරයාගේ මතය වේ නම් ඔහු විසින් ලියවිල්ලකින් නියමයක් කිරීමෙන්, ඒ නියමයෙහි සඳහන් කර ඇති හෝ පෙන්නුම් කර ඇති පරිදි, එවකටත් සාක්ෂි දී ඇති සාක්ෂිකරුවන්ගෙන් අලුතින් සාක්ෂි විභාග කිරීම් වශයෙන් හෝ පරීක්ෂණය දිගටම පවත්වා ගෙන යාම වශයෙන් හෝ ඒ සාක්ෂිකරුවන්ගෙන් වැඩිපුර සාක්ෂි සටහන් කර ගන්නා ලෙස මහෙස්ත්‍රාත් අධිකරණයට නියම කරනු ලැබිය හැකි ය. එවැනි නියමයක් කරනු ලැබූ විට පරීක්ෂණයේ නඩු වාර්තාව මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ආපසු යවන ලෙස නීතිපතිවරයා විසින් විධාන කළ හැකි ය.ඉන් ඉක්බිතිව මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් නඩු වාර්තාව එසේ ආපසු යැවිය යුතු අතර, නීතිපතිවරයාගේ නියමයට අනුව මහෙස්ත්‍රාත්වරයා ක්‍රියා කළ යුතු ය.

(2) යම් විශේෂඥ සාක්ෂිකරුවකුගේ හෝ පොලිස් නිලධරයකුගේ සාක්ෂි සටහන් කර ගන්නා ලෙස විධාන කිරීම අවශ්‍ය යයි නීතිපතිවරයා කල්පනා කරන්නේ නම් ඔහු විසින් මහෙස්ත්‍රාත්වරයාට එසේ විධාන කළ හැකි අතර එවිට මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ විධානය අනුව ක්‍රියා කළ යුතු ය.

(3) අතිරේක පරීක්ෂණය, මුල් පරීක්ෂණය පැවැත් වූ මහෙස්ත්‍රාත්වරයා නොවන ඒ අධිකරණයේ වෙනත් මහෙස්ත්‍රාත්වරයකු විසින් ඒ මහෙස්ත්‍රාත් අධිකරණයේ දී පවත්වනු ලැබිය හැකි ය.

නියම කරනු ලැබූ විට නඩු කටයුතු වාර්තා මහාධිකරණ විනිශ්චයකාරවරයා සහ මහෙස්ත්‍රාත්වරයා විසින් නීතිපතිවරයා වෙත යැවිය යුතු බව.

**398.** (1) නීතිපතිවරයා විසින් ලියවිල්ලකින් නියම කරනු ලබන කවර හෝ විටක, මහාධිකරණ විනිශ්චයකාරවරයකු සහ මහෙස්ත්‍රාත්වරයකු විසින්, තමා ඉදිරියේ පරීක්ෂණයක් හෝ නඩු විභාගයක් පැවැත්වුණු හෝ පැවැත්වෙන්නා වූ යම් අපරාධ නඩුවක නඩු කටයුතු වාර්තා නීතිපතිවරයා වෙත නොපමාව යැවිය යුතු අතර එවිට ඒ පරීක්ෂණය හෝ නඩු විභාගය අඩාළ ව කල් තබනු ලැබූ විට මෙන් ඒ ආකාරයෙන් ම හා ඊට සමාන ආකාරයෙන් ඒ පරීක්ෂණය හෝ නඩු විභාගය අත් හිටුවනු ලැබිය යුතු ය:

එසේ වුව ද ඒ නඩු වාර්තාව තමාට ලැබී මාස දෙකක් පසු වීමට පෙර නීතිපතිවරයා විසින් එය ඒ අධිකරණය වෙත ආපසු යැවිය යුතු ය.

(2) මේ වගන්තියේ විධිවිධාන යටතේ යම් නඩුවක නඩු කටයුතු වාර්තා මහෙස්ත්‍රාත්වරයකු විසින් තමා වෙත එවනු ලැබූ විටක, ඒ නඩු කටයුතු වාර්තාවට අදාළ පරීක්ෂණය සම්බන්ධයෙන් තමා අවශ්‍ය යයි සලකන උපදෙස් දීමේ බලය නීතිපතිවරයාට තිබිය යුතු ය. ඉන් ඉක්බිතිව මේ සංග්‍රහයේ විධිවිධානවලට යටත් ව නීතිපතිවරයාගේ උපදෙස් ක්‍රියාත්මක කිරීම ද ඒ උපදෙස්වල නියමයන් ට අනුකූලව ඒ පරීක්ෂණය පවත්වා අවසාන කිරීම ද මහෙස්ත්‍රාත්වරයාගේ කාර්ය විය යුතු ය:

චූදිතයකු නිදහස් නොකළ යුතු ව තිබුණු බව සිය මතය වන විට නීතිපතිවරයා විසින් නඩුව ඉහළ අධිකරණයට තබන ලෙස හෝ අලුතින් පරීක්ෂණයක් පවත්වන ලෙස නියම කළ හැකි බව

**399.** 153 වන වගන්තියේ විධිවිධාන යටතේ මහෙස්ත්‍රාත්වරයකු විසින් චූදිතයකු නිදහස් කරනු ලැබ ඇත්තා වූ ද ඒ චූදිතයා නිදහස් නොකළ යුතුව තිබුණු බව නීතිපතිවරයාගේ මතය වන්නා වූ ද කවර හෝ විටක, ඒ චූදිතයාගේ නඩු විභාගය මහාධිකරණයට තබන ලෙස නීතිපතිවරයා විසින් මහෙස්ත්‍රාත්වරයාට විධාන කරනු ලැබිය හැකි ය; නැතහොත් ඒ මහෙස්ත්‍රාත් අධිකරණයේ මහෙස්ත්‍රාත්වරයකුට පරීක්ෂණය නැවත ආරම්භ කරන ලෙස නියම කර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය යයි ඔහුට පෙනී යන උපදෙස් දිය හැකි ය. ඉන් ඉක්බිතිව ඒ උපදෙස් ක්‍රියාත්මක කිරීම ඒ මහෙස්ත්‍රාත්වරයාගේ කාර්යය විය යුතු ය.

මහෙස්ත්‍රාත්වරයා ඉදිරියෙහි අපරාධ චෝදනාව මෙහෙයවිය හැක්කේ කවරකු විසින් ද යන වග.

**400** (1) නීතිපතිවරයා, රජයේ නීතිඥවරයකු හෝ නීතිපතිවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙනු ලැබූ උත්තරවාදියකු නොවන තැනැත්තකු විසින්, මහෙස්ත්‍රාත් අධිකරණයක මහෙස්ත්‍රාත්වරයකු විසින් පරීක්ෂණයක් පවත්වනු ලබන යම් නඩුවක දී අපරාධ චෝදනාව මෙහෙයවනු නොලැබිය යුතු ය.

(2) නීතිපතිවරයා, නියෝජ්‍ය නීතිපතිවරයා, රජයේ නීතිඥවරයකු සහ නීතිපතිවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙනු ලැබූ උත්තරවාදියකු නොමැති විට මහෙස්ත්‍රාත්වරයා විසින් අපරාධ චෝදනාව මෙහෙයවනු ලැබිය යුතු ය; එහෙත් අවශ්‍ය යයි මහෙස්ත්‍රාත්වරයා සලකතහොත් යම් පරීක්ෂණයක් පැවැත්වීමේ දී යම් උත්තරවාදියකුගේ හෝ රජයේ නිලධරයකුගේ සහාය ලබා ගැනීමෙන් මේ වගන්තියෙහි වූ කිසිවක් නිසා මහෙස්ත්‍රාත්වරයා වළක්වනු නොලැබිය යුතු ය.

නියෝජ්‍ය නීතිපතිවරයාගේ සහ රජයේ නීතිඥවරයාගේ කටයුතුවල විෂය ප්‍රමාණය.

**401.** අධිචෝදනා නිවර්තනයක් සටහන් කිරීමේ සහ අප සහායකයකුට සමාව දීමේ හෝ නිදොස් කිරීමකට විරුද්ධව වූ අභියාචනයකට අනුමතය දීමේ බලතල හැර, මේ සංග්‍රහයෙන් නීතිපතිවරයා වෙත පවරා ඇති බලතල සියල්ලම හෝ ඉන් කිසිවක් ක්‍රියාත්මක කිරීම ද නියම කර ඇති කාර්ය සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටු කිරීම ද, නීතිපතිවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධාන අනුව, නියෝජ්‍ය නීතිපතිවරයා සහ රජයේ නීතිඥවරයකු විසින් කළ හැකි ය.

## XXXIV වන පරිච්ඡේදය

## ඇප

ඇප දිය හැකි වැරදි සම්බන්ධයෙන් ඇප ගත යුතු බව.

1997/30

**402.** ඇප දිය නොහැකි වරදකට චෝදනා ලැබූ තැනැත්තකු නොවන යම් තැනැත්තකු අධිකරණයක් ඉදිරියට පැමිණ පෙනී සිටින්නා වූ හෝ පමුණුවනු ලැබ සිටින්නා වූ ද ඒ අධිකරණය ඉදිරියෙහි වූ නඩු කටයුතුවල කවර හෝ අවධියක දී ඇප දීමට ඔහු ඕනෑම වේලාවක සූදානම්ව සිටින්නා වූ ද අවස්ථාවක ඒ තැනැත්තා ඇප පිට මුදා හැරිය යුතු ය:

එසේ වුවද සුදුසු යයි අධිකරණය කල්පනා කරන්නේ නම්, ඒ තැනැත්තාගෙන් ඇප ගැනීම වෙනුවට මෙහි මින් මතු විධිවිධාන

සලසා ඇති පරිදි ඔහුගේ පැමිණ පෙනී සිටීම සඳහා ඇපකරුවන් නොමැතිව බැඳුම්කරයක් ඔහු අත්සන් කර දුන් විට ඔහු නිදහස් කරනු ලැබිය හැකි ය.

ඇප දිය නොහැකි වැරදි සම්බන්ධයෙන් ඇප ගත හැක්කේ කිනම් අවස්ථාවල දී ද යන වග.
[1993 අංක 4 § 2]

**403.** (1) ඇප දිය නොහැකි යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබූ යම් තැනැත්තකු, අවස්ථාවෝචිත පරිදි, යම් පරීක්ෂණයක හෝ නඩු විභාගයක යම් අවධියක දී, මහෙස්ත්‍රාත්වරයකු හෝ මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් ස්වකීය අභිමතය පරිදි ඇප පිට මුදා හරිනු ලැබිය හැකි ය.

එසේ වුවද, දණ්ඩ නීති සංග්‍රහයේ 114 වන, 191 වන සහ 296 වන වගන්ති යටතේ දඬුවම් කරනු ලැබිය හැකි වරදක් යම් තැනැත්තකු විසින් සිදු කර ඇතැයි කියනු ලබන්නේ නම්, හෝ සිදු කිරීමෙහිලා ඔහු සම්බන්ධ වූයේ යයි කියනු ලබන්නේ නම්, නැතහොත්, සිදු කර ඇති බවට සැක කරනු ලබන්නේ නම්, හෝ සිදු කිරීමෙහිලා සම්බන්ධ වූ බවට සැක කරනු ලබන්නේ නම්, මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් හැර, යම් පරීක්ෂණයක හෝ නඩු විභාගයක යම් අවධියක දී ඔහු මුදා හරිනු නොලැබිය යුතු ය.

(2) ඇප දිය නොහැකි වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ ඇති යම් තැනැත්තකු ඒ වරද සිදු කළ බව විශ්වාස කිරීමට සාධාරණ හේතු නොමැති නමුත් වැඩිදුර පරීක්ෂණ හෝ නඩු විභාග කිරීමට ප්‍රමාණවත් හේතු ඇති බව, අවස්ථාවෝචිත පරිදි, පරීක්ෂණයේ හෝ නඩු විභාගයේ කවර හෝ අවධියක දී අධිකරණයට පෙනී ගිය හොත් මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි ඔහු පෙනී සිටින බවට වූ කොන්දේසිය පිට ඒ අධිකරණය විසින් විධාන කරනු ලබන යම් මුදලකට හා එසේ විධාන කරන ලද පරිදි ඇප කරුවකු හෝ ඇපකරුවන් ඇතිව හෝ නැතිව බැඳුම් ඔප්පුවක් ලියා අත්සන් කර දුන් විට ඒ පරීක්ෂණය පවත්වනු ලබන තෙක් අධිකරණය විසින් චූදිතයා මුදා හරිනු ලැබිය යුතු ය.

[1993 අංක 4 § 2]

(3) (1) වන උපවගන්තියෙහි සඳහන්, දණ්ඩ නීති සංග්‍රහයේ වගන්ති අතුරින් කවර හෝ වගන්තියක් යටතේ යම් ඇප දිය නොහැකි වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව වූ

නඩු විභාගය මහෙස්ත්‍රාත්වරයකු විසින් ඉහළ අධිකරණයට තබා ඇති අවස්ථාවක මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් හැර, ඒ තැනැත්තා ඇප පිට මුදා හරිනු නොලැබිය යුතු ය. දණ්ඩ නීති සංග්‍රහය යටතේ වූ වෙනත් යම් ඇප දිය නොහැකි වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව ඒ නඩු විභාගය මහෙස්ත්‍රාත්වරයා විසින් ඉහළ අධිකරණයට තබනු ලැබූ අවස්ථාවක ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ස්වකීය අභිමතය පරිදි ඒ තැනැත්තා ඇප පිට මුදා හරිනු ලැබිය හැකි ය.

ඇපය අධික නොවිය යුතු බව සහ ඕනෑම අවස්ථාවක දී අභියාචනාධිකරණය විසින් ඇප පිට නිදහස් කරනු ලැබිය හැකි බව.

**404.** මේ පරිච්ඡේදය යටතේ අත්සන් කරනු ලබන සෑම බැඳුම්කරයක ම මුදල නඩුවේ අවස්ථාගත කරුණු ගැන නිසි සැලකිල්ල ඇතිව නියම කරනු ලැබිය යුතු අතර එය අධික නොවිය යුතු ය. තවද මේ සංග්‍රහයෙහි හෝ වෙනත්, යම් නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද අත් අඩංගුවේ සිටින යම් තැනැත්තකු ඇප පිට නිදහස් කරන ලෙස හෝ, මහාධිකරණය විසින් හෝ මහෙස්ත්‍රාත්වරයකු විසින් හෝ නියම කරන ලද ඇප මුදල අඩු හෝ වැඩි කරන ලෙස හෝ මහාධිකරණ විනිශ්චයකාරවරයකු විසින් හෝ මහෙස්ත්‍රාත්වරයකු විසින් ඇප පිට මුදා හරින ලද යම් තැනැත්තකු අත් අඩංගුවේ රිමාන්ඩ්භාරයේ තබන ලෙස හෝ ඕනෑම අවස්ථාවක දී අභියාචනාධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි ය.

චූදිතයාගේ සහ ඇපකරුවන්ගේ බැඳුම්කරය.

**405.** (1) යම් තැනැත්තකු ඇප පිට හෝ ඔහුගේ ම බැඳුම්කරයක් පිට මුදා හරිනු ලැබීමට පෙර, ප්‍රමාණවත් යයි, අවස්ථාවෝචිත පරිදි, නිලධරයා හෝ අධිකරණය කල්පනා කරන යම් මුදලක් සඳහා බැඳුම්කරයක් ඒ තැනැත්තා විසින් අත්සන් කළ යුතු ය. ඔහු ප්‍රමාණවත් ඇපකරුවන් එක්කෙනකු හෝ ඊට වැඩි ගණනකගේ ඇපය පිට මුදාහරිනු ලැබූ විට, බැඳුම්කරයේ සඳහන් වේලාවේ දී සහ ස්ථානයේ දී පැමිණ සිටිය යුතු බවත් අන්‍යාකාරයෙන් විධාන කරනු ලබන තුරු ඔහු එසේ දිගට ම පැමිණ සිටිය යුතු බවත් ඒ බැඳුම්කරයේ කොන්දේසි විය යුතු ය.

(2) නඩුව සම්බන්ධයෙන් අවශ්‍ය වුවහොත් චෝදනාවට පිළිතුරු දීම සඳහා මහාධිකරණයෙහි හෝ වෙනත් යම් අධිකරණයක දී පෙනී සිටින ලෙස නියම කරනු ලැබූ විට එසේ පෙනී සිටීමටත් නඩු විභාගය කල් තබන හෝ අධාළ ව කල්

තබන සෑම දිනයක දී ම නොකඩව පෙනී සිටීමටත් ඇප පිට මුදා හරින ලද තැනැත්තා බැඳුම්කරයෙන් බැඳවා තැබීම ද කරනු ලැබිය හැකි ය.

අත් අඩංගුවෙන් නිදහස් කිරීම.

**406.** (1) බැඳුම්කරය ලියා අත්සන් කරනු ලැබූ වහාම එය අත්සන් කරනු ලැබුයේ යම් තැනැත්තකුගේ පෙනී සිටීම සඳහා ද ඒ තැනැත්තා මුදා හරිනු ලැබිය යුතු ය. තවද ඔහු බන්ධනාගාරයෙහි සිටින අවස්ථාවක ඇප පිට ඔහු නිදහස් කරන අධිකරණය විසින් බන්ධනාගාරය භාර නිලධරයා වෙත මුදා හැරීමේ ආඥාවක් නිකුත් කළ යුතු අතර, ඒ ආඥාව ලැබුණු විට ඒ නිලධරයා විසින් ඔහු මුදා හරිනු ලැබිය යුතු ය.

(2) බැඳුම්කරය ලියා අත්සන් කරන ලද්දේ යම් කාරණයක් සඳහා ද ඒ කාරණය නොවන වෙනත් කාරණයක් සඳහා රඳවා තැබීමට යටත් යම් තැනැත්තකු මේ වගන්තියෙහි, 402 වන වගන්තියෙහි හෝ 403 වන වගන්තියෙහි සඳහන් කිසිවක් නිසා මුදා හැරීම අවශ්‍ය කෙරෙතැයි සලකනු නොලැබිය යුතු ය.

මුලින් ගත් ඇපය ප්‍රමාණවත් නොවන විට ප්‍රමාණවත් ඇපයක් සඳහා ආඥා කිරීමට ඇති බලය.

**407.** වැරදීමක් නිසා, වංචාවක් නිසා හෝ වෙනත් හේතුවක් නිසා ප්‍රමාණවත් නොවන ඇපකරුවන් පිළිගෙන ඇත්නම් හෝ පසුව ඔවුන් ප්‍රමාණවත් නොවන බවට පත් වුවහොත්, ඇප පිට මුදා හරින ලද තැනැත්තා අධිකරණය ඉදිරියට ගෙන එන ලෙස විධාන කරමින්, සිර භාරයට ගැනීමේ වරෙන්තුවක් අධිකරණය විසින් නිකුත් කළ හැකි ය. එවිට ප්‍රමාණවත් ඇපකරුවන් සොයා ගන්නා ලෙස ඔහුට ආඥා කිරීම ද ප්‍රමාණවත් ඇපකරුවන් සොයා ගැනීම ඔහු විසින් පැහැර හරිනු ලැබීමේ දී ඔහු බන්ධනාගාරයට නියම කිරීම ද අධිකරණය විසින් කළ හැකි ය.

ඇපකරුවන් නිදහස් කිරීම.

**408.** (1) ඇප පිට මුදා හරිනු ලැබූ තැනැත්තකුගේ පැමිණීම සහ පෙනී සිටීම සඳහා ඇප වූ ඇපකරුවන් සියලු දෙනාම හෝ ඔවුන්ගෙන් කිසිවකු හෝ විසින් බැඳුම්කරය සම්පූර්ණයෙන් ම නිදහස් කරන ලෙස නැතහොත් එය තම තමන්ට අදාළ වන තාක් දුරට බැඳුම්කරයෙන් තම තමන් නිදහස් කරන ලෙස ඕනෑම අවස්ථාවක දී අධිකරණයෙන් ඉල්ලා සිටිය හැකි ය.

(2) එවැනි ඉල්ලීමක් කරනු ලැබීමේ දී, මුදා හරින ලද තැනැත්තා අධිකරණය ඉදිරියට ගෙනෙන ලෙස විධාන කරමින් සිර භාරයට ගැනීමේ වරෙන්තුවක් අධිකරණය විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) ඒ තැනැත්තා වරෙන්තුව ප්‍රකාර හෝ සිය කැමැත්තෙන් ම භාර වීමෙන් හෝ පෙනී සිටි කල්හි ඒ බැඳුම්කරය සම්පූර්ණයෙන් ම හෝ එය ඉල්ලුම්කරුවන්ට අදාළ වනතාක් දුරට හෝ නිදහස් කරන ලෙසට අධිකරණය විසින් විධාන කළ යුතු අතර ප්‍රමාණවත් ඇපකරුවන් සොයා ගන්නා ලෙස ඒ තැනැත්තාට නියම කළ යුතු ය. තවද එසේ ප්‍රමාණවත් ඇපකරුවන් සොයා ගැනීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත් ඔහු අත් අඩංගුවේ තබන ලෙස නියම කළ හැකි ය.

(4) ඇපකරුවකු ඇප වූයේ යම් තැනැත්තකුගේ පැමිණීම සහ පෙනී සිටීම සඳහා ද ඒ තැනැත්තා පැන ගොස් සැඟවී සිටින අවස්ථාවක ඒ ඇපකරු විසින් ඕනෑම වේලාවක ඒ තැනැත්තා සිර භාරයට ගෙන අධිකරණය ඉදිරියට වහාම ගෙන යා හැකි අතර එවිට අධිකරණය විසින් ඒ ඇපකරුගේ බැඳුම්කරය නිදහස් කර වෙනත් ප්‍රමාණවත් ඇපකරුවකු සොයා ගන්නා ලෙස ඒ තැනැත්තාට නියම කළ යුතු ය. එසේ ප්‍රමාණවත් ඇපකරුවන් සොයා ගැනීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත් ඔහු අත්අඩංගුවේ තබන ලෙස නියම කළ යුතු ය.

(5) ඇපකරු ඇප නියම කරනු ලබන තැනැත්තන් සඳහා සිරිතක් වශයෙන් ඇපකරු ලෙස පෙනී සිටින තැනැත්තකු බවට ද තමා නිදහස් කර ගැනීම සඳහා වූ ඉල්ලීමට ප්‍රමාණවත් හේතුවක් ඔහුට නොමැති බවට ද අධිකරණය සෑහීමකට පත් වන්නේ නම් අධිකරණය විසින් ඒ ඇපකරුට රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන දඩයක් නියම කිරීම ද එය ගෙවීම පැහැර හැරීමේ දී ඔහු මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම ද නීත්‍යනුකූල විය යුතු ය.

## XXXV වන පරිච්ඡේදය
## සාක්ෂිකරුවන් විභාග කිරීම සඳහා අධිකාර

**409.** මේ සංග්‍රහය යටතේ පවත්වනු ලබන පරීක්ෂණයක දී, නඩු විභාගයක දී හෝ වෙනත් නඩු කටයුත්තක දී සාක්ෂිකරුවකු විභාග කිරීම යුක්තියේ පරමාර්ථ සඳහා අවශ්‍ය නමුත් නඩුවේ අවස්ථාගත කරුණු යටතේ අසාධාරණ වන ප්‍රමාණයක ප්‍රමාදයකින්, වියදමකින් හෝ අපහසුවකින් තොරව ඔහුගේ පැමිණ සිටීම සලසාගත නොහැකි යයි අධිකරණයට පෙනී යන කවර

පැමිණ නැති සාක්ෂිකරුගේ සාක්ෂි ලබා ගැනීමට අධිකරණය විසින් අධිකාරයක් නිකුත් කළ හැකි බව.

අවස්ථාවක වුවද ඒ අධිකරණය විසින් ඒ පැමිණ සිටීම සලස්වා ගැනීම සිදු නොකර, පාර්ශ්වකරුවන් වෙත දැනුම් දීමෙන් පසුව, ඒ සාක්ෂිකරු පදිංචිව සිටින්නේ යම් සමාන හෝ පහල අධිකරණයක අධිකරණ බල සීමාව ඇතුළත ද ඒ අධිකරණය වෙත ඔහුගේ සාක්ෂි ගන්නා ලෙසට අධිකාරයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

අධිකාරය පිළිබඳ කාර්ය පටිපාටිය.

**410.** (1)අධිකාරය නිකුත් කරනු ලැබුවේ යම් අධිකරණයක් වෙත ද ඒ අධිකරණය විසින් අධිකාරය ලැබුණ විට ඒ අධිකාරයෙහි නම සඳහන් සාක්ෂිකරු ඒ අධිකරණය ඉදිරිපිට කැඳවනු ලැබිය යුතු ය; නැතහොත් රෝගාතුර වීමක් හෝ වෙනත් හේතුවක් නිසා පැමිණ සිටීම සාධාරණ ලෙස සලසා ගැනීමට නොහැකි නම් විනිශ්චයකාරවරයා සාක්ෂිකරු සිටින ස්ථානයට යා යුතු ය.

(2) මේ සංග්‍රහය යටතේ පරීක්ෂණයක් පවත්වන මහෙස්ත්‍රාත්වරයකු සාක්ෂි ලබාගන්නා ආකාරයට ම විනිශ්චයකාරවරයා විසින් සාක්ෂිකරුගේ සාක්ෂි ලබාගත යුතු අතර මේ සංග්‍රහය යටතේ පරීක්ෂණය පවත්වන මහෙස්ත්‍රාත්වරයකු ක්‍රියාත්මක කරන බලතලම ඒ විනිශ්චයකාරවරයා විසින් මේ කාර්යය සඳහා ක්‍රියාත්මක කළ හැකි ය.

පාර්ශ්වකරුවන් විසින් ප්‍රශ්නමාලා ඉදිරිපත් කළ හැකි බව සහ, චූදිතයා හෝ ඔහුගේ උත්තරවාදියා විසින් සාක්ෂිකරු විභාග කළ හැකි බව.

**411.** (1) මේ සංග්‍රහය යටතේ යම් අධිකාරයක් නිකුත් කරනු ලැබ ඇති නඩු කටයුත්තක පාර්ශ්වකරුවන් විසින්, විසඳිය යුතු කරුණට අදාළ යයි නඩු කටයුත්ත පැවති අධිකරණය විසින් කල්පනා කරනු ලබන්නා වූ ද ලියවිල්ලකින් වූ ද යම් ප්‍රශ්නමාලා පිළිවෙලින් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. තව ද පරීක්ෂණය කරන විනිශ්චයකාරවරයා විසින් ඒ ප්‍රශ්නමාලා මත සාක්ෂිකරු විභාග කරනු ලැබිය යුතු ය.

(2) ඒ විනිශ්චයකාරවරයා ඉදිරියෙහි උත්තරවාදියකු මගින් හෝ තමා අත්අඩංගුවේ නොසිටී නම් පුද්ගලිකව හෝ පෙනී සිට චූදිතයා විසින් එකී සාක්ෂිකරුගෙන් අවස්ථාවෝචිත පරිදි ප්‍රශ්න කිරීම, හරස් ප්‍රශ්න ඇසීම සහ නැවත ප්‍රශ්න කිරීම කළ හැකි ය.

අධිකාරය ආපසු යැවීම.

**412.** යම් අධිකාරයක් විධිමත් පරිදි ක්‍රියාත්මක කිරීමෙන් පසුව එය යටතේ විභාග කරනු ලැබූ සාක්ෂිකරුගේ දිවුරුම් සාක්ෂි ද සමග එම අධිකාරය, එය නිකුත් කළ අධිකරණය වෙත

ආපසු යැවිය යුතු ය. තව ද එම අධිකාරය, ඒ පිළිබඳ වාර්තාව සහ දිවුරුම් සාක්ෂි පාර්ශ්වකරුවන් විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා සෑම සාධාරණ වේලාවක දී ම ලබාගත හැකි විය යුතු ය. තවද එම දිවුරුම් සාක්ෂි පාර්ශ්වකරුවන් දෙදෙනාගෙන් කවර හෝ පාර්ශ්වකරුවකු විසින් සියලු යුක්තිසහගත ව්‍යතිරේකවලට යටත්ව නඩුවේ දී සාක්ෂි වශයෙන් කියා සිටිය හැකි අතර ඒවා වාර්තාවෙහි ද කොටසක් විය යුතු ය.

පරීක්ෂණය හෝ නඩු විභාගය අඩාළව කල් තැබීම.

**413**. 409 වන වගන්තිය යටතේ අධිකාරයක් නිකුත් කරනු ලැබූ සෑම අවස්ථාවක දී ම, අධිකාරය ක්‍රියාත්මක කර ආපසු එවීම සඳහා සාධාරණ ලෙස ප්‍රමාණවත් වන නිශ්චිත කාලයකට පරීක්ෂණය, නඩු විභාගය හෝ වෙනත් නඩු කටයුත්ත අඩාළව කල් තැබිය හැකි ය.

## XXXVI වන පරිච්ඡේදය

## සාක්ෂිවලට අදාළ විශේෂ විධිවිධාන

ඇතැම් අවස්ථාවල දී වෛද්‍ය සහ වෙනත් විශේෂඥ සාක්ෂිකරුවන්ගේ දිවුරුම් සාක්ෂි සහ ආණ්ඩුවේ රස පරීක්ෂකගේ හෝ ආණ්ඩුවේ විකිරණවේදීන්ගේ වාර්තා සාක්ෂි වශයෙන් පිළිගත හැකි බව.

**414.*** (1) පරීක්ෂා කර හෝ විශ්ලේෂණය කර වාර්තා කිරීම පිණිස තමා වෙත යථා පරිදි ඉදිරිපත් කරන ලද යම් තැනැත්තකු, යම් ද්‍රව්‍යයක් හෝ යම් දෙයක් පිළිබඳව ආණ්ඩුවේ රස පරීක්ෂකවරයාගේ, සැක සහිත ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂකවරයාගේ, ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර්වරයාගේ, මෝටර් වාහන පරීක්ෂකවරයාගේ හෝ ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකුගේ අත්සන යටතේ නිකුත් කරන ලද වාර්තාවක් බවට අදහස් කරනු ලබන යම් ලේඛනයක් හෝ ආණ්ඩුවේ විකිරණවේදියකු විසින් පිළියෙල කරන ලද්දක් බවට අදහස් කරනු ලබන ස්ක්‍රියා ප්‍රස්ථාරයක් මත පදනම් වූ ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකුගේ වාර්තාවක් හෝ එම ස්ක්‍රියා ප්‍රස්ථාරය ම සහ එම ස්ක්‍රියා ප්‍රස්ථාරය සම්බන්ධයෙන් එම විකිරණවේදියාගේ අත්සන යටතේ වූ වාර්තාවක් බවට අදහස් කරනු ලබන යම් ලේඛනයක්, එම නිලධරයාගේ සාක්ෂිකරුවකු ලෙස කැඳවනු නොලැබුව ද, මේ සංග්‍රහය යටතේ වූ යම් පරීක්ෂණයක දී, නඩු විභාගයක දී හෝ වෙනත් නඩු කටයුත්තක දී සාක්ෂි වශයෙන් භාවිත කරනු ලැබිය හැකි ය:

* 1991.11.28 වන දින සිට ක්‍රියාත්මක වේ. 1991.9.5 වන අංක 678 /14 අති විශේෂ ගැසට් පත්‍රය බලන්න.

එසේ වුවද එලෙසින් පරීක්ෂණයට හෝ විශ්ලේෂණයට භාජනය කොට වාර්තා කරනු ලැබූ තැනැත්තාගේ, ද්‍රව්‍යයේ හෝ දෙයෙහි අනන්‍යතාව ඔප්පු කිරීමේ අවශ්‍යතාව සොරෙහි මේ වගන්තියේ සඳහන් කිසිවක් බල නොපෑ යුතු ය.

(2) මහෙස්ත්‍රාත්වරයකු හෝ සමාදාන විනිශ්චයකාරවරයකු විසින් පවත්වන ලද හඳුනා ගැනීමේ පෙරෙට්ටුවක් පිළිබඳ දිවුරුම් සාක්ෂි ද (නැතහොත් එහි සටහන් ද) පෙරෙට්ටුව පැවැත්වීමට මහෙස්ත්‍රාත්වරයාට හෝ සමාදාන විනිශ්චයකාරවරයාට සහාය වූ සාක්ෂිකරුවන්ගේ දිවුරුම් සාක්ෂි ද නැතහොත් ඔවුන්ගේ දිවුරුම් ප්‍රකාශ ද, එකී සිද්ධි ප්‍රකාශයන් හෝ මහෙස්ත්‍රාත්වරයා හෝ සමාදාන විනිශ්චයකාරවරයා හෝ සාක්ෂිකරුවන්, සාක්ෂිකරුවන් ලෙස සාක්ෂි දීමට කැඳවනු නොලැබුව ද, මේ සංග්‍රහය යටතේ යම් පරීක්ෂණයක දී, නඩු විභාගයක දී හෝ නඩු කටයුත්තක දී සාක්ෂියේ දී ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකු නොවන වෛද්‍ය සාක්ෂිකරුවකු විසින් සාදනු ලැබ සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී සහතික කරන ලද වාර්තාවක්, ඒ තැනැත්තා සාක්ෂිකරුවකු ලෙස කැඳවනු නොලැබුව ද, සාක්ෂියේ දී ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(4) වරදක් සිදු කිරීමෙහිලා පාවිච්චි කරන ලද හෝ පරීක්ෂණය හෝ විශ්ලේෂණය සහ වාර්තා කිරීම පිණිස යම් රජයේ නිලධරයකු වෙත ඉදිරිපත් කරන ලද යම් ද්‍රව්‍යයක් හෝ දෙයක් භාරයෙහි තබා ගැනීම හෝ එය බැහැර කිරීම හෝ තමා විසින් සාදන ලද පිඹුරක හෝ මිනුමක හෝ කටු සටහනක නිරවද්‍යතාව පිළිබඳ හෝ යම් සාක්ෂිකරුවකු විසින් කරනු ලැබ සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරියෙහි සහතික කරනු ලැබූ වාර්තාව ඒ තැනැත්තා සාක්ෂිකරුවකු ලෙස කැඳවනු නොලැබුව ද සාක්ෂියේ දී ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(5) මිය ගිය තැනැත්තකු විසින් කරන ලද යම් ප්‍රකාශයක් ඔප්පු කිරීමේ කාර්යය සඳහා, එම ප්‍රකාශය සටහන් කර ගනු ලැබුවේ යම් මහෙස්ත්‍රාත්වරයකු විසින් ද ඔහුගේ සහ යම් තැනැත්තකු විසින් එය භාෂණ පරිවර්තනය කරනු ලැබුවේ නම් එම තැනැත්තාගේ ද වාර්තාව ඒ තැනැත්තන් සාක්ෂිකරුවන් ලෙස කැඳවනු නොලැබුව ද සාක්ෂියේ දී ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

*(5ඇ) (1) වන උපවගන්තියේ සඳහන් රජයේ නිලධරයකු නොවන යම් රජයේ නිලධරයකුගේ ධුරයට අයත් යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී එම රජයේ නිලධරයා විසින් කරන ලද යම් ක්‍රියාවකට අදාළ වූ ද, දිවුරුම් පත්‍රයකින් සත්‍යායනය කරනු ලැබුවා වූ ද, එම රජයේ නිලධරයාගේ ලිඛිත ප්‍රකාශය, මේ සංග්‍රහය යටතේ වූ යම් පරීක්ෂණයක දී, නඩු විභාගයක දී හෝ වෙනත් නඩු කටයුත්තක දී, එම නිලධරයා සාක්ෂිකරුවකු ලෙස කැඳවනු නොලැබුව ද, සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. [1988 අංක 11 § 6]

(6) යම් ලේඛනයක තිබෙන අත්සන අව්‍යාජ බවත් එය අත්සන් තබන අවස්ථාවේ දී එය අත්සන් කරන ලද තැනැත්තා විසින් දරන ලදැයි කියන ධුරය එම තැනැත්තා විසින් දරන ලද බවත් අධිකරණය විසින් පූර්ව නිගමනය කළ හැකි ය:

* එසේ වුව ද ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයා හෝ වෙනත් වෛද්‍ය සාක්ෂිකරුවකු හෝ ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා හෝ සැක සහිත ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂකවරයා හෝ ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර්වරයා හෝ මෝටර් වාහන පරීක්ෂකවරයා හෝ ආණ්ඩුවේ විකරණවේදියා හෝ මහෙස්ත්‍රාත්වරයා හෝ සමාදාන විනිශ්චයකාරවරයා හෝ භාෂණ පරිවර්තකවරයා හෝ ඉහතින් ම වූ උපවගන්තිවල සඳහන් කර ඇති වෙනත් යම් සාක්ෂිකරුවකු හෝ එම දිවුරුම් සාක්ෂිය හෝ වාර්තාව අදාළවන යම් විශේෂ නඩු විභාගයක දී සාක්ෂි දීම සඳහා පැමිණිය යුතු බව යම් පාර්ශ්වකරුවකුගේ ඉල්ලීම මත හෝ අන්‍යාකාරයෙන් හෝ වාර්තා කරනු ලැබිය යුතු හේතු නිසා අවශ්‍යවන බව, යම් නඩුවක දී එම නඩුව විභාග කරන අධිකරණයේ මතය වන්නේ නම්, පැමිණිල්ලේ වෙනත් සාක්ෂිකරුවන් කැඳවූ ආකාරයට ම, සාක්ෂිදීමේ කාර්යය සඳහා ඒ නිලධරයන් ද සාක්ෂිකරුවන් වශයෙන් කැඳවනු ලැබිය යුතු ය. [1988 අංක 11 § 6]

දිවුරුම් පත්‍ර කවරකු ඉදිරියේ දිවුරවිය යුතු ද යන වග.

**415.** යම් දිවුරුම් පත්‍රයක් -

(අ) ශ්‍රී ලංකාවෙහි යම් සමාදාන විනිශ්චයකාරවරයකු හෝ විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී ;

(ආ) වෙනත් යම් ස්ථානයක විනිශ්චයකාරවරයකු හෝ මහෙස්ත්‍රාත්වරයකු හෝ සමාදාන විනිශ්චයකාරවරයකු

හෝ ඒ ස්ථානයෙහි දිවුරුවීමට සුදුසුකම් ලත් හෝ බලය දෙනු ලැබූ වෙනත් තැනැත්තකු ඉදිරිපිට දී නැතහොත් අධිකරණය විසින් සෑහේ යයි සලකනු ලබන වෙනත් යම් ආකාරයකින් , හෝ

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත දිවුරුම් ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු ඉදිරිපිට දී දිවුරා හෝ සහතික කර තිබේ නම් එය අපරාධ අධිකරණයක දී පාවිච්චි කළ හැකි ය.

චූදිතයා පැමිණ නොමැති අවස්ථාවක සාක්ෂි සටහන් කර ගැනීම.

**416.** චූදිතයකු පැන ගොස් සැඟවී සිටින බව හා ඔහු සිරභාරයට ගැනීමේ නුදුරු බලාපොරොත්තුවක් නොමැති බව ඔප්පු කළ හොත් පැමිණිලි කරනු ලැබූ වරද සම්බන්ධයෙන් චූදිතයාට විරුද්ධව නඩු විභාග කිරීමට හෝ 'චූදිතයාගේ නඩු විභාගය ඉහල අධිකරණයට පැවරීමට බලය ඇති අධිකරණය විසින් විත්තිකරු නොමැතිව ම, චෝදක පක්ෂය වෙනුවෙන් ඉදිරිපත් කොට ඇති සාක්ෂිකරුවන් කිසිවකු වෙතොත් ඔවුන් විභාග කොට ඔවුන්ගේ දිවුරුම් සාක්ෂි සටහන් කර ගත හැකි ය. දිවුරුම් සාක්ෂි දුන් සිද්ධි ප්‍රකාශක මිය ගොස් සිටිනහොත් හෝ සාක්ෂි දීමට නොහැකි තත්ත්වයක සිටින හොත් නැතහොත් නඩුවේ අවස්ථානුගත කරුණු අනුව අයුක්ති සහගත ප්‍රමාදයක්, වියදමක් හෝ අපහසුතාවක් නොමැතිව ඔහුගේ පැමිණ සිටීම සලසාගත නොහැකි වුවහොත් එවැනි යම් දිවුරුම් සාක්ෂියක් ඒ චූදිතයා සිර භාරයට ගනු ලැබූ විට ඔහුට චෝදනා නගා ඇති වරද පිළිබඳ පරීක්ෂණයේ දී හෝ නඩු විභාගයේ දී ඔහුට විරුද්ධව සාක්ෂියේ දී ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

ඇතැම් අවස්ථාවල දී මහෙස්ත්‍රාත්වරයාගේ සහ භාෂණ පරිවර්තකයන්ගේ දිවුරුම් සාක්ෂි සාක්ෂියේ දී භාර ගත හැකි බව.

**417.** මිය ගිය තැනැත්තකු විසින් කරන ලද යම් ප්‍රකාශයක් ඔප්පු කිරීමේ කාර්ය සඳහා, එම ප්‍රකාශය සටහන් කර ගනු ලැබුවේ යම් මහෙස්ත්‍රාත්වරයකු විසින් ද එම මහෙස්ත්‍රාත්වරයා සහ යම් තැනැත්තකු විසින් එය භාෂණ පරිවර්තනය කරනු ලැබුවේ නම් ඒ තැනැත්තා, යම් වරදක් පිළිබඳ පරීක්ෂණයක දී විභාග කරනු ලබන අවස්ථාවක, වෙනත් යම් මහෙස්ත්‍රාත්වරයකු විසින් චූදිතයා ඉදිරිපිට දී ගනු ලැබ සහතික කරන ලද ඒ මුලින් කී මහෙස්ත්‍රාත්වරයාගේ හෝ ඒ තැනැත්තාගේ දිවුරුම් සාක්ෂිය එම සිද්ධි ප්‍රකාශක සාක්ෂිකරුවකු ලෙස කැඳවනු නොලැබුව ද සාක්ෂියේ දී ඉදිරිපත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද -

(අ) එවැනි යම් සිද්ධි ප්‍රකාශයකු නඩු විභාගයේ දී සාක්ෂි දීම සඳහා පැමිණ සිටීම අවශ්‍ය යයි හෝ අවස්ථානුකූල යයි චූදිතයාගේ නඩු විභාගය ඉහළ අධිකරණයට තැබූ මහෙස්ත්‍රාත්වරයාගේ මතය වන අවස්ථාවක හෝ එසේ පැමිණ සිටි යුතු යයි නඩුවේ පාර්ශ්වකරුවන් දෙදෙනාගෙන් කවර හෝ පාර්ශ්වකරුවකු විසින් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක චෝදක පක්ෂය සඳහා වූ අනෙක් සාක්ෂිකරුවන් ලෙස ඒ ආකාරයට ම සාක්ෂි දීමේ කාර්යය සඳහා ඒ සිද්ධි ප්‍රකාශක සාක්ෂිකරුවකු ලෙස කැඳවනු ලැබිය යුතු ය; තවද

(ආ) ඒ සිද්ධි ප්‍රකාශක සාක්ෂිකරුවකු ලෙස ඕනෑම අවස්ථාවක කැඳවා විභාග කිරීමෙහිලා නඩුව විභාග කරන අධිකරණයට ඇති බලය කෙරෙහි මේ වගන්තියෙහි ඇතුළත් කිසිවක් බල නොපෑ යුතු ය. නැතහොත් බලපාන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

**418.** සොර බඩු බව දැන දැනම ඒවා භාර ගැනීම හෝ සොරකම් කළ දේපළ තම සන්තකයෙහි තබා ගැනීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව නඩු කටයුතු කර ගෙන යන අවස්ථාවක, ගත වූ මාස දොළහේ කාලය ඇතුළත සොරකම් කරන ලද වෙනත් දේපළ ඔහුගේ සන්තකයේ තිබුණු බවට නඩු කටයුත්තේ යම් අවස්ථාවක දී සාක්ෂි ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, ඔහුට විරුද්ධව වූ නඩු කටයුත්තට විෂයය වන්නා වූ දේපළ, සොරකම් කරන ලද දේපළ යයි එම තැනැත්තා දැන සිටි බව ඔප්පු කිරීමේ කාර්යය සඳහා එම සාක්ෂි සැලකිල්ලට ගනු ලැබිය හැකි ය.

භාර ගන්නන් යනාදීන්ට චෝදනා නගා ඇති විට වෙනත් නඩු පිළිබඳ සාක්ෂිවලට ඉඩ ඇති බව.

**419.*** (1) XV වන පරිච්ඡේදය යටතේ මූලික සාක්ෂි විභාගය අවසන් කළ විට, යම් තැනැත්තෙක්, ද්‍රව්‍යයක් හෝ දෙයක් හඳුනාගත් බව, හඳුනා ගැනීමේ පෙරෙට්ටුවක් පැවැත් වූ බව සහ නිශ්චිත සාක්ෂිකරුවන් විසින්, ඒ හඳුනා ගැනීමේ පෙරෙට්ටුවේ දී නිශ්චිත තැනැත්තකු හඳුනාගත් බව, යම් නිශ්චිත ද්‍රව්‍යයක් හෝ දෙයක් නිශ්චිත තැනැත්තකු ඉදිරිපිට දී මුද්‍රා තබා

පිළිගැනීමට කිසිවක් ඇත්නම් ඒ පිළිබඳ සටහන් නඩු වාර්තාවට ගොනු කළ යුතු බව [1988 අංක 11 §7]

* 1991.11.28 වන දින සිට ක්‍රියාත්මක වේ. 1991.9.5 වන අංක 678 /14 අති විශේෂ ගැසට් පත්‍රය බලන්න.

පරීක්ෂණය සහ විශ්ලේෂණය සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා වෙත යවනු ලැබූ බව, විශ්ලේෂණය සහ පරීක්ෂණය සඳහ ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා වෙත යවන ලද නිශ්චිත ද්‍රව්‍යයක් හෝ දෙයක් ඔහු විසින් ඒ පරීක්ෂණය සහ විශ්ලේෂණය කිරීමෙන් පසු අධිකරණය වෙත ආපසු එවන ලද බව, නිශ්චිත මිනුමක් හෝ සටහනක් නිශ්චිත තැනැත්තකු විසින් කරන ලද බව යන කරුණු ඇතුළුව විවාදයට භාජන වූ කරුණු හෝ විවාදයට භාජනය වූ කරුණුවලට අදාළ කරුණු සම්බන්ධයෙන් පිළිගැනීම් කිසිවක් කිරීමට චූදිත තැනැත්තා එකඟ වන්නේ දැයි චූදිත තැනැත්තාගෙන් විමසීම අධිකරණයේ කාර්යය වන්නේ ය. තවද, චූදිත තැනැත්තා එවැනි යම් පිළිගැනීමක් කිරීමට තම නීතිඥවරයා මගින් එකඟ වුවහොත්, ඒ එකඟ වුණු කාරණා පිළිබඳව සටහනක් මහෙස්ත්‍රාත්වරයා විසින් පිළියෙල කරනු ලැබිය යුතු අතර, ඒ සටහන චූදිතයාට වැටහෙන භාෂාවකින් කියවා, තේරුම් කර දිය යුතු ය. ඒ සටහන පිළිගැනීම පිළිබඳ නිවැරදි වාර්තාවක් බවට චූදිතයා, එකඟ වුවහොත්, ඔහු සටහනට අත්සන් තැබිය යුතු අතර, ඒ සටහන නඩු වාර්තාවට ගොනු කරනු ලැබිය යුතු ය. මහාධිකරණය විසින්, චූදිත තැනැත්තා වෙත දණ්ඩන නියම කරනු ලබන විට, එම තැනැත්තා මේ වගන්තිය යටතේ පිළිගැනීමක් කර ඇති බව සැලකිල්ලට ගත යුතු ය.

(2) එකඟවීමේ දී පිළිගන්නා ලද කාරණා විධිමත් පරිදි ඔප්පු කරනු ලැබූ ලෙස මහාධිකරණය ඉදිරියේ වූ නඩු විභාගයේ දී සලකනු ලැබිය යුතු ය.

(3) පිළිගැනීම් කළ අවස්ථාවේ දී චූදිතයා නීතිඥවරයකු විසින් නියෝජනය කරනු ලැබ නම් මිස, මේ වගන්තියෙහි විධිවිධාන අදාළ නොවිය යුතු ය.

පිළිගන්නා ලද කරුණු තව දුරටත් ඔප්පු කිරීම අවශ්‍ය නොවන බව.
[1988 අංක 11 § 8]

**420.*** (1) ලඝු ආකාරයෙන් වූ සෑම නඩු පැවරීමක් හෝ අධිචෝදනා පත්‍රයක් මත වූ සෑම නඩු විභාගයක් ආරම්භයේ දී යම් තැනැත්තකු හෝ කාරණාවක් හෝ දෙයක් හඳුනාගත් බව, හඳුනාගැනීමේ පෙරට්ටුවක් පැවැත් වූ බව සහ එම පෙරට්ටුවේ දී නිශ්චිත සාක්ෂිකරුවකු විසින් නිශ්චිත තැනැත්තකු හඳුනාගනු ලැබූ බව, යම් නිශ්චිත ද්‍රව්‍යයක් හෝ දෙයක් නිශ්චිත තැනැත්තකු ඉදිරියේ දී මුද්‍රා තබනු ලැබ, පරීක්ෂා කිරීම සහ විශ්ලේෂණය කිරීම සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කළ

බව, පරීක්ෂා කිරීම සහ විශ්ලේෂණය කිරීම සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා වෙත යවන ලද යම් නිශ්චිත ද්‍රව්‍යයක් හෝ දෙයක් පරීක්ෂණයෙන් සහ විශ්ලේෂණයෙන් පසු ඔහු විසින් අධිකරණය වෙත ආපසු එවනු ලැබූ බව, යම් නිශ්චිත මිනුම හෝ දළ සටහන යම් නිශ්චිත තැනැත්තකු විසින් කරන ලද බව යන කරුණු ඇතුළුව විවාදයට භාජන වූ කරුණු හෝ විවාදයට භාජන වූ කරුණුවලට අදාළ කරුණු සම්බන්ධයෙන් පිළිගැනීම් කිසිවක් කිරීමට චූදිත තැනැත්තා එකඟ වන්නේ දැයි ඔහුගෙන් විමසීම අධිකරණයේ කාර්යය වන්නේ ය. තව ද චූදිත තැනැත්තා විසින් එවැනි යම් පිළිගැනීමක් කිරීමට තම නීතිඥවරයාගේ මාර්ගයෙන් එකඟ වුවහොත්, අධිකරණය විසින් එම පිළිගැනීම වාර්තා කළ යුතු ය. අධිකරණය විසින්, චූදිත තැනැත්තා වෙත දණ්ඩන නියමය කරන විට, එම තැනැත්තා විසින් මේ වගන්තිය යටතේ පිළිගැනීමක් කර ඇති බව සැලකිල්ලට ගත යුතු ය.

[1988 අංක 11§ 8]

(2) ලඝු ආකාරයෙන් වූ යම් නඩු පැවරීමක දී හෝ අධිචෝදනා පත්‍රයක් මත වූ නඩු විභාගයක දී, පාර්ශ්වකරුවන් දෙදෙනාගෙන් කවර හෝ පාර්ශ්වකරුවකු විසින්, විරුද්ධ පාර්ශ්වකරු විසින් පිළිගන්නා ලද යම් කාරණයක් ඔප්පු කිරීම හෝ සත්‍යතාව සහ නියමයන් සම්බන්ධයෙන් ආරාවුලට භාජනව නොමැති යම් ලේඛන ඔප්පු කිරීම හෝ පිණිස සාක්ෂි මෙහෙයවීම අවශ්‍ය නොවන අතර, යම් ලේඛනවල පිටපත් පාර්ශ්වකරුවන්ගේ එකඟත්වය ඇතිව මුල් ලේඛනවලට සමාන ලෙස පිළිගනු ලැබිය හැකි ය.

එවැනි පිළිගැනීම් නඩු විභාගයට පෙර හෝ නඩු විභාගයේ දී හෝ කරනු ලැබිය හැකි ය.

එවැනි පිළිගැනීම් පිළිගන්නා ලද සිද්ධිය හෝ සිද්ධි සම්බන්ධයෙන් වෙනත් සාක්ෂි නොමැතිව ම, ප්‍රමාණවත් ඔප්පු කිරීමක් විය යුතු ය:

එසේ වුව ද, පිළිගැනීම් කළ අවස්ථාවේ දී චූදිත තැනැත්තා නීතිඥවරයකු විසින් නියෝජනය කරනු ලැබ් නම් මිස, මේ වගන්තියෙහි විධිවිධාන අදාළ නොවිය යුතු ය.

එසේ ම තවදුරටත්, එවැනි පිළිගැනීම් නඩු විභාගයට පෙර කර තිබෙන අවස්ථාවක, ඒවා ලියවිල්ලකින් විය යුතු අතර, එය චූදිතයා විසින් අත්සන් කර, ඒවායේ නිරවද්‍යතාව සහ චූදිතයාගේ අනන්‍යතාව සහ අත්සන පිළිබඳව නීතිඥවරයකු විසින් සහතික කර තිබිය යුතු ය.

## XXXVII වන පරිච්ඡේදය

## බැඳුම්කර සම්බන්ධයෙන් විධිවිධාන

බැඳුම්කරය වෙනුවට මුදල් තැන්පත් කිරීම.

**421.** ඇප කරුවන් නොමැතිව බැඳුම්කරයක් ලියා අත්සන් කරන ලෙස යම් අධිකරණයක් විසින් යම් තැනැත්තකුට නියම කරනු ලැබූ විට, එම අධිකරණය විසින්, බැඳුම්කරය ලියා අත්සන් කිරීම වෙනුවට, යහපත් හැසිරීම සඳහා වූ බැඳුම්කරයක් සම්බන්ධයෙන් හැර, අධිකරණය විසින් තීරණය කරනු ලබන ප්‍රමාණයක මුදලක් වලංගු කාසිවලින් හෝ නෝට්ටුවලින් හෝ තැන්පත් කිරීමට ඔහුට ඉඩ දෙනු ලැබිය හැකි ය.

බැඳුම්කරය අහිමි කරනු ලැබූ විට කාර්ය පටිපාටිය.

**422.** (1) මේ සංග්‍රහය යටතේ බැඳුම්කරයක් ගන්නා ලද අධිකරණය සෑහීමට පත් වන පරිදි හෝ බැඳුම්කරය යම් අධිකරණයක් ඉදිරියෙහි පෙනී සිටීම සම්බන්ධයෙන් නම් ඒ අධිකරණය සෑහීමට පත්වන පරිදි, එම බැඳුම්කරය අහිමිකරනු ලැබූ බව ඔප්පුකළ විට, එම අධිකරණය විසින් ඒ ඔප්පු කිරීමේ හේතු වාර්තාගත කොට එහි දණ්ඩන මුදල ගෙවන ලෙස හෝ එය නොගෙවීමට ඇති හේතු දක්වන ලෙස ඒ බැඳුම්කරයෙන් බැඳී සිටින යම් තැනැත්තකුට නියම කළ යුතු ය.

(2) ප්‍රමාණවත් හේතු නොදක්වනු ලැබුවේ නම් සහ දණ්ඩන මුදල නොගෙවනු ලැබුවේ නම් ඒ තැනැත්තාට අයත් චංචල හෝ නිශ්චල දේපළ තහනමට ගෙන විකිණීම සඳහා අධිකාරයක් නිකුත් කිරීමෙන් එය අයකර ගැනීමට අධිකරණය විසින් කටයුතු කළ හැකි ය.

(3) එම අධිකාරය එය නිකුත් කළ අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව ඇතුළත ක්‍රියාත්මක කරනු ලැබිය හැකි අතර, එම තැනැත්තාට අයත් ඉහත සීමාවෙන් පිටත වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් පිහිටා ඇත්තේ යම් විනිශ්චයකාරවරයකුගේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව ඇතුළත ද,

ඒ විනිශ්චයකාරවරයා විසින් එම අධිකාරය පිටසන් කරනු ලැබූ විට එම තැනැත්තාට අයත් ඒ දේපළ විනිග්‍රහණය කොට විකිණීම සඳහා ඉන් බලය ලැබිය යුතු ය.

(4) එම දණ්ඩන මුදල නොගෙවනු ලබන්නේ නම් සහ එවැනි තහනමට ගැනීමකින් හෝ විකිණීමකින් එම දණ්ඩන මුදල අය කර ගත නොහැකි නම් එසේ බැඳී සිටි තැනැත්තා අධිකාරය නිකුත් කරනු ලැබූ අධිකරණයේ ආඥාවකින් මාස හයක් දක්වා දීර්ඝ විය හැකි බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

(5) සඳහන් කර ඇති දණ්ඩන මුදලේ යම් කොටසක් සිය අභිමතය පරිදි අඩු කර, කොටසක් පමණක් ගෙවීම ක්‍රියාත්මක කිරීම අධිකරණය විසින් කළ හැකි ය.

**423.** මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ නිශ්චිත දේපළ විකුණා ඇති කවර අවස්ථාවක වුව ද, එය තහනමට ගැනීම හා විකිණීම කරනු ලැබුවේ යම් පිස්කල් කෙනකුගේ විධානය යටතේ ද ඒ පිස්කල් විසින්, ගැනුම්කරු නමින් හිමිකරයක් ලියා අත්සන් කර දීම, නීත්‍යනුකූල විය යුතු ය. ඒ නිශ්චල දේපළ තහනමට ගෙන විකිණීම සඳහා අධිකාරයක් නිකුත් කරනු ලැබුයේ යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ තැනැත්තා විසින් ඒ හිමිකරය ලියා අත්සන් කරනු ලැබුවාක් මෙන් විකුණන ලද දේපළ එසේ ලියා අත්සන් කරන ලද හිමිකරයක් මගින් ගැනුම්කරු සතු විය යුතු ය.

ගැනුම්කරුට හිමිකරයක් ලියා අත්සන් කර දීමට පිස්කල් ට ඇති බලය.

**424.** මහාධිකරණය වෙත පැමිණ පෙනී සිටීම සඳහා වූ බැඳුම්කරයක් මත අය විය යුතුව ඇති මුදල් අය කර ගන්නා ලෙස මහාධිකරණය විසින් යම් මහෙස්ත්‍රාත්වරයකුට විධාන කළ හැකි ය.

බැඳුම් ඔප්පු මත අයවිය යුතුව ඇති මුදල් අය කර ගන්නා ලෙස විධාන කිරීමට ඇති බලය.

## XXXVIII වන පරිච්ඡේදය

## වැරදි හා සම්බන්ධ දේපළ බැහැර කිරීම

**425.** (1) යම් අපරාධ අධිකරණයක දී පරීක්ෂණයක් හෝ නඩු විභාගයක් අවසන් කරනු ලැබූ විට ඒ අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත්තා වූ ද, ඒ පිළිබඳව යම් වරදක් සිදු කර ඇතැයි පෙනී යන්නා වූ ද නැතහොත් යම් වරදක් සිදු

සිදු කර ඇති වැරදි හා සම්බන්ධ දේපළ බැහැර කිරීම සඳහා ආඥාව.

කිරීමෙහි ලා යොදාගෙන ඇත්තා වූ ද යම් ලේඛනයක් හෝ වෙනත් දේපළක් බැහැර කිරීම සඳහා සුදුසු යයි අධිකරණය කල්පනා කරන යම් ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(2) එවැනි ආඥාවක් මහාධිකරණය විසින් කරනු ලැබ, එහි නිලධරයන් මාර්ගයෙන් ඒ දේපළ සඳහා හිමිකම ඇති තැනැත්තාට එම දේපළ එම ආඥාව යටතේ භාර දීම පහසුවෙන් කළ නොහැකි වන විට මහෙස්ත්‍රාත්වරයකු විසින් ඒ ආඥාව ක්‍රියාවේ යෙදවිය යුතු යයි ඒ අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි ය.

(3) අභියාචනයක් ඉදිරිපත් කළ හැකි නඩුවක දී මේ වගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබූ කල්හි ඒ ආඥාව (එම දේපළ ඇති කරන සතුන් හෝ ඉක්මනින් හා ස්වභාවික ලෙස නරක් වීමට යටත් දේපළ වන්නේ නම් මිස) අභියාචනයක් ඉදිරිපත් කිරීමට ඉඩ දී ඇති කාලය අවසන් වන තෙක් හෝ ඒ අභියාචනය නියමිත කාලය ඇතුළත ඉදිරිපත් කර ඇති විටක ඒ අභියාචනය සම්බන්ධයෙන් සුදුස්සක් කරනු ලබන තෙක් හෝ ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

(4) මේ වගන්තියෙහි "දේපළ" යන යෙදුමට, සිදු කරනු ලැබ ඇතැයි පෙනී යන වරදක් හා සම්බන්ධ දේපළක් පිළිබඳව එය යෙදෙන විට, යම් පාර්ශ්වකරුවකුගේ සන්තකයෙහි හෝ පාලනය යටතේ මුලින් තිබුණු යම් දේපළක් පමණක් නොව, එකී දේපළ හරවා ඇත්තේ හෝ හුවමාරු කර ඇත්තේ යම් දේපළකට ද එකී දේපළ ද, නැතහොත් හරවා ඇත්තේ හෝ හුවමරු කර ඇත්තේ යම් දේපළක් සඳහා ද එකී දේපළ ද එකී හැරවීමෙන් හෝ හුවමාරු කිරීමෙන්, වහාම හෝ නො එසේ ව අත්කර ගත් කිසිවක් වෙතොත් එය ද ඇතුළත් වේ.

ආඥාව වෙනුවට බැහැර කිරීම සඳහා දේපළ මහෙස්ත්‍රාත්වරයා වෙත යැවිය හැකි බව.

**426.** 425 වන වගන්තිය යටතේ ආඥාවක් කරනු වෙනුවට එම දේපළ මහෙස්ත්‍රාත්වරයකු වෙත භාර දෙන ලෙස මහාධිකරණය විසින් විධාන කළ හැකි ය. එසේ වූ විට, එම දේපළ පොලීසිය විසින් තහනමට ගනු ලැබ එම තහනමට ගැනීම මෙහි මින් මතු සඳහන් කරනු ලබන ආකාරයට තමා වෙත වාර්තා කරන ලද දේපළක් පරිද්දෙන් මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ය.

**427.** සොරකම හෝ සොරකම් කරන ලද දේපළ භාර ගැනීම ඇතුළත් වන හෝ සොරකමක් හෝ සොරකම් කරන ලද දේපළ භාර ගැනීමක් බවට පත්වන යම් වරදකට යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ විට සහ එම බඩු සොරකම් කරන ලද බඩු බව නොදැන හෝ එසේ විශ්වාස කිරීමට හේතු නොමැති ව වෙනත් යම් තැනැත්තකු ඔහුගෙන් ඒවා මිල දී ගත් බවද වරදකරු කරනු ලැබූ තැනැත්තා සිරභාරයට ගන්නා ලද වේලාවේ ඔහුගේ සන්තකයේ තිබූ යම් මුදලක් ගන්නා ලද බව ද ඔප්පු කරනු ලැබූ විට, ඒ මිලට ගැනුම්කරුගේ ඉල්ලීම පිට හා සොරකම් කරන ලද බඩු, ඒවායේ සන්තකය හිමි තැනැත්තාට භාර දීමෙන් පසු, ඒ මිලට ගැනුම්කරු විසින් ඒ බඩු සඳහා ගෙවන ලද මුදල නොඉක්මවන යම් මුදලක් ඒ මුදලින් ඔහුට ගෙවන ලෙස අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

විත්තිකරු ළඟ තිබූ මුදල් නිර්දෝෂී ගැනුම්කරුවකුට ගෙවීම.

**428.** මේ පරිච්ඡේදයේ ඉහතින් වූ වගන්ති යටතේ කරන ලද මහාධිකරණයේ හෝ මහෙස්ත්‍රාත් අධිකරණයක ආඥාවක් අභියාචනාධිකරණය විසින් සලකා බලන තෙක් නතර කරන ලෙස ඒ අධිකරණය විසින් විධාන කළ හැකි අතර එවැනි ආඥාවක් සුළු වශයෙන් වෙනස් කිරීම, වෙනස් කිරීම හෝ අවලංගු කිරීම ඒ අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

මේ පරිච්ඡේදය යටතේ වූ ආඥාවක් නතර කිරීම.

**429.** (1) දණ්ඩ නීති සංග්‍රහයේ 285 වන, 286 වන, 481 වන හෝ 482 වන වගන්ති යටතේ වරදකරු කරනු ලැබූ විටක දී, එසේ වරදකරු කරනු ලැබුවේ යම් දෙයක් සම්බන්ධයෙන් ද ඒ දෙයෙහි, අධිකරණය භාරයේ හෝ වරදකරු කරනු ලැබූ තැනැත්තාගේ සන්තකයේ නැතහොත් බලය යටතේ ඇති සියලු පිටපත් විනාශ කරන ලෙස අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

අපකීර්තිදායක හා වෙනත් දේ විනාශ කිරීම.

(2) ඒ ආකාරයට ම, දණ්ඩ නීති සංග්‍රහයේ 265 වන, 266 වන, 267 වන හෝ 268 වන වගන්ති යටතේ වරදකරු කරනු ලැබූ විටක දී වරදකරු කරනු ලැබුවේ යම් ආහාර, පාන, ඖෂධ හෝ බෙහෙත් මිශ්‍රණ සම්බන්ධයෙන් ද ඒ ආහාර, පාන, ඖෂධ හෝ බෙහෙත් මිශ්‍රණ විනාශ කරන ලෙස අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

**430.** (1) සාපරාධ බලහත්කාරය ඇතුළත් වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබුවා වූ හා ඒ බලහත්කාරකමින් යම් තැනැත්තකු යම් නිශ්චල දේපළකට අහිමිකර ඇති බව අධිකරණයට පෙනී යන්නා වූ කවර හෝ

නිශ්චල දේපළවල සන්තකය ආපසු භාර දීමේ බලය.

විටක, එම දේපළ ඒ තැනැත්තාගේ සන්තකයට ආපසු භාර දීම සුදුසු යයි අධිකරණය කල්පනා කරනහොත් එසේ එම දේපළ ආපසු භාර දෙන ලෙස අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

(2) සිවිල් නඩුවක දී යම් තැනැත්තකු විසින් ඔප්පු කරනු ලැබිය හැකි එකී නිශ්වල දේපළ සම්බන්ධයෙන් වූ හෝ විෂයයෙහි වූ යම් අයිතිවාසිකමකට හෝ සම්බන්ධතාවකට එවැනි කිසිදු ආඥාවකින් හානියක් නොවිය යුතු ය.

29 වන වගන්තිය යටතේ ගනු ලැබූ හෝ සොරකම් කරන ලද හෝ දේපළ තහනමට ගනු ලැබූ විට එය දන්වා සිටීමේ කාර්ය පටිපාටිය.

**431.** (1) 29 වන වගන්තිය යටතේ ගන්නා ලද හෝ සොරකම් කරන ලදැයි කියනු ලබන හෝ සැක කරනු ලබන නැතහොත් යම් වරදක් සිදු කරන ලදැයි යන සැකයන් ඇති කිරීමේ අවස්ථානුගත කරුණු යටතේ සම්බ වූ යම් දේපළක් පොලිස් නිලධරයකු විසින් තහනමට ගනු ලැබීම, වහාම මහෙස්ත්‍රාත්වරයකු වෙත වාර්තා කළ යුතු ය. එම දේපළෙහි සන්තකයට හිමිකම් ඇති තැනැත්තාට එය ආපසු භාරදීම සම්බන්ධයෙන් හෝ එබඳු තැනැත්තකු නිසැකව දැන ගත නොහැකි නම් එකී දේපළවල භාරය සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් හෝ සුදුසු යයි තමා කල්පනා කරන යම් ආඥාවක් මහෙස්ත්‍රාත්වරයා විසින් අප්‍රමාදව කළ යුතු ය.

(2) එසේ හිමිකම් ඇති තැනැත්තා දැනගත හැකි නම් සුදුසු යයි තමා කල්පනා කරන යම් කොන්දේසි වෙතොත් ඒ කොන්දේසි මත දේපළ ඔහුට භාර දෙන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥා කළ හැකි ය. ඒ තැනැත්තා දැනගත නොහැකි නම් මහෙස්ත්‍රාත්වරයා විසින් දේපළ රඳවා ගනු ලැබිය හැකි අතර, එසේ රඳවා ගනු ලැබූ විට, එම දේපළ සමන්විත වන භාණ්ඩ සඳහන් කරමින් අධිකරණයේ දැන්වීම් පුවරුවෙහි සහ මහෙස්ත්‍රාත්වරයා විසින් තීරණය කරනු ලැබිය යුතු වෙනත් ප්‍රසිද්ධ ස්ථාන දෙකක නිවේදනයක් පළ කිරීම ද ඒ භාණ්ඩවලට හිමිකම් ඇති යම් තැනැත්තකු ඒ නිවේදනයේ දිනයෙහි සිට මාස හයක් ඇතුළත තමා ඉදිරියට පැමිණ ස්වකීය හිමිකම් පෑම තහවුරු කර දැක්විය යුතු යයි නියම කිරීම ද මහෙස්ත්‍රාත්වරයා විසින් කළ යුතු ය.

(3) එම දේපළෙහි වටිනාකම රුපියල් දෙදහස් පන්ඩියයක් හෝ ඊට වැඩි වන්නේ නම් ඒ නිවේදනය, මහෙස්ත්‍රාත්වරයා සුදුසු යයි කල්පනා කරනහොත් සිංහල භාෂාවෙන්, දෙමළ භාෂාවෙන් සහ ඉංග්‍රීසි භාෂාවෙන් පළවන ප්‍රවෘත්ති පත්‍රවල යටත් පිරිසෙයින් එක් වතාවක්වත් පළ කිරීම ද කරනු ලැබිය හැකිය.

**432.** එම කාලසීමාව ඇතුළත යම් තැනැත්තකු එම දේපළට ඇති ස්වකීය හිමිකම තහවුරු නොකරයි නම් සහ ඒ දේපළ හමුවූයේ යම් තැනැත්තකුගේ සන්තකයේ තිබී ද, ඒ තැනැත්තාට ඒ දේපළ තමා විසින් නීත්‍යනුකූලව අත්කර ගත් බව පෙන්වා දීමට නොහැකි නම් එම දේපළ රජයට සුදුස්සක් කළ හැකි පරිදි තිබිය යුතු අතර මහෙස්ත්‍රාත්වරයාගේ ආඥාව යටතේ එම දේපළ විකුණනු ලැබිය හැකි ය.

මාස හයක් ඇතුළත කිසිම හිමිකම්පාන්නකු පෙනී නොසිටින අවස්ථාවක කාර්ය පටිපාටිය.

**433.** ඒ දේපළෙහි සන්තකය හිමි තැනැත්තා කවරෙක් දැයි නොදන්නෙහි නම් හෝ ඔහු නොපැමිණියහොත් සහ ඒ දේපළ ඉක්මණින් හා ස්වභාවික ලෙස නරක් වීමට යටත් දේපළ වන්නේ නම් හෝ විකුණා දැමීම අයිතිකරුගේ යහපත පිණිස වන බව තහනමට ගැනීමට වාර්තා කරනු ලැබූ මහෙස්ත්‍රාත්වරයාගේ මතය වේ නම් එය විකුණා දමන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් ඕනෑම අවස්ථාවක දී විධාන කළ හැකි ය. එබඳු විකිණීමක ශුද්ධ ආදායම සම්බන්ධයෙන් 431 වන සහ 432 වන වගන්තිවල විධිවිධාන යොදාගත හැකිතාක් දුරට අදාළ විය යුතු ය.

විකිණීමට ඇති බලය.

**433** අ. (1) කුලී සින්නක්කර හෝ බදු දීමේ ගිවිසුමක් යටතේ කුලියට දෙන ලද වාහනයක් සම්බන්ධයෙන් වූ විට, (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත යටතේ එම වාහනයේ පරම අයිතිකරු ලෙස ලියාපදිංචිව සිටින තැනැත්තා, මේ පරිච්ඡේදයේ කාර්යයන් සඳහා එම වාහනයේ සන්තකය දැරීමට හිමිකම් ඇති තැනැත්තා ලෙස සලකනු ලැබිය යුතු ය.

කුලී සින්නක්කර ගිවිසුමක විෂයය වස්තුව වන්නා වූ දේපළක සන්තකය. [1990 අංක 12 § 2]

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් කිසියම් වාහනයක පරම අයිතිකරු ලෙස, එක් තැනැත්තකුට වැඩි ගණනක් ලියාපදිංචිව සිටින අවස්ථාවක, ඒ වාහනය සම්බන්ධයෙන්, එම කාලසීමාවේ පළමුවෙන් ම ලියාපදිංචිව සිටින තැනැත්තා මේ පරිච්ඡේදයේ කාර්යයන් සඳහා එම වාහනයේ සන්තකය දැරීමට හිමිකම් ඇති තැනැත්තා ලෙස සලකනු ලැබිය යුතු ය.

## XXXIX වන පරිච්ඡේදය

## නඩු කටයුතු පිළිබඳ අක්‍රමිකතා

**434.** යම් අපරාධ අධිකරණයක නඩු විභාගයක් හෝ වෙනත් නඩු කටයුත්තක් වැරදි ප්‍රාදේශික ස්ථානයක පැවැත්වීම නිසා යුක්තිය ඉෂ්ට නොවීමක් සිදු වී ඇතැයි පෙනී ගියහොත් පමණක්

වැරදි ස්ථානවල නඩු කටයුතු පැවැත්වීම.

මිස ඒ විභාගය, නඩු විභාගය හෝ වෙනත් නඩු කටයුත්ත වැරදි ප්‍රාදේශික ස්ථානයක පැවැත්විය යන හේතුව මත පමණක් එවැනි අපරාධ අධිකරණයක නඩු තීන්දුවක් නිෂ්ප්‍රභ කරනු නොලැබිය යුතු ය.

සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා නොකිරීම.

**435.** මේ සංග්‍රහයේ විධිවිධාන යටතේ වාර්තාගත කරන ලද සාක්ෂිකරුවකුගේ දිවුරුම් සාක්ෂියක් හෝ චූදිතයකුගේ ප්‍රකාශයක් සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරන ලද්දේ යම් අධිකරණයක් ඉදිරිපිට දී ද ඒ දිවුරුම් සාක්ෂිය හෝ ප්‍රකාශය සටහන් කර ගත් මහෙස්ත්‍රාත්වරයා මේ සංග්‍රහයේ විධිවිධානවලට සම්පූර්ණයෙන් අනුකූල "ලෙස ක්‍රියා කර නොමැති බව ඒ අධිකරණයට පෙනී ගියහොත් ඒ සාක්ෂිකරු හෝ චූදිතයා යථා පරිදි දිවුරුම් සාක්ෂිය දුන් බවට හෝ වාර්තාගත කළ ප්‍රකාශය කළ බවට ඒ අධිකරණය විසින් සාක්ෂි ගත හැකි ය. තවද සාක්ෂි ආඥාපනතේ 91 වගන්තියෙහි කුමක් සඳහන්ව ඇත ද චූදිතයාගේ විත්තිවාචකයේ යථාර්ථය කෙරෙහි එම වරදින් හානියක් වී නොමැති නම් එම දිවුරුම් සාක්ෂිය හෝ ප්‍රකාශය ඒ අධිකරණය විසින් පිළිගත යුතු ය.

චෝදනාවක හෝ වෙනත් නඩු කටයුත්තක දෝෂයක් හෝ අත් හැරීමක් නිසා තීරණය හෝ දණ්ඩන නියමය ප්‍රතිවර්තනය කළ හැකි අවස්ථා.

**436.** මෙහි ඉහත සඳහන් විධිවිධානවලට යටත්ව, නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් දෙන ලද යම් නඩු තීන්දුවක් -

(අ) මේ සංග්‍රහය යටතේ වූ නඩු විභාගයකට, යම් පරීක්ෂණයකට හෝ වෙනත් යම් නඩු කටයුත්තකට පෙර හෝ එවැන්නක් පැවැත්වෙන අතරතුර පැමිණිල්ලේ, සිතාසියේ, වරෙන්තුවේ, චෝදනාවේ, නඩු තීන්දුවේ සම්පිණ්ඩන දේශනයේ හෝ වෙනත් නඩු කටයුත්තක වූ යම් දෝෂයක්, අත් හැරීමක් හෝ අක්‍රමිකතාවක් ; හෝ

(ආ) 135 වන වගන්තියෙන් නියමිත යම් අනුමතයක් නොලැබීම හෝ

හේතුකොටගෙන අභියාචනයේ දී හෝ ප්‍රතිශෝධනයේ දී ප්‍රතිවර්තනය කිරීම හෝ වෙනස් කිරීම එම දෝෂය, අත් හැරීම, අක්‍රමිකතාව හෝ අවශ්‍යතාව නිසා යුක්තිය ඉෂ්ට නොවීමක් සම්බන්ධයෙන් වරදක් සිදු වී ඇත්නම් මිස නොකළ යුතු ය.

නඩු කටයුතුවල ඌනතාවක් තිබුණ ද තහනම් ආඥා නීති විරෝධී නොවන බව.

**437.** සිතාසියක හෝ වෙනත් කලින් කරන ලද වරදකරු කිරීමක, විනිග්‍රහණය කිරීමේ රීති ආඥාවක හෝ ඊට අදාළ වෙනත් නඩු කටයුත්තක යම් දෝෂයක් හෝ ආකෘතියෙහි ඇති ඌනතාවක් හේතුකොට ගෙන මේ සංග්‍රහය යටතේ කරන ලද යම් ආඥාවක් නීති විරෝධී ලෙස හෝ එම ආඥාව ක්‍රියාවේ යොදවන යම් තැනැත්තකු අයුතු ලෙස ඇතුළු වන්නකු ලෙස හෝ සලකනු නොලැබිය යුතු ය.

## XL වන පරිච්ඡේදය

## සාමාන්‍ය විධිවිධාන

පලායිත තැනැත්තන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ අධිකරණ බලය.

**438.** පලායිත තැනැත්තන් සම්බන්ධයෙන් වූ අධිකරණ බලය, පලායිත තැනැත්තන්ට සහ ඔවුන් උදර්පණය කිරීමට අදාළව තත්කාලයෙහි බලපවත්නා නීතියට අනුකූලව, ක්‍රියාත්මක කළ යුතු ය.

වැදගත් සාක්ෂිකරුවකු කැඳවීමේ හෝ පැමිණ සිටින තැනැත්තකුගෙන් සාක්ෂි විභාග කිරීමේ බලය.

**439.** මේ සංග්‍රහය යටතේ පවත්වනු ලබන පරීක්ෂණයක, නඩු විභාගයක හෝ වෙනත් නඩු කටයුත්තක කවර හෝ අවස්ථාවක දී සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු කැඳවීම හෝ සාක්ෂිකරුවකු වශයෙන් කැඳවනු නොලැබුව ද පැමිණ සිටින යම් තැනැත්තු ගෙන් සාක්ෂි විභාග කිරීම හෝ එවකටත් සාක්ෂි විභාග කරන ලද යම් තැනැත්තකු නැවත කැඳවා ඔහුගෙන් නැවත සාක්ෂි විභාග කිරීම හෝ යම් අධිකරණයක් විසින් කළ හැකි ය; තව ද නඩුවේ සාධාරණ තීරණයකට එබඳු යම් තැනැත්තකුගේ සාක්ෂි අත්‍යවශ්‍ය යයි එම අධිකරණයට පෙනී ගියහොත් ඒ තැනැත්තා කැඳවා ඔහුගෙන් සාක්ෂි විභාග කිරීම හෝ ඒ තැනැත්තා නැවත කැඳවා ඔහුගෙන් නැවත සාක්ෂි විභාග කිරීම හෝ ඒ අධිකරණය විසින් කළ හැකි ය.

බන්ධනාගාරගතව සිටින සිරකරුවකු සාක්ෂි විභාග කිරීම සඳහා ගෙනෙන ලෙස ආඥා කිරීමට අධිකරණයට ඇති බලය.

**440,** (1) යම් අපරාධ අධිකරණයක් ඉදිරියෙහි විනිශ්චයට භාජනව තිබෙන යම් නඩුවක සාක්ෂිකරුවකු වශයෙන් යම් බන්ධනාගාරයක රඳවා තබා සිටින යම් තැනැත්තකුගෙන් සාක්ෂි විභාග කිරීමට ඒ අධිකරණය අදහස් කරන්නේ නම්, ඒ අධිකරණය විසින්, ආඥාවක් මගින්, ඒ ආඥාවෙහි සඳහන් කරනු ලැබිය යුතු වේලාවක දී එම සිරකරුවාගෙන් සාක්ෂි විභාග කිරීම සඳහා නිසි රැකවරණයෙන් යුක්තව ඔහු එම අධිකරණය වෙත ගෙන එන ලෙස එකී බන්ධනාගාරය භාර නිලධරයාට නියම කළ හැකි ය.

(2) එම ආඥාව ලැබුණු විට ඒ බන්ධනාගාරය භාර නිලධරයා ඊට අනුකූලව ක්‍රියා කළ යුතු අතර, ඉහත කී කාර්යය සඳහා ඒ සිරකරුවා බන්ධනාගාරයෙන් බැහැරව සිටින කාලය තුළ ඔහුගේ රක්ෂිත රැකවරණය සඳහා ද එම නිලධරයා විසින් විධිවිධාන සැලැස්විය යුතු ය.

ගෙවීමට අණ කරනු ලැබූ මුදල් දඩ වශයෙන් අය කර ගත හැකි බව.

**441,** මේ සංග්‍රහය යටතේ යම් ආඥාවක බලය (දඩයක් වශයෙන් හැර) ගෙවිය යුතු යම් මුදලක්, එය දඩයක් වූවාක් මෙන්, අය කර ගත හැකි විය යුතු ය.

යම් දිවුරුම් සාක්ෂියක හෝ නඩු වාර්තාවේ වෙනත් කොටසක හෝ පිටපත්.

**442,** අපරාධ අධිකරණයක නඩු තීන්දුවකින් හෝ අවසාන ආඥාවකින් හෝ බලපෑමක් ඇති වූයේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා යම් දිවුරුම් සාක්ෂියක හෝ නඩු වාර්තාවේ අවනත් කොටසක හෝ පිටපතක් ලබා ගැනීමට බලාපොරොත්තු වන්නේ නම්, ඒ පිටපත සඳහා ඒ තැනැත්තා ඉල්ලුම් කළ විට, යම් විශේෂ හේතුවක් නිසා එය නොමිලයේ සැපයීම සුදුසු යයි අධිකරණය කල්පනා කරතහොත් මිස, අධිකරණය විසින් විධාන කරනු ලබන පරිදි, වචන සියයකට ශත විසිපහ බැගින් ඒ සඳහා ගෙවූ විට ඒ තැනැත්තා වෙත එම පිටපත සපයනු ලැබිය යුතු ය.

අවසන් කරන ලද හෝ විනිශ්චයට භාජනව පවත්නා හෝ නඩු කටයුතුවල සම්පූර්ණ වාර්තාවේ නැතහොත් ඉන් කොටසක හෝ සහතික පිටපතක් ලබා ගැනීමට නීතිපතිවරයාට, පැමිණිලිකරුට හා චූදිත තැනැත්තාට හිමිකම් ඇති බව. [1980 අංක 52 § 14]

**443,** යම් චූදිත තැනැත්තකුට විරුද්ධව වූ (විනිශ්චයට භාජනව පවත්නා හෝ අවසන් කරන ලද හෝ) නඩු කටයුතුවල සම්පූර්ණ වාර්තාවේ නැතහොත් ඉන් යම් කොටසක සහතික පිටපතක් ඉල්ලා සිටි විට අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රමාදයකින් තොරව, ඒ සම්පූර්ණ වාර්තාවේ හෝ එහි කොටසේ හෝ සහතික පිටපතක් -

(අ) කිසියම් ගෙවීමක් කිරීමෙන් නිදහස් කරනු ලැබිය යුතු නීතිපතිවරයාට; හෝ

(ආ) 442 වන වගන්තියේ සඳහන් ප්‍රමාණය අනුව ඒ සඳහා ගාස්තු ගෙවනු ලැබූ විට පැමිණිලිකරුට හෝ සෑම චූදිත තැනැත්තකුට ම

නිකුත් කළ යුතුය.

* 1979 ජූලි මස 2 වන දිනට බලපාන පරිදි - 1980 අංක 52 දරන පනතේ 16 වන වගන්තිය බලන්න

මුල් දැනුම් දීමේ පිටපතක් ලබා ගැනීමට චූදිත තැනැත්තාට හිමිකම් ඇති බව.

**444.** (1) යම් වරදක් කරන ලදැයි යම් චූදිත තැනැත්තකුට විරුද්ධව චෝදනා නගා ඇත්තේ ද ඒ වරද සිදුකිරීම පිළිබඳ මුල් දැනුම්දීමේ දී යථා පරිදි කරන ලද සහතික පිටපතක් සහ, චූදිතයා විසින් වරදක් කවර තැනැත්තකුට විරුද්ධව නැතහොත් කවර තැනැත්තකු සම්බන්ධයෙන් කරන ලදැයි කියනු ලැබේ ද ඒ තැනැත්තා විසින් කරන ලද යම් ප්‍රකාශයක යථා පරිදි සහතික කරන ලද පිටපතක් චූදිත තැනැත්තා විසින් හෝ ඔහුගේ නීතිඥවරයා විසින් හෝ ඉල්ලා සිටි විට, සෑම පරීක්ෂකවරයකු ම විසින් නැතහොත් පොලිස් ස්ථානයක් භාර නිලධරයකු විසින්, ඒ චූදිත තැනැත්තාට හෝ ඔහුගේ නීතිඥවරයාට හෝ නිකුත් කළ යුතු ය.

M/C

(2) (1) වන උපවගන්තිය යටතේ ලබා ගන්නා ලද යම් දැනුම් දීමක හෝ ප්‍රකාශයක හෝ සහතික පිටපතක් ඉදිරිපත් කිරීම, ඒ දැනුම්දීම හෝ ප්‍රකාශය හෝ සටහන් කළ පරීක්ෂකවරයාට නැතහොත් පොලිස් නිලධරයාට ඒ දැනුම්දීම හෝ ප්‍රකාශය හෝ කරන ලද බවට මේ සංග්‍රහය යටතේ වූ සෑම නඩු කටයුත්තක දී ම, බැලූ බැල්මට පෙනෙන සාක්ෂි විය යුතු ය. තවද, වෙනත් යම් නීතියක කවර විධිවිධානයක් තිබුනද, එවැනි සහතික පිටපතක් ඉදිරිපත් කිරීමේ හුදු කාර්යය සඳහා ම පමණක් සාක්ෂිකරුවකු වශයෙන් ඒ පරීක්ෂකවරයා හෝ පොලිස් නිලධරයා හෝ කැඳවීම අවශ්‍ය නොවිය යුතුය.

(3) චූදිතයාට විරුද්ධව චෝදනාව සනාථ කිරීම පිණිස චෝදක පක්ෂය විශ්වාසය තබන්නේ යම් සාක්ෂිකරුවකුගේ සාක්ෂි කෙරෙහි ද, 110 වන වගන්තිය යටතේ වාර්තාගත කරන ලද ඒ සාක්ෂිකරුගේ ප්‍රකාශය, විවෘත අධිකරණයේ දී කියවා බැලීම සඳහා මහෙස්ත්‍රාත් අධිකරණයක යම් නඩු විභාගයක දී මහෙස්ත්‍රාත්වරයකු විසින්, යුක්තිය ඉටුකිරීම පිණිස, චූදිතයාට හෝ ඔහුගේ නීතිඥවරයාට හෝ ලබා ගත හැකිවීමට සැලැස්විය හැකි ය.

M/C

යම් තැනැත්තන්ට විරුද්ධව නඩු විභාග කිරීම යුද්ධාධිකරණයක් විසින් කළ හැකි අවස්ථාවල දී ඒ තැනැත්තන් යුද්ධ හමුදා බලධරයන් වෙත භාර දීම.

**445.** (1) මේ සංග්‍රහය අදාළ වන අධිකරණයක් විසින් යුද්ධ හමුදා නීතියට යටත් තැනැත්තාට විරුද්ධව විභාග කළ යුතු නඩු සම්බන්ධයෙන් මෙම සංග්‍රහයට හා යුද්ධ හමුදා නීතියට හෝ තත්කාලයෙහි බලපවත්නා ඒ හා සමාන යම් නීතියකට හෝ අනුකූල වන්නා වූ රීති 453 වන වගන්තිය යටතේ සාදනු ලැබිය හැකි ය. තවද යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියට පමුණුවනු ලැබ යුද්ධ හමුදා නීතිය යටතේ නඩු විභාග

කිරීමට ඔහු යටත් වන්නා වූ වරදක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව චෝදනා නගනු ලැබූ විට, ඒ මහෙස්ත්‍රාත්වරයා ඒ රීති ගැන සැලකිලිමත් විය යුතු අතර, නිසි අවස්ථාවල දී, ඒ තැනැත්තාට විරුද්ධව යුද්ධ හමුදා නීතිය අනුව නඩු විභාග කරනු ලැබීමේ කාර්යය සඳහා, අවස්ථාවෝචිත පරිදි, ඔහු අයත් වූ නැවේ, රෙජිමේන්තුවේ, බලකායේ හෝ කණ්ඩායමේ අණදෙන නිලධරයා වෙත හෝ ළඟම පිහිටි නාවික, යුද්ධ හෝ ගුවන් හමුදා ස්ථානයේ අණදෙන නිලධරයා වෙත, ඒ තැනැත්තාට විරුද්ධව චෝදනා කර ඇති වරද පිළිබඳ ප්‍රකාශයක් ද සමඟ ඒ තැනැත්තා ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් භාර දිය යුතු ය.

මේ උපවගන්තියෙහි "යුද්ධ හමුදා නීතිය" යන යෙදුමට යුද්ධ හමුදා පනත, නාවික හමුදා පනත සහ ගුවන් හමුදා පනත ඇතුළත් වන අතර "යුද්ධ හමුදා නීතියට යටත් තැනැත්තන්" යන යෙදුමට එකී පනත් අතුරින් කවර හෝ පනතකට යටත් සියලු තැනැත්තෝ ඇතුළත් වෙති.

(2) එවැනි යම් ස්ථානයක නවත්වා ඇති හෝ සේවයෙහි නියුක්ත කර ඇති යම් භට කණ්ඩායමක අණදෙන නිලධරයාගෙන් තත් කාර්යය සඳහා ලිඛිත ඉල්ලීමක් ලැබුණු විට, යට කී අන්දමේ වරදක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබ සිටින යම් තැනැත්තකු සිර භාරයට ගෙන සුරක්ෂිතව තබා ගැනීමට සෑම මහෙස්ත්‍රාත්වරයකු ම තමාගේ උපරිම උත්සාහය දැරිය යුතු ය.

ඇප පිට මුදා හරිනු ලැබූ තැනැත්තකු විසින් සිතාසි භාර දීම සඳහා ලිපිනය සැපයිය යුතු බව.

**446.** ඇප පිට හෝ තමාගේ ම බැඳුම්කරයක් පිට හෝ යම් තැනැත්තකු මුදා හරිනු ලැබූ කල්හි, සියලු දැන්වීම් හා අධිකරණ විධාන ඔහු වෙත භාර දිය හැකි ලිපිනයක් ඔහු විසින් එම ඇප හෝ බැඳුම්කරය ගන්නා අධිකරණයට හෝ නිලධරයාට සැපයිය යුතු ය. තවද ඒ තැනැත්තා සොයා ගත නොහැකි හෝ වෙනත් හේතු නිසා එසේ භාර දීම කළ නොහැකි යම් අවස්ථාවක, ඒ තැනැත්තා සඳහා ඒ ලිපිනය දරන ස්ථානයේ තබනු ලබන යම් දැන්වීමක් හෝ අධිකරණ නියෝගයක් ඔහුට යථා පරිදි භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

පැහැර ගෙන යනු ලැබූ ස්ත්‍රීන් පුනස්ථාපනය කිරීමට බල කිරීමේ බලය.

**447.** ස්ත්‍රියක හෝ වයස අවුරුදු දහ හතරකට අඩු ගැහැණු ළමයකු හෝ යම් නීති විරෝධී කාර්යයක් සඳහා පැහැර ගෙන යාම හෝ නීති විරෝධී ලෙස රඳවා ගෙන සිටීම හෝ සම්බන්ධයෙන් දිවුරුම් පිට පැමිණිල්ලක් මහෙස්ත්‍රාත්වරයකු වෙත

කරනු ලැබූ විට, සුදුසු යයි තමා සලකන පරීක්ෂණයකින් පසු ඒ ස්ත්‍රිය හෝ ළමයා තමාගේ කොට්ඨාසය තුළ සිටී නම්, ඒ ස්ත්‍රිය නිදහස් කොට වහාම පුනස්ථාපනය කරන ලෙස නැතහොත්, ඒ ගැහැණු ළමයා ඇගේ ස්වාමි පුරුෂයාට, මවට හෝ පියාට, භාරකරුට හෝ ඒ ළමයාගේ නීත්‍යනුකූල භාරය දරන වෙනත් තැනැත්තකුට පුනස්ථාපනය කරන ලෙස ආඥාවක් කිරීම ද එම ආඥාව අනුව ක්‍රියා කරන ලෙස අවශ්‍ය විය හැකි අන්දමේ බලයක් පාවිච්චි කිරීමෙන් බල කිරීම ද මහෙස්ත්‍රාත්වරයා විසින් කළ හැකි ය.

බොරු සාක්ෂි දීම සම්බන්ධයෙන් වෛකල්පික චෝදනා මත සාක්ෂිකරුවකුට විරුද්ධව ලඝු කාර්ය පටිපාටිය අනුව නඩු විභාග කිරීම.

**448.** (1) මහාධිකරණයක් ඉදිරියෙහි පැවැත්වෙන නඩු විභාගයක දී යම් සාක්ෂිකරුවකු යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් තමා විසින් මහෙස්ත්‍රාත්වරයා ඉදිරියෙහි වූ පරීක්ෂණයේ දී කලින් දෙන ලද සාක්ෂියට ප්‍රකාශිතව ම හෝ අවශ්‍ය ව්‍යංගයෙන් හෝ පටහැනි වන්නා වූ සාක්ෂි දුනහොත්, ඒ නඩු විභාගය අවසානයේ දී, මූලාසනාරූඪ විනිශ්චයකාරවරයා විසින් ඒ සාක්ෂිකරු විනිශ්චයට ඉදිරිපත් කරවා, අධිකරණ කටයුත්තේ යම් අවස්ථාවක දී ඕනෑකමින් ම බොරු සාක්ෂි දීම සම්බන්ධයෙන් අධිචෝදනා පත්‍රයක් මත ඔහුට විරුද්ධව නඩු විභාග කිරීම නීත්‍යනුකූල විය යුතු ය. අධිචෝදනා පත්‍රය රෙජිස්ට්‍රාර්වරයා විසින් පිළියෙල කර අත්සන් කළ යුතු අතර, පළමුව සඳහන් කරන ලද නඩු විභාගය ජූරි සභාවක් මඟින් වන අවස්ථාවක චූදිතයාට විරුද්ධ නඩු විභාගය එම ජූරි සභාව විසින් ම හෝ පළමුව සඳහන් කරන ලද නඩු විභාගය ජූරි සභාවක් නැතිව වන අවස්ථාවක චූදිතයාට විරුද්ධ නඩු විභාගය තනිව විනිශ්චයාසනාරූඪව සිටින විනිශ්චයකාරවරයා විසින් හෝ පවත්වනු ලැබිය හැකි ය.

(2) ඒ නඩු විභාගයේ දී, කරන ලදැයි අධිචෝදනා පත්‍රයෙන් කියවෙන පරස්පර විරෝධී ප්‍රකාශ චූදිතයා විසින් කරන ලද බැව් ඔප්පු කිරීම ප්‍රමාණවත් විය යුතු අතර එම ප්‍රකාශ අතුරින් කුමක් අසත්‍ය ද යන්න ඔප්පු කිරීම අවශ්‍ය නොවිය යුතු ය.

(3) අවස්ථානුකූල යයි තමා සලකතහොත් ඒ සාක්ෂිකරු පිළිබඳ නඩු විභාගය සුදුසු යයි තමා කල්පනා කරන යම් කාලයක් සඳහා අඩාළුව කල් තැබීම ද ඒ සාක්ෂිකරු අත් අඩංගුවෙහි තැබීම ද නියම කිරීම හෝ ඔහු පෙනී සිටින බවට ඔහුගේ ම බැඳුම් ඔප්පුවක් පිට නැතහොත් ඇපකරුවන් ඇතිව ඇප පිට

නිදහස් කිරීම ද මූලාසනාරූඪ විනිශ්චයකාරවරයා විසින් කළ හැකි ය. නඩු විභාගය ජූරි සභාවේ මඟින් වන අවස්ථාවක එසේ අඩාළව කල් තබන ලද නඩු විභාගය එම ජූරි සභාව ඉදිරියෙහි ම හෝ විනිශ්චයකාරවරයා විසින් විධාන කරනු ලබන පරිදි වෙනත් යම් ජූරි සභාවක් ඉදිරියේ දී හෝ පවත්වනු ලැබිය යුතු ය.

විවෘත අධිකරණයෙහි බොරු සාක්ෂි දීම සඳහා ලඝු ආකාරයෙන් දඬුවම් කිරීම.

**449**. (1)මේ සංග්‍රහය යටතේ යම් අධිකරණ කටයුත්තක දී යම් කාරණයක් සම්බන්ධයෙන් විවෘත අධිකරණයෙහි සාක්ෂි දෙන යම් තැනැත්තකු, ඒ අධිකරණ කටයුත්ත පවත්වනු ලබන්නේ යම් අධිකරණයක් ඉදිරියෙහි ද ඒ අධිකරණයේ මතය අනුව, දණ්ඩ නීති සංග්‍රහයේ 188 වන වගන්තියේ අර්ථානුකූලව බොරු සාක්ෂි දුනහොත්, ඒ අධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අභියානාධිකරණය හෝ මහාධිකරණය නම්, අධිකරණයට කරනු ලැබූ අපහාස කිරීමක් මෙන් සාක්ෂිකරුට අවුරුදු දෙකක් නොඉක්මවන යම් කාලයක් බරපතල වැඩ නැතිව හෝ ඇතිව හෝ බන්ධනාගාරගත කිරීමක් හෝ රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයක් හෝ ලඝු ආකාරයෙන් නියම කිරීම නැතහොත් ඒ අධිකරණය ඊට පහළ අධිකරණයක් නම්, රුපියල් පන් සියයක් නොඉක්මවන දඩයක් ගෙවන ලෙස ඒ සාක්ෂිකරුට ආඥා කිරීම හෝ මාස තුනක් නොඉක්මවන කාලයක් බරපතල වැඩ ඇතිව හෝ නැතිව ඔහු බන්ධනාගාරගත කිරීමට ආඥා කිරීම හෝ නීත්‍යනුකූල විය යුතු ය. මේ වගන්තියෙන් දෙන ලද බලය ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අභියාචනාධිකරණය හෝ නොවන අධිකරණයක් විසින් ක්‍රියාත්මක කරනු ලබන කවර හෝ විටක, ඒ දණ්ඩන නියමය කිරීමට හේතු ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් වාර්තාගත කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ බන්ධනාගාරගත කිරීමේ යම් දඬුවමක් විඳ ඇති හෝ නියම කරනු ලැබූ යම් දඩයක් ගෙවා ඇති හෝ යම් තැනැත්තකු, ඒ වරද සම්බන්ධයෙන් ම නැවතත් දඬුවම් කරනු ලැබීමට යටත් නොවිය යුතු ය.

(3) ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අභියාචනාධිකරණය හෝ නොවන යම් අධිකරණයක් විසින් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරන ලද්දේ යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ තැනැත්තා විසින් අභියාචනාධිකරණය වෙත අභියාචනය කළ හැකි අතර ඒ සෑම අභියාචනයක් ම මේ සංග්‍රහයේ විධිවිධානවලට යටත් විය යුතු ය.

(4) මේ වගන්තියෙන් දෙනු ලැබූ බලය ක්‍රියාත්මක කිරීම වෙනුවට, සුදුසු යයි අධිකරණය කල්පනා කරන්නේ නම්, මේ සංග්‍රහය මගින් නීතිපතිවරයා වෙත පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කිරීමට නීතිපතිවරයාට හැකි වනු පිණිස අධිකරණ කටයුත්තේ වාර්තාව ඒ අධිකරණය විසින් නීතිපතිවරයා වෙත යැවිය හැකි ය.

මහාධිකරණයේ විනිශ්චයකාරවරයන් තිදෙනකු විසින් ජූරි සභාවක් නොමැතිව නඩු විභාග කළ හැකි බව
(1988 අංක 21 § 2)

**450.** (1) වෙනත් යම් ලිඛිත නීතියක හෝ මේ සංග්‍රහයේ වෙනත් යම් විධිවිධානයක හෝ පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, දණ්ඩ නීති සංග්‍රහයේ 114 වන, 115 වන හෝ 116 වන වගන්තිය යටතේ දඬුවම් කළ හැකි යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධ නඩු විභාගය මහාධිකරණයේ විශේෂ අධිකරණය ඉදිරියෙහි විනිශ්චයකාරවරයන් තිදෙනකු විසින් ජූරි සභාවක් නොමැතිව පවත්වනු ලැබිය යුතු ය.

(2) වරදේ ස්වභාවය අනුව හෝ වරද සිදු කිරීමේ අවස්ථානුගත කාරණා අනුව සහ වරද සිදු කිරීමට අදාළව පැවති අවස්ථානුගත කාරණා අනුව, යුක්තිය ඉෂ්ට කිරීම අරමුණ, විශේෂ අධිකරණයක් විසින් නඩු විභාගයක් පැවැත්විය යුතු බව අග විනිශ්චයකාරවරයාගේ මතය වන අවස්ථාවක දී ඒ වරද සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව නඩු විභාගය ජූරි සභාවක් නොමැතිව මහාධිකරණයේ විශේෂ අධිකරණයක් ඉදිරියෙහි විනිශ්චයකාරවරයන් තිදෙනකු විසින් පැවැත්විය යුතු යයි අග විනිශ්චයකාරවරයා විසින් තම අත්සන යටතේ වූ ආඥාවක් මගින් විධාන කළ හැකි ය. මුල් අධි කාර්.

(3) මේ වගන්තිය යටතේ මහාධිකරණය ඉදිරියෙහි නඩු විභාගයක් නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන අධිචෝදනා පත්‍රයක් මත හෝ නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු මත පවත්වනු ලැබිය හැකි ය.

(4) මේ සංග්‍රහයෙහි හෝ වෙනත් යම් නීතියක හෝ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද ජූරි සභාවක් නොමැතිව මහාධිකරණයේ විශේෂ අධිකරණයක් ඉදිරියෙහි විනිශ්චයකාරවරයන් තිදෙනකු විසින් විභාගයක් පැවැත්විය යුතු යම් වරදක් පිළිබඳව තොරතුරු නීතිපතිවරයා විසින් මහාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(5) (අ) මේ වගන්තිය යටතේ මහාධිකරණයේ විශේෂ අධිකරණයක් ඉදිරියෙහි වූ නඩු විභාගයක් හැකිතාක් ඉක්මණින් පවත්වනු ලැබිය යුතු අතර, අධිකරණය විසින් ආඥා කරනු ලබන්නා වූ හෝ මේ සංග්‍රහය යටතේ සාදන ලද රීති මගින් නියම කර ඇත්තා වූ, හෝ සුළු වශයෙන් වූ වෙනස් කිරීම්වලට යටත්ව, මහාධිකරණය ඉදිරියෙහි ජූරි සභාවක් නොමැතිව පැවැත්වෙන නඩු විභාගය සඳහා විධිවිධාන සලස්වා ඇති ආකාරයට හැකි පමණ ආසන්න ලෙස, එබඳු නඩු විභාගයක් පවත්වා ගෙන යනු ලැබිය යුතු ය .

(ආ) අසාමාන්‍ය අවස්ථාගත කරුණු නිසා හොවේ නම් මිස, මහාධිකරණයේ විශේෂ අධිකරණයක් විසින් පවත්වනු ලබන නඩු විභාගයක්, එය ඉක්මණින් නිම කිරීමට හැකිවන පරිදි දිනපතා පවත්වාගෙන යා යුතු ය. යම් කිසි නිශ්චිත දිනයක යම් නිශ්චිත නීතිඥවරයකුට (එම දිනයේ දී වෙනත් යම් අධිකරණයක හෝ විනිශ්චයාධිකාරයක පෙනී සිටීමට යොදාගෙන තිබීම ඇතුළුව) පෞද්ගලික හේතු නිසා මහාධිකරණයේ විශේෂ අධිකරණය ඉදිරියේ පෙනී සිටීමට නොහැකි වීම, නඩු විභාගය ආරම්භ කරන දිනය කල් දැමීමට හේතුවක් නොවිය යුතු අතර, එය නඩු විභාගය කල්දැමීම අවශ්‍ය වන අසාමාන්‍ය අවස්ථාගත කරුණක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(ඇ) මේ වගන්තිය යටතේ මහාධිකරණයේ විශේෂ අධිකරණයක් ඉදිරියේ පවත්වන ලද නඩු විභාගයක දී දෙන ලද යම් නඩු තීන්දුවකට, දණ්ඩන නියමයකට හෝ ආඥාවකට විරුද්ධව වූ යම් අභියාචනයක් විභාග කිරීම හා නිම කිරීම සම්බන්ධයෙන්, මේ උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(ඈ) මහාධිකරණයේ විශේෂ අධිකරණයක විනිශ්චයකාරවරයකු මිය ගිය හොත්, ඉල්ලා අස්වුව හොත් හෝ යම් නඩු විභාගයක් ආරම්භ කිරීමට පෙර හෝ ආරම්භ වූ පසුව එම මුළු නඩු විභාගයෙන් ම හෝ එහි කොටසකින් නිදහස් කරන ලෙස ඉල්ලා සිටියහොත් හෝ ක්‍රියා කිරීමට ප්‍රතික්ෂේප කළහොත් නැතහොත් ක්‍රියාකිරීමට නොහැකි වුව හොත් හෝ ඒ මුළු නඩු විභාගය ම හෝ එහි යම් කොටසක් විභාග කිරීම සඳහා ඔහු වෙනුවට ශ්‍රී ලංකා මහාධිකරණයේ වෙනත් විනිශ්චයකාරවරයකු, අග්‍රවිනිශ්චයකාරවරයා විසින් නම් කරනු ලැබිය හැකි ය.

(ඉ) ඒ නම් කිරීම කරනු ලබනතෙක් නඩු විභාගය මහාධිකරණයේ විශේෂ අධිකරණයේ ඉතිරි විනිශ්චයකාරවරයා හෝ විනිශ්චයකාරවරයන් ඉදිරියේ දිගටම පවත්වාගෙන යා හැකි වන අතර, (ඇ) ඡේදයේ සඳහන් මරණයෙන්, ඉල්ලා අස්වීමෙන්, නිදහස් වීමෙන්, ක්‍රියාකිරීමට ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ ක්‍රියා කිරීමට නොහැකි වීමෙන් එක් සතියක් ඇතුළත එවැනි නම් කිරීමක් කරනු නොලැබුවහොත් නඩු විභාගය, ඒ මහාධිකරණයේ විශේෂ අධිකරණයේ ඉතිරි විනිශ්චයකාරවරයා හෝ විනිශ්චයකාරවරයන් ඉදිරියේ දිගටම පවත්වාගෙන ගොස් අවසන් කළ යුතු ය.

(ඊ) (ඇ) ඡේදය යටතේ අලුත් විනිශ්චයකාරවරයකු නම් කරනු ලැබ ඇති අවස්ථාවක ඒ නම් කිරීමට පළමුව ලබාගෙන ඇති යම් සාක්ෂියක් නැවත ලබා ගැනීම අවශ්‍ය නොවිය යුතු අතර ඒ නම් කිරීමට පෙරාතුව ම පැවති අවස්ථාවේ සිට මහාධිකරණයේ විශේෂ අධිකරණය විසින් නඩු විභාගය දිගටම පවත්වාගෙන යාමට හිමකම තිබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ මහාධිකරණයේ විශේෂ අධිකරණයක් ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයක දී, අධිකරණය විසින් හෝ එහි මුලාසනාරූඪ විනිශ්චයකාරවරයා විසින් හෝ මේ වගන්තිය යටතේ අධිචෝදනා පත්‍රයක් පිට හෝ මේ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද තොරතුරු මත ඒ අධිකරණය ඉදිරියේ චෝදනා ලබා ඇති සියලු තැනැත්තන් කැඳවීම, සිර භාරයට ගැනීම, අත් අඩංගුවට ගැනීම හෝ ඔවුන්ට ඇප නියම කිරීම සම්බන්ධයෙන් විධාන නිකුත් කළ හැකි ය:

එසේ වුව ද, නීතිපතිවරයාගේ අනුමැතිය ඇතිව හැර එවැනි යම් තැනැත්තකුට ඇප නියම කරනු නොලැබිය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ මහාධිකරණය ඉදිරියෙහි අධිචෝදනා නගා ඇත්තේ හෝ ඒ ඉදිරියෙහි වූ තොරතුරු මත චෝදනා නගා ඇත්තේ යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ තැනැත්තා විසින්, නඩු විභාගයේ දී චෝදක පක්ෂය විසින් කැඳවීමට අපේක්ෂා කරනු ලබන සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශවල පිටපත් සහ ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරනු ලබන ලේඛනවල පිටපත් තමා වෙත සපයන ලෙස ඒ නඩු විභාගය ආරම්භ කිරීමට යටත් පිරිසෙයින් සති දෙකකට කලින් ලිඛිත ඉල්ලීමක් මගින්

මහාධිකරණයෙන් ඉල්ලා සිටිය හැකි අතර ඒ සියලු ප්‍රකාශවල හෝ ලේඛනවල පිටපත් හෝ අධිකරණයේ අභිමතය පරිදි සුදුසු යයි අධිකරණය සලකන ප්‍රකාශවල සහ ලේඛනවල පිටපත් පමණක් හෝ ඒ තැනැත්තාට නීතිපතිවරයා විසින් දිය යුතු යයි අධිකරණය විසින් විධාන කළ හැකි ය.

(8) මේ වගන්තිය යටතේ යම් තැනැත්තකුට විරුද්ධව මහාධිකරණය ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයක දී, ඒ තැනැත්තා පැන ගොස් සැඟවී සිටින බවට හෝ රෝගාතුර බව බොරුවට අඟවන බවට හෝ දිවයිනෙන් බැහැර ගොස් ඇති බවට හෝ අධිකරණයට පැමිණීම වෙනත් ආකාරයකින් මග හරින බවට හෝ පැමිණ සිටිමින් නඩු විභාගය පවත්වාගෙන යාමට බාධා කරන හැනහොත් අවහිර කරන බවට හෝ අධිකරණය සෑහීමට පත්වන්නේ නම්, ඒ නඩු විභාගය ඒ තැනැත්තා අනභිමුඛයේ දී ආරම්භ කිරීම හෝ පවත්වා ගෙන යාම හෝ කළ හැකි ය.

විනිශ්චයකාරවරයන් නම් කිරීම සහ අභියාචන.
[1988 අංක 11 § 9 ]
[1988 අංක 21 § 3]

**451.*** (1)450 වන වගන්තිය යටතේ මහාධිකරණයේ විශේෂ අධිකරණයක් ඉදිරියේ නඩු විභාගයක් පැවැත්වෙන සෑම අවස්ථාවක දී ම, ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයන් සහ ඒ නඩු විභාගය පැවැත්විය යුතු ස්ථානය නම් කිරීම පිළිබඳ ප්‍රශ්නයට, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ අදාළ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) එකම කලාපයක හෝ පළාතක නඩු විභාග පැවැත්වීම සඳහා විශේෂ අධිකරණ විභාග පවත්වන මහාධිකරණ සංයුක්ත විමට විනිශ්චයකාරවරයන්ගේ එක් විනිශ්චයාසනයකට වැඩි ගණනක් අගු විනිශ්චයකාරයා විසින් නම් කළ හැකි අතර එසේ නම් කරන ලද විනිශ්චයාසන විසින් එකම වේලාවේ දී එම විනිශ්චයාසනවල නඩු විභාග ආරම්භ කර පවත්වාගෙන යා හැකි ය

* 451 වන වගන්තිය 1988 අංක 21 දරන පනතේ 3 වන වගන්තියෙන් ඉවත් කර ප්‍රතියෝජනය කර ඇත. කෙසේ වෙතත් 1988 අංක 11 දරන පනතේ 9 වන වගන්තියෙන් 451 වන වගන්තියට කරනු ලැබූ සංශෝධනය 1991.11.28 දින සිට ක්‍රියාත්මක වේ. 1991 .9 .5 දින අංක 678/14 විශේෂ ගැසට් පත්‍රය බලන්න.

(3) මේ සංග්‍රහයේ හෝ වෙනත් යම් නීතියක හෝ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද 450 වන වගන්තිය යටතේ පවත්වන ලද නඩු විභාගයක දී දෙන ලද යම් නඩු තීන්දුවකට, දණ්ඩන නියමයකට හෝ ආඥාවකට විරුද්ධව අභියාචනයක් කළ හැකි ය. එවැනි අභියාචනයක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කළ යුතු අතර, අග්‍ර විනිශ්චයකාරයා විසින් නම් කරනු ලබන එම අධිකරණයේ විනිශ්චයකාරවරයන් පස් දෙනකුට නොඅඩු විනිශ්චයකාර මණ්ඩලයක් විසින් එවැනි අභියාචනයක් විභාග කළ යුතු ය. ඒ විනිශ්චයකාර මණ්ඩලයට අග්‍ර විනිශ්චයකාරවරයා විසින් තමා ම නම් කිරීම නීත්‍යනුකූල විය යුතු ය.

(4) ජූරි සභාවක් නොමැතිව විභාග කරන ලද නඩු වල දී මහාධිකරණය විසින් දෙන ලද නඩු තීන්දුවලට, දණ්ඩන නියමවලට සහ ආඥාවලට විරුද්ධව අභියාචනාධිකරණයට ඉදිරිපත් කෙරෙන අභියාචන පාලනය කෙරෙන මේ සංග්‍රහයේ සහ වෙනත් යම් ලිඛිත නීතියක වූ විධිවිධාන, 450 වන වගන්තිය යටතේ මහාධිකරණයේ විශේෂ අධිකරණයක් ඉදිරියේ වූ නඩු විභාගයක දී දෙන ලද නඩු තීන්දුවලට, දණ්ඩන නියමවලට සහ ආඥාවලට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත (3) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද අභියාචනවලට අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

අතවරයට පත් වූ ළමයාගේ භාරකාරත්වය ආරක්ෂා ස්ථානයකට පැවරීමේ බලපත්‍රය [1998 අංක 28 § 4]

**451 අ.** (1) ළමා අපචාරය සම්බන්ධයෙන් වූ අධිචෝදනාවක් හෝ චෝදනාවක් යම් අධිකරණයක ගොනු කොට ඇති අවස්ථාවක දී ඒ ළමා අපචාරය සිදු කර ඇතැයි කියනු ලබන්නේ යම් ළමයකු සම්බන්ධයෙන් ද ඒ ළමයා රැක බලා ගැනීම සහ ඔහුට ආරක්ෂාව සැලසීම සඳහා ඒ ළමයා ආරක්ෂා ස්ථානයක රඳවන මෙන් ඒ අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

(2) ළමා අපචාරය සිදු කර ඇතැයි කියනු ලබන්නේ යම් ළමයකු සම්බන්ධයෙන් ද ඒ ළමයාගේ රැකවරණය හා ආරක්ෂාව සඳහා ඒ ළමයා ආරක්ෂා ස්ථානයක තැබිය යුතු යයි අධිකරණය විසින් (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබූ අවස්ථාවක, දෙවන උප ලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ බලපත්‍රයක් ඒ අධිකරණය විසින් අත්සන් කොට ඒ අධිකරණයේ පිස්කල් වෙත භාර දිය යුතු ය.

විභාගය හෝ නඩු විභාගය පවත්වනු ලබන තෙක් ස්ත්‍රීන් සහ වයස අවුරුදු දහසයට අඩු තැනැත්තන් අත් අඩංගුවෙහි තැබීම.

**452.** විභාගයක් හෝ නඩු විභාගයක් හෝ පවත්වනු ලබන තෙක් යම් තැනැත්තකු භාරයට නියම කිරීම සඳහා හෝ රිමාන්ඩ් භාරයේ තැබීම සඳහා හෝ යම් ලිඛිත නීතියකින් බලය දෙනු ලැබූ සෑම අවස්ථාවක දී ම, ඒ තැනැත්තා ස්ත්‍රියක හෝ වයස අවුරුදු දහසයට අඩු තැනැත්තකු නම් ඒ තැනැත්තා භාරයට නියම කිරීම හෝ බන්ධනාගාරයක අධිකාරීවරයාගේ භාරයට නියම කිරීම හෝ රිමාන්ඩ් කිරීම වෙනුවට, ඒ තැනැත්තා ස්ත්‍රියක හෝ වයස අවුරුදු දහසයට අඩු හොවීහි නම් ඒ නීතිය යටතේ භාරයට නියම කිරීමක් හෝ රිමාන්ඩ් කිරීමක් හෝ අණ කරනු ලැබිය හැකි කාලසීමාවකට, ඒ තැනැත්තා පරිවාස නිලධරයකුගේ භාරය යටතේ හෝ අනුමත නිවාසයක හෝ සිටිය යුතු යයි අධිකරණය විසින් විධාන කළ හැකි ය.

මේ වගන්තියෙහි "අනුමත නිවාසය" යන්නෙන් ස්ත්‍රියක් හෝ වයස අවුරුදු දහසයට අඩු තැනැත්තන් සඳහා වූ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නිවේදනයකින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්තා වූ ද නිවාසයක් හෝ වෙනත් සමාන ආයතනයක් අදහස් වේ.

රීති සෑදීමට ශ්‍රේෂ්ඨාධිකරණයට ඇති බලය.

**453.** (1) මේ සංග්‍රහයේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හෝ බල ගැන්වීම හෝ ආකෘතියක් නියම කළ යුතු යයි අග්‍ර විනිශ්චයකාරවරයා සලකනු ලබන්නේ අධිකරණවල යම් නඩු කටයුත්තක් සඳහා ද ඒ සියලු අධිකරණවල ඒ සෑම නඩු කටයුතු සඳහා ආකෘති නියම කිරීම පිණිස හෝ රීති සෑදීමට මේ සංග්‍රහයෙන් බලය පවරා ඇත්තේ යම් කාරණා සඳහා ද ඒ කාරණා සඳහා හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් අතුරින් කවර හෝ විනිශ්චයකාර වරයන් තිදෙනකු සමග අග්‍ර විනිශ්චයකාරවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට හානි කර බලපෑමක් නොවන පරිදි කලින් කළ රීති සෑදීම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන රීති, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇති ආකාරයට සාදනු ලැබිය යුතු ය.

නඩු විභාග සහ අභියාචන සඳහා ප්‍රමුඛත්වය දිය යුතු බව.
[1998 අංක 28 § 5]

**453අ.** ළමා අපචාරය සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ චෝදනා ලැබූ හෝ අධිචෝදනා ලැබූ යම් තැනැත්තකු පිළිබඳ නඩු විභාගයට සහ ළමා අපචාරය පිළිබඳව යම් තැනැත්තකු වරදකරු කිරීමට කර ඇති යම් අභියාචනයක් සහ

එසේ වරදකරු කිරීම මත පනවන ලද යම් දණ්ඩන නියමයකට විරුද්ධව විභාග කිරීම සඳහා සෑම අධිකරණයක් විසින් ම ප්‍රමුඛතාව දෙනු ලැබිය යුතු ය.

**454.** 453 වන වගන්තියෙන් පවරන ලද බලයට යටත්ව, දෙවන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘති, එක් එක් අවස්ථාව අනුව අවශ්‍ය විය හැකි වෙනස් කිරීම් සහිතව, ඒ උපලේඛනයෙහි සඳහන් ඒ ඒ කාර්ය සඳහා පාවිච්චි කරනු ලැබිය යුතු ය. ආකෘති.

**455.** මේ සංග්‍රහය යටතේ යම් දේපළක් විකිණීම සම්බන්ධයෙන් යම් රාජකාරියක් කිරීමට ඇත්තා වූ රජයේ සේවකයකු විසින් එවැනි විකිණීමක දී ඒ දේපළ මිලට ගැනීම හෝ ඒ දේපළ සඳහා ලංසු තැබීම හෝ නොකළ යුතු ය. මේ සංග්‍රහය යටතේ වූ විකිණීම්වල දී රජයේ සේවකයන් ලංසු නොතැබිය යුතු බව .

**456.** මිනීමැරුම හෝ රාජ්‍ය ද්‍රෝහය සඳහා නඩු පැවරීමේ අයිතියට කිසියම් කාල සීමාවක් ඉකුත් වීම බාධාවක් නොවිය යුතු නමුදු (නීතිය මගින් විශේෂ විධිවිධාන සලස්වා ඇත්තා වූ හෝ සලස්වනු ලබන්නා වූ අපරාධ හෝ වැරදි හැර) වෙනත් යම් අපරාධයක් හෝ වරදක් සඳහා නඩු පැවරීමේ අයිතියට ඒ අපරාධය හෝ වරද සේ කරනු ලැබූ වේලාවේ සිට අවුරුදු විස්සක් ගතවීම බාධාවක් විය යුතු ය. අපරාධ හෝ වැරදි සඳහා වූ කාලාපගමන කාලසීමාව.

**456*** අ. මේ පනතේ යම් විධිවිධානයකට අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම නිසා සෑහෙන ප්‍රමාණයකින් යුක්තිය ඉටු නොවීමක් සිදු වී ඇත්නම් මිස, යම් පැමිණිල්ලක්, ඉහළ අධිකරණයකට තැබීමක නැතහොත් අධිචෝදනාවක වලංගුභාවය හෝ යම් සාක්ෂියක ආවේශ්‍යතාව කෙරෙහි එවැනි පැහැර හැරීමක් බල නොපෑ යුතු ය. නැතහොත් බලපාන ලද්දේ යයි නොසැලකිය යුතු ය. පනත අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම පැමිණිලි ආදියෙහි වලංගු භාවය කෙරෙහි බල නොපෑ යුතු බව. [1980 අංක 52 § 15]

**457.** (1) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ II වන සහ IV වන පරිච්ඡේද මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ. පරිච්ඡින්න කිරීම් හා තබා ගැනීම් සහ අන්තර් කාලීන විධිවිධාන.

* 1980 අංක 52 දරන සංශෝධන පනත සහතික කරනු ලැබූයේ 1980.12.6 වන දිනය. කෙසේ වෙතත් මෙම පනතේ විධිවිධාන 1979 ජූලි මස 2 වන දිනට අතීතයට බලපාන පරිදි ක්‍රියාත්මක විය.

(2) නියමිත දිනයට ඉහතින්ම වූ දිනයෙහි යම් අධිකරණයක විනිශ්චයට භාජනව ඇති යම් අභියාචනයක්, ඉල්ලීමක්, නඩු විභාගයක්, පරීක්ෂණයක් හෝ විමර්ශනයක් අවස්ථාවෝචිත පරිදි, හැකිතාක් දුරට මේ සංග්‍රහයේ විධිවිධාන යටතේ තීරණය කර අවසන් කිරීම, පවත්වාගෙන යාම, පැවැත්වීම හෝ කිරීම කළ හැකි ය.

(3) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ දෙවන උපලේඛනය යටතට අයත් වන වරදක් නියමිත දිනයට පෙර සිදු කර ඇත්තා වූ ද ඒ වරද සම්බන්ධයෙන් අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කර නොමැති වූ ද අවස්ථාවක XV වන පරිච්ඡේදය යටතේ මූලික පරීක්ෂණයක් පවත්වා මේ සංග්‍රහයේ විධිවිධාන අනුව ක්‍රියා කර ගෙන යා යුතු යයි නීතිපතිවරයා මහෙස්ත්‍රාත්වරයාට විධාන කළහොත් මහෙස්ත්‍රාත්වරයා විසින් එසේ කළ යුතු ය :

එසේ වුව ද එවැනි වරදක් සම්බන්ධයෙන් ඒ වරදේ ස්වභාවය සහ වරදේ අවස්ථානුගත කාරණා ගැන සැලකිලිමත්ව, මහාධිකරණයේ දී ජූරි සභාවක් මගින් පවත්වනු ලබන නඩු විභාගයකට පෙනී සිටීම පිණිස, චූදිතයාට කෙළින්ම අධිචෝදනා කිරීම සුදුසු යයි නීතිපතිවරයා කල්පනා කරන අවස්ථාවක, නීතිපතිවරයා විසින් එසේ අධිචෝදනා කළ හැකි අතර, එවිට ඒ නඩු විභාගය හැකිතාක් දුරට මේ සංග්‍රහයේ විධිවිධාන යටතේ ඒ මහාධිකරණයෙහි ජූරි සභාවක් ඇතිව පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

(4) නියමිත දිනයට පෙර සිදු කරන ලද (එහෙත් 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ දෙවන උපලේඛනයෙහි සඳහන් වැරදි ලැයිස්තුවට අයත් නොවන) යම් වරදක් සම්බන්ධයෙන් ඒ වරදේ ස්වභාවය සහ සිදු කිරීමේ අවස්ථානුගත කාරණා ගැන සැලකිලිමත්ව, ජූරි සභාවක් නැතිව නඩු විභාග කිරීම සඳහා කෙලින් ම අධිචෝදනා පත්‍රයක් මහාධිකරණයට ඉදිරිපත් කිරීම සුදුසු යයි නීතිපතිවරයා කල්පනා කරන අවස්ථාවක, නීතිපතිවරයා විසින් එසේ අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කළ හැකි අතර, එවිට ඒ නඩු විභාගය හැකිතාක් දුරට මේ සංග්‍රහයේ විධිවිධාන යටතේ මහාධිකරණයෙහි පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(5) නියමිත දිනයට පෙරාතුව ම බලපැවැත් වූ නීතිය යටතේ පළ කරන ලද සියලු නිවේදන ද, නිකුත් කරන ලද සියලු ප්‍රකාශන ද, පවරන ලද සියලු බලතල ද, නියම කරන ලද සියලු ආකෘති ද, නිශ්චය කර දක්වන ලද සියලු දණ්ඩන නියමයන් ද, කරන ලද සියලු ආඥා ද, සාදන ලද සියලු රීති ද, කරන ලද සියලු පත් කිරීම් ද මේ සංග්‍රහයේ අනුරූප විධිවිධාන යටතේ, පිළිවෙලින්, පළ කරන ලද, නිකුත් කරන ලද, පවරන ලද, නියම කරන ලද, නිශ්චය කරන ලද,පනවන ලද, කරන ලද හෝ සාදන ලද ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ විධිවිධාන යටතේ එකඟවන ලද යම් අනුමතයක් අනුව හෝ දෙන ලද යම් කැමැත්තක් අනුව ඒ පනත යටතේ නඩු කටයුතු ආරම්භ නොකරනු ලැබුවේ ද නැතහොත් නියමිත දිනයට පෙරාතුවම වූ දිනයෙහි නඩු කටයුතු අවසන් නොවී පවතී ද, ඒ අනුමතය හෝ කැමැත්ත මේ සංග්‍රහයේ අනුරූප විධිවිධාන යටතේ එකඟවන ලද්දේ යයි හෝ දෙන ලද්දේ යයි සලකනු ලැබිය යුතු අතර, ඒ අනුමතය අනුව හෝ කැමැත්ත අනුව මේ සංග්‍රහය යටතේ, අවස්ථාවෝචිත පරිදි, නඩු කටයුතු ආරම්භ කිරීම හෝ පවත්වාගෙන යාම හෝ කළ හැකි ය.

(7) අභියාචනයක් හෝ ඉල්ලීමක් නැතහොත් වෙනත් නඩු කටයුත්තක් ඉදිරිපත් කිරීම හෝ, කාර්ය පටිපාටිය පිළිබඳ යම් පියවරක් ගැනීම හෝ සඳහා නියමිත දිනයට ඉහතින්ම බල පැවැත් වූ නීතිය මගින් නියම කර තිබුණු කාල සීමාව නියමිත දිනයට පෙර ඉකුත් වී තිබුණේ නම්, මේ සංග්‍රහය මගින් ඒ සඳහා වඩා දීර්ඝ කාල සීමාවක් නියම කොට තිබීම හෝ කාලය දීර්ඝ කිරීම සඳහා මේ සංග්‍රහයෙහි විධිවිධාන සලස්වා තිබීම හෝ කලින් ලබාගත නොහැකි වූ වෙනත් සහනයක් මේ සංග්‍රහයෙන් සලස්වා තිබීම හෝ පමණක් හේතු කොටගෙන එබඳු යම් අභියාචනයක් හෝ ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට හෝ නඩු කටයුත්තක් ආරම්භ කිරීමට හෝ කාර්ය පටිපාටිය පිළිබඳ පියවරක් ගැනීමට හෝ මේ සංග්‍රහයෙහි සඳහන් කිසිවකින් ඉඩ සලස්වන්නේ යයි අර්ථ නිරූපණය කරනු නොලැබිය යුතු ය.

(8) නියමිත දිනයට ඉහතින් ම වූ දිනයෙහි, අධිචෝදනා පත්‍ර මත මහාධිකරණයෙහි විනිශ්චයට භාජනව තිබූ සියලු නඩු ඒ අධිචෝදනා පත්‍ර, මේ සංග්‍රහයේ විධිවිධාන යටතේ ඉදිරිපත් කරන ලද්දාක් මෙන්, හැකිතාක් දුරට මහාධිකරණය විසින් විභාග කොට අවසන් කරනු ලැබිය යුතු ය.

[1979 අංක 36 § 2] (8අ) අධිචෝදනා පත්‍රයක් මත නියමිත දිනයට කලින් මහාධිකරණයේ නඩු පවරා ඇත්තා වූ ද, ඒ අධිචෝදනා පත්‍රයෙහි සඳහන් වරද හෝ එහි වැරදි එකකට වැඩි ගණනක් සඳහන්ව ඇති අවස්ථාවක, ඉන් යම් වරදක් හෝ 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි පිළිබඳ ලැයිස්තුවට ඇතුළත් වන වරදක් නොවන්නා වූ ද, නියමිත දිනයට ඉහතින්ම වූ දිනයෙහි ඒ නඩු කටයුතු විනිශ්චයට භාජනව පවත්නා වූ ද අවස්ථාවක, ඒ අධිචෝදනා පත්‍රය මත වූ නඩු විභාගය, ජූරි සභාවක් නොමැතිව තනිව නඩු විභාග කරන මහාධිකරණ විනිශ්චයකාරවරයකු ඉදිරිපිට පැවැත්විය යුතු ය.

[1979 අංක 36 § 2] (8ආ) මේ සංග්‍රහයේ විධිවිධාන යටතේ මහාධිකරණය විසින් ම පමණක් නඩු විභාග කරනු ලැබිය යුතු වරදක් සම්බන්ධයෙන්, නියමිත දිනයට පෙරාතුව මහෙස්ත්‍රාත් අධිකරණයක නඩු කටයුතු පවරා ඇත්තා වූ ද නියමිත දිනයට ඉහතින් ම වූ දිනයෙහි ඒ නඩු කටයුතු විනිශ්චයට භාජනව පවතින්නා වූ ද අවස්ථාවක, මේ සංග්‍රහයේ හෝ වෙනත් යම් නීතියක හෝ විධිවිධාන කෙසේ වුව ද ඒ කාරණය විභාග කොට තීරණය කිරීමට හෝ දිගටම විභාග කොට නිම කිරීමට හෝ ඒ මහෙස්ත්‍රාත් අධිකරණයට අධිකරණ බලය තිබිය යුතු ය.

(9) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ 3 (1) (ඇ) වන වගන්තිය මගින් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකන ලද අපරාධ වැළැක්වීමේ ආඥාපනතේ සහ වරදකරුවන් පරිවාසයේ තැබීමේ ආඥාපනතේ විධිවිධාන, ඒ විධිවිධාන පරිච්ඡින්න කරනු ලැබූ ලෙස නොසලකන ලද්දාක් මෙන් ක්‍රියාත්මකව පැවතියේ යයි ද ක්‍රියාත්මකව පවතී යයි ද සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

නියෝග. **458**. (1) නියෝග සෑදීමට මේ සංග්‍රහයෙන් බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙහි හෝ නියෝගවල සඳහන් කරනු ලබන යම් පසු දිනයක හෝ ඒ නියෝගය බලාත්මක වන්නේ ය.

(3) සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, ඒ අනුමතයේ දින සිට අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක එසේ අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලබන්නේ යම් දිනයක ද ඒ දිනය ගැසට් පිටුවෙහි පළ කරනු ලැබිය යුතු ය.

## පළමුවන උපලේඛනය

(10 වන සහ 11 වන වගන්ති)

### වැරදි පිළිබඳ වර්ගීකරණ ප්‍රකාශය පැහැදිලි කිරීමේ සටහන්

(1)මෙම උපලේඛනයෙහි පිළිවෙලින් " වැරදි " හා " දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් "යන ශීර්ෂ වලින් යුත් දෙවන හා හත් වන තීරුවල දැක්වෙන සටහන් පළමුවන තීරයේ අංක දක්වා ඇති වගන්තිවල විෂයයන් පිළිබඳ හුදු සඳහන් කිරීමක් ලෙස මිස දණ්ඩ නීති සංග්‍රහයේ අනුරූප විවිධ වගන්තිවල විස්තර කර ඇති වැරදි හා දණ්ඩන පිළිබඳ අර්ථ නිරූපණයක් ලෙස හෝ එම වගන්තිවල උද්ධෘත කොටස් ලෙස හෝ නොසැලකිය යුතු යි.

(2) මෙම උපලේඛනයේ තුන්වන තීරයේ වූ සටහන් සාම නිලධරයන් විසින් නීත්‍යානුකූලව ක්‍රියාවේ යෙදවිය හැකි වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගැනීමේ බලතල කිසිම ආකාරයකින් සීමා කරන්නක් ලෙස අදහස් නොකළ යුතු ය.

| 1<br>වගන්තිය | 2<br>වරද | 3<br>සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4<br>පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5<br>ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6<br>සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7<br>දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් | 8<br>මහාධිකරණය හැර වෙනත් කවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| | | | | **V වන පරිච්ඡේදය - අනුබල දීම** | | | |
| 102- | වරදක් සිදුවීමට අනුබල දීම එහි ප්‍රතිඵලයක් වශයෙන් අනුබල දෙන ලද ක්‍රියාව කරන ලද නම් හා ඊට දඬුවම් දීමට ප්‍රකාශිත විධිවිධාන සලසා නොමැති අවස්ථාවක | අනුබල දෙන ලද වරද සම්බන්ධයෙන් සිර භාරයට ගැනීම වරෙන්තුවක් නැතිව කළ හැකි නම් වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගත හැකි ය නොඑසේ වූ විට නොහැකි යි | අනුබල දෙන ලද වරද සම්බන්ධයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ හැකි ද යන්න අනුව | අනුබල දෙන ලද වරදට ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන්න අනුව | අනුබල දෙන ලද වරද සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන්න අනුව | අනුබල දෙන ලද වරද සඳහා නියමිත දඬුවමයි | අනුබල දෙන ලද වරද පිළිබඳ නඩු විභාග කළ හැකි අධිකරණය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 103- | යම් වරදකට අනුබල දීම ඒ අනුබල ලැබූ තැනැත්තා අනුබල දුන් තැනැත්තාට වෙනස් වූ චේතනාවකින් යුක්තව ඒ ක්‍රියාව කළේ නම් | එම - | එම - | එම - | එම - | එම - | අනුබල දෙන ලද වරද පිළිබඳ නඩු විභාග කළ හැකි අධිකරණය |
| 104- | අතුරු වගන්තියට යටත්ව එක් ක්‍රියාවකට අනුබල දෙනු ලැබූ නමුත් වෙනස් ක්‍රියාවක් කරන ලද කල්හි යම් වරදකට අනුබල දීම | එම - | එම - | එම - | එම - | අනුබල දෙන්නට අදහස් කරනු ලැබූ වරද සඳහා දෙනු ලබන දඬුවමයි | අනුබල දෙන ලද වරද පිළිබඳ නඩු විභාග කළ හැකි අධිකරණය |
| 106- | අනුබල දෙනු ලැබූ ක්‍රියාවෙන් අනුබල දුන් තැනැත්තා බලාපොරොත්තු වූ ප්‍රතිඵලයට වෙනස් වූ ප්‍රතිඵලයක් ලැබුණු කල්හි එබඳු යම් වරදකට අනුබල දීම | එම - | එම - | එම - | එම - | කරන ලද වරද සඳහා නියමිත දඬුවමයි | අනුබල දෙන ලද වරද පිළිබඳ නඩු විභාග කළ හැකි අධිකරණය |
| 107- | වරද කරන විට අනුබල දුන් තැනැත්තා පැමිණ සිටිය හොත් එබඳු යම් වරදකට අනුබල දීම | එම - | එම - | එම - | එම - | එම - | අනුබල දෙන ලද වරද පිළිබඳ නඩු විභාග කළ හැකි අධිකරණය |

| 1<br>වගන්තිය | 2<br>වරද | 3<br>සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4<br>පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5<br>ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6<br>සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7<br>දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් | 8<br>මහාධිකරණය හැර වෙනත් තවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| 108- | මරණ දඬුවමින් දඬුවම් දිය හැකි වූ වරදකට අනුබල දෙනු ලැබ අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් වරද නොකරන ලද නම් | එම - | එම - | ඇප දිය නොහැකි ය | සමථයට පත් කළ හැකි ය | අවුරුදු හතක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් හා දඩයක් | අනුබල දෙන ලද වරද පිළිබඳ නඩු විභාග කළ හැකි අධිකරණය |
| | හානියක් සිදුවන ක්‍රියාවක් අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් කරන ලද නම් ප්‍රතිඵලයක් වශයෙන් කරන ලද නම් | එම - | එම - | එම - | එම - | අවුරුදු දහ හතරක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් හා දඩයක් | අනුබල දෙන ලද වරද පිළිබඳ නඩු විභාග කළ හැකි අධිකරණය |
| 109- | බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වූ වරදකට අනුබල දෙනු ලැබ, අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් වරදක් සිදු කරනු නොලැබී නම් | එම - | එම - | අනුබල දෙන ලද වරදට ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන්න අනුව | අනුබල දෙන ලද වරද සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන්න අනුව | එම වරදට නියම කර ඇති තවර ආකාරයක හෝ දීර්ඝතම බන්ධනාගාරගත කිරීමේ කාලයෙන් හතරෙන් කොටසකට බන්ධනාගාරගත කිරීමක් හෝ දඩයක් හෝ ඒ දෙකම | අනුබල දෙන ලද වරද පිළිබඳ නඩු විභාග කළ හැකි අධිකරණය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | වරදට අනුබල දෙන්නා හෝ අනුබල ලැබූ තැනැත්තා, ඒ වරද වැළැක්වීමේ කාර්යය නියමිත රජයේ සේවකයකු නම් | අනුබල දෙන ලද වරද සම්බන්ධයෙන් සිරභාරයට ගැනීම වරෙන්තුවක් නැතිව කළ හැකි නම් වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගත හැකි : නොඑසේ වූ විට නොහැකිය. | අනුබල දෙන ලද වරද සම්බන්ධයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ හැකි ද යන්න අනුව | අනුබල දෙන ලද වරදට ඇප දිය හැකි ද නැතහොත් ඇප දිය නොහැකි ද යන්න අනුව | අනුබල දෙන ලද වරද සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන්න අනුව | එම වරදට නියම කර ඇති තවර ආකාරයක හෝ දීර්ඝතම බන්ධනාගාරගත කිරීමේ කාලයෙන් හතරෙන් කොටසකට බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | අනුබල දෙන ලද වරද පිළිබඳ නඩු විභාග කළ හැකි අධිකරණය |
| 110- | මහජනයා ලවා හෝ තැනැත්තන් දසදෙනකුට වැඩි ගණනක් ලවා යම් වරදක් කරවීමට අනුබල දීම | එම - | එම - | එම - | එම - | අවුරුදු තුනක කාලයකට දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් හා දඩය හෝ ඒ දෙකම | අනුබල දෙන ලද වරද පිළිබඳ නඩු විභාග කළ හැකි අධිකරණය |
| 111- | මරණීය දඬුවමින් හෝ අවුරුදු විස්සක කාලයක් බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදක් සිදුකිරීමේ උපක්‍රමයක් වසන් කිරීම වරද සිදුකරන ලද නම් | එම - | එම - | ඇප දිය නොහැකිය | සමථයට පත් කළ නොහැකිය | අවුරුදු හතක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් හා දඩය | අනුබල දෙන ලද වරද පිළිබඳ නඩු විභාග කළ හැකි අධිකරණය |
| | වරද සිදු නොකරන ලද නම් | එම - | එම - | එම - | එම - | අවුරුදු තුනක කාලයකට දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් හෝ දඩය | අනුබල දෙන ලද වරද පිළිබඳ නඩු විභාග කළ හැකි අධිකරණය |

| 1 වගන්තිය | 2 වරද | 3 සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4 පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5 ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6 සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7 දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම | 8 මහාධිකරණය හැර වෙනත් කවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| 112- | යම් වරදක් වළැක්වීම තම කාර්යය වන්නේ ද එවැනි වරදක් සිදු කිරීමේ උපක්‍රමයක් රජයේ සේවකයකු විසින් වසන් කරනු ලැබීමේ වරද කරන ලද නම් | එම - | එම - | අනුබල දෙන ලද වරදට ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන්න අනුව | එම - | එම වරද සඳහා නියම කර ඇති කවර ආකාරයක හෝ දීර්ඝතම බන්ධනාගාරගත කිරීමේ කාලයෙන් භාගයකට බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | අනුබල දෙන ලද වරද පිළිබඳ නඩු විභාග කළ හැකි අධිකරණය |
| | වරදට මරණීය දඬුවමින් දඬුවම් කළ හැකි නම් | එම - | එම - | ඇප දිය නොහැකි ය | එම - | අවුරුදු දහයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් | අනුබල දෙන ලද වරද පිළිබඳ නඩු විභාග කළ හැකි අධිකරණය |
| | වරද සිදු නොකරන ලද නම් | එම - | එම - | අනුබල දෙන ලද වරදට ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන්න අනුව | එම - | එම වරද සඳහා නියම කර ඇති කවර ආකාරයක හෝ දීර්ඝතම බන්ධනාගාරගත කිරීමේ කාලයෙන් හතරෙන් කොටසකට බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | අනුබල දෙන ලද වරද පිළිබඳ නඩු විභාග කළ හැකි අධිකරණය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 113- | බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් සිදු කිරීමේ උපක්‍රමයක් වශයෙන් කිරීම වරද සිදු කරන ලද නම් | එම - | එම - | එම - | එම - | එම වරද සඳහා නියම කර ඇති සවර ආකාරයක හෝ දීර්ඝතම බන්ධනාගාරගත කිරීමේ කාලයෙන් හතරෙන් කොටසකට බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | අනුබල දෙන ලද වරද පිළිබඳ නඩු විභාග කළ හැකි අධිකරණය |
| | වරද සිදු නොකරන ලද නම් | එම - | එම - | එම - | එම - | එම වරද සඳහා නියම කර ඇති සවර ආකාරයක හෝ දීර්ඝතම බන්ධනාගාරගත කිරීමේ කාලයෙන් අටෙන් කොටසකට බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | අනුබල දෙන ලද වරද පිළිබඳ නඩු විභාග කළ හැකි අධිකරණය |

V අ වන පරිච්ඡේදය - කුමන්ත්‍රණය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 113 ආ | යම් වරදක් කිරීම හෝ කිරීමට අනුබල දීම | කුමන්ත්‍රණයට අරමුණ වූ වරද සම්බන්ධයෙන් සිරභාරයට ගැනීම වරෙන්තුවක් නැතුව කළ හැකි නම් වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගත හැකිය නොඑසේ වූ විට නොහැකි ය | කුමන්ත්‍රණයට අරමුණ වූ වරදට වරෙන්තුවක් හෝ සිතාසි නිකුත් කළ හැකිද යන්න අනුව | කුමන්ත්‍රණයට අරමුණ වූ වරදට ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන්න අනුව | සමථයට පත් කළ නොහැකිය | කුමන්ත්‍රණයට අරමුණ වූ වරදට අනුබල දීම සඳහා නියමිත දඬුවම | කුමන්ත්‍රණයට අරමුණ වූ වරද පිළිබඳ නඩුව මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් විභාග කරනු ලැබිය හැකි නම් මහෙස්ත්‍රාත් අධිකරණය |

| 1<br>වගන්තිය | 2<br>වරද | 3<br>සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද, නොහැකි ද යන බව | 4<br>පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5<br>ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6<br>සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7<br>දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම | 8<br>මහාධිකරණය හැර වෙනත් කවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| | | | VI වන පරිච්ඡේදය - රාජ්‍ය විරෝධී වැරදි | | | | |
| 114- | ශ්‍රී ලංකා ජනරජයට විරුද්ධව යුද්ධ කිරීමේ හෝ යුද්ධ කිරීමට තැත් කිරීම හෝ යුද්ධ කිරීමට අනුබල දීම | වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගත හැකිය | වරෙන්තුව | ඇප දිය නොහැකිය | එම - | අවුරුදු දහඅටට අඩු තැනැත්තන් සම්බන්ධයෙන් නම් ජනාධිපතිවරයා කැමති කාලයක් රඳවා තබා ගැනීම හා දේපළ අහිමි කිරීම ; ගර්භණී ස්ත්‍රීන් සම්බන්ධයෙන් නම් ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කිරීම හා දේපළ අහිමි කිරීම; අනිත් සියලුම අවස්ථාවල දී මරණීය දඬුවම හෝ අඩුම වශයෙන් අවුරුදු දහයක් වන නමුත් අවුරුදු විස්සට වැඩි නොවන කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දේපළ රාජ්‍ය සන්තක කිරීම | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 115- | රාජ්‍ය විරෝධී අපරාධ වැරදි කිරීමට කුමන්ත්‍රණය කිරීම | එම - | එම - | එම - | එම - | අවුරුදු විස්සක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය | - |
| 116- | ශ්‍රී ලංකා ජනරජයට විරුද්ධව යුද්ධ කිරීමේ චේතනාවෙන් ආයුධ ආදිය එකතු කිරීම | එම - | එම - | එම - | එම - | අවුරුදු විස්සක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දේපළ රාජ්‍ය සන්තක කිරීම | - |
| 117- | යුද්ධ කිරීමේ උපක්‍රමයක් පහසු කිරීමේ චේතනාවෙන් එය වසන් කිරීම | එම - | එම - | එම - | එම - | අවුරුදු දහයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය | - |
| 118- | ජනාධිපතිවරයා අපහාසයට පාත්‍ර කිරීමට තැත් කිරීම | එම - | එම - | එම - | එම - | අවුරුදු දෙකක කාලයකට බරපතළ වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හා දඩය | - |
| 119- | යම් නීත්‍යනුකූල බලයක් ක්‍රියාත්මක කිරීම බල කිරීම හෝ වැළැක්වීමේ චේතනාවෙන් ජනාධිපති ආදීන්ට අඩන්තේට්ටම් කිරීම | එම - | එම - | එම - | එම - | අවුරුදු හතක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය | - |

| 1<br>වගන්තිය | 2<br>වරද | 3<br>සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4<br>පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5<br>ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6<br>සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7<br>දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් | 8<br>මහාධිකරණය හැර වෙනත් යම් අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| 120- | අනාදරය ඇවිස්සීම හෝ ඇවිස්සීමට තැත් කිරීම | එම - | එම - | එම - | එම - | අවුරුදු දෙකක කාලයකට බිරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හා දඩය | - |
| 121- | ශ්‍රී ලංකා ජනරජය හා සමග සන්ධානයෙන් හෝ සාමයෙන් සිටින යම් රාජ්‍යයකට විරුද්ධව යුද්ධ කිරීම හෝ එවැනි යුද්ධ කිරීමකට අනුබල දීම | එම - | එම - | එම - | එම - | අවුරුදු දහයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය හෝ දඩය | - |
| 122- | ශ්‍රී ලංකා ජනරජය හා සමග සන්ධානයෙන් හෝ සාමයෙන් සිටින යම් රාජ්‍යයකට අයත් ප්‍රදේශවල විලුම්පනය කිරීම | වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගත හැකිය | වරෙන්තුව | ඇප දිය නොහැකි ය | සමථයට පත් කළ නොහැකිය | අවුරුදු හතක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය හා ඇතැම් දේපළ රාජ්‍ය සන්තක කිරීම | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 123- | 121 වන හා 122 වන වගන්තිවල සඳහන් යුද්ධයකින් හෝ විප්ලවයකින් ගත් දේපළ ලබා ගැනීම | වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගත හැකිය | වරෙන්තුව | ඇප දිය නොහැකිය | සමථයට පත් කළ නොහැකි ය | අවුරුදු හතක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය හා ඇතැම් දේපල රාජ්‍ය සන්තක කිරීම | - |
| 124- | තම අත්අඩංගුවේ සිටින රාජ්‍ය සිරකරුවකු හෝ යුද්ධ සිරකරුවකු පැන යාමට රජයේ සේවකයකු විසින් ස්වේච්ඡාවෙන් ම ඉඩ දීම විසින් නොසැලකිලිමත්ව ඉඩ හැරීම | එම - | එම - | එම - | එම - | අවුරුදු විස්සක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය | |
| 125- | තම අත්අඩංගුවේ සිටින රාජ්‍ය සිරකරුවකු හෝ යුද්ධ සිරකරුවකු පැන යාමට රජයේ සේවකයකු | එම - | එම - | ඇප දිය හැකිය | එම - | අවුරුදු තුනක කාලයකට බිරපතළ වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හා දඩය | |

| 1<br>වගන්තිය | 2<br>වරද | 3<br>සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4<br>පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5<br>ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6<br>සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7<br>දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් | 8<br>මහාධිකරණය හැර වෙනත් කවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| 126- | එබඳු සිරකරුවකුට පැන යාමට ආධාර කිරීම ඔහු බේරා ගැනීම හෝ ඔහුට රැකවරණය දීම හෝ එබඳු සිරකරුවකු නැවත අල්ලා ගැනීමට විරුද්ධකම් පෑම | වරෙන්තුවක් නැතිව සිර භාරයට ගත හැකිය | වරෙන්තුව- | ඇප දිය නොහැකිය | සමථයට පත් කළ නොහැකිය | අවුරුදු විස්සක කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය | - |

VII වන පරිච්ඡේදය - නාවික හමුදාවට යුද්ධ හමුදාවට හා ගුවන් හමුදාවට සම්බන්ධ වැරදි

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 128- | නාවික භටයකුට යුද්ධ භටයකුට හෝ ගුවන් භටයකුට හෝ සෙනඟ කැරලි ගැසීම සඳහා අනුබල දීම හෝ ඔහුගේ පක්ෂපාත භාවය හෝ කාර්යය පැහැර හැර වීමට තැත් කිරීම | වරෙන්තුවක් නැතිව සිර භාරයට ගත හැකිය | වරෙන්තුව- | ඇප දිය නොහැකිය | සමථයට පත් කළ නොහැකිය | අවුරුදු විස්සක කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 129- | සෙනඩිය කැරැලි ගැසීමට අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් කැරලි ගැසීම සිදු වුණි නම් එවැනි කැරලි ගැසීමකට අනුබල දීම | එම - | එම - | එම - | එම - | මරණීය දඬුවම හෝ අවුරුදු විස්සක කාලයක බන්ධනාගාරගත කිරීම හා දඩය | |
| 130- | නිලධරයකු නාවික භටයකු යුද්ධ භටයකු හෝ ගුවන් භටයකු විසින් තම ධුරයේ කටයුතු කරමින් සිටින තම උසස් නිලධරයකුට කරනු ලබන අඩන්තේට්ටමකට අනුබල දීම | එම - | එම - | එම - | එම - | අවුරුදු තුනක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය | මහේස්ත්‍රාත් අධිකරණය |
| 131- | ඒ අඩන්තේට්ටමට අනුබල දීමෙන් ඒ අඩන්තේට්ටම සිදු වුණි නම් අඩන්තේට්ටමට අනුබල දීම | එම - | එම - | එම - | එම - | අවුරුදු හතක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය | මහේස්ත්‍රාත් අධිකරණය |

| 1<br>වගන්තිය | 2<br>වරද | 3<br>සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4<br>පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5<br>ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6<br>සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7<br>දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් | 8<br>මහාධිකරණය හැර වෙනත් කවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| 132- | නිලධරයකුට නාවික භටයකුට යුද්ධ භටයකුට හෝ ගුවන් භටයකුට පලා යාම සඳහා අනුබල දීම | වරෙන්තුවක් නැතිව සිරභාරයට ගත හැකිය | වරෙන්තුව | ඇප දිය හැකිය | සමථයට පත් කළ නොහැකිය | අවුරුදු දෙකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩයක් හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 133- | පලා ගිය එබඳු නිලධරයකුට නාවික භටයකුට යුද්ධ භටයකුට හෝ ගුවන් භටයකුට රැකවරණය දීම | එම - | එම - | එම - | එම - | එම - | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 134- | පලා යන්නා නෞකාධිපතිගේ හෝ එය භාරව සිටින තැනැත්තාගේ නොසැලකිල්ල නිසා වෙළෙඳ නැවක සැඟවීම | වරෙන්තුවක් නැතිව සිරභාරයට නොගත යුතුය | සිතාසි | එම - | එම - | රුපියල් පන්සියයක දඩයක් | මහෙස්ත්‍රාත් අධිකරණය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 136- | අභිකරුවීමේ ක්‍රියාවට අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් නිලධරයකු නාවික භටයකු යුද්ධ භටයකු හෝ ගුවන් භටයකු උසස් නිලධරයකුට අභිකරුවීමේ වරද සිදු කළහොත් | වරෙන්තුවක් නැතිව සිර භාරයට ගත හැකිය | වරෙන්තුව | එම - | එම - | මාස හයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 137- | තමා නාවික භටයකු යුද්ධ භටයකු හෝ ගුවන් භටයකු බව විශ්වාස කරවීමේ අදහසින් එබඳු නාවික භටයකුගේ යුද්ධ භටයකුගේ හෝ ගුවන් භටයකුගේ ඇඳුමක් ඇඳීම හෝ එබන්දකු පාවිච්චි කරන යම් සලකුණක් ගෙන යාම | වරෙන්තුවක් නැතිව සිර භාරයට ගත හැකිය | සිතාසි | ඇප දිය හැකිය | සමථයට පත් කළ නොහැක | මාස තුනක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් සියයක දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |

VIII වන පරිච්ඡේදය - මහජන නිසංසලතාවට විරුද්ධ වැරදි

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 140- | නීති විරෝධී රැස්වීමක සාමාජිකයකු වීම | එම - | එම - | එම - | එම - | හය මාසයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |

| 1 වගන්තිය | 2 වරද | 3 සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4 පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5 ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6 සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7 දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම | 8 මහාධිකරණය හැර වෙනත් කවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| 141- | යම් මාරක ආයුධ සිහිවක් ඇතිව නීති විරෝධී රැස්වීමකට සහභාගිවීම | ඩිට- | වරෙන්තුව | ඩිට- | ඩිට- | අවුරුදු දෙකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය හෝ ඒ දෙක | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 142- | විසිර යන ලෙස යම් නීති විරෝධී රැස්වීමකට අණ කරනු ලැබූ බව දැන දැනම එබඳු නීති විරෝධී රැස්වීමකට එකතුවීම හෝ එහි රැඳී සිටීම | ඩිට- | ඩිට- | ඩිට- | ඩිට- | ඩිට- | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 144- | කැරලි ගැසීම - | ඩිට- | ඩිට- | ඩිට- | ඩිට- | ඩිට- | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 145- | මාරක ආයුධයක් අතැතිව කැරලි ගැසීම | ඩිට- | ඩිට- | ඩිට- | ඩිට- | අවුරුදු තුනක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 146- | නීති විරෝධී රැස්වීමක යම් සාමාජිකයකු වරදක් කළ හොත් ඒ රැස්වීමේ අනෙක් සෑම සාමාජිකයකු ම එම වරදට වරදකරු වන බව | එම වරදට වරෙන්තුවක් නැතිව සිර භාරයට ගත හැකි ද නොහැකි ද යන්න අනුව | වරදට නියුක්ත කරන්නේ වරෙන්තුවක් ද නැතහොත් සිතාසියක්ද යන්න අනුව | වරදට ඇප දිය හැකි ද නොහැකි ද යන්න අනුව | වරද සමථයට පත් කළ හැකි ද නොහැකි ද යන්න අනුව | වරදට නියමිත දඬුවමයි | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 147- | නීති විරෝධී රැස්වීමකට සම්බන්ධ කර ගැනීම සඳහා තැනැත්තන් කුලියට ගැනීම යෙදවීම හෝ සේවයෙහි නියුක්ත කර ගැනීම | වරෙන්තුවක් නැතිව සිර භාරයට ගත හැකිය | කුලියට ගන්නා ලද යොදවන ලද හෝ සේවයේ නියුක්ත කර ගන්නා ලද තැනැත්තා විසින් කරන ලද වරද අනුව | වරදට ඇප දිය හැකි ද නොහැකි ද යන්න අනුව | සමථයට පත් කළ නොහැකි ය | එබඳු රැස්වීමක සාමාජිකයකුටත් සාමාජිකයකු විසින් කරනු ලබන වරදකටත් දෙනු ලබන දඬුවමයි | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 148- | තැනැත්තන් පස් දෙනකුගෙන් හෝ ඊට වැඩි ගණනකින් සමන්විත වූ යම් රැස්වීමකට විසිර යාමට අණ කරනු ලැබීමෙන් පසු දැන දැනම ඊට එකතු වීම හෝ එහි රැඳී සිටීම | එම- | සිතාසි | ඇප දිය හැකිය | එම- | මාස හයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 149- | කැරලි ගැසීම ආදිය මැඩ පැවැත් වීමේ දී රජයේ සේවකයකුට අවහිරවීම් කිරීම හෝ බාධා කිරීම | එම - | වරෙන්තුව | එම- | එම- | අවුරුදු තුනක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |

| 1<br>වගන්තිය | 2<br>වරද | 3<br>සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4<br>පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5<br>ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6<br>සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7<br>දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම | 8<br>මහාධිකරණය හැර වෙනත් කවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| 150- | කැරැලි ගැසීමක් සිදු කිරීමේ චේතනාවෙන් කිසිවකු ප්‍රකෝප කරවීම කැරැල්ල සිදු වුවහොත් | එම - | එම - | එම - | එම - | එක් අවුරුද්දක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |
| | කැරැලි ගැසීමක් සිදු නොවුවහොත් | එම - | සිතාසි - | එම - | එම - | මාස හයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |
| 151- | කැරලි ගැසීම ආදිය පිළිබඳව ඉඩම් හිමියා හෝ පදිංචිකරුවා තොරතුරු නොදීම | වරෙන්තුවක් නොමැතිව සිර භාරයට නොගත යුතු ය | සිතාසි - | ඇප දිය හැකිය | සමථයට පත් කළ නොහැකි ය | රුපියල් එක් දහසක දඩය | මහේස්ත්‍රාත් අධිකරණය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 152- | කැරලි ගැසීමක් සිදු කරන ලද්දේ යම් තැනැත්තකුගේ ප්‍රතිලාභය සඳහා හෝ එම තැනැත්තා වෙනුවෙන් ද එම තැනැත්තා එය නැවැත්වීම සඳහා නීත්‍යානුකූලව කළ හැකි සියලු දේම නොකිරීම | එම - | වරෙන්තුව | එම - | එම - | දඩය | මහේස්ත්‍රාත් අධිකරණය |
| 153- | අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ ප්‍රතිලාභය සඳහා කැරලි ගැසීමක් සිදු කරනු ලබන විට එම තැනැත්තාගේ නියෝජිතයා එය නැවැත්වීම සඳහා නීත්‍යානුකූලව කළ හැකි සියලු දේම නො කිරීම | එම - | එම - | එම - | එම - | එම - | මහේස්ත්‍රාත් අධිකරණය |
| 154- | නීති විරෝධී රැස්වීමකට කුලියට ගනු ලැබූ තැනැත්තන්ට රැකවරණය දීම | වරෙන්තුවක් නැතිව සිර භාරයට ගත හැකිය | එම - | එම - | එම - | මාස හයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |

| 1<br>වගන්තිය | 2<br>වරද | 3<br>සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4<br>පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5<br>ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6<br>සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7<br>දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් | 8<br>මහාධිකරණය හැර වෙනත් කවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| 155- | නීති විරෝධී රැස්වීමකට හෝ කැරලි ගැසීමකට සහභාගී වීම සඳහා කුලියට ගනු ලැබීම. | එම - | එම - | එම - | එම - | එම - | මහෙස්ත්‍රාත් අධිකරණය |
| | නැතහොත් ආයුධ අතැතිව යාම | එම - | එම - | එම - | එම - | අවුරුදු දෙකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 157- | කලහ කිරීම | එම - | සිතාසි | එම - | සමථයට පත් කළ හැකිය | මාස එකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් සියයක දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |

IX වන පරිච්ඡේදය - රජයේ සේවකයන් විසින් කරනු ලබන වැරදි හෝ රජයේ සේවකයන්ට අදාළ වැරදි

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 158 - | රජයේ සේවකයකුව හෝ රජයේ සේවකයකු වන්නට බලාපොරොත්තුව සිල ක්‍රියාවක් සම්බන්ධයෙන් නීත්‍යනුකූලව පාරිශ්‍රමිකයක් නොවන තුටු පඬුරක් ගැනීම | වරෙන්තුවක් නැතුව සිර භාරයට නොගත යුතු ය | සිතාසි | ඇප දිය හැකි ය | සමථයට පත් කළ නොහැකි ය | අවුරුදු තුනක කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 159- | දූෂිත හෝ නීති විරෝධී හෝ ක්‍රමයකින් රජයේ සේවකයකු වෙත බලපෑමක් ඇති කිරීම සඳහා තුටු පඬුරක් ගැනීම | එම - | එම - | එම - | එම - | එම - | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 160- | රජයේ සේවකයකු වෙත පෞද්ගලික බලපෑම් කිරීම සඳහා තුටු පඬුරක් ගැනීම | එම - | | | | අවුරුදු එකක කාලයකට බරපතළ වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |

| 1<br>වගන්තිය | 2<br>වරද | 3<br>සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4<br>පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5<br>ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6<br>සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7<br>දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් | 8<br>මහාධිකරණය හැර වෙනත් කවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| 161- | ඉහතින් වූ වගන්ති දෙකෙහි නිශ්චිත වූ වැරදි තමා සම්බන්ධයෙන් කිරීමට රජයේ සේවකයකු විසින් අනුබල දීම | එම - | එම - | එම - | එම - | අවුරුදු තුනක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |
| 162- | යම් තැනැත්තකුට හානියක් සිදු කිරීමේ චේතනාවෙන් නීතියේ විධානයකට රජයේ සේවකයකු අකීකරු වීම | එම - | එම - | එම - | එම - | එක් අවුරුද්දක කාලයකට බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණ |
| 163- | හානියක් සිදු කිරීමේ චේතනාවෙන් සාවද්‍ය ලේඛනයක් රජයේ සේවකයකු විසින් සකස් කරනු ලැබීම | එම - | එම - | එම - | එම - | අවුරුදු තුනක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 164- | තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ රජයේ සේවකයකු වංචා සහගතව හෝ ද්වේෂ සහගතව ලියුකම් කඩ කිරීම | වරෙන්තුවක් නොමැතිව සිරභාරයට නොගත යුතු ය | සිතාසි | ඇප දිය හැකි ය | සමථයට පත් කළ නොහැකි ය | අවුරුදු දෙකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |
| 165- | තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත රජයේ සේවකයකු විසින් කරනු ලබන විෂමාචාරය | එම - | එම - | එම - | එම - | මාස තුනක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් පනහ දක්වා විය හැකි දඩය හෝ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |
| 166- | තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත රජයේ සේවකයකු විසින් කරනු ලබන වංචාව | වරෙන්තුවක් නැතිව සිරභාරයට ගත හැකිය | වරෙන්තුව | එම - | එම - | අවුරුදු දෙක දක්වා විය හැකි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |
| 167- | තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත රජයේ සේවකයකු විසින් පණිවිඩ ආදියට හානි කරනු ලැබීම | එම - | එම - | එම - | එම - | අවුරුදු තුනක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |

| 1<br>වගන්තිය | 2<br>වරද | 3<br>සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4<br>පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5<br>ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6<br>සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7<br>දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් | 8<br>මහාධිකරණය හැර වෙනත් කවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| 168 | රජයේ සේවකයකු ලෙස පෙනී සිටීම | එම - | එම - | එම - | එම - | අවුරුදු දෙකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 169- | වංචනික චේතනාවෙන් රජයේ සේවකයකු විසින් පාවිච්චි කරනු ලබන ඇඳුම් හෝ සලකුණු ඇඳීම හෝ සලකුණු පාවිච්චි කිරීම | එම - | සිතාසි | එම - | එම - | මාස තුනක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් සියයක දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |

IX අ වන පරිච්ඡේදය - ඡන්ද විමසීම්වලට අදාළ වැරදි

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 169 ඉ- | ඡන්ද විමසීමක් සම්බන්ධ අල්ලස් දීම | වරෙන්තුවක් නැතිව සිර භාරයට නොගත යුතු ය | සිතාසි | ඇප දිය හැකිය | සමථයට පත් කළ නොහැකි ය | රුපියල් පන්සියයක දඩය | මහෙස්ත්‍රාත් අධිකරණය |
| | සංග්‍රහ කිරීමෙන් අල්ලස් දීමක් නම් | එම - | එම - | එම - | එම - | රුපියල් දෙසියයක දඩය | මහෙස්ත්‍රාත් අධිකරණය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 169 ඊ- | ඡන්ද විමසීමක දී අයුතු බලපෑම් | එම - | එම - | එම - | එම - | රුපියල් පන්සියයක දඩය | මහෙස්ත්‍රාත් අධිකරණය |
| | ඡන්ද විමසීමක දී අනෙකකු නාමයෙන් පෙනී සිටීම | එම - | එම - | එම - | එම - | රුපියල් තුන්සියයක දඩය | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 169උ- | ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් කරනු ලබන අසත්‍ය ප්‍රකාශය | එම - | එම - | එම - | එම - | රුපියල් තුන්සියයක දඩය | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 169ඌ- | ඡන්ද විමසීමක ගණන් නිලව තැබීම පැහැර හැරීම | එම - | එම - | එම - | එම - | රුපියල් තුන්සියයක දඩය | මහෙස්ත්‍රාත් අධිකරණය |

## X වන පරිච්ඡේදය - රජයේ සේවකයන්ගේ නීත්‍යනුකූල බලයට කරනු ලබන අපහාස කිරීම

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 170- | රජයේ සේවකයකු විසින් සිතාසි හෝ වෙනත් නියෝග භාර දෙනු ලැබීම වැළැක්වීමසඳහා පැන ගොස් සැඟවී සිටීම | වරෙන්තුවක් නැතිව සිරභාරයට නොගත යුතුය | සිතාසි | ඇප දිය හැකි ය | සමථයට පත් කළ නොහැකිය | මාස එකක කාලයකට බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් පණහක දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණ |
| | අධිකරණයක පුද්ගලිකව පෙනී සිටීම අදිය සඳහා සිතාසියකින් හෝ දැන්වීමකින් හෝ නියම කර ඇත්නම් | එම - | එම - | එම - | එම - | මාස හයක කාලයකට බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් එක් සියයක දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණ |

| 1<br>වගන්තිය | 2<br>වරද | 3<br>සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4<br>පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5<br>ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6<br>සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7<br>දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම | 8<br>මහාධිකරණය හැර වෙනත් කවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| 171- | සිතාසි හෝ දැන්වීමක් භාරදීම හෝ ඇලවීම වැළැක්වීම නැතහොත් එය ඉවත් කිරීම හෝ ප්‍රකාශයක් කිරීම වැළැක්වීම | එම - | එම - | එම - | එම - | මාස එකක කාලයකට බරපතළ වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් පනහක දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |
| | අධිකරණයක පුද්ගලිකව පෙනී සිටීම ආදිය සඳහා සිතාසි ආදියෙන් නියම කර ඇත්නම් | එම - | එම - | එම - | එම - | මාස හයක කාලයකට බරපතළ වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් සියයක දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 172- | තමා ම හෝ නියෝජිතයකු මාර්ගයෙන් හෝ යම් ස්ථානයක පෙනී සිටිය යුතුය යන නීත්‍යනුකූල ආඥාවකට අකීකරුවීම හෝ බලය නොමැතිව එතැනින් පිටවීම | එම - | එම - | එම - | එම - | මාස එකක කාලයකට බරපතළ වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් පනහක දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | අධිකරණයක පොද්ගලිකව පෙනී සිටීම අදිය ආඥාව අනුව අවශ්‍ය වේ නම් | එම - | එම - | එම - | එම - | මාස හයක කාලයකට බරපතල වැඩ සහිතව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් සියයක දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |
| 173- | ලේඛනයක් ඉදිරිපත් කිරීමට හෝ භාර කරවීමට නීත්‍යානුකූලව බැඳී අති තැනැත්තකු විසින් එය රජයේ සේවකයකු වෙත හිතාමතාම ඉදිරිපත් කිරීම පැහැර හැරීම | එම - | එම - | එම - | එම - | මාස එකක කාලයකට බරපතල වැඩ සහිතව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් සියයක දඩය හෝ ඒ දෙකම | XXXII වන පරිච්ඡේදයෙහි විධිවිධානවලට යටත් ව වරද කරන ලද අධිකරණය නොවෙතොත් අධිකරණයක් තුළ එම වරද සිදුකර නැතිනම් |
| | ලේඛනය අධිකරණයකට ඉදිරිපත් කළ යුතු යයි හෝ භාර කළ යුතු යයි අවශ්‍ය නොවේ නම් | එම - | එම - | එම - | එම - | මාස එකක කාලයකට බරපතල වැඩ සහිතව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් සියයක දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |
| 174- | දැනුම් දීමට හෝ තොරතුරු සැපයීමට නීත්‍යානුකූලව බැඳී අති තැනැත්තකු විසින් රජයේ සේවකයකු වෙත ඒ දැනුම් දීම හෝ තොරතුරු සැපයීම හිතාමතාම පැහැර හැරීම | එම - | එම - | එම - | එම - | මාස එකක කාලයකට බරපතල වැඩ සහිතව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් පනහක දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |

| 1<br>වගන්තිය | 2<br>වරද | 3<br>සාම නිලධාරියා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4<br>පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5<br>ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6<br>සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7<br>දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඩුවම් | 8<br>මහාධිකරණය හැර වෙනත් කවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| | අවශ්‍ය වූ දැනුම් දීම හෝ තොරතුරු වරදක් කිරීම ආදිය පිළිබඳව | එම - | එම - | එම - | එම - | මාස හයක කාලයකට බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් සියයක දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |
| 175 - | රජයේ සේවකයකුට දැනුවත්ව අසත්‍ය තොරතුරු සැපයීම | එම - | එම - | එම - | එම - | එම - | මහේස්ත්‍රාත් අධිකරණය |
| | අවශ්‍ය වූ තොරතුරු වරදක් සිදු කිරීම ආදිය පිළිබඳව නම් | එම - | එම - | එම - | එම - | අවුරුදු දෙකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |
| 176 - | රජයේ සේවකයකු විසින් දිවුරුම් දීමට යථා පරිදි නියම කරනු ලැබූ විට දිවුරුම් දීම ප්‍රතික්ෂේප කිරීම | එම - | එම - | එම - | එම - | මාස හයක කාලයකට බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් සියයක දඩය හෝ ඒ දෙකම | XXXII වන පරිච්ඡේදයෙහි විධිවිධානවලට යටත් ව වරද කරන ලද අධිකරණය නැතහොත් අධිකරණයක දී කර නැතහොත් මහේස්ත්‍රාත් අධිකරණය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 177 - | සත්‍ය ප්‍රකාශ කිරීමට නීත්‍යානුකූලව බැඳී ඇති විටක දී ප්‍රශ්නවලට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කිරීම | එම - | එම - | | එම - | එම - | XXXII වන පරිච්ඡේදයෙහි විධිවිධානවලට යටත් ව වරද කරන ලද අධිකරණය නැතහොත් අධිකරණයක දී කර නැතොත් මහෙස්ත්‍රාත් අධිකරණය |
| 178- | රජයේ සේවකයකුට කරන ලද ප්‍රකාශයකට අත්සන් තැබීමට නීත්‍යානුකූලව නියමිතව ඇති විටක දී එසේ අත්සන් තැබීම ප්‍රතික්ෂේප කිරීම | එම - | වරෙන්තුව | | එම - | මාස තුනක කාලයකට බරපතළ වැඩ සහිතව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් සියයක දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 179 - | යමක් අසත්‍ය බව දැන දැනම එය දිවුරුම් පිට සත්‍යයක් හැටියට රජයේ සේවකයකුට ප්‍රකාශ කිරීම | එම - | වරෙන්තුව | | එම - | අවුරුදු තුනක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය | මහෙස්ත්‍රාත් අධිකරණය |

| 1 වගන්තිය | 2 වරද | 3 සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4 පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5 ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6 සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7 දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් | 8 මහාධිකරණය හැර වෙනත් කවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| 180 - | යම් තැනැත්තකු පිඩාවට හෝ කරදරයට පත් වන පරිදි රජයේ සේවකයකු ලවා තම නීත්‍යනුකූල බලය පාවිච්චි කරවනු පිණිස එම රජයේ සේවකයාට අසත්‍ය තොරතුරු සැපයීම | එම - | සිතාසි | එම - | එම - | මාස හයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් එක් දහසක දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |
| 181 - | රජයේ සේවකයකුගේ නීත්‍යනුකූල බලය පිට දේපළක් ගැනීමට විරුද්ධ වීම | එම - | එම - | එම - | එම - | මාස හයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් සියයක දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |
| 182 - | රජයේ සේවකයකුගේ බලය පිට විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ දේපළ විකිණීමකට බාධා කිරීම | එම - | එම - | එම - | එම - | මාස එකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් සියයක දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 183- | පොදු කටයුතු ඉටු කිරීමේ දී රජයේ සේවකයකුට බාධා කිරීම | එම - | එම - | එම - | එම - | මාස තුනක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් සියයක දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |
| 184- | සහායවීමට නීතියෙන් බැඳී ඇති විට රජයේ සේවකයකුට සහාය වීම නොකර හැරීම | එම - | එම - | එම - | එම - | මාස එකක කාලයකට බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් සියයක දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |
| | සැදවීමේ නියෝග භාර දීමේ අපරාධ වැළැක්වීමේ ආදියේ දී රජයේ සේවකයකු උපකාර ඉල්ලා සිටි විටක ඔහුට සහාය දීම හිතාමතාම පැහැර හැරීම | වරෙන්තුවක් නැතිව සිර භාරයට නොගත යුතු ය | සිතාසි | ඇප දිය හැකි ය | සමථයට පත් කළ නොහැකි ය | මාස හයක කාලයකට බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් සියයක දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |
| 185- | රජයේ සේවකයකු විසින් නීත්‍යනුකූලව ප්‍රකාශ කරන ලද නියෝගයකට අකීකරු වීමෙන්ද නීත්‍යනුකූලව සේවයෙහි යොදවනු ලබන තැනැත්තන්හට බාධාවක් කරදරයක් හෝ පීඩාවක් සිදු වේ නම් එබඳු අකීකරු වීම | එම - | එම - | එම - | එම - | මාස එකක කාලයකට බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් පනහක දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |

| 1<br>වගන්තිය | 2<br>වරද | 3<br>සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4<br>පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5<br>ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6<br>සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7<br>දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම | 8<br>මහාධිකරණය හැර වෙනත් කවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| | එබඳු අකීකරු වීමෙන් මනුෂ්‍ය ජීවිතය සෞඛ්‍යයට හෝ ආරක්ෂාව ආදියට අන්තරායක් වෙතොත් | එම - | එම - | එම - | එම - | මාස හයක කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් සියයක දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 186 - | රජයේ සේවකයකුට හෝ ඔහු උනන්දුවක් දක්වන යමකුට හෝ එම රජයේ සේවකයා ලවා යම් නිල ක්‍රියාවක් කරවා ගැනීම සඳහා හෝ එය කිරීමෙන් වැළැක්වීමට පොළඹවා ගැනීම සඳහා පීඩා කරන බවට තර්ජනය කිරීම | එම - | එම - | එම - | එම - | අවුරුදු දෙකක කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් සියයක දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 187- | පීඩාවෙන් ආරක්ෂා වීමට නීත්‍යනුකූල ඉල්ලීමක් කිරීමෙන් වැළැක්වීමට පෙළඹවීම සඳහා යම් තැනැත්තකුට තර්ජනය කිරීම | එම - | එම - | එම - | එම - | අවුරුදු එකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |

XI වන පරිච්ඡේදය - බොරු සාක්ෂි දීම හා පොදු යුක්ති ධර්මයට විරුද්ධ වැරදි

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 190 - | අධිකරණ කටයුත්තක දී බොරු සාක්ෂි දීම හෝ ගෙතීම | එම - | වරෙන්තු | එම - | එම - | අවුරුදු හතක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |
| | සෙසු යම් නඩුවක දී බොරු සාක්ෂි දීම හෝ ගෙතීම | එම - | එම - | එම - | එම - | අවුරුදු තුනක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |
| 191 - | යම් තැනැත්තකු මරණීය දණ්ඩනය දිය හැකි වරදකට වරදකරු කරවීමේ චේතනාවෙන් බොරු සාක්ෂි දීම හෝ ගෙතීම | එම - | එම - | ඇප දිය නොහැකි ය | | අවුරුදු දහයක කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීම හා දඩය | මහේස්ත්‍රාත් අධිකරණය |

| 1<br>වගන්තිය | 2<br>වරද | 3<br>සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4<br>පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5<br>ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6<br>සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7<br>දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් | 8<br>මහාධිකරණය හැර වෙනත් කවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| | ඒ හේතුවෙන් නිර්දෝෂී තැනැත්තකු වරදකරු කරනු ලැබ මරණීය දණ්ඩනයට යටත් කරනු ලැබුව හොත් | එම - | එම - | එම - | එම - | අවුරුදු දහයෙන් පහළ නොවන කාලයක් සඳහා ... සම්බන්ධයෙන් ජනාධිපතිවරයාගේ කැමැත්ත පරිදි වූ කාලයක් සිර භාරයේ රඳවා තැබීම ගර්භණී ස්ත්‍රීන් ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කිරීම, සෙසු තැම තෙනකුටම මරණීය දඬුවම | - |
| 192 - | අවුරුදු හතක හෝ ඊට වැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු කර වීමේ චේතනාවෙන් බොරු සාක්ෂි දීම හෝ ගෙතීම | එම - | එම - | එම - | එම - | වරදට දෙන දඬුවම ම වේ | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 456 - | වටිනා ඇපයක් හෝ අන්තිම කැමති පත්‍රයක් හෝ යම් වටිනා ඇපයක් ලබා ගැනීම සඳහා නැතහොත් එවැන්නක් පැවරීම සඳහා එසේත් නැතහොත් යම් මුදලක් ලබා ගැනීම සඳහා බලය දෙන ලේඛනයක් ව්‍යාජ ලෙස සෑදීම | එම - | එම - | එම - | එම - | අවුරුදු විස්සක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය | මහෙස්ත්‍රාත් අධිකරණය |

| 1<br>වගන්තිය | 2<br>වරද | 3<br>සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4<br>පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5<br>ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6<br>සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7<br>දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් | 8<br>මහාධිකරණය හැර වෙනත් කවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| 457 - | රැවටීමේ කාර්යය සඳහා ව්‍යාජ ලේඛන සෑදීම | එම - | එම - | එම - | එම - | අවුරුදු හතක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 459 - | ව්‍යාජ ලෙස සාදනු ලැබූ ලේඛනයක් බව දැන දැනම සැබෑ ලේඛනයක් හැටියට පාවිච්චි කිරීම | එම - | එම - | එම - | එම - | ව්‍යාජ ලේඛන සෑදීම සඳහා දෙන දඬුවම | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 460 - | දණ්ඩ නීති සංග්‍රහයේ 456 වන වගන්තිය යටතේ දඬුවම් කළ හැකි අන්දමේ ව්‍යාජ ලේඛනයක් සෑදීමේ චේතනාවෙන් මුද්‍රාවක්, තහඩුවක් යනාදිය ව්‍යාජ ලෙස සෑදීම හෝ එවැන්නක ව්‍යාජ අනුකරණයක් බව | එම - | එම - | ඇප දිය නොහැකි ය | එම - | අවුරුදු දහයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය | මහෙස්ත්‍රාත් අධිකරණය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | දැන දැනම, එවැනි යම් මුද්‍රාවක්, තහඩුවක් යනාදිය එම චේතනාවෙන්ම තම සන්තකයේ තබා ගැනීම | | | | | | |
| 461 - | දණ්ඩ නීති සංග්‍රහයේ 456 වන වගන්තිය යටතේ නොව අන්‍යාකාරයකින් දඩුවම් කළ හැකි අන්දමේ ව්‍යාජ ලේඛනයක් සෑදීමේ චේතනාවෙන් මුද්‍රාවක්, තහඩුවක් යනාදිය සෑදීම හෝ එවැන්නක ව්‍යාජ අනුකරණයක් සෑදීම හෝ ව්‍යාජ අනුකරණයක් බව දැන දැනම එවැනි යම් මුද්‍රාවක්, තහඩුවක් යනාදිය එම චේතනාවෙන්ම තම සන්තකයෙහි තබා ගැනීම | වරෙන්තුවක් නැතිව සිර භාරයට ගත හැකි ය | වරෙන්තුව | ඇප දිය නොහැකි ය | සමථයට පත් කළ නොහැකි ය | අවුරුදු හතක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය | මහෙස්ත්‍රාත් අධිකරණය |

| 1<br>වගන්තිය | 2<br>වරද | 3<br>සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4<br>පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5<br>ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6<br>සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7<br>දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් | 8<br>මහාධිකරණය හැර වෙනත් කවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| 462 - | ව්‍යාජ ලෙස සාදන ලද්දක් බව දැන දැනම සහ සැබෑ ලේඛනයක් ලෙස පාවිච්චි කිරීමේ චේතනාවෙන් යම් ව්‍යාජ ලේඛනයක් තම සන්තකයෙහි තබා ගැනීම . ඒ ලේඛනය දණ්ඩ නීති සංග්‍රහයේ 455 වන වගන්තියේ විස්තර කර ඇති අන්දමේ ලේඛනයක් වේ නම් | එම - | එම - | එම - | එම - | එම - | මහේස්ත්‍රාත් අධිකරණය |
| | ඒ ලේඛනය දණ්ඩ නීති සංග්‍රහයේ 456 වන වගන්තියේ විස්තර කර ඇති අන්දමේ ලේඛනයක් වේ නම් | එම - | එම - | එම - | එම - | අවුරුදු දහයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය | මහේස්ත්‍රාත් අධිකරණය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 463 - | දණ්ඩ නීති සංග්‍රහයේ 456 වන වගන්තියේ විස්තර කර ඇති ලේඛනවල සත්‍ය බව සහතික කිරීමේ ලක්ෂණයක හෝ සලකුණක කූට අනුකරණයකින් සලකුණු කරනු ලද ද්‍රව්‍යයක් තම සන්තකයෙහි තබා ගැනීම | එම - | එම - | එම - | එම - | අවුරුදු හතක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 464 - | දණ්ඩ නීති සංග්‍රහයේ 456 වන වගන්තියේ විස්තර කර ඇති ලේඛන නොවන ලේඛනවල සත්‍යතාව සහතික කිරීම සඳහා පාවිච්චි කරනු ලබන ලක්ෂණයක හෝ සලකුණක කූට අනුකරණයක් සෑදීම හෝ එවැනි කූට අනුකරණයකින් සලකුණු කරනු ලද ද්‍රව්‍ය තම සන්තකයෙහි තබා ගැනීම | එම - | එම - | එම - | එම - | එම - | මහෙස්ත්‍රාත් අධිකරණය |

| 1<br>වගන්තිය | 2<br>වරද | 3<br>සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4<br>පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5<br>ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6<br>සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7<br>දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් | 8<br>මහාධිකරණය හැර වෙනත් කවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| 465 | විදුලි පුවත් මගින් අසත්‍ය පණිවුඩ යැවීම | එම - | එම - | එම - | එම - | අවුරුදු විසක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් හෝ දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 466 - | අන්තිම කැමති පත්‍ර ආදියක් වංචනික ලෙස විනාශ කිරීම හෝ විකෘති කිරීම, හෝ විනාශ කරන්නට හෝ විකෘති කරන්නට තැත් කිරීම, හෝ එබන්දක් සැඟවීම | එම - | එම - | එම - | එම - | අවුරුදු හතක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 467 - | හිඳුම් වරදවා පෙන්වීම | එම - | එම - | එම - | එම - | අවුරුදු හතක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් හෝ දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 468 - | යම් මුදල් නෝට්ටුවක, බැංකු නෝට්ටුවක හෝ කාසියක අනුකරණයක් සන්තකයෙහි තබා ගැනීම | එම - | සිතාසිය | එම - | එම - | අවුරුදු දෙකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් හෝ දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |
| | | | දේපළ ලකුණු | | | | |
| 471 - | යම් තැනැත්තකු රැවටීමේ හෝ ඔහුට හානි කිරීමේ චේතනාවෙන් අසත්‍ය දේපළ ලකුණක් පාවිච්චි කිරීම | එම - | වරෙන්තුව | ඇප දිය හැකි ය | එම - | අවුරුදු එකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් හෝ දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 472 - | හානියක් හෝ පාඩුවක් කිරීමේ චේතනාවෙන් තවත් කෙනකු විසින් පාවිච්චි කරනු ලබන දේපළ ලකුණක කූට අනුකරණයක් සෑදීම | එම - | එම - | එම - | එම - | අවුරුදු දෙකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් හෝ දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |

| 1 වගන්තිය | 2 වරද | 3 සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4 පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5 ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6 සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7 දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම | 8 මහාධිකරණය හැර වෙනත් කවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
| --- | --- | --- | --- | --- | --- | --- | --- |
| 473 - | රජයේ සේවකයකු විසින් පාවිච්චි කරනු ලබන දේපළ ලකුණක් හෝ යම් දේපළක නිෂ්පාදනය, තත්ත්වය ආදිය දැක්වීම සඳහා ඔහු විසින් පාවිච්චි කරනු ලබන යම් ලකුණක් කූට ලෙස අනුකරණය කිරීම | වරෙන්තුවක් නැතිව සිර භාරයට ගත හැකිය | වරෙන්තුව | ඇප දිය හැකි ය | සමථයට පත් කළ නොහැකි ය | අවුරුදු තුනක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය | මහේස්ත්‍රාත් අධිකරණය |
| 474 - | යම් පොදු හෝ පුද්ගලික දේපළ ලකුණක් කූට ලෙස අනුකරණය කිරීම සඳහා වූ යම් අච්චුවක්, තහඩුවක් හෝ වෙනත් උපකරණයක් වංචනික ලෙස සෑදීම හෝ තම සන්තකයේ තබා ගැනීම | එම - | එම - | එම - | එම - | අවුරුදු තුනක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් හෝ දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 475 - | දේපළ ලකුණක කූට අනුකරණයකින් ලකුණු කරන ලද භාණ්ඩ දැන දැනම විකිණීම | එම - | එම - | එම - | එම - | අවුරුදු එකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 476 - | භාණ්ඩ ඇතුළත් කරනු ලැබූ යම් බඩු මිටියක හෝ භාජනයක අඩංගුව නැති භාණ්ඩ කිසිවක් එහි අඩංගු බව විශ්වාස කරවීමේ චේතනාවෙන් බඩු මිටියේ හෝ භාජනයේ අසත්‍ය ලකුණක් වංචනික ලෙස යෙදීම | එම - | එම - | එම - | එම - | අවුරුදු තුනක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 477 - | එබඳු යම් අසත්‍ය ලකුණක් පාවිච්චි කිරීම | එම - | එම - | එම - | එම - | එම - | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 478 - | හානි කිරීමේ චේතනාවෙන් යම් දේපළ ලකුණක් ඉවත් කිරීම, විනාශ කිරීම හෝ විකෘති කිරීම | එම - | එම - | එම - | එම - | අවුරුදු එකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |

| 1<br>වගන්තිය | 2<br>වරද | 3<br>සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4<br>පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5<br>ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6<br>සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7<br>දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම | 8<br>මහාධිකරණය හැර වෙනත් කවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| | | | මුදල් නෝට්ටු හා බැංකු නෝට්ටු | | | | |
| 478 අ - | හොර මුදල් නෝට්ටු හෝ හොර බැංකු නෝට්ටු අච්චු ගැසීම | වරෙන්තුවක් නැතිව සිර භාරයට ගත හැකිය | එම - | ඇප දිය නොහැකිය | එම - | අවුරුදු විස්සක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 478 ආ - | වංචාජ නැතහොත් හොර මුදල් නෝට්ටු හෝ හොර බැංකු නෝට්ටු සත්‍ය ඒවා ලෙස පාවිච්චි කිරීම | එම - | එම - | එම - | එම - | එම - | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 478 ඇ - | වංචාජ නැතහොත් හොර මුදල් නෝට්ටු හෝ හොර බැංකු නෝට්ටු තම සන්තකයෙහි තබා ගැනීම | එම - | එම - | එම - | එම - | අවුරුදු විස්සක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය | මහෙස්ත්‍රාත් අධිකරණය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 478 ඈ - | වියාජ නැතහොත් හොර මුදල් නෝට්ටු හෝ ව්‍යාජ නැතහොත් හොර බැංකු නෝට්ටු අච්චු ගැසීම සඳහා වූ උපකරණ හෝ ද්‍රව්‍ය හෝ සෑදීම නැතහොත් තම සන්තකයෙහි තබා ගැනීම | එම - | එම - | එම - | එම - | අවුරුදු විස්සක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය | |

## XIX වන පරිච්ඡේදය - අපකීර්තිකරණය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 480 - | අපකීර්තිකරණය | වරෙන්තුවක් නැතිව සිර භාරයට නොගත යුතු ය | වරෙන්තුව | ඇප දිය හැකි ය | සමථයට පත් කළ හැකි ය | අවුරුදු දෙකක කාලයකට බරපතළ වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම; මාස දොළහක හෝ ඊට වැඩි කාලයක බන්ධනාගාරගත කිරීම කලින් ලබා තිබේ නම්, අවුරුදු දෙකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |

| 1<br>වගන්තිය | 2<br>වරද | 3<br>සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4<br>පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5<br>ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6<br>සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7<br>දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් | 8<br>මහාධිකරණය හැර වෙනත් කවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| 481 - | අපකීර්තිකර දෙයක් බව දන්නා වූ යම් දෙයක් මුද්‍රණය කිරීම හෝ කැටයම් කිරීම අපකීර්තිකර කරුණු ඇතුළත් බව දනිමින් ම එබඳු කරුණු ඇතුළත් කොට මුද්‍රණය කරනු ලැබූ හෝ කැටයම් කරනු ලැබූ ද්‍රව්‍ය | එම - | එම - | එම - | එම - | එම - | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 482 - | සාමය කඩ කිරීමට තුඩු දෙන ප්‍රකෝපනය කිරීමේ චේතනාවෙන් නින්දා කිරීම | එම - | එම - | එම - | එම - | එම - | මහෙස්ත්‍රාත් අධිකරණය |
| | | | XX වන පරිච්ඡේදය - සාපරාධ භය ගැන්වීම, නින්දා කිරීම හා කරදර කිරීම | | | | |
| 484 - | එම - | එම - | එම - | එම - | එම - | අවුරුදු දෙකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 485 - | කැරැල්ලක් ඇති කරවීමේ හෝ රජයට විරුද්ධව වරදක් කරවීමේ හෝ චේතනාවෙන් අසත්‍ය ප්‍රකාශයක් හෝ දූෂමාන ආරංචියක් ආදිය ප්‍රචාරය කිරීම | එම - | එම - | ඇප දිය නොහැකි ය | සමථයට පත් නොහැකි ය | එම - | මහේස්ත්‍රාත් අධිකරණය |
| 486 | සාපරාධ භය ගැන්වීම | එම - | එම - | ඇප දිය හැකි ය | සමථයට පත් කළ හැකි ය | අවුරුදු දෙකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |
| | තර්ජනය කළේ මරණය, බරපතළ තුවාල ආදිය සිදු කිරීමට නම් | එම | එම - | එම - | සමථයට පත් කළ හැකි ය | අවුරුදු හතක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහේස්ත්‍රාත් අධිකරණය |
| 487 - | නිර්නාමික සංදේශයකින් හෝ තර්ජනය කරන්නේ කවරකු ද යන්න සැඟවීමට පූර්වාරක්ෂාව යෙදීමෙන් හෝ කරනු ලබන සාපරාධ භය ගැන්වීම | එම - | එම - | එම - | සමථයට පත් කළ නොහැකි ය | ඉහත සඳහන් වගන්තිය යටතේ දඬුවමට අතිරේක අවුරුදු දෙකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම | මහේස්ත්‍රාත් අධිකරණය |

| 1 වගන්තිය | 2 වරද | 3 සාම නිලධරයා විසින් වරෙන්තුවක් නැතිව සිරභාරයට ගැනීම කළ හැකි ද නොහැකි ද යන බව | 4 පළමු අවස්ථාවේ දී සාමාන්‍ය වශයෙන් වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කළ යුතු ද යන බව | 5 ඇප දිය හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 6 සමථයට පත් කළ හැකි ද නැතහොත් නොහැකි ද යන බව | 7 දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් | 8 මහාධිකරණය හැර වෙනත් කවර අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි ද යන බව |
|---|---|---|---|---|---|---|---|
| 488 - | පොදු ස්ථානයක් ආදියක දී බීමත් තත්වයකින් සිට යම් තැනැත්තකුට කරදරයක් කිරීම | වරෙන්තුවක් නැතිව සිර භාරයට නොගත යුතු ය | එම - | එම - | එම - | මාස එකක කාලයකට බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් සියයක දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |

XXI වන පරිච්ඡේදය - නීති විරෝධී දිවුරුම්

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|
| 489 - | අවුරුදු විස්සක් බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් කිරීමට දිවුරුමක් දීම හෝ දිවුරුමක් ගැනීම හෝ දිවුරුමක් ගැනීමට අනුබල දීම | වරෙන්තුවක් නැතිව සිර භාරයට නොගත යුතුය | එම - | එම - | එම - | අවුරුදු විස්සක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය |
| | අවුරුදු විස්සට අඩු බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් දිය හැකි වරදක් නම් | එම - | එම - | එම - | එම - | දිවුරුම් හා සම්බන්ධ වූ වරදකට දෙනු ලබන දඬුවම | මහෙස්ත්‍රාත් අධිකරණය |

## XXII වන පරිච්ඡේදය - වැරදි කිරීමට තැත් කිරීම

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 490 - | බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදක් කිරීමට තැත් කිරීම හා එසේ තැත් කිරීමේ දී එම වරද කිරීම සම්බන්ධයෙන් යම් ක්‍රියාවක් කිරීම | වරද කවරාකාර ද, යත් ඒ සම්බන්ධයෙන් වරෙන්තුවක් නැතිව පොලිසිය විසින් සිර භාරයට ගත හැකි ද නැද්ද යන්න අනුව | වරද සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් සිතාසි නිකුත් කළ යුතු ද වරෙන්තු නිකුත් කළ යුතු ද යන්න අනුව | කරන්නට සිතා ලද වරද ඇප දිය හැකි වරදක් ද නැද්ද යන්න අනුව | වරද සමථයට පත් කළ හැකි ද නැද්ද යන්න අනුව | එම වරද සඳහා නියමිත වූ දෙයාකාරයෙන් එක් ආකාරයක දීර්ඝතම කොටසකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීම හෝ ඒ දෙකම | කරන්නට තැත් කළ වරද පිළිබඳ නඩුව විභාග කළ හැකි අධිකරණය |

**වෙනත් නීති වලට විරුද්ධ වැරදි**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | මරණීය දඬුවමින් හෝ අවුරුදු හතකට හෝ ඊට වැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි නම් | වරෙන්තුවක් නැතිව සිර භාරයට ගත හැකිය | වරෙන්තුව | ඇප දිය නොහැකි ය | සමථයට පත් කළ නොහැකි ය | | මේ සංග්‍රහයේ 11 වන වගන්තියේ විධිවිධාන අනුව |
| | අවුරුදු තුනකට හෝ ඊට වැඩි එහෙත් අවුරුදු හතකට අඩු කාලයකට බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි නම් | එම - | එම - | එම - | එම - | | |
| | අවුරුදු තුනකට අඩු කාලයකට බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි නම් | වරෙන්තුවක් නැතිව සිර භාරයට නොගත යුතු ය | සිතාසිය | ඇප දිය හැකි ය | එම - | | |
| | දඩයකින් පමණක් දඬුවම් කළ හැකි නම් | එම - | එම - | එම - | එම - | | |

## දෙවන උපලේඛණය

## ආකෘති

## අංක 1

## චූදිත තැනැත්තකු වෙත සිතාසි

| | |
|---|---|
| කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ දී ය. | කොළඹ, ගාලු පාරේ, අංක 157 දරන ස්ථානයේ කඩ කරුවකු වන, චාර්ල්ස් ප්‍රනාන්දු වෙතය. |

19.........ක් වූ ............මස ............. වන දින ඔබ කොළඹ කොට්ඨාසය ඇතුළත වූ කොම්පඤ්ඤ වීදියේ මහා මාර්ගයේ දී ඉහත කී කොම්පඤ්ඤ වීදියේ, ජුවානිස් අප්පු නමැත්තකුට දණ්ඩකින් ගැසීමෙන් ස්වේච්ඡාවෙන් ඔහුට තුවාල සිදු කළ බව ද එමගින්, දණ්ඩ නීති සංග්‍රහයේ 314 වන වගන්තිය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි වරදක් ඔබ විසින් සිදු කර ඇති බව ද ඉහත කී කොළඹ කොට්ඨාසයේ හා ඒ කොට්ඨාසය සඳහා වූ මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ මෙදින පැමිණිලි කර ඇති හෙයින් ද ;

එකී පැමිණිල්ලට උත්තර දීම සඳහාත් නීතිය අනුව ඒ සම්බන්ධයෙන් වැඩිදුර කටයුතු කරනු ලැබීම සඳහාත් මේ මස 11 වන දින වූ ලබන සිකුරාදා පෙරවරු දහයට කොළඹ, අලුත්කඩේ මහෙස්ත්‍රාත් අධිකරණයට පෞද්ගලිකව ම පැමිණ පෙනී සිටින ලෙස ඔබට මෙයින් අණ කරනු ලැබේ.

19..........ක් වූ............මස ...... වන දින වූ මෙදින ඉහත කී කොට්ඨාසය තුළ කොළඹ දී මාගේ අත්සන යටතේ නිකුත් කරන ලදී.

(අත්සන් කළේ) එක්ස් .වයි
මහෙස්ත්‍රාත්වරයා / බලයලත් නිලධරයා

සැ.යු. අධිකරණයට පැමිණීමට අකමැති යම් සාක්ෂිකරුවකු කැඳවීමට ඔබට වුවමනා නම්, අධිකරණයට පැමිණෙන ලෙස ඔහුට බල කරන සිතාසියක් ලබා ගැනීමට ඔබ විසින් වහාම මේ කොට්ඨාසයේ මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉල්ලීමක් කළ යුතු ය.

## අංක 2

### සිතාසි භාරදීම පිළිබඳ දිවුරුම් පත්‍රය
### (සිතාසියේ පිටපත් කිරීම සඳහා ය)

............. පිස්කල්ගේ නිලධරයකු වන.............. හි, සි.ඩී. වන මම 19 ...........ක් වූ ............මස ..........වන දින......... දී, මෙහි ඇති සිතාසිය, එහි නම සඳහන් චාර්ල්ස් ප්‍රනාන්දු ට එහි දෙවන පිටපතක් / සහ පරිවර්තනයක් ගෙන ගොස් භාරදීමෙන්, භාර දුන් බව දිවුරා කියමි. (නැතහොත් ගෞරව බහුමානයෙන් යුක්තව ද අවංකව ද සත්‍ය ලෙස ද ප්‍රකාශ කර ප්‍රතිඥා දෙමි)

සිද්ධි ප්‍රකාශකගේ අත්සන..............................

19 ...........ක් වූ ............මස .........වන දින ............දී (දිවුරන නිලධරයාගේ නම හා පදවි නාමය) වන මා ඉදිරියේ දී දිවුරන ලදි. (නැතහොත් ප්‍රතිඥා දෙන ලදි)

## අංක 3

### සිතාසි අනුව පැමිණ සිටීම පැහැර හරිනු ලැබූ විට භාරයට ගැනීමේ වරෙන්තුව

| | |
|---|---|
| කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය. | (වරෙන්තුව ක්‍රියාවේ යෙදවිය යුතු තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ නම/නම් සහ පදවි නාමය / නාම) වෙතය. |

කොළඹ, ගාලු පාරේ, අංක 157 දරන ස්ථානයේ කඩ කරුවකු වන, චාර්ල්ස් ප්‍රනාන්දු නැමැත්තා පසුගිය 19.........ක් වූ ..........මස ............. වන දින එකී කොළඹ කොට්ඨාසය ඇතුළත වූ කොම්පඤ්ඤ වීදියේ මහා මාර්ගයේ දී ඉහත කී කොම්පඤ්ඤ වීදියේ, ජුවානිස් අප්පු නමැත්තකුට දණ්ඩකින් ගැසීමෙන් ස්වේච්ඡාවෙන් ඔහුට තුවාල සිදු කළ බව ද එමගින්, දණ්ඩ නීති සංග්‍රහයේ 314 වන වගන්තිය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි වරදක් එකී චාර්ල්ස් ප්‍රනාන්දු විසින් සිදු කර ඇති බව ද ඉහත කී කොළඹ කොට්ඨාසයේ හා ඒ කොට්ඨාසය සඳහා වූ මහෙස්ත්‍රාත්වරයකු වන පහත අත්සන් තබන මා ඉදිරියේ පසුගිය ...........මස ..........වන දින පැමිණිල්ලක් කරනු ලැබ ඇති හෙයින් ද ;

තව ද එකී පැමිණිල්ල උත්තර දීම සඳහාත් නීතිය අනුව ඒ සම්බන්ධයෙන් වැඩිදුර කටයුතු කරනු ලැබීම සඳහාත් මේ මස 11 වන දින වූ ලබන සිකුරාදා පෙරවරු දහයට කොළඹ, අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණයට පෞද්ගලිකව ම පැමිණ පෙනී සිටින ලෙස එකී චාර්ල්ස් ප්‍රනාන්දුට අණ කෙරෙන මගේ සිතාසිය මා විසින් ඊට පසු මා වෙත නිකුත් කරනු ලැබූ හෙයින් ද;

තව ද, එකී සිතාසිය ඔහු වෙත යථා පරිදි භාර දුන් බව දිවුරුම් (හෝ ප්‍රතිඥා) පිට මා ඉදිරියේ ඔප්පු කරනු ලැබ ඇති නමුත් එකී සිතාසියෙහි සහ එකී සිතාසිය මගින් නියම කර ඇති වේලාවේ දී සහ ස්ථානයේ දී පැමිණ පෙනී සිටීම එකී චාර්ල්ස් ප්‍රනාන්දු විසින් නොසලකා හරිනු ලැබ ඇති හෙයින් ද ;

එකී පැමිණිල්ලට උත්තර දීම සඳහාත් නීතිය අනුව ඒ සම්බන්ධයෙන් වැඩිදුර කටයුතු කරනු ලැබීම සඳහාත්, එකී චාර්ල්ස් ප්‍රනාන්දු නොපමාව ම අල්ලා ඉහත කී කොළඹ, අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියට ගෙන එන ලෙස ඔබට මෙයින් අණ කරනු ලැබේ.

19..........ක් වූ..........මස ...... වන දින වූ මෙදින ඉහත කී කොට්ඨාසය තුළ කොළඹ දී මාගේ අත්සන යටතේ නිකුත් කරන ලදී.

(අත්සන් කළේ) එක්ස් .වයි

## අංක 4

## ප්‍රථම අවස්ථාවෙහි සිර භාරයට ගැනීමේ වරෙන්තුව

| | |
|---|---|
| කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ දී ය. | (වරෙන්තුව ක්‍රියාවේ යෙදවිය යුතු තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ නම/නම් සහ පදවි නාමය / නාම) වෙතය. |

දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත කම්කරුවකු වන, එකී කොළඹ කොට්ඨාසයේ වැල්ලවත්තේ කංකානිගේ කරෝලිස් අප්පු, සොරකමක් කිරීම සඳහා මේ මස 12 වන සිකුරාදා රාත්‍රියේ දී හිරු බැසීමත් පසු දින හිරු උදාවත් අතරතුර රාත්‍රියේ දී ඉහත කී කොට්ඨාසය තුළ ගල්කිස්සේ පිහිටි ඒබ්‍රහම් ප්‍රනාන්දු නමැත්තකුගේ ගෙය බිඳ ඇතුළු වී ඇති බව ද එමගින් දණ්ඩ නීති සංග්‍රහයේ 443 වන වගන්තිය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි වරදක් කර ඇති බව ද එකී කොළඹ කොට්ඨාසයේ සහ ඒ කොට්ඨාසය සඳහා මහේස්ත්‍රාත්වරයකු වන පහත අත්සන් තබන මා ඉදිරියේ මෙදින පැමිණිල්ලක් කරනු ලැබ ඇති හෙයින් ද ; ඒ පැමිණිල්ලේ කාරණා සනාථ කෙරෙන දිවුරුමක් මා ඉදිරියේ දැන් කරනු ලැබ ඇති හෙයින් ද ;

එකී පැමිණිල්ලට උත්තර දීම සඳහාත් නීතිය අනුව ඒ සම්බන්ධයෙන් වැඩිදුර කටයුතු කරනු ලැබීම සඳහාත්, එකී කංකානිගේ කරෝලිස් අප්පු, නොපමාව ම අල්ලා ඉහත කී කොළඹ, අලුත්කඩේ මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියට ගෙන එන ලෙස ඔබට මෙයින් අණ කරනු ලැබේ.

19..........ක් වූ...........මස ...... වන දින වූ මෙදින ඉහත කී කොට්ඨාසය තුළ කොළඹ දී මාගේ අත්සන යටතේ නිකුත් කරන ලදී.

(අත්සන් කළේ) ..............................

## අංක 5

## චූදිත තැනැත්තකුට පැමිණ පෙනී සිටින ලෙස නියම කෙරෙන ප්‍රකාශනය

........................................... මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

(නම පදිංචි ස්ථානය සහ රක්ෂාව සඳහන් කරන්න) ඒ.බී. මේ අධිකරණයේ අධිකරණ බල සීමාව ඇතුළත වූ ..................දී 19.......ක් වූ .............මස ........වන දින (වරෙන්තුවෙහි සඳහන් ආකාරයට සඳහන් කරන්න) බවට පැමිණිල්ලට උත්තර දීම සඳහා එකී ඒ.බී. අල්ලා ගැනීම පිණිස වූ වරෙන්තුවක්, එකී ........................ කොට්ඨාසයේ සහ ඒ කොට්ඨාසය සඳහා වූ මහෙස්ත්‍රාත්වරයකු වන පහත අත්සන් තබන මා විසින් 19.......... ක් වූ .......... මස ...............වන දින නිකුත් කරන ලද හෙයින් ද ;

තව ද එකී ඒ. බී. සොයාගත නොහැකි බවට එකී වරෙන්තුව සම්බන්ධයෙන් වාර්තාවක් කර ඇති හෙයින් ද ;

තව ද එකී ඒ. බී. සැඟවිල්ලේ සිටින බව (නැතහොත් වසන් වී සිටින බව) ද එම නිසා එකී වරෙන්තුව ක්‍රියාවේ යෙදවිය නොහැකි බව ද මා සෑහීමට පත් වන පරිදි පෙන්වා දෙනු ලැබ ඇති හෙයින් ද ;

එකී පැමිණිල්ලට උත්තර දීම සඳහා 19....... ක් වූ ..........මස ..........වන දින පෙරවරු .......... ට ..........අධිකරණ ශාලාවෙහි එකී ඒ. බී. පැමිණ පෙනී සිටින ලෙස නියම කරමින් මේ ප්‍රකාශය කරනු ලැබේ.

19..........ක් වූ...........මස ...... වන දින වූ මෙදින ඉහත කී කොට්ඨාසය තුළ කොළඹ දී මාගේ අත්සන යටතේ නිකුත් කරන ලදී.

.........................................

(අත්සන් කළේ) එක්ස්. වයි.

අංක 6

නඩු අංක .....................

සෝදිසි වරෙන්තුව..........................
(68 වන වගන්තිය)

....................................පැවැත්වෙන මහාධිකරණයේ දී ය.
....................................මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

සෝදිසි වරෙන්තුවක් නිකුත් කිරීම සඳහා අවශ්‍ය කරුණු ඇති බව විශ්වාස කිරීමට පහත අත්සන් තබන මට හේතු ඇති හෙයින් ...........................................(ස්ථානය මෙහි විස්තර කරන්න) ........................... සෝදිසි කිරීමට සහ පරීක්ෂා කිරීමට ද, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ තත් කාර්යය සම්බන්ධයෙන් සඳහන් කර ඇති බලතල ක්‍රියාත්මක කිරීමට සහ කාර්යය ඉටු කිරීමට ද ............................... වන ඔබට මම මෙයින් (බලය දෙනු ලබන නිලධරයාගේ නම) බලය දෙමි.

...............................වන දින හෝ එදිනට පෙර මේ වරෙන්තුව සම්බන්ධයෙන් ඔබේ වාර්තාව සැපයිය යුතු යයි ඔබට මෙයින් නියම කරනු ලැබේ.

19...... ක් වූ ......... මස ............ වන දින මාගේ අත්සන යටතේ නිකුත් කරන ලදි.

..............................................
අත්සන් කලේ :
මහාධිකරණ විනිශ්චයකාරවරයා
මහෙස්ත්‍රාත්වරයා

## අංක 7

## මහාධිකරණය විසින් කරන ලද බන්ධනාගාරගත කිරීමේ හෝ දඩ ගැසීමේ දණ්ඩන නියමයක් මත බන්ධනාගාරයට නියම කිරීමේ බලපත්‍රය

........................ මහාධිකරණයේ දී ය.

නඩු අංකය ..............................

. ...........................බන්ධනාගාරයේ අධිකාරීවරයා වෙත .

මේ අධිකරණයේ අධිකරණ බල සීමාව ඇතුළත .................. දී අංක ...............දරන නඩුවේ............වන චූදිතයා වන ................[2] විසින් 19 ......ක් වූ ............මස ...... වන දින ................[3] කරන ලද නිසා සහ එමගින්, දණ්ඩ නීති සංග්‍රහයේ ............... වන වගන්තිය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි වරදක් කර ඇති නිසා 19...... ක් වූ ...... මස ......... වන දින............[4] වන මා ඉදිරියේ දී ඔහු විධිමත් ලෙස වරදකරු කරනු ලැබ, ඔහුට [5] ............බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් හා රුපියල් ............දඩයක් ගෙවීමේ හෝ ඒ දඩය ගෙවීම පැහැර හැරීමේ දී ............බන්ධනාගාරගත කිරීම හෝ දණ්ඩන නියමයක් ද කරනු ලැබ ඇති අතර ඒ දඩය ගෙවා නොමැති හෙයින් ;

එකී [2]......................... භාරගෙන ඔහු ආරක්ෂා සහිතව රැගෙන ගොස්, මේ බලපත්‍රය සමග ඉහත නම සඳහන් අධිකාරීවරයාට භාරදෙන ලෙස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයකු වන ඔබට මෙයින් අණ කරනු ලැබේ.

තව ද එකී [2]........................ බන්ධනාගාරයේ දී ඔබේ භාරයට ගෙන, ඉහත කී දණ්ඩන නියමය ක්‍රියාවේ යොදවනු ලබනතුරු ආරක්ෂා සහිතව ඔහු එහි තබා ගන්නා ලෙස එකී බන්ධනාගාරයේ අධිකාරීවරයා වන ඔබ්ට මෙයින් අණ කරමි.

19.......ක් වූ ...........මස ..........වන දින වූ මෙදින ............. දී මාගේ අත්සන යටතේ නිකුත් කරන ලදී .

..................................

(අත්සන් කළේ) එක්ස්. වයි.

මහාධිකරණයේ විනිශ්චයකාරවරයා

1. අවස්ථාවෝචිත පරිදි, පළමුවන , දෙවන .තුන්වන යනාදී වශයෙන්

2. චූදිතයාගේ නම.

3. වරද හෝ වැරදි කෙටියෙන් සඳහන් කරන්න.

4. නම සහ පදවි නාමය.

5. දඬුවම සම්පූර්ණ ලෙසත් පැහැදිලි ලෙසත් සඳහන් කොට අනවශ්‍ය වචන කපා හරින්න.

## අංක 8

**කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.**

**කොළඹ, ගාලු පාරේ, අංක 179 දරන ස්ථානයේ කඩ කරුවකු වන, දොන් චාර්ල්ස් අප්පුහාමි වෙත ය.**

............. (චූදිතයාට විරුද්ධව නිකුත් කළ සිතාසියේ හෝ වරෙන්තුවේ සඳහන් ආකාරයට මෙහි සඳහන් කරන්න)බව කොළඹ කොට්ඨාසයේ මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ පැමිණිලි කරනු ලැබ ඇති හෙයින් ද ඔබට චෝදක පක්ෂය (හෝ විත්ති පක්ෂය)වෙනුවෙන් සාක්ෂි දිය හැකි බවට එකී කොට්ඨාසය සඳහා වූ මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ කරුණු දක්වා ඇති හෙයින් ද ;

එකී පැමිණිල්ලේ කාරණය සම්බන්ධයෙන් ඔබ දන්නා කරුණු පිළිබඳව සාක්ෂි දීම සඳහා 19 ........ක් වූ .........මස .........වන දින පෙරවරු දහයට කොළඹ, අලුත්කඩේ අධිකරණ ශාලාවට පැමිණ, එහි සිටින යම් මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පෙනී සිටින ලෙස හා අධිකරණයේ අවසරය නොමැතිව එයින් පිටව නොයන ලෙස මෙයින් ඔබට නියම කරනු ලැබේ. තව ද යුක්ති සහගත හේතුවක් නොමැතිව එකී දිනයේ දී පැමිණ සිටීම ඔබ විසින් නොසලකා හරිනු ලැබුවහොත් හෝ ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් පැමිණ සිටීමට ඔබට බල කිරීම පිණිස වරෙන්තුවක් නිකුත් කරන බව ද ඔබට මෙයින් දන්වනු ලැබේ.

19..........ක් වූ...........මස ...... වන දින වූ මේදින ඉහත කී කොට්ඨාසය තුළ කොළඹ දී මාගේ අත්සන යටතේ නිකුත් කරන ලදි.

(අත්සන් කළේ) එක්ස්. වයි
මහෙස්ත්‍රාත්වරයා / බලයලත් නිලධරයා

## අංක 9

## රඳවා තැබීමේ බලපත්‍රය

නඩු අංකය : .....................

..................... දී පවත්වනු ලැබූ මහාධිකරණයේ දී ය.

..................... මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

..................... බන්ධනාගාරයේ අධිකාරීවරයා වෙත ය.

1979 අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ .................. විධිවිධාන අනුව 19 ...... ක් වූ ........ මස ......... වන දින ₁.................... මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ හෙයින් ද වැඩිදුර විමර්ශන / නඩු විභාගය පවත්වන තුරු එකී ₂.................... රඳවා තැබීම අවශ්‍යව ඇති හෙයින් :

එකී ₂.................... භාර ගෙන, ඔහු ආරක්ෂා සහිතව රැගෙන ගොස්, මේ බලපත්‍රයත සමග ඉහත සඳහන් අධිකාරීවරයාට භාර දෙන ලෙස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයකු වන ඔබට මෙයින් අණ කරනු ලැබේ.

තව ද එකී ₂...................... එකී බන්ධනාගාරයේ දී ඔබේ භාරයට ගෙන, 19.........ක් වූ ..........මස..........වන දින තෙක් ඔහු එකී බන්ධනාගාරයේ ආරක්ෂා සහිතව තබා ගන්නා ලෙසත්, ඔහු පිළිබඳ නීතිය අනුව වැඩිදුර කටයුතු කිරීම සඳහා ඔහු ඒ දිනයේ දී ................කොට්ඨාසයේ / අධිකරණ කලාපයේ සහ කොට්ඨාසය / අධිකරණ කලාපය සඳහා වූ මෙහි පහත අත්සන් තබන මහෙස්ත්‍රාත්වරයා / මහාධිකරණ විනිශ්චයකාරවරයා ලෙසත් එකී බන්ධනාගාරයේ එකී අධිකාරීවරයා වන ඔබට මම මෙයින් අණ කරමි.

19.......ක් වූ ..........මස ..........වන දින ඉහත කී .................. කොට්ඨාසය / අධිකරණ කලාපය තුළ.................. දී මාගේ අත්සන යටතේ නිකුත් කරන ලදී .

(අත්සන් කළේ) එක්ස්. වයි.
මහෙස්ත්‍රාත්වරයා/මහාධිකරණයේ
විනිශ්චයකාරවරයා

1. චූදිතයාගේ නම, පදිංචි ස්ථානය, පදවි නාමය යනාදි ය.

2. චූදිතයාගේ නම

## අංක 10

## ජූරි සභාව විසුරුවා හැරීමෙන් පසු රඳවා තබා ගැනීමේ බලපත්‍රය

නඩු අංකය : ......................

.......................... දී පවත්වනු ලැබූ මහාධිකරණයේ දී ය.

.......................... බන්ධනාගාරයේ අධිකාරීවරයා වෙත ය.

.......................... 19 ............ක් වූ ............. මස වන දින මේ අධිකරණයේ අධිකරණ බල සීමාව ඇතුළත වූ ................. දී [2] ........................ සිදු කළ නිසාත් එමගින්, දණ්ඩ නීති සංග්‍රහයේ ......... වන වගන්තිය යටතේ වූ වරදක් කර ඇති නිසාත් ................19 ..........ක් වූ ....... මස ................වන දින ..............දී මා ඉදිරියේ ඔහු පිළිබඳව නඩු විභාගයක් පවත්වනු ලැබූ හෙයින් ද :

තව ද, ඒ වරද ගැන එකී [1] .................... පිළිබඳව නඩු විභාගය පැවැත්වීම සඳහා තෝරා ගනු ලැබූ ජූරි සභාව 1979 අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන යටතේ විසුරුවා හරින ලද හෙයින් ද, නියම කරන ලද පරිදි රුපියල් ..............ක් වූ මුදලක් ඇපය වශයෙන් තැබීමට ඔහු පැහැර හැර ඇති නිසා වෙනත් ජූරි සභාවක් විසින් ඔහු පිළිබඳව නඩු විභාගය පවත්වන තුරු එකී [3]......................... අත් අඩංගුවේ රඳවා තබා ගැනීම අවශ්‍යව ඇති හෙයින් ද [4] :

එකී 3 .......................... භාර ගෙන, ඔහු ආරක්ෂාව සහිතව රැගෙන ගොස් මේ බලපත්‍රය සමග ඉහත සඳහන් අධිකාරීවරයාට භාර දෙන ලෙස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයකු වන ඔබට මෙයින් අණ කරනු ලැබේ.

එකී බන්ධනාගාරයේ දී එකී 3 ............................ ඔබේ භාරයට ගෙන 19 ..............ක් වූ ............මස ...........වන දින තෙක් ඔහු එකී බන්ධනාගාරයෙහි ආරක්ෂා සහිතව තබා ගන්නා ලෙසත් වෙනත් ජූරි සභාවක් විසින් ඔහු පිළිබඳව පවත්වනු ලබන නඩු විභාගය සඳහා ............දී පවත්වනු ලබන මහාධිකරණය ඉදිරියට ඔහු රැගෙන ගොස් ඉදිරිපත් කරන ලෙසත් එකී බන්ධනාගාරයේ එකී අධිකාරීවරයා වන ඔබට මම මෙයින් අණ කරමි.

19 .........ක් වූ ..........මස.......... වන දින වූ මෙදින ...............දී මගේ අත්සන යටතේ නිකුත් කරන ලදී.

(අත්සන් කළේ ) එක්ස්.වයි.
මහාධිකරණයේ විනිශ්චයකාරවරයා

1. චූදිතයාගේ නම, පදිංචි ස්ථානය සහ පදවි නාමය යනාදිය.

2. වරද හෝ වැරදි කෙටියෙන් සඳහන් කරන්න.

3. චූදිතයාගේ නම.

4. අනවශ්‍ය වචන කපා හරින්න.

අංක 11

## නඩු විභාගය ඉහළ අධිකරණයට තැබීමේ බලපත්‍රය.

නඩු අංකය ; ...........................

......................මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.
.......................බන්ධනාගාරයේ අධිකාරිවරයා වෙත ය.

...................................................................චෝදනාව සම්බන්ධයෙන් ₃ .............................. පිළිබඳ නඩු විභාගය මා විසින් ඉහළ අධිකරණයට තබා ඇති හෙයින් ;

එකී ₄ ......................... එකී බන්ධනාගාරයේ දී ඔබේ භාරයට ගෙන, එකී චෝදනාව ₁ සම්බන්ධයෙන් මහාධිකරණය ඉදිරියේ ₄............................ පිළිබඳව නඩු විභාගය පවත්වන තුරු සහ පවත්වන කාලය තුළ හෝ නීතියේ නිසි ක්‍රියා මාර්ගය අනුව ඔහු ඒ චෝදනාවෙන් නිදහස් කරනු ලබන තුරු ₄.................. එකී බන්ධනාගාරයේ ආරක්ෂා සහිතව තබා ගන්නා ලෙස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයකු වන ඔබට මෙයින් අණ කරනු ලැබේ.

එකී මහාධිකරණයෙහි පැවැත්වෙන ₄...................... පිළිබඳව නඩු විභාගය පැවැත්වීමේ කාර්යය සඳහා අවශ්‍ය කවර හෝ විටක එකී ₄..................... මහාධිකරණය වෙත රැගෙන ගොස් ඉදිරිපත් කරන ලෙස එකී අධිකාරිවරයා, වන ඔබට මෙයින් තවදුරටත් අණ කරනු ලැබේ.

19..............ක් වූ ............ වන දින වූ මෙදින ............දී මාගේ අත්සන යටතේ නිකුත් කරන ලදී.

(අත්සන් කළේ) එක්ස්.වයි.
....................කොට්ඨාසයේ මහෙස්ත්‍රාත්වරයා

1. අවස්ථාවෝචිත පරිදි, චෝදනාව හෝ චෝදනා කවරේ දැයි සඳහන් කරන්න.

2. එකකට වැඩිනම් චෝදනා

3. චූදිතයාගේ හෝ චූදිතයන්ගේ නම හෝ නම් සහ ඔහුගේ / ඇයගේ හෝ ඔවුන්ගේ පදිංචි ස්ථානය සහ පදවි නාම යනාදිය.

4. චූදිතයාගේ හෝ චූදිතයන්ගේ නම.

5. අවස්ථාවෝචිත පරිදි ඔහු/ඇය/ඔවුන්.

## අංක 11අ [1998 අංක 28 § 7]

## ආරක්ෂා ස්ථානයක් වෙත භාර කිරීමේ බලපත්‍ර ආකෘතිය

................................ මහාධිකරණයේ දී (හෝ ................................ මහෙස්ත්‍රාත් අධිකරණයේ දී )

........................................................පිස්කල් සහ ........................................(ආයතනයේ නම)

කළමනාකරු වෙත

.......................................................මේ අධිකරණය ඉදිරියේ ................................... වරද සම්බන්ධයෙන් අධිචෝදනා / චෝදනා ලැබ ඇති හෙයින් ද:

එකී වරද ..........................ට අදාළව සිදුකරනු ලැබ ඇතැයි කියනු ලබන හෙයින් සහ .......................... එම වරද පිළිබඳ නඩු විභාගය නිමවන තුරු, එකී ..........................ට රැකවරණය සහ ආරක්ෂාව අවශ්‍යව ඇති හෙයින් ද :

එකී ............................ භාර ගෙන ආරක්ෂා සහිතව ...................... .............. වෙත රැගෙන ගොස්, ඔබේ අත්සන යටතේ සහතික කරන ලද මේ බලපත්‍රයේ පිටපතක් ද සහිත ව, ඔහු එහි කළමනාකරුට භාර දෙන ලෙස එකී පිස්කල් වන ඔබට මෙයින් අණ කරනු ලබන අතර එකී ............................ ඔබේ භාරයට ගෙන, ඒ වරද පිළිබඳ නඩු විභාගය නිමවන තුරු ඔහු ඔබේ රැකවරණය හා ආරක්ෂාව යටතේ ආරක්ෂා සහිතව තබා ගන්නා ලෙස එකී ................................ කළමනාකරු වන ඔබට මම මෙයින් අණ කරමි.

19 ......... ක් වූ .....................මස ....................වන දින වූ මෙදින මගේ අත්සන යටතේ නිකුත් කරන ලදි.

අත්සන් කළේ
මහාධිකරණයේ / විනිශ්චයකරු / මහෙස්ත්‍රාත්

අංක 12

## නඩු විභාගය කල් තැබූ විට හෝ අඩාළව කල් තැබීමෙන් පසු රිමාන්ඩ් භාරයට පත් කිරීමේ හෝ අත් අඩංගුවේ තැබීමේ බලපත්‍රය

නඩු අංකය : ........................

......................පිහිටි ...................අධිකරණයේ දී ය.

.................... බන්ධනාගාරයේ අධිකාරීවරයා වෙත ය.

19........ක් වූ ..............මස ...............වන දින , .............. විසින් , ...................... කළ බවට 19.......ක් වූ .................මස ................ වන දින ............. පිහිටි ...................... අධිකරණයට පැමිණිල්ලක් / අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබ ඇති හෙයින් ද (චූදිතයා පිළිබඳ නඩු විභාගය පවත්වමින් තිබේ නම් එකතු කරන්න : එකී , .......................... නඩු විභාගය සඳහා මා ඉදිරියට පත් කරනු ලැබ ඇති හෙයින් ද ) :

වැදගත් සාක්ෂිකරුවකු පැමිණ නොසිටීමේ , හේතුව නිසා එකී පැමිණිල්ලේ / අධිචෝදනා පත්‍රයේ කාරණය පිළිබඳ පරීක්ෂණය / නඩු විභාගය 19 .....ක් වූ ...........මස වන දින පෙ.ව./ප.ව. ............... ට ...............දී පැවැත්වීම පිණිස කල් තැබීම ( හෝ අවස්ථාවෝචිත

පරිදි, අඩාළව කල් තැබීම ) අවශ්‍යව ඇති හෙයින් සහ ඒ අතරතුර එකී [3] ................... රිමාන්ඩ් භාරයේ තැබීම (හෝ අවස්ථාවෝචිත පරිදි අත් අඩංගුවේ තැබීම) අවශ්‍ය වන හෙයින් ද :

එකී [1].................................භාරගෙන ආරක්ෂා සහිතව රැගෙන ගොස් මේ බලපත්‍රය සමග ඉහත සඳහන් අධිකාරීවරයාට භාර දෙන ලෙස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයකු වන ඔබට මෙයින් අණ කරනු ලබන අතර එකී [3] ..........................එකී බන්ධනාගාරයේ දී ඔබේ භාරයට ගෙන 19.....ක් වූ .........මස ..................... වන දින තෙක් ඔහු එහි ආරක්ෂා සහිතව තබා ගන්නා ලෙස ද එම දිනයේ දී ඔහු රැගෙන ගොස් එකී පැමිණිල්ලට / අධිචෝදනා පත්‍රයට වැඩිදුර උත්තර දීම සඳහා සහ නීත්‍යනුකූලව ඔහු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පහත අත්සන් කරන මා වෙත හෝ එහි සිටිය හැකි වෙනත් මහෙස්ත්‍රාත්වරයකු (හෝ අවස්ථාවෝචිත පරිදි මහාධිකරණ විනිශ්චයකාරවරයකු ) වෙත එකී පරීක්ෂණය / නඩු විභාගය කල් තැබුවේ, (හෝ අවස්ථාවෝචිත පරිදි ) අඩාළව කල් තැබුවේ යම් ස්ථානයක දී යම් යම් වේලාවකට පැවැත්වීමට ද ස්ථානයේ දී හා වේලාවේ දී ඉදිරිපත් කරන ලෙස ද එකී බන්ධනාගාරයේ එකී අධිකාරීවරයා වන ඔබට, මම මෙයින් අණ කරමි.

19.........න් වූ ............මස ..............වන දින වූ මෙදින ................ දී මාගේ අත්සන යටතේ නිකුත් කරන ලදී.

(අත්සන් කළේ) එක්ස්.වයි.
මහෙස්ත්‍රාත්වරයා/මහාධිකරණ
විනිශ්චයකාරවරයා.

1. චූදිතයාගේ නම, පදිංචි ස්ථානය හා ඔහුගේ / ඇයගේ පදවි නාමය යනාදිය.

2. සිතාසියේ හෝ වරෙන්තුවේ දැක්වෙන ආකාරයට වරද හෝ වැරදි සඳහන් කරන්න.

3. චූදිතයාගේ නම.

4. කල් තැබීමට හෝ අඩාළව කල් තැබීමට වෙනත් කරුණු හේතු වී නම් ඒ කරුණු සඳහන් කරන්න.

5. වරද ඇප දිය හැකි වරදක් නම් -

"නියම කරන ලද පරිදි රු......................... මුදලක් ඇපය තැබීමට ඔහු පැහැර හැර ඇති හෙයින් " යන වචන එකතු කරන්න.

## අංක 13

### මහෙස්ත්‍රාත්වරයකු විසින් කරන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් අනුව බන්ධනාගාරයට භාර දීමේ බලපත්‍රය.

කොළඹ මහාස්ත්‍රාත් අධිකරණයේ දී ය.

වැලිකඩ බන්ධනාගාරයේ අධිකාරීවරයා වෙත ය,

චාර්ල්ස් ප්‍රනාන්දු විසින් 19.........ක් වූ ...........මස ............. වන දින කොළඹ කොට්ඨාසය ඇතුළත කොම්පඤ්ඤ වීදියේ දී පුවානිස් අප්පු නමැත්තකුට ස්වේච්ඡාවෙනම තුවාල සිදු කළ නිසා හා එමගින්, දණ්ඩ නීති සංග්‍රහයේ 314 වන වගන්තිය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි වරදක් කළ නිසා එකී කොළඹ කොට්ඨාසයේ හා ඒ කොට්ඨාසය සඳහා වූ මහෙස්ත්‍රාත්වරයකු වන මෙහි පහත අත්සන් තබන මා ඉදිරියේ එකී චාර්ල්ස් ප්‍රනාන්දු මෙදින විධිමත් ලෙස වරදකරු කරනු ලැබ, ඒ අනුව එක් මාසයක් බරපතල වැඩ සහිතව බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් මා විසින් කරන ලද හෙයින් ;

එකී චාර්ල්ස් ප්‍රනාන්දු භාරගෙන ආරක්ෂා සහිතව රැගෙන ගොස් මේ බලපත්‍රය සමග ඉහත සඳහන් අධිකාරීවරයාට භාරදෙන ලෙස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයකු වන ඔබට මෙයින් අණ කරනු ලබන අතර, එකී චාර්ල්ස් ප්‍රනාන්දු එකී බන්ධනාගාරයේ මබේ භාරයට ගෙන, එකී දණ්ඩන නියමය ක්‍රියාත්මක කරන ලෙස එකී බන්ධනාගාරයේ එකී අධිකාරීවරයා වන ඔබට මම මෙයින් අණ කරමි.

19.........ක් වූ...........මස ...... වන දින වූ මෙදින ඉහත කී කොට්ඨාසය තුළ කොළඹ දී මාගේ අත්සන යටතේ නිකුත් කරන ලදී.

(අත්සන් කළේ) එක්ස්. වයි

අංක 14

## වරදකරු කිරීමකට විරුද්ධව අභියාචනය කිරීමේ දී දිය යුතු බැඳුම් ඔප්පුව

කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ දී ය.

කොළඹ, කොල්ලුපිටිය අංක 159 දරන ස්ථානයේ පදිංචිකරුවකු වන පර්ඩිනැන්ඩෝ ද සිල්වා සහ ඉහත කී කොළඹ, පිටකොටුවේ අංක 239 දරන ස්ථානයේ පදිංචිකරුවකු වන චාර්ල්ස් ප්‍රනාන්දු 19..........ක් වූ..........මස ...... වන දින, එකී කොට්ඨාසයේ හා ඒ කොට්ඨාසය සඳහා රෙජිස්ට්‍රාර්වරයකු වන මා ඉදිරියට පෞද්ගලිකව පැමිණ, පහත දැක්වෙන කොන්දේසිය කඩ කරනු ලැබුවහොත් එක් එක් තැනැත්තාගේ චංචල හා නිශ්චල දේපළවලින් ශ්‍රී ලංකා ආණ්ඩුවේ ප්‍රයෝජනය සඳහා අයකර ගත යුතු රුපියල් 1...................... ක මුදලක් ශ්‍රී ලංකා ආණ්ඩුවට ඒ එක් එක් තැනැත්තා ණයගැති බව පිළිගත් බව සිහි තබා ගත යුතු ය.

ඉහත කී කොට්ඨාසයේ මහේස්ත්‍රාත්වරයකු වන විලියම් හෙන්රි මුවර් මහත්මයා විසින් කරනු ලැබූ එක්තරා වරදකරු කිරීමක් අනුව එකී චාර්ල්ස් ප්‍රනාන්දු විසින් (වරදකරු කිරීමෙහි දැක්වෙන පරිදි සඳහන් කරන්න) කළ නිසා ඔහු වරදකරු වී ඇති හෙයින් ද:

තව ද එකී වරදකරු කිරීමට විරුද්ධව චාර්ල්ස් ප්‍රනාන්දු විසින් අභියාචනයක් ඉදිරිපත් කොට ඇති හෙයින් ද :

මේ බැඳුම් ඔප්පුවේ කොන්දේසිය නම්, එකී චාර්ල්ස් ප්‍රනාන්දු ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවට යටත් වුවහොත් සහ යම් නඩු ගාස්තුවක් ගෙවන ලෙස ඒ අධිකරණය විසින් නියම කරනු ලැබුණි නම් ඔහු විසින් ඒ නඩු ගාස්තු ගෙවනු ලැබුවහොත් එවිට මේ බැඳුම් ඔප්පුව ශුන්‍ය වන බවය.

(අත්සන් කලේ) එක්ස්.වයි.

............................... මා ඉදිරිපිට ඇතුළත් වී, පිළිගන්නා ලදී.

1. මුදල් ප්‍රමාණය සඳහන් කරන්න.

**සැ.යු.-** මහාධිකරණයකින් වරදකරු කිරීමට විරුද්ධව අභියාචනා කිරීමේ දී දිය යුතු බැඳුම් ඔප්පුව සඳහාත් මේ ආකෘතිය ම අවශ්‍ය වෙනස් කිරීම් සහිතව උපයෝගි කර ගන්න.

## අංක 15

## අධිචෝදනා පත්‍රයේ ආකෘතිය

වැල්ලවත්තේ පදිංචි කංකානිගේ කරෝලිස් අප්පු වෙත ය.

ශ්‍රී ලංකා ජනරජයේ නීතිපතිවරයා වන ..........ගේ ඉල්ලීම අනුව ඔබට විරුද්ධව චෝදනා කරනු ලැබේ. ඔබට විරුද්ධව ඇති චෝදනාව නම්, 19............ක් වූ ............ මස ........ වන දින හිරු බැසීම සහ පසු දින හිරු උදාවීම අතර රාත්‍රී කාලයේ දී සොරකම් කිරීම සඳහා ඔබ කොළඹ අධිකරණ කලාපයේ ..............දී ...............නමැත්තකු පදිංචි නිවස බිඳ ඇතුළු වූ බව සහ එමගින්, දණ්ඩ නීති සංග්‍රහයේ 443 වන වගන්තිය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි වරදක් ඔබ සිදු කළ බවය.

(අත්සන් කළේ)..................

ඉදිරිපත් කරන පද ලේඛනවල ලැයිස්තුව

(1) අලවංගුවක්

(2) උදැල්ලක්

(3) ගල්කිස්ස පොලිස් ස්ථානයේ තොරතුරු පොතෙන් උද්ධෘතයක්

සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවක්

(1) කොළඹ, කාසල් පටුමගේ අංක 5 දරන ස්ථානයේ මාරියා ප්‍රනාන්දු

(2) රත්මලානේ ග්‍රාම නිලධාරී දොන් චාර්ල්ස් අප්පුහාමි

(3) ගල්කිස්සේ පොලිස් සැරයන් විලියම් තෝමස්

## අංක 16

## අභියාචන පෙත්සමේ ආකෘතිය

ශ්‍රී ලංකා ජනරජයේ අභියාචනාධිකරණයේ දී ය.

අභියාචනාධිකරණයේ ගරු සභාපතිවරයා සහ අනිකුත් විනිශ්චයකාරවරයන් වෙත ය.

ඒ.බී. ගේ පෙත්සමෙන් පහත දැක්වෙන පරිදි වේ.

1. පෙත්සම්කරු වන * ඉහත නම් සඳහන් ඒ.බී. විසින් චෝදනාව (මෙහි කෙටියෙන් විස්තර කරන්න) කරන ලද බවට ඔහුට විරුද්ධව චෝදනා නගා 19............ක් වූ ..............මස ...........වන දින ............දී පවත්වනු ලැබූ ..........................මහෙස්ත්‍රාත් අධිකරණයේ දී වරදකරු / නිදොස් කරන ලදි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නඩු තීන්දුව කරන ලදි.

(නඩු තීන්දුවේ සාරය කෙටියෙන් මෙහි සඳහන් කරන්න)

2. පහත දැක්වෙන හේතු නිසා පෙත්සම්කරු* එකී නඩු තීන්දුව පිළිබඳව අතෘප්තියට පත්ව සිටී.

(පෙත්සම්කරු විශ්වාස තබන හේතු අනුක්‍රමික වශයෙන් අංක යොදමින් මෙහි සඳහන් කරන්න.

3. එකී නඩු තීන්දුව ප්‍රතිවර්තන කරන ලෙස හෝ යුක්තිය ඉටු වන පරිදි ආඥාවක් කරන ලෙස පෙත්සම්කරු* ඉල්ලා සිටී.

(අත්සන් කළේ) ..........................

---

* පෙත්සම්කරු නීතිපතිවරයා නම් "පෙත්සම්කරු"යන වචනය අත්හරින්න.

\+ අදාළ නොවන වචන කපා හරින්න.

සැ.යු.- මහාධිකරණයේ නඩු තීන්දුවකට හෝ ආඥාවකට හෝ විරුද්ධව අභියාචනය කිරීමට අවසර පතන ඉල්ලීම කරනු ලබන අවස්ථාවක, මේ ආකෘතිය ම සුදුසු වෙනස් කිරීම් සහිතව භාවිත කළ හැකි ය.

අංක 17

## විශේෂ නඩුවක ආකෘතිය

ශ්‍රී ලංකා ජනරජයේ අභියාචනාධිකරණයේ දී ය.

ඒ. බී. පැමිණිලිකරු වූ ද පී.එච්. විත්තිකරු වූ ද පැමිණිල්ලක් සම්බන්ධයෙනි.

මෙහි පහත අත්සන් තබන තැනැත්තා විසින් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXIX වන පරිච්ඡේදයේ විධිවිධාන යටතේ ඉදිරිපත් කරනු ලබන නඩුවක නීතිය පිළිබඳ ප්‍රශ්නයක්

මෙහි පහත සඳහන් අත්සන් තබන තැනැත්තා ඉදිරියේ 19..........ක් වූ ..............මස ................වන දින ................ පවත්වන ලද ....................මහේස්ත්‍රාත් අධිකරණයේ / මහාධිකරණයේ දී ඉහත නම් සඳහන් පී.එච්. ට පහත සඳහන් පරිදි චෝදනා නගා තිබිණ.

(අවස්ථාචෝචිත පරිදි චෝදනාව හෝ අධිචෝදනාව මෙහි සඳහන් කරන්න)

එකී චෝදනාව / අධිචෝදනාව පිළිබඳ නඩු විභාගයේ දී (ඔප්පු කරන ලද සිද්ධි අතුරින්, ආවේශය කිරීමට අදහස් කරනු ලබන නීතිය පිළිබඳ ප්‍රශ්නය හෝ ප්‍රශ්න මතු කිරීමට අවශ්‍ය තරම් සිද්ධි මෙහි දක්වන්න) ඔප්පු කරන ලදි.

ඉක්බිතිව විත්ති පක්ෂය විසින් (ඉදිරිපත් කරනු ලැබිය හැකි නෛතික විරෝධය පෑම මෙහි සඳහන් කරන්න.) යන තර්කය ඉදිරිපත් කරන ලදි.

එහෙත් (අධිකරණය විසින් නඩුව තීරණය කිරීමට පදනම් කර ගත් හේතුව මෙහි සඳහන් කරන්න) බව මගේ මතය වූ බැවින් (අධිකරණයේ තීරණය හා නඩු තීන්දුව මෙහි සඳහන් කරන්න) බවට තීන්දුව දෙන ලදි.

මේ අධිකරණයේ මතය සඳහා ඉදිරිපත් කෙරෙන ප්‍රශ්නය නම් එකී නිශ්චය නීතිය අනුව නිවැරදි ද යන්න ය. තව ද ඒ අවස්ථාවේ දී කළ යුතුව තිබූ දෙය කුමක් ද යන්න ය.

(අත්සන් කළේ) එක්ස්. වයි.

19............ක් වූ ............මස ............වන දින දී ය.

## අංක 18

## ජූරි සභාවක් භාර කරනු ලැබූ නිලධරයකු විසින් කළ යුතු දිවුරුම් ආකෘතිය

ඔබ විසින් කිසිවකුට ඔවුන් සමග කථා කිරීමට ඉඩ නොදිය යුතු අතර, ඔවුන් එකඟ ද යන වග ඔවුන්ගෙන් විමසීම පමණක් හැර, විනිශ්චයකාරවරයාගේ අවසරය නොමැතිව ඔබ ද ඔවුන් සමග කථා නොකළ යුතු ය.

## අංක 19

## දඩය ගෙවීම සඳහා (ඇපකරුවන් නොමැති ව) දිය යුතු බැඳුම්කරයේ ආකෘතිය

[1995 අංක 4 § 3]

[ 291 (4) වන වගන්තිය ]

19……..ක් වූ ………..මස වන දි ය.

……………….. පදිංචි………………..(වරදකරුගේ නම සහ ලිපිනය) ……………… වන මම අංක ……………… දරන නඩුව සම්බන්ධයෙන් ම විසින් දඩය වශයෙන් ගෙවිය යුතු බවට අධිකරණය විසින් නියම කරනු ලැබූ රුපියල් …………… ක මුදල අධිකරණයට ගෙවීමට මෙයින් බන්ධනය වෙමි.

එකී බැඳුම්කරයේ කොන්දේසිය නම්, එකී ……………… (වරදකරුගේ නමා)වන ම විසින් මාස ……………… කාලයක් තුළ දී රු. ………………… බැගින් වාරික ………..කින් එකී දඩ මුදල ………………ට (ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බැංකුව හෝ තැපැල් කාර්යාලය) ගෙවුවහොත් එකී බැඳුම්කරයෙන් මා නිදහස් කරනු ලැබිය යුතු අතර එසේ ගෙවීම නොකළහොත් මාගේ පැහැර හැරීම වෙනුවෙන් බන්ධනාගාරගත විය යුතු කාල සීමාව ගෙවීම පිණිස මා සිර භාරයට ගනු ලැබිය යුතු බව ය.

මේ බැඳුම්කරය යටතේ මා නිදහස් කරනු ලැබූ විට, නොතීසි ආදිය මා වෙත එවිය යුතු ලිපිනය මෙසේ ය -

අත්සන් කළේ …………………..
වරදකරු

දිනය : ……………………

19............ක් වූ ............මස .............වන දින මා ඉදිරිපිට දී මෙම බැඳුම්කරයට ඇතුළත් වී පිළිගන්නා ලදි.

අත්සන් කළේ .........................
රෙජිස්ට්‍රාර්

## අංක 20

## දඩය ගෙවීම සඳහා (ඇපකරුවන් සහිතව) දිය යුතු බැඳුකරයේ ආකෘතිය

[1995 අංක 4 § 3]

[291 (4) වන වගන්තිය ]

19.......ක් වූ ..........මස වන දී ය.

.................... පදිංචි..................(වරදකරුගේ රැකියාව නම සහ ලිපිනය) ................. වන මම

ප්‍රධාන ණයකරු වශයෙන් ද සහ ................ පදිංචි ...............(ඇපකරුගේ / ඇපකරුවන්ගේ නම, රැකියාව සහ ලිපිනය) වන මම / අප ඇපකරු / ඇපකරුවන් වශයෙන් ද අංක ......... දරන නඩුව සම්බන්ධයෙන් ............(වරදකරුගේ නම) විසින් දඩය වශයෙන් ගෙවිය යුතු බවට අධිකරණය විසින් නියම කරනු ලැබූ රුපියල් .............. ක මුදල අධිකරණයට ගෙවීමට එක්ව සහ වෙන් වෙන්ව මෙයින් බන්ධනය වෙමු.

එකී බැඳුම්කරයේ කොන්දේසිය නම්, එකී වරදකරු ප්‍රධාන ණයකරු වශයෙන් රු. .................ක් වූ දඩය මාස ................. කාලයක් තුළ දී රු. ..................... බැගින් වාරික ..........කින් ..............ට (ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බැංකුව හෝ තැපැල් කාර්යාලය) ගෙවිය යුතු බවය.

ඉහත දැක්වෙන කොන්දේසිය පරිදි එකී මුදල වරදකරු විසින් නොගෙවුවහොත් මෙහි නම් සඳහන් කරන ලද ...................... (ඇපකරුගේ / ඇපකරුවන්ගේ) නම වන මම/අපි එකී දඩ මුදල ගෙවීමට මෙයින් පුද්ගලිකව ම භාර ගනිමි / ගනිමු.

අත්සන් කළේ ......................
වරදකරු

.........................................
ඇපකරු / ඇපකරුවන්

දිනය : ........................

19..............ක් වූ ..............මස ..............වන දින මා ඉදිරිපිට දී

මෙම බැඳුම්කරයට ඇතුළත් වී පිළිගන්නා ලදි.

අත්සන් කළේ ......................
රෙජිස්ට්‍රාර්

## අංක 21

[1995 අංක 4 § 3]

### වරදකරුට නිකුත් කළ යුතු ප්‍රකාශය

[ 291 (4) වන වගන්තිය ]

නඩු අංකය :...........................

........................................පවත්වන ලද මහාධිකරණයේ දී
........................................මහෙස්ත්‍රාත් අධිකරණයේ දී
....................................................ප්‍රාථමික අධිකරණයේ දී

ඉහත සඳහන් කරන ලද නඩුවේ දී මහාධිකරණයේ විනිශ්චයකාවරයා / මහෙස්ත්‍රාත්වරයා / ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද නඩු තීන්දුව / ආඥාව මගින් ........................ (වරදකරුගේ නම සහ ලිපිනය) වන ඔබට රුපියල් ............. ක දඩයක් සහ ඒ දඩය ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් බන්ධනාගාරගත කිරීමක දණ්ඩන නියමයක් ඇත.

මේ ප්‍රකාශය ................ බැංකුවට, ප්‍රාදේශීය ලේකම්වරයකුගේ කාර්යාලයකට හෝ තැපැල් කාර්යාලයකට ඉදිරිපත් කරන ලෙසත්, එකක් රු. .......................... ක් වූ වාරික ........................කින් ....................දිනට හෝ ඊට පූර්වමයෙන් ඔබ වෙත පනවන ලද දඩය ඒ බැංකුවට, ප්‍රාදේශීය ලේකම්වරයකුගේ කාර්යාලයට හෝ තැපැල් කාර්යාලයට ගෙවන ලෙසත් අධිකරණය විසින් මෙයින් ඔබට නියම කරනු ලැබේ. (ඊළඟට එළඹෙන වාරිකය ගෙවීමට ඔබට හැකිවනු පිණිස, දඩය හෝ වාරිකය ගෙවීමෙන් පසු මෙම ප්‍රකාශය බැංකුව, ප්‍රාදේශීය ලේකම් හෝ තැපැල් ස්ථානාධිපතිවරයා විසින් ඔබට ආපසු දෙනු ඇත.)

අධිකරණයේ අණ පරිදි ........................
රෙජිස්ට්‍රාර්

අංක 22

[1995 අංක 4 § 3]

## ගෙවීම් කළ බව ඔප්පු කිරීම සම්බන්ධයෙන් වූ ආකෘතිය

[ 291 (4) වන වගන්තිය]

නඩු අංකය : ...........................

........................... අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත:

අංක .................. දරන නඩුව සම්බන්ධයෙන් අධිකරණය විසින් ඔහුට ගෙවීමට නියම කරනු ලැබ ඇති දඩය / වාර්කය ගෙවීම වශයෙන් රු. .........................ක මුදලක් ................ දින ............ (වරදකරුගේ නම සහ ලිපිනය) ගෙන් භාරගන්නා ලදි.

අත්සන් කළේ .......................
බැංකු කළමනාකරු/ප්‍රාදේශීය ලේකම්/තැපැල් ස්ථානාධිපති.

දිනය :............................
(මුද්‍රාව)